# THE BLACK PHARAOH


Christian Jacq

# කළු පාරාවෝ



පරිවර්තනය

මානෙල් කරුණාතිලක


MEDITERRANEAN SEA
Delta
Sile
Pi-Ramses
PALESTINE AND ASIA
Giza
Heliopolis
Saqqara
Memphis
Fayoum
LIBYA
Hermopolis
Assiout
RED SEA
Abydos
Dendera
Coptos
Thebes West
Thebes, (Karnak, Luxor)
Oasis de Khargeh
Edfou
Kom Ombo
Éléphantine (Assuan)
Valley of the Kings, Valley of the Queens, Valley of the Nobles, Deir el-Bahari Ramesseum, Medinet Habou
NUBIA
Abu Simbel
Mirgissa
Bouhen
0
150 km

# 01

මධ්‍යම ඊජිප්තුවේ හෙනෙන් නෙසට් නම් පළාතක් විය. එහි වූ කුඩා ගම්මානයකි, ඒලෙග්ලිං කන්ද. මේ කුඩා ගමට වෙනදා මෙන්ම හිරු උදාවී තිබිණි.

ගම්පතිගේ බිරිඳ දෙවොලේ සිට ආපසු එන තම සැමියා දෙස බලා සිටියාය. ඔහු තිරිඟු ගෝනියක් ඔසවාගෙන එනවා නොවෙද? පෙර දින රාත්‍රියේ ඔවුහු තම දියණියගේ උපන් දිනය සැමරූහ. එහිදී තෑගි ලැබුණ, තම පියා විසින් තනන ලද රෙදි බෝනික්කාටයි දැරිය වඩාත්ම ආශා කළේ. ඒ මොහොතේත් ඈ තම යහලු දැරියන් සමග සෙල්ලම් කරමින් සිටියාය. ගම මැදින් දිවෙන මාවතේයි ඔවුන් කෙළිදෙලෙන් පසුවූයේ.

ගම්පති ගෝනිය විසි කළේය. එය හිස්ය. ''කිසිවක් ඉතිරි වී නැහැ'' ඔහු කීය. ''පූජකවරුන්ට පවා සාගින්නේ සිටින්නට සිදුවේදැයි සැකයි. වැඩිකල් නොගොස්ම දෙවිවරුන් දෙව්ලොව බලා ආපසු යාවි. කිසිවෙකුට අවශ්‍ය නැහැ අපේ මුතුන් මිත්තන්ගේ චාරිත්‍ර රැක ගන්නට. බොරුව, දූෂණය, ආත්මාර්ථකාමීකම... ඒවායි ඔවුන්ගේ නවතම ස්වාමියා.''

''ඔබ මේ තත්ත්වය ගැන පවසන්න අගවිනිසුරුට. ඊළඟට පාරාවෝට.'' බිරිඳ කීවාය.

''පාරාවෝ? කුමන පාරාවෝ කෙනෙක්ද? තව දුරටත් නැහැ පාරාවෝ කෙනෙක්. දැන් සිටින්නේ වාර්ගික නායකයින් පමණයි. ඔවුන් අතර නොනවතින සටන්. සුපිරි බලය ලබා ගන්නට එකිනෙකා සටන් වදිනවා. රටේ උතුරු ප්‍රදේශය ලිබියානු කුමාරවරු යටත් කරගෙන. අරාජකත්වය තුළ සටන් වදින ලිබියානුවන්.*''

''ඒත් කළු පාරාවෝ?''

''හෑ! කොහිද කළු පාරාවෝ? ඔහු ආමන් දෙවියන්ගේ නගරය රැක

---

* - ක්‍රි.පූ.730 කාලය

ගන්නට එහි යුද හමුදාව නවත්වා තිබෙනවා. ඔහුගේ සහෝදරිය එහි, තීබසයේ රැඳෙමින්, ආමන් දෙවියන්ගේ දිව්‍යමය භාර්යාව ලෙස සේවය කරනවා. කළු පාරාවෝ නුබියාවේ ඈත කෙළවර පිහිටි ඔහුගේ අගනුවර වන නපාටාවේ රැඳී සිටිනවා. ඔහු කෙතරම් කාලයක් ඊජිප්තුවෙන් ඈත්ව සිටියාද? ඔව්. ඔහුට දැන් අප අමතකයි. අමතකයි."

"ඔහු අපට උදව් කරාවි. අපව රැක ගනීවි. මට විශ්වාසයි."

"හිත රවටා නොගන්න. අවශ්‍ය වුවත් ඔහුට හැකියාවක් නැහැ. ඔහු ඉහළ හා පහළ ඊජිප්තුවේ රජු වීමට සුදුසු බව සත්‍යයක්. එහෙත් දැන් ඔහු පාලනය කරන්නේ ඒ ඔහුගේම දුෂ්කර පළාත සහ නයිල් නිම්නයේ දකුණු දෙස පමණයි. රටේ ඉතිරි කොටස; පටලැවිල්ලක, කරදරයක දමා අවසන් ඔහු."

"අප ඔහුට පැවසිය යුතුයි මෙහි තත්ත්වය. අප දිළිඳු බවට, විනාශයට පත්වන බව දැන්විය යුතුයි."

"අපේ කාලය නාස්ති වේවි. එපමණයි."ගම්පති කීය. "කළු පාරාවෝ බොහෝම තෘප්තිමත්, ඒ පළාතේ රජකම් කිරීමෙන්. ඔහුට අප ගැනවත් අපේ ගම්මාන ගැනවත් මතක නැහැ."

"අප සතුව තව කරවල ටිකක් තිබෙනවා. ඒත් දින කීපයකට පමණයි." බිරිඳ කනස්සලු වූවාය.

"මේ සාගතයට ඔවුන් මට දොස් තබාවි. මා එයට විසඳුමක් සොයා නොගතහොත් අප සැම මියයාවි. දැන් අපට කළ හැකි එකම දේ හෙනෙන් නෙසට්හි කුමරාගේ පිළිසරණ පැතීම පමණයි."

"ඔව්, ඔහු කළු පාරාවෝට පක්ෂපාතී අයෙක්."

"ඔහුත් මා පිටමං කළොත් මා උතුරට ගොස් ආධාර ඉල්ලා සිටිනවා."

බිරිඳ ඔහුගේ අතින් අල්ලා ගත්තාය. "නැහැ නැහැ. මාර්ගය අනාරක්ෂිතයි. ලිබියානු හමුදාව ඔබේ ගෙල සිඳ දමාවි. ඔබ යන්නේ නැහැ. අප මෙහි ආරක්ෂිතයි. ෆ්ලෙග්ලිං කන්ද ආරක්ෂිතයි. උතුරු හමුදාවන් කිසිදා මෙතරම් දුර දකුණට එන්නේ නැහැ."

"බොහොම හොඳයි. එසේනම් අපි සාගින්නේ මිය යමු."

"නැහැ නැහැ. අපි බදු එකතු කිරීම නවතමු. අපි අපගේ ආහාර සලාක ක්‍රමයට ගෙන, අප සතු ඉතිරිය අනෙක් ගම්මාන සමග බෙදා ගනිමු. එමගින් අපට හැකිවේවි ඊළඟ නයිල් ජල ගැල්ම එනතෙක් ජීවත් වෙන්න."

''ජල ගැල්ම අසාර්ථක වුවහොත් අප මියයාවි.'' ගම්පති පැවසීය.

''බලාපොරොත්තු කඩකර නොගන්න. අපි දිවා රාත්‍රී දෙකේම යාඥා කරමු. අස්වැන්නට අධිපති දේවතාවියට.''

ගම්පති හිස් අහස දෙස බලාගෙන මෙසේ කීය. ''තවත් කෙසේද බලා සිටින්නේ? සතුට අප හැර ගොස් හමාරයි. ජීවිතය බරක්. කෙසේද අප විශ්වාස කරන්නේ බලවතුන් පවසන දේ? ඔවුන්ගේ එකම අරමුණ තම තමන්ගේ ධනය වැඩිකර ගැනීමයි. ඔවුන්ගේ චාටු බස් වලින් අප රැවටිය නොහැකියි.''

කුඩා ගැහැනු ළමයින්ගේ බෝනික්කන් සෙල්ලම ඒ වන විටත් පැවතිණ. ඔවුන්ටම අයිති ඒ පුදුමාකාර ලෝකයේ දොරගුළු හරින යතුරු අයිති ඔවුනටම පමණි. ඒ අකීකරු බෝනික්කන්ගේ දඟවැඩ වලට ඔවුන් නොනවත්වාම දොස් පවරනු ඇසිණ.

ඔවුන්ගේ සිනාහඬ, ගැමිලියගේ මුවඟ සිනාවක් නැංවීය. ඇගේ ස්වාමියා වැරදිය. බලාපොරොත්තු බිඳ ගත යුතු නොවේ. මේ කුඩා දැරියන්ගේ සිතහව තුළ වාසනාව රැඳී තිබිණ. ඔවුහු අවාසනාව ප්‍රතික්ෂේප කරති. ඉතින් එහි ප්‍රතිඵලය වාසනාව නොවේද?

උතුරු සුළඟ ඉහළ නැංගේය. ඒ සමග ඇදී ආ දූලි වලාවක් දොරකඩ වසා වැතිරගති. ගම්පති ශෝකී මුහුණින් යුතුව නිවස ඉදිරිපිට වූ ගල් බංකුවක ඉඳගත්තේය.

බිරිඳ මුසුනක් අතට ගනිත්ම පොළොව දෙදරා ගියේය. ඊජිප්තුවේ විශාලම නගරය හා වෙළෙඳ මධ්‍යස්ථානය වන මෙම්පීස් දෙසින් හමා එන සුළඟ දිගේ මහ හඬක් ඇදී ආයේය. මෙම්පීස්! කළු පාරාවෝගේ අපකීර්තිමත් රාජ්‍ය පාලනය ගැන කිසිත් නොදත් ඒ මහා නගරයේ ලිබියානු බලය, දිනෙන් දිනම වැඩිවිය.

කුඩා දැරියෝ බෝනික්කන් බිම තබා රවුමට හිටගෙන ඔවුන්ට තර්ජනය කළහ.''ලොකු වනවිට ලස්සන ඇඳුම් අඳින්නට උවමනා නම් කීකරුව සිටිය යුතුයි.''

ඒ මොහොතේ අලුත් දූවිලි වලාවක් අහස තෙක් නැගුණි. ඒ සමගම ඇදී ආ හඬ බිහිසුණු ගව රංචුවකගේ ගෙරවුමක් බවට පත්විය. ගැමිලිය ඉදිරියට ගොස් උතුර දෙස බැලුවාය. ඇගේ ඇස් නිලංකාර විය. ලෝහ තහඩු මත පතිතවී පරාවර්තිත හිරු එළිය ඇස් අන්ධ කරවන තරම් සුදු පැහැති එළියක් නිකුත් කළේය.

"අශ්ව රථ" ගම්පති නින්දෙන් අවදි වූවකු මෙන් කෑගැසීය.

අශ්වරථ, හිස්වැසුම් හා ආයුධ සන්නද්ධ සොල්දාදුවන්, පලිහ, හෙල්ල...... උතුරු හමුදාව ඩෙල්ටාවෙන් පිටත්ව ඒ කුඩා ගම්මානය දෙසට පැමිණෙයි. යට ගිරියෙන් කෑ ගැසූ ගැහැනියගේ හඬ, අශ්ව කුර හඬ හා රථ රෝද හඬට යටපත් විය.

ඒ හඬ! අන්තිමේදී කුඩා දැරියෝ ඒ ආක්‍රමණිකයන් දෙස හැරී බැලූහ. ඒ මොහොතේ, පාම් ගස් ගොන්න තුළ සැඟවෙන්නැයි කෑ ගසමින් තමන් වෙත දිව එන ගම්පති හා බිරිඳ ඔවුන්ගේ නෙත ගැටුනේ නොවේ. කුඩා දැරියෝ බෝනික්කන් පපුවට තුරුළු කරගෙන බලා සිටියහ. ඒ රථවල බිහිසුණු, වනචාරී බව දුටු ඔවුහු පුදුමයටත්, බියටත් පත්වූහ.

අහෝ! ඒ රථ සමූහය දැරියන්ද බෝනික්කන්ද යටකරගෙන ඉදිරියට ගියේය. කුඩා දරුවන්, වැඩිහිටියන් ඇතුලු සියලු දෙනාගේ සිරුරු ඒ යකඩ රෝද වලට යටවී කැබලි වී ගියේය. අශ්ව කුර වලට යටවී තැලී ගියේය.

ඒ සංහාරය, උතුරේ ඒකාබද්ධ ලිබියානුවන්ගේ නායක ජෙනරාල් ටෙෆ්නැක්ගේ පළමු ගොදුරයි. ඔහුගේ පාබල හමුදාවෝ ෆ්ලෙග්ලිං කන්දේ ඉතිරි වූ සියලු ජනයා ඝාතනය කළහ. එහි වූ සුදු පැහැති කුඩා ගෙවල් ගිනිබත් කළහ.

ඉතින්, ඉහළ හා පහළ ඊජිප්තුවේ ගොඩබිම් දෙකේ රජු වීමට සූදානම් වන ටෙෆ්නැක්ට මළ සිරුරු ගොඩ ගැසුනාම ඇති ගැටලුව කුමක්ද? දැන් එළඹ ඇත්තේ නියම වේලාවයි. ජෙනරාල් ටෙෆ්නැක්, කළු පාරාවෝ යටත් කර ගන්නා වේලාවයි.

# 02

ටෙෆ්නැක් උපන්නේ ඩෙල්ටාවේ සායිස්හිය. ගිඑනු, කළු ඇස් ඇති ඔහු ශක්තිමත් මිනිසෙකි. ඔහුගේ රළු මුහුණ ඔහු තුළ වූ දැඩි අධිෂ්ඨාන ශක්තිය විද්‍යාමාන කළේය. දරුණු ද්වන්ද්ව සටනක සිහිවටනයක් ලෙස ඔහුගේ නළල හරහා ගැඹුරු කැළලක් තිබිණි.

තරුණ වියේ සිටම ටෙෆ්නැක්ට බියගැන්වීම හුරු පුරුදුය. අණ දෙන්නටම උපන් ඔහු, බියගුල්ලන් පිළිකුල් කළේය. දකුණ යළි යටත් කර ගැනීම සඳහා, ඔහු උතුරේ කුමාරවරුන් බිය ගන්වා තමාට නතු කර ගත්තේය. දැන් ඔහු ලිබියානු නායකයාය. ඩෙල්ටාවේ බටහිර කොටසේ පාලකයාය. පහළ ඊජිප්තුවේ පළාත්වල පාලකයාය. ඉවසීම යන්න නොදන්නා ඔහුට, තමාට සහාය වන අයට කාරුණික වන අන්දම අමුතුවෙන් ඉගෙන ගන්නට සිදුවිය.

මිත්‍ර පාක්ෂිකයින් සමග හමුවක් සංවිධානය කළ ටෙෆ්නැක් ඔවුන් ඇමතීමට සූදානම් විය. කුමාරවරුන් හා ගෝත්‍රික නායකයින් තම තමන්ගේ කුඩාරම් වලින් පිටතට පැමිණියහ. ටෙෆ්නැක් ඔවුන් ඇමතීමට සූදානම් වී මධ්‍යම ඊජිප්තුවේ සිතියමක් සහිත අනර්ඝ පැපිරසයක් දිග හැරියේය.

''මෙම්පිස් අපගේයි.'' ඔහු ප්‍රීතිරාවයක් නැගීය. ''අප ලිෂ්ට් යටත් කර ගත්තා. දැන් අප හෙනෙන් නෙසට් නගරය බලා යනවා. මිත්‍රවරුනි, අපගේ දියුණුව ඉතා විශිෂ්ටයි. මා ඔබට ජයග්‍රහණ වැලක් පොරොන්දු වූවා නොවෙද? එහෙත්, අප තවත් ඉදිරියට යාමට නම් අපි අපගේ සන්ධානය ශක්තිමත් කළ යුතුයි. ඒ නිසයි මා ඔබට පවසන්නේ මේ රටේ නායකයා ලෙස මා පත්කර ගන්නැයි කියා.''

ඩෙල්ටාවේ පළාත් යටත් කර ගැනීමේ පටන්, ඒවා පාලනය කරන ලිබියානු ගෝත්‍රවල නියෝජිතයා වූයේ අකනොෂ්ය. වෙනත් ලිබියානුවන්ට සේම ඔහුටද කදිම යට රැවුලක් විය. කරල් ගෙතු කොණ්ඩය උරහිස තෙක් වැටුණි. ඒ එකිනෙකක් පැස්බර පිහාටුවකින් අලංකාර කෙරිණ. ඔහුගේ මැණික්කටු වළලුවලින් සැරසුන අතර, බාහු සහ පපුව වැසී

ගියේ පච්චකොටන ලද දුනු සහ කිරිච්චි සලකුණු වලිනි. වම් උරහිසෙන් ගැට ගසන ලද දිග, රතු සිවුර අලංකාර මල් මෝස්තර වලින් වැසී ගිය අතර, ඔහු සිත් ඇද ගන්නා පෙනුමක් සඳහා බොහෝ වෙහෙස වූ බව පෙන්වීය. අකනොෂ්ගේ වයස අවුරුදු හැටකි. ඔහු තම රාජ්‍යය වූ සෙබෙනිටොස් හොඳින් පාලනය කළේය. ඔහුගේ ජීවිතය සතුටින් ගෙවී ගිය නමුත්, ටෙෆ්නැක්ගේ යුදමය චාරිකාවට එක්වීමට ඔහුද තීරණය කළේය.

"ඔබට ස්තුතියි. අපට මෙතෙක් මග පෙන්වූවාට." අකනොෂ් නිහඬ ස්ථිර හඬින් පැවසීය. "එහෙත් හෙනෙන් නෙසට් යනු අපගේ සතුරා වන නුබියානුවාට, පියැන්කිට, යටත් ප්‍රදේශයක්. ඔහු සිතනවා ඊජිප්තුවේ නියම රජු ඔහුය කියා. ඔහු මෙතෙක් අප වෙත කිසිදු ප්‍රති ප්‍රහාරයක් එල්ල කර නැත්තේ අපගේ ආක්‍රමණය ගැන ඔහු නොදන්නා නිසයි."

"කළු පාරාවෝ ජීවත් වෙන්නේ මෙහි සිට සති දෙකක ගමනක දුර සුඩානයේ." ටෙෆ්නැක් පිළිකුලෙන් යුතුව පැවසීය.

"සත්‍යයක්. එහෙත් ඔහුගේ හමුදා තීබසයේ රඳවා තිබෙනවා. ඔවුනට හැකියි ඉක්මනින් හදිසි පියවරක් ගන්නට."

ටෙෆ්නැක් සිනාසුණි. "ඔබ සිතනවාද මා දුර්වල මනසක් ඇත්තෙකු කියා මිත්‍රයා? ඔවුනට අනිවාර්යයෙන්ම අණ ලැබේවි ප්‍රහාරයකට, කවදා හෝ. එහෙත් අප ඔවුනට මුහුණ දීමට සූදානම්. එසේ නොවෙද?"

"සමහරුන්ගේ අදහස අපගේ සන්ධානය දුර්වල බවයි." අකනොෂ් කීවේය. "ඔබ දක්ෂ යුද නායකයෙක්, ටෙෆ්නැක්. එහෙත් අප අතරින් කීප දෙනෙකුම කැමතියි අප සතු බලය රැකගෙන සිටින්නට. තවත් දුර යාම අපගේ විනාශයට හේතු විය හැකියි."

"අප විනාශ වන්නේ නිකම් බලා සිටීමෙන්." ටෙෆ්නැක් කෑ ගැසීය. "මා මේ ඒකාබද්ධ පෙරමුණට ප්‍රධානත්වය දෙන්නට පෙර , අප මුහුණ දුන් කරදර මා සිහිකළ යුතුද?ඩෙල්ටාවේ සිටියා බොරු පාරාවෝ වරුන් සිව් දෙනෙක්. උරුමය කියන අය අවම වශයෙන් දුසිමක්. කිසිදු වැදගැම්මකට නැති ගෝත්‍රික නායකයා නියම රජකු ලෙස හැසිරුණා. අවනීතිය රජකළා. ලේ වැගිරුණා."

"එය සත්‍යයක්." අකනොෂ් එකඟ විය. "ඔබ අපට අපගේ ගෞරවය නැවත ලබා දුන්නා. එහෙත් අප සිහිමුළා නොවිය යුතුයි. දැනට අපට රටෙන් බාගයක් අයිතියි. ඉතින් අප සතු මේ ගොඩබිම බෙදාගෙන සිටීම අඥාන අවදානමක් ගන්නවාට වඩා සුදුසු නොවේද?"

ටෙෆ්නැක්ට ඒ බියගුල්ලාගේ ගෙල මිරිකන්නට සිතුණි. එහෙත් ඔහු කෝපය පාලනය කරගති. ඔහුට තනිවම යුද්ධ කරන්නට තරම් යුධ හමුදාවක් නැත. ඒ නිසයි ඔහුට ඒ වනචාරීන් සමග එක්වන්නට සිදුවූයේ.

''මට ඔබේ වදන් වැටහෙනවා අකනොෂ්.'' ඔහු කීය. ''මේ වනවිට අප දකුණු ප්‍රදේශය පියන්කිට පාලනය කරන්නට ඉඩ දී උතුරෙහි අපගේ බලය තහවුරු කරගෙන, මධ්‍යම ඊජිප්තුව උදාසීන කලාපයක් බවට පත්කර තිබෙනවා. එහෙත් සතුට හා සෞභාග්‍යය ලබා ගන්නට ඊජිප්තුව එකමුතු විය යුතුයි. නියම පාරාවෝ කෙනෙකු විසින් එය පාලනය කළ යුතුයි. අප මේ ලෙස වෙන් වෙන්ව ජීවත් වීම, අපට අප සතු සියල්ල අහිමි වීමට හේතුවක් වේවි. එකම විසඳුම දකුණ ආක්‍රමණය කර කළු පාරාවෝගේ හමුදාවන් අතුගා දැමීම පමණයි.''

''ඒ ඔබේ සිතිවිල්ලක් ටෙෆ්නැක්. මා ඊට ගරු කරනවා. එහෙත් මෙතැන සිටින්නේ ඉතා හොඳින් තම භූමිය පාලනය කරන ස්වාධීන පාලකයන්.''

''කිමද නුඹ මගේ පාලනයට අභියෝග කරන්නේ? අප ජයග්‍රාහී මාවතක ගමන් කරමින් සිටියදීත්?''

''ඔබ අපව ඒකාබද්ධ පෙරමුණකට ගෙන ආ බව සත්‍යයක්.'' අකනොෂ් කීය. ''එහෙත් අප ඔබට, අප අභිබවා යන නායකත්වයක් දී නැහැ. අපට අවශ්‍ය වුණා යම් අලුත් දෙයක් කරන්නට. ඩෙල්ටාවෙන් පිටවන්නට, ඉදුනු පලතුරක් සේ අප අතට වැටුණු මෙම්පිස් අයිතිකර ගන්නට, එසේම මධ්‍යම ඊජිප්තුවේ පළාත් කීපයක් යටත් කර ගන්නට. අප අපට අවශ්‍ය සියල්ල කර අවසන්. අප එයින් තෘප්තිමත් විය යුතු නොවේද?''

තම ආවතේවකරුට අඬගැසූ ටෙෆ්නැක් ලිබියානු කුමාරවරුන්ට හොඳම බීර වත්කරන්නැයි අණ කළේය. එය බොහෝ දෙනාගේ පැසසුමට ලක්වූ නමුත් අකනොෂ් බීර කෝප්පය ප්‍රතික්ෂේප කළේය.

''මේ තාක් අප ජයග්‍රහණය කළේ කිසිදු සටනකින් තොරව.'' ඔහු ටෙෆ්නැක්ට සිහිකර දුන්නේය. ''අප යටත් කර ගත් කිසිදු ගම්මානයකට ශක්තියක් තිබුණේ නැහැ ප්‍රතිප්‍රහාර එල්ල කරන්නට. එහෙත් හෙනෙන් නෙසට් යනු දක්ෂ පළපුරුදු සොල්දාදුවන් සිටින නගරයක්. අපගේ මිනිසුන් කී දෙනෙක් මිය යාවිද? අප සූදානම්ද එවැනි ජීවිත පරිත්‍යාගයකට?''

"ජයග්‍රහණයේ වටිනාකම එයයි." ටෙෆ්නැක් හඬ නැගීය."එසේ නැතැයි පැවසීම බොරුවක්. ආපසු යාම පරාජයක්."

"අපට සිතන්නට කාලය අවශ්‍යයි."

ටෙෆ්නැක් තම දොම්නස සඟවාගති. ලිබියානු නායකයින් එකතුවන හැම විටකම, ඔවුන්ගේ සිරිත කිසිදු තීරණයක් නොගෙන දබරයක පැටලීම බව ඔහු දනී.

"එසේ නම් මගේ මේ පැනයට පිළිතුරක් දෙන්න වහාම. ඊජිප්තු රාජ්‍යය යටත් කර ගැනීමේ බලය, එහි නායකත්වය, මට දෙන්නට ඔබ සූදානම්ද නැතිද?" ඔහු ඇසීය.

අකනොෂ් නැගිට තම කූඩාරමට ගියේය. සෙසු ලිබියානු නායකයෝද ඔහු පසුපස ගියහ. තව බොහෝ වේලාවක් නිහඬතාවය රජ කරන බව ටෙෆ්නැක්ට විශ්වාසය.

කෝපයෙන් දැවෙමින් පහත තිබූ සියඹලා අත්තක කොළ සූරාගත් හෙතෙම එය ඈතට විසි කළේය. ඉන්පසු ඔහු පිය නැගුවේ කිසිදා නොවෙනස්ව සේවය සපයන තම උපදේශකවරුන් සිටින කූඩාරම වෙතයි.

යෙගෙබ් සහ නාට්‍රෙබ් නොගැලපෙන දෙදෙනෙකි. යෙගෙබ් උසය. ඉතා දිග අත්, ඊටම ගැලපෙන දිග මුහුණක් හා ඉදිමුණ වළලුකර ඔහුට හිමිය. නාට්‍රෙබ් වූ කලී කළයක් බඳු බඩක්, ළදරුවෙකුගේ මෙන් වූ මෘදු ඇඟිලි, රවුම් මුහුණක් හා මහත බෙල්ලක් ඇති තර මිනිසෙකි. ගුප්ත, විශ්වාසවන්ත යෙගෙබ්, නාට්‍රෙබ්ට වඩා මඳක් වයසින් වැඩිය. ඔහු නිතරම ටෙෆ්නැක්ට අවවාද කළේය. ඒ අවවාද කෙසේ වුවද නාට්‍රෙබ් නොසන්සිඳෙන ආශාවකින්, කිසිදු චකිතයකින් තොරව තම ධනය වැඩි කර ගැනීමට ඕනෑම දෙයක් කළේය. යෙගෙබ්ද නාට්‍රෙබ් තරමටම දූෂිතයකු වුවද නිරතුරුවම තම නිදොස් බවයි ප්‍රකාශ කළේ. පරණ ඇඳුම් ඇන්ද ඔහු කෑවේත් මසුරුකමිනි. බලය ලබා ගැනීමට ඔහු තුළ වූ ආශාව දැඩිය. ටෙෆ්නැක්ට ගොඩබිම් දෙකේ රජු ලෙස කිරුළ දරන්නට නාබ්‍රෙට්ගේද සහය ඇතිව උදව් දෙන ඔහු තුළ, ඊට සරිලන උසස් තිළිණ ලැබෙනු ඇත යන විශ්වාසය තිබිණි.

"සාකච්ඡා සාර්ථකද?" පැපිරස් නටුවක් හපමින් සිටි නාට්‍රෙබ් ඇසීය.

"ඒ මන්දබුද්ධිකයින්ට තවත් සාකච්ඡාවක් අවශ්‍යයි." ටෙෆ්නැක් පැවසීය.

''හෝ, නරකම තත්ත්වය.'' යෙගෙබ් නාසය කසමින් කීය. ''ඔවුන්ගේ තීරණය කුමක් වුවත්, සිදුවේවි අපට උතුර බලා ආපසු යන්නට.''

''එසේ නම් කුමක්ද ඔබේ අදහස?'' ටෙෆ්නැක් ඇසීය.

''වසර ගණනක් පුරා අප මේ ලිබියානු ඒකාධිපතියන් හඳුනනවා. කළ හැකිදේ බොහෝයි.''

''එසේ නම් ඒවා කරන්න.'' ටෙෆ්නැක් කීය.

# 03

නුබියානු තරුණයා නයිල් නදියේ කිමිදුනේය. ඔහු සිටියේ වේගවත් දිය පහරේ පෙරළෙමින් ගිය කුළු හරකකු ලුහුබැඳ යමිනි. ඇත්තටම එය, තමා දෙස බලා සිටින තඹවන් සිරුරින් යුතු තරුණියන් තිදෙනා පුදුම කරවීමට ඔහුට උදාවූ අපූරු අවස්ථාවක් විය.

ඔවුන් සිටියේ නිරුවතිනි. දැඩි උණුසුමෙන් පීඩාවට පත් පෝර්මාගේ ඥාති සහෝදරයකුට අයත් ගවයන් ගඟට පනින විට, තරුණියෝ ගල් අතර වූ ස්වභාවික නාන තොටක නෑමට සූදානම්ව සිටියහ. ඔවුන් විස්මයට පත් කරමින් ගවයින් අල්ලා ගැනීමයි පොර්මාගේ අභිප්‍රාය වුණේ. තරුණ පෝර්මා ශක්තිමත්ය. ඔහු අතිදක්ෂ පිහිනුම් කරුවෙකි. තරුණියන් තිදෙනාගේම සිත් ඇද ගන්නට සමත් වූ ඔහු ඔවුන් දෙස බැලීය. බියෙන් පලා නොගොස් හිනැහෙන ඔවුන්, තමාට කැමති බවට ඔහු තීරණය කළේය.

කෙසේ වෙතත් නයිල් නදියේ සිව්වැනි ඇල්ල, ආදරයේ සිතිවිලි උපදින තැනක් නොවේ. ඊසාන සිට නිරිත දෙසට සීඝ්‍ර ගමනක යෙදෙන ඇල්ල, කුඩා දූපත් යට කරගෙන කළු ගල් අතරින් ඉදිරියට ඇදුණේය. ඒ ඉවුරු මත පැතිර තිබූ වැලි හා ගල් හේතුවෙන් ගස් වැවුනේ කලාතුරකිනි. කුඩා බෑවුම් මත රට ඉඳි වැවුනද ඒ අතරද කළු පැහැති ගල් පැතිරී තිබිණි. ඒ අතරින් ගමන් කරන අයට එය අපායේ කාමරයක් ලෙස පෙනුනද එය පුදුමයට කරුණක් නොවීය.

එහෙත් පෝර්මාගේ අසිරිමත් ළමා කාලය ගතවුණේ මේ හුදකලා ස්ථානයේය. ඒ ගල් සහිත භූමියේ හැම මුල්ලක්ම ඔහු දනී. අන්තිමේදී ඔහු හැකි ස්ථානයකට ගවයින් ඇතුළත් කළේය.

''එන්න'' ඔහු තරුණියන්ට කීය. ''මෙතන බොහොම ආරක්ෂිතයි.''

ඔවුහු ඔහු දෙස බලා සිනාසෙන්නට වූහ. ඉක්බිති ගලින් ගලට පනිමින් ප්‍රවේශමෙන් පා තබමින් තරුණයාට ළං වීමට තැත් කළහ. ඒ අතරින් වඩාත්ම එඩිතර තරුණිය ගවයකුගේ පිටට පැන තරුණයා වෙත

අත දිගු කළාය. එය අල්ලන්නට ඉදිරියට නැමෙන තරුණයාට සිනාසුන ඇය අත ආපස්සට ගෙන පිටුපසට ඇදුණාය. ඇගේ මිතුරියන් දෙදෙනා දිය යටින් පිහිනා ගොස් තරුණයාගේ දෙපයින් අල්ලා ඇදගෙන යන්නට වන්හ.

ඔවුන්ගේ සිරකරුවා බවට පත්වීම ඔහුට දැඩි සතුටක් විය. ඒ ඇපල් වැනි පියයුරු හුරතල් කරන්නටත්, ආලවන්ත දෙතොල් මත හාදු වපුරන්නටත් ඔහුට හැකිවිය. පැනගිය ගවයින්ට හදවතින්ම ස්තුති කළ ඔහු තරුණියන්ට කීකරු විය. තරුණ නුබියානු කෙල්ල වැලක් සේ නම්‍යශීලීය. ඇය හා ආදරයෙන් වෙලී සිටීම අතිශය චමත්කාරජනක මොහොතක් විය. ඒ රාගී තරුණියන් තිදෙනාගේ ක්‍රීඩා භාණ්ඩයක් බවට පත් වූ පෝර්මාට දැනුණේ තමා අමුතුම පාරාදීසයක තනිවූ බවකි. එහෙත් ඒ දිය දහර මැද ඔහුට ඔවුන්ගෙන් මිදෙන්නට අවශ්‍ය විය. ඒ බැව් දැනීමෙන් ඔවුන් ඔහු ගොඩට ඇදගෙන ආ පසුව, සියලු විරෝධතා අමතක කළ තරුණයා ඔවුන්ගේ හාදු වලට ඉඩ දුන්නේය.

එක්වරම ඔහුගේ සිරුර මත වැතිරී සිටි තරුණිය බියකරු කෑ ගැමක් සමග ඉවතට පැන්නාය. ඇගේ මිතුරියන් දෙදෙනාද ඇය අනුව ගිය අතර, මොහොතකින් වල් එළුවන් තිදෙනෙකු සේ ඔවුහු ගල් අතර නොපෙනී ගියහ.

''කුමක්ද සිදුවූයේ? ආපසු එනු.'' කනස්සල්ලට පත් පෝර්මා නැගිට වටපිට බලමින් කෑ ගැසීය.

එවිට ඔහුට පෙනුණේ ඒ ආදර කැදැල්ල දෙස බලාගෙන ගලක් මත සිටින යෝධයෙකි. කළුවර සමක් ඇති ඔහු රියන් හතරකට වඩා උසය. සුදු කෙටි සායකින් සැරසී සිටි ඔහු තරුණයා දෙස දැඩි බැල්මක් හෙළීය.

වහා දණින් වැටුණු පෝර්මා නළල බිම තැබීය.

''උතුමාණෙනි ඔබ ආපසු පැමිණි බව දැන සිටියේ නැහැ.''

''නැගිටිනු. දුනුවායන්ගේ නායකයා.''

පෝර්මා එඩිතරය. බිය නොහඳුනන ඔහු කිසිදු පසුබෑමකින් තොරව මිනිසුන් දසදෙනෙකු සමග සටනට ඉදිරිපත් වෙයි. එහෙත් කළු පාරාවෝගේ බැල්ම ඔහුට දරාගත නොහැකිය. පියැන්කිගේ අනෙකුත් නිලධාරීන් මෙන්ම පෝර්මාද ඔහු තුළ ඉන්ද්‍රජාලීය බලයක් ඇතැයි විශ්වාස කළේය. ඔහුට රාජ්‍ය පාලනය සඳහා හැකියාව ලබාදෙන බලය එය නොවේද?

"උතුමාණෙනි යුද්ධයක් ඇති වීමට නියමිතද?" පෝර්මා ඇසීය.

"නැහැ. කලබල නොවන්න. දඩයම ඉතා සාර්ථකයි. මා බලාපොරොත්තු වූවාටත් වඩා කලින් ආපසු පැමිණියා."

තමා ඉතා ආදරය කරන රට හා එහි අභිවෘද්ධිය ගැන කල්පනා කිරීමට පියැන්කි නිතරම පැමිණියේ මේ කඳු සහිත පෙදෙසටයි. වනගතව සැඟවුණු, බැලූ බැල්මට දිළිඳු වූ අඳුරු නුබියාව, ශක්තිමත් ආත්මයන් හා බලවත් මිනිසුන් බිහිකළ ඊජිප්තුවෙන් බොහෝ ඈතය. දිනපතාම හිරු සහ ජලය අතර සිදුවන විවාහය සමරන එහි, විටෙක අයිස් මෙන් සීතල වූද තවත් විටෙක ගිනිදැල් සේ උණුසුම් වූද සුළඟ, ප්‍රචණ්ඩව හමා එයි.

'ඉහළ හා පහළ ඊජිප්තුවේ රජු' යන නාමය දැරුවද කළු පාරාවෝ පියැන්කි, කිසි විටෙක තම අගනුවර වූ නපාටාවෙන් බැහැර ගියේ නොවේ. විසිපස් වැනි වියේදී කිරුළු දැරූ කළු පාරාවෝ විසි වසරක් රාජ්‍ය පාලනය කර තිබේ. එසේම, ඊජිප්තුව, දරුවකු මෙන් දුර්වල කරන දේශපාලනික හා සමාජයීය බෙදීම් ගැන හොඳ අවබෝධයක් ඔහුට විය. උතුරේ රැඳී සිටින ලිබියානු හමුදාවන් ඔවුනොවුන් අතර වැඩි බලයක් ලබා ගැනීමේ තරඟයක යෙදෙති. දකුණේ, උතුම් නගරය වූ තීබසය පිහිටියේය. එහි නවත්වන ලද නුබියානු හමුදාවන්ට ඕනෑම ආක්‍රමණයකින් ආමන් දෙවියන් ආරක්ෂා කිරීමේ කාර්යය භාරවිය. උතුර හා දකුණ අතර මධ්‍යම ඊජිප්තුව පිහිටි අතර කළු පාරාවෝගේ සහායකයින් වූ හෙනෙන් නෙසට් හා කමුන් කුමාරවරු එහි පාලනය ගෙන ගියහ. උතුරෙන් ඇතිවන බලපෑම මැඩලන්නට ඒ දෙදෙනා සමත්ය.

ඇත්ත වශයෙන්ම එය හොඳ තත්ත්වයක් නොවීය. එහෙත් පියැන්කි තීබසයේ දියුණුව සහ තම අගනුවර වෙනුවෙන් සියල්ල කැප කළේය. ඔහු තම අගනුවර, ආමන් දෙවියන් වෙනුවෙන් කාර්නැක් දෙවොලටම සමාන දෙවොලක් තනමින් සිටියේය. පියැන්කිගේ එකම අභිප්‍රාය වූයේ අතීත රජවරුන් සේම ඉදිකිරීම් කරවන්නටයි. දෙවිවරු ඔහුට සාධාරණත්වයට හා සත්‍යයට අධිපති මා ආට් දෙවඟනගේ හඬ ඇසෙන ඉන්ද්‍රජාලීය භූමියක් තිළිණ කර තිබිණ. ඉතින් ඔහු තම සියලු ශක්තිය යොදා එම වස්තුව රැක ගන්නට උත්සාහ කළේය.

"ඔබේ පුහුණුවීම් දිගටම කෙරෙනවාද?"

"එසේය උතුමාණෙනි. මගේ දුනුවායන් ඕනෑම වේලාවක සටනට සූදානම්. ඔවුන් දොම්නසින් සිටින්නේ සටනක් නැති නිසයි. අණ දෙන්න උතුමාණෙනි, අපි සටන් කරන්නම්."

පියැන්කි, පෝර්මාගේ නිර්භීතකම ගැන හොඳින් දැන සිටියේය. මේ හමුව සටනක පෙරනිමිත්තක් නොවන බව පෝර්මාද හොඳින් දැන සිටියේය.

''උතුමාණෙනි, අප යුද්ධයට සූදානම් විය යුතුද?''

''නැහැ. සටන් ඔබ සිතන පරිදි සිදු නොවේවි. සතුරා ඔබ බලාපොරොත්තු වන ස්ථානයෙන් පහර දෙන්නේ නැහැ. පෝර්මා, මගේ අගනුවර වැසියන් සිතනවා, මා දෙවියන් වෙනුවෙන් කැප කරන කාලය අඩුකොට ඔවුන්ගේ සැපත වෙනුවෙන් කාලය ගත කළ යුතුය කියා. ඔබ නිවැරදිව සිතන්න. ඕනෑම අවස්ථාවක ඕනෑම දේකට සූදානම් වන්න.''

රජුට ආචාර කළ දුනුවායන්ගේ නායකයා, නපාටා දෙසට දුවන්නට විය. පියැන්කි, දිය දහරේ වදයට ලක්වන ගොඩබිම දෙස බලා සිටියේය. ඒ ජල ප්‍රහාරයේ වේගයත්, ගල්වල සදාකාලිත්වයත් ඔහුට අවශ්‍ය ශක්තිය ලබාදුණි.

සතුට..... පියැන්කි තම රටේ ජනතාව සතුටින් තැබීමට බැඳී සිටියේය. ප්‍රීතිමත් පවුලක්, හොඳින් ආහාර ලැබ ආධ්‍යාත්මිකව පෝෂණය වන ජනතාවක්, ආගමික චාරිත්‍ර හා උත්සව මගින් සාමය උදාකර ගත් ජනතාවක්. ඒ ශාන්ත බව රැක ගැනීමේ වගකීම පැවරී තිබුණේ ඔහුටයි.

ඒ අවට වාතය කෙතරම් පැහැදිලිද යත් ඉතා සුළු ශබ්දයක් පවා හොඳින් ඇසුණි. පියැන්කි ඒ හඬ හැඳින්නේය. බූරුවෙක් ඇවිදින හඬ.... පියැන්කිගේ ප්‍රධාන ලේකම් මෙන්ම උපදේශක වූ කුල්හෙඩ් පිට තබාගෙන එන බූරුවාගේ හඬ. මේ බූරුවා, බරින් ඉතා අඩු ස්වාමියෙකු පිට තබාගෙන යන්නට තරම් වාසනාවන්තයි. මන්ද යත්, කුල්හෙඩ් රළු මුහුණක් හා ඊට ගැලපෙන සිරුරක් ඇති කුරුමිට්ටෙකි.

සාමාන්‍යයෙන් තම කාර්යාලයෙන් පිටතට යාම කුල්හෙඩ්ගේ සිරිත නොවේ. ඔහු මේ ගමන පැමිණ ඇත්තේ කුමක් හෝ බරපතල හේතුවක් නිසාය.

''හා, උතුමාණනි, අන්තිමේදී මට ඔබ හමුවුණා.'' ඔහු කීය.

''කුමක්ද ගැටලුව?''

''ඉදිකිරීම් වැඩබිමේ අනතුරක්. උතුමාණනි, ඉතාම බරපතල තත්ත්වයක්.''

# 04

ගිබෙල් බාර්කල් නම් වූ ශුද්ධ වූ කන්ද නපාටාවේ උසම කන්ද විය. ලොව සියලු දෑ උපන් ස්ථානයේ පිහිටි එය, සැඟවුණු තැනැත්තා හෙවත් ආමන් දෙවියන්ගේ අදෘශ්‍යමාන ශක්තිය රඳවාගෙන සිටී.

නයිල් නදියේ සිව්වන දිය ඇල්ලේ සිට දිනක ගමනකින් නපාටා හමුවන අතර එය වටවී තිබුණේ කාන්තාරයෙනි. තවලම් මාර්ග කීපයක් එකට හමුවන ස්ථානයක, සාරවත් භූමියක පිහිටි නපාටාවේ වැසියෝ සුඛෝපභෝගී ජීවිත ගත කළහ.

කෙසේ වෙතත් තවලම්කරුවන්ට නපාටාවේ පදිංචි වීමට අවශ්‍ය නම් තම රැකියාව වෙනස් කිරීමට සිදුවිය. ඔවුන්ට එහි රැඳී සිටිය හැකිවූයේ වෙළෙඳාම් කිරීමට හා විවේක ගැනීමට පමණි.

පියැන්කිට අති විශාල වස්තුවක් ඇති බව කවුරුත් දැන සිටියහ. එහෙත් ඔහු එය විදයම් කළේ රාජ්‍යයේ දෙවොල් ආරක්ෂා කිරීමට හා ජනතාවගේ සුභ සිද්ධිය වෙනුවෙන් පමණි. දූෂණය තහනම් වූ අතර ඊට ලැබුණු දඬුවම් දැඩිය. ඉතා බරපතල දූෂිතයින්ට මරණ දඬුවම හිමිවිය. මා ආට් නීතිය බිඳ දැමීම කළු පාරාවෝගේ දැඩි කෝපයට හේතුවිය. එසේ වුවද ඔහුගේ කෝපය නංවා, අවදානම ගැනීමට තරම් මෝඩ මිනිසුන්ද නපාටාවේ සුළු වශයෙන් දක්නට ලැබිණි.

ගිබෙල් බාර්කල් පිහිටියේ හුදකලා බිමකය. කුඩා පියැන්කි මේ කන්දට වශී වී සිටියේය. අදද එය එසේමය. ඔහු ඊට ආදරය කළේය. නයිල් නදියේ දකුණු ඉවුරේ පිහිටි එම කන්දේ බෑවුම් සහිත ගිරි ශිඛර මත ඔහු පැය ගණන් ගමන් කර තිබිණි. කල් ගතවීමේදී සිතේ එක් සැලසුමක් ඇඳෙන්නට විය. ශුද්ධ වූ කන්දේ මුදුනෙහි පිටතට නෙරූ කොටසක පාරාවෝ නීතියේ සලකුණ කැටයම් කර තැබීමෙන්, කන්ද කතාකරවීමයි ඒ.

එය අනතුරුදායක ක්‍රියාවලියකි. එහෙත් පසුගිය දෙවසර තුළ ස්වෙච්ඡා සේවකයින් කණ්ඩායමක් සමග එක්වූ ඔහු එහි වැඩ අරඹා

තිබිණි. කන්ද මුදුනෙහි, ප්‍රධාන කන්දෙන් වෙන් වූ රියන් විසිපහක් පළල රියන් එකසිය විස්සක් ගැඹුරු ගිරි කඳුරක් විය. ඊට ළංවීම සඳහා යෝධ පලංචියක් අවශ්‍ය විය. ගලෙහි සිදුරු තනා ඒ තුළට බාල්ක හා පරාල යෙදීමෙන් පලංචිය තනන ලදී.

පටු වේදිකාවක නැගුණු ගල් වඩුවෝ පාරාවෝගේ දැඩි අධීක්ෂණය යටතේ ගිබෙල් බාර්කල්හි මුදුන කැටයම් කළහ. පෙරදිගින් බලන විට එය, සුදු ඔටුන්න සහිත හිස ඔසවාගත් අති විශාල ගැහැනු නාගයෙකු සේ පෙනිණ. බටහිරින් එය පෙනුණේ රතු ඔටුන්න හා හිරු තැටියක් ලෙසයි. එහි මුදුනත, ආමන් දෙවියන්ට ගෞරව ලෙස කරන ලද චිත්‍ර ලේඛන සඳහන් ලියවිල්ලක් විය. උදෑසන ආලෝකය පරාවර්තනය කිරීම සඳහා රන් කරුවකු විසින් රන් පත්‍රයකින් ආවරණය කරන ලද තහඩුවක් තනා තිබිණි. සෑම උදෑසනකම එමගින් අඳුර පලවා හැරෙන එළියක් නිකුත් වනු ඇත.

ඒ වනවිට කාර්යය අවසන් භාගයට පැමිණ තිබිණි. අවසාන වැඩ ටික ඉවර කිරීමට ගල් කුඩා සහ වංගෙඩි ඉහළට ගෙනගොස් තිබිණි.

''කුමක්ද සිදුවුණේ? වහා පවසන්න.'' පියැන්කි කීය.

''උතුමාණනි, එක් නිර්මාණ ශිල්පියෙකුට අවශ්‍ය වුණා තම කාර්යයේ අගය දකින්නට. නීති නොතකා ඔහු ඉදිරියට ගියා. අතරමගදී පය ලිස්සා අවාසනාවන්ත......''

''ඔබ පවසන්නේ....''

''ඔහු මියගියා උතුමාණනි.'' කුල්හෙඩ් කීය. ''ඒ සමගම ඔහුගේ ශිෂ්‍යයා තම ගුරුවරයාට උදවු කරන්නට දිව ගියා. ඔහු එහි සිරවුණා. සෙලවෙන්නවත් නොහැකිව.''

✸

පියැන්කි උඩ බැලීය. තරුණයෙක් ගලටම ඇලී සිටියේය. ඔහුගේ දෑත ඉහළ ගල් ගැට්ටක රැඳී තිබූ අතර දෙපයද ගල් මත රැඳී තිබිණි. වහා ගුරුතුමා ළඟට යාමට තැත්කළ ඔහු, වැඩබිමේ නීතිය වූ ඉනිමං හා ලණු යෙදූ මග අමතක කර ගල් අල්ලාගෙන කන්ද නගින්නට තැත්කර තිබිණි. ගුරුවරයා වැටෙණු දුටු ඔහු තවත් බියවී සිටියේය. ඔහුගේ මිතුරන් ඔහුගේ අනිවාර්ය වැටීම සිදුවන තෙක් බලා සිටියේ දෑස් මුව අයාගෙනය.

''ඔහුගේ වයස?'' පියැන්කි ඇසීය.

''දාහතයි උතුමාණනි.''

"බර?"

"හරියටම කිව නොහැකියි. එහෙත් ඔහු බොහොම කේඩෑරි නිසා බරින් අඩුයි උතුමාණනි."

"මා හා එහි යන්නට දෙදෙනෙක් තෝරා දෙන්න."

"උතුමාණනි ඔබ යන්නේ නැහැ නෙවෙද?"

"බලන්න ඔහුට ඉහළින්..... " පියැන්කි කීය. "ගල් මුදුනත එකිනෙකට ආසන්නයි. මට හැකිනම් ඉන් එකක රැඳී ඔහු වෙත අත දිගු කරන්නට ඔහුගේ දිවි බේරේවි."

කුල්හෙඩ් වෙව්ලන්නට විය. "උතුමාණනි මා ඉල්ලා සිටිනවා රාජ්‍යයේ නාමයෙන් ඒ අවදානම නොගන්නැයි කියා."

"ඒ දරුවාගේ ජීවිතයට මා වගකිව යුතුයි. එන්න. මොහොතක් හෝ ප්‍රමාද විය නොහැකියි."

ශක්තිමත් විශ්වාසවන්ත ගල් වඩුවන් දෙදෙනෙක් පියැන්කිට ඉදිරියෙන් ගියහ. ඔවුහු පටු ඉනිමග දිගේ ඇකේෂියා ලීයෙන් තනන ලද පළමු තට්ටුව වෙත නැංගෝය.

"රැඳී සිටින්න." පියැන්කි කෑ ගැසීය. ශුද්ධ වූ කන්ද මත ඒ හඬ දෝංකාර දුනි. "අපි එනවා ඔබ ළඟට."

තරුණයාගේ වම් පාදය ලිස්සා ගියේය. මොහොතකට එය හිස් අවකාශයේ වැනෙන්නට විය. යළිත් ඇදහිය නොහැකි තරමේ ධෛර්යකින් සමබරතාවය රැකගත් ඔහු එය කන්දෙහි ගැට්ටක තබාගති.

"මා තවත් ඉහළට යා යුතුයි." රජු කීය.

"උතුමාණනි, මේ ගැට ලණුව දිගේ යා හැකියි." ගල් වඩුවෙක් කීය.

පියැන්කි පහසුවෙන් එහි නැංගේය. තරුණයාට ඉහළින් වූ තට්ටුව මත නැවතුණේය. තරුණයාගේ ඇඟිලි ගලේ එල්ලී සිටීමෙන් නිල් පැහැයට හැරී තිබිණි. රජු අත දිගු කළේය. එහෙත්.... ඔහු තවත් රියන් දෙකක් ඈතය. මරණයෙන් මුදවාගත යුතු අවාසනාවන්ත තරුණයා!

"ඉණිමගක්" රජු අණ කළේය.

ගල්වඩුවෝ ඉණිමගක් ඔසවාගත්හ.එය කොතරම් බරද යත් ඔවුන්ගේ අත්වල මාංශ පේශි ගැට ගැසෙනු ඔවුනට දැනුණි. පියැන්කිගේ සිතිවිල්ල අසිරිමත් උත්සාහයක් විය. ඉණිමග තිරස්ව තබා එය ගල් මුහුණත දෙක අතර රැඳවීම!

හෙමින් ඉණිමගේ හරස් ලීය දැඩිව අල්ලාගත් රජු, එය කඳු අතර රඳවන්නට ගත් උත්සාහයේදී එහි වැදීමෙන් කැඩී ආ කුඩා ගල් කැබලි දෙකක් තරුණයාගේ හිදේ වැදී නොවැදී බිම වැටුණි. ඔහු විලාප දුන්නේය.

''තදින් අල්ලාගන්න පොඩි දරුවෝ.'' රජු කෑ ගැසීය.

අන්තිමේදී ඉණිමග රඳවා ගන්නට හැකිවිය. පියැන්කි ඒ පාලම හරහා යනවිට එහි ලී, කිරි කිරි හඬ නැංවීය. රජුගේ පාදයට එක හරස් ලීයක් පුපුරා ගියද වාසනාව ඔහු සමග විය. රජු හෙමින් පහසුවෙන් ඉණිමග දිගේ ගියේය.

''මා මෙතැන දරුවා. මා ඔබ ළඟ. දැන් මා මගේ අත දෙනවා. ඔබ එය අල්ලාගන්න. මා ඔබ මේ ඉණිමග මතට ගන්නවා.''

''මට.... මට නොහැකියි. මා ඉවරයි.''

''ඔබ හැරෙන්න. බලන්න මගේ අත මෙන්න.''

''නොහැකියි. අපොයි! නොහැකියි.''

''හොඳින් හුස්ම ගන්න. හෙමිහිට හොඳින්, ගන්න හුස්ම. දැන් හැරෙන්න. ඔබට මා පෙනේවි දරුවා.''

''මා වැටෙනවා දැන්.... මා මැරෙන්නයි යන්නේ. මා කුඩු වෙන්නයි යන්නේ.'' තරුණයා විලාප දුනි.

''බිම නොබලන්න. නුඹට ඇහුණද? උඩ බලන්න. උඩ. මගේ අත. ඔබේ ළඟටම එන මගේ අත. ඔබේ හිස ළඟ.''

ඉණිමග යළිත් කිරි කිරි හඬ නැංවීය.

''හැරෙන්න, හැරෙන්න මා වෙත.'' පියැන්කි බලවත් හඬින් ගර්ජනා කළේය.

හුස්ම ඉහළට අල්ලා ගත් තරුණයා කීකරු විය. බියෙන් අඩපණව සිටියද ඔහුගේ පා සෙලවිණ. දෑස් අඳුරුව යද්දී හිස් බවට මුහුණලා සිටි තරුණයාගේ පය ලිස්සා ගියේය.

උරහිසෙන් ගැලවී යන්නට තරම් වේදනා දෙන අත හැකිතරම් ඈතට දිගුකළ පියැන්කිට තරුණයාගේ වම් මැණික් කටුව අල්ලාගන්නට තරම් වාසනාව තිබිණි. දැරිය නොහැකි තරම් බියෙන් තැති ගත්තද, දරුවා ඉණිමගට ඔසවා ගන්නට පියැන්කිට හැකිවිය.

''උතුමාණෙනි,'' කෑ ගැසූ තරුණයා වැලපෙන්නට විය.

''ඔබ තව මඳක් හෝ බරින් වැඩි වුණා නම් දරුවා, අප දෙදෙනාම

අද මළවුන් අතර. මෙතැන ආරක්ෂක නීති කැඩීම වෙනුවෙන් නුඹට ලැබෙන දඬුවම මසක කාලයක් රෙදි අපුල්ලන වැඩ.''

කන්ද පාමුල රැඳී සිටි තරුණයාගේ මිතුරෝ ඔහු වැළඳගෙන සුබ පැතුවේ රජුගේ එඩිතරභාවය ගැන බොහෝ සේ වර්ණනා කිරීමෙන් පසුවයි.

එහෙත් කුල් හෙඩ් තවමත් කණගාටුවෙනි.

''තරුණයාගේ පණ බේරුණා. ඉතින් එය නොව ගැටලුව?'' පියැන්කි කීය.

''උතුමාණනි මා ඔබට සියල්ල පැවසුවේ නැහැ.''

''පවසන්න.'''

''මා බියෙන් සිටි දේ සිදුවී හමාරයි උතුමාණනි. ඔබේ රාජ සභාවේ සමහරුන්, ඇත්තටම වැදගැම්මකට නැති අය, සිහසුනට ඇති ඔබේ අයිතිය ගැන ප්‍රශ්න කරනවා.''

# 05

කළු පාරාවෝ ගිබෙල් බාර්කල් මුදුනත දෙස බැලීය. ''බලන්න කුල්හෙඩ්.'' ඔහු පැවසීය. ''මේ ජයග්‍රහණය මගේ නාමය බොහෝ කල් පවත්වාගනීවි. මේ ජීවී ගල මත කළ කැටයමයි සදාකල් පවතින්නේ.''

කුල්හෙඩ්ගේ නම ඔහුටම ගැලපෙන්නකි. ඔහු විඩාවට පත් නොවන සරල මිනිසෙකි. මතුපිට ඔපය ගැන කිසිවිටක නොසිතන්නෙකි ඔහු. රජු තමා පැවසූ වදන්වල බියකරු බව අවබෝධ කරගෙන නැති බව දත් ඔහු නැවතත් එය අවධාරණය කිරීමට කල්පනා කළේය.

''උතුමාණනි, මා ඔබට නැවතත් පවසන්නේ එය සාමාන්‍ය තත්ත්වයක් නොවෙයි. එය ඔබේ පුද්ගලික බලයට එරෙහි සත්‍ය කැරැල්ලක්. මා අවංකවම පවසන්නේ උතුමාණනි, මට විශ්වාසයි ඔබේ කනිෂ්ඨ බිසවක් මීට සම්බන්ධයි කියා.''

''මෙවැනි ඉතා සුළු දේ ගැන අප කලබල විය යුතුද?''

''මෙය බරපතල කාරණාවක් උතුමාණනි.''

''මට සිහසුන අහිමිවුවහොත් එය එතරම්ම විනාශකාරීද ජනතාවට?"

"එසේයි, උතුමාණනි එසේයි. මීට මැදිහත් වන තැනැත්තා ඔබේ නායකත්වය හෝ ඔබේ පියාගෙන් පැවත එන කරුණු ගැන සැලකිල්ලක් දක්වන්නේ නැහැ. ඔහුට අවශ්‍ය එකම දේ නුබියාවේ රත්රන් අයිති කර ගැනීම සහ එහි වස්තුව පුද්ගලික ලාභය හා විනෝදය සඳහා යොදා ගැනීමයි.''

පියැන්කි ඒ වදන් දැඩි සේ සිතට ගත්තේය. සිහසුන අත්හැරීම ඔහුට ඉතා සුළු කරුණකි. එහෙත් පරම්පරා ගණනාවක සිට රැකගෙන එන වටිනාකම් විනාශ කිරීම ඔහුට දරාගත නොහැකිය.

''මා දෙවොල බලා යනවා. මගේ ආමන් දෙවියන් මට මග පෙන්වාවි.''

කුල් හෙඩ්ට අවශ්‍ය වූයේ ඒ මොහොතේම රාජ සභාව කැඳවන රජු, තම පුපුරුදු බලය විහිදුවනු දැකීමටය. එහෙත් පියැන්කි තම තීරණය වෙනස් නොකරන බව ඔහු දැන සිටියේය.

ශුද්ධ වූ කන්ද පාමුල පිහිටි ආමන් දෙවොල කළු පාරාවෝගේ ආඩම්බරය හා සතුට විය. තීබසයෙන් සැතපුම් ගණනක් මැතින් පිහිටි මෙහිද, ඔහු දෙවියන්ගේ රජු සඳහා මන්දිරයක් තනවා තිබිණි. එහි වූ බටහිර හා නැගෙනහිර සංකේතවත් කරන කුලුනු දෙක වෙත දිවෙන මග දෙපස වූයේ ආමන්ගේ භෞමික ස්වරූපය වන බැටළුවන්ගේ පිළිරූය. එතැනින් ඒ මග දිවෙන්නේ උත්සව දවස්වල්දී වැදගත් අමුත්තන් පිළිගන්නා අති විශාල කුලුනු ශාලාව වෙතයි. ඉන් එපිටද දෙවැනි දොරටුවක් හා දෙවැනි කුලුනු ශාලාවක් විය. එතැනින් එපිට පිහිටියේ ප්‍රධාන දෙවොලයි. එතුළ ආමන් දෙවියන්ගේ පිළිරුව තැන්පත් කරන ලද දේව මන්දිරය විය. එය දෙවියන්ගේ ආත්මීය බලය පැවැත්වෙන ස්ථානය වූ අතර ඊට ඇතුල් විය හැක්කේ රජුට පමණි. දිනපතාම පළමු හිරු රැස් ලොව දෙස බලන්නා හාම පියැන්කි එහි දොරටුව විවෘත කරයි. එහි ඇතුල් වී ප්‍රතිමාවට පුද පූජා පවත්වා, සුවඳ පැනින් නහවා, අලුත් පිළියෙන් සරසා, ආහාර පූජාවෙන් එහි ශක්තිය අලුත් කරයි. ඉන්පසු එය නැවතත් තිබූ ස්ථානයේම තැන්පත් කරයි.

සවස් කාලයේදී දෙවොල වසා පැතිර තිබුණේ නිහඬ බවකි. චාරිත්‍ර පවත්වන්නෝ තම තමන්ගේ පුද්ගලික කුටි තුළට වී පූජනීය භාණ්ඩ සෝදා පිරිසිදු කරති. දෙවොල් බිත්ති මත මූර්තිමත් කරන ලදුව, නිහඬවම එකිනෙකා දෙස බලමින් කතාබහේ යෙදෙන දෙවි දේවතාවියන්ගේ මුහුණු පිරිසිදු කරති.

පියැන්කි විසින් තනන ලද මේ දෙවොලට ඇතුල් වන කාර්නැක්හි පූජකයකුට තම නිවසේම වෙසෙන බව දැනෙනු නියතය. මන්ද යත් මෙහි, නපාටාහි, මින් පෙර ජීවත් වූ පාරාවෝ වරුන්ගේ ගෞරවය රකිමින් කළු පාරාවෝ දිනෙන් දිනම එය අලංකාරව තබන නිසාය. එමගින් ආමන් දෙවියාගේ පණිවිඩය ලොවට ගෙන යාම ස්ථිර කෙරේ.

දෙවොල තුළ තුත්මෝසිස් III ගේ ශිලා ලේඛනයක් තිබිණි. කළු පාරාවෝ ඔහු ගිය මග යන්නෙකි. පළමුවැනි සේටි හා දෙවැනි රැම්සීස් කළු පාරාවෝට ආදර්ශය දුන් අනෙක් දෙදෙනාය. මේ රජවරු තිදෙනා ගොඩබිම් දෙකේ පූජනීයත්වය රැක ගත්හ. දිව්‍යමය කැමැත්ත හා සමාදානය ඇතිව, සැසඳිය නොහැකි ආදරයක් ඔවුන් තුළ විය. ටූටන්කාමන්ගේ කුඩා දෙවොලද ආරක්ෂිතව තිබූ අතර එහිද දේව ප්‍රතිමා තබන ලද්දේය.

දෙවොල තුළ තවත් ඇතුළට යනවිට එහි කාමර වඩාත් කුඩා වන අතර වඩාත් අඳුරු වෙයි. ඇතුළත ගර්භයට පා තැබූ විට එහි තිබෙන රහසිගත ආලෝකය පෙනෙන්නේ හදවතේ දෑසට පමණි. ජීවිතයේ ගුප්ත බව කිසිවෙකුට කිසි දිනක විස්තර කළ නොහැකි වුව, එය අත්දැකීමට බෙදා ගැනීමට හැකිය.

පියැන්කි හුණු ගලින් කරන ලද සිංහ රුවක් අසල නැවතුණි. ඒ සත්ත්වයාගේ සෑම අවයවයක්ම අසිරිමත් ලෙස නිමවා තිබිණි. නුබියාවේදී ආමන් මෙම සත්ත්වයාගේ රුවින් පෙනී සිටින්නට කැමතිය. සිංහයාගේ නම චිත්‍රලේඛන වල සඳහන් වූයේ 'මායි' ලෙසයි. එහි තේරුම 'දකින්නා'ය. මේ අඳුරු කාමරය තුළ කොතැනක සැඟවුනද මැවුම්කරුගේ දෑසින් නම් සැඟවිය නොහැකිය. ප්‍රතිමාවේ පදනමේ මෙසේ සඳහන් වෙයි. ''දෙවියෝ තමන්ට විශ්වාසවන්ත අය හඳුනති. උන් වහන්සේගේ පැමිණීම සතුට දනවයි. එසේම අසතු ලබන සියල්ලට පිළිතුරු දෙනු ලැබේ.''

එම හුණුගල් සිංහ ප්‍රතිමාවට එපිටින්, ආමන් වෙත දූත්නක් පිළිගන්වන කැටයමක් වෙයි. දෙවියෝ පියැන්කි ගත යුතු මඟ පෙන්වා දෙති. ඔහු සටන් කළ යුතුය.

✸

ඒ සන්ධ්‍යාව ඉතා සුන්දරය. උණුසුම්ය. එය ගොපල්ලන් බටනළා පිඹින වේලාවයි. ලියන්නා තම පින්සල බිම තබන වේලාවයි. ගෘහිනිය බැස යන හිරු දෙස බලාගෙන විවේක ගන්නා වේලාවයි. වෙහෙස අමතකව යන මෙම ඉන්ද්‍රජාලීය මොහොතේ දවස පුරා තිබූ කරදර අමතකව යයි.

පියැන්කි තම මහ රජිනගේ කාමරයට ඇතුල් වන විට ඇය එහි නොවූවාය. සඳළුතලයේ රැඳී බැසයන හිරුගේ රැස් විඳින ඇය, ඔහුට පෙනිණි.

තිස්පස් වියැති අබිලා ඉතා රූමත්ය. උස, සිහින් සිරුර සිහිකර දෙන්නේ නෙෆර්ටිටි රජිනගේ රුවයි. ඒ සිරුරටම ගැලපෙන දිගැටි මුහුණ ඇයට නියම රාජකීය පෙනුමක් ලබාදෙයි. පියැන්කි අන් සියලු තරුණියන් ප්‍රතික්ෂේප කොට, ඉතා දිළිඳු පූජකයකුගේ දියණිය වූ අබිලා විවාහය සඳහා තෝරාගෙන තිබිණි. ඇගේ පියා ඊජිප්තුවේ පුරාණ චාරිත්‍ර පිළිබඳ මහා දැනුම් සම්භාරයක් හිමි අයෙකු වූ අතර ඔහු ඒ සියලු දැනුම පියැන්කිට පිරිනැමීය. හිරු නැඟී බැස යාම ඇගේ රුවට කිසිදු බලපෑමක්

නොකළ සැටියකි. අනෙක් අතට, මුහුකුරා යාමද ඇගේ රුව වැඩිකර තිබිණි. නපාටාහි ඇගේ රුව පරදන අන් කිසිවෙක් නොවීය.

විනිවිද පෙනෙන ඇඳුමකින් සැරසී සිටි අබිලා තම විදාහල වරලස හා අඩ නිරුවත් සිරුර සුවඳ ගන්වමින් සිටියාය. බැසයන හිරුගේ රැස් දහරින් ඇගේ සිරුර රන් පැහැයෙන් දිලිසිණ.

හාත්පස අඳුර පැතිර යද්දී ඇය තවත් සිවුරකින් සිරුර වසා ගත්තාය. ඇය ඔහු දුටුවේ එවිටයි.

"ඔබ මේ දැන්ද පැමිණියේ ස්වාමීනි?"

"මට බැරිවුණා ඔබේ භාවනාවට බාධා කරන්නට."

ඔහු බොහෝ කලකට පසුව හමුවූ විටෙක මෙන් ඇය වැළඳ ගත්තේය. කොතරම් අකැමැති වුවද, කොතරම් කෝප වුවද ඇයට ඔහුගේ ඉන්ද්‍රජාලයෙන් ගැලවෙන්නට නොහැක. මේ රජු තමා රැක ගන්නා බවත්, ඔහු ඇයට ආදරය කරන බවත්, දැන සිටීම ඇගේ බලවත් සතුටට හේතුවිය. ඔහු කොතරම් ශක්තිමත්ද යන සිතිවිල්ලෙන් ඇය වෙවුලා ගියාය.

"දඩයම කෙසේද ස්වාමීනි?"

"රාජ සභාවට මස් වලින් හිඟයක් නැහැ. එහෙත් එය ඔවුන්ගේ ගෙරවිලි නවත්වන්නට තරම් නොවෙයි."

"ඔබ ඔවුන්ට බියද?'"

"තමාට එරෙහිව එන කැරැල්ලක් අමතක කරන ඕනෑම රජෙක් රාජ්‍ය පාලනයට නුසුදුසුයි."

අබිලා තම කම්මුල ඔහුගේ උරහිසේ තැබුවාය. "කුමන්ත්‍රණය? එය එතරම් භයානකද?"

"රජතුමාගේ මහ රැජින තවමත් එය නොදන්නා බව නොපවසන්න, ප්‍රේමිය."

"මා සිතුවා ඒ සියලු කටකතා අසත්‍යයි කියා."

"එහෙත් කුල් හෙඩ් එසේ සිතන්නේ නැහැ."

"කුල්හෙඩ්.... ඔබ හැමවිටම ඒ ලියන්නා කියන දේ පිළිගන්නවාද?"

"ඔබ මට දොස් පවරනවාද එසේ කරනවා කියා?"

අබිලා පියවරක් පසුපසට තබා පියැන්කි දෙස බැලුවාය. "ඔබ නිවැරදියි ස්වාමිනී. කුල්හෙඩ් ඔබට ද්‍රෝහි වන්නේ නැහැ. ඔබේ කනිෂ්ඨ

භාර්යාවක්, ඊර්ෂ්‍යාකාර පූජකයින් කීප දෙනෙක්, මෝඩ රාජ සභිකයින් කීප දෙනෙක් හා බලයට ගිජු ඇමතියෙක්........ කෙසේද ඔබ ඔවුනට බියවන්නේ, ඔබ වසර විස්සක් රාජ්‍ය පාලනය කර තිබියදීත්? ඔබට ආදරය කරන ඔබේ හිතවතුන් ඔබ වෙනුවෙන් දිවි පුදාවි.''

''අබිලා, උඩඟුකමට ප්‍රතිකාර නැහැ. එය සියල්ලන්ගේම විනාශය ළඟා කරනවා. මිනිසාගේ හෘද සාක්ෂිය නසා දමනවා.''

''කුමක්ද ඔබේ සැලසුම?''

''මා ආමන්ට ආයාචනා කළා යා යුතු මග පෙන්වන ලෙසට. ඔහු මට පිළිතුරු දී තිබෙනවා ප්‍රේමිය.''

# 06

ඒ උණුසුම් නිසල රාත්‍රියේ පියැන්කිගේ මුදල් ඇමති ට්‍රැනාන්, තම ජයග්‍රහණය දකිමින් සිටියේය. තම ගෙළයනේ වූ උසම පාම් ගස යට ඉඳගෙන, ඔහු තමා වෙත ළං ළංව එන ජයග්‍රහණයේ සුවඳ වින්දේය. වයස පනස් හතරේදී ඔහු පියැන්කිගේ රජයේ උසස්ම ගෞරවණීය තනතුර දැරීය. නපාටාව මධ්‍යයේ අත්‍යලංකාර නිවසක, තීබසයේ ප්‍රභූවරයකු ලෙස දිවි ගෙවුවේය. ඔහු වාසනාවන්ත සැමියෙකි. දරු පස් දෙනෙකුගේ පියෙකි. රජයට බැඳී සේවය කරමින් සිටි ඔහු ගත කළේ සැපවත් දිවියකි.

එහෙත්, ට්‍රැනාන් පියැන්කිගේ රාජ්‍යයේ සැඟවුන සම්පත් ගැන දැන සිටියෙකි. සත්‍ය වශයෙන්ම එම රාජ්‍යයේ පිටතින් පෙනෙන දිළිඳුකම මායාවකි. නයිල් නදී තීරයේ සාරවත් ගෙවතු, දඩයම් හා ධීවර කර්මාන්තය, රටඉඳි.... රාජ්‍යයේ නියම වටිනාකම ඉතා කෙටි කාලයකදී ගණන් බැලිය හැකිය. එහෙත් දුර සිට බලන ඕනෑම කෙනෙක් නපාටා යනු දිළිඳුකමින් බැටකන පළාතක අගනුවර යයි සිතනු ඇත.

නුබියානු භූමිය තුළ සැඟවුන රන් කොතෙක්ද? ඉතා උසස් තත්ත්වයේ රන් පවා ඕනෑතරම් තිබිණි. මින් පෙර සිටි රජවරු නුබියාව ජනපදයක් බවට පත් කළේද රන් හේතුවෙනි. ඔවුන් එසේ කළේ රන් පතල් පාලනය කිරීමේ පහසුව තකාය. වර්තමානයේදී කළු පාරාවෝ පතල් කැනීම් පාලනය කරයි. රන් නිපැයුමද පාලනයට ලක්වෙයි. කැදරකම පාලනය කෙරුනේ එසේයි. එහෙත් කෙසේද පියැන්කි මේ අති මහත් වූ වාසනාවෙන් ප්‍රයෝජන ගන්නේ? ඔහු ඒ සියල්ල ආමන් දෙවොලට පූජා කළේය. තම ජනතාවගේ ජීවිත සුඛිත මුදිත කරන්නට යොදා ගත්තේය.

රාජ්‍යයේ මුදල් ඇමති ලෙස ට්‍රැනාන්ට මේ තත්ත්වය දැරිය නොහැකිය. තමාගේම වස්තුව ගැන අනවබෝධයෙන් සිටින පාලකයෙක් දුර්වල පාලකයෙකි. කෙදිනක හෝ රජකමෙන් පලවා හැරීමට එයම සුදුසු කමක් නොවේද? ට්‍රැනාන් පියැන්කිගේ තැන සිටියේ වී නම් ඔහු

මහජනතාවට ඉතා සුළු කොටසක් දී තම මිතුරන් සමග අති සුඛෝපභෝගී දිවියක් ගත කරනු ඇත. මහලු වියට පා තබමින් සිටින තම බිරිඳට නිදහස දෙන ඔහු, තරුණ වෛශ්‍යාවන් සමග සංචාරයේ යෙදෙමින් සතුට සොයනු ඇත. එවිට, විදෙස් කුමාරවරුන් ඔහුගෙන් ලැබෙන සංග්‍රහ ගැන විස්මයට පත්වනු ඇත.

පියැන්කි සමග කුමන අනාගතයක්ද? කළු පාරාවෝ තම පූජනීය කන්දට, ආමන් දෙවොලට හා අගනුවරට කොතරම් බැඳී සිටියේද යත්, ඔහු තුළ ව්‍යාපාරයක් ගැන සිතිවිල්ලක් හෝ නොවීය. ඉතින්, මේ ප්‍රතිපත්ති වෙනස් කළ යුතු කාලය එළඹ තිබිණි.

ට්‍රැනාන්ගේ ආවතේවකරු සිසිල් වයින් කෝප්පයක් හා මී පැණි දිසියක් ගෙනාවේය. ''උතුමාණනි, ඔබේ බිරිඳ ආහාර ගන්නට ඔබ එනතෙක් බලා සිටිනවා.''

''පවසන්න ඇයට දරුවන් සමග ආහාර ගන්න කියා. මට කරදර නොකරන්නැයි කියන්න. මගේ අමුත්තා පැමිණි විගස ඔහුව සම්බාහන කාමරයට ගෙනියන්න. කිසිවෙකු අපට බාධා නොකළ යුතුයි.''

ට්‍රැනාන්ට තනිව ක්‍රියාත්මක විය නොහැක. ඔහුට රාජ සභිකයන් කීප දෙනෙකුගේ සහාය අවශ්‍ය බව සත්‍යයකි. එහෙත් පාරාවෝගේ හඬ උස්ව නැගුන විගස ඔවුන් ඔහුගේ දෙපා මුල වැතිරෙණු ඇත. අනෙක් අතට, රජු විසින් නොසලකා හරින්නට යෙදුනු කතිජ්ය රජිනක් ඔහුට වෛර කරමින්, ඔහු විනාශ කරන්නට සිහින මැවුවාය. මේ සියල්ලන්ටම වඩා වැදගත් කෙනෙක් ට්‍රැනාන්ට සිටී. ඔහුට වඩාත් වැදගත්, ඉතා වටිනා ඒ තර මිනිසා තම සුළු මොහොතකින් සම්බාහන කාමරයට ඇතුල් වීමට නියමිතය.

ඔටොකු, ගවයකු තරම්, බොහෝ විට ඊටත් වඩා බරය. ඔහු පුරුද්දක් ලෙස ආහාරයට ගත් ගවමස්, සෝස් වර්ග හා ක්‍රීම් පිරවූ පේස්ට්‍රි ඔහුට ඒ තත්ත්වය ලබා දී තිබිණි. ඔහුගේ සිරුර රන් මාල හා මුදු වලින් පිරී ගියේය. ඔහුගේ ඇඳුම පවා රන් නූලෙන් වැඩ දැමූ එකකි. කිසිවෙකුට ඔහුට අත තැබිය නොහැකිය. එසේ වුවහොත් ප්‍රහාරකයාගේ හිස මත රන් යගදාව පතිත වනු නියතය. ඔටොකු, නුබියානු ගෝත්‍රික නායකයෙකි. එම ගෝත්‍රිකයෝ අති විශාල පතලකින් රන් ලබාගත්තවුන් වූහ. වසර ගණනාවක සිට ඔවුන් කළු පාරාවෝට පක්ෂපාතීව සිටි නමුත් කාලයත් සමග සුළු සුළු වෙනස්කම් ඇතිවී තිබිණි.

ඔටොකුගේ සුප්‍රසිද්ධ සංවේදීබව සිහි තබා ගනිමින් ට්‍රැනාන් පියවරෙන් පියවර ඔහුට ළං වූයේය. ඔහුගේ විශ්වාසය දිනා ගැනීමේ අභිප්‍රායෙන් දැඩි පරීක්ෂාවෙන් ඔහුට ළං වූයේය. වාසනාවට මෙන් තර මිනිසා තෑගි වලට ගිජුය. විශේෂයෙන්ම කළුවර මංජුසා සහ සීතල රැයක ගෙල වටා එතෙන වූල් ලේන්සු ඔහුගේ ප්‍රියතම තෑගි විය.

එහෙත් ඔටොකු තුළ දුර්වලතාද විය. ඉන් ප්‍රධාන වූයේ සම්බාහනයට ඇති කැමැත්තයි. සෑම දිනකම ඔහු පැය ගණනාවක් පුරා සිරුර කිති කවන සියුමැලි දෑත්වල සම්බාහනයට තම සිරුර පුද කළේය. තමා අති විශිෂ්ට හැකියාවන්ගෙන් යුත් නවක සම්බාහන තරුණියක බඳවා ගත්තැයි ට්‍රැනාන් පැවසූ මොහොතේ ඇය හමුවීමට තර මිනිසා තුළ උපන්නේ දැඩි නොඉවසිල්ලකි.

එහෙත් නීච මිනිසෙකුගේ භූමියට පා තැබීම ඔටොකුගේ ගෝත්‍රයට තහනම්ය. ඔහුට සිටින එකම ජ්‍යෙෂ්ඨයා පාරාවෝය. ඒ නිසාම ඔටොකු, කේඩෑරි මිනිසුන් සිව්දෙනකු විසින් ඉතා අපහසුවෙන් ඔසවාගෙන ගිය රන් ආලේපිත පුටුව නිවස තුළටම ගෙන යන ලෙස ඔවුනට අණ කළේය.

''ඔටොකු උතුමාණනි, ඔබේ පැමිණීම මට ගෞරවයක්.'' තම අමුත්තාට ගැලපෙන අත්‍යවශ්‍ය වචන යොදා ඇමතීමේ වැදගත්කම දන්නා ට්‍රැනාන් පැවසීය.

''නිහඬ වනු. නිහඬ වනු. මට කොන්දේ අමාරුවක්. වහාම ඊට ප්‍රතිකාර කරනු.''

එහි වූ පඩිතුන නැගීමේදී පුටුව ඔසවාගත්තවුන්ගේ අවසන් ශක්ති මාත්‍රයද සිඳී ගියේය. සේවකයකු විසින් තබන ලද කොට්ටය මත තම විශාල බඩ තැබූ ඔටොකු දණ ගසන අලියෙකු සේ පහළට රුටා මුනින් තලා විය.

''කොහිද ඔබ පැවසූ සම්බාහන තරුණිය?''

''ඇය මෙහි සිටිනවා උතුමනි.''

දුර්වල පෙනුමැති සිරියාවනු තරුණියක්! ඇගේ කෙස් කෙටිය. දුඹුරුය. ඇය තර මිනිසාගේ පිටට නැග්ගාය. ඉක්බිති තම සියුමැලි දෑතින් ඔහුගේ කොන්ද පිරිමැද සුවඳ ගන්වන ලද උණුසුම් තෙල් ඒ ලෙලදෙන මාංශය මත තැවරුවාය.

''කුමක්ද ඒ? එය නම් කදිමයි.'' ඔටොකු පුදුමයෙන් කෑ ගැසීය.

''තීබසයේ උත්සව අවස්ථාවල ගන්නා තෙලක් උතුමාණනි. එය මහා රැම්සීස්ගේ සිරුරේත් ගෑල් වූ බව සැලයි.''

තර මිනිසා තෘප්තිමත්ව ගෙරවීය. තරුණියගේ සියුමැලි අතැඟිලි ඔහුගේ මාංශයේ වූ ආතතිය ටිකෙන් ටික බුරුල් කළාය.

ට්‍රැනාත් ඒ ප්‍රතිකාරයට කිසිසේත්ම බාධා නොකිරීමට වගබලාගති. ඇත්තටම ඔටොකු ඒ ප්‍රතිකාරය වෙනුවෙන් ට්‍රැනාත්ට ණය ගැතිය.

''කදිමයි. පොඩිත්ති කදිමයි.'' සම්බාහනය අවසන ඔටොකු තරුණියට කීවේය. ''නුඹට ලැබේවි රත්තරන් කුඩු මල්ලක්.''

ඇය පිටව ගිය පසු ඔහු නැවතත් තම පුටුවට බර ගෑවේය.

''ඉතින් ට්‍රැනාත් මා මිත්‍රය, කිමද ඔබ මා නපාටා වෙත කැඳවන්නට කාරණය?''

''ඒ තරුණිය.....''

''නුඹේ සිරියානු පොඩිත්තිය බොහොම දක්ෂයි. දැන් අපි කතා කරමු වඩාත් වැදගත්දේ. ඔබ දන්නවා මම ගමන් යාම සහ මගේ ගමෙන් පිටවීම කොතරම් පිළිකුල් කරනවාද කියා.''

ට්‍රැනාත් තැති ගැන්මෙන් එහෙ මෙහෙ ඇවිද්දේය. ''කාරණය ඉතා බරපතලයි උතුමනි. ඔබයි රාජ්‍යයේ ප්‍රධාන රන් නිපැයුම්කරු. මමයි මුදල් ඇමති. පියැන්කි සහ ඔබත් මාත් පමණයි නුබියාව සතු වස්තුව ගැන දන්නේ. අවංකවම උතුමනි, මට දැනෙන ලෙස පියැන්කි එය හොඳින් පාවිච්චි කරන්නේ නැහැ.''

''ඔබ පවසන්නේ පාරාවෝ අවංක නැති බවද?''

''නැහැ. ඔහුට නැත්තේ සිතීමේ බලය. බොහෝ නිලධාරීනුත් එසේ සිතනවා. අපගේ අගනුවර ධනය හිඟවෙමින් පවතිනවා, පියැන්කි ඒ පෞරාණික චාරිත්‍ර වලට බැඳී ඒවාට ගරු කරන නිසා. ඔහු රට පාලනය කළා විසි වසරක්. ඔහුට අමතකයි අනාගත අවශ්‍යතා, වෙනස්කම් හා ඉල්ලීම්. ඔබත් මාත් එක් නොවුණහොත් නපාටා විනාශ මුඛයේ.''

ඔටොකුගේ ඇස් හීන් විය. ''කෙසේද අප එක්වන්නේ?''

''රාජ සභාවේ කොටසක්, සිහසුනට පියැන්කි සතු අයිතිය අභියෝගයට ලක් කරනවා. ඔහුව තෝරාගත් අයම ඔහුගෙන් පසු රජවන අය නම් කරනවා.''

''ඔහුගෙන් පසු රජු...... ඒ ට්‍රැනාත්ද?''

"ඔටොකු උතුමාණන් මුදල් ඇමති පදවිය බාරගෙන එහි කටයුතු කරනවා නම් පමණයි."

"එවිට.... මගේ ජනතාව භූමිය කැන ලබාගන්නා රන් වලින් වැඩි කොටසක් මට ලැබෙන පොරොන්දුව පිටද?"

"එසේයි, එසේයි."

තර මිනිසා තෘප්තිමත් බව පෙන්වා 'ගර ගර' ගා රාමතෙල් යැවීය. තමාට ජයගත හැකිබව දැන් ට්‍රැනාන්ට විශ්වාසය. මිනිසකුගේ කෑදරකම හඳුනාගෙන ක්‍රියා කළ විට ලැබෙන ප්‍රතිඵල සාර්ථකය. දැන් ඉතින් පියැන්කිගේ අවසානය ළඟා වනු ඇත.

එහෙත්.... එක්වරම බළලෙකු සේ ඉදිරියට පිනූ ඔටොකු, ට්‍රැනාන්ගේ ගෙල සිරකොට අල්ලා ගත්තේය. "බොහෝ කලක සිට මා දැන සිටියා තා නීච වංචනිකයෙකු බව. පාරාවෝ ප්‍රාර්ථනා කළ තරම් ගෞරවනීය සේවකයකු නොවන බව. තට එකක් අමතකයි ට්‍රැනාන්. පියැන්කිත් මාත් වසර විස්සකට වැඩි කලක් හොඳ මිතුරන්. සත්‍ය මිතුරන් කිසිදා එකිනෙකාට ද්‍රෝහි වන්නේ නැහැ."

# 07

ජීවිතාන්තය දක්වාම පතලක වැඩ කිරීමේ දඬුවම ලද ට්‍රැනාත් කිසිදා ආපසු නොඑනු ඇත. කෙසේ වෙතත් ඔටොකුගේ සිතට සැනසිල්ලක් නොවීය. ඔහු කළේ තම තුඩට නොගැලපෙන තරම් බඩගින්නක් තිබූ කුඩා දෙබරකු විනාශ කිරීම පමණි. පියැන්කිගේ හිසමත එල්ල වී තිබූ තර්ජනය ඊට වඩා බලවත්ය.

ප්‍රධාන කවුන්සිලය සෑදී තිබුණේ රජුගේ හිතවතුන්, සහායකයින්, වැඩිහිටියන් හා පූජකයින්ගෙනි. විසි වසරකට පෙර ඔවුන් විසින් ඒකමතිකව තෝරා ගන්නා ලද පාරාවෝයි පියැන්කි. එහෙත් දැන් දැන් ඔවුන් පාරාවෝගේ හැසිරීම ගැන බරපතල චෝදනා එල්ල කිරීමට සූදානම්ය. මේ චෝදනා වලට පදනම් වී ඇත්තේ ට්‍රැනාත් විසින් ඉදිරිපත් කරන ලද අසත්‍ය වාර්තා, පියැන්කිගේ කනිෂ්ඨ භාර්යාවක විසින් දොඩවන්නට යෙදුන වල්පල් සහ ආමන් දෙවියන්ට තිබූ භක්තිය අඩු වී ඇතැයි මුසාබස් දොඩන පූජකවරුන්ගේ කේළම්ය. මේ තර්ජනය කල්වේලා ඇතිව දැනගත්තේ නම්, මේ සියලු බොරුකාරයින්ගේ ගෙල තම දෑතින්ම මිරිකා දමන්නට ඔටොකුට හැකියාව තිබිණි. එහෙත් දැන් ප්‍රධාන කවුන්සිලය කිසිදා නොවූ තරම් ශක්තිමත්ව, කිසිවකුට නවතාලිය නොහැකි තරමට ඉදිරියට ගොස් තිබිණි.

මේ අපහාසාත්මක චෝදනා පරාජය කිරීම පියැන්කිට අපහසුවක් නොවන බව සත්‍යයකි. එහෙත් එයින් ඔහුගේ කීර්තියට වන හානිය බරපතලය. ඉනුදු නොනැවතී සිදුවිය හැකි බරපතලම හානිය වන්නේ ඔහු සිහසුන හැරදා ආමන් දෙවොලට ගොස් එහි රැඳෙන්නට තීරණය කිරීමයි. ඔටොකු තම මිතුරා හොඳින් හඳුනයි. පවතින තත්ත්වය තම වගකීම් වලින් නිදහස් වීම සඳහා ඔහුට අවස්ථාව දෙයි නම්, ඔහු කිසිවිටකත් බලයේ රැඳී නොසිටින බව ඔටොකු දැන සිටියේය. එසේම පියැන්කිගේ තැනට සුදුසු අන් කිසිවෙක් රාජ්‍යය තුළ නොමැති බවද ඔහු දැන සිටියේය. ඔහුගේ ඉවත්වීම නපාටාවට, නුබියාවට මෙන්ම ඊජිප්තුවටද විපතක් වනු නිසැකය.

මේ චෝදනාවෙන් ගැලවෙන්නට සූදානම් වීම පසෙකලා, රජු තම ප්‍රියතම අශ්වයා වූ වැලියන්ට් පිට නැගී කාන්තාරයට ගොස් තිබිණි. ඒ විශිෂ්ටතම සත්ත්වයාට ඔහු කැමතිම අති විශාල නිදහස් භූමිය විඳින්නට අවස්ථාව ලබා දීමද ගමනේ එක් අරමුණක් විය. මේ දෙදෙනා ප්‍රධාන කවුන්සිලය ඇරඹෙන්නට පෙර ආපසු නොඑනු ඇත.

✸

පියැන්කිගේ ළාබාලතම කනිෂ්ඨ බිරිඳ වහා කෝපවන, දාහත් වියැති තරුණියකි. ඇගේ පියා ඇය නපාටාවට ගෙන ආ දවසේ, ඇයට කිසිදා පාරාවෝ දකින්නට නොලැබෙන බවත්, එම රාජ්‍ය තාන්ත්‍රික විවාහය සිදුවන්නේ සිවුවැනි ඇළ මාර්ගයේ දකුණු දෙස වෙසෙන ජනතාවගේ ප්‍රධානියාගේ උරුමක්කාරිය ලෙස රජුට ඇති පක්ෂපාතිත්වය පෙන්වීමට බවත් ඇයට කියාදී තිබිණි. කෙසේ වෙතත් රජ මාළිගාවේ සිටි වඩාත්ම රූමත් තරුණිය ඇයයි. ඇයට රජු සමග සයනය බෙදා ගන්නට අවශ්‍ය විය. එමගින් ඇයට අවශ්‍ය පරිදි සියල්ල කළ හැකිවනු ඇතැයි ඇය කල්පනා කළාය.

ඇය පියැන්කිට ළං වීමට හැකි සෑම උත්සාහයක්ම ගත්තද, කිසිම පිළිවෙලක් නැති ඒ උත්සාහයන් ව්‍යර්ථ විය. නැවත නැවතත් ලැබුණේ එකම ප්‍රතිඵලයයි. රජුගේ නිලධාරීන්, විශේෂයෙන්ම ඔහුගේ ලේකම් ලෙස කටයුතු කළ අඟුටුමිට්ටා, රජුගේ කීර්තියට බාධාවන සියල්ල වැළැක්විය. රජුගේ කනිෂ්ඨ භාර්යාවක වූ, ගෝත්‍රික නායකයාගේ දියණියද බාධාවකි! තමා නොසලකා හැරීමෙන් දැඩි කෝපයට පත් ඇය තම රුව අගය කිරීමට නොදත් ඒ ඒකාධිපතියාගෙන් පළිගැනීමට ඉටා ගත්තාය. පියැන්කි දූෂිතයෙකු බවත්, රාජ්‍යයේ ධනයෙන් වැඩිම කොටස තම ප්‍රයෝජනය සඳහා සොරකම් කරන බවත් ප්‍රධාන කවුන්සිලය ඉදිරියේ හෙළි කිරීමෙන් ඔහුගේ කීර්තිය දෙදරා යනු ඇත. අලුත් පාරාවෝ ලෙස පත්වන තැනැත්තා ඇයට රාජ සභාවේ නිසි තැන ලබාදෙනු ඇත.

තම සයනාගාරයේ වාඩි වී නිල් කැට හා රතු කැට, කුඩා රන් කැබලි වලින් යාකොට තනන ලද කර මාලයක් ගෙලට තබා හැඩ බැලුවාය. ''එය සවිකරන්න'' ඇය තම සේවිකාවට අණ කළාය.

''මෙය සුදුසු මහ රැජිනකටයි. ඔබ රැජිනක් නොවේ.''

ඒ වදනින් දැඩි කෝපයට පත් තරුණිය හැරී බැලුවාය. ඇයට මුහුණ ලා හිටගෙන සිටියේ මහ රැජින අබිලාය.

''මේ මාළිගය ඔබව පිළිගත්තා පොඩිත්ති. ඒත් ඔබ ඒ විශ්වාසය කඩකළා. එපමණක් නොවෙයි. ඔබ පාරාවෝ ගැන අසත්‍යය පවසා ඔහුට එරෙහිව කුමන්ත්‍රණයක් සූදානම් කළා.''

බියට පත් තරුණිය නැඟී සිට ගොත ගැසුවාය.

''එය අපරාධයක්.'' අබිලා කීවාය. ''රාජ අපරාධයක්. ඊට දඬුවම දීර්ඝ කාලීන සිරදඬුවම්. එහෙත් ඔබ තවම දරුවෙකු වැනියි. ඔබේ හදවත පිරී පවතින්නේ වෛරයෙන්. පියැන්කිගේ කීර්තිය කෙළෙසීමට ඇති සිතිවිලි ඉවත දමන්න. එසේ නොවුණහොත් නුඹට මගේ ඇති බැඳීම සුනුවිසුනු වේවි. මා කොටි දෙනකට වඩා දරුණු වේවි.''

''කුමක්ද ඔබ මට කරන්නේ?''

''නුඹ නුඹේ ජනයා වෙත ආපසු යැවෙනවා. එහිදී නුඹට උසස් කාන්තාවන් උගන්වාවි, හොඳින් වැඩකර නිවසක් පාලනය කරන්නේ කෙසේද කියා. මෙය නුඹගේ වාසනාව යයි සිතන්න.''

✸

ප්‍රධාන කවුන්සිලයේ ජ්‍යෙෂ්ඨතම සාමාජිකයා වූයේ කාපාය. වයස අවුරුදු අනූ හතක් වුවද, ඔහුගේ පෙනීම හා කතා කිරීමේ හැකියාව ඉතා හොඳය. දිනපතාම එකම එක සරල ආහාර වේලක් ගන්නා ඔහු ඉතා සිහින්ය. ඔහු කිසිදා රටබීම බිව්වේ නැත. දිනපතාම හොඳින් ඇවිදීම ඔහුගේ පුරුද්ද විය. ඔහු වටා සිටි සියලු දෙනා, වයසත් සමග වඩාත් බරපතල වූ ඔහුගේ අවලාද ඇසීමෙන් වෙහෙසට පත්ව සිටියහ. ඔටොකු හා කාපා අහසට පොළොව මෙන් වූහ.

තර මිනිහාට මේ කෙට්ටු මහල්ලා සමග කෙසේ වැඩ කරන්නදැයි සිතාගත නොහැකිය. අවම වශයෙන් සිසිල් වයින් වීදුරුවක්වත් පිළි නොගන්නා මහල්ලෙක්... ''ඔබ ඔබේ සෞඛ්‍ය ගැන හිතන්න'' ඔටොකු කාපාට කීවේය.

''මා ඔබේ සෞඛ්‍ය ගැන සිතන තරමටවත් ඔබ මගේ සෞඛ්‍ය ගැන සිතන්නේ නැහැ ඔටොකු, කොහිද ඔබේ මිත්‍ර රජු සැඟවී සිටින්නේ?''

''ඔහු දිගු ගමනක් ගොසින්.''

''ප්‍රධාන කවුන්සිලයේ සාමාජිකයන් ඔවුන්ගේ තීරණ මට දැනුම් දී තිබෙනවා. මා ඒවා බොහොම හොඳින් පරීක්ෂා කළා.''

''එසේ නම් ඔබට තේරුම් යන්න ඇති ඒවා විහිළු බව.''

"ඔබ ඔවුන්ගේ ක්‍රියාව විවේචනය කිරීමට තරම් එඩිතරයි? ඔවුන්ට ගෞරව කරන්න." කාපා කෑගැසීය.

"ඔවුන්ට ලැබෙන තොරතුරු සියල්ල අසත්‍යයි." ඔටොකු කෝපයෙන් කීවේය. "මේ සියල්ල පියැන්කිට රිදවන්නට, ඔහුට පහර දෙන්නට අවශ්‍ය ඊර්ෂ්‍යාකාරයින්ගේ අවශ්‍යතාවයන්. කළ යුත්තේ ඔවුන්ට සුදුසු දඬුවම් ලබාදීම, එයයි නිවැරදි."

"මා දන්නා තරමින් ඔබ ට්‍රැනාන්ට දඬුවම් කර තිබෙනවා. හිටපු මුදල් ඇමතිට."

"මා ඔහු වැඩට යෙදවූවා. සමහර වෙලාවට පියැන්කි සමාව දෙනවා වැඩියි. ඔහුගේ මිතුරන් භාරගත යුතුයි, ඔහුව විෂකුරු පරපෝෂිතයන්ගෙන් බේරා ගැනීමේ කාර්යය."

"ප්‍රධාන කවුන්සිලයේ ප්‍රධානියා මමයි. මා ඉඩ දෙන්නේ නැහැ මගේම තීරණය අසාධාරණව ඉවත දැමීමට. රජු කැමති වුණත් නැතත්, ඔහු හැකි තරම් ඉක්මනින් අප ඉදිරියේ පෙනී සිටිය යුතුයි."

✸

වැලියන්ට්ගේ වයස අවුරුදු පහකි. ඒ ඔහුගේ දිවියේ හොඳම කාලයයි. ඔහු පියැන්කිට හමුවූ හොඳම අශ්වයාය. කිසිදු වෙහෙසක් නොමැතිව ඉතා දිගු ගමන් යාමට ඔහුට හැකිය. ඒ දෙදෙනාගේ දෑස් හමුවූ මුල් අවස්ථාවේදීම මිනිසා හා තිරිසනා අතර මිතුදම ඇරඹිණි. අශ්වයා අහංකාර සේම දරුණු වුවත්, ඔහුගෙන් සිදුවිය යුතු සේවය පහදා දීමට රජුට හැකිය. ඔහුගේ සම්පූර්ණ විශ්වාසය දිනූ රජු සතුටට පත්කිරීම හැර, අන් කිසිවක් ඔහුට උවමනා නැත.

සිල්ක් මෙන් සිනිඳු කේශර ඇති වැලියන්ට් උසය, රාජකීයය. ඇසිපිය නොහෙලා බලා සිටින ඔහු සිනාසෙන බවකි පෙනුණේ. පියැන්කිගේ යුද්ධ හමුදාවේ අශ්වාරෝහකයින් ඔහුට වඩාත් ළංවීමට බිය වුවද, ඔහු ගැන කරන අගය කිරීම්වල අඩුවක් නොවීය. වැලියන්ට් කීකරු වන්නේ පියැන්කිට පමණක් බව කාටත් නොරහසකි. කිසිවෙකු ඔහුගේ පිටට නගින්නට තැත් කළොත් එසැනින් ඔහු දරුණු වනසතකු බවට පත්වේ.

රජු ඔහු සමග නපාටාවේ බොහෝ තැන්වල ගියේය. ඔහුට බොහෝ දේ ඉගැන්වීය. අශ්වයාද කිසිදු පැකිලීමක් නොමැතිව ඒ සියල්ල ඉගෙන ගත්තේ පුදුමාකාර වේගයකිනි. තම අශ්වගාලට ආපසු යන්නට වේලාව

පැමිණි විට, හැමවිටම ඔහු තෝරා ගත්තේ කෙටිම මාර්ගයයි. ශක්තිය හා ඔරොත්තු දීමේ හැකියාව මෙන්ම බුද්ධිමත් බවද ඔහු ලද දායාදයන් විය.

ඉතා උස වැලි කන්දක් මුදුනේ සිට, කළු පාරාවෝ අවට වූ කාන්තාරය දෙස භාවනානුයෝගීව බලා සිටියේය.

''බලන්න වැලියන්ට්, කිසිදු අධිරාජයෙක් මෙවැනි රාජ්‍යයකට කැමති නැහැ. එහෙත් මෙයයි භූමිය ඔබත් මාත් ආදරය කරන. මන්ද එය කිසිදා බොරු කියන්නේ නැහැ. එය අපට බල කරනවා අප අනුකම්පා විරහිත විය යුතු බවටත්, අසීමාන්තික බලයක් ඇති ආලෝකය වන්දනා කරන ලෙසටත්. කාන්තාරය හා ගොවිබිම් එකිනෙකාට අමුත්තන්. වෙනස්ම දෙදෙනෙක්. ඒ දෙදෙනාට එක් අයෙකු විය නොහැකියි. ඒත් ඒ දෙදෙනාම ඔබට කියා දෙනවා එකිනෙකා හඳුනාගැනීමේ අවශ්‍යතාවය.''

ඔටුනු කොක්කු, රජු හා අශ්වයාගේ හිස් මතින් පියාසර කළහ. ඈතින් තිබූ උස වැලි කන්දක් මත නැගුණු ඔරික්ස්, නොසැලී සිටගෙන ඔවුන් දෙස බලා සිටියේය. පියැන්කිට වතුර සොයා ගන්නට අවශ්‍ය නම් ඌ පසුපස යාම පමණයි කළ යුත්තේ.

''වැලියන්ට් අපි යමු. අගනුවර, මා එනතෙක් බලා සිටිනවා මගේ සතුරන්. එහෙත්, මා සියල්ල අත් හරිනවා නම් මා හා එන්නට දෙදෙනෙක් ඉන්නවා. ඒ නුඹත් මගේ බිරිඳත්. මා නොවෙද ලොව වඩාත්ම ප්‍රීතිමත් මිනිසා?''

අශ්වයා නපාටාව දෙසට හිර හැරවීය. පියාසැරිය ඇරඹීය. ඔවුන් එනතුරු බලාසිටින 'නඩුව' ට ඒ දෙදෙනා තුළම කිසිදු බියක් නොවීය.

# 08

රජකම හිමිකර ගත හැකි එකම මග යුද්ධය බව ටෙෆ්නැක් දැන සිටියේය. එහෙත් ආයුධ සන්නද්ධ වීම හෝ යුද්ධය ඔහුට සතුට ගෙනාවේ නොවේ. සෙස්සන්ගේ කාලය දුනු ශිල්පය හෝ හෙල්ල හරඹ වෙනුවෙන් කැප කිරීම ඔහු ඉවසුවේ නොවේ. සියලු ලිබියානු නායකයින් තම තමන්ගේ ශරීර ශක්තිය ගැන ආඩම්බර වූ නමුත් ලිබියානු එකමුතුවේ ප්‍රධානියා එවැනි දේ ගැන තැකීමක් කළේ නැත.

තම සාංකාව මග හරවා ගැනීම සඳහා, ටෙෆ්නැක් ගොඩබිම් දෙක නැවත ජය ගැනීමට හා එක්සත් කිරීම ගැන සියක් වාරයක් සැලසුම් තැනුවේය. ඔහු වෙත ගණිකාවන් ගෙන ආ නමුත් ඔවුන් ආපසු යැවූ ඔහු වයින් බිඳක් හෝ තොලගෑම ප්‍රතික්ෂේප කළේය. එවැනි සිත නලවන දෑ ඔහුගේ එකම අරමුණ වෙනස් කරනු ඇත. ලිබියානු එකමුතුවේ ප්‍රධානියා වීම, පියැන්කිගේ හමුදාවන් පරාජය කිරීම, නුබියානු බලය බිඳ දමා පාරාවෝ ලෙස කිරුළු දැරීම.... පළමුව දකුණේ තීබසයේ. ඊළඟට උතුරේ මෙම්පිස්හි!

ජයග්‍රහණය අත ළඟය. එහෙත් වහා ක්‍රියාත්මක විය යුතුය. ටෙෆ්නැක් කෙතරම් අධිෂ්ඨානශීලීද, බලයට ගිජුද යන්න පාරාවෝ දැන ගන්නට පෙර ක්‍රියාත්මක විය යුතුය. මේ වනවිට පියැන්කි ඔහු ගැන සිතන්නේ ඔහු ලිබියානු කුමාරවරුන් අතර කෙනෙක් කියාය. සෙස්සන්ට වඩා බලවත්, පහසුවෙන් දූෂිතයකු වන, විශිෂ්ට බලයක් නැති කුමරෙක් කියාය. එහෙත් පියැන්කි වැරදිය.

ටෙෆ්නැක්ගේ පියා ලිබියානුවෙකි. මව ඊජිප්තුවෙකි. ඔහු ඊජිප්තුවේ කීර්තිමත් අතීතය හදාරා තිබිණි. මේ රටට එහි වූ අතීත ශ්‍රී විභූතිය නැවත ළඟා කර ගන්නට නම් ඉහළ හා පහළ ඊජිප්තුව නැවත එක්සත් කළ යුතුය. එය පියැන්කිට කිසිදා කළ නොහැකි ක්‍රියාවලියකි. එහෙත් තමාට එය කළ හැකිබව ටෙෆ්නැක්ට විශ්වාසය. මහා රැම්සීස් ගෙන් පසු රාජ්‍ය පාලනය කළ අය නිවා දැමූ පහන්, යළි දැල්විය හැකිය.

අවාසනාවට මෙන් රටේ දියුණුව රඳා පැවතියේ අනාගත දැක්මක් නැති, තම පුද්ගලික වරප්‍රසාද ගැන පමණක් සිතූ ඒකාධිපතියකුගේ කැමැත්ත මතය. එහෙත් ටෙෆ්නැක් රජ වූ පසු ඔහු, රට වෙහෙසට පත් කරන අරාජකත්වයට තිත තබනු ඇත. සියලුම පළාත්, උතුරට හෝ දකුණට අයිති සියලු පළාත් පාරාවෝගේ බලයට යටත් වනු ඇත.

ටෙෆ්නැක්ට අවශ්‍ය වූයේ තම පුද්ගලික කීර්තිය නංවා ගැනීම නොව, ඊජිප්තුවට එහි වූ අතීත ශ්‍රී විභූතිය ලබාදීමයි.

කිසිවකුට මේ දැක්ම වටහාගත නොහැක.

ටෙෆ්නැක්ට තම අරමුණ කරා යාමේදී, මිනිසුන්ට තබා දෙවියන්ටද බිය නොවන යෙගෙබ් හා නාට්‍රෙබ්ගේ සේවයද ලබා ගැනීමට සිදුවිය. එහෙත්, ඔහු ජයගතහොත් මේ සැක සංකා සහ වේදනා සැනෙකින් අමතක වනු ඇත.

ඔහු මහා රැම්සීස්ගේ පාලන සමයේ ගිණුම් තොරතුරු සඳහන් පැපිරසයක් දිග හැරියේය. එදවස මෙම්පිස්හි තිබූ අති විශාල ධනය පිළිබඳ විස්තර එහිවිය. සාරවත් ගොවිපොළ, මත්ස්‍යයින් ගහණ දියපාරවල්, භාණ්ඩ පුරවන ලද ගබඩා. තානාපතිවරුන්ගේ පැමිණීම්.... අද ඒ මහා නගරය නිදිකිරා වැටෙයි. එහි වූ ශක්තිය නැවත ලබාදිය හැකි රජෙක් ලැබෙන තෙක්, ගොඩබිම් දෙකේ සමබරතාවය රැක ගැනීමට!

''උතුමාණනි මට අවසරද?'' ටෙෆ්නැක්ගේ කුඩාරම අසල නැවතුන නාට්‍රෙබ් ඇසීය. ඔහුගේ හඬ සතුට දනවයි.

''සුබ ආරංචියක්?''

''ඉතා සුබයි. ඒත් මගේ උගුර වියළියි.'' ඔහු තම ස්ථූල දෑතින් ගත් සුදු වයින් කෝප්පයක් බීවේය. එය මධ්‍යම ඊජිප්තුවන් පමණක් දන්නා රහසකට අනුව තනන ලද කෝප්පයක, සිසිල් වීමට තබන ලද්දකි.

''අන්තිමේදී පළාත් නායකයින් මට පක්ෂව කැමැත්ත ප්‍රකාශ කළාද?'' ටෙෆ්නැක් ඇසීය.

''තත්ත්වය ඊට වඩා මඳක් පැටළිලි සහිතයි උතුමාණනි. ඇත්ත වශයෙන්ම පසුගිය දින කීපය තුළ ඔබට එරෙහිවයි කරුණු ඉදිරිපත් වුණේ. ඔබට විශ්වාසය තැබිය හැකිව තිබුණේ විරුද්ධ අයට පමණයි. යෙගෙබ් සහ මා ඊට සම්බන්ධ නොවුණා නම්, සියල්ල ඔබට එරෙහිව යන්න තිබුණා. ඔබට නැවතත් සායිස් බලා ආපසු යන්න තිබුණා.''

"ඉතින් කෙසේද ඔබ ඔවුන් වෙනස් කළේ?"

"එය පහසු වුණේ නැහැ. ඒත් අපට හැකිවුණා නිවැරදි තර්ක ඉදිරිපත් කරන්නට."

"මට අවශ්‍ය ඒ දේ කුමක්දැයි දැන ගන්නයි නාට්‍රෙබ්." ටෙෆ්නැක් දැඩිව කීය.

"එය අත්‍යවශ්‍යද උතුමාණනි. ඔබ අපට ගෙවනවා. අප ඔබට සේවය කරනවා. තොරතුරු වැදගත් නොවෙයි."

"මා එසේ සිතන්නේ නැහැ."

ටෙෆ්නැක්ගේ කෝපය වැඩෙන බව නාට්‍රෙබ්ට දැනුණි. ඔහු හිස වනා මෙසේ කීය. "වසර ගණනාවක සිට යෙගෙබ් සහ මා උතුරු පළාත්වල කුමාරවරුන් ගැන තොරතුරු රැස්කළා. ඒවායෙහි ප්‍රාදේශීය නිලධාරින්ගේ සහාය ඉතා වැදගත් වුණා. ඔවුන්ගේ නම් රහසිගතව තබන තාක්කල් ඔවුන් කැමැත්තෙන්ම අපට ඔවුන්ගේ රහස් විකුණන්න සූදානම්. අද අපට ඒ කාර්යයෙහි ප්‍රතිඵල ලැබෙනවා. ඒ කුමාරවරුන් දුෂිතයින් නිසා, ඔවුන් තම තමන්ගේ හිතවතුන් පාවා දෙන්න සූදානම්. ඉතින් අපට එතරම් අපහසු වූයේ නැහැ ඔවුන් සමග කතාබහ. ඒත් එක සුළු ප්‍රශ්නයක්."

"අකතොෂ්?"

"අපොයි නැහැ. ඔහු නොවෙයි. ඔහු බියගුල්ලෙක්. ඔහු එකඟයි වැඩි දෙනාගේ කැමැත්තට. මා කතා කරන්නේ, ඩෙල්ටාවේ වගුරු බිම් හා ධීවර බිම් පාලනය කරන මහලු නායකයා ගැනයි. ඔහු අත්තනෝමතිකව ක්‍රියා කරන හිතුවක්කාරයෙක්. ඔහු ප්‍රතික්ෂේප කරනවා කළු පාරාවෝ සමග ඕනෑම සටනකට එළඹීම. අවාසනාවට මෙන් ඔහු තවමත් ශක්තිමත්. එය අපට තීරණයක් ගැනීම වළක්වනවා. ඇත්තෙන්ම, ඔහුගේ විරෝධයම අපගේ අවසන් ජයග්‍රහණයට තර්ජනයක් විය හැකියි."

නාට්‍රෙබ්ගේ බඩ දඟලන්නට විය. ඔහු රටඉඳි අහුරක් ගිල දැමීය.

"කෙසේද ඔබ එය විසඳන්නේ?" ටෙෆ්නැක් ඇසීය.

"යෙගෙබ් ඒ ගැන සොයනවා.හෝ.... මෙන්න ඔහු."

යෙගෙබ්ගේ සිහින් දිගටි මුහුණේ වූයේ තෘප්තිමත් බවකි. "මා ඉඳගන්නද උතුමාණෙනි. මගේ පාද කැක්කුම් දෙනවා."

"ඔබ ජය ගත්තාද?" ටෙෆ්නැක් ඇසීය.

''දෛවය ඔබ සමගයි. ඒ මහල්ලා මියගියා මේ දැන්.''

ටෙෆ්නැක් සුදුමැලි විය. ''ඔබ පවසන්නේ. ඔබ.......''

''ඔබේ ඒ විරුද්ධවාදියා සවස නින්දේදීම මිය ගියා. ස්වාභාවික මරණයක්. ඔබේ වාසනාව ස්ථිර කර ගන්න.''

''යෙගෙබ් මට අවශ්‍යයි සත්‍යය.''

''සත්‍යය නම් උතුමනි, ඔහු වෙනුවෙන් වැලපීමේ සමය උදාවේවි. ලිබියානු නායකයින් ඔබට සුපිරි බලය දීමට අත් ඔසවාවි.''

✸

වයස පනහ ඉක්මවුවද අකනොෂ්ගේ බිරිඳ තවමත් රූමත්ය. විවාහයෙන් තිස් වසරකට පසුව වුවද, වදනකදු නොදොඩා තම සැමියාගේ හැඟීම් හඳුනාගන්නට ඇයට හැකිය. ඔහු කූඩාරමට එනවිට යම්කිසි අසුබ දෙයක් සිදු වී ඇතිබව ඇයට දැනුණි.

''යුද්ධයද?'' ඇය ඇසුවාය.

''ඔවුන් තීරණ වෙනස් කරගෙන. අපගේ ප්‍රධානතම සාමාජිකයා දැන් නැහැ. ටෙෆ්නැක්ට නායකත්වය දීම වරදක් බව පවසන්න කෙනෙක් නැහැ. ඔව් යුද්ධයක්. අප සූදානම් වෙනවා හෙනෙන් නෙසට් වෙත පහර දෙන්නට.''

''ඔබ මා ගැන බියෙන් නොවෙද?''

අකනොෂ් තම බිරිඳගේ දෑත් දෝතින්ම ගත්තේය. ''ඔබ නුබියානුවෙක් බව දන්නේ අප දෙදෙනා පමණයි. කෙසේ වෙතත් කවුද නොබියව මගේ බිරිඳට පහර දෙන්නේ?''

උතුරු ඊජිප්තුවකුගේ දුඹුරු පැහැති සමක් තිබුණද අකනොෂ්ගේ බිරිඳගේ පියා නුබියානුවෙකි. බොහෝ කලක සිට මේ ලිබියානු කුමරා පියැන්කි සමග සබඳකමක් ඇති කර ගන්නට සිහින දුටුවේය. එමගින් ඔහුට අනෙකුත් ඩෙල්ටා ප්‍රධානීන් අතරට යා හැකිය.

''මා කරදර වන්නේ ටෙෆ්නැක් ගැනයි.'' අකනොෂ් පැවසීය. ''ඔහු බුද්ධිමත්, කපටි, අනුකම්පා විරහිත කෙනෙක්. ඔහුට ඔහුගේ සිහිනය සැබෑ කර ගන්නට හැකිනම්, ඔහු ඊජිප්තුව ගිනි තබාවි. කඩුගා දමාවි.''

''ඒත් ඔබ ඔහුට අවනත විය යුතුයි. අනෙකුත් නායකයින් මෙන්ම. ඔබේ භටයින්ට අණ දිය යුතුයි.''

''සත්‍යයක්, මට දැන් අන් කළ හැක්කක් නැතිබව . ඒත් මගේ හෘද සාක්ෂිය පවසනවා මා පියැන්කිට ඒ ගැන දැන්විය යුතුබව.''

''ප්‍රවේසම් වෙන්න පෙම්වත. පාවාදීමක් ගැන ඔබව සැක කළොත්?''

''ටෙෆ්නැක් මා මරා දමාවි ඔහුගේම දැතින්. මා දන්නවා. ඒත් කරදර නොවන්න ප්‍රේමිය. කිසිවෙකු සැක නොසිතන සේ එය කරන හැටි මා දන්නවා.''

# 09

නපාටාහි ආමන් දෙවොලේ පළමු දොරටුව අසලදී ප්‍රධාන කවුන්සිලය රැස්විය. එය, මා ආට් නීතිය, සත්‍යය හා සාධාරණත්වයේ නීතිය, රකින ස්ථානයයි. කවුන්සිලයේ ප්‍රධානියා වූ කාපා මුලසුන දැරිය. ඔහු වටා රජුගේ හිතවතුන්, සහායකයින්, වැඩිහිටියන් හා පූජකයින් වාඩි වී සිටියහ.

කළු පාරාවෝ අසු පිටින් පැමිණියේය. සත්පුන් කාපාගෙන් යාර කීපයක් ඈතින් අසු පිටින් බැස්සේය. ඔහු, සාමාන්‍යයෙන් නුබියානු රජවරුන් පළඳින ඔටුන්න පැළඳ සිටියේය. ඔහුගේ මැණික්කටු හා උඩ බාහු ඔහුගේ නම සඳහන් කළ රන් වළලු වලින් සැරසී තිබිණ. උඩ කබායෙහි සවි කරන ලද කළු දිවියෙකුගේ කුඩා හිස ආලෝකයට දිලිසිණි.

දකින්නන් වෙව්ලා හරින තරමට බලවත් ඒ රූපකාය දුටු කවුන්සිලයේ සමහර සාමාජිකයන්ට එතැනින් පැන දුවන්නට හිතුණද, මහලු කාපා අනුගමනය කළ ඔවුහු; හුස්ම ඉහළට ඇදගෙන, ඉතා ගෞරවයෙන් හිසනමා රජුට ආචාර කළහ.

කාපා කතා කළේය.

''උතුමාණනි, මේ කවුන්සිලය මීට අවුරුදු විස්සකට පෙර ඔබ ඉහළ හා පහළ ඊජිප්තුවේ පාරාවෝ ලෙස තෝරාගත්තා. ඒ අවස්ථාවේ ඔබට එරෙහි චෝදනා කිසිවක් තිබුණේ නැහැ. එහෙත් මේ වනවිට බොහෝ සිත් රිදවීම් තුළින් නිලධාරීන් අතර සාමය කඩවී තිබෙනවා. අප විවිධ මාර්ග වලින් අප වෙත ලැබී ඇති චෝදනා පරීක්ෂා කර තිබෙනවා. තවද....''

''කිමද?'' කළු පාරාවෝ බාධා කළේය. ''කිමද ඒ චෝදනා කරනවුන් සැඟවී සිටින්නේ?''

''උතුමාණනි, අප පිළිගන්නවා ට්‍රැනාන්ට දුන් දඬුවම. එසේම ඔබට එරෙහිව කුමන්ත්‍රණයක් මෙහෙය වූ කනිෂ්ඨ බිසව පිටුවහල්

කිරීමත්. පුද්ගලිකව පැවසීමට කැමතියි උතුමාණනි, එම දඬුවම් ඉතා සුළු ඒවා බව.''

''එසේනම් තවත් කුමන චෝදනාවක්ද?''

කාපා ඉන් සෑහීමකට පත් වෙතැයි බොහෝ දෙනා සිතුවද ඒ මහලු නුබියානුවා තුළ සියල්ල ගැන වැටහීමක් තිබිණි. ඔහුට අනුව, නිලධාරීන්ගේ ප්‍රතිපත්ති යනාදී සියල්ලට, බැඳීම් හා එකමුතුකමේ තාලයට අනුගත නොවන අයකුට රටක් හොඳින් පාලනය කළ නොහැකිය.

''විසි වසරක කාලය තුළ උතුමාණනි'' කාපා කියන්නට විය. ''ඔබේ බලය ස්ථිරව පැවතුණා. එහෙත් කවරකු හෝ ඔබේ කීර්තිනාමය කැළැල් කිරීමට උත්සාහ කර තිබේ නම් එය බරපතල හේතුවක් නිසා විය යුතුයි. ඔබ සතු පාලන හැකියාව දුර්වල වෙමින් පැවතීම වැනි හේතුවක් උතුමාණනි.''

ප්‍රධාන කවුන්සිලයේ කීප දෙනෙකුගේම දෙකන් රත්විය. මහලු කාපා පමණ ඉක්මවා කතාකරන බවද, එයින් කළු පාරාවෝ කෝප වෙතැයිද ඔවුහු බිය වූහ. එහෙත් ඔහුගේ සන්සුන් බව බිඳකුදු නොවෙනස්ය.

''දිව්‍යමය ආලෝකය විසින් මේ මිහිමත රජකු බිහි කරන්නේ මනුෂ්‍යයන් විනිශ්චය කිරීමට හා දෙවියන්ගේ කැමැත්තට අනුව ක්‍රියා කිරීමටයි.'' සන්සුන්ව කී ඔහු කිරුළු පැළඳි උත්සවයේ ගීයක් ගැයීය.

''ඒ මෙසේයි. රජු අපිළිවෙල හා අසත්‍යය අසාධාරණය වෙනුවට එකමුතුකම ස්ථාපිත කළ යුතුයි. බලවතාගෙන් දුබලයා ආරක්ෂා කළ යුතුයි. අදෘශ්‍යමාන බලයන්ට පුද පූජා පැවැත්විය යුතුයි. මළවුන්ගේ ආත්මයන්ට ගෞරව කළ යුතුයි. ආමන් විසින් මා තෝරා ගනු ලැබුවේ ඒ සඳහායි. ''ඔටුන්න පිළිගන්න.'' ඔහු මට අණකළා. මගේ දෛවය තීරණය කරන්නේ ආමන් විසින්මයි. දෙවියන් රජු තනනවා. මිනිසුන් ඒ රජු පිළිගන්නවා. මා ස්ථිර කළා තුන්වැනි තුත්මොසිස්ගේ කිරුළු පැළඳි උත්සවයේදී ප්‍රකාශ කළ දේ. කවුරුන්ද ඔහු? හැඳින්වූයේ ඔහු, ජාතීන් දෙකේ සාමය ඇතිකළ තැනැත්තා. ගොඩබිම් දෙක එකතු කළ තැනැත්තා. දිව්‍යමය ආලෝකයේ බලය යනුවෙන්. ඔහු, තෝත්ගේ පුත්‍රයා වූ ඔහු, මෙන් මමද දැනුම සොයනවා. The book of going forth by day පොතෙහි ලියැවී තිබෙනවා දැනුම යනු අඳුර හා නීච බව පලවා හරින බලය බව. එය අනාගතය දැක භූමිය පාලනය කරන බව. ඒත් සමහර විට, ඔබ

නිවැරදි විය හැකියි කාපා. සමහර විට රාජ්‍ය පාලනයට ඇති මගේ ශක්තිය දුර්වල වෙමින් පවතිනවා විය හැකියි. මට කිරුළ අතහැර මේ ජීවිතය නිමාකළ යුතු කාලය පැමිණ තිබෙනවා විය හැකියි. එහෙත් ඊට පිළිතුරු දිය යුත්තේ මා නොවෙයි. ආමන් විසින්. ඔහු අපට දන්වාවි ඔහුගේ කැමැත්ත.''

✸

පියැන්කි තම මාලිගයේ සඳළුතලයේ ඉඳගෙන සිටියේය. ඔහුට, පහතින් වූ නගරයද, බොහෝ ඈතින් වූ කාන්තාරයද පෙනිණ. ඒ උණුසුම් අඳුරු රැයේ එය කොතරම් සන්සුන්ද? එහෙත් ඒ රාත්‍රියේ අපරික්ෂාකාරී සංචාරකයන් ගිලගන්නට යක්ෂයෝ එක්වෙති. පියැන්කිද බොහෝ වාර ගණනක් කාන්තාර අනතුරු වලට මුහුණ දී තිබිණි. එහි මිරිඟුව, අනන්තය තෙක් දිවෙන මායාකාරී මාවත්, ඇසට වෙහෙසක් නොදෙන වැලිකඳු!

අබිලා ඔහු අසල සිටගත්තාය. ඒ උස් සිරුරට හේත්තු වී ඔහුගේ නිකට පිරිමැද්දාය. ඔහු ඒ ගැහැනියට කෙතරම් ආදරේද?නුබියාවේ අලංකාරය හා කීර්තිය එකට එක්කළ ඒ ගැහැනිය. ධීවරයෙකුගේ දැලක් වැනි විනිවිද පෙනෙන ඇඳුම ඒ සිරුර ආවරණය කරනවාට වඩා නිරාවරණය කළේය. ඇයගේ ගෙල සැරසී තිබුණේ නිල් කැට වලින් අලංකාර කළ රන් කරපටියකිනි. පියැන්කිට පුත්‍රයකු හා දියණියක දුන් ඈය, ඒ දරු උපත් සමගම ස්ත්‍රීත්වයෙන් තව තවත් දීප්තිමත්ව වැඩුණාය.

''මෙ ගෙවෙන්නේ අප මේ මාලිගයේ ගෙවන අවසන් රාත්‍රී කීපයද ස්වාමීනි?'' ඇය පැහැදිලි හඬින් ඇසුවාය. ඒ හඬ තැතිගැන්මෙන්, බියෙන් වෙළී තිබුණේ නොවේ.

''ඔව්, ආමන් දෙවියන් මා ගැන තැබූ විශ්වාසය බිඳී ගියහොත්.''

අබිලා තම සැමියා වැළඳ ගත්තාය. ''ඔබට ඇති ආදරයේ නාමයෙන් මට හැකියි ආමන් දෙවියන්ට නිහඬව සිටින්නැයි යදින්නට. අපට හැකියි අපේ දරුවන් සමග ඈත ගම්මානයක, පාම් ගස් ගොන්නෙන් වටවූ ගම්මානයක නිදහසේ ජීවත් වන්නට. එහෙත් මා ඒ ආයාචනය කරන්නේ නැහැ. මන්ද, ඔබයි ඔබේ ජනතාවගේ සතුට රකින්නා. එය නැතිකළ නොහැකියි. අපගේ සතුට වෙනුවෙන් ඔවුන්ගේ සතුට පූජාකරවීම සමාව නොලැබෙන ද්‍රෝහි කමක්.''

''ඔබට නොදැනේද ඔබ මගේ තත්ත්වය අධිතක්සේරු කරන බව?'' පියැන්කි සිනාසී ඇසීය.

''ඔබයි සැක කරන්නේ ඔබේ බලය ගැන. මා එය තිබෙන පරිදිම පිළිගන්නවා පමණයි. එය නොවෙද ඊජිප්තු රජිනගේ ප්‍රමුඛ වගකීම?''

''ආමන් මා වෙත එව්වා දුන්නක සංකේතය.''

''බලන්න'' අබිලා වහා කීවාය. ''නුබියාව දුන්නෙහි භූමිය. ඒ සංඥාවෙන් පෙන්වන්නේ ඔබ තව දුරටත් රාජ්‍යය පාලනය කළ යුතු බවයි.''

''දුන්න යුද්ධයේත් සංකේතයයි ප්‍රේමිය. එහෙත් ඈත ක්ෂිතිජයේ යුද්ධයක සේයාවක් නැහැ.''

''උතුරේ කුමාරවරුන් ඇතිකරන කලබල ගැන ඔබ කරදර නොවන්නේද ස්වාමීනි?''

''ඔවුන් අතර සටන් ඇතිවෙනවා. නිතරම එකිනෙකා අතර දරුණු සටන්. එහෙත් කිසිදු ලිබියානුවකුට හැකියාවක් නැහැ සෙස්සන් තමා වෙත පක්ෂපාතී කරගන්නට. එය කළ නොහැකියි.''

✸

දිගු කලක සිට කාපාට හරිහැටි නින්දක් නොවීය. දිනකට පැය දෙක තුනකට වඩා නින්දක් නැත. කාලය ඉතා ඉක්මනින් ගතවී ඇත. වශීකෘත සිනහවක් සමග මරණය ගෙන එන බටහිර දෙවඟන හා එක්වීමට පෙර හැම මොහොතකින්ම ප්‍රයෝජන ගැනීම ඔහුගේ පැතුම විය.

ඔහු කිසිම දිනක උපන් බිම හැරගියේ නැත. මේ ගිනිගෙන දැවෙන භූමියේ වශීකරණසුළුබව, අන් කිසිවකුට වඩා හොඳින් ඔහු දනී. නුබියාව තමාට ආදරය කළ අය වැළඳගත්තාය. එහෙයිනි පියැන්කි හොඳ පාලකයකු වූයේ. මහලු කාපා හෘද සාක්ෂියට එකඟව සියල්ල කළ අතර ඔහු තුළ පසුතැවිල්ලක් නොවීය.

දෙවිවරුන් පියැන්කි ඉවත්කළහොත්, දකුණු ඊජිප්තුවේ අනාගතය අඳුරු වේ. පාරාවෝ පරාජය කිරීමේ සිහින දකින්නන්, විනාශයක් ඇතිකරනු නියතය.

රාත්‍රිය අලංකාරය. රතුකැට, නිල මාණික්‍ය පිරි අහස සිත් වශීකරවන සුළුය. ඒ සියල්ල විශ්වයේ ඈත කෙළවර උපදින ආලෝකය ලොවට බෙදා හරින දොරවල්ය. උඩ බලන්නෙකුට මිස ඒ අසිරිය දැකිය නොහැකිය.

හදිසියේම එක් තරුවක් සෙසු තාරකා වලින් මිදී අසුරු සැනින් අහස හරහා ගියාය. ඒ සමගම, එය පොළොව විසින් පහළට අදින කලක මෙන්, ගින්නක් මවාගෙන පොළොවට වැටුණි.

නැත. එය මායාවක් නොවේ. තරුව නුබියාව දෙසට වැටුණි. නපාටා දෙසට, රජ මාළිගය දෙසට, එසේය. හදිසි ගින්නක් තුළ රජ මාලිගය සැඟවී ගියේය.

# 10

ඒ රාත්‍රියේ නොනිදා සිටියවුන් රජ මාළිගාවේ සඳළුතලයට වැටුනු ගිනි බෝලය දැක තිබිණි. දෙව්ලොව කෝපය කළු පාරාවෝ විනාශ කළ බව ඔවුන්ට පිළිගැනීමට සිදුවිය. ආමන්ගේ පිළිතුර කෙතරම් බිහිසුණු වීද?

කාපාගේ මහලු දෙපා ඒ කේඩෑරි සිරුර ඔසවාගෙන මේ නාටකය සිදුවූ තැනට ගියේ හැකි උපරිම වේගයෙනි. අගනුවර සියලු ජනතාව එතැනට එක්වෙමින් සිටියහ. මේ විනාශය දුටුවෝ සියල්ලන්ට ඒ ගැන දැනුම් දී තිබිණි.

✸

නායක දූනාවායා, පෝර්මා, කිසිවෙකුට රජුගේ පුද්ගලික කාමරයට ඇතුලු වීම තහනම් කර තිබිණි. කුල්හෙඩ්ට හෝ ඊට අවසර නොවීය.

''උතුමාණන්ට අප සහාය විය යුතු නොවෙද?'' කාපා නොඉවසිල්ලෙන් ඇසීය.

''මා දන්නේ නැහැ.'' පෝර්මා කීය. ඔහු කෙතරම් භීතියට පත්ව සිටියේද යත් කිසිදු තීරණයකට එළඹිය නොහැකි විය.

''හොඳයි මා ඇතුල් වෙන්නම්.'' කුල්හෙඩ් කීය.

''මාත් ඔබ හා එනවා.'' කාපාද ඉදිරිපත් විය.

පෝර්මාගේ සංඥාවකට අනුව දූනුවායෝ ඔවුනට ඇතුල් වීමට ඉඩ දුන්හ. පින්තාරු කළ ගල් අල්ලන ලද පඩි පේළිය නැග ඔවුහු පියැන්කිගේ පුද්ගලික කාමරයට ළංවූහ.

''උතුමාණනි, මම කුල්හෙඩ්. ඔබට කෙසේද?''

පිළිතුරක් නැත.

සයනාගාරය, විශාල නාන කාමරය, සම්බාහන කාමරය, කාර්යාලය, විශේෂ අමුත්තන් පිළිගන්නා කාමර, පුස්තකාලය සියල්ල හිස්ය.

"එහෙත්... සඳළුතලය?" කාපා ඇසීය.

කුල්හෙඩ්ට හැඬුම් එන්නට ආසන්නය. කාමරයක් තුළ සිටියේ නම් ඒ ගිනි බෝලයෙන් ගැලවෙන්නට පියැන්කිට අවස්ථාව තිබිණි. එහෙත් සඳළුතලය?

"මගේ මහලු දෙපා අප්‍රාණිකයි." කාපා ගෙරවීය.

"මෙහි රැඳී විවේක ගන්න. මා තනිව යන්නම්."

දැතින්ම පපුව බදාගත් කුරුමිට්ටා බියෙන් ගැහෙමින්, හෙමින් හෙමින් සඳළුතලයට පිය මනින්නට විය. ඒ සඳ එළියේ ඔහුට ඔවුන් පෙනිණි. පියැන්කි හා අබිලා ළං ළංව වැතිර සිටියහ. අබිලාගේ හිස පියැන්කිගේ පපුව මත වැටී තිබිණ. ඔවුන් දෙදෙනා ඒ සදාකාලික ආදරයෙන් බැඳී, එකම මොහොතේ මිය ගොස්ය!

"කුමක්ද ඔබ මෙහි කරන්නේ කුල්හෙඩ්?"

හිස සිට දෙපතුළ දක්වා වෙව්ලා ගිය කුරුමිට්ටා උඩ විසිවිය. ඒ ආමන්ගේ හඬයි. දෙව්ලොවින් ඒ හඬ නැගී ආයේ ගරු සරු නැති මිට්ටාට දඬුවම් දීමටද?

"මගේ අගනුවරට කරදරයක්ද?" පියැන්කි ඉඳ ගනිමින් ඇසීය.

ඒ අවතාරයකැයි සිතූ කුල්හෙඩ් පියවරක් පසුපසට තැබීය.

"උතුමාණනි ඒ ඔබද? ඇත්තටම ඒ ඔබද?"

"මා හඳුනාගත නොහැකි තරමට වෙනස් වී තිබේද?"

"න්.... නැහැ. ඒත්.... අහසින් තරුවක් කඩා වැටුණා උතුමාණනි. එය ගිනි බෝලයක් වුණා."

"ඔබට පෙනේද මෙහි ගින්නක සලකුණක්?"

ඒ මොහොතේ රැජින අවදි වූවාය. "මා සිහිනයෙන් දුටුවා දිව්‍යමය ගින්නක්. එය අප වටකර ගත්තා. රැස් වළල්ලක් මෙන් අපව ආරක්ෂා කර ගත්තා. අප සිටියේ හිරුගේ හදවතේ, ඒ අඳුරේ දිලිසෙමින්."

"ආශ්චර්යයක්" කුල්හෙඩ් පඩිපෙළ බසිමින් කෑ ගැසීය. "එය ආශ්චර්යයක්. ආමන් දෙවියන් රාජකීය යුවල ආලෝක කිරණ බවට පත්කර තිබෙනවා."

✸

ප්‍රධාන කවුන්සිලය, පූජකයින්ගේ අවවාද, මහජන අදහස් යන සියල්ලෙහි විනිශ්චය ඒකමතික විය. ආමන්, දිව්‍යමය ගින්නක ස්වරූපයෙන්

පෙනී සිටින්නට තීරණය කර ඇත. ඒ, ශුද්ධ වූ කන්දේ වැඩ හිඳින, පියැන්කි නියම පාරාවෝ මෙන්ම තම පුත්‍රයා ලෙසද තෝරාගෙන සිටින ආමන් දෙවියන්මය.

ගිබෙල් බාර්කල්හි, ඔටුන්නක හැඩය ගත් මුදුනතින් හිරු නැගෙත්ම; රජුගේ හිතවතුන් හා සහායකයින් පූජකයින් මෙන්ම වැඩිහිටියන්ද පියැන්කි පාරාවෝ ලෙස පිළිගනු ලබන බවට පණිවිඩය ගෙනයන නියෝජිතයා වූයේ කාපාය.

''අප ඔබේ සේවකයින්.'' මහල්ලා කීවේය. ''අණ දෙන්න. අපි එය පිළිපදිමු. මන්ද යත් ඔබේ සිතිවිලි වලට මග පෙන්වන්නේ ආමන්ගේ සිතිවිලිම වන හෙයිනි.''

ඔටොකුගේ මුහුණේ පුළුල් සිනාවක් පිපුණි. ඒ තරම් මිනිසා ඒ වනවිටත්, කළු පාරාවෝගේ දෙවැනි අභිෂේකය සමරන භෝජන සංග්‍රහයක් සංවිධානය කර තිබිණි. එහි තිබෙන ආහාර වර්ග නුබියානු මුතුන් මිත්තන්ගේ සංග්‍රහයන් සිහිකර දෙනු ඇත.

''වඩාත්ම වැදගත් කාර්යය වන්නේ අපගේ මුතුන් මිත්තන්ට ගෞරව දැක්වීමයි.'' පියැන්කි පැවසීය. ''ඔවුන් නොසිටින්නට අප මෙතන නැහැ. ඔවුන් සිටින්නේ අපට පිටුපසින් නොවෙයි ඉදිරියෙන්. මන්ද යත් ඔවුන් ජීවිතය හා මරණය යන දෙකම ගැන දන්නා නිසා.''

කළු පාරාවෝ රාජකීය නෞකාවට නැග්ගේය. නෞකාවේ ඉදිරිපස තනා තිබුණේ ආමන් දෙවියන්ගේ උතුම් සත්ත්වයා වූ බැටළු හිසක හැඩයටයි. ඔහු තම අසුනේ හිඳගත් අතර අබිලා ඇගේ තැන ගත්තාය. රජු කුර්රු බලා යාමට ගමන් ඇරඹීමට සත් කළේය. ඒ පසුපසින් රාජ්‍යයේ උසස් නිලතල දරන සියලු නිලධාරීන් රැගත් කුඩා නැව් කණ්ඩායමක්ද විය.

කුර්රු යනු පියැන්කිගේ පියාණන් ඇතුළු රජවරුන්ගේ සුසාන භූමියයි. පූජාවන් සඳහා තබන ලද කුඩා කුහර සහිත තාප්පවලින් වට වූ ළිං සහ සොහොන් පිහිටා තිබුණේ පුරාණ අධිරාජ්‍යයේ සොහොන් වල ආකාරයටමය. ඒවායෙහි බිත්ති සිනිඳු හුණු ගලෙන් තනා තිබිණ. හිරු එළියේ දිළිසෙන එම සිහිවටන තුළ නැගෙනහිර දෙසින් තනන ලද කුඩා දෙවොල්, පූජා පැවැත්වීමෙන් ජීවත්ව සිටින්නන්ට මළවුන් සමග සම්බන්ධ වීමට ඉඩ සැලසීය.

''ජීවී තැනැත්තා'' යන තේරුම ඇති නම් ලද පියැන්කි, ඒ වනවිටත් තම සිහිවටනය තනා ඇතිබව දුටුවේය. ඔහු තෝරාගෙන තිබුණේ පිරමීඩයක් තනවන්නටයි. එහි ඇතුළට යාමට පටු විවරයක් විය. මරණින්

මතු දිවියේද ඔහුගේ හිතවතිය වන රජින සැතපෙන ස්ථානයද ඒ අසලම පිහිටියේය.

පියැන්කිගේ පිරමීඩය තුළ ඒ වනවිටත් ඔහුගේ විශ්වාසවන්ත මිතුරන් දෙදෙනෙක් නිදා සිටියහ. ඒ, මමී බවට පත් කරන ලද ඔහුගේ පළමු අසුන් දෙදෙනාය. ඔවුන් එහි වූ ගැඹුරු වළවල් තුළ කෙළින් අතට සිටුවා තිබිණි. ඔවුන් ඇස්, කට හා කන් විවර කරන චාරිත්‍රයෙන් ආශීර්වාද ලබා සිටි අතර, ඔවුන්ගේ හදවත් වෙනුවට අනුකරණය කරන ලද දිරාපත් නොවන හදවත් තැන්පත් කර තිබිණි.

පියැන්කි තම මුතුන් මිත්තන් වෙනුවෙන් මල්, සුවඳදුම්, අලුත් පාන්, වයින්, කිරි,බියර්, තෙල්, රෙදි හා රන්මාල පූජා කළේය. ''ඔබේ නාමයන් ගලේ කැටයම් කර තිබේ'' ඔහු පැවසීය. ''ඒවා කිසිදිනක අමතක නොවේ. මම ඔවුනට නැවත ජීවය දෙමි. එසේම මාගේ පුත්‍රයාගේ පුත්‍රයාද එසේ කරනු ඇත. සත්‍ය වශයෙන්ම තම මුතුන් මිත්තන්ගේ මතකය රැක ගනිමින් ඔවුන්ට පුද පූජා පවත්වන අයගේ නාමයද ගෞරවයට පාත්‍රවේ.''

අබිලා දුටුවන් වශීකරන රුවින් යුතු වූවාය. ඇයද ඇගේ සැමියා මෙන්ම, ගොඩබිම් දෙකේ ඊජිප්තුවන් ඔවුන්ගේ චාරිත්‍ර අමතක කරමින් සිටින බවත්, මා ආට් නීතිය බිඳ දමමින් සිටින බවත් පිළිගත්තාය. ශුද්ධ වූ නගරය වන තීබසය පවා ඒ උතුම් චාරිත්‍ර අමතක කරනු ඇත. පුද්ගලික බලාපොරොත්තු හා වාසිය, ලාභය යන මිරිඟුව පසුපස යනු ඇත. එහෙත් නපාටාවේ, ඒ බොහෝ ඈතින් පිහිටි වනගත බිමේ, කළු පාරාවෝ, පුරාණ ලියවිලි කියවමින්, තුත්මොසිස් III , සේටි I හා මහා රැම්සීස් යුගවල ඥානය රකිමින්, නිවැරදි චාරිත්‍ර රැක ගත්තේය.

එම උත්සවයට පැමිණ සිටි එක් අයෙක් මහත් ආඩම්බරයෙන් සිටිනු දක්නා ලදී. ඒ කුල්හෙඩ් නම් වූ ලේකම්වරයාය. ඔහු ආදි චිත්‍රලේඛන කලාව වර්ණනා කරමින්, උතුරු ජන කොට්ඨාස වල භාෂාවට සම්බන්ධයක් නැති පුරාණ භාෂාව අගය කළේය. පිරමීඩයේ ගල් මත වැටෙන ආලෝක කිරණ දුටු ඔහුට සිහිවූයේ පාරාවෝ වරුන්ගේ ස්වර්ණමය යුගයයි.

පියැන්කි තම පියාණන්ගේ සොහොන් පිහිටි භූමියේ දිඹුල් ගසක් සිටවීය. ඒ මොහොතේ අදෘශ්‍යමාන ලෝකය සමග සම්බන්ධයක් ඔහුගේ සිතේ හොල්මන් කළේය. ඉදිරිය කෙසේ වනු ඇතිද? එය කුමන අනතුරු හා තර්ජන පෙන්වූයේද?

# 11

ටෙෆ්නැක් තමා සතු මුළු හමුදාවම හෙනෙන් නෙසට් හෙවත් රාජකීය දරුවාගේ නගරයට එරෙහිව යොදවා තිබිණි. එය කළු පාරාවෝට යටත් ඉතා පැරණි ගම්මානයකි. ඇත්ත වශයෙන්ම ටෙෆ්නැක් ලිබියානු කුමාරවරුන්ගේ අවනතභාවය ගැන පුදුමයට පත්විය. ඔවුන් කිසිදු ප්‍රශ්න කිරීමකින්, විරෝධතාවයකින් තොරව ඔහුගේ සැලසුම ක්‍රියාවට නංවා තිබිණි.

ලිබියානුවෝ එකවිට ස්ථාන හතරකට පහර දී තිබිණි. මේ ප්‍රහාරය ආරක්ෂක භටයින් පුදුමයට පත් කරන සුළුවිය. ධනවත් ඉඩම් හිමියෙක්, ලේකම්වරයෙක්, ප්‍රසිද්ධ පවුලක පුතෙක් වූ හැට වියැති ඊජිප්තු අණදෙන නිලධාරි පෙෆ්ටෝ කුමරුට මෙම භයානක ආක්‍රමණයට මුහුණ දෙන්නේ කෙසේදැයි නිනව්වක් නැතිවිය. හොඳින් පුහුණුව ලැබ සිටියද ඔහුගේ සොල්දාදුවෝද ඊට අසමත් වූහ.

පැය බාගයක් තුළ උතුරු හමුදාවන් රහස් දොරටුව යටත් කරගෙන නගර දොරටුව බලෙන් විවෘත කරවා නගරයට කඩා වැදී තිබිණි. ආරක්ෂක ප්‍රාකාර මත සිටි පෙෆ්ටෝ ගේ දුනුවායන්, විනාශය අවම කිරීමට තැත්කළ නමුත් ලිබියානු ගල්දුනු ඔවුන් බිම හෙළා තිබිණි.

නිර්භීත සාමාන්‍ය ජනයා නොබියව සටනට එක්වුවද ඔවුහු උතුරු සොල්දාදුවන්ගේ අසිපත් වලින් මරු දුටහ. මුළු මහත් ප්‍රජාවම තැතිගැන්මට, කලබලයට පත්විය.

මේ විනාශය තම ජනතාවගේ සමූල ඝාතනයක් දක්වා ඉදිරියට යතැයි සිතූ පෙෆ්ටෝ කුමරු මාලිගයෙන් පිටතට පැන්නේය. තම පුද්ගලික ආරක්ෂකයින් වටකරගත් හෙතෙම තම භටයින්ට ආයුධ බිම තබන්නැයි අණ කළේය.

ටෙෆ්නැක්, පරාජිත කුමරා ඉදිරියට ගියේය. ''නුඹ කොන්දේසි විරහිතව යටත් වීමට කැමතිද?''

''අප ඔබේ සිරකරුවන්. එහෙත් නගර වැසියන්ට නිදහස දෙන්න.''

''එකඟයි. එහෙත් සියලුම ආයුධ නගර චතුරස්‍රයට ගෙනෙනවා නම් පමණක්.''

''එකඟයි.''

එහි වූ උමතු කලබලය ටිකෙන් ටික සංසිඳිණි. හෙනෙත් නෙසට් එහි කුමරාට කීකරු විය. තම නගරය යටත් කර ගත්තවුන්ගේ කෲර බවින් භීතියට පත් ගැහැනු තම දරුවන් බදාගත්හ. පැන යන්නට තැත්කළ භටයකු අල්ලාගත් ටෙෆ්නැක්ගේ පාබල හමුදා භටයින් සිව්දෙනෙක් ඔහු පාගා මරා දැමූහ. ඒ කෲරත්වය හෙනෙත් නෙසට්හි ආරක්ෂකයින් භීතියට පත් කළේය. නගරයේ හැම කොනකම වූ ආයුධ බිම තැබිණි.

''ඔබ සායිස්හි කුමරා නොවෙද?'' පෙෆ්ටෝ් ගල් ගැසී ඇසීය.

''අද මමයි උතුරේ මිත්‍ර සන්ධානයේ නායකයා.'' ටෙෆ්නැක් කීය. ''හෙට මා ගොඩබිම් දෙක නැවත එක් කරනවා.''

''ඔබ දැනගත යුතුයි එකම සත්‍ය පාරාවෝ පියැන්කි බව. මේ නගරය අයිති ඔහුටයි.''

''ඔබේ කැමැත්ත එය විය හැකියි පෙෆ්ටෝ්. එහෙත්. දැන් තා මගේ දාසයා. නැතහොත් තට මරණය.''

එය විහිළුවක් නොවන බව හෙනෙත් නෙසට්හි කුමරාට වැටහිණ. ඔහුගේ දෑසේ වූයේ අනුකම්පා විරහිත ආක්‍රමණික බැල්මකි. පෙෆ්ටෝ් හිස නමා ආචාර කළේය.

''මා ඔබ මගේ රජු සේ පිළිගන්නවා.''

''නුඹ පියැන්කිට පක්ෂපාතිද?''

''ඔව්. එහෙත් ඔබේ සැලසුම කුමක්ද?''

''හෙනෙත් නෙසට් නැවතුම්පොළක් පමණයි.''

''නැවතුම්පොළක්? එහි අදහස? ඔබ තවත් දකුණු දෙස ඉදිරියට නොයනු ඇතැයි මා සිතනවා.''

ටෙෆ්නැක් අවට බැලීය. ''නුඹේ භටයින්ගෙන් තුනෙන් එකක් මියගොස් හෝ තුවාල ලබා සිටිනවා. එහි තේරුම නුඹේ පළපුරුදු සටන් කරුවන්ගෙන් තුනෙන් දෙකක් තවමත් පණපිටින්. ඔවුනට හැකියි මගේ හමුදාවට එක්වී පියැන්කි විසින් පාලනය කෙරෙන තවත් නගරයක් යටත් කර ගන්නට.''

''හෙනෙත් නෙසට් විශිෂ්ට ජයක්.'' පෙෆ්ටෝ් කීය. ''මේ ඔබ ලබාගත් ජය, නුබියානුවන් බියගැන්වීමට සමත්. කුමටද තවත් දේ ඉල්ලා සිටින්නේ?''

''නුඹ දෙවැනි පන්තියේ මිනිහෙක් පෙෆ්ටෝ. නුඹ නුඹේ ආරක්ෂක ප්‍රාකාරයෙන් පිටත කිසිවක් දකින්නේ නැහැ. ප්‍රශ්න කිරීම නවත්වා මට අවනත වනු. එවිට නුඹට හිමි වරප්‍රසාද සියල්ල එසේම රැකෙනු ඇති.''

පරාජිත කුමරාගෙන් වෙන්ව ගිය ටෙෆ්නැක්, මාලිගයේ අමුත්තන් පිළිගන්නා ශාලාවේදී ලිබියානු නායකයින් හමුවිය. ඔවුන්ගෙන් කීප දෙනෙක් ඒ වනවිටත් බීමත්ව සිටි අතර සෙස්සෝ තම භටයින්ගෙන් ගලා ගිය රුධිරයෙන් නැහැවී සිටියහ. ඒ සියලු දෙනාම තමන්ට ඉක්මන් විශිෂ්ට ජයක් ලබාදුන් ජෙනරල්ගේ නම කියා කෑ ගසන්නට වූහ. ඔවුන් හෙනෙන් නෙසට් ජනතාව හා සොල්දාදුවන්ට බියෙන් සිටියද ටෙෆ්නැක් එසේ නොවේ. ඔහු යුද නායකයකුගේ හැකියාව පෙන්වා ඇති අතර සිහිනයෙන් හෝ නොදුටු අනාගතයකට මාවත හෙළිකර ඇත. සටන් කිරීමට ඔහු තුළ වූ ආශාවට පණ දී ඇත. ශතවර්ෂ ගණනාවක සිට ලිබියානුවන්ගේ සතුරන්ව සිටින ඊජිප්තුවන් සමූල ඝාතනය කිරීමේ ආශාවට පණ ලැබී ඇත.

මේ පළමු යුධ මෙහෙයුමෙන් උගත් පාඩම් සාකච්ඡා කිරීමට ටෙෆ්නැක්ට අවශ්‍ය වුවද ඔහුගේ සහායකයින්ගේ ඉල්ලීමට අනුව ඒ සියල්ල ඉවත දමන ලදී. ඔවුන්ගේ නොහික්මුන බවින් දැඩි කෝපයට පත් ටෙෆ්නැක් ඔවුන්ට බීමත්කමේ රස විඳින්නට හැර ඉවත ගියේය.

මාලිගයෙන් පිට වූ ටෙෆ්නැක් රතු පැහැති දිග ලෝගුවකින් සැරසුන අකනොෂ්ගේ ඇඟට කඩා පැන්නේය.

''කිමද නුඹ සටනට එක් නොවුණේ?''

''මා පාබල හමුදා භටයෙකු නොවෙයි. මමයි අපගේ ගෝත්‍රවල පණිවිඩ දෙන්නා. මගේ රැකියාව සටන් කිරීම නොවෙයි.''

''නුඹ මගේ ජයග්‍රහණය පිළිගන්නේ නැහැ?''

''ඔබ විශිෂ්ට ජයක් ලැබුවා. තව දුරටත් ඔබේ බලයට අභියෝගයක් නැහැ. ඒ නිසා මා සූදානම් ඔබේ උපදෙස් අකුරටම පිළිපදින්නට.''

''කදිමයි අක්නොෂ්. එසේ නම් සවන් දෙන්න. හෙනෙන් නෙසට්හි ආරක්ෂාව බලවත් කර ජංගම මුර සේවා සැලසුම් කරන්න.''

ටෙෆ්නැක් නාට්‍රෙබ් හා යෙගෙබ් හමුවීමට පිටතට ගියේය. ඔහුට යෙගෙබ් හමුවූයේ සටනේදී මරා දැමුණු නායක දූතුවායාගේ නිවස කොල්ලකා වස්තුව රැගෙන යන සොරුන් සමග සිටියදීය. වේදනා දෙන වළලුකර ඔසවමින් කොර ගසමින් ගියද ඔහු එහි ප්‍රධානියා බව

පැහැදිලිව පෙනිණි. ගෝනිවලට රන් පොලු පුරවමින් සිටි ඔහු ටෙෆ්නැක් දුටු විගස කතා කළේය.

''උතුමාණනි, මා...... මා..... මා.... මේ මිනිසුන් ගැන පරීක්ෂාවෙන් සිටින්නේ. බිය නොවන්න. ඔවුන් ගන්නේ ඔවුන්ට හිමි කොටස පමණයි.''

''මා නුඹව විශ්වාස කරනවා.'' ටෙෆ්නැක් අමනාපයෙන් කීය. ''නාට්‍රෙබ් කොහිද?''

''උඩ තට්ටුවේ උතුමනි.'' යෙගෙබ් අමනාපයෙන් කීය. ''එහෙත් මේ වෙලාවේ ඔහුට වැඩ අධිකයි මා සිතනවා.''

ටෙෆ්නැක් උඩ තට්ටුවට යන්නට විය. එහි නාට්‍රෙබ්ගේ පහරට ලක්වන, දූෂණයට ලක්වන ගැහැනියකගේ විලාපය ඔහුට ඇසිණ.

''නවතනු. නාට්‍රෙබ්.''

එහෙත් ඒ කෲර හිංසනය නැවතුණේ නොවේ. ''ඇය පියැන්කිගේ නායක දුනුවායාගේ දියණිය. මට විශ්වාසයි. ඇයට මා වැනි මිනිහෙක් හමු වී නැහැ.''

ටෙෆ්නැක් ඔහුට පා පහරක් දුන්නේය.

''එපා උතුමාණනි.'' නාට්‍රෙබ් කෑ ගැසීය.

''ඉවත ගොස් යෙගෙබ් සොයනු. හෙනෙන් නෙසටිහි කුමරු, පෙෆ්ටෝ ගැන පරීක්ෂාවෙන් සිටිනු.''

නාට්‍රෙබ් තමා දෙස වෛරී දෑසින් බලා සිටින තරුණිය දෙස නොබලාම තමා කෙටිසාය ඇඳගති.

''ඔබට ඔහුගේ පක්ෂපාතී බව සැකද උතුමාණනි?''

''මට අවශ්‍යයි ඔහු ගැන සියලු තොරතුරු දැනගන්නට. වහාම.''

පහළට යන්නට පෙර තම ගොදුර දෙස බැලූ දූෂකයා ''අපි නැවත හමුවෙමු පොඩි කෙල්ල.''යි කීය.

ඊජිප්තු තරුණිය තම නිරුවත් පියයුරු හා බඩ, ඉරීගිය ඇඳුමෙන් මුවා කළාය.

''කුමක්ද නුඹේ නම?'' ටෙෆ්නැක් ඇසීය.

''ඩේ බ්‍රේක්. නුඹද ලිබියානු ජෙනරල්?''

''මමයි මේ නගරයේ නව අයිතිකරු.''

''තා මගේ පියා මරා දැමුවා. මම තා මරා දමනවා.''

# 12

ආමන් දෙවොල අසල පිහිටි කළු පාරාවෝගේ මාලිගය, රියන් හතරක් උස පදනමක් මත තනන ලද අතර, ඒ වටා තාප්පයක්ද විය. ඊට මග විවර කරන විශාල දෙබිඩි දොරටුව, පියැන්කි වෙනුවෙන් සූදානම් කරන ලද සංග්‍රහයට එන නපාටාවේ සියලු ප්‍රභූන් පිළිගැනීමට විවර වී තිබිණි. මෙම උත්සවය භාරව සිටියේ අන් කිසිවෙකු නොව ආහාරවලට ගිජු ඔටොකු වූ හෙයින්, ඒ සන්ධ්‍යාව අති විශේෂ එකක් වන බව කවුරුත් දැන සිටියහ.

නායක දුනුවායා වූ පෝර්මාට වඩාත්ම අපහසු කාර්යය වූයේ ඒ සන්ධ්‍යාවට ගැලපෙන තරුණියක තෝරා ගැනීමයි. ඔහු අන්තිමේදී කළේ තමන් එහි ගෙනියන ලෙස ඇවිටිලි කළ දුසිමකට වැඩි තරුණියන් අතරින් අහඹු ලෙස එකියක තෝරා ගැනීමයි. එහෙත් ඉතිරි සියලු දෙනා ඔහු මහා ණයකරුවකු කරමින් ඔහුගෙන් තිළිණ ලබාගත්හ.

වාසනාවට මෙන් ඔහුගේ අතේ එල්ලුනේ අඩුවෙන්ම කතා කරන තරුණියයි. ඇය තම විශාල දෑසින් ඔහු දෙස බැලුවාය. ඒ උයනේ සෑම තැනකම සකස් කරන ලද පන්දම් වල එළියෙන් පාම් ගස් ගොන්න දිළිසිණි. නිල් හා රතු නෙළුම් මල් පිපුණු වැව්දිය මඳ ආලෝකයේ බැබළුනි. මාලිගයේ කුලුනු දෙස පුදුමයෙන් බලා සිටින අමුත්තන්ට, සේවිකාවන් විසින් සුවඳ කවන ලද අත්පිස්නා සහ සිසිල් වයින් බඳුන් පිරිනමන ලදී.

පෝර්මා සහ ඔහුගේ හිතවතුන් පඩිපෙළ නැග්ගෝය. කළු ගලින් තනන ලද ඒ පඩිවල පැතිවල සතුරන් පරාජය කරන පාරාවෝගේ සිතුවම් ඇඳ තිබිණි. ඒ වනවිටත් රාජ සභිකයින් විශාල සංඛ්‍යාවක් එහි පැමිණ සිටියහ. ඒ කාමරයේ ලස්සන සිත් වශීකරන සුළුය. කහ, කොළ, රතු, නිල් හා දම්පාට බිම් උළු, බිත්තිවල කෙළවර සවිකළ රන් ආලේපිත ලී දාර, කුළු හරකුන්, කළු දිවියන් හා අලින්ගේ සිතුවම් සහිත බිත්ති එහි

විය. ශාලාවේ ඈත කෙළවර ශෛලමය සිංහයන් දෙදෙනෙකු විසින් දරා සිටින උඩු වියනකි. ඒ වියන යටයි පාරාවෝ යුවලගේ අසුන් තබා තිබුණේ. පෝර්මාගේ හිතවතිය මේ දසුනින් කොතරම් විස්මයට පත්ව සිටියාද යත්; ඔවුන් සිටිතැන හරිමැද, අඳුර තුළ සඟවන ලද ආලෝකය සංකේතවත් කරනු වස්, මේ භූමියෙන්ම සොයා ගන්නා ලද රන් කුට්ටියක් වළලා තිබෙන බව ඇයට නොකියන්නට පෝර්මා ප්‍රවේසම් විය.

හදිසියේම කෙනෙක් පෝර්මාගේ ඇඟට පැන්නේය.

''කවුද? ඕහ්.... ඒ ඔබයි කුල්හෙඩ්. කිමද ඔබ සංග්‍රහයට සුදුසු පරිදි සැරසී නැත්තේ?''

''හෝ මට සිතන්නට වෙනත් දේවල් බොහෝයි.''

''කිමද ඔබ කලබලෙන්?''

''නැවතත් කාණු පද්ධතිය! මගේ උපදෙස් අමතක කරන කම්කරුවන්, ඔවුනට කැමති පරිදි සියල්ල කර අවසානයි. බොහොම සුළු දෙයක්. ගල් බේසමේ කෙළවරට තඹ පටි සවිකළා. අවශ්‍ය තරමට විශාලව තිබූ කාණු තවත් විශාල කොට ඒවාට ලෝහ පොරොප්ප සවි කරනවා. ඊළඟට තඹ තහඩු වලින් තනන ලද පයිප්ප වල නියම විෂ්කම්භය පරික්ෂා කරනවා. මා දන්නේ නැහැ මා කුමට මෙම නියම මිමි සහ සැලසුම් ඔවුන්ට දෙනවාද කියා. මාලිගයේ වම් පැත්තෙන් පිටවන අපිරිසිදු ජලය ඉවත් කිරීමේ කාණු, නැවතත් ඇහිරී තිබෙනවා. එහි තේරුම මේ ප්‍රිය සම්භාෂණයට මා නැහැ කියන එකයි. මට සිදුව ඇත්තේ ආපසු ගොස් ඒ කම්මැලි මෝඩයින් අවදි කරන්නටයි.''

කුරුමිට්ටා කෝපයෙන් දොඩවමින් පිටව ගිය වහාම සංගීතඥයෝ ඒ විශාල ශාලාවට ඇතුල් වූහ. වීණා වාදනය කරන තරුණියන් දෙදෙනෙක්, දෙසවන් සනසන වාදනයන් ඉදිරිපත් කළහ. ඒ සමග ම බටනලා කරුවෙක්ද තවත් විවිධ කලාකරුවෝද පැමිණියහ.

ප්‍රසංගය අවසානයේ, ප්‍රධාන සේවකයා අමුත්තන්ට භෝජන ශාලාවට යන්නැයි ඇරයුම් කළේය. එහි වූ මිටි, කළුවර මේස දුටු පෝර්මාගේ හිතවතිය ක්ලාන්තව නොවැටුණා පමණි. එහි බිම ඉරිඟු මල් විසිරුවා තිබූ අතර තෙල් පහන් තබන ලද්දේ රන් ආලේපිත ලී ආධාරක මතය. ඒ හැමටම වඩා ඇගේ ඇස් යොමුවුණේ ආහාර බේදීම දෙසටයි. ඒ අලංකාර දීසි, බීම පානය සඳහා වූ රන් කුසලාන, පිඟන්, කෝප්ප සහ අත් සෝදන බේසම්!

සේවකයෝ අවාන් වනන්නට වූහ. පත් වලින් වියන ලද මෙන්ම පැස්බර තටු වලින් තනන ලද අවාන් අමුත්තන්ට ප්‍රමාණවත් සිසිලසක් දැනවිය. ඒ සුවඳ ගන්වන ලද කාමරයේ කෙළවර අමුත්තෝ සැප පහසුවෙන් ඉඳගෙන සිටියහ.

රත්රන් සහ බාල මැණික් යොදා තනන ලද සයපොට මාල පැළඳි රූමත් කාන්තාවෝ දිළිසෙන දෑසින් අවට බැලූහ. පෝර්මාගේ හිතවතිය ඉන්පෙර කිසිම දිනක එතරම් ප්‍රමාණයක් කානෙලියන්, රතුකැට හා නිල්කැට දැක තිබුණේ නැත. එපමණක්ද? රන් කරාබු? රන් කරුවන් විසින් විවිධාකාර හැඩයට තනන ලද කරාබු ඔවුන්ගේ මුහුණු එළිය කළේය.

''මගේ ආභරණ..... මෙතනට සෑහේද?'' ඇය කම්පනයෙන් ඇසුවාය.

''හොඳටම ප්‍රමාණවත්.'' ඔහු වහා කීය. එක් සන්ධ්‍යාවකට පමණක් තම පෙම්වතිය වන තරුණියකගේ ගෙල වටා ආභරණ පුරවන්නට වියදම් කිරීමට ඔහුට හැකියාවක් නැත.

පියැන්කි සහ අබිලා පැමිණෙත්ම, අගය කිරීම්, වර්ණනා කෙළවරක් නොවිය. බලවත් රාජකීය යුවල, ඔවුනට වඩා රුවින් බබලන්නට සිතා සිටි සියල්ලන් පරදවන්නට සමත් වූහ. පියැන්කිගේ කළු සමටත්, අබිලාගේ තඹ පැහැති සමටත්, රන් කරපටි හා වළලු ගෙන දුන්නේ ඇදහිය නොහැකි අලංකාරයකි. ඒ දෙදෙනා තෝරාගෙන තිබූ ආභරණ දෙවියන්ට පූජා කිරීමට තරම් වටනේය. සියලු අමුත්තෝ රාජකීය යුවලගේ උසස් බව හා බලවත් පෙනුමෙන් පුදුමයට පත්වූහ.

පියැන්කි අති විශාල මුතු ඇටයක් පෙන්වූ විට කාගේත් ඇස් එදෙසට යොමුවිය.

''බලන්න සොබා දහමේ මෙම විශිෂ්ට නිර්මාණය.'' ඔහු කීය. ''මෙයයි මැවීමේ ගෝලයේ අදෘශ්‍යමාන සංකේතය. දිව්‍යමය මාතාවගේ පාරදෘශ්‍ය කුසෙහි සංකේතය. සෑම උදයකම හිරු උපත ලබන කුස. ඒ හිරු ඔබට ලබාදෙන ආලෝකය වන්දනා කරන්න. විටෙක මරණය ලෙස පෙනෙන මේ ජීවය වන්දනා කරන්න.''

රජු, රනින් කළ රවුම් හැඩති බීම බඳුනක් අතින් ගත්තේය. එය පිපුණු නෙළුමක් තුළ ඔබ්බවා තනන ලද්දේ විය. ඒ හැඩය සංකේතවත් කළේ මළවුන්ගෙන් නැගිටීමයි. ආදි කල්පිත සාගරයෙන් පිපී එන නෙළුම

තුළින් යළි උපදින ආත්මය ඉන් සංකේතවත් විය. එතුළ වූ වයින් මගින් සංකේතවත් වූයේ තාරකාවන්ට හා ආදරයට අධිපති හාතෝර් දෙවඟනට ගෞරව දැක්වීමයි.

රජු වයින් උගුරක් බීවේය. රැජින එය අනුගමනය කළාය. උත්සවය ආරම්භ විය.

✸

එවන් රාත්‍රියක ආරක්ෂක සේවයේ යෙදීම දොම්නසට කරුණකි. එහෙත් කළු පාරාවෝ අගනුවර ආරක්ෂාව සලසන නිලධාරියා ඇතුළු කණ්ඩායම අමතක කළේ නොවේ. ඔවුනට වැටුප හා සලාක දෙගුණයක් ගෙවන ලද අතර ඊළඟ දවසේ හොඳම රතු වයින් සංග්‍රහයක් ලැබිණ.

උසස්වීම් නොලැබීම හා වැඩි කාලයක් වැඩ කිරීමට සිදුවීම ගැන නිතරම මැසිවිලි නැගීම සොල්දාදුවන්ගේ සිරිත වුවද, නපාටාවේ නම් ඔවුන්ගේ ජීවිතය එතරම් නීරස නොවීය. නගරය ධනවත්ය. එය හොඳින් පාලනය කෙරිනි. එහි වැසියෝ සතුටින්, සාමයෙන් ජීවත් වූ අතර අභ්‍යන්තර ගැටුම් කිසිවිටක නොවීය. යුද්ධයක සලකුණු පෙනෙන මානයක නොවීය. ඈත අතීතයේ ලිබියානුවන් හා සිරියානුවන් සමග සටනට යන පාරාවෝ ගේ හමුදාවට බැඳී සිටි නුබියානුවන් අතිභයානක සටන් වලට මුහුණ දී තිබිණි. එකල නිරතුරුවම ආරක්ෂිත පුරයක් දෙකක් ළඟ තබාගත් නුබියානු සොල්දාදුවෝ ඕනෑම මොහොතක සටනට සූදානමින් සිටියහ.

හැකියාවක් තිබිණි නම්, ආරක්ෂක නිලධාරියා ඒ තරුපිරි අහස යට සුව නින්දක් ලබන්නට ඉඩ තිබිණි. ඒ තරු අතර රැඳී සිටින පාරාවෝ වරුන්ගේ ආත්මය ඔහුට ආරක්ෂාව සලසනු ඇත. එහෙත් කොතැනක හෝ සිටින මුර සෙබළෙක් ඔහු දකිනු ඇත. ඒ පිළිබඳව ඉහළ නිලධාරියෙකුට දන්වනු ඇත.

ආරක්ෂකයා තොල් හා නළල ඇල් මැරුණු දියෙන් තෙමාගති. ඔහුගේ ඇස් යොමු වී තිබුණේ උතුරට දිවෙන මග දෙසටයි. ඒ මග කෙළවරද ආරක්ෂක කුටියක් විය. නගරයට ඇතුල්වන ඕනෑම අයකු එහිදී දැඩි පරීක්ෂාවට ලක්වේ.

මාලිගා මුළුතැන්ගෙයි කෝකියෙකු ලෙස සේවය කරන තම නෑයාට පින්සිදු වෙන්නට, පියැන්කිගේ අමුත්තන්ට දී ඉතිරිවන ආහාර හෙට

දිනයේ ඔහු වෙත ලැබෙනු ඇත. ඒ ආහාර අතර, ශත වර්ෂ ගණනාවක් තිස්සේ පැවත එන කෑම වට්ටෝරුවකට අනුව සැකසෙන 'රැම්සීස්ගේ කැමැත්ත' නම් සෝස් වර්ගය තිබෙන බවට කටකතාවක්ද පැතිරිණ.

එක්වරම කාන්තාරය තුළින් යමක් දිලිසුණි.

මුලින්ම ආරක්ෂක නිලධාරියා සිතුවේ එය වැටෙන තරුවක් බවයි. එහෙත් ක්ෂණයකින් ඔහුට සත්‍ය තත්ත්වය වැටහිණි. එය මුරකරුවෙකුගේ සංඥාවකි. ඔව්. එය කිප වරක්ම දැල්වුණි. අනතුර ළඟම එන බවට සංඥාවකි ඒ.

# 13

ආරක්ෂක නිලධාරියා කල්පනා කළේය. රජු අවදිකළ යුතුද නැතහොත් පහන්වනතුරු බලා සිටිය යුතුද? පියැන්කි අවදි කළහොත් ඔහු කෝප වනු ඇත. එහෙත් අවශ්‍ය වේලාවේදී ඔහු දැනුවත් නොකිරීමෙන් ඇතිවන ප්‍රතිඵලය වඩාත් භයානක වනු ඇත. තීරණයකට එළඹිය නොහැකි නිලධාරියා කුල්හෙඩ් හමුවීමට තීරණය කළේය.

කාණු පද්ධතිය අලුත්වැඩියා කිරීම අධීක්ෂණය කර ප්‍රමාද වී පැමිණි කුල්හෙඩ්, නිදන්නට සූදානම්ව සිටියේය. ආඩපාලි කියමින් ගෙරවූ ඔහු අන්තිමේදී ඇඳේ ඉඳගති.

''හොඳයි නුඹේ අවශ්‍යතාවය?''

''බරපතල සිදුවීමක්.'' නිලධාරියා කීය. ''මා සිතනවා අප උතුමාණන් දැනුවත් කළ යුතුයි කියා.''

''හා හා එය නපාටාව ආක්‍රමණය කිරීමක් නොවෙයි නොවැ.''

''එහෙත්.....''

ඒ වනවිට කුල්හෙඩ්ගේ ඇස් ඇරී තිබිණි ''යම්කිසි පියවරක්?''

''එසේයි ඒ මිනිහා අත් අඩංගුවේ.''

කුරුම්ට්ටා රවා බැලීය. ''මිනිහා? ඔබ පවසන්නේ තනි මිනිහෙක් නපාටාවට පහර දෙන බවද?''

''රාත්‍රියේ ගමන් කරන ඕනෑම කෙනෙක් සැකකරුවෙක්. අපගේ ආරක්ෂකයින් එය ඉතා ඵලදායී බව ඔප්පු කර තිබෙනවා. මා සිතනවා මගේ කාර්යය...''

''මා එය රජුට සැල කරන්නම්.''

✸

පියැන්කි සිටියේ තද නින්දේ නොවේ. ඔහු පැය ගණනක් කල්පනා කරමින් සිටියේ, එකිනෙකා පරයමින් වර්ණනා මුඛයෙන් කතාකළ රාජ

සභිකයන් ගැනයි. ආහාර සහ වයින් පිළිබඳව ඔවුන්ගේ ප්‍රසාදය ඉතා ඉහළය. එතරම් කදිම බීර තැනීම පිළිබඳව ඔටොකුද වර්ණනාවට පාත්‍රවිය.

කළු පාරාවෝ, සත්ධ්‍යාවේ පැවති එම සංග්‍රහය ගැන එතරම් සතුටු වූයේ නොවේ. ඔහු තුළ දැඩි කනස්සල්ලක් පැවතිණි. රාජ සභාව තුළ නම් මාස ගණනාවක් ගතවනතෙක් කතාබහට ලක්වන එම සංග්‍රහයේ සතුට ඔහු වෙත ළං වූයේ නොවේ. අබිලා තම සැමියාගේ කණගාටුව වටහා ගත්තද ඔහුට බාධා කිරීමෙන් වැළකී සිටියාය.

පියැන්කි මාළිගා සඳළුතලයේ හිටගෙන අහස දෙස බලා සිටියේය. ඒ තරු, සත්‍ය බලයේ උල්පතයි. ජීවය ඇතිකරන බලයයි.

සඳළුතලය මත සැහැල්ලු පියවර හඬක්.

''කුල්හෙඩ්, ඒ ඔබද නැවතත්?''

''සමාවෙන්න උතුමාණනි, ඔබට කරදර කිරීම ගැන. එහෙත් ඔබ අවදියෙන් නිසා.....''

''රාත්‍රියේ මේ වෙලාවේ ඔබ සාමාන්‍යයෙන් තද නින්දේ නොවෙද සිටින්නේ?''

''මිනිහෙක් නගරයට ඇතුල් වෙන්න තැත්කළා. ඒත් දුනුවායන් ඔහු අල්ලාගත්තා. ඒ ගැන වග කියන නිලධාරියා උතුමාණනි, ඔහුගේ රාජකාරියේ වටිනාකමට අනුව උසස්වීමක් බලාපොරොත්තුවෙන් සිටිනවා.''

''ලබන මස සිට ඔහු රාත්‍රී මුර සේවාවන්හි ප්‍රධානියා බවට උසස් කරන්න. ඉන්පසු අපි බලමු. මේ බලෙන් ඇතුලු වුණ මිනිසාගේ නම?''

''නිලධාරියාට අනුව ඔහු වැදගත් කරුණු කිසිවක් පවසන්නේ නැහැ. ඔහු පවසන්නේ ආමන්ගේ සේවකයකු බවත්, නියම පාරාවෝට පණිවිඩයක් ගෙන ආ බවත් පමණයි.''

'' ඔබ ඔහු ප්‍රශ්න කළාද?''

''නැහැ උතුමාණනි. මා සිතුවා ඔබට අවශ්‍ය වෙතැයි කියා, හැකි ඉක්මනින් ඔහු හමුවන්නට.''

''ඔහු අමුත්තන්ගේ ශාලාවට ගෙන යන්න.''

✱

එය පියැන්කිගේ රාජ්‍ය සමයේ, විසිඑක් වන වර්ෂයේ, නයිල් ජල ගැල්මේ පළමු මස, පළමු දිනයයි. ඒ අළුයම වර්ණවත්, අලංකාර දසුනක් මැවීය. පෙරදිග කන්දෙන් හිරු තැටියක් සේ නැගී ආ ආලෝකය, මැවුම්කරුගේ ජීවී ප්‍රතිරූපයයි. පාරාවෝ යනු මැවුම්කරුගේ මිහිමත නියෝජනයයි.

අමුත්තන් පිළිගන්නා කාමරය සෞම්‍ය හිරු එළියෙන් නැහැවී යද්දී සැකකරු පියැන්කි ඉදිරියට ගෙන එන ලදී. ඔහුගේ දෑත් ලී විලංගුවෙන් සිරවී තිබූ අතර, ඔහුගේ දෙපසින් සොල්දාදුවන් දෙදෙනෙක් වූහ.

''ඔහු ලිහන්න. ඔබ පිටවන්න.'' පාරාවෝ කීය.

ඒ කළු පැහැයෙන් දිලිසෙන සමක් ඇති යෝධයා දුටු මිනිසා දිගු වේලාවක් ගොළු වී සිටියේය. ඉන්පසු ඔවුහු නැති ගැන්මෙන් කතා කළේය. ''උතුමාණෙනි.''

''කවුද ඔබ?''

''ආමන්හි පූජකවරයෙක් උතුමාණනි.''

''පූජකවරයෙකු ලෙස ඔබේ තත්ත්වය?''

''මා චාරිත්‍ර කරන්නෙක්. සන්ධ්‍යා චාරිත්‍ර සඳහා පූජනීය බඳුන් භාරව සිටින්නේ මමයි.''

''කුමන දෙවොලෙන්ද පැමිණියේ?''

''කාර්නැක්. දෙවියන්ගේ රජු වන ආමන් රා දොවොලින්.''

''කෙසේද මෙහි පැමිණියේ?''

''මා සතුව සිතියමක් තිබුණා. පා ගමනට පෙර මට බෝට්ටු කිපයකින්ම එන්නට සිදුවුණා.''

''රාත්‍රියේ පයින් ගමන භයානකයි. ඔබව සර්පයෙකු දෂ්ට කරන්නට තිබුණා.''

''මට ඒ අවදානම ගන්න සිදුවුණා උතුමාණනි. නුබියාවේ සිටින වඩාත්ම විෂ සහිත නාගයාටත් වඩා විෂ සහිත සර්පයෙකුගේ දෂ්ටනය මග හරින්නට. ඒ සර්පයා ඊජිප්තුව වටා දරණ ගසනවා, ඇගේ ජනතාවගේ හුස්ම හිරකරමින්. ඉක්මනින්ම ඌ ඔවුන්ගේ ජීවන හුස්ම උදුරා ගනීවි.''

''තේරවිලි නොපවසනු.'' පියැන්කි කීය.

''ඔබ දන්නවාද අකනොෂ් ගැන උතුමාණනි.?''

''ඔහු ඩෙල්ටාවේ ලිබියානු කුමාරයෙක්.''

''දැඩි ජීවිත අවදානමක් ගනිමින් ඔහු කාර්නැක් වෙත පණිවිඩයක් එවුවා. එය ඔබට ගෙනෙන්න මා තෝරා ගත්තා.''

''මට ඒ පැපිරසය දෙන්න වහාම.''

''එය වාචික පණිවිඩයක් උතුමාණනි.''

''පවසන්න.''

''ලිබියානු ජන කොට්ඨාස ඒකාබද්ධ වී සායිස්හි කුමරා වන ටෙෆ්නැක්, ඔවුන්ගේ අණදෙන නිලධාරි ලෙස තෝරාගෙන තිබෙනවා. ඔහු මුලින්ම ඩෙල්ටාවේ බටහිර යටත් කර ගත්තා. ඊළඟට මුළු ඩෙල්ටාවම. ඔහුගේ අති විශාල යුද හමුදාව මෙම්පිස්හි පාලනය අල්ලාගෙන දැන් දකුණට ගමන් කරනවා. ග්‍රාමීය කුමාරවරුන්, නගරාධිපතින් සහ ආණ්ඩුකාරවරුන් ඔහුගේ දෙපා මුල සුනඛයින් සේ වැතිරෙනවා. කිසිවෙක් ඔහුගේ අණ ප්‍රශ්න කරන්නේ නැහැ. හෙනෙන් නෙසට් දක්වා හැම නගරයකම දොරටු ඔහු වෙනුවෙන් විවෘත කළා. ඔහු ඒ හැමදෙනාගේම නායකයා බවට පත්වී හමාරයි.''

''එහෙත් මගේ විශ්වාසවන්ත පෙෆ්ටෝ කුමරු ඔහුට විරුද්ධ වුණා. ටෙෆ්නැක් තවදුරටත් ඉදිරියට යෑම නැවැත්වූවා. ඔහුගේ කයිවාරු නැවතී, ඒකාබද්ධ කණ්ඩායම විසිරී තිබෙනවා.''

''සමාවෙන්න උතුමාණනි,'' පූජකයා කීය. ''ටෙෆ්නැක් හෙනෙන් නෙසට් නගරයට පහර දුන්නා. පෙෆ්ටෝට හැකිවුණේ නැහැ ඊට එරෙහිව නැගී සිටින්නට.''

''පෙෆ්ටෝ ඝාතනයට ලක්වුණාද?''

''නැහැ උතුමාණනි. ඔහු යටත් වුණා.''

''නගරයේ ජනතාව?''

''ඔවුන්ගේ දිවි බේරුණා. ඒත් පෙෆ්ටෝගේ භටයින් දැන් ටෙෆ්නැක්ගේ අණසකට යටත්.''

''ඔවුන් ඔහුට එරෙහිව නැගී සිටියේ නැහැ?''

''ඔවුන් ඔහුට කීකරු නොවුණානම් සමූල ඝාතනයක් සිදුවෙන්නට තිබුණා උතුමාණනි. දැන් ඔවුන් ඔබේ සතුරන්.''

''එසේනම් දැන් ටෙෆ්නැක්, හෙනෙන් නෙසට් පාලනය කරනවා?''

''එසේයි උතුමාණනි. ඔබ තේරුම් ගත යුතුයි, දැන් ඔහුට නියම යුද හමුදාවක් ඇතිබව. එක් ජයග්‍රහණයකින් තවෙකකට යන.''

''ඔහුගේ යුධ උපක්‍රම ගැන දැනුමක් ඔබ සතුද?''

''ඔහු සෑම' දිනකම පහර දීමට සූදානම්. තවදුරටත් දකුණ බලා යාමට.''

''තීබසය දක්වා?''

''එසේයි උතුමාණනි.''

පූජකයාගේ හෙළිදරව්වෙන් ගොළු වී, තප්පර කිපයක් නිහඬව සිටි කළු පාරාවෝ මහ හඬින් සිනාසෙන්නට විය.

# 14

පියැන්කිගේ ප්‍රතිචාරය පූජකයාගේ බලවත් පසුබෑමට හේතුවිය.

''උතුමාණනි ඔබ මා පිළිගන්නේ නැද්ද?''

''ඔබ යාඥාව හා භාවනා කරන අයෙක්. ඔබ යුද්ධය හඳුනන්නේ නැහැ.''

''ඒත් අකනොෂ්?''

''කෙසේද ඔහුට මේ තත්ත්වය ගැන නිවැරදි දසුනක් ලැබෙන්නේ? අකනොෂ් ලිබියානු යුද නායකයෙක්, අර කයිවාරු ගහන ටෙෆ්නැක්ට යටත්. මේ කිසිවක් බරපතල ලෙස මට දැනෙන්නේ නැහැ.''

''ඒත් උතුමාණනි, මුළු මධ්‍යම ඊජිප්තුවම ඉක්මනින්ම ටෙෆ්නැක්ගේ පාලනයට යටත් වේවි.''

''තෝත් දෙවියන්ගේ නගරය, කමුත්, මට පක්ෂපාතීව ඉතිරිවේවි. ටෙෆ්නැක් ඊට පහර දීමට තරම් එඩිතර නොවේවි.''

පූජකයාගේ බලාපොරොත්තු සුන්විය. ''උතුමාණෙනි, ඔබ කිසිම ප්‍රතිචාරයක් දක්වන්නේ නැතිද?''

''බිය නොවන්න. මා මගේ යුද කවුන්සිලය රැස්කරනවා. ඔබට නැවතීමේ පහසුකම් හා ආහාර ලැබේවි. ආමන් දෙවොල ඔබට විවෘතයි. ඔබ ඔබේ ශුද්ධ වූ චාරිත්‍ර එහි ඉටු කරන්න.''

''උතුමාණෙනි මගේ ඉල්ලීමක් තිබෙනවා.''

''පවසන්න.''

''ඔබ මට මෙහි, නපාටාවෙහි, නවතින්න ඉඩ දෙනවාද? මා අසා තිබෙනවා මෙහි තවමත් පුරාණ චාරිත්‍ර කෙරෙන බවට.''

''ඔබේ කැමැත්ත එය නම් ඊට ඉඩ ලැබෙනවා.''

කළු පාරාවෝගේ යුද කවුන්සිලය අබිලා, කුල්හෙඩ්, පෝර්මා සහ ඔටොකුගෙන් සමන්විතය. පියැන්කි ඔවුන් වෙත සම්පූර්ණ විශ්වාසය තැබීය. ඔවුන් ඔහුට බොරු නොකියන බවත්, ඔහු නොරවටන බවත් ඔහු

දැන සිටියේය. සියලුම ඇමතිවරුන් හා රාජ සභිකයන් නොනවත්වාම කතා කිරීමේ හපන්නුය. ඔවුන්ගේ එකම අවශ්‍යතාවය වූයේ තමන්ගේම ආරක්ෂාව ගැන සිතීම බව පැහැදිලිය. ඒ නිසාම, අත්‍යවශ්‍ය තීරණ පුද්ගලිකව ගෙන පසුව රාජ සභාවට පැවසීම වඩාත් සුදුසු විය.

පියැන්කි තම විශ්වාසවන්තයින් හමුවූයේ, මාලිගා උයනේ වඩාත්ම සෙවන සහිත කොටසේදීය. එහි මධ්‍යයේ රජු නිතර පීනන පොකුණක් විය. ඒ ජූලි මාසය අග උණුසුම, නුබියානුවන්ට පවා ඔරොත්තු නොදෙන තරම් වුව, පියැන්කි ඉතා සතුටින් එහි ගත කළේය. මහ පොළොවේ ශක්තිය උකහාගෙන, සෑම ශරීර අංගයක්ම දැඩි පරීක්ෂාවට ලක් කිරීම පොකුණේ කාර්යය විය.

ඔටොකු සිසිල් දිය බඳුනක දෙපා ඔබාගෙන, නළලත සුවඳ දියරයෙන් තෙමූ තුවායක් එලාගෙන සිටියේය. කුල්හෙඩ් ඒ දැඩි උණුසුමට මුහුණ දුන්නේ බෝතලයකින් පසු බෝතලයක් සිසිල් වයින් බීමෙනි. කුඩයක් යට වාඩි වී සිටි රැජිනට උණුසුම කරදර නොකළ බවකි පෙනුණේ. ඇය ඒ කාන්තිමත් සිරුර යන්තමට මුවාකළ සිවුරකින් සැරසී සිටියාය. තම පුහුණු සන්නාහය ඇඳීමට අකැමැති පෝර්මා සිටියේ නිර්වස්ත්‍රවය.

''මගේ එක සැකයක් දුරු කරන්න උතුමාණනි.'' ඔටොකු සුවඳ කැවූ තෙලකින් සම අතුල්ලා හරිමින් කීය. ''මේ හමුවීම අතිශය සාමාන්‍ය එකක් නොවේද?''

''හිත රවටා නොගන්න. ඔබ දන්නවා මෙය යුද කවුන්සිලය බව.''

තර මිනිහා තම ඇහිබැම පිස දැමීය. ''ඔබට එරෙහිව ජන කොට්ඨාස කැරලි ගහනවද උතුමාණෙනි?''

''මෙය ඊට වඩා භයානක තත්ත්වයක්. ලිබියානු කුමරකු වන ටෙෆ්නැක්, තවත් අය හා ඒකාබද්ධව යුද හමුදාවක් තනාගෙන.''

''විහිළුවක්.'' පෝර්මා කීය. ''ලිබියානුවන් පරම සතුරන්. එකෙක් වෛර කරනවා අනෙකාට. ඔවුන්ට කිසිදා ඒකාබද්ධ වී නායකයකු පත්කර ගත නොහැකියි.''

''එහෙත් ටෙෆ්නැක් ඊට සමත් වී සිටිනවා. උතුරු පළාත් ප්‍රධානීන් ඔහු තෝරාගෙන තිබෙනවා ඔවුන්ගේ ප්‍රධානියා ලෙස. අණ දෙන්නේ ඔහුයි, ජෙනරාල් ටෙෆ්නැක්. දැන් ඔවුන් යටත් වැසියන්.''

''එය සිදුවීමට හේතු තිබුණා.'' කුල්හෙඩ් ශෝකයෙන් කීය. ''උතුරේ ආර්ථික තත්ත්වය බරපතලයි. දහස් ගණන් මිනිසුන්ට වැඩ නැහැ. ආහාර

මිල දිනෙන් දින ඉහළට. තවදුරටත් එහි වැසියන් දෙවියන්ට පූජා පවත්වන්නේ නැහැ. කිසිම බාධාවක් නැතිව අසාධාරණය හා දූෂණය එහි පාලනය ගෙනයනවා. ඒ හේතු නිසා සිදුවිය හැකිව තිබුණා, හොඳින් ආයුධ සන්නද්ධ හමුදාවක් තනන ඒකාධිපතියකුගේ පැමිණීම.''

''ආයුධ සන්නද්ධ? විය නොහැකියි.'' පෝර්මා විරුද්ධතාවය පළ කළේය. ''මේ දිනවල උතුර, ඔවුනට සුදුසු භට කණ්ඩායම් පුහුණු කිරීමට නොහැකි තරමට දිළිඳු බවට පත්වී හමාරයි.''

''ටෙෆ්නැක් මෙම්පිස් යටත් කරගෙන'' පියැන්කි හෙළි කළේය. ''ඔහු හෙනෙන් නෙසට් යටත් කරගෙන.'' කළු පාරාවෝගේ වදන් සෙස්සන්ට අකුණු පහරක් සේ විය.

''කෙසේද උතුමාණෙනි ඔබට ඒ තොරතුරු ලැබුණේ?'' ඔටොකු ඇසීය.

''දින ගණනක් මග ගෙවාගෙන අපට මෙය දැන්වීමට පැමිණි ආමන් පූජකයෙකුගෙන්.''

''ඒත් ඔබ එය එතරම් ගණනකට ගත්තේ නැහැ.'' අබිලා කිවාය.

''සත්‍යයක්.'' පියැන්කි එකඟ විය. ''මා සිතන හැටියට මේ ටෙෆ්නැක්ට අවශ්‍යව ඇත්තේ උතුරේ සියලු නායකයින් අභිබවා විශිෂ්ට ජයක් අත්කරගෙන බලය පැතිරවීමටයි. හෙනෙන් නෙසට් යටත් කර ගැනීම සැලකිය යුතු ජයක්. එහෙත් ඔහු එතැනින් එහා යන්නට තරම් එඩිතර නොවේවි. ඔහුට අවශ්‍ය සම්පත් නැහැ. දාමරික නායකයෙකුට විශිෂ්ට ජෙනරාල් කෙනෙක් වෙන්නට බැහැ, එක රැයකින්.''

නායක දුනුවායා එකඟත්වය පළකර හිස වැනීය.

''කෙසේ වෙතත් අප ප්‍රහාරයකට සූදානම් විය යුතුයි.'' ඔටොකු කීය. ''මේ කරදරකාරයාට ඔහු කැමති පරිදි හැසිරෙන්න ඉඩ දීම ඔහු දිරිගැන්වීමක් වේවි.''

''මට පෙනෙන්නේ ඊට වැඩිය අසුබවාදී දසුනක් උතුමාණනි.'' කුල්හෙඩ් කනස්සලු විය.

කුරුමිට්ටාගේ කතාව කාගේත් බිය ඉස්මතු කළේය. කවුරුත් ඔහුගේ විශිෂ්ට බුද්ධියට ගරු කළ අතර ඒ අදහස් විශ්වාස කිරීමට පුරුදුව සිටියහ.

''කිමද ඔබ බියවන්නේ?'' ඔටොකු ඇසීය.

''උතුරේ මිත්‍ර පාක්ෂිකයින් ගැන මගේ අදහස වෙනස්. මේ වනවිට ඔවුන්ගේ විරුද්ධවාදීන් ඔවුන් බල රහිත කර තිබෙනවා. අපත් එවැනිම

අරාජක තත්ත්වයන්හි ජීවත් වී තිබෙනවා, නුබියානුවන් ලෙස. ඒ නිසා අප දන්නවා එහි නියම තත්ත්වය. ඉතින් ඔවුන් ඒ තනි මිනිසකුගේ බලයට යටත් වීම, ඔහු නායකයා ලෙස පිළිගැනීම, ඔවුන්ගේ වරදක් නෙවෙයි. හොඳ ගතිගුණයක්. ඔවුන් ඒ නායකයා ක්‍රියා කරන හැටි බලා ඉන්නවා. බලන්න මෙම්පීස් දෙස. එහි සිටියේ නැහැ තනිව තීරණ ගත හැකි නායකයෙක්. ඒ නිසා ඔවුන් ඕනෑම ආක්‍රමණයකුට, දෙවෙනි පෙළේ එකෙකුට වුවත් විරෝධය එල්ල කිරීමට සිතුවේ නැහැ. හෙනෙත් නෙසට් යනු පෙෆ්ටෝගේ නායකත්වයෙන් යුතු විශිෂ්ට බලකොටුවක්. ඔහු පියැන්කිට පක්ෂපාතී අයෙක්. එහෙත් ඒ නගරය යටත් කර ගැනීමට අවශ්‍ය වුණේ සුළු සටනක් පමණයි. ටෙෆ්නැක්ට මේ විශිෂ්ට ජයග්‍රහණ ගැන ඇත්තටම සතුටු විය හැකියි.''

''ඔබේ උත්සාහය අප වේදනාවට පත් කිරීමද කෝප ගැන්වීමද?'' පියැන්කි ඇසීය.

''ඒ දෙකම නෙමෙයි උතුමාණනි. මා පවසන්නේ මට දැනෙන දෙය පමණයි.''

''මට විශ්වාස කළ නොහැකියි මේ ටෙෆ්නැක් නම් මිනිසාට හැකියි කියා අපට අභියෝග කරන්නට.'' පෝර්මා කෑ ගැසීය. ''මේ කියන ජයග්‍රහණය සත්‍යනම් එය එතැනින්ම අවසන් වේවි.සාමාන්‍ය නායකයෙක් පාරාවෝ පියැන්කිගේ කෝපය අවුස්සන්නට නොබියව ඉදිරිපත් වේද?''

''ඔහුගේ එම ජයග්‍රහණය ගැන ඇසූ මා හඬනගා සිනාසුණා.'' රජු කීය. ''එහෙත් කුල්හෙඩ්ගේ විස්තරය ඇසූ මට හිතෙනවා මා වැරදිද කියා.''

''සාමාන්‍ය ජනයාගේ අවාසනාවන්ත කමින් වාසි ලබන ආකාරය දන්නා නීච මිනිසකුට හැකියි ඔවුන් හැම අතින්ම උමතු කරවන්නට.'' අබිලා කීවාය. ''ටෙෆ්නැක් ජයග්‍රහණය කර ඇත්නම් ඔහු තුළ ස්වයං විනය නැතිවේවි. සටනේදී ඔහුගේ පයට පෑගෙන මිනී පිළිබඳව යන්තමට හෝ වේදනාවක් ඔහු තුළ නොවේවි. මා කුල්හෙඩ් හා එකඟයි. මා සිතන්නේ දකුණ ආක්‍රමණයට ඔහු තුළ ඇති උනන්දුව සුළුවෙන් තැකීම වරදක් බවයි.''

''එහෙත් කමුන්ට පහරදීම පහසු නොවේවි.'' පෝර්මා කීය. ''එහි කුමරු නෙම්රොඩ්, පියැන්කිට පක්ෂපාතී බවට දිවුරා සිටිනවා. එසේම ඔහු සතුව හොඳ හමුදාවක් සිටිනවා.''

"අප හෙනෙත් නෙසට් ගැන සිතුවේත් එලෙසම නොවෙද?" කුරුම්ට්ටා සිහි කළේය. "ටෙෆ්නැක් මුලු මධ්‍යම ඊජිප්තුවටම නායකයා වුවහොත් තිබසයට යන මාවත විවෘත වේවි. ඉන්පසු? කාටද කිවහැකි කුමක් සිදුවේවිද කියා."

"එවැන්නක් සිදු නොවේවි." ඔටොකු කිය. "තිබසයේ රැඳී සිටින අපගේ හමුදාවන් ඔහු පැරදවීමට ඕනෑවටත් වැඩියි."

"අපි එසේ ප්‍රාර්ථනා කරමු." කුල්හෙඩ් කීය.

පෝර්මා හිස නමා රජුගෙන් මෙසේ ඇසීය. "කුමක්ද ඔබේ තීරණය උතුමාණෙනි?"

"මට සිතන්නට කාලය අවශ්‍යයි."

# 15

අකනොජ් කුමරුගේ බිරිඳ කොතරම් කලබල වී සිටියාද කිවහොත් මුහුණු ආලේපන පවා අමතක වී තිබිණි. ''එන්න එන්න'' ඇය සැමියාට කතා කළාය. ''මේ දැන්ම. දැන්ම එන්න.''

''එහෙත් මා උදේ ආහාරය ගත්තෙත් නැහැ. මගේ රැවුල...''

''එන්න!''

අකනොජ් තම ගොතන ලද කොණ්ඩයේ පැස්බර පිහාටුවක් සවිකරගෙන, හැකි ඉක්මනින් දිග ලෝගුවේ පටි වම් උරහිසට උඩින් ගැට ගැසීය. හදිසිය කෙතරම් වුවත්, තම බලයේ සංකේත නොමැතිව ඔහුට හෙනෙන් නෙසටිහි මාවතට පා නැගිය නොහැකිය.

''කොහේද ඔබ මා ගෙනියන්නේ?'' ඔහු ඇසීය.

''රෝහලට. ප්‍රහාරයෙන් තුවාල ලද්දවුන් සිටින රෝහලට.''

''මගේ කාරිය රෝහල් බලන්නට යාම නොවෙයි. එය ඔබේ කාරියත් නොවෙයි.''

''ඔබත් ටෙෆ්නැක්ගේ පෙරමුණේ සාමාජිකයෙක් නොවෙද? ඔව්ද නැහැද?''

''ඔව්. එහෙත්?''

''එසේ නම් ඒ රෝහලට යමු.''

ගඩොලින් තැනූ ඒ රෝහලට සොල්දාදුවන් දෙදෙනෙකුගේ ආරක්ෂාව ලබා දී තිබුණි. ඔවුනගේ හෙල්ල අකනොජ් හා බිරිඳ ඉදිරිපිට හරස් විය.

''මා අකනොජ් කුමරු. ඉඩදෙනු.''

''යෙගෙබ්, කිසිවෙකුට ඇතුලු වෙන්නට ඉඩ දී නැහැ.'' එක් භටයෙක් කීය.

''කෙසේද නුඹ මා නවත්වන්නේ සොල්දාදුවා? නුඹේ යෙගෙබ්

නිකම්ම කෘමියෙක් පමණයි. නුඹ අපට යන්නට ඉඩ නොදුනහොත් මා තොප දෙදෙනාම මාරුකර යවනවා ඩෙල්ටාවේ වගුරු බිම්වලට!''

මුරකරුවෝ හෙල්ල පහත් කළහ.

ඒ ගොඩනැගිල්ලට පා තබන අකනොෂ්ට දැනුණේ ඉවසාගත නොහැකි දුර්ගන්ධයකි. ලේ, කුණු වූ තුවාල, මළමිනී.... ගැහැනු පිරිමි දුසිම් ගණනක් එහි බිම පේළියට වැතිර සිටියෝය. දොරටුව අසල සිටියවුන් විලාප තැබුවද, ඇත කෙළවර සිටි සියල්ලන් මියගොස්ය.

සොල්දාදුවන් දෙදෙනෙක් මළ සිරුරක දෙපයින් ඇදගෙන පිටතට ගෙන යන්නට වූහ.

''කොහේද තොප එය ගෙනයන්නේ?'' අකනොෂ් කෑ ගැසීය.

''යෙගෙබ්ගේ අණින් අගලක් කපා තිබෙනවා. අප මෙය එතුළට විසිකරනවා. එවිට මෙහි ඉඩ ලැබෙනවා නෙවැ. මිනී සියල්ල ඉවත් කළ පසු තව තුවාලකරුවන් මෙහි ගෙනෙනවා. සියලුම තුවාලකරුවන්.''

''කුමක්ද මේ අසරණයන්ට දෙන ඖෂධය?''

''කුමන ඖෂධද? ඔවුන්ට හොඳම දේ ඉක්මනින් මිය යාමයි.''

✸

පෙෆ්ටෝ කුමරු තම මාලිගයේ පළමු මහල ටෙෆ්නැක්ට පිරිනමා තිබිණි. ටෙෆ්නැක් එහිදී තම සගයින් වෙන් වෙන්ව හමුවී තම යුද උපක්‍රමවල සාධාරණත්වය පෙන්වා දෙමින් සිත් සැනසීමට ක්‍රියා කළේය.

ඒ කාමරයට පිටතින් තිබුණේ යෙගෙබ්ගේ කාර්යාලයයි. සියලු අමුත්තන් එහිදී පරීක්ෂා කෙරිණි.

''මට ටෙෆ්නැක් හමුවීමට අවශ්‍යයි වහාම'' අකනොෂ් කීවේය.

යෙගෙබ් දින හා නම් සඳහන් පැපිරසයක් ගෙන කියවා බැලීය. ''ඔබට ආරාධනාවක් නැහැ. ඉල්ලීමක් කර, ජෙනරාල්ගේ පිළිතුර ලැබෙන තෙක් රැඳී සිටින්න.''

අකනොෂ් කෝපයෙන් පුපුරන්නට විය. ඔහු යෙගෙබ්ගේ බෙල්ලෙන් අල්ලා, ඔහු ඒ තර මිනිහාට වඩා කුඩා වුවත්, ඉහළට එසවීය. ''පණුවා, මා නවත්වන්නට උත්සාහ නොකරනු! තා අපරාධකරුවෙක්. මස් මරන්නෙක්. තොප කර ඇති දේ ඔහුට පැවසීම මගේ යුතුකම. ඔහු කුමන දඬුවමක් නියම කළත් මා පිළිගන්නවා එය''

හුස්ම ගන්නට දඟලන යෙගෙබ් අත්හැර දැමූ කුමරා ටෙෆ්නැක් ගේ කාමරයට ඇතුල් විය.

ටෙෆ්නැක්, කළු පාරාවෝ පරාජය කළ පළමු සටන ගැන තොරතුරු, ලියන පුවරුවක සටහන් කරමින් උන්නේය. එය කිප වරක්ම පිටපත් කර ජ්‍යෙෂ්ඨ නිලධාරීන් වෙත බෙදා හරිනු ඇත. එමගින් සියලු සොල්දාදුවන් ඉදිරියේ එය කියවෙනු ඇත. මේ පුවත මධ්‍යම ඊජිප්තුව පුරා පැතිර යනු ඇත. තීබසය දක්වාම පැතිරෙනු ඇත. එමගින් පියැන්කිගේ ආධාරකරුවන් තුළ භීතියේ බීජ වපුරා, යටත් වීමට ඔවුන් දිරිගන්වනු ඇත.

ටෙෆ්නැක්ගේ කළු ඇස්, හදිසියේ කඩා වැදුණ තැනැත්තා වෙත යොමුවිය. ''මා ඔබව කැඳවා නැහැ.''

''මේ නගරයේ සිදුවන දේ පිළිබඳව මා ඔබට පැවසිය යුතුයි.''

''සියල්ල සන්සුන්. අපගේ යුධ හමුදාව සියල්ල පාලනය කරනවා. පෙෆ්ටෝ කුමරු දැන් මගේ සේවකයා. කුමක්ද පැමිණිල්ල?''

''ඔබ දන්නවාද මෙහි වැසියන්ට වෙන්කර ඇති රෝහල මළකඳන් ගොඩ ගසන ස්ථානයක් බවත්, රෝගීන්ට කිසිදු ඖෂධයක් නොදෙන බවත්? එම්බාම්කරුවන් ඔවුන් මියයනතෙක් බලාසිට ඇදගෙන ගොස් එකම වළකට විසිකරන බව? කිසිදු අවමඟුල් චාරිත්‍රයක් නොමැතිව? මේ සියල්ල කෙරෙන්නේ ඔබේ වහලා යෙගෙබ්ගේ නියමයෙන්. මගේ ඉල්ලීම ඒ අසරණයින්ට හොඳ ප්‍රතිකාර කරන ලෙස හා ඒ වධකයාට දඬුවම්!''

ටෙෆ්නැක් තම අතැති පුවරුවෙන් බිත්තියට දමා ගැසීය. ''නුඹ කිසිම ඉල්ලීමක් කළ හැකි තත්ත්වයක නැහැ අකනොෂ්. නුඹට අමතකයි නුඹ මගේ යටත් දාසයකු බව.''

''එහෙත් සිවිල් ජනතාව?''

''නුඹේ වැලපීම ලිබියානු කුමරෙකුට නොගැලපෙයි.'' ටෙෆ්නැක් උපහාසයෙන් කිය. ''උතුර දිළිඳු බවට පත්ව තිබෙනවා. නුඹ ඒ බව දන්නවා. අපගේ හමුදාවන්ට ඖෂධ හා ආලේපන හිඟයක් තිබෙනවා. හෙනෙන් නෙසට්හි තිබූ සියලු ඖෂධ අපගේ හමුදාවන්ට අවශ්‍යයි. ඒවා මගේ නියමයන්. ඊට එරෙහි වන ඕනෑම කෙනෙක් රාජ ද්‍රෝහියෙක්.''

''එසේනම් අපගේ තුවාලකරුවන් ප්‍රතිකාර නොමැතිව මැරෙන්නට හරිනවාද?''

''අප සිටින්නේ යුද්ධයක අකනොෂ්. එවිට අපට සිදුවෙනවා යම් යම් දේ කරන්නට. කාරුණික සිතිවිලිවලට නොහැකියි පියැන්කිගේ රණ විරුවන් පරාජය කරන්නට.''

"ඔබ මට පොරොන්දු වුණා මේ නගරයේ ජනතාවට කරදරයක් නොවන බවට."

"නුඹ මගේ ක්‍රමයට එකඟ නැතිද?" ටෙෆ්නැක් කෝපයෙන් කෑ ගැසීය.

ඔහුට එරෙහිව පිට වන්නට ගිය වදන් අකනොෂ්ගේ උගුරේ සිරවී ගියේය.

"සන්සුන්ව හිතන්න මිත්‍රයා. මේ නොවැදගත් දේ අමතක කරන්න. අප හා එක්වන්න. නුඹේ මනස එකම අරමුණකට යොදවන්න. ඊජිප්තුව නැවත යටත් කර ගැනීම. අපගේ ජයග්‍රහණය ජනතාවට සතුට ගෙන එන බව ස්ථිරයි."

"යෙගෙබ්?"

"ඔහු මට යටත්. කිසිදා මගේ අණ පිළිබඳව විමසන්නේ නැහැ. ඔහු මෙන් වැඩ කරන්න අකනොෂ්. නුඹට හැකිවේවි නුඹේ මහලු දිවිය සතුටින් ගෙවන්නට."

අකනොෂ් යෙගෙබ් දෙස නොබලාම කාමරයෙන් පිටව ගියේය.

✸

"මේ තුවාලකරුවන්ට වෙදැදුරන් පැමිණෙන්නේ නැතිද?" අකනොෂ්ගේ බිරිඳ විමසුවාය.

කුමරා කොට්ට ගොඩක් මතට වැටුණි.

"නැහැ, ඔවුන් එන්නේ නැහැ."

"ඒත්... ඔබ ටෙෆ්නැක්ට කතා කළේ නැතිද?"

"කතාකළා."

"ඔහු එය ප්‍රතික්ෂේප කළා?"

"වටහාගන්න ප්‍රේමිය. මෙය යුද්ධයක්. ඔබට, මට, ටෙෆ්නැක්ට මේ කිසිවෙකුට ඒ වෙනුවෙන් කිසිම දෙයක් කළ නොහැකියි."

"ටෙෆ්නැක් අප හමුදාවන්ගේ අණදෙන නිලධාරි. ඔහු පවසනවා නම් සාමාන්‍ය ජනතාව මරණින් බේරෙන බව, ඔහු බොරුකාරයෙක්."

"ඔබ නිවැරදියි. එහෙත්...."

රූමත් නුබියානු ගැහැනිය තම සැමියා දෙස ශෝකයෙන් බැලුවාය. "ඔබ බියෙන්. ඔහුට එරෙහිව යන්නට? එසේ නොවෙද පෙම්වත?"

"මට දැනෙනවා මා මහලු වැඩියි කියා ටෙෆ්නැක්ට එරෙහිව යන්නට. මා දුර්වලයි. මා ඔහුට එරෙහි වුවහොත් ඔවුන් මා මරා දමාවි. ඒ කුණාටුව ඔබවත් ඇදගෙන යාවි. මාත් අනෙක් සියලු නායකයින් වැනියි. ඔහුගේ අතේ සිටින පඹයකු හා සමානයි. එහෙත්, එය තේරුම් ගන්නේ මා පමණයි. ඊජිප්තුව ජය ගැනීමට ටෙෆ්නැක් ඕනෑම දෙයක් කරාවි. ඔහු නියම රණකාමියෙක්. පියැන්කි වහාම ක්‍රියාත්මක නොවුණහොත් ටෙෆ්නැක් ජය ගනීවි. ඔහු මේ රටට කිසිදා ගැලවීමක් නැති ඒකාධිපතිත්වයක් ගොඩනගාවි."

# 16

කාර්නැක් වෙතින් පැමිණි පූජකයා මුවු හිසින්, වහන් රහිතව සෙමෙන් සෙමෙන් ශුද්ධ වූ වැවට බසින පඩිපෙළ බැස්සේය. වැව පිහිටියේ මහ දෙවොල අසලය. ඔහු රන් බඳුනකට ජලය පුරවා ගන්නට නැමුණේය.

මේ ජලය එන්නේ නන් වෙතිනි. එනම් නිමැවුම උපන් ආදිකල්පිත සාගරය වෙතිනි. පෘථිවිය යනු දිව්‍යමය මැවිල්ලෙන් උපන් ගොඩබිමකි. දිව්‍යමය සිතිවිල්ල උපන් ප්‍රථම වතාවේ මතුවූ ගොඩබිමක් වන පෘථිවිය, නැවතත් ඒ දිව්‍යමය සිතිවිල්ල ඇතිවීමට අවශ්‍ය වන චාරිත්‍ර පාරාවෝ විසින් නොපැවැත්වුන දිනක, ආදිකල්පික රළ පහරේ ගිලී යනු ඇත. දෙවියන්ගේ කඳුළින් උපන් මනුෂ්‍යත්වය, අවසානයේදී මනුෂ්‍යයාගේම පව්ටු හැසිරීම හේතුවෙන් අතුරුදහන් වනු ඇත.

පූජකයින්ගේ කාර්යය වූයේ වැළැක්විය නොහැකි ඒ දවස, දෙවියන්ට සුදුසු වාසස්ථානයක් සපයා දීමෙන් හා චාරිත්‍ර ඉටු කිරීම මගින් කල් දැමීමයි. ඒ අනුව මා ආට් නීතිය ගරු කරන්නවුන්ගේ, අසාධාරණය යටපත් කොට සාධාරණත්වය ඉටු කරන්නවුන්ගේ හදවත් දීප්තිමත් වනු ඇත.

නපාටාව පුදුම සහගත බව පූජකවරයාට පෙනිණි. සදහටම නැවතී යතැයි ඔහු සිතූ භක්තිය එහිවිය. කාර්නැක්හි සමහර දෙවොල්හි දැනට නොපැවත්වෙන චාරිත්‍ර, මෙහි ඉතා නිවැරදිව කෙරිණි. සිව්වැනි දියඇල්ල සමීපයේ පිහිටි මෙම නගරයේ, ආමන්ට නිසි ගෞරවය ලැබිණි.

පූජකයා ශුද්ධ වූ ජල බඳුන ගෙන පූජා කාමරයට ඇතුල්විය.

එක්වරම, යෝධයෙක් ඔහුගේ මග අවුරා සිටගති.

"ඔබ මෙහි සතුටින්ද සිටින්නේ?"

"උතුමාණනි," පූජකයා කීය. "මගේ දවස් මායාවක් වැනියි. අසිරිමත් දිවියක් උතුමාණනි."

''ඔබ මා පුදුම කරනවා. ඔබට කාර්නැක් අභිමිවුවා නොවෙද?''

''මට හැකිනම් ඔබට පහදා දෙන්න, මා මෙය කොතරම් අගය කරනවාද කියා, උතුමාණනි!''

''ඔබේ පුදපූජා අවසන් කොට එන්න මා හා දෙවොල් පුස්තකාලයට.''

✸

පිරමීඩ ලියවිලි, මළවුන්ගේ පොත්, මුඛය විවර කිරීමේ චාරිත්‍ර, නව වසර සඳහා වන උත්සව චාරිත්‍ර, සුබ අසුබ දින යනාදී සියල්ල, එහි සටහන් කර තිබුණේ පිරමීඩ යුගයේ සිටයි.

නපාටා පුස්තකාලයේ වටිනාකම දුටු පූජකයා පුදුමයට පත්විය. කළු පාරාවෝ සියලු ශුද්ධ වූ ලියවිලි සුදුසු තැන තබා තිබිණි.

''උතුර අපගේ පාරම්පරික චාරිත්‍ර වලින් ඈත්වන බව දැනගත් වහාම මා තීරණය කළා ඒ සියල්ල මෙහි එක්කොට තබන්නට'' පියැන්කි කීය. ''අපගේ ශිෂ්ටාචාරය සදාකල් පවත්වා ගැනීමට අවශ්‍ය වන ලියවිලි එක තැනක තබන්නට.''

පූජකයා රාක්ක එකින් එකට ගියේය. ඔහුගේ දෑත් ඉතා ගෞරවයෙන්, ප්‍රවේශමෙන් ඒ පැපිරස් පෙට්ටි මත තැබිණි.

''පවසන්න මට.'' රජු කීය. ''තවදුරටත් කාර්නැක්හි ආමන් දෙවියන්ට ගෞරව දැක්වීමක් නැතිද?''

''එහි ස්ථිර පූජකවරු නිදිමතේ සිටිනවා. තාවකාලික පූජකවරුන් තමන්ගේ චාරිත්‍ර හා යුතුකම් ගැන හිතන්නේ ඉතා නොවැදගත් විකාර ලෙසටයි. තීබසයේ දෙවොල් නිසියාකාරව පැවැත්වෙන බවට අධීක්ෂණය කිරීමට ඔබ විසින් පත් කරන ලද ආමන්ගේ දිව්‍යමය බිරිඳ දැන් බොහොම මහලුයි. රෝගීව දුර්වලව සිටින්නේ. නොයෙකුත් පක්ෂ භේද ඇතිවී සමහර පූජකවරුන් ශුද්ධ වූ චාරිත්‍ර ඉටු කිරීමට වඩා මුල්තැන දෙන්නේ තමන්ගේම ධනය වැඩිකර ගැනීමටයි.''

''එයද සත්‍ය තත්ත්වය?''

කළු පාරාවෝගේ දෑස් තම ආත්මය තුළට කා වදින බවක් පූජකයාට දැනිණි. එය පැහැදිලි කර දීමට නම් දිවුරා සිටිය යුතු බව ඔහුට දැනිණි.

''පාරාවෝගේ නාමයෙන්.'' ඔහු සන්සුන්ව කීය. ''මා පවසන්නේ සත්‍යය බවට මා සපථ කරනවා උතුමාණනි. මා පැවසුවේ අසත්‍යයක් නම් මගේ ආත්මය විනාශ වේවා. සදාතනික දිවියට මං පෙත වැසීයේවා.''

තිබසය; ඒ ශුද්ධ වූ නගරය; ආමන්ගේ නගරය; සිය ගණනක් වූ දොරටු; අනභිභවනීය දෙවොල් හා කුඩා ගෙවල්; ඒ සියල්ල පරදවන කාර්නැක්හි අභිමානය. මැව්මේ රහස හෙළි වූ ස්ථානය.... කළු පාරාවෝගේ හදවත උතුරා යන ශෝකයෙන් ඇළලී ගියේය. ඔහු මෙහි පැමිණියේ නපාටාවේ දෙවොල්හි භාවනා කිරීමටයි. තමාට මග පෙන්වන සේ ආමන්ට ආයාචනා කිරීමටයි. දැන් ඔහුට දැනගන්නට ලැබී ඇත්තේ තම අගනුවර තැනීමේදී ආදර්ශයක් වූ ඒ මහා නගරය විනාශයට පත්වෙමින් තිබෙන බවයි.

✸

කුල්හෙඩ් තම සිසුන් විසිදෙනා දෙස රවා බැලීය.

''කවුද මේ ලිපිය ලිව්වේ?'' ඔහු කෝපයෙන් ඇසීය.

එක කකුලක් නවා, අනෙක කෙළින් කොට නවා නිවැරදිව ඉඳගෙන සිටි, පුහුණුව ලබන ලේකම්වරු හිස නවාගත්වනම සිටියහ. කෙටි සායක් ඇඳ, කනේ පින්සලක් රඳවාගෙන සිටි ඔවුන්, ගුරුවරයාට බියෙන් සිටින බව පැහැදිලිය.

හෙට දවසේ රාජ්‍යයේ ප්‍රධාන තනතුරුවලට හිමිකම් කියන්නට සිටින මේ ඉහළ පන්තියේ සිසුන්ට, කුරුම්ට්ටා සතියකට වරක් උසස් පාඩමක් ඉගැන්විය. මේ වාසනාවන්තයින් අතර තරුණියන් සිව් දෙනෙක්ද වූහ.

''මා නැවතත් අහනවා, කවුද?'' කුල්හෙඩ් පුවරුව ලෙලවමින් ඇසීය.

සිසුහු තම දණහිස් දෙස බලාගත්වනම සිටියහ.

''හොඳයි. බොහොම හොඳයි. තොප අතර මෙය දන්වන්ට කෙනෙක් නැහැ. එහෙත්, මේ අත් අකුරු හඳුනාගන්නට මට කිසිදු උදව්වක් අවශ්‍ය නැහැ.''

කුරුම්ට්ටා පන්තිය මැදින් ගමන්කොට එක් සිසුවකු අසල නැවතිණි. සිසුවා දැස් තදින් පියාගති. ඔහුගේ පින්සල උදුරාගත් කුරුම්ට්ටා එය කඩා දැමීය.

''නැගිටිනු තක්කඩියා,''

එම සිසුවා, අගනුවර නිවෙස් කීපයක් හා පාම් වතු දෙකක් හිමි ඇමතිවරයෙකුගේ පුතෙකි. එහෙත් කුල්හෙඩ්ට ඉන් කමක් නැත.

''මා තොප මේ පාසලට බඳවාගත්තේ ලේකම්වරයකු වන්නට

සුදුසුකම් තොප තුළ ඇතැයි පෙනුණ නිසයි. දැන් මට වැටහෙනවා මා වැරදියි කියා.''

''එහෙත් ගුරුතුමනි, මා ඉතා ප්‍රවේශමෙන්.....''

''නිහඬවනු, උඩඟු පුංචි මෝඩයා! ඔව්. නුඹේ චිත්‍ර ලේඛන ඉතා නිවැරදියි. කදිමයි. ව්‍යාකරණ වැරදි කිසිවක් නැහැ. හැම කරුණක්ම සැලකිල්ලෙන් තෝරාගෙන. ඒත් නුඹ භූමි බද්දක් සකස් කරනවා, අදාල ගොවිපොළට යන්නේ නැතිව. එහි අයිතිකරු හමුවී ඔහුට පවුලේ හෝ ගොවිපොළේ හෝ අමාරුකම් තිබෙනවාදැයි සෙවීමක් නැතිව. නුඹ මේ ලෙස ඉදිරියටත් වැඩ කළොත්, දරුවා, නුඹ නීච පාලකයකු වේවි. අමානුෂික යන්ත්‍රයක්, නීතිය පමණක් තකන නරුමයෙක් වේවි. නුඹගේ පාලනයට යටත් වන මිනිසුන්ගේ ජීවිත පිළිබඳව අබැටක තරම්වත් නොසිතන, ඔවුන් හා කිසිදු සම්බන්ධයක් නොමැතිව ක්‍රියා කරන නීචයෙක්. තවත් එක් වරක් මෙවැනි වරදක් කළොත් මා නුඹ මගේ පන්තියෙන් පන්නා දමනවා. නිලධාරීන් කාර්යාල තුළට වී මුළු කාලයම ගත කරමින්, තම වගකීම් පැහැර හරින දිනක මේ රට නවතීවි.''

එක්වරම එහි වාතාවරණය වෙනස් විය. පියැන්කි ඇතුල් වෙනු කිසිවෙක් නොදුටුවද, ඔහු එතැන සිටින බව ඔවුන්ට දැනුණි. හිස ඔසවා බලන කුල්හෙඩ්ගේ දෑසට, දෑත් බැඳගෙන හිටගෙන සිටින පාරාවෝ පෙනෙත්ම ඔහුගේ කෝපය සංසිඳුණි.

''අදට එපමණයි.'' ඔහු කීය. ''ඊළඟ වාරයේ සකස්කරගෙන එන්න, නගරාධිපති කෙනෙකුට ලියන ලිපියක්. පැපිරස් නාස්ති නොකරන්න. හුණුගල් කැබලි හා පරණ තීන්ත යොදාගන්න.''

ශිෂ්‍යයෝ නිහඬව පිටව ගියහ.

''ඔබ ඔබේ ශිෂ්‍යයින් ගැන තෘප්තිමත්ද කුල්හෙඩ්?''

''දැනට ඔබේ රජයේ සිටින තකතිරුවන් තරම් නරක පාලකයින් ඔවුන් අතරින් බිහි නොවේවි උතුමාණනි.''

කුල්හෙඩ් තම පින්සල් සෝදා, පුවරු සූරා දමා, ලිවීමට සුදුසු මතුපිටක් සකස්කර ගති. රජයේ වස්තුව ඔහු භාරයේ ඇති හෙයින් ඔහු ඒ සියල්ල හැකිතරම් හොඳින් රැකගත යුතුය.

''තීබසයෙන් කිසිදු ආරංචියක් ලැබුණාද?'' පියැන්කි ඇසීය.

''පරිපාලන ලේකම් වාර්තා කීපයක් සකස් කර තිබෙනවා.''

''කුමක්ද එයින් කියවෙන්නේ?''

"අලුත් දෙයක් නැහැ උතුමාණනි. තීබසය සාමකාමී නගරයක්. චාරිත්‍රානුකූලව සියල්ල කෙරෙනවා."

"සිදුවීම් කිසිවක් නැහැ?"

"ඒ වාර්තා අනුව නැහැ උතුමාණනි."

"ඒ ලේකම්වරයා විශ්වාසවන්තද?"

කුල්හෙඩ් තම නිකට අතගෑවේය. "එක කරුණක් මගේ හිත කරදර කරනවා උතුමාණෙනි. එම වාර්තාවෙහි එකම වචන, එකම වාක්‍ය නැවත නැවතත් ලියවී තිබෙනවා. ඇත්තෙන්ම මා තීරණය කර තිබුණේ ඔබට දන්වන්නයි. ඊළඟ වාර්තාවත් එහිම පිටපතක් වුවහොත්."

"කිසිවෙක් නැත් කරනවා අප රවටා වැරදි ආරක්ෂක තත්ත්වයක් මවන්නට."

"එසේ විය හැකියි උතුමාණනි."

# 17

නාට්‍රෙබ්ට, ඩෙල්ටාවේ ගොවිපොළක ඔහුගේ ගිණුම් තැබීමක් සිහිවිය. ඉලක්කම් හරඹය අපූරු ක්‍රීඩාවකි. ඊට සමත් අයෙකුට තමන් කැමති අයුරින් ඒවා හසුරුවන්නට පුළුවන. ගිණුම්වල මාර්ගයෙන් සෙස්සන් රවටා පොහොසත් වීමට පුළුවන. එවැනි අවස්ථාවක නාට්‍රෙබ්ට කිසිම අතපසුවීමක් සිදුවූයේ නොවේ.

නගරය වටා දැස් යැවූ පමණින්ම, හෙනෙන් නෙසට් ධනවත් තැනක් බව නාට්‍රෙබ්ට වැටහිණි. විශේෂයෙන්ම එහි ධනවත් ඉඩම් හිමියන් කිප දෙනෙක්ද වූහ. දැන් මේ නගරය ටෙෆ්නැක්ගේ යටත් රාජ්‍යයක් බවට පත්වන හෙයින්, පියැන්කි විසින් පනවන ලද නීති වෙනස් විය යුතුය. ඒ හේතුවෙන්ම එම භාරදූර කාර්යය නිල වශයෙන් භාරගෙන තිබූ නාට්‍රෙබ්, නගරයේ ප්‍රභූවරයෙකුට දිවා ආහාරයට ආරාධනා කර තිබිණි. ඔහු නගරයේ භාණ්ඩාගාරික තැන්පත්, හැත්තෑ වියැති ප්‍රභූවරයෙකි. වැන්දඹු පුරුෂයකු වූ හෙතෙම, අවංක කම ගැන ප්‍රසිද්ධියට පත්වූ අයෙකි.

''පිළිස්සූ බැටළු මස්.'' නාට්‍රෙබ් කීය. ''දිඹුල්, ක්‍රීම් සෝස් දැමූ බෝංචි, ඉමායු වෙතින් ගෙන ආ රතු වයින්, කෙසේද අපගේ ආහාර වට්ටෝරුව මිත්‍රයා?''

''මිත්‍රයා?'' ඒ සඳවන් මුහුණක් ඇති මිනිහා ගැන ඒ වනවිටත් පිළිකුලෙන් සිටි ඊජිප්තුවා පුදුමයෙන් ඇසීය.

''ටෙෆ්නැක් ඔහුගේ මූල්‍යමය කටයුතු භාර දී ඇත්තේ මටයි. ගිණුම් කටයුතු පිළිබඳ විශිෂ්ටයෙකු වන යෙශෙබ් සමග, මා ටෙෆ්නැක්ට ඇති සියලු බාධා බිඳ හෙළීමට කටයුතු කරනවා. එවිට ඔහුට හැකියි ඊජිප්තුව යටත් කර ගැනීමට පමණක්ම සිත යොමු කරන්නට.''

''මගේ නගරය ගැන ඔබේ සැලසුම් මොනවාද?''

''මට දැනගන්න අවශ්‍යයි පියැන්කිගේ බදු ක්‍රමය. පියැන්කි! ඔහුට ශාප වේවා!''

"එය පාරම්පරික ක්‍රියාවලියක්. උදාහරණ ලෙස ගොවියෝ තම අස්වැන්නෙන් බාගයක් නගරයට ගෙවනවා. ඉන් එක් කොටසක් වර්ෂය පුරා ප්‍රයෝජනයට ගන්නවා. ඉතිරිය අටුවල සංරක්ෂණය කෙරෙනවා, නයිල් ජල ගැල්ම අඩුවූ විට පමණක් යොදා ගන්නට. ඒ වෙනුවට රජය ඔවුන්ගේ ගොඩබිම් වලට ජලය සපයමින්, අවශ්‍ය දෑ සපයනවා. එපමණක් නොවෙයි, ගොවියෙක් තමා බලාපොරොත්තු වූ ප්‍රමාණයට වඩා අස්වැන්න ලැබුවහොත් ඔහුට භූමිය මිලට ගෙන තම ගොවිපොළ විශාල කරගත හැකියි."

නාට්‍රෙබ්ගේ මුහුණ කළු විය. "හෝ! කොතරම් පැරණි ක්‍රමයක්ද? රජයට බොහෝ ලාභ අහිමි වෙනවා."

භාණ්ඩාගාරික කෝප විය. "ගොවීන් ඉතා සතුටින් සියල්ල කරන්නේ. එපමණක් නොවෙයි....."

"යුධ ආර්ථිකයක් ඇතිවිටක අපි සෑම ආහාර නිෂ්පාදනයක්ම පාලනය කළ යුතුයි. තවත් ජයග්‍රහණ ලබන්නට නම් සොල්දාදුවන්ගේ සෞඛ්‍ය තත්ත්වය ඉහළ මට්ටමක තැබිය යුතුයි. හොඳින් ආහාර සැපයිය යුතුයි. මා සියලු ගොවිපොළ රජයට පවරා ගන්නවා." නාට්‍රෙබ් කීය.

"අසාධාරණයි. පිළිගත නොහැකියි."

"නුඹේ භාෂාව හොඳින් පාවිච්චි කරනු මිත්‍රයා. එය ටෙෆ්නැක්ගේ තීරණයක්."

"කුමක්ද ගොවීන්ට ඉතිරිවන්නේ?"

"අපි ඔවුන්ට අවශ්‍ය තරම් ආහාර සලාක ලබා දෙනවා. ඔවුන්ට ඒවා මධ්‍යම බැරැක්කයෙන් ලබා ගත හැකියි."

"ඔවුන්ගෙන් බොහොමයක් ඊට විරුද්ධ වේවි."

"එවිට ඔවුන් රාජ ද්‍රෝහීන්. ඔවුන්ට හිමි මරණයයි. ඔවුන්ගෙන් කීප දෙනෙක් ප්‍රසිද්ධියේ පණ පිටින් පුළුස්සා දමන විට ඉතිරි කැරලි ඉබේම හැකිළී යාවි. වෙළෙන්දන් ගැන කතා කරනවිට, ඔවුන් අපගේ යුධ හමුදාවට සේවය කළ යුතුයි. එවිට භටයින්ට සියල්ල නිවැරදිව ලැබේවි. ඊට බාධාවක් නැහැ නොවෙද ප්‍රිය මිත්‍රය?"

"බාධා කළත් ඉන් කුමන පලයක්ද?"

නාට්‍රෙබ් තම තර දෑත් පිරිමදිමින් පුළුල් ලෙස සිනාසුණි. ඒ දරාගත නොහැකි පීඩනය ප්‍රභුවරයාගේ මුව ගොළු කළේය.

"දැන් අපි හෙනෙත් නෙසට්හි තිබෙන වඩාත් වටිනා දේ ගැන

කතා කරමු. ඔබ වැනි ප්‍රභුවරුන්ට අති විශාල වස්තුවක් තිබෙනවා. ඒ සියල්ල වඩාත් හොඳින් භාවිතා කළ යුතුයි. ටෙෆ්නැක් ධනවත් විය යුතුයි. මාත් එසේයි.''

''තා සොරෙක්.''

''සන්සුන් වෙන්න මිත්‍රයා. කෝපවීමට කරුණක් නැහැ. මා සතුව තිබෙනවා ඔබට සහනදායි පිළිවෙලක්. ඔබ මේ නගරයේ සියලුම ප්‍රධානීන් හඳුනන නිසා මා ඔබට පවරනවා ඔවුන් හා සාකච්ඡා කිරීමේ කාර්යය. ඔබ මගේ අණ ඔවුන්ට පවසන්න. ඔවුන්ගේ වස්තුව නගර මධ්‍යයේ ගබඩා කරවන්න. ඒ වෙනුවෙන් ඔබට ලැබෙනවා..... අපි හිතමු..... සියයට දහයක්. ටෙෆ්නැක්ට සේවය කිරීම ඔබ මහා ධනවතකු කරාවී.''

නාට්‍රෙබ් ඒ අහර ගිලින්ට වූ අතර මහල්ලා ආහාර දීසිය ඉවතට තල්ලු කළේය.

''තා සිතුවේ මා කවරෙකු කියාද නීචයා? තගේ නීච වැඩ තනිව කරගනු. මා මගේ රට වැසියන් සොරකම් කරන්නේ නැහැ. මා කිසිදු අයුරකින් තට සහාය වන්නේ නැහැ. එපමණක් නොවෙයි. මා සියලුම දෙනාට පවසනවා තා කුමන හොරෙක්ද කියා.''

නාට්‍රෙබ් නැගිට්ටේය. ''වැරදි වැටහීමක් මිත්‍රයා. මා සැලකුවේ ඔබේ යහපත පමණයි. ඒ අතරම මා මට පැවරුණ වැඩ කොටස කරගෙන යනවා. ඔබ වැනි පළපුරුදු අයෙකුට වැටහෙනවා, මගේ කාර්යය කෙතරම් අපහසුද කියා.''

''තට නොහැකියි බොරුව නොගැවුන එක වදනක් හෝ පවසන්නට.'' භාණ්ඩාගාරික පිළිකුලෙන් කෑ ගැසීය.

''මේ ගැන තව මඳක් සිතන්න.''

''මා තගේ පරම සතුරෙක්. මට කොතරම් විශාල පාඩුවක් වුවත්, එය එසේමයි.''

නාට්‍රෙබ් මුලුතැන්ගේ දෙසට යන බව පෙන්වා මහල්ලා පිටුපසින් සිටගත්තේය. එක් වරම හැරී වෛරී දෑතින් ඔහුගේ ගෙල සිර කළේය.

''මන්දබුද්ධිකයා. තට තගේ ජීවිතයෙන් වන්දි ගෙවන්න සිදුවුණා. මට හැකියි තා නොමැතිව එය කදිමට කරගන්නට.''

✸

''සියලු විරෝධතා ඉවත් කළා උතුමාණනි.'' නාට්‍රෙබ් ටෙෆ්නැක් ඉදිරියේ හිස නමා කීය.

"ඔවුන් ඔබේ බදු ක්‍රමය පිළිගත්තාද?"

සොල්දාදුවන් කැඳවූ නාට්‍රෙබ් භාණ්ඩාගාරිකගේ මෘත දේහය ඉවත් කරවිය. ඔහුට අනුව ඒ මහල්ලා සතුරන් සමග එක්ව වංචා කිරීමෙන් ද්‍රෝහියෙකු ලෙස කටයුතු කිරීම ගැන චෝදනා ලැබ තිබිණි. කිසිදු දීර්ඝ සාකච්ඡාවකින් තොරව ටෙෆ්නැක්ගේ ප්‍රියතම ක්‍රෑරත්වය හා බලෙන් පැහැර ගැනීම විශිෂ්ට ප්‍රතිඵල පෙන්වා තිබිණි.

"යෙගෙබ් ඔබේ තොරතුරු?"

"නගරය පිරිසිදු කර අවසානයි උතුමනි. කිසිදු කරදරකාරී කටක් හෝ අනවශ්‍ය කරදරයක් ඉතිරිව නැහැ."

"හෙනෙත් නෙසට්, ඔබ සිතූ තරමට ධනවත්ද?"

"සත්‍ය වශයෙන්ම ඉතාම පොහොසත්. එහෙත් ආයුධ හිඟයි. මා සිතූ තරම් ආයුධ නැහැ."

ටෙෆ්නැක් කෑ ගැසීය. "නායක දුනුවායාගේ දියණිය මෙහි ගෙන එනු."

යෙගෙබ් අවිනිශ්චිත බැල්මක් හෙළීය. "උතුමාණනි ඇය ජීවතුන් අතරදැයි කියා දන්නේ නැහැ."

"ඇය ගෙන එනු."

✸

අවුල් වූ කෙස්, සීරීම්වලින් වැසී ගිය සිරුර හා ඉරීගිය ඇඳුම් ඩේබ්‍රෙක්ගේ අහංකාරකම බිඳකුදු අඩුකර නැත.

"මගේ භටයින් ඔබට හිරිහැර කරනවාද?" ටෙෆ්නැක් ඇසීය.

"මට අන් කිසිවක් බලාපොරොත්තු විය හැකිද?"

"මට අවශ්‍ය සියලු දේ මා ලබාගන්නවා. දැන් මට අවශ්‍යයි නුඹේ පියා ආයුධ සැඟවූ ස්ථානය"

"කුමටද මගෙන් විමසන්නේ?"

"මා මිනිසුන් විනිශ්චය කිරීමට හපනෙක්. නුඹ එඩිතරයි. ධෛර්යමත් ගැහැනියක්. මට විශ්වාසයි ඔහුගේ සියලු රහස් නුඹට පවසා ඇති බවට."

"නුඹ වැරදියි."

"මට ඒ ආයුධ අවශ්‍යයි ඩේබ්‍රෙක්. නුඹ මට එම ස්ථානය පෙන්වන තෙක් හැම පැයකටම වරක් දරුවෙකුගේ හිස ගසා දැමේවි."

# 18

ඇය තරුණය. රූමත්ය. හැඟුම්බරය. වයස දහඅටේදී ඇය පළපුරුදු ගැහැනියක සේ ආලය කළාය. අහිංසක බැල්ම තවමත් ඇගේ දෑසේ වැතිර සිටී.

ලැමසෙක්නි, නිදා සිටින ඇය දෙස බැලීය. ඔහුට වඩා විසි වසරකින් ළාබාල ඇයට අන්තිමේදී ඔහු පොළඹවා ගන්නට හැකිවිය. යටි රැවුල, මුඩු හිස, කැළැල් පිරුණු සිරුරක් ඇති ලැමසෙක්නි ගැහැනුන් සොයා ගියේ නැත. ඔවුහු ඔහු සොයා ආවෝය. ඔහුටද ඔවුන් ප්‍රතික්ෂේප කළ නොහැකි විය.

ඔහු ඇගේ පිට අතගෑවේය. "දෙවියන්ගේ නාමෙට ඇය නම් පුදුමාකාර ගැහැනියක්."

ඔහුගේ අත ඒ සිරුරේ දෙපා අතරින් ලිස්සා ගියේය. ඇය අවදි වුණාය.

"පවසන්න පෙම්වත" ඇය මිමිණුවාය.

"අපට නොහැකියි අතරමග නවතින්නට. මට විශ්වාසයි ඔබ මට සියල්ල නොපෙන්වූ බවට."

ඇය වැලක් සේ ඔහු වටා එතුණාය. හාදු වැස්සකින් ඔහු තෙමා හැරියාය. ඉක්බිති ඔහුගේ දකුණත, ලී බාහුව, මත දෙතොල් තැබුවාය.

"කුමක්ද ඔබේ අතට සිදුවුණේ?"

"පොරෝ පහරක්. මට හැකිවුණේ නැහැ බේරී පැනගන්නට. මා දෙගිඩියාවෙන් සිටියා සතුරාගේ ගෙල සිඳිනවාද නැතිද කියා. මා දෙපසට වැනුණා. ඔහු මගේ අත කැපුවා. ඒ මා දෙගිඩියාවක් පෙන්වූ අවසන් වතාව."

"එය ඇකේෂියා ලීයක් නොවෙද?"

"බොහොම පැරණි හොඳම ඇකේෂියා ලීයක්. එය කිසිදා දිරාපත් වෙන්නේ නැහැ. ඊට විශාල මිලක් ගෙවන්න සිදුවුණත්, එය කදිම

නිමැවුමක්. ඔබට තේරෙනවාද? මේ හන්දි ඉතා හොඳින් ක්‍රියාත්මකයි. ඔබ දන්නවාද? මට හැකියි ඒ අතෙහි හන්දිපත් රුදාවෙන් නම් ගැලවෙන්නට.''

එක්වරම හිඳගත් තරුණිය තම දෑතින් පියයුරු වසා ගත්තාය. ''අපොයි යෝධයෙක්. ඔහු අප දෙස බලා සිටිනවා.''

ලැමසෙක්ති කෙටි කඩුව අතින් ගෙන නැගිට්ටේය.

''ඕ, ඒ ඔහුයි.'' ඔහු අත පහත හෙළීය. ''පොඩිත්ති ඇඳුම් ඇඳගෙන පිටවෙන්න.''

''එහෙත් ඒ යෝධයා.....''

''ඊජිප්තු පාරාවෝගෙන් ඔබට කිසිදු හානියක් සිදුවන්නේ නැහැ. දැන් පිටව යන්න.''

බියෙන් ඉවතට දිවගිය තරුණියට, ඇඳුම් ඇඳ ගන්නට තබා අතින් ගෙන යන්නටවත් නිනව්වක් නොවීය.

''අලුත් ජයග්‍රහණයක්.'' පාරාවෝ කීය. ''ඇය බොහොම රූමත්.''

''අලුත් පරාජයක් ලෙසයි මට දැනෙන්නේ.'' බීර කෝප්පයක් අතින් ගත් ලැමසෙක්ති වැලපෙන්නට විය. ''උතුමාණනි මා කොතරම් උත්සාහ කළාද මෙවැනි යක්ෂණියන්ගෙන් ගැලවෙන්න? එහෙත් එය කළ නොහැකියි. මා සිතනවා ඇය අවිවාහකයි කියා. උතුමාණනි, ඔබට පිපාසද?''

''මට අවශ්‍යයි උපදෙසක්.''

''මගෙන්? උතුමාණනි, බොහොම නරක විහිළුවක්. ඔබ නිතරම තීරණ ගන්නේ තනිවමයි. මා දන්නේ නැහැ කෙසේ උපදෙස් දෙන්නද කියා, රට පාලනය කරන්නට.''

''ඔබ යුද්ධයට විශිෂ්ටයෙක් නොවෙද?''

පාබල හමුදා නායකයාගේ මලානික, නිල් ඇස්, කළු පැහැ ගැන්විණි. ''යුද්ධය? ඔබ පවසන්නේ නියම යුද්ධයක් ගැනද? නියම සොල්දාදුවන්, නියම සටන්, මියගියවුන් හා තුවාලකරුවන්?''

''මා තවමත් දන්නේ නැහැ.''

''හෝ, මා එසේ සිතුවා. ඉතින් එහි බරපතලකමක් නැහැ නොව? රාජ්‍යය පෙර මෙන්ම බොහොම නිස්කලංකයි. සමහර විට ජන කොට්ඨාස දෙකක් අතර දබරයක් තිබිය හැකියි. මා නින්දට යනවා.''

පියැන්කි ජනෙල් පියන් තල්ලු කොට, කාමරයට ආලෝකය ලබාගති.

''උතුමාණෙනි'' ලැමසෙක්නි විරෝධය පෑවේය. ''ඔබ දන්නවා මා කැමති අඳුරට කියා.''

''මා දන්නවා, ඔබ මේ අඳුරු කුටියට වැදී නපාටාවේ ලස්සනම තරුණියන්ට ආලය කළත් මෙහි සිදුවන සියල්ල දන්නා බව. ඔබයි මට විශ්වාසය තැබිය හැකි එකම විශිෂ්ටයා.''

''සත්‍යයක්. ඔබ මා ජෙනරාල් තනතුරට උසස් කරන්න තිබුණේ බොහෝ කලකට පෙරයි.''

''ගැහැනුන්ට හා බීමට ඇති ඔබේ ගිජුබව කිසිවකුගේ ඇගයීමට ලක්වෙන්නේ නැහැ. විශිෂ්ට නිලධරයෙක් ස්වයං විනය ඇතිකර ගත යුතුයි. නිවැරදි මග තමාම සොයාගත යුතුයි.''

''වීරයෙකුගේ එකම හපන්කම ජයග්‍රහණයයි, උතුමනි.''

ඒ කාමරය, ලැමසෙක්නිට නිවසේ වැඩ ගැන කිසිදු තැකීමක් නැතිබව පෙන්වීය. ඔහුගේ ඇඳුම් හැමතැනම විසිරී තිබිණි. ඒ පිළිවෙලට තබන්නට ඔහුට කිසිදු අවශ්‍යතාවයක් නැත.

''ඔබ සිතනවාද උතුරේ පළාත් ඒකාබද්ධ වෙතැයි කියා?'' පියැන්කි ඇසීය.

''එය වැළැක්විය නොහැකියි උතුමාණනි.''

''කෙසේද ඔබ එතරම් විශ්වාසයෙන් පවසන්නේ?''

''දෙබර කුඩුවක වුවත්, එකෙක් අනෙකුන් තම කැමැත්තට එකඟ කර ගන්නවා.''

''ඔබේ අදහසේ හැටියට කවුද ඒ දෙබරා?''

''අන් කිසිවෙකු නොවෙයි. ටෙෆ්නැක්. සායිස්හි කුමරු. ඔහුට විශාලතම රාජ්‍යයක් හා හොඳම යුද හමුදාවක් තිබෙනවා. යම් දිනක ඔහු ඩෙල්ටාව පමණක් නොව මෙම්පිස්ද යටත් කර ගනීවි.''

''ඊළඟට?''

''ඊළඟට ටෙෆ්නැක් සිතනවා යුද උපක්‍රම සියල්ල දත් වීරයා ඔහුයි කියා. තව ඉදිරියට ගොස් නියම යුද්ධයක් කළ හැකි වීරයකු කියා. ඔහු තම බලය තවත් ශක්තිමත් කොට සෙසු සියලු නායකයන් ඉවත්කොට අභීතව මධ්‍යම ඊජිප්තුවට පැන ගනීවි.''

"ඔබට සියල්ල නිවැරදිව දැකිය හැකියි. පෙර දැක්මක් තිබෙනවා ඔබට."

"ඔබ පවසන්නේ මේ සියල්ල දැනටමත් සිදුවී ඇති බවද?"

"අවාසනාවට මෙන් ඔව්. ඔබේ අදහසට අනුව ටෙෆ්නැක් කොතරම් දුර යයිද?"

ලැමසෙක්නි සැක සහිතව තම ලී අත කසන්නට විය. "ඔහුට අවශ්‍ය නම් තවත් ඈතට යන්නට, ඔහුට ජය ගන්නට බාධාවන් තිබෙනවා. හෙනෙන් නෙසට්, ඔහුගේ පළමු ඉලක්කය වේවි."

"කිමද එතැන?"

"හේතුව........ පෙෆ්ටෝ කුමරුගේ වයස හැටක්. ඔහු එදා සිටි ශූර සටන්කරුවා නොමෙයි. ඔහුට නොහැකි වේවි විනාශකාරී සටනකට මුහුණ දෙන්නට."

"එහෙත් හෙනෙන් නෙසට්හි ආරක්ෂක වළල්ල ශක්තිමත්."

"ඒවා එසේ පෙනෙනවා පමණයි. එහි ආරක්ෂකයින්ගේ විමසිලිමත්කම අඩු වී තිබෙනවා. ඔවුන් හිතනවා පාරාවෝ පියැන්කිගේ නාමයම ප්‍රමාණවත් කියා සතුරා බියගන්වන්නට. උතුමාණනි, ගෞරවයෙන් පවසන්න අවසර, ඔබ සටනින් බොහෝ ඈතයි. එවැනි සිතිවිලි වලට උමතු යුද්ධයක් නැවැත්විය නොහැකියි."

"ඔබ සිතනවාද ටෙෆ්නැක්ට හැකිබව, හෙනෙන් නෙසට් යටත් කර ගැනීමට?"

"ඔහු එය ජයගතහොත් සැබෑවේවි ඔහුගේ ආක්‍රමණික සිහිනය. ටෙෆ්නැක් ජයග්‍රාහක ආක්‍රමණිකයා! එපමණයි ඔහුට අවශ්‍ය. ඔහු සියල්ල කරන්නේ එතැනට එන්නයි. ඒ සඳහා ඔහු ඕනෑම දෙයක් කරාවි. තම අරමුණ කරා එන්නට ඔහු ඕනෑම වනචාරී පියවරක් ගනීවි."

"හෙනෙන් නෙසට්, ටෙෆ්නැක්ට යටත් වී හමාරයි ලැමසෙක්නි." පාරාවෝ කීය.

ලැමසෙක්නි බීර කෝප්පය මිටි මේසය මත තැබීය.

"උතුමාණනි ඒ විහිළුවක්ද?"

"නැහැ ටෙෆ්නැක් ජය ගත්තා. ඔබ සිතන අයුරින්ම."

"ඔහු තවත් ඉදිරියට ගොස්ද?"

"ඔහු වඩාත් ශක්තිමත්ව සිටින හැඩයි. එහෙත් මට ලැබෙන තොරතුරු අවිනිශ්චිතයි."

''ඔව්. ශක්තිමත් වීම තුළින් ඔහුගේ බලාපොරොත්තු තවත් වැඩිවෙනවා. ඔහුගේ ඊළඟ පියවර වේවි කමුන්.''

''නෙම්රොඩ් කුමරු ඔහු පරාජය කරාවි.''

''නෙම්රොඩ් සතුව සියලු සම්පත් තිබෙන බව සත්‍යයක්. එහෙත් යුද්ධය ඉතා කෲර වේවි. ටෙෆ්නැක් කමුන් ජයගතහොත් තීබසයට මග ඔහු ඉදිරියේ.''

''කුමක්ද ඔබේ අදහස?''

''අද තීබසයේ ස්ථානගත කර සිටින හමුදාවන් සීරුවෙන් තැබිය යුතුයි. උදාවන තත්ත්වයට අනුව සහාය හමුදාවන් යැවිය යුතුයි.''

''ඔබ තීබසයට යා යුතුයි. මගේ නායක දූනුවායා, පෝර්මා සමග. එහි හටයින්ට  නායකත්වය දිය යුතුයි. ඔබ ටෙෆ්නැක්ගේ ගමන නැවැත්විය යුතුයි.''

''උතුමාණනි, සමාවෙන්න. මා ඒ පෝර්මාට කැමති නැහැ. අනෙක් අතට මා යුධ නායකයකු පමණයි. තීබසයේ සිටින ජ්‍යෙෂ්ට නිලධාරීන් මගේ අණ නොතකාවි.''

''ඔබට මා බලපත්‍රයක් දෙනවා, ඔබේ කාර්යය සඳහන් කළ. කුමක්ද ගැටලුව ලැමසෙක්නි? ඔබ සටනට බියෙන්ද?''

එවර ලැමසෙක්නිගේ ලී අත බිහිසුණු ලෙස ඉහළ ගොස් මිටි ලී මේසය දෙපළු විය. ''උත්මාණනි මා පිටත් වෙනවා, හෙට අළුයම.''

# 19

නාට්‍රෙබ්, මවගේ ඇකයෙහි සිටි කුඩා දරුවා උදුරා ගත්තේය. භීතියෙන් ගැහෙමින් විලාප දෙන දරුවාට පහර දුන් ඒ නීචයා, දරුවාගේ මවට පා පහරක් එල්ල කළේය. එය වළක්වන්නට තැත්කළ මිනිසුන් දෙදෙනෙක් යෙගෙබ් විසින් පත් කරන ලද ආරක්ෂකයින්ගේ දැඩි ප්‍රහාරයට ලක්වූහ.

නාට්‍රෙබ් දරුවාගේ හිස වධක කොටය මත තබා අසිපත ඇදගති.

"තී මට ආයුධ සඟවා ඇති තැන නොකීවොත්," ටෙෆ්නැක් ඩේබ්‍රෙක්ට කිය. "මා මේ දරුවාගේ හිස ගසා දමනවා. ඉතිරි දරුවන්ටත් සිදුවන්නේ එයමයි."

"තා යක්ෂයෙක්!"

"නුඹ වැරදියි. මගේ පැතුම ඊජිප්තුවේ සතුටයි. එය ලබාගන්නට මා පියැන්කි පරාජය කළ යුතුයි. ඒ සඳහා මට ආයුධ අවශ්‍යයි. පවසනු ඩේබ්‍රෙක්. නැතහොත් මේ දරුවා මියයාවි. ඊට වරදකරු වන්නේ තී."

තරුණිය සැකයෙන් ඔහු දෙස බැලුවාය. "නුඹ පවසන්නේ අසත්‍යයක් නම්?"

"එහි තේරුම?"

"මා කුමක් පැවසුවත් තා මේ දරුවා මරා, මාවත් මරා දමාවි."

ටෙෆ්නැක් සිනාසුණි. "තිට මා තේරුම් ගත නොහැකියි ඩේබ්‍රෙක්. ඇරත් තිට කළ හැකි අන් කිසිවක් නැහැ. හෙට තිට සිදුවන්නේ යටත් වෙන්නයි සුදුවට."

"කුමක්ද තා පවසන අනාගතය?"

"මෙය බෙදී ගිය රටක්. රජෙක් නැහැ. නුබියාවේ සැඟවී ඊජිප්තු පාලනය ඉල්ලන කළු පාරාවෝ හේතුවෙන් රට දිළිඳු බවට පත්වී හමාරයි. කෙසේද තී හා තිගේ ජනතාව ඒ කුරිරු මිනිසා යටතේ ජීවත් වන්නේ? දැනටමත් මා ඩෙල්ටාව හා මෙම්පීස් යටත්කරගෙන හමාරයි. හෙට මා

දකුණ යටත් කර ගන්නවා. ඒ සමගම ගොඩබිම් දෙක නැවත එක්වෙනවා. ජනතාව, මා පාරාවෝ ලෙස පිළිගන්නවා.''

තරුණියගේ දෑසේ කෝපය යටපත්වී සැකය මතුවිය.

''නුඹේ උත්සාහය එයද?''

''දැන් නුඹ දන්නවා, මගේ එකම අරමුණ.''

''මා සමග එන්න තනිවම.''

යෙගෙබ් ඊට එරෙහි විය. ''උතුමාණෙනි මේ කෙල්ලට නොරැවටෙනු මැනවි. ඇය ඔබව උගුලක පටලාවි.''

''මට හැකියි මගේ ආරක්ෂාව සලසාගන්නට.''

ඩේබ්‍රෙක්, ඔහු තම පියාගේ නිවසට කැඳවාගෙන ගියාය. මුලුතැන්ගේ පසුකර ගිය ඇය ගල් පඩිපෙළක් බැස බිම්ගෙයට ඇතුල් වුණාය. එතැන බිම දණගසා යම්කිසි ලාංඡනයක් සහිත ගල් පතුරක් සොයා ගත්තාය.

''මෙන්න මෙතැන යට.''

ටෙෆ්නැක් තම කිරිච්චි තුඩ යොදා ගල් පතුර එසවිය. එතැන වූයේ තවත් පඩි පෙළකි. එහි කෙළවර අඳුරේ සැඟව ගියේය. පන්දමක් දල්වා ගත් ජෙනරාල් ඉන් බැස, දුනු ඊතල හා හෙල්ල පිරවූ කාමරයකට ඇතුල් විය. ඒ සියල්ල ඉතා අළුත්, හොඳම තත්ත්වයේ ලෝහයෙන් නිමවූයේ විය. මේ ආයුධ සමග ඔහුට සැලකිය යුතු තරම් ශක්තිමත් ප්‍රහාරයකට යා හැකි බව ටෙෆ්නැක්ට විශ්වාසය.

එහෙත් ඒ මොහොතේ ඔහුගේ ඇලපතට පිහියක් කිඳා බැස්සේය.

''තා මගේ පියා මරා දැමුවා.'' ඩේබ්‍රෙක් ක්‍රෝධයෙන් පිරි හඬින් ඔහුට සිහිකර දුන්නාය. ''දැන් මා තා මරා දමනවා.''

''නුඹේ පියා මියගියේ සොල්දාදුවකු ලෙස. මේ නගරය රැකගත හැකියැයි සිතූ ඔහු මා සතුරකු ලෙස සැලකුවා. ඔහු වැරදියි. ඒත් මා ඔහුගේ එඩිතරකමට ආචාර දක්වනවා. මා ඔහුගේ නමින් ශිලා ලේඛනයක් පිහිටුවනවා. ඔහු මියයාම කණගාටුවට කරුණක්. ඔහු වඩා හොඳින් කල්පනා කළා නම් ඔහුට තිබුණා මේ සමගම මා හා එක්වන්න. මට හැකියාව තිබුණා මා ගොඩනගන ඊජිප්තුවේ උසස්ම තනතුරක් ඔහුට දෙන්න. මා ඔබේ පියා මැරුවේ නැහැ ඩේබ්‍රෙක්. එය කළේ මේ යුද්ධයයි. මේ අනවශ්‍ය යුද්ධයයි. අප අවසානය දක්වා ගෙන යා යුතු යුද්ධයයි.''

පිහිතලය මඳක් ඇතුළට ගියේය. ලේ බිඳක් පිටතට විසිවිය.

ටෙෆ්නැක් එය නොසලකා කතා කළේය. "ඔබ මා මරා දැමුවත් ඔබට මුළු ජීවිත කාලයම පසුතැවෙන්න වේවි. මන්ද ඔබ ඔබේ ජනතාවට දුක ගෙනෙන නිසා. නුඹේ හදවත දන්නවා මේ රට විනාශයෙන් බේරාගෙන, නුඹේ පියාගේ මරණයට සාධාරණය ඉටුකළ හැක්කේ මට පමණක් බව."

"කෙසේද නා?" ඇය කෙළ ගැසුවාය.

"එයයි සත්‍යය. එය පිළිගන්නට දිරිමත් වන්න."

තවත් ටික වේලාවක් එහිම රැඳී තිබුණ පිහිතලය ටිකෙන් ටික පිටතට ආයේය.

ටෙෆ්නැක් තරුණියගේ දෑස් දෙස බැලීය. "ඔබ මට උදව් කරනවද?"

"මා තට උදව් කරනවා. එහෙත්....."

"ඔබ දන්නවා මේ ප්‍රදේශය හා එහි ප්‍රභූන්. ඔබේ සහයෙන් අපට හැකියි ලේ ගලන යුද්ධයකින් මිදෙන්නට. සිරගෙයක මැරී යනවාට වඩා ජීවිත ගණනාවක් බේරාගෙන හොඳින් ජීවත් වෙන්නට ඔබ අකැමැතිද?"

"උදව් කරන්න ඔබට?" ඇය නැවතත් ඇසුවාය.

"ඔබේ තීරණය කුමක් වුවත් මා කමුන්ට පහර දෙනවා. ඔබට හැකිනම් නෙම්රොඩ් කුමරුගේ හිත වෙනස් කරන්නට, ඔහු පියැන්කිගෙන් වෙන්කොට මගේ සගයකු කරන්නට, නගර වැසියන් කරදරයක නොවැටේවි."

ඩෙබ්‍රෙක් තොල් විකුවාය. ටෙෆ්නැක්ගේ තර්කය ඇගේ හිසට වැදුණි. ඇය ඔහු පිළිකුල් කළද ඔහු ඇගේ හදවතේ වූ බලාපොරොත්තුවට යළි පණ දුනි. ඇයට මේ තත්ත්වයෙන් ඉදිරි ගමනක් නැත. ඉදිරියේදී සිදුවීමට නියමිත සියලු පහරදීම්, මරණ, තුවාලකරුවන් වැළැක්වීමට ඇයට හැකිය. යළි සමූල ඝාතනයක් වීම වැළැක්විය හැකිය. සියලු වද වේදනා වැළැක්විය හැකිය.

ඇය කොතෙක් කරදර කළද ඔහු ඇය හා එකඟ නොවනු ඇත. සායිස්හි කුමරා තම වචනයට හිස නමන යුධ හමුදාවක් වටකරගත් මිනිසෙකි. ඔවුහු ඊජිප්තුව යළි එක් කරන්නට ඔහු හා එක්ව සිටියහ. ඩෙබ්‍රෙක් එසේ නොවෙයි. ඇය නොහික්මුණු, අවිනීත, ඕනෑම අභියෝගයකට මුහුණ දිය හැකි ගැහැනියකි. මේ වනතෙක් ටෙෆ්නැක් බිරිඳක ලබා නැත. එහෙත් පාරාවෝ ලෙස කිරුළ දැරූ පසු ඔහුට ඒ

සිහසුන එළිය කිරීමට රජිනක් අවශ්‍යය. ඒ තනතුරට ගැලපෙන්නී ඩේබ්‍රේක් පමණි.

✸

ලිබියානු නායකයෝ ඒ වනවිටත් සතුට සමරමින් සිටියහ. කළු පාරාවෝට පක්ෂපාතිව සිටි හෙනෙන් නෙසට් කුමරුගේ මාළිගයේ, මෙවන් ප්‍රීතිමත් රාත්‍රීන් ගත කිරීමට ඔවුන් සිහිනෙන් හෝ සිතා සිටියේ නොවේ. තම දෛවය පිළිගැනීමට එකඟ වූ පෙෆ්ටෝ කුමරු ඒ සතුට සමරන්නට එක්විය. ඔහු තම නිලධාරීන්ට හා සොල්දාදුවන්ට, ටෙෆ්නැක්ට යටත් වන ලෙස අණකර තිබිණි. නගරයේ ප්‍රධානියා, පාලකයා, වෙනස් වූ පසු ඊට එරෙහි වීමෙන් කුමන ඵලයක්ද?

යෙගෙබ් හැම කෙනෙකු ගැනම දැඩි පරීක්ෂාවෙන් සිටියේය. ඔවුන්ගෙන් කිසිවෙක් ටෙෆ්නැක්ට එරෙහි වන්නට සූදානම් වුවහොත් ඔහුට එය දැනේ. ඒ අතර නාට්‍රෙබ්, තනිවම ආහාර ගිල දමමින් ක්ෂේම භූමියෙන් ගෙන්වන ලද වයින්, වතුර බිඳකුදු එකතු නොකරම කෝප්ප ගණන් බොමින් ගත කළේය.

''යෙගෙබ්, කුමක්ද ඔබේ අදහස පෙෆ්ටෝ ගැන?'' නාට්‍රෙබ් ඇසීය.

''ඔහුගේ මේ වයසේදී ඔහුට අවශ්‍යව ඇත්තේ කරදරවලින් මිදී සැප පහසු දිවියක් ගත කරන්නයි. දැන් ටෙෆ්නැක් බලවත් නිසා ඔහු අන්ධයකු සේ ටෙෆ්නැක් පාමුල වැතිරෙනවා.''

''ඒත් ජෙනරල්, අර කෙල්ල, ඩේබ්‍රේක්ට මුලාවීම වරදක්. ගැහැනු ශක්තිය උරා බොනවා වීරයින්ගේ. ඒ ගැහැනිය කිසිදා නවත්වන්නේ නැහැ ඔහුට වෛර කිරීම.''

''මා එසේ සිතන්නේ නැහැ.'' යෙගෙබ් කීය. ''ටෙෆ්නැක් ඇයව වශී කරගෙන. ඇරත් ඇයට ඇති එකම අනාගතය ඔහු පමණයි.''

''කෙසේ වෙතත් අප ඇය ගැන දැඩි විමසිල්ලෙන් සිටිය යුතුයි.''

''මා කරදර වන්නේ වෙනත් කෙනෙක් ගැන.''

''ඒ කවුද?''

''අකනොෂ් කුමරු. ඔහුගේ මුහුණ ශෝකයෙන්, බලාපොරොත්තු කඩවීමෙන් මැළවී තිබෙනවා. ඔහු කිසිම කැමැත්තක් දැක්වූයේ නැහැ මේ යටත් කර ගැනීමට. යුද්ධයට.''

''අකනොෂ් කිසිදා ටෙෆ්නැක්ගේ බලයට අභියෝග නොකරාවි.'' නාට්‍රෙබ් කීය.

''මගේ සිතිවිලි වෙනස්. අප ඔහු ගැනත් දැඩි විමසිල්ලෙන් සිටිය යුතුයි.''

ටෙෆ්නැක් පපු සැරහුමෙන් සැරසීගෙනම උත්සවයට එක්විය.

ඉක්මනින් එහි දැඩි නිහඬතාවක් ඇතිවිය. වැඩියෙන්ම මත්වී සිටියවුන්ට පවා ඔහුගේ නිවේදනය ඇසුණි.

''අපගේ ආයුධ ප්‍රමාණය අවශ්‍ය තරමට වැඩිකරගෙන තිබෙනවා. අප හමුදාවට අවශ්‍ය තරම් විවේකය ලැබුණා. නැවත යුද්ධය ඇරඹීමට කාලය පැමිණ තිබෙනවා. තව තවත් දකුණු දෙසට යන්නට පෙර අප මධ්‍යම ඊජිප්තුව අප අතට ගත යුතුයි. කමුන් අල්ලාගත යුතුයි. එහි ධනය හා ආයුධ අත්පත් කරගත යුතුයි. අපි උත්සාහ කරමු, නෙම්රොඩ් කුමරු යටත් කර ගන්නට සටනකින් තොරව. ඔහු එය ප්‍රතික්ෂේප කළහොත් අප කමුන් වටලනවා.''

# 20

ලැමසෙක්නි කෝපයෙන් වෙව්ලා ගියේය. තීබසය බලා යන ගමන සංවිධානය කිරීම පහසු නොවන බව පෙනුණි. ගබඩා පාලකයින්ගෙන් කිසිදු සහයක් නැත. හැම ලේකම්වරයෙක්ම තමාට වඩා ඉහළ ලේකම්වරයාට ලැමසෙක්නි යොමු කළේය. කවුරුත් පැවසුවේ තමාට ඒ කටයුතු කිරීමට බලයක් නොමැති බවයි. අවසන ඔහු කුල්හෙඩ්ගේ කාර්යාලයට බලෙන් ඇතුල් වී මේ තත්ත්වය පහදා දීමට තීරණය කළේය. ටෙෆ්නැක්ට එරෙහිව හමුදාවක් යැවීමට රජුට අවශ්‍යද නැතිද?

ලේකම් කාර්යාලය තුළ සිටින පෝර්මා දුටු ලැමසෙක්නිගේ කෝපය තවත් වැඩිවිය. දුනුවායා තම මාංශපේශි නටවා වැඩි බලය තමා අත යැයි පෙන්වන්නට මෙන් ලැමසෙක්නි දෙස බැලීය.

''නුඹ නැවත හමුවීම ගැන කණගාටුයි පෝර්මා'' ලැමසෙක්නි කීය.

''කිමද නුඹ නුඹේ ගුහාවෙන් පිටතට පැමිණියේ? පියවි සිහියෙන් ඉන්නට සිතුණාද?''

''මා බේබද්දෙකු වීමට කැමතියි මෝඩ කයිවාරුකාරයකු නොවී.''

''නවත්වනු!'' කුල්හෙඩ් කෑ ගැසීය. ''තොප දෙදෙනාම ඉක්මනින්ම සතුරා හා සටනට යනවා. තොප එය කරන්නේ එකට එක්ව.''

''මා ඊට සූදානම්, ඔනෑවටත් වඩා.'' ලැමසෙක්නි දැඩිව පැවසීය. ''කිමද මේ මෝඩයා මගේ ගමන නවත්වන්නට තැත් කරන්නේ?''

පෝර්මා එය ප්‍රතික්ෂේප කරමින් ඔහු දෙස බැලීය. ''කුමක්ද පවසන්නේ? මට අණ ලැබී තිබෙනවා. මා තීබසය බලා යාමට සූදානම්.''

ලැමසෙක්නි විරිත්තා බැලුවේය. ''අප වැඩ කරන්නේ එකට. මා එය දන්නවා.''

''කැමති නැහැ! ප්‍රතික්ෂේප කරනවා.''

''නිලධාරියෙකුට උතුමාණන් වහන්සේගේ විධානයන් ප්‍රතික්ෂේප

කළ නොහැකියි.'' පෝර්මාගේ හැසිරීමෙන් කෝප වූ කුල්හෙඩ් වහා පැවසීය. ''තවත් එක් වරක් එවැනි කතාවක් පැවසුවහොත් ඔබට සිදුවන්නේ යුද කවුන්සිලය ඉදිරියේ පෙනී සිටින්නයි.''

පෝර්මාගේ නොසන්සුන් බැල්ම ලැමසෙක්නිගේ දැඩි සතුටට හේතුවිය. ඔහු තවත් දුබල කිරීමට සිතූ ලැමසෙක්නි මෙසේ ඇසීය.

''කවුද අප දෙදෙනාගෙන් ජ්‍යෙෂ්ඨයා?''

''ඔබ දෙදෙනාම එකම තත්ත්වයේ. '' කුල්හෙඩ් කීය. ''ඔබ පාබල හමුදාවේ. පෝර්මා දුනුවායන් මෙහෙයවනු ඇති. ගමන අතරතුර ඔබ දෙදෙනාට එක්ව වැඩ කිරීමට සිදුවේවි. තීබසයේදී, ඔබ ඔබේ ලිඛිත රාජකාරි පැවරීම් භාරදිය යුතුයි අපගේ හමුදා බණ්ඩවල අණදෙන නිලධාරීන්ට.''

''කිමද අප ඉක්මනින් පිටත් නොවන්නේ?''

''මේ දැන් අපට ලැබුණ තොරතුරක් නිසා'' කුල්හෙඩ් කීය.

''පෙනෙන අන්දමට ටෙෆ්නැක් අප සිතූ තරම් ශක්තිමත් නැහැ. ඔහු හෙනෙන් නෙසට් අතහැර උතුරු දෙසට ආපසු යන බව පැලයි.''

ලැමසෙක්නිගේ බලාපොරොත්තු සුන්විය. ''ඒ බැව් නොපවසන්න. මේ යුද්ධය පටන් ගන්නට පෙරම අවසානයි. මේ මිනිහා ටෙෆ්නැක්, නිකමෙක්.''

''කෙසේ වෙතත්'' කුල්හෙඩ් කීය. ''අප සීරුවෙන්. කුමක් නිසාද සතුරා හෙනෙන් නෙසට් අතහැර ගියේ? පෙෆ්ටෝ කුමරුට නොහැකි නම් ඔහුගේ නගරය නැවතත් පියැන්කිට යටත් බව තහවුරු කරන්නට, අප ඊට මැදිහත් වෙනවා. පාරාවෝ ඉඩ දෙන්නේ නැහැ මධ්‍යම ඊජිප්තුවේ අවනීතිය රජ කරවන්නට.''

''එහි තේරුම, අපි ඉවසා සිටිය යුතුයි.'' ලැමසෙක්නි චෝදනා මුඛයෙන් කීය.

''මගේ දුනුවායන් නැවතත් පුහුණුවීම් අරඹනවා.'' පෝර්මා සතුටින් කීය.

''එය නම් කළ යුතුමයි.'' ඔහු හා තරඟයට මෙන් ලැමසෙක්නි කීවේය. ''බලන්න මගේ පාබල හමුදා. ඔවුන් දැනටමත් සටනට සූදානම්.''

✸

කළු පාරාවෝගේ දියණිය ෂෙපෙනා* දුටුවන් වශීකරන රුවැති විසිපස් වියැති තරුණියකි. තම මවගේ ශරීර වර්ණය සොරාගත් ඇය උසය. ඉතා ශෝබනය. ඉතා බාල වියේ සිටම ඇය ආමන්ගේ බිරිඳ වූ මට් දෙවඟනගේ අභිරහස් ගැන දැන සිටියාය. ඇගේ වයසේ සෙසු ගැහැනු ළමයින් මෙන් පිහිනීම, නර්තනය, සංගීතය හෝ පිරිමි ළමයින් ඇසුරට කැමැත්තක් ඇය තුළ නොවීය. දෙවොලේ වැඩපොළවල චාරිත්‍ර කරන්නවුන්ට සහායිකාවක ලෙස සේවය කළ ඇය ඉන් සතුටක් ලැබුවාය. ඈ තෝරාගත් කාර්යය වූයේ සුවඳ දුම් නිපදවීමයි.

ඇගේ හපන්කම් හඳුනාගෙන අගයකිරීමට පෙර, සුවඳ ද්‍රව්‍ය තනන මහලු පූජකයකුගේ විවේචනයන්ට හා පරීක්ෂාවලට මුහුණ දීමට ඇයට සිදුවිය. පසුව ගිබෙල් බාර්කල්හි කුඩා නිල නිවසක විශ්‍රාම සුවයෙන් ගත කිරීමට තීරණය කළ ඔහු, තම නිෂ්පාදනයේ රහස් සියල්ල ඇයට පැවසුවේය. මේ අයුරින් ඇයට වසර ගණනාවක පර්යේෂණ හා සොයා ගැනීම් වලට අදාල දැනුම ලබාගත හැකිවිය.

ෂෙපෙනා, එවැනි වාසනාවක් උදාකරදීම පිළිබඳව දෙවියන්ටත්, එම පූජකයාටත් ස්තුති කළාය. තමා ඔවුන්ට ණයගැතිබව ඇයට දැනුණි. එහෙයින්ම දිවියේ ඉදිරිකාලය දෙවොල් හා ශුද්ධ වූ ප්‍රතිමා වෙනුවෙන් නිපදවන සුවඳ ද්‍රව්‍ය තැනීමටත්, ඒවා වැඩිදියුණු කිරීමටත් ඇය කැප කළාය. දෙවොල් තුළට පා තබන බැතිමතුන්ට ඒ සුවඳ ඔස්සේ තම ආත්මය සතුටින් පුරවාගෙන, කුරුල්ලෙකු සේ සැහැල්ලු බවට පත් කරගත හැකිවිය.

නපාටාව ධනවත් වූ නිසාත්, පියාන්කිගේ අරමුණ වූයේ දෙවියන්ට උපරිම ගෞරවය ලබාදීම වූ නිසාත්, ෂෙපෙනා තමාට හැකි වඩාත්ම දුර්ලභ වටිනා අමුද්‍රව්‍ය ගෙන්වා ගත්තාය. යේමනයෙන් ගෙන්වන්නට යෙදුන ''හෝරස්ගේ කඳුළු'' නමින් හැඳින්වෙන සුවඳ ලාටු, පන්ට් දිවයිනෙන් ගෙන්වන ලද සුවඳ ද්‍රව්‍ය හා තෙල් යනාදිය ඒ අතර විය. මේවා ඉතා සුවඳය. අවර්ණය. පිළුණු වීමක් නැත. මේ දැන් ඇයට සිරියාවෙන් ගෙන්වන ලද අමුද්‍රව්‍ය විශාල තොගයක් ලැබී තිබිණි. ඒ අතර තෙල් වර්ග, ගව මේදය, මැලියම් වර්ග, ආලේපන, පර්සියානු සුවඳ ලාටු, රෝස හා ලිලී සුවඳ හා ඖෂධ වියළීමට අවශ්‍ය ලුණු දැකිය හැකිය.

ආමන්ගේ ඊළඟ උත්සවයට, සිත් වශීකරන සුවඳක් විහිදුවන සුවඳ

*- ඇගේ සම්පූර්ණ නම සෙප්-එන්-ඔපෙට්යඃ ඔපෙට් දෙවඟනගේ තිළිණය

දියරයෙන් කුඩා කුප්පි ටිකක් පුරවා තබන්නට ෂෙපෙනා තීරණය කර තිබිණි. ඇත්තටම මේ සුවඳ දියර නිෂ්පාදනය පහසු කාර්යයක් නොවේ. නිරතුරුවම අසාර්ථක වීමට ඉඩ ඇති මේ සුවඳ දුම් තැනීමට, ප්‍රධාන පෙළේ නිපදවන්නන් මිස අනෙකෙක් තැත් නොකරති. පැරණි වට්ටෝරු වලට අනුව මේ සුවඳ ද්‍රව්‍ය තැනීමට අමුද්‍රව්‍ය දහයක්, දොළහක් අවශ්‍යය. සමහරු දහසයක් පවා යොදා ගත්හ. නියමිත අමුද්‍රව්‍ය තෝරාගෙන දීර්ඝ කාලයක් ඒවා ඇඹරීමයි ෂෙපෙනාගේ සිරිත. ඉන්පසු පෙනේරයකින් හලාගන්නා එම කුඩු හොඳම තත්ත්වයේ වයින් හා මිශ්‍රකොට ඊට මී පැණි හා මැලියම් එක්කොට රත්කරනු ලැබේ.

"සාර්ථකද ඔබේ උත්සාහය?' පියැන්කි ඇසීය.

"උතුමාණනි ඔබේ පැමිණීම මට ගෞරවයක්."

"ඔබේ වැඩපොළ ගැන මිනිසුන් කොතරම් ප්‍රශංසා කරනවාද යත්, මා පැමිණියා මගේ දෑසින්ම ඒවා දැක ගැනීමට."

ෂෙපෙනා කුප්පිවල මූඩි ඉවත් කළාය. එකෙනෙහිම ඉන් පිටවූ සුවඳින් පියැන්කි දුක් ගැහැට නැති, කරදර නැති ලොවකට ඇදී ගියේය.

"ඔබ ඉන්ද්‍රජාලයක් ෂෙපෙනා."

"දෙවියන් තෘප්තිමත් කිරීමට වඩා වැදගත් වැඩක් තවත් නැහැ පියාණෙනි."

පියැන්කි සුවඳ දියරවල ආකර්ෂණය අමතක කරන්නට තැත් කළේය. "ඔබට හැකිවේවි මීටත් වඩා වැඩි ශක්තිමත් බවකින් එය ඉටු කරන්නට."

තරුණිය කල්පනාකාරීව බැලුවාය. "මට, සුවඳ ද්‍රව්‍ය තනන්නෙකු ලෙස කරන මගේ රැකියාවෙන් දුරස් වීමට සිදුවේද පියාණෙනි?"

"කිසිසේත්ම නැහැ. එහෙත් ඔබේ වගකීම් වැඩිවේවි."

"මට තේරුම් ගත නොහැකියි පියාණෙනි."

"තීබසයේ ආමන්ගේ බිරිඳ ලෙස පෙනී සිටින ඔබේ නැන්දනිය දැන් ඉතාම දුර්වලයි. මහලුයි. දැන් ඇයට කාර්නැක් දෙවොල් සියල්ලේම වගකීම දැරීම අපහසුයි. කාලය පැමිණ තිබෙනවා ඇගෙන් පසුව ඒ තැන ගන්නා තැනැත්තිය පත් කරන්නට. එවිට එතුමියට හැකියි ඇයට උපදෙස් දෙමින් තම රහස් ඇය වෙත ලබාදෙමින්, අවශ්‍ය පරිදි ඒ උතුම් තනතුරට පුහුණු කරන්නට."

ෂෙපෙනා සුදුමැලි වූවාය. ''පියාණනි! ආමන්ගේ බිරිඳ යනු දහස් ගණන් වැසියන්ට ආඥාවන් නිකුත් කරන, දෙවොල් නගරය පාලනය කරන රැජිනක්. එහෙත් මා කැමති මගේ වැඩපොළ පමණක් පාලනය කිරීමටයි. දෛනික ජීවිතයෙන් ඈත්ව සිටින්නයි පියාණෙනි.''

පියැන්කි තම ශක්තිමත් දෑතින් තම දියණිය වැළඳගති.

''මා තෝරා ගත්තේ ඔබයි. මගේ තේරීම ඔබයි මා ආදර දියණියනි.''

# 21

නෙම්රොඩ් කුමරුගේ වයස අවුරුදු පනහට ඉතා ආසන්නය. තමා ගැන මෙන්ම නිලධාරීන් ගැනද ආඩම්බර වන ඔහු සතුටින් ජීවිතය ගත කළේය. පිය උරුමයෙන් කමුත් නගරය ඔහු අතට පත්වන තෙක්, ඔහු මාලිගයේ ගතකළ ළමා කාලය, දැසි දැස්සන් විසින් වටකරගත් අධික ලෙස සැප ලැබූ එකක් විය.

නිතරම තමා ඉගෙනුම ලැබූ පන්තියේ ලේකම්වරුන් අතරින් පළමුවැන්නා වූ ඔහු අති දක්ෂ දුනුවායෙක් හා අශ්වාරෝහකයෙක් විය. ශක්තිමත් පුරුෂයෙකු වූ ඔහුට කාන්තාවන්ගේ ආකර්ෂණය ලැබුණේ කිසිදු වෙහෙසකින් තොරවය. කිසි විටක එක් ගැහැනියක සමග මාස හයකට වැඩි කලක් ගත නොකිරීම ඔහුගේ පුරුද්ද වූ අතර, ඔහුගේ සියලු රහස් රැක ගැනීමටද ඇය බැඳී සිටියාය. චාරිත්‍රානුකූලව සිදුවිය යුතු හෙයින් ඔහු විවාහ කරගත් රදල තරුණිය, තම මන්දිරයට වී අලස සුඛෝපභෝගී දිවියක් ගතකළාය.

සත්‍ය වශයෙන්ම කමුත්හි කුමරුගේ ජීවිතය නීරසය. ඔහුට අවශ්‍යව තිබුණේ මෙම්පිස් පාලනය කිරීමටයි. එහි දිවිය ජීවී බවක් ඉසිලූ අතර උතුරේ බලපෑමද දිනෙන් දින වැඩි වෙමින් පැවතිණ. මා ආට් නීතිය යටපත්ව තිබූ එහි, යම් යම් රහසිගත ක්‍රියාවන්ට තිබූ ඉඩ වැඩිය. මෙහි, කමුත්හි, චිත්‍රලේඛන හා මනුෂ්‍යත්වයේ රහස් මිනිසාට හෙළි කරන තෝත්ගේ නගරයෙහි, සියල්ල චාරිත්‍රානුකූලය. කිසිදු වරදකට ඉඩක් නැත.

කාර්නැක්හි ආමන් රා දෙවොල තරමටම විශාල තෝත්ගේ දෙවොල ප්‍රභූවරුන්ගේ දරුවන් වූ සිසුන්ට දෙව්ලොවක් විය. ඉපැරණි ලියකියවිලි වලට අනුව චාරිත්‍ර කරන්නන්, තාරකා විද්‍යාඥයින් හා නැකැත්කරුවන්, වෙදැදුරන්, ඉන්ද්‍රජාලිකයන්, සුවඳ ද්‍රව්‍ය තනන්නන් හා ගෘහ නිර්මාණ ශිල්පීන් දිනපතාම තව තවත් අධ්‍යයන කටයුතුවල යෙදෙති. නෙම්රොඩ්ට ඒ කිසිවක් වෙනස් කළ නොහැකිය.

කල්ගතවෙත්ම ඔහුගේ තත්ත්වය තවත් උග්‍ර අතට හැරුණි. මේ උගත්තු නිරතුරුවම ඔහු හා සංවාදයේ යෙදුනහ. ඔහු ඔවුන්ගේ නීරස දෙසුම් වලට දැඩි අවධානයෙන් සවන් දෙන බව පෙන්වූයේ, ඒ සන්ධ්‍යාවේ ප්‍රනීත ආහාර වේලකින් පසු තම යහනට කැඳවාගන්නා සුරූපී ලලනාව ගැන සිහින මවමිනි. ඊළඟ දවසේ ඔහු තම පාලනයට යටත්, ඉහළ ඊජිප්තුවේ පාලොස් වැනි පළාතේ අශ්වරථ ගමනක යෙදෙනු ඇත. නැතහොත් රසවත් බියර් තොල ගාමින්, නයිල් නදිය දිගේ අලස යාත්‍රා ගමනක යෙදෙනු ඇත.

නෙම්රොඩ් දිනපතාම සම්බාහනකරුවා, කරණවෑමියා, කොණ්ඩ සකසන්නා, නිය සකසන්නා සහ පා ඇඟිලි සකසන්නාගේ සේවය ලබාගති. තමාගේ බොරු කොණ්ඩා, ඇඳුම් හා සුවඳ ආලේපන තමාම තෝරාගන්නා ඔහු, මහලු බවේ සුළු ලකුණක් හෝ සිරුරෙහි මතුවේද යන්න ගැන දැඩි විමසිල්ලෙන් සිටියේය. එහෙත් සේවිකාව ඉතා මෘදු ලෙස සමේ තවරන ආලේපනයන්ට පින්සිදු වෙන්නට ඔහුගේ සමේ එකම රැල්ලක් හෝ වැටී නැත.

නෙම්රොඩ්ගේ රජයෙහි පත්කර සිටි ලේකම්වරුන්ගේ කළමනාකාර හැකියාවන් නිසා, දෛනිකව ඔහුට කිසිදු පරිපාලනමය ගැටලුවක් නොවීය. ඔහුගේ පළාත සාරවත්ය. අස්වැන්න ඉතා ඉහළය. කිසිදු අපහසුවකින් තොරව බදු එකතු කරගත හැකි විය. ඔහුගේ කාර්යය වූයේ කිසිදු වරදක් නැති ලේඛනයන්හි ඉලක්කම් දෙස යන්තමට බැලීම පමණි. එහෙත් එක් වගකීමක් ඔහුගේ සිත කරදරයට පත් කළේය. එනම් පියැන්කි විසින් ඔහුගේ අණසකට යටත්ව තබන ලද යුධ හමුදා බණ්ඩය හොඳ තත්ත්වයේ තැබීමයි. ඊට දක්ෂ දුනුවායන් හා පළපුරුදු හමුදා භටයින් අයත් විය. ඕනෑම ආක්‍රමණයකට මුහුණ දීමට තරම් ඔවුන් දක්ෂය. ඉංජිනේරුවෝ ආරක්ෂක තාප්ප නඩත්තු කළහ. ඒවායෙහි අවශ්‍යතා සැපයීම නිරතුරුවම නෙම්රොඩ් අතින් සිදුවිය.

කමුන්හි තත්ත්වය ඉතා සාමකාමීය. එයින් උතුරට ලිබියානු කුමාරවරු සිටින අරාජික පෙදෙසකි. දකුණට, තීබසය නම්වූ ශුද්ධ වූ නගරයයි. එයද කමුන් මෙන්ම පාරම්පරික චාරිත්‍ර වලින් මිරිකුණු සිරගෙයකි. ශිෂ්ටාචාරයෙන් බොහෝ දුර තිබෙන හුදකලා නුබියාවේ පියැන්කි වාසය කරයි. කළු පාරාවෝ, නම ඇසූ පමණින්ම සතුරා බියගන්වන කළු පාරාවෝ!

හෙනෙත් නෙසට් වෙත ප්‍රහාරයක් එල්ල වූ බව දැනගත් පළමු අවස්ථාවේම නෙම්රොඩ් එය ප්‍රතික්ෂේප කළේය. එය ලිබියානුවන්ගේ

තවත් එක කටමැත දෙඩීමක් පමණක් විය යුතුය. එහෙත් පසුව ඒ පුවත තහවුරු විය. ටෙෆ්නැක්ට එරෙහිව සටන් වැද ජය ගන්නට පෙෆ්ටෝ අසමත්ව තිබිණි.

ටෙෆ්නැක්, සායිස්හි කුමරු..... මෙතරම් දක්ෂ ලෙස පෙරමුණක් සදාගෙන, විශිෂ්ට යුධ උපක්‍රම යොදා ගන්නා රණකාමියෙකු යැයි නෙම්රොඩ්ට නම් විශ්වාස කළ නොහැකිය. එක අතකට ඔහු සිතූ හැටි නිවැරදිය. ඔහු තමන්ට පහර දීමට ඉදිරිපත් නොවූයේ ඒ නිසාය. හෙනෙන් නෙසට් ජයගෙන විවේක ගත් ලිබියානුවෝ තීබන් කලාපය දෙසට පා තබා නැත. එහිදී පියැන්කිගේ හමුදාව ඔවුන් පෙති ගසන බව දැන, ඔවුන් ඩෙල්ටාව දෙසට හැරී ඇත. එය නිකම්ම කෙටි කතන්දරයක් පමණි.

හෙනෙන් නෙසට් යළිත් පෙෆ්ටෝගේ පාලනයට යටත්ව ඇත. ඔහු යළිත් කළු පාරාවෝට පක්ෂපාතී වනු ඇත. මේ වනවිට නෙම්රොඩ්ට ගොවීන්ගේ හා කර්මාන්ත ශිල්පීන්ගේ අඳෝනාවලට කන්දෙන්නට සිදුවී ඇත. බදු වැඩිවීම හා රැකියාවන් කිරීමේ අපහසුතාවය ගැන දිගින් දිගටම චෝදනා එල්ල වේ. ඔහු ඊට ප්‍රතිචාර ලෙස නව නීති සම්පාදනය කිරීමට තීරණය කළේය. කැරලි ඇතිවුවහොත් ඔහු තම ආරක්ෂක හමුදා මගින් ඒවා පාලනය කරනු ඇත.

නෙම්රොඩ් රාත්‍රී ආහාරය සඳහා වයින් තෝරන අවස්ථාවේ ඔහුගේ ප්‍රධාන ඇමති පැමිණියේය. වැදගත් කරුණකට හැර නිකරුණේ එන අයෙක් නොවේ ඔහු.

''කුමරුනි අපව වට කරලා.'' ඔහු කෑගැසීය.

''විය නොහැකියි. ඒ පියැන්කිගේ හමුදාව විය යුතුයි. අපගේ ආරක්ෂාවට එන පියැන්කිගේ හමුදාව.''

''ඔවුන් නුබියානුවන් නොවෙයි කුමරුනි.''

''එසේනම්?''

''ඒ ටෙෆ්නැක්. මා අපගේ හමුදාවන් සීරුවෙන් තැබුවා.''

''අපට හැකිද ඔවුන් හා සටනින් ජයගන්නට.''

''ප්‍රහාරයට එන හමුදාව ආයුධ සන්නද්ධයි. එහෙත් අපට හැකියි ඔවුන් පරදවන්න. වතුර ටැංකි සියල්ල පිරී තිබෙනවා. අපගේ ආහාර ගබඩාත් එසේයි. ඔහුගේ භටයින් මිය යනවිට ඔහු සටන අත්හැර දමාවි.''

''සියලු දෙනා නිවැරදි මගට යොදවන්න.''

✸

උරහිස් පටි යෙදූ, දිග, කොළ පැහැති ලෝගුවකින් සැරසුන තරුණිය සරල බොරු කොණ්ඩයකින් සැරසී සිටියාය. කමුන්හි ප්‍රධාන දොරටුවෙන් ඇය ඉදිරියට එත්ම, දූනුවායෝ පුදුමයෙන් බලා සිටියහ.

ඩේබ්‍රෙක්, ආයුධ සන්නද්ධ භට කණ්ඩායමක් සමග නෙම්රොඩ් මාලිගාව බලා ගියාය.

''කවුද ඔබ?'' ඔහු ඇසීය.

''ටෙෆ්නැක් විසින් මරා දමන ලද හෙනෙන් නෙසට් හි නායක දූනුවායාගේ දියණිය.''

''ඔහු ඔබව නිදහස් කළා?''

''මා ඔහුගේ නියෝජිතයා.''

''ඔබ මට විහිළු කරනවාද?''

''හෙනෙන් නෙසට් හමුදාව දැන් ටෙෆ්නැක්ගේ අණට යටත්. ඔහු තීරණය කර තිබෙනවා ඔබේ නගරය අයිති කර ගන්නට.''

''ඔහු අධික බල කාමයෙන් යුතු අයෙක්.''

''විය හැකියි කුමරුනි. එහෙත්, මගේ ව්‍යායාමය වෙනස් කිරීමයි ඔබේ සිත. ටෙෆ්නැක්ගේ අරමුණ ඊජිප්තුව විනාශයෙන් මුදවාගෙන ඇයට පෙර තිබූ විශිෂ්ටත්වය ලබාදීමයි. ඔබ පියැන්කිට සේවය කිරීම තෝරාගන්නවා නම් ඔබත් ඔබේ නගරය සමග මියයාවි.''

''ඔහුගේ යෝජනා මොනවාද?''

''කමුන්හි දොරටු විවෘත කර ඔහුට එක්වන්න. ඔබේ භටයින් ඔහුගේ අණට අනුව තීබසය බලා ගමන් කරාවි.''

''එය මා බිය ගැන්වීමට කරන මෝඩ උත්සාහයක් තරුණිය! කමුන් ඒ ප්‍රහාරය මැඩපවත්වනවා.''

''ටෙෆ්නැක් නොසන්සිඳෙන ආශාවන් ඇත්තෙක්. ඔහු තම අරමුණට ළං වී මිස නවතින්නේ නැහැ. ඔහුට කුමක් අහිමි වුණත් ඔහුට කමක් නැහැ. කමුන් යටත් විය යුතුයි. කමුන් යටත් වේවි.''

''මා ඔහුට යටත් වුවොත්, ඔහු මා මරා දමාවි.''

''පෙෆ්ටෝ කුමරු තවමත් ජීවතුන් අතර. ඔහු තවමත් හෙනෙන් නෙසට් පාලනය කරනවා. කුමටද තවත් පියැන්කිගේ බලපෑමට යටත්ව සිටින්නේ? ඔහු කිසිවිටක නුබියාව හැර යන්නේ නැහැ. එපමණක්ද? ඔහු ඊජිප්තුව වහලකුගේ තත්ත්වයට පත් කරනවා. ඔහු නිසයි සෞභාග්‍යය

අතුරුදහන් වී දිළිඳුකම මතුවන්නේ. ටෙෆ්නැක් යටතේ ගොඩබිම් දෙක යළිත් එකමුතු වේවි. ඔහුගේ ජයග්‍රහණයට සහාය වූ අයට තිළිණ ලැබේවි.''

නෙම්රොඩ් ටික වෙලාවක් කල්පනා කළේය. කළු පාරාවෝ යනු බොහෝ දුරින් සිටින හිතුවක්කාරයෙක් පමණි. හැම අතින්ම කළු පාරාවෝට පක්ෂපාතී වන බවට ඔහු සහතික වී ඇතිබව සත්‍යයකි. එහෙත් ඒ පොරොන්දුව මේ හදිසියේ පැමිණි කරදරය නිසා බිඳී යනු ඇත. ටෙෆ්නැක් කමුන්හි දොරටු අසලට පැමිණ සිටී. ඔහුට බලවත් සැලසුමක් ඇත. ඒ නිසාම ඔහු නෙම්රොඩ්ට මේ තත්ත්වයෙන් මිදී වඩාත් සැප පහසු ජීවිතයකට යාමට මං සලසනු ඇත.

''ඔබට හැකියි ඉතා පහසුවෙන් යමක් පැහැදිලි කරන්නට. ඔබ හොඳ නියෝජිතයෙක්.'' නෙම්රොඩ් පැවසීය.

''ලේ වැගිරීමක් නැහැ. මා කමුන්හි දොරටු විවෘත කරනවා ටෙෆ්නැක්ගේ හමුදාවට. මා ඔහුගේ අණ පිළිපදිනවා.''

# 22

ටෙෆ්නැක් කමුන් නගරයට ඇතුල් වූයේ ජනතාවගේ ඔල්වරසන් මැදය. ඔහුගේ පිටුපසින් ඔහුගේ හමුදාවන් ඇදී ආහ. ඉන් පැයකට පෙර ජනතාව ඇමතූ නෙම්රොඩ් තමා ලේ වැගිරීමක් නැවැත්වූ බවත්, ඔවුනට දීප්තිමත් අනාගතයක් උරුම කර දෙන බවත් පැවසීය. ඔහු පැවසූ අන්දමට දෛනික ගැටලු, බදු පැනවීම්, නයිල් ජල ගැල්ම අඩුවීම, බඩු මිල ඉහළ යාම, දරුවන්ගේ රෝග පීඩා ආදි අවාසනාවන්ත තත්ත්වයන් එකම මිනිසෙකුගේ වැරදි නිසා සිදුවන දේය. ඒ පියැන්කිය. කළු පාරාවෝය. වසර ගණනක සිටම මේ කුරිරු පාලකයාගෙන් මිදෙන්නට නෙම්රොඩ් උත්සාහ කළ නමුත් ඔහු ඉන් පරාජය විය. දැන් අනාගත ඊජිප්තු පාරාවෝ, ටෙෆ්නැක්ට පින්සිදු වන්නට ජනතාවට සෞභාග්‍යමත් අනාගතයක් උදාවනු ඇත.

''මේ දිළින්දන් මෙතරම් පහසුවෙන් රැවටෙන්නේ කිමද?'' අකනොෂ් විස්මයට පත්විය. ඔහුගේ අශ්වයාගේ කුර ගැටෙන්නේ, පහසු ජයෙන් කුල්මත් වී සිටින සෙසු ලිබියානු කුමාරවරුන් ඔසවාගත් අසුන්ගේ කුර හඬ සමග කැලතෙමිනි. විශිෂ්ට බවක් ආරූඪ කරගත් ටෙෆ්නැක්ගේ බලයට කිසිවෙකු අභියෝග නොකරනු ඇත. කමුන් යටත් කර ගැනීමත් සමග ඔහු මධ්‍යම ඊජිප්තුවේ පාලකයා බවට පත්වී සිටී. අති දක්ෂ ලේකම්වරුන්ගේ සහය ලබා ගනිමින් තම යුධ හමුදාවේ තත්ත්වයද සැලකිය යුතු තරම් වැඩි කර ගැනීමට ඔහු සමත් විය.

මෙවර කිසිදු ආකාරයක කැරැල්ලක් ආක්‍රමණයක් ගැන සිතන්නට ජනතාවට ඉඩක් නැත. ඉන් ඔවුන්ට සිදුවන වාසියක්ද නැත. ටෙෆ්නැක් නියත වශයෙන්ම ජයග්‍රාහකයා බවට පත්වෙයි. එහෙත්, අකනොෂ්ගේ හදවත දවන්නේ වෙනත් ගිනි දළුවකිනි. ''කිමද පියැන්කිගේ ප්‍රතිචාරයක් නැත්තේ? ඔහුට ඒ පණිවිඩය නොලැබුණාද? නැතහොත් ඔහු මේ අනතුරේ බරපතලකම අවතක්සේරු කළේද? දැන් තීබසය මහ විපතකය!"

✸

නෙම්රොඩ්, රජෙකුට මෙන් ආචාර දක්වා නව පාලකයා පිළිගත්තේය. හිරු රැසින් ඔහු ආරක්ෂා කිරීමට, රන් ආලේපිත ලීයෙන් තැනූ මණ්ඩපයක් විය. සිංහ පාදවල හැඩයට තැනූ පාද සහිත සිහසුනක් පාම් අතු වලින් සරසා තිබිණි. එතැන වූ කුඩා පා රඳවනය, බිම දිගාවී පක්ෂපාතිත්වය පෙන්වන නුබියානුවකුගේ හැඩය ගති. මෙයින් කියවෙන පණිවිඩය ඉතා පැහැදිලිය. කමුන්හි කුමරා, මෙම නව පාලකයා ඊජිප්තු පාරාවෝ ලෙස පිළිගනී. එතැන අඩු කිරුළු පැළඳීමේ උත්සවයක් පමණි.

රෝස සුවඳැති දියර ඉසගත් නෙම්රොඩ් බොරු කොණ්ඩයක් දමා ලිනන් ලෝගුවකින් සැරසුණි.දෙපයෙහි අලංකාර සෙරෙප්පු යුගලක්ද, ගෙල වටා නීල මාණික්‍ය යෙදූ පළල් මාලයක්ද විය. ඔහු ටෙෆ්නැක් ඉදිරියේ ආචාර දක්වා මෙසේ කීය. ''මෙතැන් පටන් මේ නගරය ඔබෙයි උතුමාණෙනි. අණ දෙන්න මම එය පිළිපදිමි, ඔබ මට එය පාලනය කිරීමේ වරම ලබාදෙන්නේ නම්.''

''නුඹ බොහොම සාධාරණ මිනිහෙක් නෙම්රොඩ්. යුද්ධයකදී එය ඉතාම දුර්ලභ වටිනා ගුණයක්. මේ පුරාණ අභිමානවත් නගරය ගැන නුඹට වඩා දන්නේ කවුරුද?''

දණින් වැටුණු නෙම්රොඩ්, ටෙෆ්නැක්ගේ සමින් කළ පා වැස්ම සිපගති. පපු සන්නාහය හා හිස්වැස්මද පැළඳ සිටි නව පාරාවෝද ඒ?

''ස්තුතියි උතුමාණනි. ඔබට මගේ භක්තිය, ගෞරවය.''

''නැගිටිනු දාසයා.''

කමුන් කුමරු ටෙෆ්නැක්ට පියවරක් පිටුපසින් සිටි ඩේබ්‍රේක් දෙස බැලීය.

''ඔබේ නියෝජිතයාගේ බුද්ධිය හා රුව.....''

''ඇය ඊට වඩා බොහොම ඉදිරියෙන්.'' ටෙෆ්නැක් කීය. ''ඇයයි අනාගත ඊජිප්තු රැජින.'

තරුණියගේ මුහුණේ පුදුමය උපදවන ප්‍රීතිමත් සිනාවක් මතුවිය. තම පියාගේ මරණයෙන් ඇගේ හදවතේ ඇතිවූ තුවාලය තවමත් සුවවී නැත. එය දැඩි වේදනාවක් දුන්නද ඇය ඇගේ ජයග්‍රාහකයාගේ මායාවට යටත් වී සිටියාය. තමාගේ මේ ක්‍රියාව සාධාරණ යැයි සිතන ජයග්‍රාහකයා ඔහු තම හදවතේ පැසවන ගින්න ඇය තුළද දැල්වීය. ඇගේ හදවතේ උපන් වෛරය තවමත් පහව නොගිය නමුත්, එය ආදරයට ළං වූ අගය කිරීමක් සමග සටනක යෙදිණි. ඔහුට සහය වීමට ඇයට අවශ්‍ය විය. ටෙෆ්නැක් ඈ රවටා නැත. ඇගේ මැදිහත් වීමෙන් ජීවිත දහස් ගණනක්

බේරී ඇත. හෙට තීබසයේදීද ඇගේ ඒ උත්සාහය ක්‍රියාත්මක වනු ඇත. සමහර විට ආමන්ගේ බිරිඳ කළු පාරාවෝ දුෂ්ට පාලකයකු බව වටහාගනු ඇත. ටෙෆ්නැක්ට එරෙහි වීම, ඊජිප්තුවට එරෙහි වීම හා සමාන බව වටහාගනු ඇත.

රැජිනක බවට පත්වීම.... ඒ සිතිවිල්ල ඩේබ්‍රෙක්ගේ සිරුර පුරා සිසිල දනවන ආලේපනයක් සේ පැතිර ගියේය. අනාගතය ගැන කිසිදු බලාපොරොත්තුවක් නොමැතිව ජීවත් වූ මේ තරුණිය තුළින් එක්වරම ඒ ළමාවියේ මෘදුබව වියැකී ගියේය. ඇයට මරණ බිය දැනී තිබිණි. ජීවත්වීමට ඇය තුළ වූයේ දැඩි ආශාවකි. ප්‍රයෝජනවත් ලෙස ජීවත් වෙමින්, ටෙෆ්නැක්ගේ අධිෂ්ඨානය තමා තුළද වූ බව පෙන්වීමට ඇයට අවශ්‍ය විය.

කමුත් නගරයට නිදහස ලබාදීම සැමරීමට පැවැත්වූ පළමු උත්සවයේදී, ඩේබ්‍රෙක් ටෙෆ්නැක්ගේ වම් පසින් වාඩි වී සිටියාය. මුලු ලොව ඉදිරියේ ඒ ජයග්‍රාහකයා ඇගේ තත්ත්වය හෙළි කළේය. ඇයට බෙහෙවින් ආශා කළද, ඇයට බැල්මකින් හෝ ළං නොවන්නට නාට්‍රෙබ් ප්‍රවේසම් විය.

''උතුමාණනි, මේ අවස්ථාවේම ඔබට බරපතල කාරණා ඉදිරිපත් කිරීමට සිදුවීම ගැන කණගාටුයි.'' නෙම්රොඩ් ටෙෆ්නැක්ගේ කනට කෙඳිරිය. ''උතුමාණෙනි, පියැන්කි විසින් ඇතිකළ බදු ක්‍රමය.... ඔබ එය වෙනස් කරනවාද?''

''දැනට මුල්තැන යුද්ධ ආර්ථිකයටයි. මගේ උපදේශකවරුන් වන යෙගෙබ් හා නාට්‍රෙබ් නුඹට ඒ සියල්ල විස්තර කරනු ඇති. ඔවුන් ඒ ගැන කටයුතු භාරව සිටීවි.''

''මගේ පුද්ගලික අඩු කිරීම් උතුමාණනි?''

''නුඹ හොඳින් ක්‍රියාකළ නිසා ඒවා අඩුකෙරෙනවා. කෙසේද නුඹේ ආයුධ තත්ත්වය?''

''ප්‍රවේශමෙන් නඩත්තු කෙරෙනවා.''

''නුඹේ සොල්දාදුවන් සූදානම්ද යුද්ධයට?''

''ඔවුන් විශිෂ්ටයි උතුමාණනි. සියලුම දෙනා පළමු පන්තියේ වෘත්තිකයන්. ඔවුන් නුබියානුවන් බුරුතු පිටින් වනසා දමාවි.''

''නුඹේ වාසනාව ගැන සතුටු වනු නෙම්රොඩ්.''

*

අකනොෂ්ගේ බිරිඳ වැලපුණාය. යෙගෙබ් හා නාට්‍රෙබ් හෙනෙත් නෙසට්හි පැනවූ නීතිමයි මෙහි පනවන්නේ. මහල්ලන් හා රෝගීන් ක්‍රමයෙන් මරා දමනවා. ටෙෆ්නැක්ගේ සැලසුම් ගැන වචනයකින් හෝ සැක පහළ කරන අය මරා දමනවා. එහෙත් පියැන්කි නිහඬයි. කිමද ඒ? මේ යක්ෂයින් තලා දමන්නට ඔහුගේ හටයින් තිබසයෙන් මෙහි එවිය යුතුයි.

අකනොෂ්ගේ සියලු බලාපොරොත්තු සිඳී තිබිණි. ''සමහර විට ඔහුට පණිවිඩය ගෙනගිය තිබත් පූජකයාට නපාටාවට යන්න නොහැකි වූවා විය හැකියි. මේ කාරිය මවිසින්ම කළ යුතුයි ප්‍රේමිය.''

ඇය ඔහුගේ බාහුව මිරිකාගත්තාය. ''නැහැ, අකනොෂ්. නැහැ. ඔවුන් කිසිදා ඔබට ඉඩ දෙන්නේ නැහැ මේ නගරය හැර යන්නට. දේශද්‍රෝහී වීමේ වරදට ඔබ අල්ලා ගනීවි. වදයට පමුණුවාවි.''

ඔහු හිස නැවීය. ''ඔබ නිවැරදියි ප්‍රේමිය. එය උමතු ක්‍රියාවක් වේවි. එහෙත් තවමත් එක දෙයක් ඉතිරිව තියෙනවා. තෝත් දෙවියන්ගේ පූජකයින් මේ පවතින තත්ත්වයට එරෙහි වනු නිසැකයි.''

''ඔබ ඔවුන් හඳුනනවාද?''

''නැහැ. එහෙත් අපට සිදුවෙනවා ඒ අවදානම ගෙන දෙවොල් වැඩපොළට ගොස් ආධාර ඉල්ලන්නට. ඔබ එහි යා යුතුයි. අපට ලබාදී තිබෙන නිවස, මැසි මදුරුවන්ගෙන් පිරී ඇති නිසා උන් පළවා හරින්නට කැළෑ මිංචිවලින් තැනූ තෙලක් ඉල්ලන්න. මගේ තත්ත්වයත් අපගේ අවශ්‍යතාවයත් සලකා ඔවුන් අපට විශේෂඥයකු එවාවි.''

✸

මිංචි තෙල ගෙන ආවේ මැදිවියේ පුද්ගලයෙකි. ඔහු ඉතා ප්‍රවේශම් සහිතව එය ගෙනැවිත් අකනොෂ්ගේ කාර්යාලයේ ඔබ මොබ ඇවිදිමින් පරීක්ෂා කළේය.

''කුමරුනි මා කුමක් පවසන්නද? මේ නිවස ඉතා හොඳ තත්ත්වයේ පවතින බව පේනවා. මට කිසිම තැනක මැක්කෙක් හෝ දැකිය නොහැකියි.''

මෙහිදී අකනොෂ් කතා කළේය. ''ඔබ පියැන්කිට පක්ෂපාතීද?''

''ඔබට පිළිතුරු දීමෙන් මට මගේ දිවි අහිමිවේවි.'' පූජකයා වෙව්ලායමින් කීය.

''බිය නොවන්න. මා ලිබියානු කුමරෙකු බව සත්‍යයක්. එහෙත් මා

ටෙෆ්නැක්ට අවනත වෙනවා. අවශ්‍ය වුවහොත් මා සටනට ඔහුට සහාය දෙනවා. එහෙත් මට ඔහුගේ උපදේශකයින් වධකයින් සේ ක්‍රියාකිරීම ඉවසිය නොහැකියි. ජනතාව පීඩාවට පත්කිරීම ඉවසිය නොහැකියි. පියැන්කි දැනුවත් කිරීම අත්‍යවශ්‍යයි. සමහර විට, ඉතා විනාශකාරී යුද්ධයක් ඇතිවේවි. සමහර විට මා සිතන හැටියට, තත්ත්වය නැවතත් ශක්තිමත් වේවි. අවම වශයෙන් ජනතාවගේ දිවි බේරේවි. කෲර ටෙෆ්නැක් ඉදිරියට යාම නවතීවි.''

''මෙසේ පැවසීම දේශද්‍රෝහි වීමක් නොවේද?''

''මා ප්‍රකාශ කරන්නේ මගේ හෘද සාක්ෂිය. තෝත් දෙවොලට හැකිද, කමුන් ටෙෆ්නැක්ට යටත් වූ බව පියැන්කිට දන්වන්නට?''

''මේ කැළෑ මිංචි තෙල් කුප්පිය පිළිගන්න කුමරුනි. එය ඔබේ ගෙය වටා ඉසින්න. ඔබ මගෙන් ඉල්ලා සිටින්නේ අහිතකර පණුවන් පරාජය කිරීමට උදව්වක් නොවේද?''

# 23

පියැන්කිගේ දියණිය ඔහුට දුන් බඳුන ඉතා අනර්ඝ වීදුරු වලින් තනන ලද්දකි. ඔහු එය විවෘත කළේය. ඇගේ විලවුන් සත්‍ය වශයෙන්ම අති විශිෂ්ටය. කටු නොඇනෙන, කිඹුලන් සපා නොකන, එහා ලෝකයේ දෙවිවරුන් ආලේප කරන විලවුන් වර්ගයකි එය.

සැමියාගේ අතින් මෘදු ලෙස එය ගත් අබිලා ඔහුගේ ශක්තිමත් සිරුර ඉන් නැහැවූවාය. සම්බාහනය කළාය. ''මේ සුවඳ ඉන්ද්‍රජාලයක්.'' ඇය කීවාය.

අබිලා තම නග්න සිරුර පියැන්කිගේ සිරුර වටා එතුවාය. ඇය වෙතින් සියලු මල්වල සුවඳ හැමීය. නයිල් ගඟේ ඉවුරුවල ඉන්ද්‍රජාලය, සාරවත්, වශීකරනසුළු හිරු නගින බිමක ඉන්ද්‍රජාලය; ඇය වෙතින් දිස්විය.

''මා සදහටම ආදරය කරන එකම ගැහැනියයි සිටින්නේ. මා අන් කිසිවකුට ආදරය කරන්නේ නැහැ.''

''මා ඔබව විශ්වාස කරනවා හිමියනි. මා දන්නවා ඔබ පවසන්නේ සත්‍යයක් බව.''

ඇය තම සිහින් දිගැටි ඇඟිලි වලින් සැමියාගේ කෙටි සාය බුරුල් කළාය. කළු පාරාවෝ, කිසිවකට සම කළ නොහැකි ඇගේ සිරුරේ සුවය වින්දේය. ඔවුන් එක්වූ මුල්ම රාත්‍රියේ ලද සුවය එදිනද ඔවුන්ට දැනිණි.

✸

කළ යුත්තේ කුමක්දැයි කුල් හෙඩ්ට සිතාගත නොහැකිය. ආරක්ෂකයා ඔහුට රජුගේ පුද්ගලික මන්දිරයට ඇතුල් වීමට ඉඩ දුන්නද රාජකීය යුවල එකට වෙළී නිදිසුව විදියි. මේ අවස්ථාවේ ඔවුන් අවදිකර ඒ අසුභ පුවත පැවසිය යුතුද? කුරුමිට්ටා රජයේ ලේකම්වරයෙකි. ඔහුට රාජ්‍යය වෙනුවෙන් බලවත් වගකීම් රැසක් විය. ඔහු සෙමෙන් රජුගේ නළලත ස්පර්ශ කළේය.

''උතුමාණෙනි අවදිවන්න.''

පියැන්කි එක ඇසක් ඇරියේය. ''කුල්හෙඩ් කිමද ඔබ මෙහි?''

''සමාවෙන්න උතුමාණනි. මෙය.... මෙය ඉතා හදිසියි.''

පාරාවෝ තම බිරිඳගේ සුකොමල සිරුර දෙස බැලීය. ලොව සියලු බර මොහොතකට අමතක කර, තමා ආලය කරන ගැහැනිය සමග, සෙසු මිනිසුන් සේ විසීම වරදක් නොවන බව ඔහු කල්පනා කළේය. ඒ සමගම අබිලා අවදි වූවාය. නැගී සිටි ඇය සැහැල්ලු අඩි තබමින් නාන කාමරය වෙත ගියාය.

''කුල්හෙඩ්?'' පියැන්කි කීය. ''ඔබ මා අවදි කළේ කිසිදු හේතුවක් නැතිව නම්, ඒ අප මිතුදමේ අවසානය.''

''එය අන් කිසිවකට සමකළ නොහැකි වුවත් උතුමාණනි, මා එයද අතහරිනවා සාමයේ නාමයෙන්. සාමය රැක ගන්නට හැකිවේ නම්.''

''ඔබට මධ්‍යම ඊජිප්තුවෙන් පණිවිඩයක් ලැබුණාද?''

''අවාසනාවට මෙන් එසේයි උතුමාණනි.''

✸

තෝත් දෙවොලෙන් පාරාවෝ වෙත යවන ලද තරුණයා, සෘජු බැල්මක් හා ශක්තිමත් මාංශපේශි ඇති තරුණයෙකි.

''කොහි සිටද ඔබ?'' පියැන්කි ඇසීය.

''කමුන් සිට උතුමනි.'

''නුඹව එව්වේ?''

''තෝත් දෙවොලේ ප්‍රධාන පූජකතුමා.''

''කුමක්ද ඔබේ දෙවොල පිහිටි මිටියාවතේ නම?''

''ටැමරික්ස් මිටියාවත උතුමනි.''

''දෙවොලේ දොරටුව අසල වැඩපොළේ නිපදවන්නේ මොනවාද?''

''ලේකම්වරුන්ගේ පුවරු උතුමාණනි.''

''කමුන්හි ශුද්ධ වූ නාමය?''

''ඔග්ඩෝඩ් නගරය. දැනට තීබස භූමියේ නිදන, ලොව මැවූ දෙවිවරුන් අට දෙනාගේ නාමයෙන්.''

පියැන්කිට සහනයක් දැනිණි. පණිවිඩකරුවා බොරුකාරයකු නොවේ.

''ඔබ තුල්හෙඩ් සමග කුණාටුවක් ගැන පැවසුවාද? ඒ කුමක්ද?''

''නෙම්රොඩ් කුමරු ඔබට ද්‍රෝහි වී, කමුන්හි දොරටු ටෙෆ්නැක්ට විවර කළා උතුමාණනි.''

''එය විශ්වාස කිරීමට අපහසුයි. නෙම්රොඩ් මට පක්ෂපාතිත්වය සපථ කර තිබුණා. එසේම ඔහු සතුව අවශ්‍ය තරම් හමුදා බලය තිබුණා.''

''එය සත්‍යයක් උතුමාණනි. එහෙත් ඔහු නගර බිත්ති බිඳ දමා ප්‍රතිඥාව කඩකොට ටෙෆ්නැක්ගේ දාසයා වී හමාරයි. ඔහු මොහොතකට හෝ ප්‍රමාද වූයේ නැහැ කමුන්හි වස්තුව ටෙෆ්නැක්ට පවරා දී යුධ හමුදාව ලිබියානු අණසකට පවරන්නට. මගේ නොඉවසිල්ලට කමන්න උතුමාණනි. එහෙත් තව කොතරම් කල් ඔබ නිහඬව සිටිනවාද? ටෙෆ්නැක් සෙසු නගර යටත් කර ගනිමින් ජයග්‍රහණය කරන තෙක්ද උතුමාණනි? ඔබේ සතුරා ඊජිප්තුව විනාශ කිරීම වැළැක්විය හැක්කේ, ඔබේ කීර්තියට පමණයි උතුමාණනි.''

✸

තැඹිලි, කහ පැහැති කේශරයෙන් අලංකෘත අසු පිට නැගි පියැන්කි කාන්තාරයේ ඈතටම ගියේය. වාත වේගයෙන් ඇදී යන පාරාවෝ ඒ විවෘත අවකාශය ගිල ගත්තේය. පළිඟු සේ පැහැදිලි වාතයෙන් පෝෂණය ලබමින් අහසේ නිල් පැහැය සමග සංවාදයේ යෙදුනේය. තම ස්වාමියාගේ සිත් රිදුම හඳුනාගත් වැලියන්ට්, ඔහු පවසන්නට පෙරම තම දිගාව මෙන්ම ගමන් ලතාවද වෙනස් කළේය. ඒ කාන්තාරය තුළ මිනිසා සහ සත්ත්වයා එකෙක් බවට පත්වූහ.

ගමන අතරතුර පියැන්කි ළිඳක් අසල නැවතිණි. තම උගුර තෙමාගන්නට පෙර ඔහු වැලියන්ට්ගේ පිපාසය සංසිඳීය. ඉක්බිති ඔහුගේ දෑස් කාන්තාරය දෙසට යොමුවිය. හිරු සහ සුළඟට විවෘතව ජනිත වූ භූමිය කිසිවකු කැළැල් කළේ නොවේ. මිනිස් ඇසට කිසිදා හසු නොවන, සැඟවුන තැනැත්තා විසින් ඇති කරන ලද සාමයට කිසිදු වංචාකරුවෙකුට හානි කළ නොහැකි විය.

පියැන්කි පැය ගණනක් භාවනාවේ යෙදුනේය. ඔහුගේ පූර්වජයා විසින් ආමන් වෙනුවෙන් කරන ලද යාඥාව ඔහුගේ දෙතොල් අතරින් පිටවිය.

''උතුම් දෙවියනි ඔබ සියල්ලන්ට ජීවය දෙයි. ඔබට ආචාර වේවා. අසමසම වූ දෙවියනි, මා ආට්ගේ ස්වාමීනි, ඈත අහස් ගැබ සාමයෙන්

තරණය කරන දෙවියනි, ඔබ ආලෝකයට ජීවය දෙයි. ඔබේ වදන් සත්‍යයි. ඕ, එක් තැනැත්තෙකු ලෙස හිඳිමින් බොහෝ දෙනෙක් නිර්මාණය කරන ඔබ පිළිගන්නට මගේ හදවත ආශා කරයි. ඔබේ නාමය පැවසීම කෙතරම් භාග්‍යයක්ද? මන්ද එහි ජීවයේ රසය රැඳී තිබේ. තණ බිමට ගවයන් ගෙන යන තැනැත්තා ඔබයි. නගරය ආරක්ෂා කරන දොරටුව, ගංගාවේ හැම නැම්මක්ම දන්නා කප්පිත්තා ඔබයි. ඔබයි ආමන්. නිහඬ බවේ ස්වාමියා. නිහතමානී අයට ඔබ ගැන හෙළි කරන, අවශ්‍ය තැනැත්තාට හුස්ම ලබාදෙන ඔබ, මා රැකගනු මැනවි. මම වේදනාවෙන් හා අවිනිශ්චිත බවින් වෙළී සිටිමි.''

හිරු බැසගිය පසු, කළු පාරාවෝ නපාටාව දෙසට අසු මෙහෙයවීය.

✸

පියැන්කිගේ විධානයට අනුව තෝත් පූජකයා ඔහු ගෙන ආ තොරතුරු සියල්ල රාජ සභාවට පැවසීය.

අණදෙන නිලධාරි ලැමසෙක්නි හැර අන් සියල්ලන්ගේම මුහුණු කඩා වැටිණි. ඔහුට ලිබියානුවන් සමූල ඝාතනය කිරීමේ වරම හෙටම ලැබෙනු ඇත. රාජ සභාවේ බොහෝ දෙනා ඔහු ගැන පුදුමයට පත්වූහ. දෙවියන්ට හෝ මිනිසාට බියනැති මේ මිනිසා සියල්ලන් බියට පත්කළ සෙයකි.

''උතුමාණනි කුමක්ද ඔබේ බලාපොරොත්තුව?'' ආහාර රුචිය නැතිවූ ඔටොකු ඇසීය.

''මේ සාක්ෂිය අප සැලකිල්ලට ගත යුතුයි. හෙනෙන් නෙසට් යටත් වීම හුදකලා සිදුවීමක් නොවෙයි. නෙම්රොඩ් නීච ද්‍රෝහියෙක් . තම නගරය ටෙෆ්නැක්ට භාර දීමෙන් පසු ඔහු තමන් විසින්ම කෲර සතුරකු බවට පත්වුණා, අප අපගේ අවසන් ශක්ති මාත්‍රාව දක්වා සටන් කර හෝ පරාජය කළ යුතු.''

ඒ වදන් ඇසූ තර මිනිසා බිය වූයේය. ''උතුමාණනි, මා සිතන්නේ නැහැ ඔබ යුධ හමුදාවට නායකත්වය දෙමින් නපාටාව හැර යතැයි කියා. ඔබ අත්‍යවශ්‍යයි. අනෙක් ඔබට අයිතියක් නැහැ ඔබේ ජීවිතයට අවදානමක් දෙන්නට.''

''මා ඔටොකු හා එකඟයි.'' රැජින කීවාය. ''මධ්‍යම ඊජිප්තුවේ ඇති වී තිබෙන කලබල සියල්ල නෙම්රොඩ්ගේ ද්‍රෝහිවීම තුළයි ඇතිවුණේ. එහෙත් තීබසයේ සිටින අපේ හමුදාවන් හදිසි ප්‍රහාරයක් දීමට තරම් ශක්තිමත් කළ යුතුයි.''

"මා එය පෝර්මා සහ ලැමසෙක්නිගේ අණ යටතේ පිටත්වන හමුදාවක් මගින් ශක්තිමත් කරනවා." පියැන්කි පැවසීය. "ඔවුන්ගේ කාර්යය වන්නේ හෙනෙත් නෙසට් හා කමුන් නිදහස් කර ගැනීමයි. සතුරු ඒකාබද්ධ හමුදාවන් බිඳ දැමීම හා ඉතිරි වන හමුදාවන් උතුරට පලවා හැරීම."

ඔටොකුට සහනයක් දැනුණි. මේ කාර්යයේදී රජු අගනුවර රැඳී ඒ නිශ්චල කැරැල්ල මැඩලීමේ කාර්යය ඔහුගේ හොඳම හමුදා ඛණ්ඩයකට භාරදෙනු ඇත.

# 24

නෙම්රොඩ් සිටියේ සතුටිනි. කුමරකු ලෙස ඔහු සතු බලය බිඳකුදු අඩු නොවුණා පමණක් නොව ඔහුට සියලු පරිපාලන කටයුතු වලින්ද නිදහස ලැබී තිබිණි. නගරයේ සියලු කටයුතු ගැන නාට්‍රෙබ් හා යෙගෙබ් උනන්දුවෙන් සොයා බලති. ඒවා ක්‍රමානුකූලව හැඩ ගත්වති. ජන ජීවිතයට ඔවුන්ගේ බලපෑමෙන් මිදෙන්නට කිසිදු හැකියාවක් නැත. මෙහි ඔවුන් පනවන නීති, හෙනෙත් නෙසට්හි බල පැවැත්වෙන ඒවාටත් වඩා කෲරය.

ටෙෆ්නැක්ගේ උපදෙස් අනුව යමින් ඒ යක්ෂයන් දෙදෙනා, කමුන්හි සියලු පුරවැසියන් යුධ හමුදාවට එක් කර ගනිමින්, එය හමුදා බැරැක්කයක් බවට පත්කර තිබිණි. මහල්ලාගේ සිට කුඩා දරුවා දක්වා සියල්ලන්ම, කුමන අන්දමට හෝ හමුදාවට සේවය කළ යුතුවිය. හමුදාවෙන් සහනයක් ඉල්ලූ සැමට සිදුවූයේ ඔවුන්ට ආවතේව කිරීමටයි. මව්වරුන්ට ගණිකා වෘත්තියේ යෙදීමට සිදුවීම හෝ දස වියැති කුඩා දරුවන්ට විශාල ආහාර කුඩ ඔසවාගෙන යාමට සිදුවීම නාට්‍රෙබ්ට හෝ යෙගෙබ්ට කිසිදු ගැටලුවක් නොවීය.

යුද්ධයේ ගැටලු ප්‍රසිද්ධියේ කතා කිරීමක් නොවීය. කරදරකාරී කටවල් ඉවත් කෙරුන අතර මුළු කමුන් නගරයම, යුද්ධය සඳහාම යොදාගනු ලැබිණ.

ටෙෆ්නැක්, මාලිගාවේ කෑම කාමරයේදී යුධ කවුන්සිලය කැඳවීය. නෙම්රොඩ්, යෙගෙබ්, නාට්‍රෙබ්, ලිබියානු නායකයින්, පෙෆ්ටෝ කුමරු හා ඩේබ්‍රේක් එහි වූහ. ඇගේ පැමිණීම බොහෝ දෙනාගේ අප්‍රසාදයට හේතු වුවද කිසිවෙක් ජෙනරල්ගේ අදහස් විවේචනය නොකළහ.

''තීබසයෙන් කිසිදු පුවතක් ලැබී තිබේද?'' ටෙෆ්නැක් ඇසීය.

''එසේය උතුමාණනි.'' යෙගෙබ් සතුටින් කීය. ''අපට එහි සිටින සහායකයින් වැඩි වෙනවා. අප කමුන් අල්ලා ගැනීමෙන් ඔවුනට වැටහුණා ඔබගේ ජයග්‍රහණය ඇරඹුන බව. ගොඩබිම් දෙක එක්කිරීම සිහිනයක්ම නොවෙයි උතුමාණනි.''

''ඔබ නගරයට ඔත්තුකරුවන් යොදා තිබෙනවද?''

''අපට සිටිනවා විශ්වාසය තැබිය හැකි තොරතුරු ගෙන එන්නන් දෙතුන් දෙනෙක්. ඔවුන් සුපරික්ෂාකාරීව වැඩ කරනවා, තීබසය තවමත් පියැන්කිට දැඩි සේ පක්ෂපාති බව දක්වන නිසා.''

''කුමක්ද ඔවුන් පවසන්නේ?''

''කළු පාරාවෝ හදිසියේම යුද හමුදාවක් තීබසයට යවා ඇතිබව.''

කාගේත් මුහුණු අඳුරු විය. මේ වනතෙක්ම ලිබියානුවන් ලැබුවේ පහසු, ඉක්මන් ජයග්‍රහණයන්ය. කෲර යයි පැවසෙන නුබියානුවන් හා සටනට යාම සිහිවීම ඔවුන්ගේ සිත්හි ඇති කළේ භීතිය මුසු ශෝකයකි.

''අප සාකච්ඡා මගට ගියහොත්?'' පෙෆ්ටෝ කුමරු වෙව්ලන හඬින් ඇසීය.

''කුමක්ද ඔබේ යෝජනාව?'' ටෙෆ්නැක් ඇසීය.

''උතුමාණනි, ඔබ දැනටමත් විශාල නගර දෙකක් යටත් කරගෙන තිබෙනවා. ඔබයි මධ්‍යම ඊජිප්තුවේ පාලකයා. පියැන්කි ඒ බව දන්නවා නම් තවත් ඉදිරියට යාමක් කුමටද? රාජ දූතයන් යවා සාකච්ඡා කිරීමෙන් මේ නවතම තත්ත්වය ස්ථිර කරගත හැකියි.''

''පෙෆ්ටෝ, නුඹට තේරුම් ගත නොහැකියි මා සටන් වදින හේතුව. මට අවශ්‍යව ඇත්තේ මගේ භූමිය විශාල කර ගැනීමට නොවෙයි. ඊජිප්තුව එදා තිබූ තත්ත්වයට පත් කර ගැනීමටයි මට අවශ්‍ය. ඊජිප්තුව එකමුතු කිරීමටයි. ලොව වඩාත්ම බලවත් අධිරාජ්‍යය ලෙස නැගී සිටීමටයි. පියැන්කි මා හා සාකච්ඡා කරාවි, ඔහුගේ යුධ හමුදාවන් අතුගා දැමූ පසුව. ඔහු හුදකලා වී ශෝකයට පත්ව, හෙළා දැකීමට ලක්වූවායින් පසුව. ඊජිප්තුව විසින් පාලනය කෙරෙන, ඈ විසින් සම්පත් සූරා ගැනෙන නුබියාවක් ඇතිවූ පසුව. මා ඒ තක්කඩියාට ගැලවීමට ඉඩ දෙන්නේ නැහැ. නුබියානු කැරලිකරුවන්ට කිසිදු අනුකම්පාවක් නොලැබිය යුතුයි.''

පෙෆ්ටෝ කුමරු ගොළුවත රැක්කේය.

සියල්ලන් පුදුමයට පත්කරමින්, ඩේබ්‍රෙක් කට ඇරියාය. ''පියැන්කි යුධ හමුදාවක් යවා ඇත්නම්, ඒ සාකච්ඡා කිරීමට හෝ සාමය ඇති කිරීමට නොවේ. නිසැකවම ඔහු තම හොඳම භටයින් තෝරාගෙන තීබසයට යවන්නට ඇති, හමුදාව සමග පෙරට යාමට.''

''අප සූදානම් නැහැ කාන්තාවකගෙන් යුධ උපක්‍රම ඉගෙන ගන්නට.'' නායකයෙක් කීය.

''කිමද බැරි? මේ පාඩම අති විශිෂ්ටයි.'' ටෙෆ්නැක් කීය.

''හොඳයි අපි එසේනම් තීබසයට ගොස් පහර දෙමු.'' නායකයා කීය.

''මෝඩයා.'' ඩේබ්‍රෙක් කීවාය. ''අප පියැන්කිගේ හමුදාව සමග යුද්ධයට යාමෙන් ඇතිවන ප්‍රතිඵලය කෙසේ වේදැයි කිව නොහැකියි. අනෙක් අතට, අප බලා සිටිය යුතුයි ඔවුන් අප වෙත එනතෙක්. ඔවුන්ට තම හමුදාව කොටස් කරන්නට සිදුවේවි. තීබසයේ ආරක්ෂාව බිඳකුදු අඩු නොවන සේ, ඔවුන්ගෙන් කොටසක් පමණයි කමුන් වෙත එවන්නේ. අප දැනගත යුතුයි ජයගත හැකි අන්දමේ හමුදාවක් අපේ හමුදාවන් තවත් ශක්තිමත් කිරීමෙන් ඇතිකර ගැනීමට. එවිටයි, එවිටම පමණයි අප තීබසය බලා යන්නේ. අපට එරෙහිව ඇතිවිය හැකි ශක්තිය සැලකිය යුතු තරම් දුර්වල කළ පසුවයි.''

නායකයා ගෙරවීය. කෙනෙක් උරහිස් ගස්සා හැරියේය. එහෙත් බොහෝ දෙනෙක් ඇය නිවැරදි බව පැවසූහ.

''උතුමාණනි, කිමද ඔබ කමුන්හි තාප්ප විනාශ කළේ?'' අකනොෂ් ඇසීය.

''සතුරා රැවටීමට. නගරය අත්හැර තිබෙන බවත්, ඔවුන්ට පහසුවෙන්ම ඊට ඇතුල් විය හැකි බවත්, ඔවුන් සිතාවි. ඇතුල්වන පියැන්කිගේ හටයින් උගුලක හසුවේවි.'' ජෙනරාල්වරයා මුළු ප්‍රදේශයේම පැහැදිලි සිතියමක් දිග හළේය. ''තීබසයේ ඉතිරිවන හමුදාව තැනිතලාවේදී අවහිර කර අල්ලා ගන්නවා. එසේම අප කඳු මත තැන තැන රහස් හමුදාවන් යොදවනවා, පසුබැස්මකට ඉඩ නොදී. පියැන්කි යුධ කලාව දන්නා අයෙක් නොවෙයි. ඔහු සිතන්නේ කෲර බලයකින් ඕනෑම සටනක් දිනිය හැකියි කියා. ඔහුට දෙවැනි පාඩම ඉගැන්වීමට කාලය පැමිණ තියෙනවා.''

''ජනතාව අපට එරෙහිව නැගී සිටීමේ අවදානමක් නැතිද?'' අකනොෂ් ඇසීය.

''කුමන හේතුවක් නිසාද එවැනි දේ විමසන්නේ?'' පුදුමයට පත් ටෙෆ්නැක් ඇසීය.

''අප ඔවුනට ඉතා සැහැසි ලෙස සලකන නිසා.''

''මෙය යුද්ධය අකනොෂ් කුමරුනි. ජනතාව තුළ ඕනෑම වෙලාවක කැරලිකාර හැඟීම් ඇතිවිය හැකියි. ඒවා නිසි අයුරින් පාලනය කළ යුතුයි. මගේ උපදේශකයින් දෙදෙනා එය නිසියාකාරව කරනවා, විශිෂ්ට ලෙස.''

යෙගෙබ්ගේ තොලග සිනහවක් මතුවිය. "අපට ස්තුති වෙන්න." ඔහු කීය. "සාමාන්‍ය ජනතාව පාලනය කෙරෙනවා. ඔවුන් ආරක්ෂා වෙනවා. බලන්න අපගේ ඉල්ලීම, 'ටෙෆ්නැක්ට කීකරුවන්න. ඔහු විශ්වාස කරන්න.' එපමණයි. ඔවුන් දන්නවා අප සියල්ල කරන්නේ ඔවුන්ගේම සුබ සිද්ධිය සඳහා බව. මුල්දී එය හඳුනගන්න බැරි වුණත් දැන් ඔවුන් ඒ බව දන්නවා."

ඒ දෙපිටකාට්ටුවා දෙස දැඩි බැල්මක් හෙළා අභියෝග කළද, තම හදවතේ නැගෙන එකම වදනක් හෝ පිට කිරීමට තරම් එඩිතර කමක් අකනොෂ් වෙත නොවිය.

"වෙනත් සැලසුම් කිසිවක්?" ටෙෆ්නැක් ඇසීය.

එහෙත් එහි රජකළේ නිහඬ බවයි.

"එසේ නම් අප අපගේ දරුණු පුහුණුවීම් අරඹනවා. යුධ හමුදාවේ විවිධ කණ්ඩායම් විවිධ ස්ථානවල පුහුණු වෙනවා. සටන් කරනවා, මා ඔබට එවන සැලසුමට අනුව. යුද්ධය ආරම්භ වන දවසේ මගෙන් සමාවක් නැහැ, ඔබේ පසුබැසීම් කිසිවකට. හොඳයි ආරම්භ කරන්න."

✱

යෙගෙබ් ගිණුම් සකස් කරන අතරේ නාට්‍රෙබ් පැපිරස් දඬුවක් හපමින් බලා සිටියේය.

"අප ධනවතුන් වීම ඇරඹෙනවා මිත්‍රයා." යෙගෙබ් කීය."ටෙෆ්නැක් අපට දුන් බලය නිසා අපට නීතිමය වශයෙනුත් සුලු වාසියක් ලැබෙනවා. නිවෙස්, භූමිය, ඇඳුම් පැළඳුම්, පාවහන්, පිඟන් කෝප්ප මේ සියලු දේ, අප ගම්මානවලට පහර දෙනවිට මගේ දෑතේ හිරවෙනවා. මෙය කදිම ආදරවන්ත යුද්ධයක්."

"එය පවතින තාක්කල්." නාට්‍රෙබ් කීය. "එමෙන්ම යුද්ධයේ වාසනාව අප අත තිබෙන තාක්කල්."

"මා හෙනෙත් නෙසට් හා කමුන්හි නිලධාරීන්ට හොඳින් ගෙවීම් කළා, ටෙෆ්නැක්ගේ අණට අන්ධයින් සේ කීකරු වන්නට. ඔහු ජයගන්නා තාක්කල්, ඔවුන් කිසිදු ප්‍රශ්නයක් නොඅසාවි. සොල්දාදුවකුගේ එකම බලාපොරොත්තුව පැහැදිලි අණදීමක් හා හොඳ ගෙවීමක්. ඔහුට එය ලැබේනම් ඔහු මොහොතක් හෝ ප්‍රමාද නොවී, මරා දමාවි."

"මට යම් වෙලාවකට හිතෙනවා අපගේ සියලුම මිත්‍ර පාක්ෂිකයින්ට මේ ජයග්‍රහණය අවශ්‍යද කියා?"

''ඔබ පවසන්නේ අකනොෂ් කුමරු ගැන නොවෙද?'' යෙගෙබ් ඇසීය.

''මට දැනෙනවා ඔහු මේ යුද්ධයේ අවසානය දකින්නට කැමති බව. අප නගර පාලනය කරන ආකාරය ගැන ඔහු බෙහෙවින් විරුද්ධ බව.''

''ඔබ නිවැරදියි නාට්‍රෙබ්. ඒ අකනොෂ් අපට බාධාවක් වේවි.''

"මා එයට නිසි පිළිතුර ලබාදෙන්නද?"

''නැහැ එසේ නොවෙයි. කෲර මරණයකදී සෙසු නායකයින් ටෙෆ්නැක් සැක කරාවි. ඒකාබද්ධ හමුදාවන් අතර ගැටුම් ඇතිවේවි. මා සිතන්නේ, ඔහුට උගුලක් ඇටවීමයි සුදුසු.''

නාට්‍රෙබ්, ඇකේෂියා කොළ යෙදූ ආලේපනයකින් තම පෘෂ්ටිමත් දෙපා පිරිමැද්දේය. ඒ තර ඇඟිලි ගිනිගත් කලෙක මෙන් වේදනා දෙන හෙයින් ඔහු ඇවිදීම පිළිකුල් කළේය.

''ඩේබ්‍රෙක් පමණට වඩා ඉදිමෙනවා.'' ඔහු චෝදනා කළේය. ''මේ ලෙසින් තව දුරටත් කරුණු සිදුවුවහොත් ටෙෆ්නැක්ට අප අමතක වේවි. ඔහු අප දෙවන පෙළට දමාවි. සමහර විට අප ඉවත් කිරීමට පවා කටයුතු කරාවි.''

''මට ගැහැනු පිළිකුල්.'' යෙගෙබ් අමනාපයෙන් කීය. ''නිදන කාමරය හා මුලුතැන්ගෙය හැර අන් සෑම තැනකදීම ඔවුන් වදයක්. ටෙෆ්නැක් රජ වූ විට අප ඔහුට බල කළ යුතුයි නීතියක් පනවන්නට, ගැහැනුන් හිස සිට දෙපතුල දක්වා වේලයකින් වසන්නටත්, වැඩ නවත්වා ගෙතුළ සිර කර තබන්නටත්.''

''කදිම අදහසක් යෙගෙබ්. කදිම අදහසක්. අප මේ අතරතුර පියවර ගත යුතුයි මේ බලයට ගිජු ගැහැනිය, රැජින බවට පත්වීම වළක්වන්නට. ටෙෆ්නැක් අපෙන් වෙන් කිරීමට තැත්කරන නීච ස්ත්‍රිය!''

''එය පහසු නොවේවි මිත්‍රයා. ඒත් අපට ජයගත හැකියි.''

# 25

ගැලපෙන කාලගුණය, වේගවත් දියපහර, හොඳම තත්ත්වයේ බෝට්ටු සහ විශිෂ්ට කප්පිත්තන් සමග ඒ ගමන ඉතා පහසු විය. ලැමසෙක්නි හා පෝර්මාගේ නායකත්වයෙන් යුතු යුධ හමුදාව දින විස්සක් තුළ පළමු නැවතුමට ළඟාවිය. තීබසය, බලවත් ස්ථානය නම් වූ ආමන්ගේ නගරයයි ඒ.

නායකයින් දෙදෙනා එකිනෙකා සමග කතා කිරීම ප්‍රතික්ෂේප කළ හෙයින් ගමන් කළේ බෝට්ටු දෙකකය. එහෙත් පාරාවෝගේ විධානය වූයේ, එකට එක්ව් අණ දෙමින්, ටෙෆ්නැක්ගේ කලහකාරී බවට තිත තබන සැලසුමක් හදන ලෙසයි.

අලුත් සැලසුම් අනවශ්‍යය යන්න ලැමසෙක්නිගේ අදහස වුවද, පෝර්මා රජුට පොරොන්දු වී තිබුණේ පුද්ගලිකව කිසිදු තීරණයක් නොගන්නා බවත්, ලැමසෙක්නි හා එක්ව සියල්ල සැලසුම් කරන බවත්ය.

ඉදිරියේදී දරුණු සටන්වලට මුහුණ දෙන්නට සිදු නොවන්නට, ලැමසෙක්නි ඉතා සතුටින්, තම ඇකේෂියා ලී අතින් පෝර්මාට සිහිනැතිවන තුරු පහර දෙන්නට ඉඩ තිබිණි. එහෙත් ඔහු දැඩි ස්වයං පාලනයක යෙදුණි. නපාටා හා තීබසය අතර ගමන ඔහුට සන්සුන්ව ගත කරන්නට හැකිවූයේ නීතිරීතිවලට පටහැනිව, හොරෙන්ම බෝට්ටුවට නංවාගත් නුබියානු තරුණියන් දෙදෙනාගේ ආලිංගනයට මැදිවී සිටීමෙනි. දකුණේ මහා නගරයේ මත්පැන් හලක නර්තනයේ යෙදෙන්නට ඉඩ සලසා දෙන බවට පොරොන්දු වූ ඒ වීරයාට අවශ්‍ය පරිදි හැසිරෙන රුවැත්තියන් දෙදෙනාද සිටියේ බලවත් සතුටිනි.

ඔවුන් නගරයට ළඟා වෙත්ම, යුධ හමුදා බෝට්ටු, ගඟ හරස් කළේය. නුබියානු යාත්‍රාවල ගමන නැවතුණි. ටෙෆ්නැක් තීබසය යටත් කරගෙන ඇති බවත්, ඔහු වහාම යුද්ධයට අවතීර්ණ වනු ඇති බවත්, ලැමසෙක්නි සිතීය. එහෙත් මුල්ම නෞකාවේ තට්ටුව මත සිටි නුබියානු නිලධාරියා දුටු ඔහු සන්සුන් විය.

තමා හා නෝක්කඩුවට කතා කරන අනෙක් අණදෙන නිලධාරියා සමග එක් වන්නට ලැබුණු පළමු අවස්ථාවෙන්ම වාසි ලබන්නට සිතූ පෝර්මා, බෝට්ටුවෙන් බෝට්ටුවට පැන ලැමසෙක්නිට ළංවිය.

''අමුතු පිළිගැනීමක්. කුමක්ද ඔබේ අදහස?'' ඔහු ලැමසෙක්නිගෙන් ඇසීය.

''ඔබේ දුනුවායන් සූදානම්ද?''

''අප සිටින්නේ තීබසයේ. දැන්.....''

''මෝඩයා. ඔවුන්ට සූදානම් වන්නට අණදෙනු. අප සිටින්නේ යුද්ධයක. ඕනෑම මොහොතක ඕනෑම දෙයක් සිදුවිය හැකිබව මතක තබාගනු.''

පෝර්මා ඉන් කෝප වුවද තම භටයින්ට අණ දුන්නේය. නුබියානු නිලධාරියා මේ අමුත්තන් දෙස විමසිල්ලෙන් බැලීය.

''කවුද ඔබ?''

''පාබල හමුදා අණදෙන නිලධාරි ලැමසෙක්නි. මේ මගේ හිතවතා පෝර්මා. දුනුවායන්ගේ අණදෙන නිලධාරි.''

''මට ලැබී ඇති අණ ඔබ කාර්නැක් වෙත ගෙනයාමටයි.''

''ඒ කුමන උමතුවක්ද?'' ලැමසෙක්නි විරෝධය පෑවේය. ''අප සොල්දාදුවන් මිස පූජකයන් නොවෙයි. අපට අවශ්‍යයි මෙහි සිටින හමුදාවන්හි අණදෙන නිලධාරි හමුවීමට, වහාම.''

''මෙහි පාලනය ගෙනයන්නේ ආමන්ගේ බිරිඳ. ඇය මට දුන් අණ මා ක්‍රියාත්මක කරනවා.''

ලැමසෙක්නි තම අසිපතට අත තැබූ නමුත් පෝර්මා එය වළක්වමින් ඒ අත මිරිකාගති. ''හොඳයි, අපි එකඟයි.'' ඔහු පැවසීය.

අණදෙන නිලධාරීන් දෙදෙනා නාවිකයින් සිය දෙනෙක් සිටින විශාල යුධ නෞකාවකට නැංවිණ.

''නැවත එවන්නක් නොකරනු.'' ලැමසෙක්නි පෝර්මාට තර්ජනය කළේය. ''මා නුඹේ අත කඩා දමනවා.'

''ඒ නුඹේම හොඳටයි මෝඩයා. නුඹ සටන් වදින්නේ අපගේ සතුරන් සමග මිස මිතුරන් සමග නොවෙයි.''

කාර්නැක්හි ආශ්චර්යය දුටු ඔවුන්ගේ අඬ දබර යටපත් විය. දෙවියන්ගේ රජවරුන් වූ ආමන් රා වැඩ හිඳින ඒ අතිවිශාල ශුද්ධ වූ

භූමියේ උස් තාප්පයට උඩින්, දෙවොලේ රන් ආලේපිත අති විශාල මුදුනත පෙනෙන්නට තිබිණි.

නපාටාහි දෙවොල සත්‍ය වශයෙන්ම ආනුභාවසම්පන්නය. එහෙත් මේ මහා දෙවොල අසල ඒ සියල්ලට ලැබෙන්නේ දෙවැනි තැනයි. ශතවර්ෂ ගණනාවක සිට පාරාවෝවරුන් එය විශාල කරමින් අලංකාර කර තිබිණි. ඊට ලැබ් තිබුණේ 'සියලු දෙවොල් එක්තැන් කළ ස්ථානය' යන නාමයයි.

''දෙවියනි, කොතරම් විශාල බලකොටුවක් වේවිද මෙය?'' ලැමසෙක්නි හඬ නැගීය.

පෝර්මාගේ දෑස ප්‍රධාන දොරටුවෙහි වූ නිවුන් කුලුනු වෙත රැඳී තිබිණි. බටහිර හා නැගෙනහිර කඳු මෙන්ම අයිසිස් හා නෙප්තයිස් දෙවඟනන් සංකේතවත් කළ ඒ කුලුනු අතරින් දිනපතාම හිරු නැවත උපදී.

''කාර්නැක් ගොඩ නගන ලද්දේ දෙවියන් විසින්මයි.'' ඔහු මිමිණීය. ''මිනිසුන් විසින් නම් නොවෙයි.''

පාරාවෝගේ දූතයින් කැඳවාගෙන ගිය හිස මුඩු කළ පූජකයෙක් දොරටුවකින් ඇතුල්විය. එහිදී සෘජුව ඔවුන් දෙස බැලූ පූජකයෙක් ඔවුන්ගේ නම් විමසා මෙසේ ඇසීය. ''පසුගිය දින තුන තුළ ඔබ ගැහැනුන් සමග ගත කළාද?''

''කිසිසේත්ම නැහැ.'' ලැමසෙක්නි බොරු කීවේය. ''අප පැමිණියේ නපාටාවේ සිට බෝට්ටුවෙන්. එහි සිටියේ සොල්දාදුවන් පමණයි.''

''එසේනම් ඔබට මේ දොරටුව විවෘතයි.''

''අප එවන ලද්දේ පාරාවෝ විසින්. ලිබියානුවන් හා සටනට. අපට නාස්ති කිරීමට කාලයක් නැහැ.''

''මා හා එන්න.''

ලැමසෙක්නි කුපිතව සුසුමක් හෙළීය. ඔවුන් සිටින්නේ කාර්නැක්හිය. දැන් ඉතින් ඔවුනට වැඩ කරන්නට සිදුවන්නේ පූජකවරුන්ගේ තාලයටයි. තව තවත් කෝපයට පත්වන ලැමසෙක්නි සහ පෝර්මා කැඳවාගත් පූජකයා, ඉතා සෙමෙන් ඒ දෙදෙනා ශුද්ධ වූ වැව දෙසට කැඳවාගෙන ගියේය. එහි වූ වර්ණවත් කුඩා දෙවොල් දුටු පෝර්මා ඉන් වශී විය. ඒ අතර ලැමසෙක්නි නම් වශී වී සිටියේ, තම කෝමල පෙම්වතියන් සිහි කරන සුවඳ විලවුන්වලටයි. වැවේ විශාලත්වය දුටු දූතයින් දෙදෙනා

ගල් ගැසී සිටියහ. නිල් දියට ඉහළින් සිය ගණනක් ගේ කුරුල්ලෝ ඉගිල ගියහ.

''ඇඳුම් උනා තබන්න.'' පූජකයා අණ කළේය.

''ඔබ අපට පිහිනන්න ඉඩ දෙනවාද?'' ලැමසෙක්නි ඇසීය.

''පිරිසිදු වීම සඳහා.''

''අපට පූජකයින් වීමට අවශ්‍ය නැහැ.''

''මොහොතකට හෝ දෙවොලට ඇතුල් වන අය පිරිසිදු විය යුතු බවයි නියමය. ඇඳුම් උනා, පඩිපෙළ දිගේ සෙමින් වැවට බසින්න. තප්පර කීපයක් දියේ නිසලව සිටිමින් ඔබේ සිතිවිලි එක්තැන් කරගන්න. ඔබේ ආත්මය ආලෝකය දෙසට යොමු කරන්න.''

''මා මගේ අසිපත ළඟ තබාගන්නවා.'' ලැමසෙක්නි කීය.

''එය සිදුවිය නොහැකියි. සියලුම ආයුධ දෙවොලේ දොරටුව අසල්දී ඉවත් කළ යුතුයි.''

''එන්න.'' පෝර්මා අණ කළේය.

ලැමසෙක්නි තම කමිසය ඉවත් කරන විට පූජකයාට තම විස්මය සැඟවිය හැකිවූයේ නොවේ.

''විහිළු අතක්? එසේ නොවේද?'' ලැමසෙක්නි කීවේය. ''නපාටාවෙන් පිටත්වෙන්න පෙර මට තිබුණේ ලෝහ යෙදූ ලී අතක්. ප්‍රධාන අශ්ව රථ තනන්නා එය පුරාම මැලියම් ආලේප කළා.''

ඇඳුම් ඉවත් කළ ඔවුහු ශුද්ධ වූ වැව් දියෙන් පිරිසිදු වූහ. ඉන්පසු ඔවුනට, ඉතා පිරිසිදු සුදු කෙටි සායෙන් සැරසී, රැවුල හා හිස මුඩුකොට සුවඳ ද්‍රව්‍ය තවරා ගන්නට සිදුවිය.

''දෙවියන් ඉදිරියේ'' පූජකයා කියන්නට විය. ''ඔබට බලය ඇතැයි පුරසාරම් නොදොඩන්න. දෙවියන් නොමැතිව අපගේ ශක්තිය හීන වී දුර්වලවෙයි. අප්‍රාණික වෙයි. දුර්වලයකු ශක්තිමත් කරන්නේ දෙවියන් විසින්. ඔහුයි ශක්තිය දෙන්නේ. තනි මිනිසෙකුට, දහසක් පරාජය කරන්නට.''

දැන් ඔවුහු ශුද්ධ වූ පූජකයින් වී පූජකත්වයේ පහළම තත්ත්වය ලබා සිටියහ. ඒ දෙදෙනාට අල්තාර මත තබන ලද ආහාර මත, ශුද්ධ වූ දිය බිඳක් ඉසින්නට ආරාධනා ලැබිණි. එසේම, ආමන් අමතා චාරිත්‍රාණුකූල වාක්‍යයක් පැවසීමටද ඔවුනට සිදුවිය. ''අපට මඟ පෙන්වනු මැනවි. ඔබේ ශක්තියේ යට හිඳ සටන් කරන්නට අපට ඉඩදෙනු මැනවි.''

''දැන් ඔබ කුලුනු ශාලාවට පිය නගන්න.'' පූජකයා කීය.

පළමුවන සේටි හා දෙවන රැම්සීස් විසින් තනවන ලද ඒ අසමසම ශාලාව දුටු ඔවුන්ගේ හුස්ම නැවතුණි. පැපිරස් නටුවල හැඩය ගත් අති විශාල ගල්කණු මත වර්ණවත් දසුන් චිත්‍රණය කර තිබිණි. ඒවායෙහි සඳහන්ව තිබුණේ දෙවියන්ට පූජෝපහාර පවත්වන පාරාවෝය. සිවිලිම තනන ලද්දා වූ අති විශාල ගල්කණු අතර වූ සිහින් සිදුරු තුළින් ආලෝකය ගලා ආයේය.

ඒ එක් ආලෝක කදම්බයක් තුළින් ලැමසෙක්නිට පෙනුණේ අවතාරයක්ද? උරහිස් පටි යොදන ලද සුදු දිග ගවුමකින් සැරසුන ගැහැනියක්. ඇගේ පියයුරු ලා කහ පැහැති සළුවකින් වැසී තිබිණි.

''දෙවඟනක්'' ඔහු කීය. ''ඒ නම් දෙවඟනක්.''

# 26

''ඔබද අණදෙන නිලධාරි ලැමසෙක්නි සහ පෝර්මා?'' අවතාරය කතා කළාය.

''ලැමසෙක්නි මමයි. මා කවදත් දෙවියන්ට ගරු කරනවා. විශේෂයෙන්ම දෙවඟනන්ට. එහෙත් පෝර්මා මිත්‍යා දෘෂ්ටිකයෙක්. ඔහු සුදුසු නොවෙයි ඔබට සවන් දෙන්නට.''

අවතාරය සිනාසුණාය. ඇගේ රූපශ්‍රීය ලැමසෙක්නි ගේ සිතේ ඇතිකළේ බියකි.

''ඔබද ආමන්ගේ දිව්‍යමය බිරිඳ?'' පෝර්මා ඇසීය.

''නැහැ. ඇගේ සහායිකාව. බරපතල ලෙස රෝගාතුරව පසුවන උත්තමාවිය ඇගේ සයනාගාරයෙන් පිටතට පැමිණෙන්නේ නැහැ. ඒ නිසා ඇය මට පැවරුවා ඔබගෙන් ප්‍රශ්න කිරීම.''

''ප්‍රශ්න කිරීම? කුමක් ගැනද?''

''කරුණාකර මා හා එන්න.''

රූමත් පූජකවරිය රාජ දූතයින් දෙදෙනා සමග ආමන් බිරිඳගේ වාසස්ථානයට ගියාය. එහි කුඩා දොවොලක්, පුද්ගලික කාමර හා ලේකම්වරුන්ගේ කාර්යාලද විය.

ඇගේ රුවට වශී වූ ලැමසෙක්නිගේ දෑස ඇගෙන් ඉවතට ගියේ නොවේ.

''ඔබේ නම කුමක්ද?''

''මාජොරම්.''

''ඔබ විවාහකද?''

''ආමන්ගේ බිරිඳ හෝ ඇයට සේවය කරන පූජකවරියන් විවාහ

"ඔබට පැවසීමට කණගාටුදායක පුවතක් තිබෙනවා. තීබසයේ යුධ හමුදාවේ අණදෙන නිලධාරි දින හතරකට පෙර මියගියා."

"කණගාටුයි.කවුද ඒ වෙනුවට පත්වුණේ?"

"ආමත් බිරිඳත් ඒ ගැන දැනගත යුතුයි. මන්ද, ඇය තීබසයේ ආරක්ෂාව ගැන දැඩි ලෙස කල්පනා කරන නිසා. ඔබේ පැමිණීම දැනගත් මොහොතේ පටන් මුළු නගරයම බලා සිටින්නේ, ඔබ දෙදෙනාගෙන් හමුදාවට අණ දෙන්නේ කවුද කියා."

නිලධාරීන් දෙදෙනා ගොළු වී මුහුණෙන් මුහුණ බලාගත්හ.

"අප දෙදෙනාම එකම තත්ත්වයේ " පෝර්මා කීය.

"පාබල හමුදාවයි වඩාත්ම පැරණි. වඩාත්ම චාරිත්‍රාණුකූල හමුදා සේවය. ඒ නිසා..." ලැමසෙක්නි කීවේය.

"දුනුවායන් කණ්ඩායමේ සිටින්නේ පරෙස්සමින්, පුද්ගලිකවම තෝරාගත් අය. ඒ නිසා..." පෝර්මාගේ අදහස විය.

මේ දෙදෙනාගේ දබරයෙන් කෝප වූ මාජොරම් කතා කළාය. "මට අවශ්‍යයි දැන ගන්නට පාරාවෝගේ විධානය ගැන."

"අප දෙදෙනා එක්ව වැඩකළ යුතුයි.තීබන් අණදෙන නිලධාරියාගේ විධානයට යටත්ව." පෝර්මා කීය.

✸

පැයක් වාදයෙහි යෙදුන ලැමසෙක්නි හා පෝර්මා වටිනා තර්ක වලින් එකිනෙකාගේ මුහුණට දමා ගැසූහ.

"කිමද අපට පියැන්කිගේ අණ ඒ අයුරින්ම ක්‍රියාවට නගන්නට නොහැකි?" පෝර්මා ඇසීය. "ඔහුගේ අණට අනුව අප දෙදෙනාම අණ දිය යුතුයි. අපි එසේ කරමු."

"නොහැකියි."

"අපට කළ හැකි අන් කිසිවක් නෑ."

දිගින් දිගටම කතාකළ ලැමසෙක්නි ඉන් වෙහෙසට පත්ව සිටියේය. "හොඳයි. එහෙත් අප ඔවුනට කතා කළ යුත්තේ එකට. එක සමානව, නුඹ දුනුවායකු කියා, මට ඉහළින් බලය පැතිරවීමට උත්සාහ නොකළ යුතුයි."

"අපි අණදෙන නිලධාරියෙකු නැතිවීම නොදැනෙන සේ අපගේ මෙහෙයුම අවසන් කරමු. එවිට පාරාවෝ අපට ස්තුති කරාවි. අප එසේ නොකළහොත් ඔහු කුපිත වේවි."

''අන්තිමේදී ඔබ නිවැරදි තීරණයකට පැමිණියා පෝර්මා. අප දෙදෙනා එක්ව ජය ගන්නට උත්සාහ කරමු. එහෙත් උපාය මාර්ග ගැනීම මට පවරන්න. ඔබ ඊට සම්බන්ධ නැහැ.''

✸

තීබසයේ සොල්දාදුවන්ට කිසිවක් වටහා දීම අපහසු විය. පළමු කොටම තම ජ්‍යෙෂ්ඨ නිලධාරියාගේ මරණය වෙනුවෙන් ශෝක වූ ඔවුහු වැලපීමේ කාලය සඳහා තව දින කීපයක් අවශ්‍ය බවට ඉල්ලීමක් කළහ. දෙවනුව, කීර්තිමත් නාමයෙන් පමණක් ප්‍රසිද්ධව සිටි ලැමසෙක්නි හා පෝර්මා ගැන ඔවුන් විශ්වාසය තැබීමට කැමති නොවූ සෙයකි. අවසාන වශයෙන් පසුගිය කාලය සැපපහසු, සාමකාමී දිවියකට හුරු වී සිටි ඔවුන් තුළ යුද්ධයකට කිසිදු කැමැත්තක් නොවීය. ඔවුන් පවසන ආකාරයට හොඳම විසඳුම නපාටාවෙන් අණක් ලැබෙන තෙක් බලා සිටීමයි. භට කණ්ඩායම් වෙනුවෙන් අදහස් ප්‍රකාශ කිරීමට ඉදිරිපත් වූ තරුණ, කනිෂ්ඨ නිලධාරියා ආහාර වල තත්ත්වය, නිල ඇඳුම් පමණක් නොව දින කීපයක නිවාඩු ඉල්ලා අයදුම්පතක්ද ඉදිරිපත් කළේය.

ලැමසෙක්නි, මේ කතාකාරයාගේ හිස් කබල තම ලී අතින් පුපුරුවා හරිනැයි පෝර්මා බියවිය.

එහෙත් ලැමසෙක්නි ඊට කිසිදු ප්‍රතිචාරයක් නොදැක්විය.

✸

ටෙෆ්නැක්, ඩේබ්‍රෙක්ගේ පියයුරු පිරිමැද්දේය. ''ඔබ මායාවක් ප්‍රේමිය. කෙසේද ඔබ මෙසේ මා වශී කළේ?''

''ඔබයි මායාව. ඔබ ඉන්ද්‍රජාලයක් කළා මගේ බලාපොරොත්තුවම ඔබේ හදවතේ උපදවා ගනිමින්. මේ රට නැවත ජයගෙන, පෙර මෙන් බලවත් රාජ්‍යයක් බවට පත් කිරීමේ කාර්යයට වඩා වැදගත් දෙයක් තවත් තිබිය හැකිද?''

ටෙෆ්නැක් ඒ තරුණියගේ සිරුරට ආලයෙන් බැඳී සිටියේය. ප්‍රේම සම්බන්ධතා ඇති කර ගැනීම පිළිබඳව ප්‍රසිද්ධියක් උසුලන, නිවට නියාලු ලෙස හැඟීම් වලට වහල් වන ඔහු කිසිදා ඉන් වෙහෙසට පත් වූයේ නොවේ. ඩේබ්‍රෙක් ඔහුගේ සුරතලයට ඉඩ දුන්නාය. ඊට පිළිතුරු දුන්නාය. එහෙත් ඇය කිසිවිටෙකත් ඔහුගේ භාරදූර විශිෂ්ට මෙහෙයුම ගැන කතාකිරීම නැවැත්වූවා නොවේ. ඇත්තටම ඇය දැඩි කැමැත්තකින් එය ඇගේම වගකීමක් ලෙස තමාටද පවරාගෙන තිබිණි.

"ඔබට දරුවන් සිටිනවාද?" ඇය ඇසුවාය.

"සායිස්හි ගැහැනුන් කිප දෙනෙක්ම මා අත්හැර දැමුවා. මා ඔවුන් කිසිවෙකුට ආලය නොකළත් ඔවුන් මට දරුවන් ලබා දුන්නා. ඔවුන් උතුරේ නැවතුණා. එහෙත් සටනට සුදුසු වයසේ සිටින පුතුන් දෙදෙනෙක් මගේ යුධ හමුදාවේ නිලධාරීන් ලෙස සේවය කරනවා. එහෙත් ඔවුන් දෙදෙනාටම නැහැ හැකියාවක් මගෙන් පසුව රාජ්‍යය ගෙන යන්නට. මගෙන් පසු සිහසුන හිමිවන්නේ අපගේ පුත්‍රයාටයි."

ඩේබ්‍රේක් ඔහුගේ මුහුණ දෑතින් ගත්තාය. "මා ඔබට ආදරෙයි ටෙෆ්නැක්. මා ඔබට ආදරය කරන්නේ ඔබේ හදවතේ පිරී ගිය විශිෂ්ට දැක්ම නිසායි. එහෙත්, අහන්න, ඔබ ගොඩබිම් දෙකේ රජු, පාරාවෝ, වෙනතෙක් මට දරුවකු අවශ්‍ය නැහැ."

ඇගේ චිත්ත ස්වභාවය ඔහුගේ හදවත සසල කළාය. ඇය ඔහු දැන සිටි අන් කිසිදු ගැහැනියක මෙන් නොවූ අතර දැන් දැන් ඇය ඔහු බියට පත්කරවන තරම්ය.

"ඔබේ කැමැත්තක්" ඔහු කීය.

ඔහුගේ පිළිතුරට තිළිණ ලෙස හාදු වැස්සකින් ඔහු තෙමූ ඇය, තම ගොදුර ගිල දමන, ඒ දෙසට නැඹුරුව සිටින අති භයංකර සිංහ ධේනුවක මෙන් ඔහු දෙස බලා සිටියාය. මේ හුරතලයේ කෙළවර කොතැනද? ඔහු ඇය උඩුකුරුව හැරවිය.

කිසිවෙක් සයනාගාරයේ දොරට තඩි බාන්නට විය.

"කවුද තොප? නොබියව මට කරදර කරන්නේ?" ටෙෆ්නැක් ගොරවන්නට විය.

"යෙගෙබ්, උතුමාණනි. වැදගත් තොරතුරක්. ඉතා වැදගත්."

"පසුව පවසනු."

"නොහැකියි උතුමාණනි."

ජෙනරල් දොර විවෘත කළේය.

යෙගෙබ් නැමී ආචාර කළේය. "අපගේ ඔත්තුකාර දැල මේ දැන් දන්වා තිබෙනවා තීබසයේ යුධ හමුදාවන්හි ප්‍රධානියා මියගිය බව. පියැන්කිගේ හමුදාව එහි පැමිණ තිබෙනවා. එහෙත් ඔවුන් තුළ යම්කිසි පටලැවිල්ලක් උතුමාණනි. නිලධාරීන් ඔවුනොවුන්ගේ ගෙල මිරිකාගෙන. කිසිවෙකුට හැකියාවක් නැහැ පැහැදිලි අණක් දෙන්නට, නපාටාවෙන් අලුත උපදෙසක් ලැබෙන තෙක්. එය කදිම අවස්ථාවක් නොවෙද?"

ටෙෆ්නැක්ගේ ඇස් දිළිසුණි. ''පටන් ගන්න නයිල් ගඟෙන්. ඒ භූමියේ ආරක්ෂක බල හමුදාවන් විනාශ කරමු. ඔව්, කාලය පැමිණ තිබෙනවා.''

''එහෙත් අපගේ සැලසුම වෙනත් එකක්.'' ඩේබ්‍රේක් සිහි කළාය. යෙගෙබ්ගේ පැමිණීම හෝ ඔහුගේ රාගී ඇස් තම සිරුර මත දුවමින් ආශාවෙන් හා පිළිකුලෙන් දිලිසෙන අන්දම ඈ කිසිදු ගණනකට නොගත්තාය.

''පුරුදු විය යුතුයි අප, ඇතිවන තත්ත්වයට මුහුණ දීමට.'' ටෙෆ්නැක් කීය. ''අපට මෙතනදී හොඳම වාසියක් ලැබී තිබෙනවා. පළමු ප්‍රහාරක රැළ එක නායකයෙකුගේ විධානයට යටත්ව වහාම ඉදිරියට යනු ඇති.''

# 27

ප්‍රධාන ආරක්ෂක නිලධාරියාගේ මරණයත් සමගම ආරක්ෂක හමුදාවන් හිරු පායා ආවාට පසුවද තද නින්දේය.

එහෙත් එක් සොල්දාදුවෙකුට නින්ද නොයාමේ රෝගයක් විය. තම හොඳම මිත්‍රයා කාන්තාර සොරුන් සමග සටනට ගොස් රුධිරයෙන් නැහැවී මැරී සිටිනු දුටු මොහොතේ පටන් ඔහුට නින්ද යාමක් නොවීය. 'රිසින්' නම් වූ මේ භටයාට තම සගයින්ගේ මේ දිගු නින්ද වදයකි. ඔහුට ව්‍යායාම කිරීම සැපතකි. ශාරීරිකව වෙහෙසට පත්වන විට මානසික ආතතිය පහව යයි. ඒ බියකරු මතකයන් සැඟව යයි. ඔහු ව්‍යායාමයෙන් පසු වැතිර බැරැක්කයේ ලී සිවිලිම දෙස බලා සිටියේය.

එක්වරම සිවිලිමේ කොටසක් කඩා වැටුණි. පාම්ගස් කඳන් දෙකකටද ඒ ඉරණමම අත් කරමින් සොල්දාදුවන් අවදි කරවන කලබලයක් ඇතිවිය.

''සවන් දෙනු!'' ලැමසෙක්නි කෑ ගැසීය. ඔහු පෝර්මා සහ තවත් සොල්දාදුවන් විසි දෙනෙකු සමග වහලය මත සිටගෙන උන්නේය. ''මේ තප්පරයේ තොප අවදි විය යුතුයි. වහාම ආයුධ අතට. වහාම පුහුණුවන ස්ථානයට. අකීකරු වන්නන්ට මරණය!''

සෑම බැරැක්කයකටම මේ පණිවිඩය ලැබිණි. දහවල් වනවිට මුළු ආරක්ෂක හමුදාවම යුද්ධයට සූදානම්ය.

''බලන්න'' ලැමසෙක්නි පෝර්මාට කීවේය. ''ඔබ දත යුතුයි ඔවුනට ආමන්ත්‍රණය කරන ආකාරය. ඒ කුඩාවුන් අවදි කළ යුතුයි. එපමණයි. දැන් ඔවුන් ඔබේ අතේ. ඔවුන් මෙහෙයවන්න මා උතුර බලා යනවා, හොඳින් සන්නද්ධ නැව් පන්තියක් සමග.''

''එය අවදානමක්.''

''එහෙත්, ඒ ටෙෆ්නැක්ගේ ආරක්ෂක හමුදාව විසින් අටවන ලද සියලු උගුල් මතුකර ගැනීමට ඇති එකම මග එයයි.''

✸

පෝර්මා දැඩි සේ ශෝක විය. ලැමසෙක්නිගේ යෝජනාවට ඉඩ දීම ගැන ඔහු තමාටම ශාප කර ගත්තේය. නාවියකයන් සිය ගණනකට තනිව අණ දෙමින් ඔහු ගිය මේ ගමන නැවැත්විය යුතුව තිබිණි. අහෝ! නාවික හමුදාවට අණදෙන පාබල හමුදා අණදෙන නිලධාරියෙක්. එය නිසැකවම විනාශයකින් කෙළවර වනු ඇත.

එහෙත්, ඔවුන් යමක් කළ යුතුව තිබිණි. පියැන්කි ඒ දෙදෙනාටම අණ කළේ යුද්ධයට හොඳින් සූදානම් වන ලෙස, ටෙෆ්නැක් හා සටන් වදින ලෙස හා ඔහු අල්ලාගන්නා ලෙසය. ඔවුනට එය කළ හැක්කේ ඔහුගේ බෝට්ටු විනාශ කරන අතරම තීබසය හෙවත් ආමන්ගේ ශුද්ධ වූ නගරයේ ආරක්ෂාව තහවුරු කිරීමෙනි.

පෝර්මාගේ ආරක්ෂාව යටතේ ශුද්ධ වූ නගරයට කිසිදු අනතුරක් නැත. ඉතිරිය ලැමසෙක්නිගේ වාසනාව මත රඳා පවතිනු ඇත.

පණිවිඩ හුවමාරුව භාර නිලධාරියා පෝර්මා ඉදිරිපිට පෙනී සිටියේය. ''මා බලා සිටිනවා නිලධාරිතුමනි, ඔබේ අණ ලැබෙන තෙක්.''

''පණිවිඩකරු නපාටා බලා ගියාද?''

''එසේයි. අද උදෑසනම දුනුවායන් කණ්ඩායමක් සමග. ඔහු ආරක්ෂිතව තම ගමනාන්තයට යන බව සහතිකයි.''

පෝර්මා වදනකුදු අඩු නැතිව දීර්ඝ වාර්තාවක් පිළියෙල කර පියැන්කි වෙත යවා තිබිණි. ඊට අනුව පියැන්කි අවශ්‍ය තීරණ ගෙන, හැකි ඉක්මනින් කළ යුතු දේ දන්වනු ඇත.

''තවත් පණිවුඩකරුවෙක් සූදානම් කර තබන්න. අද පටන් තීබසය හා නපාටා අතර නොනවත්වාම පණිවුඩ හුවමාරු වේවි.''

''හොඳයි නිලධාරිතුමනි.''

ආමන්ගේ බිරිඳ මරණාසන්නය. තීබසය පාලනය හුදෙකලා පෝර්මා අතේය. මේ බලාපොරොත්තු නොවූ වගකීම ඔහු බිය ගැන්වීය. එහෙත් අවසන් ලේ බිඳුව දක්වා සටන් කොට ඔහු නගරය ආරක්ෂා කරනු ඇත.

✸

''තව වේගයෙන්.'' ලිබියානු නායකයා පතල් කරුවන්ට කෑගැසීය. ''නිදිමත පහකරනු. නීච කම්මැලියනි, තව මොහොතකින් අප තීබසයේ. එහිදී තොපට හැකියි හමුවන්න ලස්සනම ඊජිප්තු කෙල්ලන්. බඩ පුපුරන තෙක් බීමට වයින්.''

මේ කිසිදු වදනක් ඔවුන් තුළ කලබලයක් ඇතිකළේ නොවේ. හෙනෙත් තෙසව් හා කමුන් වෙතින් අල්ලාගන්ට යෙදුන අසරණ වැසියන් බලෙන් හමුදාවට බඳවාගන්නා ලද ඔවුනට පියැන්කිගේ හමුදාව ඉදිරියට ගොස් ඔවුන් සිහිනෙනුදු නොසිතූ සටනකට මැදිවී මිය යන්නට අවශ්‍ය නැත.

මෙසේ ටෙෆ්නැක්ගේ යුධ නෞකා පන්තිය බලාපොරොත්තු වූවාට වඩා බොහෝ සෙමින් ඉදිරියට ඇදුණි. ඊජිප්තු හබල්කරුවන් මරා දැමීමද ඊට පිළිතුරක් නොවීය. කිසිදු ලිබියානු භටයකු ඒ තැනට එන්නට ඉදිරිපත් වනු නැත.

උතුරු සුළඟ හමන විට ඔවුනට රුවල් නංවා වඩාත් වේගයෙන් ඉදිරියට යන්නට හැකිවනු ඇත. ඊජිප්තු භූමියේ ගතකළ දිවියෙන් පෘෂ්ටිමත්ව සිටි, හිටපු කාන්තාර සොරකු වූ හමුදා නායකයාගේ ලේ රස බැලීමේ ආශාව දළුලා වැඩෙන්නට විය. ආමන් දෙවොලට ගිනි තබා, ආමන්ගේ බිරිඳ ඇතුලු සෙසු පූජකවරියන් දූෂණය කර එම ශුද්ධ වූ නගරයේ සියලු සම්පත් කොල්ලකන ආකාරය ගැන ඔහු සිහින දකින්නට විය.

ටෙෆ්නැක් හොඳ ජෙනරල්වරයෙකි. මේ හදිසි ප්‍රහාරය මගින් සතුරාගේ ආරක්ෂක බලමුළු බිඳ දැමිය හැකිය. ජය සහතිකය. සති කීපයක් තුළ ඔහු ඒ යුද්ධය ජය ගනු ඇත.

✸

ලැමසෙක්නි නව තනතුරේ සිටියේ දැඩි සතුටකිනි. සුවපහසු කාමරයක නැවතී, හොඳම තත්ත්වයේ ඇඳක වැතිරී, මිදි පොකුරු කමින්, සිසිල් වයින් තොලගාන ඔහුගේ දෑසින් පවා සතුට උතුරා ගියේය.

යුද්ධය යනු මිනිසකුට හොඳම දේ දියහැකි අවස්ථාවකි. අසරණ පෝර්මා හැඟීම් විරහිතව දුක්වන අතරේ, තීබසයේ ආරක්ෂාව ගැන වදවෙන මොහොතේ, ලී අතක් හිමි රණවිරුවා නයිල් නදියේ යාත්‍රා කරමින් සිටියේය.

කමුන වෙත ළං වූ පසු ටෙෆ්නැක් ගැන සිතිය යුතුය. ඒ බියගුළු ලිබියානුවා කිසිවිටක මධ්‍යම ඊජිප්තුව පසුකර එනු නැත.

ලැමසෙක්නිගේ සහායකයා වූ 'රිසින්' කාමරයට පැමිණියේය. "නායකතුමනි, ඉදිරියෙන් බෝට්ටු පෙළක්."

"වෙළඳ නෞකා?"

"නැහැ. යුධ නෞකා. ඍජුවම අප දෙසට එනවා."

"ඔබට වැරදීමක් රිසින්."

"ඔත්තුකරුවා පවසන්නේ එතැන අඩු තරමින් බෝට්ටු විස්සක් තිබෙන බවයි."

අකැමැත්තෙන් කාමරයෙන් පිටවූ ලැමසෙක්නි නැවේ ඉදිරියට ගමන් කළේය. රිසින්ට වැරදී නැත. ඒවා බඩු නැව් හෝ මගී බෝට්ටු නොවේ. ලිබියානු නෞකා; තීබසය බලා යන ලිබියානු නෞකා.

"හ්ම්ම්." ඔහු කීය. "ටෙෆ්නැක් භයානකයි මා හිතුවාට වඩා."

"අප පහර දෙනවාද පසු බසිනවාද නිලධාරිතුමනි?"

ලැමසෙක්නි රිසින් දෙස සැලකිල්ලෙන් බැලීය. "ඔබ සොල්දාදුවෙකු වී කොපමණ කල්ද?"

"වසර කීපයක්. තීබසයේදී හොඳින් පුහුණු වුණා."

"ඔබ දන්නවාද පියැන්කිගේ කීර්තිය?"

"ඔවුන් පවසනවා. ඔහුගේ නම පැවසීමම සතුරාට පැන දුවන්නට ප්‍රමාණවත් කියා."

"සත්‍යයක්. ඔබ දන්නවා පියැන්කි මට අණකළේ ටෙෆ්නැක් හා ඔහුගේ හමුදාව උතුරට පළවා හරින්නට බව."

"එසේයි. එහෙත් නිලධාරිතුමනි, මේ නෞකා ඉතා විශාලයි. හමුදාවන් අපට වඩා බෙහෙවින් විශාලයි."

"අප දහයකට එකෙක් ලෙස සටන් වැදිය යුතුයි. එසේම, පියැන්කිගේ නාමයෙන්, ලිබියානුවන් විනාශ වේවි."

"ඔබ ඇත්තටම එසේ සිතනවාද?"

"ලැමසෙක්නි කිසිදා බොරු කියන්නේ නැහැ මිත්‍රයා. නැව් තට්ටුව පිරිසිදු කරන්න. මේ අණ සියලු නෞකාවන්ට දෙන්න."

"කුමක්ද අපගේ උපාය?"

"සරලම ක්‍රමය. අප මේ දැන් පහර දෙනවා, දරුවා."

✷

ලිබියානු නායකයාට තම ඇස් අදහාගත නොහැකිවිය. නයිල් නදිය පුරා පැතිර තිබූ ඊජිප්තු බෝට්ටු ඔවුන් වෙත එති. ඔවුන්ගේ ඊතල, ලැමසෙක්නි විසින් තබන ලද පලිහ තාප්පයේ වැදෙයි. එකල ඊයක් හෝ

සාර්ථක නොවිය. අනෙක් අතට සතුරු ගල් දුනු වලින් ඇදී ආ රවුම් සහ උල් හැඩයේ ගල් ලිබියානුවන්ගේ ඔලුගෙඩි පොඩිකර දැමීය.

මේ කලබලය, ටෙෆ්නැක් විසින් බෝට්ටු වලට පටවන ලද ගවයන් හා අශ්වයන් කුලප්පු කරන්නට සමත් විය. මස් පිණිස ගෙන යන ගවයන්ද, අශ්ව රථ සඳහා වූ අශ්වයින්ද, ලණු කඩා ගැනීමෙන් පසු සොල්දාදුවන් පෙරළාගෙන දුවන්නට වූහ. එක බෝට්ටුවක් මේ කලබලයෙන් පෙරළී ගියේය.

ලිබියානු නායකයාට කළ හැකි කිසිවක් නොවීය. ඔහුගේ කනිෂ්ට නිලධාරීන්, එකෙක් පහර දෙන්නැයි කියද්දී තවෙකෙක් පසුබසින්නැයි කීහ. හබල්කරුවෝ දියට පැන කිමිදුනහ.

තම නෞකාවේ ඉදිරි කෙළවර සතුරු නෞකාවට ළං වූ සැනින්, අසිපත අතින් ගත් ලැමසෙක්නි යටි ගිරියෙන් කෑ ගසමින් ඒ මතට පැන්නේය. ඉදිරියට එන සියල්ලන්ගේම බෙලි කපමින් ඉදිරියට ගියේය. මේ දුටු සියලු පාබල හමුදාවෝ තම නායකයා ගත් මග ගියහ. ඉදිරියට!

# 28

''අපගේ පළමු අරමුණ ජයගත්තා.'' ලැමසෙක්නි ආඩම්බරයෙන් කීය. ''තීබසය බලා ගිය බෝට්ටු සියල්ල වැනසුණා. කිසිවකු බේරී නැහැ. අපට සිදුවූයේ ඉතා සුළු පාඩුවක්. උතුරු කුමාරවරුන්ට අයත් වූ පළමු පරාජය.''

''ඔබ විශිෂ්ටයි.'' එකෙනෙහිම ඔහු අසලට පැමිණි පෝර්මා කීය. ''එහෙත් එය ඉතා සුළු සටනක්. කොල්ල කෑ වස්තුව?''

''ආයුධ, ආහාර හා වයින්.''

''අප ඒ සියල්ල තීබසයට යැවිය යුතුයි.''

''එවිට අපගේ කොටස?''

''එය තහනම්. පියැන්කි එය තහනම් කළා.''

නිලධාරින් දෙදෙනා හමුවී සිටියේ කමුන්ට මඟක් දුරින් පිහිටි හරේ පළාතේ දකුණු ප්‍රදේශයකදීය. ලැමසෙක්නිගේ පණිවිඩය ලද විගස පෝර්මා පැමිණියේ පියැන්කිගේ අණ අනුව ක්‍රියා කිරීමටයි.

''මිත්‍රයා'' ලැමසෙක්නි කිසි ලෙසකින්වත් ඔහුට නොගැලපෙන මිහිරි හඬකින් කියන්නට විය. ''මා කල්පනා කළා අලුත් සැලසුමක්.''

''ඒ කුමක්ද?''

''කමුන්ට පහර දී අල්ලා ගැනීම. අපගේ සියලු භට කණ්ඩායම් සමග පහර දීමෙන් නගරයේ ආරක්ෂක වළලු බිඳ දැමිය හැකියි.''

''අපි අමතක කරමු නයිල් නදියේ හදිසි ප්‍රහාරය. කමුන් ගැන සලකන විට, පාරාවෝගේ සැලසුමට අනුව ඒ සඳහා කාලයක් නැහැ.''

තම සිතැඟි අනුව කිසිවක් කළ නොහැකි බව ලැමසෙක්නිට වැටහිණ. උපායශීලිව කරන මේ යුද්ධ කොතරම් කරදරකාරීද?

✸

කමුන් මාලිගයේ අමුත්තන් පිළිගන්නා ශාලාවේදී යුධ කවුන්සිලය රැස්විය. ඒ දුක්ඛිත පුවත? නැත! විය නොහැකිය!

"මේ තොරතුරු නිවැරදිද?" අකනොෂ් කුමරු ඇසීය.

"අපේ බෝට්ටු දියේ ගිලුණා." ටෙෆ්නැක් ස්ථිරවම පැවසීය. "අපගේ කිසිදු නාවිකයෙක් දිවි බේරාගෙන නැහැ."

"අප ඉදිරියට සතුරු නැව් හමුදාවක් එතැයි කිසිවෙක්, කිසි විටක සිතුවේ නැහැ." යෙගෙබ් විරෝධය දැක්වීය.

"මා ඔබට පැවසුවා ඒ පිළිබඳව. එසේ නොකරන්නැයි කීවා." ඩේබ්‍රේක් සිහි කළාය.

යෙගෙබ් හා නාට්‍රෙබ් පිළිකුලින් ඉවත බැලූහ.

"අපි අතීතයට ඇලී සිටීම වරදක්." ටෙෆ්නැක් කීය. "මෙය ඉතා සුළු සටනක්. එයින් අවශ්‍ය නම් ඔප්පු කළ හැකියි අපගේ සතුරන් අධිෂ්ඨානශීලී බව."

"සාකච්ඡා සඳහා තවත් කාලය තිබෙනවා." පෙෆ්ටෝ කීය.

"මා කිසිදා සතුරා සමග සාකච්ඡාවට යන්නේ නැහැ." ටෙෆ්නැක් කෑ ගැසීය. "මේ පළමු පරාජයෙන්ම අප අපගේ බලාපොරොත්තු බිඳ ගන්නවාද? අප හොඳින් දැන සිටියා තීබසය යටත් කර ගැනීම අපහසු බවත්, සටන් කිපයක් සිදුවන බවත්. පියැන්කි විශ්වාස කරාවි අප අපගේ සත්‍ය තත්ත්වයට වඩා දුර්වල බව. එවිට ඔහු අතින් වැරදි සිදුවීම අනිවාර්යයි. ඉන් පළමුවැන්න ඔහු කමුන්හි අපේ උගුලට හසුවීම."

"එය වැදගත් කරුණක්." ඩේබ්‍රේක් කීවාය. "නුබියානු භට කණ්ඩායම් කමුන්ට කඩා වදීවි, එහි සිටින්නේ අභය යදින වැසියන් පමණකැයි සිතා. එවිට නුබියානුවන් නයිල් නදිය සේ ඊට ඇතුල් වේවි. සැඟවී සිටින අප හමුදාවන්ට හැකියි අති භයංකර සටනක් දෙන්නට. අප දකුණට නොයා යුතුයි නුබියානුවන් අතුගා දමන තුරු."

නෙම්රොඩ් සුදුමැලි විය. "කමුන්හි කුමරු ලෙස මා එහි නැවතී සිටිය යුතුද උතුමාණනි."

"අනවශ්‍යයි." ටෙෆ්නැක් කීය. "ඔබ මගේ කවුන්සිලයේ සාමාජිකයෙකු නිසා. අප ජයගත් පසුවයි ඔබ එහි යන්නේ."

මහත් සේ සැනසීමට පත් නෙම්රොඩ් ටෙෆ්නැක්ගේ සැලසුමට එකඟ විය.

"ඉදිරියේදී." ඩේබ්‍රේක් යෙගෙබ්ට කීවාය. "යුද්ධය පිළිබඳ අවවාද නොදෙන්න. ඔබට අයිති නගර පාලනය පමණයි."

තරුණිය රැජිනියකගේ බලය පෙන්වූ සැටිය ඒ. යෙගෙබ් විවරව ගිය මුවින් යුතුව පුදුමයෙන් ඇය දෙස බලා සිටියේය.

✱

ඒ වාරයේ නයිල් ජල ගැල්ම මඳක් අඩු වූ නමුත් සතුටුදායක මට්ටමක පැවතිණි. ඒ වනවිටත් ජල ගැල්ම ඉහළ සිට පහළ බිම් කරා ගලා එමින් පැවතුණි. සේවකයින් විසි දෙනෙක් පමණ සමග ගොවිපොළක් පවත්වාගෙන ගිය මහලු ගොවියා, නගුල් සූදානම් කරන ලෙස ඔවුනට දැනුම් දී තිබිණි.

මේ අවස්ථාවේදී ඔහුගේ අට හැවිරිදි මුණුබුරා ඔහුගේ අතින් ඇද්දේය. ''සීයේ අර බලන්න. කවුද එන්නේ කියා. ඔවුන් අත තිබෙන්නේ හෙල්ල නොවේද?'

''නිවසට ආපහු යන්න මගේ දරුවා.''

සොල්දාදුවෝ ගොවිපොළට පැමිණියහ. මුඩු හිසක් හා යටි රැවුලක් ඇති ඔවුන්ගේ නායකයාට වූයේ බියකරු මුහුණකි. සේවකයෝ වෙව්ලා යමින් තම ස්වාමියා පිටුපස සැඟවුණහ.

''කුමක්ද ඔබට අවශ්‍ය?'' ගොවියා ඇසීය.

''මා යුධ හමුදා අණදෙන නිලධාරි ලැමසෙක්නි. වහාම වැඩ නවතනු.''

''එහෙත් අප සූදානම් වුණේ ගොවිපොළ සී සෑමටයි උතුමනි.''

''අද සී සෑමක්, වැපිරීමක් හෝ අස්වනු එකතු කිරීමක් සිදුවන්නේ නැහැ. හරේ පළාත උතුරු හමුදාවන්ට යටත් වී තිබෙන තාක් එය විධානයක්, කළු පාරාවෝගේ.''

''ඔබේ සූදානම උතුරු හමුදා සාගින්නේ තබන්නද?''

''ඔවුන් යටත් වේවි. ඒ අනුව යුද්ධයේ මරණ සංඛ්‍යාව ඉතා අඩුවේවි.''

''එහෙත් අප? අපට ආහාර?'' ගොවියා ඇසීය.

''පාරාවෝ ඒ සඳහා සුදුසු පියවර ගෙන අවසන්. තීබසයේ ගබඩා වලින් ඔබට ආහාර සැපයේවි. අප රැවටීමට සූදානම් නොවන්න. අපේ අණ නොතකන ඕනෑම කෙනෙක් සිරගත කෙරෙනවා.''

''යුද්ධය දිගුකලක් පවතීවිද? ලිබියානුවන් කමුන් යටත් කර ගත් දා සිට අප වදයට පත්ව සිටිනවා උතුමනි. ඔවුන් එහා ගම්මානයේ ගොවිපොළ දෙකක් ගිනිතැබුවා. ගොවියන් කළ වරද දන්නවද ඔබ? හබල්කරුවන් ලෙස ලිබියානුවන්ට එක්වීම ප්‍රතික්ෂේප කිරීම. කළු පාරාවෝ සාධාරණ කෙනෙක් නම්, ඔහු සාමය ඇතිකළ යුතුයි.''

''අප ඒ ගැන බලාගන්නම් සීයේ.''

✱

ඒ අළුයම කමුන් නගරය දෙවනත්කරමින් ලිබියානු සොල්දාදුවෝ ඊට ඇතුල් වූහ. රාත්‍රිය පුරා බූරුවන් පිට බඩු ගෙනියන තවලමක් සමග ඔවුන් ගමන් කර තිබිණි. තෝත් දෙවියන්ගේ නගරයේ ආහාර අවසන් වෙමින් තිබූ හෙයින් එයි ප්‍රධාන පෙළේ වැසියෝ තම තමන්ගේ භෝජන සංග්‍රහවලට ඇතිවන බාධා ගැන චෝදනාද එල්ල කළහ.

මේ හමුදා කණ්ඩායම් කිහිපයක්ම එවන ලද්දේ නෙම්රොඩ් විසිනි. ගම්මානවල තිබෙන පලතුරු හා එළවලු සියල්ල ගෙන යාමයි ඔවුන්ට පැවරුණ රාජකාරිය වුණේ. එහෙත් ගොවියෝ ඊට විරෝධය දැක්වූහ. එවිට සිදුවූයේ වැඩියෙන්ම බාධා කරමින් කෑගසන තැනැත්තාට දැඩි සේ පහර දී සෙස්සන් නිහඬ කිරීමයි. හරේ පළාත, එහි අගනුවර බේරා ගැනීම වෙනුවෙන් ඕනෑම කැප කිරීමක් කළ යුතු බව ඔවුන් තේරුම් ගත යුතුය.

නෙම්රොඩ්ගේ සොල්දාදුවෝ ගැමියන්ගේ ප්‍රයෝජනය සඳහා තබන ලද අති විශාල ජල බඳුන් පසුකර ගියහ. පාන් පෝරණුව පසුකළ ඔවුහු ගම් ප්‍රධානියාගේ නිවස ඉදිරිපිට නතරවූහ. සුදු හුණු ගා බඩ ඉරිඟු මල් වැල් පින්තාරු කරන ලද ඒ ගෙය කුඩා වුවද රමණීයය.

පාබල හමුදා භටයා දොරට පා පහරක් ගැසීය.

"දොර විවෘත කරනු වහාම!"

අළුපාට බළලෙක් පාර අයිනේ වැවුණු තණ බිස්සේ සැඟවුණි. දොරට තවත් පා පහරක් වැදුණි. මොහොතකට පසු එය ක්‍රීක් හඬින් විවෘත විය.

"මා සිටියේ තද නින්දේ. කුමක්ද ගැටලුව?"

"ගොවියන් අවදි කරනු. අප සියලු ආහාර එකතු කරනවා."

"හෝ. එය... අපහසුයි."

"කීකරු වනු මගෙ අණට."

"මෙහි අණ දෙන්නේ මමයි." ලැමසෙක්නිගේ ලී අත සොල්දාදුවාගේ හිස මත හෙණයක් සේ පතිත විය.

අනෙක් නිවෙස් තුළින් දුනුවායෝ පිටතට පිනූහ. සටන් කිරීමෙන් පලක් නැතිබව නෙම්රොඩ්ගේ භට කණ්ඩායම් වලට වැටහුණි. දේශද්‍රෝහී නෙම්රොඩ්ගේ භට කණ්ඩායම්වල කිසිවෙක් කමුන් වෙත ආපසු ගියේ නැත.

# 29

''අන්න ඔවුන්.'' මුරකරු කෑ ගැසීය.

කමුන්හි ආරක්ෂක මුරපොළේ අණදෙන නිලධාරියා, ටෙෆ්නැක්ගේ නියමයට අනුව වහාම තම භට කණ්ඩායම් විහිදුවා හැරියේය. එහි වැසියන්ට දොර ජනෙල් වසාගෙන නිවෙස් තුළට වී සිටීමට අණ ලැබිණි. පාබල හමුදා භටයන් හා දුනුවායන්, බාගෙට කඩා දමන ලද තාප්ප ඇති නගරයේ හැම මුල්ලකම සැඟවුණහ.

නුබියානු හමුදාව දැඩි කැමැත්තෙන් කිසිදු බාධාවකින් තොරව නගරයට ඇතුල් වනු ඇත. එහෙත් ටෙෆ්නැක්ගේ හමුදා භටයන් ඉවසීමෙන් බලා සිටිය යුතුය. එවිටයි සතුරාගෙන් වැඩි කොටසක් උගුලට හසුකර ගත හැකිවන්නේ. එතැන් පටන් ඔවුන් අතුගා දැමිය හැකිය. එවන් පරාජයකින් පසුව, තව දුරටත් හරේ පළාත යළි අත්පත් කර ගැනීමට කළු පාරාවෝ තුළ ඇති සිතිවිල්ල දියවී යනු නිසැකය. එය ටෙෆ්නැක්ගේ රාජ්‍යය වනු ඇත.

''ඔවුන් ළංව එන්නේද?'' නිලධාරියා ඇසීය.

''ඔව්.... හෝ මඳක් සිටින්න. මුලින් එන අශ්වාරෝහකයා නතර වුණා.''

✸

පෝර්මා කමුන් දෙස බැලීය. නගරය පාළුය. ආරක්ෂක බිත්ති මත එකද දුනුවායෙක් නැත. නෙම්රොඩ්ගේ සොල්දාදුවන් උතුරට පැනගොස් ඇති බවට සැක නැත.

විශ්වාසය තැබිය නොහැකි සිවුපාවකු පිට යනවාට වඩා පයින් ගමනට කැමති ලැමසෙක්නි සිටියේ කණගාටුවෙනි. පියැන්කිගේ අණ පිළිපැදීම පහසු නොවේ. ඔහුගේ අණට අනුව රාත්‍රියේ පහරදීම තහනම්ය. සියලුම සොල්දාදුවන් සටනට යවන්නටද නොහැකිය. ඒ සියලු නීති වලට යටත්ව, ටෙෆ්නැක්ගේ හමුදාව අතුගා දමා ඒ රාජද්‍රෝහියා අල්ලාගත යුතුය. එය හරියටම ඉදුනු පලතුරු පොඩි නොකර ඒ මත ඇවිදීම වැනි

කාර්යයකි. මේ තත්ත්වය යටතේ කෙසේද දරුණු යුද්ධයකට යොමුවන්නේ? එහෙත් ඊටම ගැලපෙන, සුවච කීකරු, කිසිවිටක තම අභිමතය පරිදි ක්‍රියා නොකරන, අධික උද්‍යෝගයෙන් දඟලන නිලධාරියෙක් සිටී. පෝර්මා!

ලැමසෙක්නි ඔහු ළඟට ගියේය. "කදිම තිළිණයක්. එසේ නොවෙද?"

"මා ඔබව හඳුනනවා." පෝර්මා කීය. "ඔබට අවශ්‍ය එක දෙයක් පමණයි. කමුන්ට පහර දී යටත් කර ගැනීම."

"නුඹ මා හඳුනන්නේ නෑ දුනුවායෝ. මගේ නැහැයට දැනෙනවා මෙය විශිෂ්ට උගුලක්. මෙතරම් වටිනා නගරයක් ඔහු අතහැර දමන්නේ නැහැ. ටෙෆ්නැක් සිය ගණනක් සොල්දාදුවන් මෙහි හැමතැනම සඟවා තිබෙනවා, සැඟවී සිට අපට පහර දෙන්නට. එහෙත්, ඔහු එය පමණ ඉක්මවා කළා. බලන්න, ආරක්ෂක බිත්ති මත එකම දුනුවායෙක්වත් නැහැ."

"ඔබ හරි වුණත්, වැරදි වුණත්, ඉන් කමක් නැහැ. පාරාවෝ අපට අණකළේ හෙනෙත් නෙසට් අල්ලාගන්නයි. කමුත් එසේම තිබෙන්නට හැර."

"අපේම වාසනාව"

කමුන් අතහැර දැමූ ඔවුහු උතුරු දෙසට ගමන් ඇරඹූහ. තම භට කණ්ඩායම් සමග ඉදිරියට යන ලැමසෙක්නිට පිට පුරා වැදෙන තුඩුවල සිහින් වේදනාව දිගින් දිගටම දැනෙන්නට විය. නගරය පුරා හැම අස්සක් මුල්ලකම සැඟවී, ඔවුන් වෙත එල්ල වී තිබූ සිය ගණනක් ඇස්, ටිකෙන් ටික ඈත්ව යන තම ගොදුරු දෙසම බලා සිටියාට සැක නැත.

✸

ගම්මාන අතහැර දමා ඇත. නිවෙස් දැවී ගොස්ය. පටු පාරවල් පුරා මියගිය බල්ලන්, බළලුන් හා කුඩා වඳුරන්ගේ මළ සිරුරු වැටී තිබිණි. අනාථ දරුවෝ මවුවරුන් සොයා හඬා වැලපෙති. සාගින්නේ මියගිය මහල්ලන්ගේ සිරුරු, ගොවිපොළක බිත්තියට හේත්තු වී තිබිණි. යුද්ධයේ කුරිරු බව හොඳින් අත් විඳ සිටි ලැමසෙක්නි පවා මෙතරම් බියකරු දසුනක් කිසිදා දැක තිබුණේ නැත. එය දරාගත නොහැකි වූ පෝර්මාට අවශ්‍ය වූයේ එතැනින් පැනගොස් සැඟවී වැලපෙන්නටයි. පළපුරුදු සොල්දාදුවෝ පවා බියෙන් වෙව්ලා ගියහ.

ලැමසෙක්නි පෝර්මාගේ උරහිසට තට්ටු කළේය."එන්න මෙතැන

නතර විය නොහැකියි. අප මෙහි සිටින දිවි බේරාගත්තවුන් එකතුකර දකුණට යැවිය යුතුයි.''

''සමාවෙන්න.... එහෙත්....''

''සමාව ඉල්ලිය යුතු නොවෙයි පෝර්මා. හොඳ සොල්දාදුවෙකුට මෙවැනි සමූල ඝාතන දරාගත නොහැකියි.''

පෝර්මා දැත් මිට මෙළවීය. ''ටෙෆ්නැක් හා ඔහුගේ සගයින් හෙනෙන් නෙසට්හි සිටිත් නම් අපි ඔවුන් මරා දමමු. පාරාවෝ අප ගැන ආඩම්බර වේවි.''

නගරයට යන මාවතද එවැනිම දසුනක් විය. ගං ඉවුරට ළංව ටෙෆ්නැක්ගේ මිනිසුන් විසින් ගිනි තබන ලදුව පිළිස්සෙන කුඩා බෝට්ටුය. නුබියානු හමුදාවට ආහාර ලබා ගැනීම හා ගමනාගමනය අපහසු කිරීමේ අරමුණින්, උතුරු හමුදාව ගෙවල් හා ගොවිපොළ ගිනි තබන වග මගියෙක් පැවසීය.

''ඔවුන් අතුගා දැමීම පහසු නොවේවි.'' ලැමසෙක්නි කීය. ''සියලුම උතුරු හමුදාවන් හෙනෙන් නෙසට් වෙත ගියේ නම්, ඒ සංඛ්‍යාව අපට වඩා බෙහෙවින් වැඩිවේවි.''

''පියැන්කි අපට වගකීමක් භාරකළා. අප එය ඉටු කරනවා.'' පෝර්මාගේ යුධකාමී හඬ උස්ව නැගුණි. ඒ ඇසීමද ලැමසෙක්නිට සතුටක් විය.

''එකඟයි දුනුවායා. එහෙත් ඉඩදෙන්න මට සැලසුම් කරන්න. මට නැහැ බලාපොරොත්තුවක් මැරෙන්නට.''

✸

යුධ කවුන්සිලය හමාර වී අකනොෂ් පිටතට ආයේ ශෝකයෙනි. ඔහු සිතා උන්නේ පරාජයට පත්වූ ටෙෆ්නැක් තම සැලසුම ඉවත දමනු ඇතැයි කියාය. එහෙත් ඔහු වැරදිය.

පළමු ප්‍රහාරයේදී අහිමි වූ සෙබලුන් හේතුවෙන් ටෙෆ්නැක්ගේ බලය දුර්වලය ගියද, ඔහු ඩෙල්ටාවෙන් භටයන් ගෙන්වාගෙන, යළි එය තරකර තිබිණි. හෙනෙන් නෙසට් වෙත පසු බැසීමේදී ටෙෆ්නැක් දක්ෂ උපායක් යොදා තිබිණි. ඒ සතුරා තමාවෙත ඇදගෙන විනාශ කිරීමයි. යම් කිසි ආශ්චර්යයකින් ඔහු කමුන්හිදී දිවි ගලවාගෙන තිබුණොත්!

ටෙෆ්නැක් නිවැරදිය. ඊජිප්තුව යළි එකමුතු කළ යුතුය. එහෙත් ඒ මේ අයුරින් නොවේ. බලෙන් යටත් කර ගන්නා ලද ජනතාව, තමාට

වදදෙන ක්‍ෂුර පාලකයෙකුට කිසි විටක ආදරය කරනු නැත. එසේම කවදා හෝ ඔවුන් ඔහුට එරෙහිව නැගී සිටිනු ඇත. අවාසනාවට මෙන් ජෙනරාල් සවන් දුන්නේ තම උපදේශකවරුන්ට පමණි. යෙගෙබ් හා නාට්‍රෙබ්! දූෂණයෙන්ම ඒකාබද්ධ පෙරමුණක් තනා එහි නායකත්වය ඔහුට ලබාදුන්නේ ඒ දෙදෙනාය.

✸

අකනොෂ් තම පුද්ගලික කාමරයට ගියේය. හිරු රැසින් දැවී ගිය සමක්ද, අවුල් වූ කෙස්ද ඇති මහල්ලෙක් ඔහු ඉදිරියට ආයේය. මහල්ලා තම අතෙහි වූ හිස් බඳුනක් අකනොෂ් ඉදිරියේ බිම ගැසීය. එය ඉතා කුඩා කැබලි දහස් ගණනකට කැඩී විසිරී ගියේය.

"සමාවෙන්න උතුමාණනි. ඔබේ හිත රිදුනානම් සමාවෙන්න." මහල්ලා රහසින් කතා කරන්නට විය. "මට ඔබ හා කතා කරන්නට අවශ්‍යයි උතුමාණනි. මට අණ කරන්න, ඔබට නැවුම් දිය ගෙනෙන්නැයි කියා."

අකනොෂ් කුතුහලයෙන් එසේ කළේය.

ලිලී මලින් සරසන ලද බඳුනකට දිය ගෙන එන මහල්ලා, අකනොෂ් හා බිරිඳ විසින් පිළිගන්නට යෙදුනි.

"උතුමාණෙනි, මට ඔබ හා තනිව කතා කරන්නට අවශ්‍යයි."

"මගේ බිරිඳට නොකියන රහසක් මට නැහැ. පවසන්න, නැතහොත් පිටවන්න."

"කිසිවෙකුට ඇසේවිද උතුමාණෙනි."

අවට කිසිවෙකු නොමැති බව බිරිඳ සහතික කළාය.

"මා වතුර ගෙනයන්නෙක් උතුමනි." මහල්ලා කීය. "එහෙත් මා මෙහි එවුවේ පියැන්කි. මා ඉතා අවදානම් ගමනක් ආවා ඔබ හමුවීමට. අප ඉක්මනින් ක්‍රියාත්මක විය යුතු නිසා. අකනොෂ් කුමරුනි, මට පැවරුණ වගකීම, ඔබේ උදව් ඇතිව ටෙෆ්නැක්ගේ අශ්ව රථ තිබෙන ගබඩා ගිනි තැබීමයි. එවිට ඔහු බලාපොරොත්තු කඩවී සායිස් වෙත ආපසු හැරී යාවි."

"මා ද්‍රෝහියෙක් හෝ පියැන්කිගේ මිතුරෙක් නොවෙයි."

"මා එය දන්නවා කුමරුනි. එහෙත් ඔබත් පාරාවෝ මෙන් සමූල ඝාතනයක් වැළැක්වීමට කැමතියි. අද රාත්‍රියේ මා ගබඩා අසල නවතිනවා

මිනිසුන් කීප දෙනෙක් සමග. ඔබේ ආරක්ෂකයින් අතර ඔබේම ජන කොට්ඨාසයේ මිනිසුන් සිටිනවා නම්, අපට මේ ගින්න හදිසි අනතුරක් ලෙස පෙන්විය හැකියි. එවිට මේ ප්‍රදේශයේ සාමය ස්ථාපිත වේවි. මා ඉල්ලා සිටින්නේ උතුමාණනි, දැන් අරඹන්න.''

''ඔබ බැක්ෂිම් ජන කොට්ඨාසයේ නොවේද?'' අකනොෂ් බිරිඳ ඇසීය. ''පියැන්කිට වඩාත් සමීප ජන කොට්ඨාසයක.''

''එය සත්‍යයක්. අප ඔහු විශ්වාස කරනවා. අප පෙන්වන්න උත්සාහ කරන්නේ ඒ විශ්වාසය ඉතා වටිනා බවයි. මා යා යුතුයි. රාත්‍රිය එළඹෙන තෙක් අවසර, උතුමාණනි.''

අකනොෂ් ඔහුගේ අතේ පච්චා කොටන ලද දුනු හා කිරිච්චි දෙස බැලීය. ''මට ඊට සහය වෙන්නට අවශ්‍යයි ප්‍රේමිය.''

''අද රාත්‍රියේ ඔබ මගේ දෑතේ නිදනවා.''

''නැහැ මා.....''

''එය උගුලක් පෙම්වත. මේ මිනිහා ඔත්තුකරුවෙක්. ඔහුගේ උත්සාහය ඔබ ටෙෆ්නැක්ට ද්‍රෝහි වේද කියා සෙවීම.''

''ඔබට ඒ ගැන විශ්වාසද? කෙසේද ඔබ.....?''

''බැක්ෂිම් නමින් ගෝත්‍රයක් දැන් නැහැ, පෙම්වත.''

# 30

''පරාජයක්'' යෙගෙබ් තම ඉදිමුණු වළලුකර මී පැණි මිශ්‍ර ආලේපනයක් යොදා සම්බාහනය කරමින් සිටියේය. ''ඔබට විශ්වාසද අපගේ ඔත්තුකරු ඒ කාරිය නිවැරදිව කළ බවට?''

''මට විශ්වාසයි.'' නාට්‍රෙබ් කෝපයෙන් කීය. ''ඔහුට දැනුණා අකනොෂ්, ටෙෆ්නැක්ට ද්‍රෝහි වීමට සූදානම් බව. එහෙත් කුමරා ඒ රාත්‍රියේ ගබඩාවට ගියේ නැහැ.''

''ඒ අප ඔහුට උගුලක් ඇටවූ බව ඔහු දැනගත් නිසා. ඔහු දැන් අසරණයි. කිසිදු බලයක් නැහැ. ඔහු දන්නවා දිවා රාත්‍රී දෙකේ ඔහුව පරීක්ෂා කෙරෙන බව. ඒ නිසා ඔහුට කිසිම හැකියාවක් නැහැ සතුරා සමග සම්බන්ධ වීමට. අවසානයේදී ප්‍රතිඵලය එතරම්ම නරක නැහැ.''

මේ මොහොතේ සේවකයෙක් උපදේශකවරුන්ගේ කාමරයට කඩා වැදුණි.

''සතුරා! සතුරා හෙනෙන් නෙසට් දොරටුව අසල.''

✸

ලැමසෙක්නි, බලකොටුව දෙස බලාගත්වනම පස්වැනි රතුළුණු ගෙඩිය කෑවේය. ''කදිමයි! කදිම සතෙක්. ඒත්, අපට අල්ලන්නට බැරිතරම් විශාලයි.'' ඔහු කීය.

''පියැන්කි අපට අණකළා එය අල්ලාගන්නට.'' පෝර්මා කීය.

''ඔහු මේ ගැන දන්නේ නැහැ. වම් පැත්තෙන් අපේ සතුරන් ඇළ පාර අල්ලාගෙන. දකුණු දෙසින් බෝට්ටු නවත්වා ගංගාව හරස් කර තිබෙනවා. මේ ආරක්ෂක බලකොටුව ඒ අතර. සිය ගණනක් ලිබියානු දුනුවායන් ආරක්ෂක තාප්ප මත. එතුළ සොල්දාදුවන් කී දෙනෙක් ඇතිද? ටෙෆ්නැක් එහි සිටීනම් ඔවුනට දැනේවි ඔවුන් අපරාජිතයි කියා.''

හෙනෙන් නෙසට්, මෙම්ෆිස් හි සිට දින තුනක ගමනකි. සෞභාග්‍යමත් භූමියක් වූ එය හා කාන්තාරය අතර ඇළක් පිහිටියේය.

නයිල් නදිය හා ෆායියුම් නම් සාරවත් පළාත සම්බන්ධ වූයේ ඒ මගිනි. එහි වූ ප්‍රධාන දෙවොල බැටළු දෙවියකු විසින් ආරක්ෂා කෙරෙන අතර, එහි ලොව මුල්ම ජීවය උපන් ජලය සහිත පොකුණක් විය.

ගම්මානයේ සොඳුරු බව හෝ නයිල් නදියේ ජලය මත රැළි නංවා දිළිසෙන්නට සලස්වන සිසිල් සුළඟ, යුධ සිතිවිලි තවත් ඉහළ නැංවූයේ නොවේ.

''කුමක්ද ගැටලුව ලැමසෙක්නි?'' පෝර්මා ඇසීය. ''ඔබේ ධෛර්යය ඔබ හැරගොස්ද?''

''මා කැමතියි ජීවී පුරාවෘත්තයක් වන්නට. මගේ ලී අත මාංශයෙන් සෑදුන කලක මෙන් කසන විට, මා දන්නවා මා කරන්නේ වරදක් බව.''

''අප ආපසු හැරෙන්නේ නැහැ නොවෙද?''

''පෝර්මා, පහර දීමට මං එකකට වැඩිය තිබෙනවා.''

''එහි තේරුම?''

''ටෙෆ්නැක් දන්නවා අප නගරයට පහර දෙන බව. ඒ නිසා ඔහු හොඳම භටයින් එහි රඳවා ඇති. නයිල් නදිය පැත්තෙන් ඔහුගේ බාධක බිඳින්නට අප සතුව ප්‍රමාණවත් තරම් බෝට්ටු නැහැ. අනෙක් අතට, අපට ඇළ පාරක් තිබෙනවා.''

''නොවැදගත්ම මග.''

''මා එකඟයි. ඒත් කොතරම් සුළු ජයක් ලැබුණත්, එය වික්‍රමයක් කරගනිමු.''

✸

පෙෆ්ටෝ කුමරු හෙනෙන් නෙසට්හි මධ්‍යම කුලුන මුදුනේ හිටගෙන උන්නේය. ඔහු වටා තිබූ සිදුරු සහිත ලී රාමුවයි ඔහු සතුරු ඊතල වලින් මුවා කළේ.

ඔහුගේ මුහුණේ පුළුල් සිනාවක් මතුවිය. ''ජෙනරල්, මගේ නගරයේ ආරක්ෂාව බලවත් නොවෙද?''

''කදිමයි.'' ටෙෆ්නැක් සතුට පළ කළේය.

''පියැන්කි සිතුවා ඔබ මා යටත් කර ගැනීම ඔහුට නවත්වන්න හැකිවේවි කියා. අද නුබියානුවන් අසරණයි. ඔවුන්ගේ දුප්පත් හමුදාව දන්නේ නැහැ ඊළඟට කුමක් කළ යුතුද කියා.''

''ඔවුන් පසුබසිනවා.'' සරල, දිග, රතු ඇඳුමින් සැරසී සිටි ආනුභාව සම්පන්න ඩේබ්‍රේක් කීවාය.

පෙෆ්ටෝගේ තැති ගැනුනු, සෝර සිතහව තරුණියගේ සවන් රිදවීය.

"ඔවුන් බියෙන්. ඒ ජනප්‍රිය නුබියානු රණවිරුවන් බියෙන්, මරණයට. අප මේ පුවත ඊජිප්තුව පුරා පැතිරවිය යුතුයි. එය පියැන්කිගේ කීර්තිය වළලා දමාවි. ඔහු අපරාජිතය යන්න මුසාවක් වේවි. ඔහුගේ නාමයට කිසිවකු බිය නොවේවි."

"බලන්න" ඩේබ්‍රෙක් කීවාය. "ඔවුන් නැගෙනහිරට යනවා."

"මෝඩකමක්." පෙෆ්ටෝ කීය. "කුමටද කන්ද දෙසට? "

"නුඹයි මෝඩයා." ටෙෆ්නැක් කීය. "ඔවුන්ගේ සූදානම ඇළ පාරට පහරදීම."

"එසේ වුවත් උතුමනි." මහලු පෙෆ්ටෝ ගොත ගැසීය. "එයින් අපට විශාල හානියක් සිදු නොවේවි."

"නුබියානුවන් එවැනි සුළු ජයකින් සතුටු වන නිසා, ඔවුනට හදිසි ප්‍රහාරයක් එල්ල කළ යුතුයි." ටෙෆ්නැක් සිතීය.

"අප හදිසි ප්‍රහාරයක් එල්ල කරනවා." ඔහු නිවේදනය කළේය.

✸

පෝර්මාගේ දුනුවායන් සැලකිය යුතු තරම් සාර්ථක විය. ඔවුන්ගේ ඊතල, සතුරන් බාගයකට වඩා මරා දැමීය. ලිබියානු ආරක්ෂකයින් පළවා හරින්නට, එක ඊතල වටයක් සෑහුණි. ඉතා පළපුරුදු තරුණ භටයෝ වහවහා පලා ගියහ. පසුබසින භටයින් නැවත එක් කිරීමේ වගකීම බාරගත් ප්‍රධානියාගේ ගෙල පසාරු වන සේ හීයක් විදීමේ කාර්යය පෝර්මා බාරගෙන තිබුණි.

හෙල්ලයෙන් විස්කම් පෑ ලැමසෙක්නිගේ සොල්දාදුවන් විසින්, අවසාන ලිබියානුවන්ගේ සිරුරු ඇළ පාරේ පා කර යවන්නට යෙදිණි. මේ අතරතුර, නිසොල්මන්ව අවධානයෙන් සිටි ලැමසෙක්නි, මෙවැනි සුළු පොරයකට මැදිහත් වීම ඔහුට නොවටිනේ යැයි සිතීය.

එක්වරම, ඔහුගේ අවධානය දැඩිවිය. "අන්න" ඔහු කීය. "ඔවුන් මේ දැන් නගරයේ ප්‍රධාන දොරටුව විවෘත කර තිබෙනවා. ඔවුන් තම හදිසි ප්‍රහාරයකයින් එවනවා අප කැබලි කිරීමට."

පෝර්මා හෙනෙත් නෙසට් දෙස බැලීය. "එහි අශ්ව රථ නැහැ. පාබල හමුදාවක් පමණයි."

"ඔබේ දුනුවායන්?"

"සූදානම්. පඳුරු තුළ හා තැනිතලාවේ දෙපසින්ම."

"මා ඉදිරියෙන් ප්‍රහාරය දෙන්නම්. මා පසිබසිනු යයි හඬ නගනවිට ඒ ඔබේ වාරයයි."

✸

ලිබියානුවන්ගේ හිසකේ කොටස් තුනකට බෙදා තිබිණි. මැද කොටස පහළින් කැරළි ගැහෙන සේ හිස ඉහළට කොට ගැට ගසන ලද අතර ඒ දෙපසින් දිග පිහාටු සවිකර තිබුණි. බඩ, පපුව, බාහු සහ මැණික්කටුවල පච්ච කොටන ලද අතර කතිරය වැටෙන සේ සකසන ලද උරහිස් පටි ඇති ඔවුන් ඕනෑම සතුරකු බිය ගැන්වීමට සමත් විය. එහෙත් ඒ ලැමසෙක්නි සහ ඔහුගේ නුබියානු වීරයින් නම් නොවේ!

ලැමසෙක්නි! ඒ යුධ නායකයා අමෝරාගත් කෙටි සැහැල්ලු කෙටේරියෙන් කොතරම් වේගයෙන් බෙලි හා අත් සිඳ දැමුවේද යත්, තනි අතින්ම, එය හෙනෙන් නෙසට් වෙතින් පිටතට එන ලිබියානුවන්ගේ ගමන බාල කළේය. කුඩුම්බි තුනක් සහිත කෙටේරිය කළ මහත් විනාශයටම සරිලන ලෙස ඔහුගේ ඇකේෂියා අත හිස් කබල් මත වැටුණි.

පාම් ගසෙන් පෙරා ගන්නා ලද මත් පැනින් වෙරි වී සිටි ලිබියානු නායකයාගේ අණ ලැබූ ලිබියානුවෝ මේ විස්මයජනක ප්‍රහාරයෙන් තම ඉදිරි ගමන ප්‍රමාද කළහ.

"පසුබසිනු!" ලැමසෙක්නි කෑගැසීය.

ඒ හඬට අනුව නුබියානුවෝ දකුණු දෙස තැනිතලාවට දිව ගිය අතර ලිබියානුවෝ ජයඝෝෂා නගමින් ඉදිරියට ආහ. එහෙත්, ඔවුන් පෝර්මාගේ දුනුවායන්ට ඉතා පහසු ගොදුරු බවට පත්වුණි. වම් පසින් පැමිණි ලිබියානුවන්ට ප්‍රහාර එල්ල කළ හමුදාව ඒ කණ්ඩායම දෙකඩ කළේය. පැනයන සතුරා පසුපස හඹා ගිය ලැමසෙක්නි හා ඔහුගේ දක්ෂතම භටයින් ඒ උත්සාහය ව්‍යර්ථ කළහ. ලිබියානු ප්‍රහාරය අන්ත පරාජයකින් අවසන් විය.

එහෙත්, ලැමසෙක්නිට එය එතැනින් නැවැත්විය නොහැක. ඔහු ඒ වාසිය තමා වෙතගෙන "නයිල් ගඟට" යි අණ කළේය. දුනුවායන් හා පාබල හමුදාව ඒ වනවිටත් නුබියානු නැව් හමුදාවේ ප්‍රහාරයට ලක්ව සිටි උතුරු බෝට්ටු වෙත පිනූහ. සතුරන්ගේ සංඛ්‍යාව ඉක්ම වූ පියැන්කිගේ හමුදාව පහසුවෙන්ම ජය ලබා ටෙෆ්නැක්ගේ බෝට්ටු ගිනිබත් කළහ.

"දැන් හෙනෙත් නෙසට්" පෝර්මා කෑ ගැසීය.

"නැහැ." ලැමසෙක්නි එරෙහි විය. "බලන්න."

නගරයේ ආරක්ෂක තාප්ප පෙර සේම දුනුවායන්ගෙන් පිරී පැවතිණි. අශ්ව හේෂාවරයද ඇසෙන්නට විය. රථය ඇදගෙන යන්නට නොඉවසිල්ලෙන් නැගෙන අසුන්ගේ හඬ! ටෙෆ්නැක්ගේ හමුදාවෙන් වැඩි කොටසක් ආරක්ෂිතය.

"අප කර ඇත්තේ ඔවුන් පහුරු ගෑමක් පමණයි." ලැමසෙක්නි කීය.

# 31

පියැන්කි සහ අබිලා රන් ආලේපිත කණු සහිත වියනක් යට ඉඳගෙන සිටියහ. ඒ අසලම දැඩි උණුසුම ඇතිවිට ඔවුන් ස්නානය කරන අලංකාර වැව පිහිටියේය. ඔවුහු බල්ලන් හා නරින්ගේ ක්‍රීඩාවේ යෙදී සිටියහ. කුඩා මේසයක් මත සිදුරු තිහක් සහිත පුවරුවක් තනා තිබිණි. ක්‍රීඩාව කරන ලද්දේ කුඩා කෝටුවල සවි කරන ලද බලු හා නරි හිස්වලිනි.

නිර්වස්ත්‍රව සිටි රාජකීය යුවලගේ සිරුරු ඖෂධීය තෙලක් තවරා, ඔවුන්ගේ දියණිය විසින් තනන ලද විස්මයජනක සුවඳ ද්‍රව්‍යයකින් සුවඳවත් කර තිබිණි. ඒ අපූරු පොකුණ තුළ ආලයෙන් වෙළී සිටි ඔවුහු දැන් ඒ ක්‍රීඩාවේ නිරතව සිටිති.

තියුණු තරඟයකින් පසුව තම නරි, බල්ලන් පරාජය කිරීමට සූදානම් බව පියැන්කිට වැටහිණි. එහෙත් අබිලාගේ රූපශ්‍රීයෙන් වශී වී සිටි රජුට ක්‍රීඩාව සඳහා සිත යොමු කිරීම එන්ට එන්ටම අපහසු විය. තමා දෙස යොමුවුණ සැමියාගේ දෑස් දුටු රැජින, තව දුරටත් ඔහුගේ මනස කුල්මත් කරන අටියෙන් සිරුර චලනය කරන්නට වූවාය.

ඉන් සාර්ථක ප්‍රතිඵල ලැබිණි. ඇය තම සිනිඳු අත මේසය මත නටවා කුඩා බලු හිසක් ගෙන නරි හිස් පහක් පරාජය කළාය.

''ඔබ දිනුම්. එහෙත් වංචාවෙන්.'' රජු කීය.

''වංචා කළා? මම?''

''ඔබ මා වශී කළා.''

''එය තහනම්ද මේ ක්‍රීඩාවේ යෙදෙන විට? පවසන්න පෙම්වත.''

කළු පාරාවෝ දිවියේ පළමුවරට ආලය කරන්නා සේ තම බිරිඳ වැළඳගති. ''සැම ඊජිප්තු රැජිනක් මෙන්ම මමද ශ්‍රේෂ්ඨ ඉන්ද්‍රජාලිකයෙක්. ඔබේ ඇස් මට කිසිදා ළං නොවිය හැකි, ලොව රහස් හඳුනනවා.''

''ඔබ බොහොම නිරහංකාරයි උතුමාණනි.'' අබිලා කීවාය.''කෙසේ වෙතත් බලය සතු ඔබටයි.''

"නුබියාව සියලු අනතුරු වලින් බේරා ගැනීමට එය මට සහාය වේවා."

"කුමටද අප බියවන්නේ?"

පියැන්කිගේ ඇස් අඳුරු විය. "මේ සෞම්‍ය හිරු, අඳුරු සෙවනැලි සඟවනවා."

කුඩා වඳුරෙක් පාම් ගසක් මුදුනට නැංගේය. සුදු දුඹුරු බළලෙක් වද ගසක් යට හැංගුණේය.

කිසිවෙක් පැමිණෙන ලකුණු.

"ඒ මමයි උතුමාණනි." කුල්හෙඩ් කීවේය. ඔහු පැපිරස් රෝල් පිරවූ විශාල පෙට්ටියක් ඔසවාගෙන ආයේය. "මට පෝර්මාගේ වාර්තාව ලැබුණා උතුමාණනි."

✸

පාරාවෝ සහ මහ රැජිනගේ නියමයන්ට අනුව, ඔවුන් ඉදිරියේදීම කුල්හෙඩ් පෝර්මාගේ වාර්තා ප්‍රධාන කවුන්සිලයට ඉදිරිපත් කළේය.

"පෝර්මා සහ ලැමසෙක්නි යුධ නායකයන් දෙදෙන, මධ්‍යම ඊජිප්තුවේදී දරුණු සටනකට මුහුණදී ඇත. උතුමාණන් වහන්සේගේ විධානයට අනුව, ඔවුන් තීබසය ආරක්ෂා කර ඇත. එහෙත් ඔවුන්, නෙම්රොඩ් කුමරු පාලනය කළ, තෝත්ගේ උතුම් නගරය වූ කමුන්ට පහර දී නැත. නෙම්රොඩ් පාරාවෝට ද්‍රෝහි වී ටෙෆ්නැක් ඉදිරිපිට දනින් වැටී සිටී. කෙසේ වෙතත්, ඔවුන් හෙනෙන් නෙසට් නගරය ආපසු අල්ලා ගැනීමට තැත් කළද, පෙෆ්ටෝගේ පරාජය හේතුවෙන් එයද ව්‍යර්ථ වී ඇත. දැන් ඒ නගරය බලකොටුවක් බවට පත්කර ඇති අතර, අප යුධ නායකයින්ගේ විශ්වාසය වන්නේ එය යටත් කර ගැනීම අපහසු බවයි."

"යුධ හමුදාවේ මෙහෙයුම පරාජිතයි." කවුන්සිලයේ ප්‍රධානියා කීය.

"තත්ත්වය අප සිතුවාට වඩා බරපතලයි." ලේකම්වරයා පිළිගත්තේය. "ටෙෆ්නැක් නියම යුධ නායකයෙක්. ඔහු හෙනෙන් නෙසට්හි උතුරු ප්‍රදේශයට අති විශාල හමුදාවක් යවා තිබෙනවා. එහි නගර තාප්ප අති දක්ෂ දුනුවායන් විසින් ආරක්ෂා කෙරෙනවා. ඒ නිසා ලැමසෙක්නි සහ පෝර්මා සැහීමකට පත් විය යුතුයි සතුරා බිය ගන්වා, ඔවුන් දකුණට යාම වැළැක්වීමෙන් පමණක්."

''ටෙෆ්නැක්ට තවමත් හැකිද තීබසයට පහර දීමට?'' කාපා ඇසීය.

''නැහැ. තීබසයට අවදානමක් නැහැ. අපගේ හමුදාවන් දකුණු දේශ සීමාව හා හරේ පළාත වසා දමා තිබෙනවා. ආමන්හි හමුදාවන් නිරතුරුවම සීරුවෙන්. සත්‍යය නම් ටෙෆ්නැක්ට තවත් ඉදිරියට යා නොහැකියි.''

''එසේම අපටත් තවත් උතුරට යා නොහැකියි.'' කාපා කෝපයෙන් කීය. ''පාරාවෝගේ අභිමානය කැළැල් වී හමාරයි. ඔහු තව දුරටත් ඔහුගේම රට පාලනය කරන්නේ නැහැ.''

''පෝර්මා හා ලැමසෙක්නි තම උත්සාහය නතර කර නැහැ. එහෙත් හටයින් මෙහෙයවීමේදී ඔවුන් ඉතා පරීක්ෂාකාරී විය යුතුයි. දැඩි අවදානමක් ගෙන අනතුරේ නොවැටිය යුතුයි. එඩිතරකම හා පළපුරුද්ද අතින් ඉතා ඉහළ ලැමසෙක්නිට අනුව ටෙෆ්නැක්ගේ බලහමුදා අතුගා දැමීම අපහසුයි.''

ඉන් පසු දැඩි නිහඬතාවක් පැවතිණ.

මහ රැජින කතා කළාය. ''මධ්‍යම ඊජිප්තුවේ ජනතාවගේ තත්ත්වය?''

ලේකම්වරයා තැතතීය. ''උතුමාවියනි මා... මා....''

''සත්‍යය පවසන්න කුල්හෙඩ්.''

''උතුරේ හමුදාවන් යුද්ධයක. ඔවුනට ඒ ජනතාවගේ සුභසිද්ධිය වෙනුවෙන් කාලය කැපකළ නොහැකියි. අපගේ හමුදාවන් අත්‍යවශ්‍ය ස්ථානවලට සහයට යනවා. එහෙත් උත්තමාවියනි, බොහෝ ගම්මාන විනාශ කොට තිබෙනවා. සිය ගණන් අහිංසක මිනිසුන් මියගොස්.''

''ඊජිප්තුව කරදර ගොඩක ගිලෙනවා.'' කාපා කීය. ''සාධාරණත්වය ආරක්ෂාව කොහිද? සෙස්සන්ට ගරු කිරීමක් ඇත්තේම නැහැ. නීතිය හා අවාසනාව පමණයි, සර්පයෙකු සේ රට පුරා ඇදී යන්නේ.''

''අප නතර කළ යුතුයි අපගේ හමුදාවන් අනවශ්‍ය ලෙස අනතුරට ලක්කිරීම.'' තර ඔටොකු කීය. ''තැනිය යුතුයි බලකොටු දම්වැලක් උතුරු තීබසය දක්වා. මධ්‍යම ඊජිප්තුව පරාජය වූ බව පිළිගෙන එයින් පාඩම් උගනිමු.''

''පියැන්කි, ඉහළ හා පහළ ඊජිප්තුවේ පාරාවෝ.'' මහලු කාපා විරෝධය පෑවේය. ''ඔහු තම භූමියෙන් භාගයකටත් වඩා වැඩි කොටසක්, දූෂිත කැරලිකාරයෙකුට, අනුකම්පා රහිත, කෲර ලෙස තම ජනයා පෙළන මිනිසකුට ලබාදීම.... නොකළ යුතුයි.''

''ඉතා උසස් දැක්මක්. එහෙත් එය යල්පැන ගිය එකක්. ඒ පිළිබඳ

වැලපෙන පළමුවැන්නා මමයි.'' ඔටොකු බිඳුණු හඬින් කීය. ''ඒ ස්වර්ණමය යුගය අවසානයි. කිසිවකුට නොහැකියි එය ආපසු කැඳවන්නට. අප සිහින දැකීම නවතා පවතින තත්ත්වයට මුහුණ දෙමු. පියැන්කි නුබියාව හා ඉහළ ඊජිප්තුව පාලනය කරනවා. ටෙෆ්නැක් රටේ ඉතිරි කොටස යටත් කරගෙන. ඔහු එය අත්හරින්නේ නැහැ. අපට ඇත්තේ එක අරමුණයි. අපගේ උතුම් චාරිත්‍ර, වටිනාකම් රැක ගැනීම. අප දිවියේ සාමය හා සතුට රැක ගැනීම. ඒ අතරම අප සාකච්ඡා කරමින් මේ නව සටන් වලින් ගොඩනැගුණු නව දේශ සීමාව වටහා ගනිමු.''

පියැන්කි නැගී සිටියේය. ඔහුගේ ස්වරූපය හා ඒ දෑසේ බැල්ම, ඔහු කළු දිවියෙකුට වඩා කෝපයෙන් සිටින බව කියා පෑවේය.

ශාලාව රජුගේ හඬින් දෙදරුම් කරන්නට විය.

''මා දැඩි සේ ප්‍රතික්ෂේප කරනවා, ඊජිප්තුවේ වඩාත්ම ශක්තිමත් මිනිසා යයි කියා ගන්නා ඒ සතුරාගේ අසාධාරණ හා වනචාරී ඉල්ලීම්. ටෙෆ්නැක්, මා ආට් නීතිය උල්ලංඝනය කර තිබෙනවා. ඔහු එය කරන්නේ මා ඊට ප්‍රතිප්‍රහාර දෙනතෙක් පමණයි. මගේ යුධ නායකයින් දෙදෙනා උතුරු හමුදාව වනසන්නට යවන විට මා බලාපොරොත්තු වුණා ඔවුන් එහි අවසානයක් දකීවි කියා. ඒත් කුමක්ද ඔවුන් කර ඇත්තේ? ඔවුන් සතුරාට හානි පමුණුවා නැතිතරම්. එපමණක්ද, ඔවුන් අප සතුරාගේ අධිෂ්ඨානය පෝෂණය කර තිබෙනවා. මා ජීවත්වන බව සත්‍ය වන්නා සේම 'රා' මට ආදරය කිරීම සත්‍යයි. මගේ පියාණන් වන ආමන් මට මග පෙන්වන බව සත්‍ය වන්නා සේම මා හුදකලාව ඊජිප්තුවට ගොස් ටෙෆ්නැක්ගේ කුමන්ත්‍රණය පරාජය කරනවා. මා සදහටම නවත්වනවා ඔහුගේ යුද්ධ කිරීම. උතුරු කුමාරවරු හඳුනාගනීවි මගේ යකඩ හස්තයේ ශක්තිය.''

ඒ කතාවෙන් පසු කිසිවෙක් කතා නොකළහ. රජු වහාම කාමරයෙන් පිටවී මාලිගය දෙසට ගියෙන් අබිලාද ඒ මග ගියාය.

''මා දන්නවා ඔබ මා හා එකඟ නොවන බව'' ඔහු ඇයට කීවේය. ''එහෙත් මට අයිතියක් නැහැ ආත්මාර්ථකාමී සතුටක් විඳින්නට, ඊජිප්තුව කෲර වේදනාවක සිටින අතරේ. මා තරයේ විශ්වාස කළා පෝර්මා හා ලැමසෙක්නිගේ සහයෙන් මට නපාටාව හැර නොගොස් සිටිය හැකි වෙතැයි කියා. මේ සටනට මගේ එක්වීම නවත්වාවි කියා. එහෙත් මා මගේ සතුරා අවතක්සේරු කළා ප්‍රේමිය. දැන් මගේ හදවත මා ගැනම කෝපයෙන්. මගේ දුර්වලකම වුණේ ඉදිරිය දැකීමේ හැකියාව සහ

පැහැදිලිව සිතීමේ හැකියාව නැතිකම. ඒ හේතුවෙන් ටෙෆ්නැක් කල්පනා කළා ඔහුට ගොඩබිම් දෙක යටත් කරගත හැකිය කියා. ඊජිප්තුව මේ බරින් නිදහස් කර ගැනීම භාර මටයි. මා වගකිව යුතුයි මේ කරදරයට ප්‍රේමිය.''

''ඔබ ටෙෆ්නැක් ගැන සිතන හැටි වැරදියි.'' අබිලා කීවාය. ''යටත් කර ගැනීම හා විනාශ කිරීමට. බලයට ඇති පිපාසය සංසිඳුවා ගැනීම එයයි ඔහුගේ ජීවන පරමාර්ථය. කිසිවකට හෝ කිසිවකුට එය ආපසු හැරවිය නොහැකියි.''

''ඔහු ආපසු හැරෙනවා. මට සහතිකයි.''

''පියැන්කි.''

''නැහැ අබිලා. මා යා යුතුයි. එවිට පමණයි මා ආටී නීතිය තව දුරටත් රැකෙන්නේ.පාරාවෝ තම පළමු වගකීම පැහැර හැරියොත් සතුට මහ පොළොවෙන් අතුරුදන් වේවි.''

''මා ඔබව නවත්වන්නේ නැහැ. මා ඔබ සමග එනවා.''

# 32

ඒ දරුණු යුද්ධය තරුණ ජීවිත ඉතා විශාල ගණනක් බිලි ගත්තේය. ඒ බියකරු දසුන, නෙම්රොඩ් කුමරුගේ සිහින බිඳ දැමීය. ප්‍රචණ්ඩත්වය පුපුරා යාම විසින් ඔහුට පෙන්වන ලද්දේ ඔහු කිසිදා නොපැතූ ලොවකි. පාලනය කළ නොහැකි හැඟීම් පිටාර ගලන ලොවකි. ඔහු ගත කළ ප්‍රභූ ජීවිතය ඔහු එවන් අවස්ථාවන්ට සූදානම් කර තිබුණේ නොවේ.

ඔහු අමුතුම භයංකාර හැඟීමකින් වෙළී ගියේය. ඔහුට අහිමි වූයේ ඔහුගේම නගරයයි. ඔහු එය අතහැර මෙම්පිස් බලා යාමට සිතා සිටි නමුත් දැන් ඔහුට එහි ස්මාරක, පටු වීදි හා ගෙවල් දකින්නට ආසාය. හෙනෙන් නෙසට්හි සිරවී සිටින ඔහු තම ජනතාව භාර දී ඇත්තේ කවරෙකුටද? ලේ හැලීම හැර අන් ආශාවක් නොමැති සොල්දාදුවෙකුට නොවේද? හෙට ඒ සොල්දාදුවා, තෝත් පැරණි නගරයත් වනසනු ඇත.

නෙම්රොඩ් ටෙෆ්නැක්ගේ හමුදා මූලස්ථානයට ගියේය. එහෙත් යෙගෙබ් ඔහුගේ ගමන නැවැත්වීය.

"කණගාටුයි කුමරුනි. ජෙනරාල් ටෙෆ්නැක් බොහොම අවිවේකීයි."

"පසෙකට වනු."

"මා ඔබට පැවසුවා."

ඔහුට නුපුරුදු දැඩි බවකින්, යෙගෙබ් පසෙකට තල්ලු කළ නෙම්රොඩ්, කාර්යාලයේ දොර තල්ලු කළේය. ජෙනරාල් සිතියමක් දෙස බලා සිටියේය. එහි ඔහුට යටත් ප්‍රදේශ රතු පාටින්ද, පියැන්කිට යටත් ප්‍රදේශ කළු පැහැයෙන්ද වර්ණ ගන්වා තිබිණි.

"මට අවශ්‍යයි ඔබට කතා කරන්නට." නෙම්රොඩ් හඬ නගා කීය.

"එන්න කුමරුනි. දොර වසා තබන්න. මේ සිතියමයි මගේ වඩාත්ම වටිනා යුධ රහස."

"කිමද මට ඉඩක් නැත්තේ එය බලන්නට?"

ටෙෆ්නැක්ගේ කළු ඇස් විස්මයෙන් බැබළිණි.

"ඔබ තුළ යුධ කලාව ගැන කැමැත්තක් උපදිනවාද කුමරුනි?"

"මා පුද්ගලිකවම මගේ නගරය පියැන්කිට එරෙහිව ආරක්ෂා කරනවා. කමුත් වඩාත් හොඳින් දන්නේ මමයි. අපගේ උගුල නියමාකාරයෙන් වැඩ නොකළ නිසා අප බිඳ දැමූ ආරක්ෂක බැම්ම යළි ගොඩනගන්නට මා සූදානම්. තාප්ප සියල්ල හොඳින් තනන්නට මට හැකියි."

ටෙෆ්නැක් සැකයෙන් බැලීය. "එය... ඒ සිතිවිලි අප බලාපොරොත්තු වුණේ නැහැ නෙම්රොඩ්."

"ජෙනරල්, ඔබ මේ යුද්ධය වෙනුවෙන් මා මිලට ගත්තා. ඒ යුද්ධයේ අනාථයින්ගේ ලේ මගේ ඇස් නිලංකාර කළා. මෙසේ දැඩි මානසික පීඩනයෙන් සිටින මට එකක් පැහැදිලියි. මේ මිහිපිට මා වඩාත් ආදරය කරන්නේ මගේ නගරයටයි. එයයි සත්‍යය."

"පියැන්කි පෙරළා පහර දුන්නොත් ඔබයි ඉදිරියෙන්ම සිටින්නේ."

"මා කළු පාරාවෝ ගැන හොඳින් දන්නවා. ඔහු කිසිදා නපාටා හැර යන්නේ නැහැ. ඔහුගේ මිනිසුන් තවත් ඉදිරියට නොයාවි. ඔවුන් මගේ පළාතෙහි දකුණෙහි බලකොටුවක් ඇතිකරාවි."

"මා එය විනාශ කරනවා." ටෙෆ්නැක් පොරොන්දු විය.

"මා මගේ වැසියන් සමග ඔබට සහාය දෙනවා."

"බොහොම හොඳයි නෙම්රොඩ්. කමුත් වෙත ආපහු යන්න. එය කිසිදා පරාජය කළ නොහැකි මුරපොළක් බවට පත් කරන්න."

✸

ලැමසෙක්නි තරු පිරි අහස යට තද නින්දට වැටී සිටියේය. ඔහුගේ දෙපසින් වැතිර සිටියේ ඕනෑම අනතුරකදී එය ඔහුට දන්වන සූදානමින් සිටි, වැල්ලේම පැහැය ගත් බල්ලන් දෙදෙනෙකි. වනසතෙකු සේ සැහැල්ලුවෙන් නිදන ඔහු, නුබියාවේ තණබිම්වල හුදකලාව ගිය දීර්ඝ ගමන් ගැන සිහින දුටුවේය. ඔහු බලාපොරොත්තු වූයේ සතුට දනවන විවෘත සටනකි. එහෙත් අද ඔහුට මුහුණ දෙන්නට සිදුව ඇත්තේ නිමාවක් නැති කෲර යුද්ධයකටයි.

තීබසයට දැඩි ආරක්ෂාව සපයන හමුදාවන් අතරින් සහාය හමුදා ලබා නොගත් නුබියානු හමුදාවේ අරමුණ වූයේ සුළු සටන් ජය ගනිමින් තම සම්පත් රැක ගැනීමයි. සති දෙකකට පෙර නිදහස් කරගත් ගම්මානයක් උතුරු හමුදා ප්‍රහාර හේතුවෙන් යළි අතහැරෙයි. මෙසේ දිනුම, පැරදුම

අතර ගෙවෙන කාලය ලැමසෙක්නිගේ මානසික ශක්තිය බිඳ දමන්නට විය. ඔහුගේ බලාපොරොත්තු වැසිකිළි වළක අඩියටම ගිලී ඇත. යුද්ධයද, සාමයද නොවන , අනාගත බලාපොරොත්තු කිසිවක් නැති අන්ත දිළින්දන් තවත් දිළිඳු බවට පත් කරන තත්ත්වයක් උදාවී තිබිණි.

ඔබට බලාපොරොත්තු විය හැකි එකම ප්‍රතිඵලය එය නම්, සටන් වැදීමේ තේරුම කුමක්ද? තම තනතුරෙන් ඉල්ලා අස්වී අසිපත කළු පාරාවෝට භාර දෙන්නටයි ලැමසෙක්නිට සිතුණේ. ඉතා කැපවීමෙන් සටන් කරන තරුණ සොල්දාදුවන්ට, හෙට උදාවන්නේද මේ හිරුම බව පවසන්නට ඔහුට සිදුවිය.

බල්ලන් දෙදෙන එකවරම ගොරවන්නට වූහ. ලැමසෙක්නි අසිපත අතට ගෙන වහා නැගිට්ටේය.

''ඒ මම පෝර්මා.''

''කිමද මේ මැදුම් රැයේ?''

''ටෙෆ්නැක්ගේ හමුදාවන් හරේ පළාතේ දේශ සීමාවන් බිඳගෙන ඇතුල් වෙන්න තැත් කරනවා.''

''එපමණද?'' ලැමසෙක්නි ඇනුමක් පිට කළේය.

''ඔවුන් ජයගතහොත් තීබසයට පහර දේවි.''

''නැවත මා අවදිනොකරන්න. මා යොදවා තිබෙන මිනිසුන්, ඔවුන්ට ඇතුල් වීමට ඉඩ නොදේවි.''

''ඔබ වැරදි නම්?''

''හොඳින් නිදන්න පෝර්මා.''

✸

නාට්‍රෙබ්ගේ මුහුණ කෝපයෙන් රත්පැහැ ගැන්විණ. ''වැඩකට නැති බියගුල්ලන්. උතුමාණනි, ඔබ ඔවුනට දඬුවම් දිය යුතුයි.''

ටෙෆ්නැක්ගේ අප්‍රසන්න මුහුණේ කෝපයක සලකුණු නොවීය. ''ඒ කෙසේද? හදිසි ප්‍රහාරයට එක්වූ සියලුම හටයින් මියගියා. දන්නවද? ඔබයි ඔවුන් තෝරාගත්තේ. ඔවුනට ස්මාරක හෝ අවමංගල චාරිත්‍ර නැහැ. තවත් කුමන දඬුවමක්ද ඔවුනට දිය හැකි? ඔබට අවශ්‍ය වූයේ සතුරු හමුදාවන්හි ශක්තිය මනින්නටයි. දැන් අප එය වඩාත් හොඳින් කරගත්තා. හරේ පළාතේ දේශ සීමාව තරණය කළ නොහැකියි.''

නාට්‍රෙබ්ගේ රවුම් මුහුණේ වියරු සිනාවක් ඇඳුණි. ''අඩුම තරමින්

අප දන්නවා, ඔබට පහර දීමෙන් ප්‍රයෝජනයක් නොමැති බව පියැන්කි තේරුම් ගත්බව. ඔහුගේ උත්සාහය ප්‍රහාරයෙන් ආරක්ෂා වීම පමණයි.''

''ඔහු සිතනවා නම්, ඔහුයි ගොඩබිම් දෙකේ පාරාවෝ කියා, මේ තරම් නීච ලෙස ඔහුගේ රජකම ප්‍රතික්ෂේප කරන තත්ත්වය තව වැඩිකලක් පවතින්නේ නැහැ.''

උපදේශකයා ප්‍රශ්නාර්ථයෙන් බැලුවේය. ''ඔබ සිතනවාද ඔහු පුද්ගලිකව මීට මැදිහත් වෙතියි කියා?''

''නැහැ'' ටෙෆ්නැක් පිළිකුලෙන් යුතුව පැවසීය. ''කළු පාරාවෝ තම නුබියානු අගනුවර හැර යාමට කැමති නොවේවි. චාටු බස් වලින් ඔහු නහවමින් ඔහුගේ දෙපා වඳින රාජ සභිකයන් සමග ජීවිතය සතුටින් ගත කරන්නෙක්, කළු පාරාවෝ.''

''එසේ නම් කුමක්ද ඔබ කල්පනා කරන්නේ?''

''ඔහු තම කෝපය ප්‍රකාශකිරීම ගැන..... කමුන්ට පහර දීම.''

නාට්‍රෙබ් තම මහත ඇඟිලි එකිනෙක අතුල්ලා හැරියේය. ''නෙම්රොඩ් කුමරුගේ පක්ෂපාතිත්වය ගැන යෙගෙබ්ට විශ්වාසයක් නැහැ. මටත් නැහැ.''

''නුඹ මා මෝඩයකු කියා සිතුවාද? පක්ෂපාතිත්වය යනු, යුද්ධය ගැන කිසිත් නොදත් සදාචාරය උගන්වන අය විසින් නිමවන ලද සංකල්පයක්. වෙනත් ඕනෑම කෙනෙකු මෙන්, නෙම්රොඩ් සූදානම් ඕනෑම වෙලාවක තමාගේ වාසිය වෙනුවෙන් වැඩ කරන්නට. එහෙත් ඔහු සියල්ල කරන්නේ ඔහුගේ නගරයට ඇති ආදරය වෙනුවෙන්. ඔහු දන්නවා ඔහු කළ පාවාදීමට පියැන්කි කිසිදා සමාව නොදෙන බව. ඒ නිසාම ඔහුට ඇත්තේ එකම විසඳුමයි. ඔහු කමුන්, බලකොටුවක් බවට පත්කළ යුතුයි. ඕනෑම ප්‍රහාරයකට මුහුණ දිය හැකි තරම් බලවත් තැනක්. ඉන්පසුව එය රැක ගැනීමට අවසන් ශක්ති මාත්‍රය දක්වාම සටන් කළ යුතුයි. දෙගිඩියාවෙන් සිටින නෙම්රොඩ් මගේ යුධ සැලසුමේ එක ශක්තිමත් කණුවක් බව පත්වී හමාරයි.''

''උතුමාණනි, ඔබ මට අණකරන්නේ වෙනත් හදිසි ප්‍රහාරයක් සැලසුම් කර හරේ පළාතට කඩා වදින ලෙසද?''

''එවැනි අසම්පූර්ණ සැලසුම් වලින් පලක් නැහැ. ඩේබ්‍රේක් නිවැරැදියි. ඔබ සහ යෙගෙබ් අප පාලනය කරන භූමියේ පරිපාලන කටයුතු වල පමණක් යෙදිය යුතුයි. එපමණයි.''

නාට්‍රෙබ් කෝපයෙන් වෙව්ලා යමින් ඉවතට ගියේය.

නිරුවත් දෙපයින්, නිහඬව පැමිණි ජෙනරල්ගේ අනියම් බිරිඳ, තම සුවඳැති දෑත් ඔහුගේ පපුව මත තැබුවාය.

ඇය මෙසේ කීවාය. "ඒ යෙගෙබ් සහ ඔහුගේ මිතුරාගෙන් ඈත්වන්න. ඔබේ අනාගතය ගැන ඔවුන් තුළ කිසිදු හැඟීමක් නැහැ. ඔවුන්ගේ එකම අවශ්‍යතාවය තම තමන්ගේ වස්තුව වැඩිකර ගැනීමයි."

ටෙෆ්නැක් ඇගේ සිහින් ඇඟිලි සිපගති. "ඔබ සිතනවාද මා ඒ බැව් නොදන්නවා කියා. හැම රජෙකුටම ඔවුන් වැනි පණුවන් අවශ්‍යයි. හිතුවක්කාරයන් ඉවත් කරන්නටත්, දෙපසට වැනෙන්නන් දඩයමටත්, තම තත්ත්වය හා වරප්‍රසාද ලබා ගන්නටත් ඒ නීචයන් කිසිවිටක පැකිලෙන්නේ නැහැ. කිසිදු දෙගිඩියාවක් නැහැ මිනීමැරුමට හෝ දූෂණයට. ඒ නිසයි ඔවුන් මගේ වටිනාම සහායකයින් වන්නේ."

# 33

''උතුමාණනි, එය කළ නොහැකියි'' කළු කොට් සමක පැහැගත් සිවුරක් හැඳි පූජකවරයා දැඩි සේ විරෝධය පළ කළේය.

''මා යා යුතුයි.''

''එහෙත් තාරකාවන් ඔබේ වාසියට හැරෙන තෙක් ඊට ඉඩදිය නොහැකියි. ඒ ගැන නොසලකා හැරීමෙන් ඔබේ ඉදිරි කටයුතු අසාර්ථක වේවි. අප තරු දරුවන් උතුමාණනි. අප ඔවුන්ගේ පණිවුඩයට ගරු කළ යුතුයි.''

''කොපමණ කලක් මා නැවතී සිටිය යුතුද?''

''දින කීපයක් උතුමාණෙනි. '' පූජකයා කීය. ''අලුත් සඳ උදාවන තෙක්. සඳ, හෝරස්ගේ වම් ඇස, ඔබේ ගමනට ඔබ හා එක්වන විට සෙට් විනාශකරුවාට එයට බාධා කළ නොහැකියි. එවිට සහෝදරයින් දෙදෙනාගේ අරගලය නැවතී, ඔවුන්ගේ ශක්තිය ඔබට ලැබේවි. එවිට ඔබේ බලය සඳත් සමග වැඩිවේවි. මතක තබාගන්න උතුමාණනි. සඳ පිරී යමින් පළමු තත්ත්වයට පත්වන විට, එයයි ප්‍රීතිමත් ඊජිප්තුවක සලකුණ.''

✸

පියැන්කි තම සොල්දාදුවන්ගේ ආයුධ පුද්ගලිකවම පරීක්ෂා කළේය. ඔවුන්ගේ කෙටිසාය, පාවහන්, ඉණපටි, අසිපත්, පපු සැරහුම්, පළිහ, දුනු හා ඊතල යන සියල්ල අතරින් බාල තත්ත්වයේ වූ සියලු දෑ ඉවත් කරන ලදී. වියළි මාලු, බඳුන්වල සකස් කර තිබිණි. ගමනේ දුර සහ භට සංඛ්‍යාවට අනුව, මාළු වෙළෙන්දන් හා ආහාර කල්තබාගන්නන් දිවා රාත්‍රී සේවය කළහ. අබිලාටද විවේකයක් නොවීය. ඇගේ හා සැමියාගේ එකඟතාවයකට අනුව, සෞඛ්‍යය, පිරිසිදුකම, විශේෂයෙන්ම බැලනයිට් ගසේ පොතු හා සාරයෙන් නිපදවන සබන් පිළිබඳව භාරව සිටියේ ඇයයි.

මුළු නපාටාවම පියැන්කිගේ පිටත්වීම සඳහා සූදානම් වෙයි.

ඒ දවස ළං වනවිට ඔටොකුගේ කැම රුචිය නැතිවිය. පියැන්කි හා කතා නොකර සිටීමට නොහැකි ඔහු පිටතට ගියේය. රෝද තනන වැඩපොළකදී ඔහුට තම පාරාවෝ හමුවිය.

"උතුමාණනි, මා මේ මුළු කාලය තුළම කල්පනා කළා.'

පියැන්කි පුදුමයට පත්විය. "කුමක්ද ඔබේ සිත් කරදරය මිත්‍රය?"

"ඔබ නපාටා හැර යාම උමතුවක් උතුමාණනි. නපාටාවට ඔබ අවශ්‍යයි."

"මේ නගරය ධනවත්. සාමකාමියි. කුමටද බියවන්නේ?"

ටෙෆ්නැක් ඔබ මරා දමා නුබියාව යටත් කරගතහොත් , එසේත් නැතිනම් උතුරෙන් එන කුමන්ත්‍රණ පරාජය කිරීමට ඔබ තීබසයේ නැවතී ඊජිප්තුව හා නුබියාව පාලනය කළහොත් නපාටා නොසලකා හැරේවි.

"ඔබ පවසන දේ සත්‍යයි." රජු කීය. "එහෙත් මගේ දෛවය මට අයිති නැහැ. ආමන් මා පාරාවෝ ලෙස තෝරාගත්තා. එයින් ඔහු මට ලබාදුන් සතුට අපමණයි. අද මගේ රට දුකට පත්වනවිට, කැඩී බිඳී යාමේ තර්ජනයට මුහුණ පා ඇතිවිට කෙසේද මා අකෘතඥව බලා සිටින්නේ?"

"ඔබට හැකියි වෙනත් යුධ හමුදාවක් යවන්නට."

"පාරාවෝගේ කීර්තිය කැළැල් වී තිබෙනවා. ඔබ හෝ මගේ අනෙක් රාජ්‍ය තාන්ත්‍රිකයින් ඒ අවමානය ඉවසිය යුතු නොවෙයි."

"එහෙත් ඔබ නොමැතිව නපාටාව පවතින්නේ කෙසේද උතුමාණෙනි?" ඔටොකු මහත් ශෝකයෙන් ඇසීය.

"මා මගේ අගනුවර භාරදෙනවා. ඊට ආදරය කරන, ඕනෑම ප්‍රහාරයකින් එය ආරක්ෂා කරන නිලධාරියෙකුට, ඔබට ඔටොකු"

"එහෙත් උතුමාණනි?"

"ඔබ විශිෂ්ට ආණ්ඩුකාරයෙකු වේවි. නොකඩවාම මහලු කාපාගේ අදහස් විමසමින් ඒ කාර්යයේ යෙදෙන විට, තීබසයෙන් නපාටාවටත් නපාටාවෙන් තීබසයටත් නොකඩවාම පණිවුඩකරුවන් ගමන් කරාවි. ගැටලුවක් තිබේද?"

"නැහැ උතුමාණනි."

"කොතරම් හොඳද? ඔබ හොඳ සෝදිසියෙන් සිටින්න."

පියැන්කි වැඩපොළ තුළට ගියේය. අති දක්ෂ රෝද තනන්නා වැඩෙහි යෙදී සිටියේය. ඔහු වඩාත්ම දක්ෂතා දැක්වූයේ අශ්වරථ රෝද තැනීමටයි. යුද්ධයේ අවසන් ප්‍රතිඵලය රඳා පවතින්නේ එක සුළු කරුණක් මත බව රජු දැන සිටියේය. ඒ යුද්ධයේදී දැඩි ප්‍රහාරවලට ලක්වන මේ රෝද වල ශක්තියයි.

රෝද තනන්නා තමාගේම ක්‍රම යොදා ගනිමින් ගරාදි සහ රෝදවල ප්‍රමාණය නිවැරදිව යොදා තිබිණි. රථවල තත්ත්වයද ඉතා උසස් විය.

''වැඩ අවසන්ද?'' රජු ඇසීය.

''තව දින දෙක තුනකින් උතුමාණනි. එවිට මට හැකියි ඔබ ඇනවුම් කළ සියලුම රථ භාරදෙන්නට.''

''ඔබට හැකිද ඒවායේ තත්ත්වය ගැන සහතික වෙන්නට?''

''මගේ දිවි දෙවෙනි කොට උතුමාණෙනි. බොරලු, වැලි, තණබිම්, කඳු, හෙල් ඕනෑම තත්ත්වයක බිමකදී ඒවා ඔබට ජය ලබාදේවි. මගේ පොරොන්දුව උතුමාණෙනි.''

නිර්මාණකරුවා තමා අවසන් කළ රථ දෙස දැඩි සතුටකින් බැලීය. ''රෝදය කොතරම් විශ්මයජනකද? එය පෙනෙන්නේ චලනය කළ නොහැකි, සවිකළ යමක් ලෙසයි. එහෙත් එය සතුව තිබෙනවා කරකැවීමේ රහස. එයට හැකියි එය යන ගමන් සියල්ල සිහි කරන්නට. එහෙත් එය කිසිදු ගමනකට නොයන්නේ නම් කොතරම් හොඳද උතුමාණනි? මන්ද එය ගමන් අරඹන්නේ යුද්ධයේදී පමණක් නිසා.''

''මා උතුරු හමුදාවන් සමග සටන් නොකළහොත් ඔවුන් නපාටාවට පැමිණේවි ජල ගැල්මක් ලෙසින්. මා ගොඩනැගූ සියල්ල විනාශ කරාවි. ඔබට ස්තුති වෙන්ට මට ඒ විනාශය වැළැක්විය හැකියි.''

✸

''පියාණනි?''

''ඔබ සූදානම්ද මා දියණිය?'' රජු ඇසීය.

''මට අවශ්‍ය වුණා අමතක කරන්නට දිනෙක මට සිදුවන බව මා උපන් බිම, මගේ නගරය, මා හොඳින් හඳුනන මට සතුට දෙන මේ වැඩපොළ හැර යන්නට සිදුවන බව. පවසන්න පියාණනි, ඔබ ඔබේ සැලසුම ඉවත දැමුවාද?''

''ඔබ දන්නවා මා එසේ නොකළ බව''

"මගේ මුළු දිවියම මා තීබසයේ ගත කළ යුතුද පියාණනි?"

"එයයි නීතිය දියණියනි. ආමන්ගේ බිරිඳ ඊට අවනත විය යුතුයි."

මෙපෙනා වැලපුණාය. "ඔබ මගේ හදවත බිඳ දමනවා පියාණෙනි."

පියැන්කි මෘදු ලෙස ඇය වැළඳගති. "මා දන්නවා දියණියනි, එහෙත් ඔබේ පූර්වජයාමයි මට මග පෙන්වූයේ ඔබ තීබසයේ අනාගත රජු ලෙස නම් කරන්නට. ඔබ කාර්නැක් පාලනය කරනවා. එහි ප්‍රධානතම දෙවොල, අපගේ ශිෂ්ටාචාරයේ උතුම් හදවත ආරක්ෂා කරන ස්ථානය"

"මේ මෙහෙයුම ඉතා බිහිසුණුයි උතුමාණෙනි."

"නැහැ දියණියනි. එය තැතිගැනෙනසුළු දෙයක් පමණයි. ඔබ ආමන්ගේ බිරිඳට අයත් චාරිත්‍රානුකූල සිවුරක් පොරවාගත් විගස ඔබගේ පූර්වජයින්ගේ ඥානය ඔබේ වඩාත්ම වැදගත් සහාය බවට පත්වේවි. බිය නොවන්න මා දියණියනි. ඔබ තවමත් සත්‍ය ස්වභාවය වටහාගෙන නැති බලයක ආරක්ෂකයා වන්නේ ඔබයි. ඒ බලය ඔබට ලැබෙන්නේ ඔබට උපතින්ම උරුම වූ ඒ නිලය භාරගත් විට පමණයි."

"මා පිටත් වීමට වේලාව පැමිණෙන තෙක් දොවොල තුළ භාවනා කරනවා පියාණෙනි."

ඇය තම පියාණන්ගේ දෑත සිප ගත්තාය.

*

පියැන්කි බැස යන හිරු රැසින් එළිය වූ ශුද්ධ වූ කන්දේ මුදුනත දකින්නට නගරයෙන් පිටවිය.

මූර්ති ශිල්පියෝ ඔවුන්ගේ කාර්යය අවසන් කර තිබිණි. නූබියාවේ හදවතෙහි නීතිය ස්ථාපිත වූ බවට ගිබෙල් බාර්කල් සාක්ෂි දරනු ඇත. පියැන්කිගේ උගුර සිරවිය. නැවත එය දකින්නට ඔහුට අවස්ථාව උදාවේද? කාර්නැක් දෙවොලේ දෝංකාරය බඳු ආමන් දෙවොල තනා ඇත්තේ ඒ ශුද්ධ වූ කන්දේ සෙවනැල්ලෙහිය.

ඔහු කිසිදා එය හැර යන්නට සිතුවේ නැත. මහලු වියද එහි ආරක්ෂාව ලබමින් ගෙවන්නට ඔහුට අවශ්‍ය විය.

එහෙත්, දෛවය එක්වරම ඔහුට අණකළේ වෙනත් මෙහෙයුමකි. කිසි ලෙසකින් හෝ මගහැරිය නොහැකි වගකීමකි. ඔහුගේ සතුට, සාමය, දියුණුව ඔහුගේ මාලිගයේ චිත්තාකර්ෂණීය බව හෝ අන් කිසිවක්, ඊජිප්තුවට අවාසනාව ළංවන විටෙක ඔහුට වටින්නේ නොවේ.

පියැන්කිට පියවරක් ඇතින් පඳුරු සෙලවිණි. ඉන් පිටතට පැන්නේ පහර දීමට සූදානම්ව සිටි කළු නාගයෙකි. පාරාවෝට සිතන්නටවත් කාලයක් නොවීය. ඒ ක්ෂණයේම සර්පයාට වඩා වේගවත් වූ මුගටියකුගේ* දත් අතර උගේ ගෙල සිරවිය.

මුගටියා වනාහි නිමැවුම්කරු වූ ඒටම්ගේ අවතාරයයි. යම් යම් අවස්ථාවන්හිදී මිනිසුන්ට හීලෑ කරගත හැකිවූ මුගටියා, ඔවුන්ගේ නිවෙස් තුළ සිටි හූනන්, මීයන් හා සර්පයින් විනාශ කර තිබිණි. ඊට ස්තුතියක් ලෙස, මුගටියා මියගිය පසු මමියක් සකස් කොට ඉතා කුඩා ශෛලමය පෙට්ටියක් තුළ තැන්පත් කරන්නට යෙදිණි.

උගේ ලොම් කෝපයෙන් වෙව්ලා ගියේය. උල් හොම්බ සහ දිග වලිගයක් ඇති මුගටියා, සර්ප දෂ්ටනයෙන් බේරෙන සියලු සටන් ක්‍රම දැන සිටියේය. ඒ පොරය අති භයානකය. කෙටිය. මුගටියා හතිලමින් නාගයාගේ සිරුර දෙස බලා සිටියේය.

පියැන්කි මුගටියා ඔසවාගති. සත්ත්වයා බේරී යන්නට තැත්කළේ නැත.

"ඔබ මට පෙන්නුවා කළ යුතුදේ. මා ඔබ ගෙනියනවා මා සමග." රජු කීවේය.

* - පාරාවොගේ මීයා නම් සුරතල් නාමය ලද මුගටි වර්ගයක්.

# 34

එය ජයග්‍රාහි සතියක් විය. නුබියානු හමුදාවට ගම්මාන දෙකක් අහිමිව තිබූ අතර ඔවුන් ලිබියානු ජංගම මුර සේවාවන්ට පහර දී තිබුණේද නැත. ටෙෆ්නැක් වෙත උතුරෙන් නොකඩවාම අවශ්‍ය තරම් ආයුධ ලැබුණු අතර හෙනෙන් නෙසට්හි මුර පොළවලට ඒවා එවන්නට යෙදිණි.

ඔහු සිංහ පාදවල හැඩැති කකුල් සහිත මිටි පුටුවක හිඳ සිටියේය. ඩේබ්‍රේක් ඉතා වටිනා බොරු කොණ්ඩයක් ළඟ තබාගෙන තම කොණ්ඩය පීරුවාය.

''මේ තත්ත්වය පැවති කාලය හොඳටම ප්‍රමාණවත්'' ඔහු කීය. ''අප ක්‍රමයක් සෙවිය යුතුයි නුබියානුවන් සටනට පොළඹවන්නට. ඊළඟට ඔවුන් සහමුලින්ම විනාශ කොට, තීබසයේ රඳවා තිබෙන හමුදාවන් ඔවුන්ගේ සහයට ගෙන්වන්නට සැලැස්විය යුතුයි. ඉන්පසු අපේ ගමනට කිසිදු බාධාවක් නැහැ.''

''ඊට වඩා හොඳ සැලසුමක් නැහැ පෙම්වත.''

''එසේනම් එය ක්‍රියාවට නංවමු. අප සතුරාට ඇඟවිය යුතුයි හෙනෙන් නෙසට් නගරයට පහර දීම ඉතා පහසු බව.''

''ඇයි ඔවුන්ට අඟවන්නේ නැත්තේ ඔබ නගරය හැරගිය බව? පෙෆ්ටෝ යළිත් පියැන්කිට පක්ෂපාතී වූ බව? නුබියානුවන් එය විශ්වාස කර පහසුවෙන්ම උගුලේ හසුවේවි.''

ටෙෆ්නැක් ඩේබ්‍රේක්ගේ ගෙල සිපගති. ''ඔබට හැකියි යුධ කවුන්සිලයේ වැඩ සියල්ලම කරන්න, තනිවම.''

''මට අවශ්‍යයි ඔබගේ නාමයෙන්, ඊජිප්තුවේ නාමයෙන් ජයග්‍රහණය.''

ටෙෆ්නැක්ගේ සේවකයින් අතරින් කනිෂ්ට නිලධාරියෙක් එතැනට පැමිණියේය. යෙගෙබ්ට ජෙනරාල් හමුවීමට අවශ්‍යය.

''පසුව''

''ඔහුගේ ඉල්ලීම, හදිසියි උතුමාණනි.''

''හොඳයි ඇතුලට එවනු.''

යෙගෙබ්ගේ දෑසින් බිය උතුරා යයි. ''උතුමාණනි, භයානක පුවතක්.''

''කාගෙන්ද?''

''තීබසයේ අපගේ පණිවුඩකරු ජාලයෙන්. පියැන්කි පණිවුඩයක් එවා තිබෙනවා ඔහු නපාටාව හැර ආමන් නගරයට ගමන් කරන බවට.''

''විශ්වාස කළ නොහැකියි.'' ටෙෆ්නැක් සෙමින් කිය.

ඩේබ්‍රේක් තම රුමත් සිරුර සුදු සලුවකින් වසා ගත්තාය. ''එසේනම් සියල්ල වෙනස් වේවි.'' ඈ කීවාය. ''නුබියානු නායකයා සමග යුද්ධය ඉක්මනින් ඇරඹේවි. ටෙෆ්නැක් හා පියැන්කි මුහුණට මුහුණ. කළු පාරාවෝගේ මරණයත් සමගම ඔහුගේ හටයින් ආයුධ බිම තබාවි.''

''ඇත්තෙන්ම.'' යෙගෙබ් හිස වැනිය. ''ඒත් කෙසේද අප සටනක් සංවිධානය කරන්නේ? දකුණ අයිති ඔහුටයි.''

''ඔහුගේ ගමන දීර්ඝ, අපහසු එකක්. අපි උත්සාහ කරමු අධිෂ්ඨානශීලි කීප දෙනෙක් රහසේම යවන්නට පෙරදිග කාන්තාරය හරහා. ඔවුන් පරාජය වුවහොත් පියැන්කි තීබසය බලා ඒවි. ආමන්ගේ නගරය තම සොහොන කර ගන්නට.''

✸

තරුණ, එඩිතර, ආලය කිරීමට උපන් ගැමි තරුණියකට පින්සිදුවන්නට ලැමසෙක්නි ඉතාමත් ප්‍රීතිමත් රාත්‍රියක් ගතකර තිබිණි. පසුගිය සති කීපය තුළ සිදුවූ පරාජයන් අමතක කරමින් පැය කීපයක් ගත කරන්නට ඔහුට හැකිවිය. ලිබියානු ජංගම මුරසේවා නැත. සටන් නැත. දිනෙන් දිනම මේ තත්ත්වය දියුණු වන බව පෙනිණි.

ලැමසෙක්නි තීබසයේ රඳවා සිටින හට හමුදාවන් ගෙන්වා ගැනීම සඳහා පෝර්මා පෙළඹවීමට තැත් කළේ එක් වරක් පමණක් නොවේ. එයින් ඔහු අදහස් කළේ හෙනෙන් නෙසට් හි අති විශාල හමුදාවක් සමග සටන් කිරීම නොවේ. හරේ පළාතේ යම් යම් කොටස් නැවත අල්ලාගෙන ප්‍රදේශයේ ආරක්ෂාව තර කිරීමයි. එහෙත් පෝර්මා ඊට එකඟ වූයේ නොවේ.

මෙවර ලැමසෙක්නි හිත හදාගෙන සිටියේය. තම ඉල්ලා අස්වීමේ ලිපිය පෝර්මාට දී, අණ දීම ඔහුට පැවරීමටයි ලැමසෙක්නි සිතුවේ.

හොඳ සටනක් මෙහෙයවීමට කිසිදා ඉගෙන නොගත්තා දුනුවායකුට යුද්ධය භාරදීම ලැමසෙක්නිට දරාගත නොහැකිය. එහෙත්, තව දුරටත් මේ මඩ වගුරේ එරී සිටිමින් ගත කිරීම ඊටත් වඩා වේදනාකාරිය. ඒ ගමනේ සතුට ටිකෙන් ටික වියැකී යමින්, ඔහුද හෙමින් හෙමින් වියැකී යන්නට විය.

පුළුල් සිනාවක් පාමින් තමා දෙස එන පොර්මා දුටු ලැමසෙක්නිට සිතුණේ තම සිතිවිලි ඔහු හඳුනාගත් බවකි. තනිව යුද්ධයට අණ දීමේ නිදහස ලැබීමෙන් සතුටුවන දුනුවායා!

''තීබසයෙන් පණිවිඩයක්.'' පෝර්මා කීය.

''අලුත් අණක්ද?''

''ඊට වඩා හොඳ දෙයක්. බොහොම හොඳ දෙයක්.''

ලැමසෙක්නි රවා බැලීය. ''මට තේරුම් ගත නොහැකියි.''

''පියැන්කි මෙහි එනවා.''

✸

කමුන් වෙත පැමිණි දා පටන් නෙම්රොඩ් කුමරුගේ දිවිය වෙනස් මගක් ගති. ඔහු තම පැරණි ජීවන රටාවට ඇබ්බැහි විය. ඔහුට ඔහුගේ රාජ සභාව , මාලිගාව, ප්‍රියතම කෝකියා යළි හමුවූ අතර අහිමි වෙන්නට ගිය ඒ නගරයේ මාවත් පුරා ඇවිදීම ඔහුට සතුටක් විය.

ගැහැනු සහ උත්සව දෙවෙනි පෙළට දැමූ ඔහුගේ පළමු පෙම්වතිය කමුන් විය. ඔහු එහි පෙනුම වරින් වර වෙනස් කරමින් ඊජිප්තු භූමියේ ලස්සනම, ආශ්චර්යමත් නගරය බවට පත්වන තෙක් වෙහෙස වුණි. ඔහුගේ සේවකයා යුද්ධය තවමත් පවතින බව සිහිකළ විට, ඔහු දුන් පිළිතුර වූයේ මේ තත්ත්වය දශක ගණනාවක් පවතින බවත්, එය අමතක කරන ලෙසත්ය. එසේය අමතක කළ යුතුය. ඔහු තමාගේම දේශද්‍රෝහී බව අමතක කළා සේ.

කුමරා සිසිල් සුදු වයින් කෝප්පයක් තොල ගෑවේය. තෝත් දෙවියන්ගේ දෙවොලට මැතින් පිහිටි ඒ කුඩා මන්දිරය තුළ වීණා වාදනයකට සවන් දෙමින් සිටි ඔහුගේ සිත සතුටින් පිරී තිබිණි. මේ සතුටු මොහොතට බාධා කිරීමට, ඔහුගේ හමුදාවේ අණදෙන නිලධාරී බිය වූයේය.

''තවත් පරිපාලන ගැටලුවක් නොවෙයි නෙව?'' නෙම්රොඩ් ගෙරවීය.

''නැහැ කුමරුනි. මේ දැන් පණිවිඩකරුවෙක්, ටෙෆ්නැක්ගේ මුද්‍රාව සහිත පැපිරසයක් ගෙනාවා.''

නෙම්රොඩ්, මුද්‍රාව කඩා පැපිරසය දිග හැරියේය. ඒ පේළි කීපය, ජෙනරල් ටෙෆ්නැක්ගේ අතින්ම ලියන ලද ඒ පේළි කීපය, කීප වරක්ම කියවූ ඔහු එය නපුරු සිහිනයකැයි සිතා අමතක කරන්නට තැත් කළේය. නැත. කළු පාරාවෝ තීබසය බලා යාමට නපාටාවෙන් පිටත් වී ඇත. ඔහු, කමුන්ට පහර දෙන්නට හේතුවක් නැත.

✸

නපාටාවේ ආණ්ඩුකාරයා ලෙස පත්වීම ලැබුවද, ඔටොකු නීවයන් සිටින භූමියක පා තැබීම ප්‍රතික්ෂේප කළේය. ඉතින්, ඔහුගේ දෝලාව ගෙන යන්නන්ට දහඩියෙන් නැහැවී ඒ තර සිරුර ඔසවාගෙන නගරයේ තැනින් තැනට යාමට සිදුවිය.

තර මිනිසා කෙතරම් තැති ගැනී සිටියේද යත්, ඔහු සුපුරුදු ආහාර වේල් පහෙන් එක වේලක් නොගෙන සිටියේය. ඔහු තම ජන වාර්ගික වගකීම් තම ඥාති සොහොයුරෙකුට භාර කළේ, ඉතා කුඩා රන් සිඟිත්තක් හෝ සොරකම් කළහොත් හිස ගසා දමන බවට තර්ජනය කිරීමෙන් පසුවයි. ඒ අතරම ඔටොකු රජය පාලනය කිරීමේ කලාව උගත්තේය.

ඔටොකුට යම් වගකීමක් පැවරුන විට, ඔහු එය සැහැල්ලුවෙන් සැලකුවේ නැත. ඔහු, තම දිවි පරදුවට තබා සැලකුවේ ඊජිප්තුවේ සෞභාග්‍යයයි. ඒ අතරම, ලේකම් වරුන්ගේ ගෞරවය ලබා ගනිමින්, තමා නිකම්ම නිකමෙකු නොවන බව පෙන්වීමටද ඔහුට අවශ්‍ය විය.

ඒ සඳහා කළ යුතු වූයේ, කුල්හෙඩ්ගේ කොන්දේසි විරහිත සහාය ලබාගැනීමයි. ඒ නිසාම ඔටොකු ඔසවාගත් දෝලාව, ඒ අලංකාර කාමර පහළොවකින් යුතු නිවස වෙත ගෙනයන ලදී. ලියන්නන් සේවයේ යෙදෙන ඒ ගෘහය පිහිටියේ පාම් ගස් පිරි අත්‍යලංකාර උද්‍යානයක් තුළයි. ඔටොකු දොරටුව අසලට යනවිට දොරටුපාලයා නැමී ආචාර කළේය. දෝලාව ගෙන යන්නෝ, ගෘහයේ ප්‍රධාන දොර වෙත දිවෙන වැලිපාරේ අඩි ගමනින් යන්නට වූහ.

කුරුම්ට්ටාගේ බිරිඳ දොරකඩ සිටගෙන සිටියාය. ඒත්, ඇය සිටියේ වැලපෙමිනි. කදිම රූසපුවක් ඇති ඒ නුබියානු ලඳ කුරුම්ට්ටාට පුතෙකු හා දූවක දායාද කර තිබිණි. ලියන්නන් වීමට පෙරුම් පුරන ඔවුන්ගේ වයස දාහතර සහ දොළහ වූ අතර ඔවුහු පියාගේ ඉගැන්වීම් කෙරේ දැඩි අවධානයක් යොමු කළහ.

''කුල්හෙඩ් මැතිනිය. ඔබට කරදරයක් නම් සමාවෙන්න. අපට හැකි ඉක්මනින් ඔබේ සැමියා හමුවන්නට අවශ්‍යයි.''

''අවාසනාවක මහත. එය කළ නොහැකියි.''

ඔටොකුගේ විශාල සිරුර වෙව්ලා ගියේය. ''ඔබ පවසන්නේ......''

''නැහැ උතුමනි. ඔහු පණ පිටින්. ඒත්, පියැන්කි ඔහු කැඳවාගෙන ගියා.''

එය කෙතරම් පාඩුවක්ද? ඔටොකු තනිවම රට පාලනය කරනු ඇත. කළු පාරාවෝ ඔහු ගැන ආඩම්බර වනු ඇත.

# 35

මීදුම වියැකී ගියේය. අවට වාතය පළිඟු කැටයක් සේ පැහැදිලි වෙමින්, ඈතින් ඉහළ පහළ යන කාන්තාර වැල්ල ඔවුන්ගේ දෑසට ලක්විය. හට කණ්ඩායම් පුදුමයට පත්කරමින් පියැන්කි ගම්මානය මැදින් ඔවුන් කැඳවාගෙන ගියේය. තැඹිලි පාට වැලිගල්, ගිනිය නොහැකි තරම් පාම් ගස්, කහ දුඹුරු පැහැති තැනිතලාව, හොඳින් ජල සැපයුම ලද පුළුල් තීරුව, තිරිඟු හා බාර්ලි වැවෙන ගොවිබිම් යාය..... ඒ දසුන ලබාදුන් මානසික වින්දනය, හතරවැනි දිය ඇල්ලට වඩා බෙහෙවින් මෘදුය.

නයිල් නදියේ දැඩි රළ ප්‍රහාරය උතුරු දෙස බලා ගියේය. එය කුඩා ගම්මාන අතරින් ගලා ගියාය. ඒවායේ සුදු හුණු ගෑ කුඩා නිවෙස්වල නිවැසියෝ ගං ඉවුරට දිවගොස් රාජකීය නෞකාවේ සිටින රාජකීය යුවලට සුබ පතමින් කෑ ගැසූහ.

පියැන්කි අබිලා ගේ අතින් අල්ලා ගති. ඔහුගේ දෑස ඒ දීප්තිමත් නුබියානු නගරයේ අලංකාරය වින්දේය. ඔහුගේ ආත්මය පෝෂණය කළේ එහි ගින්නයි. පාම් ගස් මුදුනේ සිටි වඳුරෝ සිනාසෙද්දී ලොකු සුදු කොකුන් රංචු පිටින් අහසේ ලැගුම් ගත්හ. ගේ කුරුල්ලන් සිය ගණනක් නිල් අහස වසා සිටියහ.

කුල්හෙඩ් නැවුම් කැරොබ් යුෂ බඳුනක් ගෙනාවේය.

''උතුමාණනි, මට අවසරද ඔබ මේ බෝට්ටුවේ ඉදිරිපස මේ අයුරින් සිටීම අවදානම් බව පවසන්න. ඕනෑම පළපුරුදු දුනුවායෙකුට බෝට්ටුව ඉදිරිපිටට ඉලක්කය ගත හැකියි.''

''එතරම්ම අසුබවාදී නොවන්න. අප තවමත් ළඟා වී නැහැ ටෙෆ්නැක්ට යටත් භූමියට.''

''ඒත් ඔහු දන්නේ නම් ඔබ නපාටාවෙන් පිටත් වූ බව, ඔහු තම ඝාතකයන් එවා ඔබ තීබසයට යන ගමන නැවැත්වීමට තැත් කළොත්?''

''විය නොහැකියි.''

"මා එසේ පතනවා උතුමනි." ලියන්නා කීය. "ඒත් අප සූදානම්ව සිටිය යුතු නොවෙද ටෙෆ්නැක් වැනි නීචයෙකුගේ නීච ප්‍රහාරයන්ට?"

"නුබියානුවෝ කුමක් සිතාවිද මා කාමරයක සිරවී සිටින විට? ඔවුන් කියාවි පාරාවෝ බියගුල්ලෙක්ය, ඔවුන් තවදුරටත් ඔහු ගැන විශ්වාසය තබන්නේ නැත කියා. එසේ නොවෙද අබිලා?"

"කුල්හෙඩ් නිවැරදියි. ඔබත් නිවැරදියි." ඇය කීවාය.

රාජකීය යුවල නැවේ ඉදිරිපිට ඉඳගෙන සිටියහ. ඔවුන්ගේ නෙත් යොමුව තිබුණේ, ප්‍රචණ්ඩත්වය හා මරණය ඔවුන් එනතෙක් බලා සිටින උතුරු දෙසටයි.

✸

"උතුමාණනි" කප්පිත්තා කීය. "අප ආර්ගෝ දූපතට ළඟාවෙනවා. මේ මාවත පහසු නමුත් මා ඊට කැමති නැහැ. දූපත බොහොම දිගයි. ගංගාව එය වට කර ගනිමින් බෙදී යන තැනදී අප එක දිය පාරක් තෝරාගත යුතුයි. අප වැරදි දිය පාර තෝරාගතහොත් ඉතා දරුණු රළ පහර වලට මුහුණදීමට සිදුවිය හැකියි."

"එය නැව් පන්තියට අනතුරක් කරාවිද?"

"සහාය බෝට්ටු වලට නම් අනිවාර්යයි උතුමාණනි."

දිගින් රියන් හතළිහක් වූ එම බෝට්ටු; ධාන්‍ය, තෙල් බඳුන්, වයින් හා බීර, කුකුළන්, ගවයින්, එළවලු, ලුණු, චීස්, කල්තබා ගැනීම සඳහා සකස් කළ මස් හා මාළු, හමුදාවට අවශ්‍ය සියලුම ආයුධ මෙන්ම විශේෂ වූ සැලකිලි ලබමින් ගමනේ යෙදෙන අශ්වයින්ද විය.

"කුමක්ද ඔබේ තීරණය?"

"මා වාසනාව විශ්වාස කරනවා, උතුමාණනි."

"මට සිතියම පෙන්වන්න."

පියැන්කි එය ඇසින් නොව අතින් පරීක්ෂා කළේය. බොහෝ අයගේ විශ්වාසය ස්පර්ශය වඩාත් හොඳ හැඟීම් උපදවන බවයි එය නිවැරදිව කිරීමයි අවශ්‍ය වන්නේ, එවිට, පෙනෙන දේ පමණක් නොව අදෘශ්‍යමාන දේද දැනගත හැකිය. පියැන්කි තම අශ්වයා තෝරා ගත්තේ උගේ ගෙල මත අත තැබීමෙනි. ඔහු ආරක්ෂිත දිය පාරද එලෙස තෝරාගනු ඇත.

"අපි දූපතට දකුණු පසින් යාත්‍රා කරමු."

කප්පිත්තාගේ තේරීම වූයේ අනෙක් දියපාරයි. එහෙත් ඒ සඳහා හේතුව පැහැදිලි කිරීමට ඔහුට නොහැකි විය.

දිග ඔරුව දකුණු පස දිය පහරට ඇතුල් විය. එවිටම අති විශාල වලාකුළක් සේ ඇදී ආ මැස්සන් රංචු වලින් ඇතිවූ බලපෑම කොතරම්ද යත් කප්පිත්තන් නියම මග සොයා ගත්තේ දිග ලී වලින් ඇන ගඟේ ගැඹුර මැන බැලීමෙනි. මැස්සන් පලවා හරින්නට ගත් උත්සාහයේදී එක කප්පිත්තෙක් ගඟට වැටුණි. වහා ක්‍රියාත්මක වූ නාවියකයන් දෙදෙනෙක් ඔහු වෙත ලණුවක් විසි කළහ. කප්පිත්තා එය දැඩිව ග්‍රහණය කරගෙන බෝට්ටුව වෙත ඇදී ආයේය.

"සේවකයින්ට කුරුළු තෙල් සපයනු." පියැන්කි අණ කළේය.

සියලු දෙනා ඒ වටිනා තෙල් සිරුරෙහි තවරා ගත්තෙන් මැස්සන්ගේ සපාකෑම නැවතිණි.

එහෙත් රජුට පෙනුණේ වෙනත් අනතුරකි. සුළඟ හෙමින් හැමුවත්, ගංගාවේ මහා රැළි මතු වෙන්නට විය. එය නොවැරදීම ගංදිය තලයට යටින් වැලිකඳු ඇති බවට සාක්ෂියක් විය.

"නවතිනු." මග පෙන්වන්නා මොර දුන්නේය.

ඉදිරියෙන්ම ගිය බෝට්ටුවට හා රාජකීය නෞකාවට ඒ පණිවිඩය ලැබෙන විට ප්‍රමාද වැඩිය. ඉතිරි නෞකා මේ බාධකය මග හරින්නට සමත් විය.

ඒ අවස්ථාවේ තිබූ එකම විසඳුම වූයේ බෝට්ටු ඉවතට ඇද ගැනීමයි. පියැන්කි, වැලි කන්දක් මත නැගී විධානය දෙමින් තවත් නාවිකයින් දස දෙනෙක් සමග ලණුවෙන් ඇද්දේය.

ඉක්මනින්ම, ආර්ගෝ දූපතේ දියපාර නපුරු මතකයක් පමණක්ම විය.

✸

නුබියානු නැව් පන්තිය බාධාවකින් තොරව තෙවැනි දිය පාර තරණය කළාය. එය දෙපසින් වූයේ කළු ගල් වැටියකි. දියපාර පසුකළ නෞකා, අළු පැහැති වැල්ල හා කළු පැහැති ගල් සහිත පෙදෙසකට යාත්‍රා කරත්ම, බියවූ කුරංගයින් කීප දෙනෙක් පඳුරු උඩින් පනිමින් ඈතට දිව ගියහ.

යළිත් වැලිකඳු හා කහ පැහැති වැල්ල මතුවිය. පාම් ගස්වල ලා කොළ පැහැය මතුව තිබූ එහි, ගං ඉවුර වැසී තිබුණේ සාරවත් බව

සඟවාගත් රත් පැහැති රොත්මඩ තට්ටුවකිනි. යාත්‍රාව සොලෙබ් සහ සෙඩෙයින්ගා දෙවොල් පසුකර යනවිට, පියැන්කිගේ හදවත හදිසියේ නැඟුන ගෞරවනීය සිතිවිල්ලකින් හිරි වැටී ගියේය. එම දෙවොල් තනන ලද්දේ ආමෙන්හොටෙප් III විසින් ඔහුගේ බිරිඳ ටියි වෙත දැක්වූ ආදරය සිහි කරමිනි. ඒ අසලින් යන්නෙකුට නිතැතින්ම වාගේ එම රාජකීය යුවලගේ උතුම් බව දැනුණි.

රජු, අබිලා වැළඳගති. "ලක්සෝර්හි දෙවොල් තැනුවෙත් තෙවැනි ආමෙන්හොටෙප්." ඔහු කීය. "තීබසයේ එක මැණිකක් එය. ඔව්. ගොඩබිම් දෙක එක්වී ධනවත්, සතුටින් පිරි බිමක් වූ කලෙක එය තීබසයේ එක මැණිකක් වනු ඇති."

"අපට ටෙෆ්නැක් පරාජය කළ හැකිවුවහොත් ඒ සතුට නැවත ආපසු ලැබේවි."

"අප මින් පෙර කිසිදා මෙවැනි බරපතල යුද්ධයක් කර නැහැ අබිලා. නුඹියානුවන්ගේ එඩිතර කම ඊට සෑහේද?"

"එවැනි සැක ඇතිකර ගැනීම ඔබේ ස්වභාවය නොවේ."

"කළ හැකි අන් දෙයක් නැති නිසා මා එසේ කරන්නේ නැහැ. එහෙත්, අප ආයුධ බිම තබන්නට පෙර කී දෙනෙක් මිය යයිද? උතුරේ සාමය බිඳීමෙන් ටෙෆ්නැක් කරන්නේ බරපතල වරදක්. එහෙත් ඔහු එක දෙයක් කළා. මා ඇලී සිටි අලසකමින් මා මුදවා ගත්තා. ලිබියානු කුමාරවරුන් තමන්ට අයිති භූමියෙන් තෘප්තිමත් වෙතැයි ඔබ සිතන්නේ නම් එය වරදක්. එමෙන්ම ඔවුන්ගේ උමතු බලාපොරොත්තු මැඩ ගනීවි යයි සිතීමද වරදක්. එහෙත්..... මම වැරදියි. අබිලා. කිසිවෙක් කිසිවිටක බල තෘෂ්ණාවෙන් සිටින අයෙකු විශ්වාස නොකළ යුතුයි. පෙෆ්ටෝ සහ නෙම්රොඩ් වැනි අයත් බොහොම භයානකයි. පාවාදෙන්නන්. ඔවුන් හැකි පළමු වතාවේම ඔබව පාවා දෙනවා. මට වැරදුනා ඔවුන්ට කෙළින් සිටින්නට බිය පමණක් ප්‍රමාණවත් කියා සිතූ නිසා. ප්‍රේමිය, මා සිතනවා ඔබ ආපසු නපාටා යා යුතුයි කියා."

"නැහැ. මට අවශ්‍යයි මේ වදයට ඔබ හා එක්ව යන්නට." අබිලා කීවාය. "අපට මිය යාමට සිදුවේනම්, එවිට මා ඔබේ ළඟයි."

මුගුටියා පියැන්කිගේ උරහිසට නැග්ගේ, හරියටම ඌ සටනට සූදානම් බව පෙන්වන්නට මෙනි.

හදිසියේම කුල්හෙඩ් නැව් තට්ටුව මත පෙනී සිටියේය. ඇද වැටී

බෙල්ල කඩා ගැනීමට තරම් වේගයෙන් දුවන කුරුම්ට්ටා ගෙනාවේ සුබ ආරංචියක් නම් විය නොහැක.

"උතුමාණෙනි." ඔහු නැවතුණේය. "විපතක් සිදුවී තිබෙනවා. මගේ වරදින්."

"ඒ කුමක්ද?"

"මා නාවිකයින්ගේ ඉන්ද්‍රජාලීය ආරක්ෂාවට බඳින සුර දැමූ පෙට්ටි සියල්ලම පරීක්ෂා කළේ නැහැ උතුමාණෙනි. ඒවායින් එකක තිබෙන්නේ කුඩා මුට්ටි. නාවිකයින් කීප දෙනෙකුට ඒ ආරක්ෂාව දිය නොහැකි නිසා ඔවුන් ඉදිරියට යාම ප්‍රතික්ෂේප කරාවි."

"සන්සුන් වන්න." අබිලා අවවාද කළාය. "සේවිකාවන් සතුව වැඩිපුර සුර තිබෙන නිසා අපට ඒවා ඉල්ලාගත හැකියි."

එහි, නිල්කැට, රතුකැට, අමතේස්ත සහ තවත් මැණික් වර්ගවලින් තනන ලද සුර තිබිණි. ඒවා අත්, කුළුණු, ස්පින්ක්ස්, උකුස්සාගේ ඇස හෝ හිපපොටේමස් හිසක හැඩයට තනන ලද්දේ විය. කුල්හෙඩ් සන්සුන් විය. දැන් ඉතින් යුධ හමුදාවේ සියලුම සාමාජිකයින් සතුරු බලයන්ගෙන් ආරක්ෂිත වන නිසා ඔවුනට ඉතා ආරක්ෂිතව ගමනාන්තයට යා හැකිවනු ඇත.

# 36

දැඩි වෙහෙස හේතුවෙන් අශ්වයින් ගණනාවක් මිය ගියද, ටෙෆ්නැක්ගේ පණිවිඩය ලිබියාවේ ඈත දකුණු කෙළවර ජීවත් වන ජන කොට්ඨාස වෙත ලැබී තිබිණි. ඒ අනුව පියැන්කි දෙවන දිය පහරට ළං වනවිට ඔහුට පහරදීම සඳහා දඩයක්කරුවන් පනහක් එක්ව සිටියහ. රිදී පොලු දුසිමක්, උසස් තත්ත්වයේ ආලේපන හා බූරුවන් සියයක් ඒ සඳහා වන ගෙවීම විය. ඔවුනට නියමව තිබුණේ ඊජිප්තු දේශ සීමාවෙන් රහසේ රිංගා ගොස්, ප්‍රහාරයට ඉතා සුදුසු එම ස්ථානයේදී ක්‍රියාත්මක වීමටයි. තමා ගැනම දැඩි විශ්වාසයකින් පසුවන කළු පාරාවෝ,තම පාලනය යටතේ පවතින භූමියකදී එවැනි ප්‍රහාරයක් බලාපොරොත්තු නොවනු ඇත.

මුදල් විශාල වශයෙන් ලබා දීමට පොරොන්දු වූ නමුත්, ඉදිරිපත් වූ ස්වෙච්ඡා භටයින් ගණන අඩුය. පියැන්කි පරාජය කළ නොහැකි වීරයකු ලෙසයි ප්‍රචලිතව තිබුණේ. එහෙයින්ම පළපුරුදු භටයින් ඔහු සමග සටනට ඉදිරිපත් වීමට කැමැත්තක් නොදැක්වූහ. මේ උමතු ප්‍රහාරයට කැමැත්ත ප්‍රකාශ කර තිබුණේ නොහික්මුණ කොල්ලන් රැළක් පමණි. ඔවුන්ගේ බලාපොරොත්තුව වූයේ පාරාවෝගේ හිස තම ගම්මානයට ගෙන ඒමයි. ගෝත්‍රික නායකයාගේ බාල පුත් කාෆි එහි නායකත්වය ගත්තේය. තම වැඩිමහල් සහෝදරයාගේ වෛරය හේතුවෙන් බලයට පැමිණීමට ඇති ඉඩ ඉතා අල්ප බව දැනසිටි කාෆි මේ අවස්ථාව ඔහුට වාසනාව උදාකරනැයි සිතීය.

මේ ප්‍රහාරය නිසැකවම අති භයානක එකකි. දිවා කාලයේදී ඔවුනට ගමන් කළ හැක්කේ පියැන්කිගේ භටයින්ගෙන් මුවා වී නයිල් ගඟේ අතු දිගේ පමණි. රාත්‍රියේදී ගල්වල හැපී ගිලීයාමේ අවදානම ඔවුනට තිබිණි. එහෙත්, ඔවුන් පරාජයක් ගැන නොසිතා හැකි ඉක්මනින් ගමන් කළ යුතුය. ඒ අනුව ඔවුනට නියම කරගත් ස්ථානයේදී පියැන්කි පුදුමයට පත් කළ හැකිය.

✸

රජු ස්තුති පූර්වකව බලා සිටියේ තම නෞකාව ඉදිරියට ගෙන යන සෘජුකෝණාශ්‍රාකාර ලිනන් රුවල දෙසයි. ඔහුගේ නාවිකයින් ඉදිරියට යාම සඳහා සහාය ලබාගත්තේ ශක්තිමත් ජල ප්‍රවාහයෙනි. එහෙත්, සුළං බලය බිඳකුදු අපතේ නොහරිනු වස් මිනිස් බලයද යොදා ගැනිණි. සුළඟ අඩුවන හැමවිටම; රුවල බා. කුඹගස පහත් කොට එය කරු දෙකක් මත රඳවා තබන්නට යෙදිනි.

පියැන්කිගේ අශ්වයා සඳහා ඉඩක් වෙන්කර තිබුණේ ප්‍රධාන නෞකාවේ රාජකීය යුවලගේ පුද්ගලික කාමරය අසලය. වැලියන්ට් සඳහා කාමර දෙකක් ම වෙන්කර තිබිණි. ඌට දිවීම පුහුණුව සඳහා නෞකාව තැනින් තැන නවත්වන ලෙස පියැන්කි අණකර තිබිණි. සොල්දාදුවන් පමණක් නොව වැලියන්ට් ද මෙම මෙහෙයුමේ වැදගත්කම වටහාගෙන සිටියේය.

පියැන්කි නිතරම තම අශ්වයාට කතා කළේය. අශ්වයාද බැල්මෙන් කෙඳිරිගෑමෙන් රජුට පිළිතුරු දෙමින් එකඟතාවය හෝ අකමැත්ත ප්‍රකාශ කළේය. එම ප්‍රතික්‍රියාවන්ට අනුව, අශ්වයාගේ දෛනික ජීවිතය සතුටින්, විශිෂ්ට වූ නිරෝගී තත්ත්වයකින් තබන්නට රජු උත්සුක විය. එපමණක් නොව වැලියන්ට් තුළ දුර්ලභ ගුණාංගයක් විය. ඌට අනාවැකි කීමේ හැකියාව තිබිණි. අනතුරක් ඉව වැටුණු විගස කෝපයෙන් දඟලමින් ඌ එය පියැන්කිට ඇඟවීය.

දෙවැනි දියපාරට ළංවෙත්ම වැලියන්ට්ගේ කෝපය කාටත් පෙනෙන්ට විය. උගේ පා පහරට ලක්වෙතැයි බිය වූ සොල්දාදුවෝ ඒ අසලට යාම ප්‍රතික්ෂේප කළහ. වැලියන්ට් හිතුවක්කාරයෙකි! ඌ, තමා වෙත ළංවීමට ඉඩහලේ පාරාවෝට පමණි.

රජු, අසු රඳවා ඇති තැනට ළංවී ඌ කැගහන, පයින් ගහන හැටි බලා සිටියේය. ''ෂ්, ෂ්... සන්සුන් වෙන්න, මිත්‍රයා, '' රජු ගැඹුරු හඬින් කීවද සන්සුන් වූයේ වැලියන්ට් නොවේ!

රජු අශ්වයා අසලට යනු දුටු කුල්හෙඩ් බිය විය. අශ්වයා කොතරම් කෝප වී සිටියේද යත්, ඌ තම ස්වාමියා දකීමෙන් හෝ සන්සුන් වූයේ නොවේ. එහෙත් වැලියන්ට්ගේ දෑස දෙස සෘජුව බැලූ පියැන්කි නොබියව ඔහුට ළංවිය. අශ්වයාගේ කෝපය තුනී විය.

✸

''වැලියන්ට් අනතුරු අඟවනවා.'' රජු අබිලාට කීය.

අබිලා, ගොන්කුර හැඩැති කකුල් සහ ඇත්දළයෙන් අලංකාර කරන ලද හිසපතක් ඇති ඇඳක වැතිර සිටියාය. ඇගේ දෑසේ කලාතුරකින් දිස්වන බියක් රැඳී තිබිණි. "මා නපුරු සිහිනයක් දුටුවා." ඇය කීවාය. "නයිල් ගඟෙන් අති විශාල කිඹුලන් මතු වුණා. එවිටම ගං ඉවුර අසලින් මෘදු පස් බිඳගෙන යෝධ හිපපොටේමස් මතුවුණා. මුලදී ඔවුන් එකිනෙකාට අභියෝග කළා. මා සිතුවා ඔවුන්, එකිනෙකා කැබලි කරාවි කියා. එහෙත් ඔවුන් එකිනෙකාට ගෞරව කළා. ඔවුන් එක්වී, කාන්තාරයෙන් මතු වූ යක්ෂයෙකුට එරෙහිව අත්වැල් බැඳගත්තා. යක්ෂයෙක්! මට ඌ හඳුනාගත නොහැකි වුණා. යුද්ධය ඇරඹුණා. මා අවදි වුණා."

"සිහිනයක්ද, ඉදිරි දැක්මක්ද?"

"මා දන්නේ නැහැ කුමක්ද කියා. ඒත් අප, මේ අපට ලැබෙන අනාවැකි නොසලකා හැරීම වරදක්."

පියැන්කි ඇදේ කෙළවර ඉඳගත් විට බිරිය ඔහුට ළං වුණාය.

"වෙනත් වචනවලින්" ඔහු කීය. "ආපසු නපාටාවට යන්න. ටෙෆ්නැක් හා යුද්ධය අමතක කරන්න."

"කුමටද ඔබෙන් සඟවන්නේ? මා බියෙන්."

"තමන් බිය නැතැයි පවසන්නේ, ධෛර්යය නැති අයකු පමණයි. එහෙත් අපට අනතුරකදී පැන යාමට අයිතියක් නැහැ. මා නාවිකයින්ට හා සොල්දාදුවන්ට අවවාද කරන්නම්, අපට බලාපොරොත්තු වූවාට පෙර සටනට මුහුණ දීමට සිදුවන බවට."

ඒ තොරතුරු ඇති කළේ බියයි. සතුරාට මෙතරම් ඈතින් සිටිමින්, තමාගේම භූමියේදී නුබියානු හමුදාවට ඇතිවිය හැක්කේ කුමන අවදානමක්ද? කෙසේ වෙතත් නැව් පන්තියේ නායකයින්, තම සේවකයින් දැඩි අවධානයෙන් තැබීය. දුනුවායෝ දිවා, රාත්‍රී ගං ඉවුරු ගැන සෝදිසියෙන් සිටියහ.

✸

කාෆි සහ ඔහුගේ සගයින් ජයගෙන තිබිණි. කටුක මාවත් දිගේ යමින්! වාසනාවට මෙන් ඒවායෙහි වතුර වළවල් තිබිණි, අන්තිමේදී ඔවුහු සියලු බාධා මගහරිමින් දෙවැනි දියපාරට ළං වූහ.

ඒ භූමිය දුටුවන් බියගන්වන සුළුය. නයිල් දිය මතින් ගල් පතුරු නැගී සිටියේය. නදිය තම කෝපය හැඟවීමට සුළි ඇති කළාය. එහි වූ

කුඩා දූපත් කළුගලින් සෑදී තිබිණි. මග අවුරන්නා සේ පෙනෙන ගිරි ශිඛර සැමතැනම විය. සමහර ලිබියානුවෝ බියෙන් වෙව්ලා ගියහ. ඔවුන් ගේ විශ්වාසය වූයේ මෙවැනි ස්ථානවල අවතාර ඇතැයි කියාය! කණ්ඩායමෙන් එකෙක් පැන දුවන්නට තැත්කළ නමුත්, නිහඬවම තම දුන්න ඇදගත් කාෆි ඒ බියගුල්ලාගේ පිට සිදුරුවන සේ ඉලක්කය ගත්තේය.

"එයයි බියගුල්ලකුගේ දෛවය." ඔහු කීය.

කාෆි, අවතාරවලට වඩා භයානක බව දැනගත් තරුණ ලිබියානුවෝ, බියෙන් වෙළී ඔහු සමග රැඳුනාහ.

"මෙතැනදීයි අප පියැන්කිව මරා දමන්නේ. අපගේ ඊතලවලින් වැසීගිය ඔහුගේ මළසිරුර දකින ඔහුගේ සොල්දාදුවන් බිය වූ සිවුපාවුන් සේ හිස් ලූ ලූ අත දුවාවි. අප ඔහුගේ හිස ගෙන ගොස් ටෙෆ්නැක්ට භාර දෙමු. එවිට අපිට ලැබේවි ඔහු පොරොන්දු වුණා සේ දෙගුණයක් තෑගි, ඉක්මනින්ම තොප ධනවතුන් වේවි."

ඒ බලාපොරොත්තුවයි අත ළඟ තිබෙන සටනට ඔවුන්ට අළුත් පණක් දුන්නේ.

"මේ ගිරි කඳුරු අපගේ සගයින්." කාෆි සතුට පළ කළේය. "අප ඒවායෙහි මුදුනට නැංගොත්, අපට හැකියි නුබියානු දුනුවායන්ගේ ඉලක්කයෙන් ඈත් වීමට. ඒ අතරම අපට පහසුවෙන්ම අපගේ ඉලක්ක ගත හැකියි."

මේ කුඩා කණ්ඩායමට ඉතිරිව තිබුණේ, කුඩා ගලින් ගලට පනිමින් නදිය තරණය කිරීම පමණි. ඊළඟට ගිරි කඳුරට නැගීම. එවිට ඔවුනට හිරු සහ සුළඟින් ආවරණය විය හැකිය.

කාෆි ඉදිරියෙන් ගියේය. ගමනින් බාගයක් ගිය ඔහු, හදිසි විලාපයක් ඇසී හැරී බැලිය. ලිබියානුවා පා තැබූ ගල එසැවී ඔහු ගඟට තල්ලු කර තිබිණි. අපොයි! ඒ ගලක් නොව යෝධ හිපපොටේමසෙකි. ලිබියානුවා උගේ නින්දට බාධා කර තිබිණි. ඒ සමගම නැගී සිටි උගේ සගයින් දුසිමක්, දරුණු ලෙස කට අරිමින් මහා හඬක් නගන්නට වූහ.

කලබලයට පත් ලිබියානුවා, ඒ යෝධයාගේ සම සිදුරු වන සේ තම කිරිච්චියෙන් පහර දුනි. එහෙත්, එය බරපතල වරදක් විය. කෝපයෙන් හා වේදනාවෙන් මුසපත්වූ හිපපොටේමස්, රියනක් පමණ දිගැති උල් දත් දෙකෙන් ඒ මිනිසා ඉරා දැමීය. සෙස්සේ ද ඌ අනුගමනය කරමින්,

දිවි බේරාගන්නට පැනයන ලිබියානුවන්ගේ මාංශය ඉරා දමන්නට වූහ.

මේ මොහොතේ, කාෆිට ගං ඉවුරේ චලනය වන යමක් පෙනිණි. මුලින් ඒ ලී කොටයකැයි සිතුවද, දිග හිසක්, කොරපොතු, උරගයකුගේ වල්ගයක් හා කකුල්. ඔව්! කෙටි කකුල්, වහ වහා සෙලවෙන කකුල්! විශාල ධාන්‍ය ගෝනි හතරකට වඩා බරින් වැඩි වුවත්, නයිල් කිඹුලා පුදුමාකාර ලෙස ජවසම්පන්නය.

"කිඹුලා!" කාෆි කෑ ගැසීය. "අප ආරක්ෂිතයි. දැන් ඔවුන් පහරදේවි හිපෝට!" ලොව උපන්දා සිට, මේ සත්ත්ව කොට්ඨාස දෙක අතර යුද්ධ ඇතිවන බව දත් ඔහු පැවසීය.

කලබල වූ ලිබියානුවෙක් තම හෙල්ලෙන් වතුරට පහර දුනි. ජල තලය කම්පනය කොට කිඹුලා ඉවතට යැවිය හැකිය. එහෙත්, සිදු වූයේ අනෙකකි. ඒ කිඹුලා ඔහු දෙසට එන්නට විය. එපමණක්ද? ගොදුර ඉතා විශාල බව දුටු උරගයා තම සගයන්ගේ සහාය ලබාගනු වස් උරුහන් බැමක් වැනි හඬක් ද පිට කළේය.

කාෆි ගල් ගැසුණි. එකද කිඹුලෙක් හෝ හිපපොටේමස් දෙස නොබැලූහ. හිපෝ ද කිඹුලන් නොසලකා හරින බව පෙනිණි. ඒ දෙකොට්ඨාසයම කළේ, ප්‍රහාරය පිණිස පැමිණි මිනිසුන් මරා දැමීමයි.

කිඹුලෙක් කාෆි දෙසට ආයේය. උගේ විවර වූ කට ඇතුළට යමක් යවන්නට තරම් වේලාවක් කාෆිට නොවීය. කිඹුලියක් කාෆිගේ දකුණු කකුල කොතරම් තදින් සැපුවාද යත් උගේ කඳුළු ග්‍රන්ථි දියවී වැගිරෙන්නට විය. ඇත්තටම ඒ විශිෂ්ට සංග්‍රහය විඳින හැම කිඹුලෙකුගේම කටින් කෙළද, දෑසින් කඳුළුද වැගිරෙන්නට විය.

✸

මුගටියා පියැන්කිගේ උර මත කෙළින් හිට ගත්තේය. උගේ නැහැපුඩු සුළඟ ඉව කරන්නට වූ අතර ඇස් ඈත ක්ෂිතිජයට ඇලී තිබිණි. රජු හා රැජිනද ඈත බලා සිටියහ. ඉතා සෙමෙන්, ප්‍රවේශමෙන් යාත්‍රා කරන ඔවුනට, ඈතින් බියකරු විලාප ඇසෙන්නට විය.

"එය කිඹුලන් හා හිපෝ අතර පොරයක් විය යුතුයි." පියැන්කි කීය. "ඔව්, මට දැන් ඔවුන් පෙනෙනවා. කිඹුලන් ඈතට යන හැඩයි."

"වතුර රතුපාටයි." අබිලා කීවාය.

"ඔබ නිවැරදියි. ඒත්..."

"මගේ සිහිනය නිවැරදියි. සතුරන් අප එනතෙක් රැඳී සිටියා. එහෙත් ඒ හිපෝ හෝ කිඹුලන් නොවෙයි."

නැව් පන්තිය ඉදිරියට ගියාය. කිඹුලන්, කුඩා මස් කැබැල්ලක් හෝ ඉතිරිකර නැත. වේගවත් රළ පහර, එහි ගලාගිය රුධිරය යටපත් කොට තද නිල් පැහැ ජලය මතු කරන්නට සමත් විය.

නපාටාවෙන් පිටත් වූ දා පටන් කිසි විටක තම කුටියෙන් නොපැමිණි ෂෙපෙනා, පිටතට පැමිණි පියාණන් අසල සිටගත්තාය.

"මා ආමන්ට යාඥා කළා." ඇය කීවාය. "මා ඔහුගේ අදෘශ්‍යමාන පැවැත්මට ආයාචනා කොට එය අවදි කළා. දැන් ඔබේ බෝට්ටුවේ මග පෙන්වන්නා වන්නේ ඔහුගේ බැල්මයි. අප ඉදිරියේ අති භයානක සතුරන් සිටිනවා. මා ආමන්ගේ සහාය යදිමින් යාඥා කරනවා දිගින් දිගටම."

මුගටියා, පියැන්කිගේ උරහිස මත වකුටු වී තද නින්දට වැටුණි. නැව් පන්තිය කිසිදු බාධාවකින් තොරව, දෙවැනි ඇළපාර පසුකර ගියේය.

# 37

ඩේබ්‍රේක්ගේ සිහින්, මෘදු දෙපා හැඩගැන්වූ පළපුරුදු සේවිකාව ඉවතට ගියාය. ඒ සමගම පැමිණි සම්බාහන සේවිකාව, මුතු ඇටයක පැහැයගත් ඒ සිරුර, සුවඳ කවන ලද ආලේප යොදා, දවස පුරා සුවඳවත්ව සිටින්නට සම්බාහනය කළාය.

ඇගේ සැරසිලි අවසානයට අඩුව තිබුණේ තව එකම එක දෙයකි. බොරු කොණ්ඩයක් තෝරාගෙන පැළඳීමයි ඒ. ඩේබ්‍රේක් ඒ වන විටත් කල්පනා කරමින් සිටියේ, ටෙෆ්නැක් සමග ගතකළ රාත්‍රිය ගැනයි. සාමාන්‍ය ජීවිතයේදී ජෙනරල් ඉක්මනින් කෝපවන, නිහඬ, කර්කශ මිනිසකු වුවත් ඇය හා සිටින විට ඔහු ආදරවන්තයෙකි. ඇය පුදුම කරවන පෙම්වතෙකි. එහෙත් සතුට උතුරා යන අවස්ථාවේ පවා ඔහු තම සැලසුම ගැනම සිතන බව ඇයට දැනුණි. ඔහු ඇයට ආදරය කළේ නම් ඒ ඇගේ රුව හෝ තාරුණ්‍යය නිසා නොව, ඇය තුළද ඔහු තුළ වූ බලාපොරොත්තුව තිබෙන නිසාය.

කොණ්ඩා සකසන්නිය පැමිණියේ හඬාගෙනය.

''කුමක්ද ගැටලුව?'' ඩේබ්‍රේක් ඇසුවාය.

''උත්තමාවනි, ඒ අර යක්ෂයා නාට්‍රෙබ්.''

''ඔහු ඔබව දූෂණය කළාද?''

''නැහැ. ඔහු මට අත තබන්නේ නැහැ, මා ඔබට සේවය කරන නිසා. ඒත් ඔහු මගේ නැගනිය... ඇගේ වයස දහඅටයි... ලිලී මලක් සේ ලස්සන මගේ නැගනිය... ඔහු ඈ දූෂණය කළා.''

ඩේබ්‍රේක්, විනිවිද පෙනෙන සිවුරකින් සැරසී, වරලස මුදාහැර නිරුවත් දෙපයින් හදිසියෙන් තම සයනාගාරයෙන් පිටවූවාය. මාලිගයේ හැම කොරිඩෝවකම කෙළවර සිටි මුරභටයින් පසුකර ගිය ඇය, තමාට ගෞරව දක්වමින් හිස නැමූ ප්‍රධාන ආවතේවකරුද හප්පාගෙන ඉදිරියට ගියාය. කවුන්සිල් කාමරයට කඩා වැදුණු ඇය දුටුවේ, ප්‍රදේශයේ ආර්ථික

තත්ත්වය පිළිබඳ තොරතුරු පවසන යෙගෙබ්ට සවන් දී සිටින ටෙෆ්නැක්ය!

"ඔබේ උපදේශක නාටෙබ් මෘගයෙක්, අපරාධකරුවෙක්!" ඇය දැඩි කෝපයෙන් ටෙෆ්නැක්ට කීවාය.

"කිමද ඔබ මෙතරම් කලබලයෙන්, ඩේබ්‍රෙක්?"

"ඔහු මගේ කොණ්ඩා සැරසිලි කරන්නියගේ නැගනිය දූෂණය කළා."

"විය නොහැකියි" යෙගෙබ් කීය. "මට දිවුරන්න හැකියි ඔහු එසේ නොකරන බවට."

"ඔහුට මෙහි පැමිණ ඒ ගැන පවසන්නැයි කියන්න." ඩේබ්‍රෙක් අණ කළාය.

යෙගෙබ්ගේ මුහුණ කළු විය. "අණදෙන්නේ... ජෙනරල් නෙවෙද?"

"පිටතට ගොස් ඔබේ මිතුරා කැඳවන්න." ටෙෆ්නැක් කීය.

උපදේශක හිස නවා පිටතට ගියේය.

"ඔවුන් ඉවත් කරන්න." ඩේබ්‍රෙක් අවවාද කළාය. "අවසන ඔවුන් නිසා මිනිසුන් ඔබට වෛර කරාවි. අපගේ නීතියට අනුව දූෂණයට දඬුවම මරණයයි."

"මගේ උපදේශකයින්ගේ දක්ෂතාවය ගැන විවාදයක් නැහැ." ටෙෆ්නැක් කීය. "සමහර අවස්ථාවල ඔවුන්ගේ ක්‍රම කෘෘර වුවත් ප්‍රතිඵල විශිෂ්ටයි. හේතුව මා ඔවුන්ට ඉඩ දෙන නිසා, ධනවතුන් වෙන්නට. ඔවුන්ට ස්තුති වන්නට මිනිසුන් මට බයයි. ඔවුන් දන්නවා ඔවුන් මට කීකරු විය යුතුයි කියා."

"එසේ නම් ඔබ දූෂකයෙකු වරදින් නිදහස් කරනවාද?"

"පළමුව අපි ඔහුට සවන් දෙමු."

නාටෙබ් එහි පැමිණි විට, ඩේබ්‍රෙක් තම චෝදනා, වාත වේගයෙන් ඉදිරිපත් කළාය.

"හෝ! මෙය සුළු වැරදි වැටහීමක්." නාටෙබ් කීය.

"සත්‍යය නම්, ගැමියෙකුගෙන් කරදරයට පත් වූ බව දක මා එම තරුණියගේ සහයට ගියා. මා එවිට දුටුවා ඇය බොහොම සාපරාධී ලෙස ලිංගික අපහරණයට ලක් වී ඇති බව. මා වහාම නියම කළා ඇයට සියලු සත්කාර කළයුතු බවට, මගේ වියදමින්."

"ඇය චෝදනා කරන්නේ ඔබටයි. ගැමියෙකුට නොවෙයි."

"ඇය ඇත්තටම සිටියේ සිහිසුන්ව. ඒ කම්පනය ඇය උමතුකරවා ඇති. මට එය තේරුම්ගත හැකියි. මා ඇයට සමාව දෙනවා.."

"අධිකරණය ඉදිරියේදී ඇය ඔබට විරුද්ධව සාක්ෂි දේවි."

"නැහැ. කිසි ලෙසකින්වත්. මන්ද මා සතුව සාක්ෂි තුනක් තිබෙනවා. මගේ ආරක්ෂාවට සොල්දාදුවන් තිදෙනෙක් සිටියා. ඔවුන් දුටුවා ගැමියා පැන දුවන හැටි. ඔවුන්ගේ කට උත්තරය සියල්ල විසඳාවි."

යෙගෙබ් සිනාසුණි. "ජෙනරල්, නාට්‍රෙබ් ගැන සැකයක් නැහැ."

"ඒ ගැටලුව අවසානයි." ටෙෆ්නැක් පැවසීය.

✸

අකනොෂ් කුමරුගේ බිරිඳ, ශ්‍රේෂ්ඨ දකුණ ගැන ගීයක් ගයා වීණාව වැයුවාය. හිරුගෙන් දුවී යමින් ම සතුට දනවන දකුණු දෙස! එය, ඔවුන් ආදරයෙන් බැඳුණු මුල් අවදියේ ඉවුර මත වැතිර දිය බිවූ ප්‍රේමණීය ගංගාව එහි ගෙන ආවාය. එය, ගං දිය පහර සමග පොර බදමින්, කහ පැහැති වැල්ලේ වැතිරෙන තාරුණ්‍යය ගැන කතා කළාය.

ස්වාමියාට කතා කරන්නට ගීතය අවසන් වනතෙක් බලා සිටි ආවතේවකරු, හඬන්නට ආසන්නය. මේ දෙදෙනාගේ කාමරයට එන්නට අවසර තිබුණේ ඔහුට පමණි. ඊට හේතු වූයේ යෙගෙබ්ගෙන් අල්ලස් ගත්තා සේවකයින් අකනොෂ් කරදරයක දැමීමට උත්සාහ කරන බවට ඔහුගේ බිරිඳ දැන සිටීමයි.

"ටෙෆ්නැක් කෝපයෙන්." ආවතේවකරු කීය.

"මා සමග?"

"නැහැ, කුමරුනි. එහෙත් මෙය හොඳ පුවතක් නොවේ. පියැන්කිගේ ගමන අතරතුර ඔහු මරාදමන්නට යෙදවූ ලිබියානුවන් පරාජය වූ බව ඔහුට දැනගන්න ලැබුණා. කළු පාරාවෝ දෙවන ඇළ පාර තරණය කර තිබෙනවා. ඔහු ඉක්මනින් ම එලිෆන්ටයින් වෙත ළං වේවි."

"පියැන්කි ඊජිප්තුවේ? ඒ උමතු සිහිනය සත්‍යයක්?"

✸

මුගටියා වැඩිම කාලයක් ගත කළේ තද නින්දේය. වැලියන්ට් ඉතාම සන්සුන්ය. ගඟ දිගේ යාත්‍රා කිරීම සතුට දැනවීය. පියැන්කි හා අබිලා එක්ව ගතකළේ ඉතා ප්‍රීතිමත් කාලයකි. නපාටාවේදී ඔවුනට

පැවරී තිබූ වගකීම්, ඔවුන් ඉතා ආශාවෙන් පැතූ සතුට ලබා ගැනීමට බාධාවක් විය. මෙහිදී,හොඳින් වාතාශ්‍රය ඇති, ඉඩකඩ ඇති කාමරය තුළ හැම මොහොතක්ම ප්‍රීතිමත්ය.

අබිලා සතුව,ගැඹුරු දියේ වශීකෘත බවත්, බළලකුගේ ඉන්ද්‍රජාලීය ප්‍රබෝධයත් විය. ආශාවෙන් කුල්මත් වී සිටියද ඇය තුළින් ප්‍රභූත්වය පහව ගියේ නොවේ. පියැන්කි වශී කළ ඇය, හැම දවසකම ඇරඹෙන චාරිකාවකි. ඇය නොමැතිව ඔහුට කිසිදු ජයක් ලැබිය නොහැක.

මුගටියා අවදිව පස්සා ගත්වලින් හිට ගත්තේය. උගේ ඉදිරිගාත් කාමරයේ ලී දොරට තදවී තිබිණි. ඉන් මොහොතකට පසු කුල්හෙඩ් දොරට ගැසීය.

''එන්න.'' පියැන්කි කීය.

කුරුමිට්ටා දොරෙන් අඩක් විවර කළේය. ''උතුමාණෙනි, කප්පිත්තා කලබලයෙන්. සුළඟ දකුණෙන් හමන්න පටන්ගෙන. දූනටමත් සුළං පහරට ගඟේ රැළි නැගෙනවා. සැඩ පහර වේගවත්. මේලෙසින් දිගටම තිබුණොත් එය භයානක තත්ත්වයක් වේවි, උතුමාණෙනි. අප, පළමුවෙන්ම හමුවන පහසු තැනකදී, නැවතී, බෝට්ටු නවත්වාගත යුතුයි. නැතහොත් අපගේ බෝට්ටු පෙරළී යාවි.''

''අප පළමු දියපහරට ළං වෙනවා නොවෙද?''

''එසේයි, උතුමාණනි.''

''අප වහාම පුස්තකාලයට යා යුතුයි.''

එහි, කුල්හෙඩ් විසින් ගෙන එන ලද පැපිරස් රෝල් කීපයක් විය. ඒ අතරින් වඩාත්ම වැදගත් වූයේ චාරිත්‍ර සඳහන් පැපිරස්ය. එහි, උත්සව පිළිබඳ දින දර්ශන, දෙවොල් ලේඛනය සහ රට පාලනය සඳහා අත්‍යවශ්‍ය කරුණු සිය ගණනක් සඳහන් පැපිරස් තිබිණි. පියැන්කි, පැපිරස් දුසිමක් පමණ දිගහැර අවශ්‍ය පැපිරසය තෝරාගති.

ඔහු වහාම භාණ්ඩ සැපයීම භාර තැනැත්තා කැඳවීය. නැවේ ඉදිරිපසට ගියේය. ඔහු විසින් නම් කරන ලද දෑ අප්‍රමාදව එහි ගෙනෙන ලදී. නිල් ඔටුන්න පැළඳගත් පාරාවෝ, නයිල් නදියේ ආත්මයට; රාජකීය ලිනන්වලින් තැනූ කෙටි සායක්, හොඳම තත්ත්වයේ හිස් පැපිරස් පත්‍රයක්, උත්සව සඳහා අවශ්‍ය තෙල්, තම රාජ්‍ය සමයේ මුල් කාලයේ තනන ලද වයින් ජෝගුවක්, මී පැණි කේක් හා රන් පොල්ලක් පූජා කළේය. රතු පැහැති දිගු ඇඳුමකින් සැරසුන අබිලා රතින් කළ සීනු දෙකක් හඬවා,

අහිතකර බලයන් පන්නා දමා මිනිස් සහ ගංගාව අතර සාමය නැවත ඇති කළාය.

දකුණු සුළඟ ටිකෙන් ටික දුර්වලව ගියේය. දියසුළි අතුරුදහන් විය. ගංගාව සුපුරුදු සන්සුන් සළුව පොරවා ගත්තාය.

''පූජා පවත්වන්න,'' පියැන්කි කෙඳිරීය. ''එයයි පුරාණ ලියවිලි අපට කරන අවවාදය. නීච බව ඉවත් කරන මග විවර කළ හැක්කේ එයට පමණයි. අබිලා, කිසිදා අමතක නොකරන්න, මුළු ඊජිප්තුවම මැවුම්කරුට පිදෙන පූජා භාණ්ඩයක් බව. ඒ සත්‍යය මතයි මා මගේ යුද ක්‍රමෝපායන් තීරණය කරන්නේ.''

# 38

පළමු ඇළපාර පුරාම විසිරී තිබූ කළුගල් දුටු නුබියානුවෝ, ඒ අවුල්ජාලය තුළින් කෙසේ යාත්‍රාකරම්දැයි පුදුමයෙන් බලා සිටියහ. ගංගාව ඒ කළුගල් අතරින් ගලාගියේ තම කෝපය පිට කරන්නා සේ මහා වේගයකිනි.

පාරාවෝ තෙවැනි සනුස්රෙට් විසින් වසර දහසකට පෙර තනන ලද මේ ඇළ සොයාගැනීමට, ඒ පිළිබඳ විස්තර සහිත සිතියම් පියැන්කිට සහාය විය. අනතුරු සහිත කාලයකදී පවා එහි යාත්‍රා කිරීමට හැකිවිය. නුබියාවේ වෙළෙඳාමට පහසුකම් සැලසීම සඳහා, පසුකලෙක පහළ වූ රාජවංශයක පාලකයින් විසින් එහි පළල වැඩිකර තිබිණි. ඒ අනුව ඇළක් බවට පත් කරනලද ඒ මඟ දිගේ බඩුබෝට්ටු පවා ප්‍රවාහනය කරන්නට යෙදිනි.

මෙතැනයි දෙවියන්ගේ භූමියට පිවිසෙන දොරටුව, තිවුන් ජාතියක ප්‍රධානියා වූ, ඊජිප්තුවේ පළමු පළාතට පිවිසෙන දොරටුව. ඊජිප්තු දේශසීමාව පිහිටියේ එතැනයි.

මුලින්ම එලිෆන්ටයින් බලකොටුව නුබියානුවන්ට පෙනුණේ ජයගත නොහැකි බාධාවක් ලෙස වුවද, මෙතැන් පටන් එහි විශාල බිත්ති උතුරු ආක්‍රමනිකයා නැවැත්වීමට තනන ලද්දක් බව ඔවුනට දැනිණි. මුළු භූමියම ආරක්ෂක බිත්තිවලින් වටවී තිබූ අතර කළු පාරාවෝට අයත්ය. සියල්ලන්ගේ ම බලාපොරොත්තුව වූයේ පියැන්කි බලකොටුව අසලින් බැස, තම හමුදාවන් දෙක එකතුකරතැයි කියාය. එහෙත් පියැන්කිගේ හදවත ඊටත් වඩා බරපතල දෙයක් ගැනයි තැවෙන්නේ!

රාජකීය නෞකාව ක්නුම් දෙවියන්ගේ දෙවොල් අසල නවත්වන ලදී. මේ දෙවොල බැටළු දෙවියන් වන, කුඹල් සක මත ජීවය මැවූ, වාර්ෂික නයිල් ජලගැල්ම ඇතිකරන දෙවියන් වෙනුවෙන් තනන ලද්දේ විය. පියැන්කි තනිවම ජැටියට බැස්සේය. තම නැව් පන්තියේ නායකයින්

සහ, කළු පාරාවෝ දුටු විගස බියෙන් වෙව්ලායන බලකොටුවේ සොල්දාදුවන් බලා සිටියදී ඔහු එහි පා තැබීය.

පියැන්කි ඒ අසිරිමත් දෙවොල් දොරටුවෙන් ඇතුල් විය. එහි දී ඔහු පිළිගන්නට යෙදුනේ ක්නුම්හි ප්‍රධාන පූජක තැන විසිනි. වැලිගලින් තනන ලද එම දෙවොලේ දොරටු සහ දොරවල් කළුගලින් තනා තිබිණි. එහි ඇතුළත සුවඳ දුම්වල සුවඳින් පිරී ගියේය.

"උතුමාණනි, මේ දෙවොල ඔබගෙයි." පූජකයා කීය.

"මා මගේ පියාණන්ගේ දෙවොලට ගෙනයන්න."

එය කුඩා කාමරයක් විය. එහි බිත්තිවල පින්තාරු කර තිබුණේ නුබියානු රාජ වංශයේ මූලිකයා වූ, පියැන්කිගේ පියාණන් වූ කෂ්ටා නම් පාරාවෝ, ක්නුම් දෙවියන්ට පුද පූජා පවත්වන ආකාරයයි. කෂ්ටාගේ ප්‍රතිමාව අසල වූ ශෛලමය පුවරුවක; එලිෆන්ටයින් බලන්නට පැමිණි ඔහු විසින් එහි ප්‍රධාන දෙවොල හොඳින් සරසන ලද බව සඳහන්ව තිබිණි.

පියැන්කි, තම පියාණන්ගේ මළවුන්ගෙන් නැගිටීමට අදාල චිත්‍රලේඛන කියවා බැලීය. වසර සියගණනක් පුරාවට ප්‍රකාශ වූ බලය බිඳකුදු අඩු නොවී තිබූ සංඥා මගින්, කෂ්ටා ඔහු සමග කතා කළේය. කළුගලෙහි ස්ථිරභාවය විසින් පෝෂණය කරන ලදුව, ජීවය ඇරඹුන දා දෙවියන් විසින් පවසන ලද වදන්, එම චිත්‍රලේඛන තුළ ආරක්ෂිතව තිබිණි. මහා රැම්සීස්, සේටිගේ කාර්යභාරය ඉදිරියට ගෙනගිය අයුරින්ම පියැන්කි තම පියාණන්ගේ කාර්යභාරය ඉදිරියට ගෙන ගියේය. හැම පාරාවෝ කෙනෙක්ම තම පූර්වජයාගේ කාර්යභාරය ඉදිරියට ගෙනයමින් ගොඩබිම් දෙකේ සතුට ස්ථාපිත කළ යුතුය.

දන් තත්ත්වය වෙනස් වී ඇති බව පියාණන්ට පවසන්නට පියැන්කිට හැකියාව තිබිණි. ටෙෆ්නැක්ගේ කඩාවැදීමත් සමග නුබියාව රැකගැනීම සඳහා ඔහු නපාටාවේ නැවතිය යුතුව තිබූ බව, ඉහළ හා පහළ ඊජිප්තුව නැවත එකමුතු කිරීම පහසු නොවන බව,.... එහෙත්, සදාකාලිකත්වයට පියනැගූ තම පියාගෙන් උපදෙස් පැතීම පුත්‍රයෙකුට නොගැලපෙයි.

✸

එහි මිනිසුන් තිදෙනෙක් වූහ. උස දෙදෙනෙක් හා මිටි කෙනෙක්. මිටි මිනිහා එහි පාලකයා විය. ඒ භූමිය ඉතා හොඳින් දන සිටි හෙයින්

අණදීම ඔහු විසින් සිදු විය. ටෙෆ්නැක් ගේ ආක්‍රමණයට පෙර ඇත දකුණේ, හරේ පළාතේ ගම්මානයක ජීවත් වූ ඔහු, පියැන්කිගේ නුබියානු හමුදාවට සම්බන්ධව සිටියේය.

දේශ සීමාවෙහි සම දුරින් පිහිටුවන ලද ආරක්ෂක කුටි මගින් එහි ඇති කර තිබුණේ ආරක්ෂක දැලකි. ඉතින්, බඩගාගෙන යන්නට පුහුණුකර සිටි මේ මිනිසුන් තිදෙනාට හැර අන් ඕනෑම කෙනෙකුට එය තරණය කිරීම සිහිනයක් ම විය. එහෙත්, ඒ තිදෙනාට, ඒ දැලෙන් රිංගා යාමට තැනක් සොයාගත යුතුව තිබිණි. ඒ ගමන තීබසයෙන් අවසන් වන අතර එහිදී ලිබියානු ඔත්තුකරුවන් හා එක්වන ඔවුන් පියැන්කි මරාදැමීමට අවශ්‍ය කටයුතු සූදානම් කරනු ඇත.

ජංගම මුරභටයින්, ඔහු බලාපොරොත්තු වූවාට වඩා බෙහෙවින් පරීක්ෂාකාරී වීම නිසා, මේ වන විට මිට්ටාට සිව්වරක්ම තම උත්සාහය අත්හැර දමන්නට සිතුණි. ඔහුගේ සගයින් උත්සාහය අත්හැර ආපසු යමුයි යෝජනා කළ නමුත්, ඔහු සතුව තවත් එක් අවසන් අදහසක් විය. ඒ වූ කලී, ගොවිපොළ හා කාන්තාරය අතර පිහිටි අත්හැර දමන ලද සුසාන භූමියයි. ඊජිප්තුවෝ මිත්‍යා දෘෂ්ටිකයෝය. අවතාර සැරිසරන ඒ භූමියේ ආරක්ෂකයින් සිටිය නොහැකිය. ඔවුනට ඒ සොහොන් අතරින් රිංගා ගියේ නම්, සතුරාගේ විමසිලිමත් දෑසට හසුනොවී පැනගත හැකිය.

සුසානභූමියට පා තැබූ විගස, සතුරාගේ දුර්වල තැන සොයාගත් බව මිට්ටාට දැනුණි. කෙසේ වෙතත් ඔහු තම ආයුධය අතින් අල්ලාගෙන සිටි අතර සෙසු දෙදෙනාද ඔහු සේ ම පරීක්ෂාවෙන් සිටිනු ඇතැයි ඔහු බලාපොරොත්තු විය. හරේ පළාතෙන් පිටත් වූ විගස ඔවුනට ඇළ හරහා ගොස්, ධීවර බෝට්ටුවක් සොරාගෙන තීබසයට ළංවිය හැකිය. ලිබියානු ඔත්තුකාර ජාලයේ ප්‍රධානියා ඔවුන් බලාපොරොත්තුවෙන් එහි රැඳී සිටියේය.

පියැන්කි ඝාතනය සැලසුම් කිරීම පහසු නොවනු ඇත. එහෙත්, නිසැකවම ඒ සඳහා අවස්ථාවක් සොයාගත හැකිය. කළු පාරාවෝගේ පැමිණීම කෙතරම් සුවිශේෂී අවස්ථාවක් ද යත්, නොකඩවා ම පැවැත්වෙන උත්සව හා රාජකාරි මට්ටමේ හමුවීම්වලදී ඔහුගේ ආරක්ෂාව ගැන වගකීම පහසු නොවනු ඇත.

ඒ තිදෙනා සුසානයේ අවසන් සොහොන පසු කළහ. පෙරමුණ ගත්තේ උස මිනිහෙකි. තමා ජයග්‍රහණය කළේය යන පණිවුඩය දෙන්නට ආපසු හැරෙන ඔහුගේ හිස මත වැටුණේ ලැමසෙක්නි ගේ ලී අතයි.

අනෙක් උස මිනිහා තම කෙටි කඩුව ඇදගත් නමුත්, යුද නායකයාගේ පොරොව ඔහුගේ ගෙල හරහා ඇදී ගියේය. සුසානභූමිය මැදින් දිවගොස් සැඟවෙන්න තැත් කළ මිට්ටා ට, සොල්දාදුවෙකුගේ හෙල්ල ප්‍රහාරයකට මුහුණ දෙන්නට සිදුවිය!

"මා දන සිටියා ඔවුන් එවැනි මෝඩකමක් කරාවිය කියා." ලැමසෙක්නි තම භටයින්ට කීය., "ඒ නිසයි මා එක මාවතක් පමණක් විවර කර තැබුවේ. මේ මන්ද බුද්ධිකයින් සිතුවා මා අවතාර වලට බියයි කියා. බේරී ගිය කිසිවකු සිටීද?"

"නැහැ නායකතුමනි."

"කණගාටුයි! අපට තිබුණේ ඔවුන් අල්ලාගෙන ප්‍රශ්න කරන්නයි. ඔවුන් කදිම බොරු තොගයක් පවසන්නට තිබුණා."

ඔවුහු කඳවුරට ආපසු ආහ. බීර කෝප්පයක් බී පිපාසය සංසිඳුවාගත් ලැමසෙක්නි, පෝර්මාගේ කුඩාරමට ගියේය.

"මා ලිබියානුවන් තිදෙනෙක් නැවැත්වූවා. ඔවුන්ගේ උත්සාහය වුණේ පැනගන්නට මෙතැන පසුකර. ඔබ දන්නවාද එහි තේරුම?"

"හමුදාවෙන් පැන යන්නත් ද?"

"දකුණු දෙසට? කිසි කලෙක නැහැ. ඔවුන් ගියේ තීබසයට."

"හැකිද ඔබට එය ඔප්පු කරන්නට?"

"මගේ සාක්ෂියයි මගේ ඉව. ඔවුන් තීබසය බලා ගියේ නිකම්ම නොවෙයි. ඔවුනට හොඳ පිළිගැනීමක් එහි ඇති."

"විකාර! තීබසය පියැන්කිට පක්ෂපාතීයි."

"ඔබ සිතනවාද තීබසයේ ටෙෆ්නැක්ට උදවුකරුවන් නැතැයි කියා? අවම වශයෙන් ඉතා සුළු සංඛ්‍යාවක් හෝ උතුරු ජයග්‍රහණය බලාපොරොත්තු වේවි."

"කිමද ඔබ එසේ සිතන්නේ?" පෝර්මා ඇසීය.

"මේ යක්ෂයින් තිදෙනා ඔවුන්ගේ තීබස සගයින්ට උපදෙස් රැ ගෙන ගියා. කළු පාරාවෝට එරෙහිව සටනක් සූදානම් කරන්නට."

"ඝාතන සැලසුමක්?"

"පියැන්කි ඝාතනය කළහොත්, අප නුබියාවට ආපසු යනවා, නපාටා රැකගන්නට. එවිට ටෙෆ්නැක්ට සම්පූර්ණ නිදහස ලැබේවි."

''ඔබ නිවැරදියි,නිවැරදියි.'' පෝර්මා කීවේය.

ඒ අඳුර මැදින් තමන් වෙත එන අශ්වාරෝහකයකු ඔවුනට පෙනිණි. යුද හමුදා පණිවුඩකරුවෙක් අසු පිටින් බැස ඔවුන් වෙත ආයේය. ඔහු කුඩා ලී පුවරු දෙකක් පොර්මා අත තැබීය. ඉන් එකක් තීබසයෙනි. අනෙක හරේ පළාතේ ගම්මානයක් වූ ජයග්‍රහණයේ කන්ද (Cliff of great victories) වෙතිනි.

පෝර්මාගේ දෑස් ආලෝකමත් විය. ''පියැන්කි, ඊජිප්තු බිමට පා තබලා. ඔහු එලිෆන්ටයින් හි ක්නුම් දෙවොලට ගොස් තම පියාණන්ට ගෞරව දක්වා, නැවත තීබසය බලා පිටත් වී තිබෙනවා.''

''පියැන්කි ඊජිප්තුවේ!'' ලැමසෙක්නි තොල් මැතිරිය. ''පුදුමයක්!'' ඔහුට කියවිණි.

පෝර්මාගේ සතුට වියැකී යමින් තිබිණි. ''අනෙක් ආරංචිය එතරම් සුබනොවෙයි. ටෙෆ්නැක්ගේ පුත්‍රයෙකුගේ අණ යටතේ, උතුරු කුමාරවරුන් එක්වී හදිසි ප්‍රහාරයක් එල්ල කර තිබෙනවා ජයග්‍රහණයේ කන්දට. එවිට අපට කමුන් බලා යාමට ඇති මග ඇහිරෙනවා.''

''නවත්වන්න!'' ලැමසෙක්නි කෑ ගැසීය. ''අප නැවත ඒ ගම්මානය යටත් කර ගන්නවා. අප කළු පාරාවෝට පෙන්වනවා අප බියගුළු මෝඩයින් නොවන බව.''

# 39

ටෙෆ්නැක්ගේ යුද කවුන්සලය තුළ සටන් ඇවිලුනි. සමහරුන්ට උතුරට යාමට අවශ්‍යය. තවත් අයට හෙනෙන් නෙසට් හා කමුන්හි ආරක්ෂාව තර කිරීමට අවශ්‍ය වූ අතර සෙස්සන්ගේ අදහස වූයේ කළු පාරාවෝ සමග මුහුණට මුහුණ සටන සුදුසු බවයි.

අකනොෂ් කුමරු නැගී සිටියේය. ''ඔබ මෙන් ම මමත් ගෝත්‍රික නායකයෙක්.'' ඔහු කීය. ''රණ විරුවෙක්. මා බොහෝ වාර ගණනක් මගේ වීරත්වය හා ධෛර්යය පෙන්වා තිබෙනවා. අද අප අපගේ ජයග්‍රහණ හා පරාජයන් මැන බැලිය යුතුයි. අප පැහැදිලි මනසින්, නිරවුල්ව සිතා බැලිය යුතුයි. පැහැදිලිවම, අපට හෝ පියැන්කිට බැහැ විශිෂ්ට ජයක් ලබන්නට, මන්ද දෙපාර්ශවයේම හමුදාවන් එකසේ දක්ෂයි. අප පොරොන්දු වී තිබෙනවා ටෙෆ්නැක්ට පක්ෂපාතී වීමට. ඔහුගේ නායකත්වයට ස්තුති වෙන්නට, අප සෞභාග්‍යමත් භූමියක් යටත් කරගත්තා, ඩෙල්ටාවේ ඈත කෙළවර සිට හරේ පළාතේ දකුණු කෙළවර දක්වා, අප ඉන් සෑහීමකට පත්ව, ටෙෆ්නැක් ඒ සුවිසල් භූමියේ පාරාවෝ බවට පිළිගනිමු.''

''ඔබට තීබසය අමතකයි.'' ඩේබ්‍රේක් විරෝධය පෑවාය. ''ජයග්‍රහණයේ දෙවියන් වන ආමන්ගේ නගරය නොමැතිව, ඊජිප්තුව යනු දුබල, රෝගී ශරීරයක් පමණයි. ඔබගේ තීරණයට අනුව අප අපගේ ජයග්‍රහණ මැන බලනවා නම් එය අපට උසස් බලාපොරොත්තු දේවි. අපගේ මේ පවතින තත්ත්වය ස්ථිරයි. අප ජයගෙන තිබෙනවා පියැන්කි ඊජිප්තුව බලා ගෙන්වා ගැනීමේ යුද්ධය පවා! ඉතින්, කුමක්ද ඒ බලාපොරොත්තු නොවූ ගමනේ තේරුම? එහි තේරුම... කළු පාරාවෝගේ නුබියානු හමුදාව පරාජිතයි. ඔහු ටෙෆ්නැක්ට කොතරම් බියෙන් සිටිනවාද කිවහොත් ඔහුට ම පුද්ගලිකව සටනට මුහුණ දීමට සිදුව තිබෙනවා. මෙයයි ඒ නීච බියගුල්ලන් තම දුර්වලකම පෙන්වන පළමු අවස්ථාව. අපගේ කිසිදු සොල්දාදුවකු ඔහුට බිය විය යුතු නැහැ.''

ඩේබ්‍රේක්ගේ වාග් චාතුර්යය, ලිබියන් නායකයින් පුදුමයට පත් කළ අතර අකනොෂ්ට පවා ඇය හා වාද කළ නොහැකි විය.

''දැන් ඔහු ඊජිප්තු භූමියේ.'' ටෙෆ්නැක් පෙන්වා දුනි. ''පියැන්කි තව දුරටත් ආරක්ෂිත නැහැ. තීබසය තවමත් සතුරා අතේ වුවත් අපට එහි ඔත්තුකරුවන් සිටිනවා. ඔවුන් අපගේ ජයග්‍රහණය වෙනුවෙන් කළ හැකි සියල්ල කරනවා.''

පෙෆ්ටෝ කුතුහලයෙන් බැලීය. ''ජෙනරල්... ඔබ පවසන්නේ පියැන්කි ඉවත් කෙරෙන බවද?''

''අප ජයගත යුතුයි. ඒ අරමුණ ජයගන්නට කරන සියල්ල සාධාරණයි. කළු පාරාවෝ තම ශක්තිය ගැන විශ්වාසය තැබීම වරදක්. ආමන්ගේ ශුද්ධ වූ නගරයේ ජීවත් වන නිසා ඔහු අපරාජිතයි කියා සිතීමත් වරදක්. ඔහු තේරුම් නොගන්නා එකම දේ මිත්‍රවරුනි, ඔහු අතීතය බව, මමයි අනාගතය!''

✸

තීබසයේ රැඳී සිටින ලිබියානු ඔත්තුකාර නායකයා, ටෙෆ්නැක් විසින් එවන ලද ඔත්තුකරුවන් තිදෙන මරා දැමුණු බව අසා බියට පත් විය. ඔවුනට හරේ පළාත හරහා යාමට නොහැකි විය. ඔවුන් පැමිණියේ නම් ඒ කාර්යය කොතරම් පහසු වනු ඇතිද? එහෙත්, වඩාත් වැදගත් වන්නේ, බාධාවන් ජයගෙන පියැන්කි මරා දැමීම සඳහා අවශ්‍ය ඕනෑම තැනකදී, ඕනෑම අවදානමකට මුහුණ දීමයි. මාස ගණනාවක් පුරා මේ ඔත්තුකාර නායකයාගේ කාර්යය වූයේ තීබසයේ හා නුබියානු හමුදාවේ තත්ත්වය ගැන ටෙෆ්නැක්ට තොරතුරු සැපයීමයි. ඔහුගේ අවසන් පණිවුඩයේ තිබුණේ වචන පහක් පමණි.

''පියැන්කි හෙට කාර්නැක් වෙත ළඟා වෙනවා.''

ඒ කළු පාරාවෝය. ටෙෆ්නැක් පරාජය කළ නොහැකිය. පියැන්කි මියගිය පසු, ඔහුගේ භට හමුදාවන් පසුබැස නපාටා වෙත පලා යනු ඇත. එලිෆන්ටයින් හි බලකොටුව ඔවුන්ගේ මාර්ගය සදහටම වසා තබනු ඇත.

එහෙත්, ඔත්තුකරුවා තවත් ටිකක් කල්පනා කළේය. කළු කොටියා මරන්නටත් පෙර උගේ සම විකුණන්නේ කෙසේද? පියැන්කි අති භයානක සත්ත්වයෙකි. ඔහු සතුව ඇත්තේ කිසිදා නොවරදින ඉවකි. ඉතින්, දුර්වල

මොහොතක් බලා වහා ඔහු යටත් කරගත යුතුය. ඔහුගේ සැකයට බඳුන් නොවන මොහොතක පහර දිය යුතුය. එය සාර්ථක වනු ඇත.!

✸

''මා අර ඩේබ්‍රේක්ගේ ගෙල මිරිකා දමන්නට තිබුණේ බොහෝ කලකට පෙර.'' නාට්‍රෙබ් වේදනාවෙන් පයැඟිලි අතගාමින් කෑගැසීය. ''ඇය භයානකයි. ඒ මෝඩ නායකයින් නිසා ඇය තවත් අහංකාර වෙනවා. ඇගෙන් ඇස් ඉවතට ගත නොහැකිව සිටින ඔවුන් ඈ කියන හැමදෙයක්ම පිළිගන්නවා.

ලී පුවරුවක සටහනක් තබමින් සිටි යෙගෙබ් ඉඳුරාම ඊට එකඟ විය. ''අපට හැකියාව තිබුණා ඇයට වස දෙන්න. ඒත් ඇගේ මරණය ටෙෆ්නැක්ට සති ගණනාවකට මරණය ගෙනේවි. එය සමහර විට මාස ගණනක් වේවි. දැන් අපට ඔහුගේ ශක්තිය අවශ්‍යම මොහොත, පියැන්කිගේ බලපෑම අප වෙත එල්ලවන නිසා.''

''ඉතින්, කුමක්ද ඔබේ යෝජනාව?''

''ඇගේ තත්ත්වය පහළ හෙළිය යුතුයි. අප ටෙෆ්නැක්ට පෙන්විය යුතුයි ඇය වංක, වැඩකට නැති ස්ත්‍රියක් බව. ටෙෆ්නැක් ඇගෙන් මිදිය යුතු බව හා ඇය කිසිදා ඊජිප්තු රැජින නොවන බව.''

''අකනොෂ් ගැන අළුත් තොරතුරු මොනවාද?''

''කිසිවක් නැහැ.'' යෙගෙබ් කීවේය. ''ඒත් මා ඔහුව සමීපව පරීක්ෂා කරනවා. මට විශ්වාසයි, ඔහු තම බිරිඳ සමග කාමරයට වී දොර වසාගෙන නොසිටියහොත් ඔහු අපව පාවාදේවි.''

''ඔබ හිතනවාද පියැන්කිට එරෙහි තීබන් කුමන්ත්‍රණය ජයගනීවි කියා?''

''එය නිකම්ම කුමන්ත්‍රණයක් නම් බැහැ ජයගන්නට. ඒත්, එය සංවිධානාත්මක දෙයක් නම්,අපට සිතාගත නොහැකි තරම් වේගවත් සර්පයෙකුගේ දෂ්ටනයක් නම්, පියැන්කිගේ අවසානය එයයි.''

''මාත් සිතනවා!'' නාට්‍රෙබ් කීය. ''ඉතින්, කුමක්ද අප මේ ඩේබ්‍රේක් සැතිරියට කරන්නේ?''

✸

''එය ලොව හිරු යයි පවසති කවුරුත්.'' ඒ ශුද්ධ වූ ගීතය ගායනා කෙරිණි.

"සිවුකොන ඇති ටැම් හතරින්
ඔසවා සිටින හෙයින් දෙව්ලොව,
තීබසයයි රැජින, පරදන සියලුම නගර,
එයයි මැවුම්කරුගේ ඇස,
කවුරුත් ඇගේ අගය වර්ණනා කරත්,
ලොව උපන් දා දියෙන් මතු වූ,
මැටි පිඩයි මේ විසල් ලෝකය.
ඒ මත මැවුනා ආලෝකයෙ ඇස
තීබස නම් වූ මහා රාජධානිය."

තීබසය දුටු පියැන්කි සහ අබිලාගේ නෙත් සතුටු කඳුළින් තෙත් විය. එහි වූ සිය ගණනක් දොරටු හා ගිණිය නොහැකි තරම් වූ දෙවොල්, ඔවුන්ගේ සිත් සතුටින් පුරවාලීය. පාරාවෝගේ බලයෙන් එය මහත් කීර්තිමත් රාජ්‍යයක් බවට පත්ව සිටී. එසේම, ලිබියානු ආක්‍රමණිකයන්ගේ බලපෑම හේතුවෙන් උතුරට අමතක වී ඇති පුරාණ චාරිත්‍ර හොඳින් රැකගනී. ''සැඟවුණු තැනැත්තා'' නමින් හැඳින්වෙන, මවක් පියෙක් නැති ආමන් දෙවියන්ගේ දෙවොල පිහිටි තීබසය, දෙවියන්ගේ ඉන්ද්‍රජාලීය බලයෙන් මවන ලද තීබසය, ගොඩබිම් දෙකක අන්ධකාරය මැද බැබළවීමට, අදෘශ්‍යමාන බලවේගය විසින් තම පණිවුඩය ගෙනදුන් තීබසය...

තමා සිහින දකිමින් සිටි ලොවක එක්වරම උපත ලැබුවා සේ පියැන්කිගේ ඇස් මහත් විය. ඔහු ඒ නගරයේ සමෘද්ධිය අත් දුටුවේය. තීබසය ඔහුට කතා කළාය. ඇය උපන්දා පටන්ම පැවසූ වදන් තෙපලුවාය.

*''ඒ මෙතැනයි. මෙතැනම පමණයි පාරාවෝ කිරුළ දරන්නේ. ඒ, මහ පොළොවේ ගොඩනැගුන මේ දිව්‍යමය නගරය, රජු වෙත රටක් පුදදෙයි. දෙවියන්ගේ කරුණාව සමග, ඒ රටේ මිනිස් ජීවිත සුඛිත මුදිත කරවයි.''*

''අහෝ! ආමන්, පාරාවෝ වෙත එනු මැනවි.'' රැජින අයැද සිටියාය. ''නැවක කප්පිත්තෙකු සේ නිර්භීත ඔබ පැමිණ, ඔහුට ජයග්‍රහණයේ මාවත පාදා දෙන්න. අහෝ! ආමන්, ඔහු වෙත එන්න. කැඩුණු නෞකාවක ආරක්ෂකයා වන ඔබ ඔහුට සතුටේ භූමිය වෙත යන්නට අවසර දෙන්න. අහෝ! ආමන් ඔහු වෙත එන්න, සාමයේ බටහිර භූමිය වෙත යාමට අවසර දෙන්න.''

රාජකීය යුවල නැවෙන් බැස කුඩා බෝට්ටුවකට නැංගෝය. එය හෙමින් හෙමින් ඇළපාර දිගේ යාත්‍රාකොට, කාර්නැක් වෙත යාම සඳහා නයිල් නදියට පිළිපන්නේය. හිස මුඩු කරන ලද ශුද්ධ වූ පූජකයෝ, විලෝගස් අතරින් දැඩි හිරු රැස් වැටෙන්නා හාම නියමිත වෙලාවට එහි පැමිණියහ.

රාජකීය යුවල පිළිගැනීමට නියමිතව තිබුණේ, දැඩි ලෙස රෝගාතුරව සිටින ආමන්ගේ බිරිඳ විසිනි. රෝගී වුවද චාරිත්‍රය වූයේ එයයි. එහෙත්, ඔවුනට ආචාර කළේ මහලු පූජකයෙකි.

''ඔබට ආමන්ගේ ආරක්ෂාව ලැබේවා, උතුමාණෙනි, තීබසයේ පූජකවරුන් හා පූජකවරියන් වෙනුවෙන් මට ඔබ පිළිගන්නට අවසර දෙන්න.''

''කිමද මගේ සහෝදරිය මෙහි නාවේ..?''

''අහෝ උතුමාණෙනි, එතුමියට අසාධ්‍යයි.''

පියැන්කිට තම සොහොයුරියගේ ඇඳ අසලට යාමට අවශ්‍ය විය. එහෙත් චාරිත්‍රානුකූලව, දෙවොලට ඇතුල් වීමට පෙර ආමන් දෙවියන්ට පූජෝපහාර පැවැත්විය යුතු විය. එහෙයින් ඔහු තම නාවිකයින්ට පූජා භාණ්ඩ ගෙනෙන්නැයි අණ කළේය. බැටළුවෙකු තරම් බර රනින් කළ මල් බඳුන්, රිදී කොතල, කුලුනු වල මුලට යෙදීම සඳහා වන රන් පත්‍ර, මිනිසුන් හයදෙනෙකු විසින් ඔසවාගෙන යන්නට තරම් විශාල ශෛලමය පූජාසන සහ කාර්නැක් රන්කරුවන් විසින් චාරිත්‍ර ඉටුකිරීමට හා පිළිම ආවරණය කිරීම සඳහා යොදා ගැනීමට අති විශාල රන් ප්‍රමාණයක් ඔවුන් විසින් ගෙනෙන්ට යෙදුනි.

තම හද පෙළන වේදනාව පසෙක ලූ පියැන්කි මේ තිළිණ දෙස සිත යොමු කළේය. ඒ වූ කලී, ආමන් දෙවියන් වෙත ඔහු තුළ වූ විශ්වාසය පෙන්වන දෘශ්‍යමාන දේය. දෙවියන්ගේ සහය නොමැතිව කරන ඔහුගේ හැම ක්‍රියාවක්ම නිශ්ඵල වනු ඇත.

# 40

ආමන් බිරිඳගේ සහායිකාව, සුවඳ ගන්වන ලද තෙත තුවායක් ඇගේ නළලත තැබුවාය.

"මගේ අත අල්ලා ගන්න'' මහලු කත ඇයට ආයාචනා කළාය.

''ඔබ ඒතරම්ම දුර්වල බවක් පෙනෙන්නේ නැහැ.'' මාජොරම් ශෝකය සඟවා ගනිමින් කීවාය.

''අසත්‍යය නොපවසන්න. මා දන්නවා මා මියයමින් සිටින බව. පියැන්කි පැමිණියේ නැතිද?''

''මුරකරු ඔහුගේ නැව් පන්තිය දක තිබෙනවා.''

''අහෝ! ආමන්. ඔහු දකින තෙක් රැඳී සිටින්න මට ශක්තිය දෙන්න. මට අවශ්‍යයි තව එක් වතාවක් ඔහු දකින්නට. මට ඊට ඉඩ සලසා දෙන්න. ආමන්!''

'' ඔබ ජීවත් වෙනවා, මට විශ්වාසයි.'' මාජොරම් කීවාය. ''අහෝ උත්තමාවනි, මගේ තරුණ වියෙන් බිඳක් ඔබට දිය හැකි නම්.''

''නැහැ දියණිය, ඔබ එය හොඳින් ආරක්ෂා කරගත යුතුයි. මගේ ජීවිත ගමන වියා අවසානයි. මා ආමන්ට ස්තුති කරනවා මෙතරම් ලස්සන ලොවක්, මේ දෙවොල තුළ මෙතරම් සතුටක් මට ලබාදීම වෙනුවෙන්. මිනිසුන්ගෙන් ඈත්ව... මට... වතුර...''

මාජොරම් මුහුණ සඟවාගෙන වැලපුණාය.

ඇය කෝප්පයකට සිසිල් දිය පුරවන අතරේ, කළුවර ලීයක් සේ කළු පැහැති යෝධයෙක් ආමන්ගේ බිරිඳගේ කාමරයට ඇතුල් විය. රනින් කළ වාටි සහිත කෙටි සායකින් සැරසී සිටි ඔහු කැඳවාගෙන එන ලද්දේ රූමත් නුබියානු තරුණියක විසිනි.

මාජොරම් ඒ දසුනින් බියට පත් වූවාය. ''මම... මම...''

''මගේ සහෝදරිය තවම ජීවතුන් අතරද?''

මාජොරම් හිස නවා ආචාර කළාය. ''එසේය. උතුමාණෙනි. ඇය ඔබ දකින ආශාවෙන් බලා සිටිනවා.''

පියැන්කි දුටු මහලු පූජකවරිය තම වෙහෙස නොතකා මොහොතක් ඉඳගන්නට තැත් කළාය. දෙදෙනා දිගු වේලාවක් එකිනෙකා වැළඳගෙන සිටියහ. ඔවුනතර වදනකුදු හුවමාරු වූයේ නොවේ.

ඉක්බිති ආමන් බිරිඳ ෂෙපෙනා දෙස බැලුවාය. ''ඔබේ දියණිය,'' ඇය පාරාවෝට කීවාය. "ඈ කොතරම් රූමත්ද?" ඇගේ දෑසේ ගැඹුරු බැල්ම. ඔව්. ඒ ඇයයි. එසේ නොවෙද? මගෙන් පසුව මෙතැනට සුදුසු ඇයයි. ඔබ එය නැණවත්ව තෝරා තිබෙනවා. එන්න දරුවා, මගේ අවසන් වදන් ඔබ සඳහායි. මා ඔබට ඔබේ තනතුරේ රහස් පවසන්නම්. එවිට ඔබට හැකිවේවි, ආමන් බිරිඳ ලෙස ඉතාමත් නිවැරදිව සියලු චාරිත්‍ර ඉටුකරන්නට.''

✸

පූර්වජයා අවසන් ගමන් ගොස් පැයකට පසු, ඒ සන්ධ්‍යාවේ ෂෙපෙනාට ආමන්ගේ බිරිඳගේ තත්ත්වය ලබා දෙන්නට යෙදිනි. තීබසයේ දෙවොල්වල රැජින ඇයයි. වැවෙන් දිය නා පිරිසිදු වූ ඇයට ශුද්ධ වූ සිවුරු පිළිගන්වා, ඇගට හිරවූ දිග ඇඳුමක් අන්දවා රන් පාවහන් පළඳවන ලදී. ඇගේ හිසේ ගිජු ලිහිණියෙකුගේ සමින් කළ සැරසිල්ලක් විය. එය ඇයගේ විශ්විය මෑණියන් වන මට් දෙවඟන සිහිකරමින් පළඳවන ලදී. ඇගේ නළලත, රනින් කළ නාග රුවක් රැඳිනි. ගෙල වටා වූයේ ආත්මීය පෝෂණය විදහා දක්වන පළල් රන් කරපටියකි.

ඇයට පෙර සිටි සෑම ආමන් බිරිඳක් සේම ෂෙපෙනාද, විවාහ නොවීමට හා දරුවන් නොලැබීමට පොරොන්දුවක් දුන්නාය. ඇගේ එකම සැමියා වන්නේ දෙවියන්ය.

ඉන්පසුව ආමන්ගේ නව බිරිඳ, සතුරාගේ ඉතා කුඩා ඉටි පිළිමයක් නියනකින් සූරා, අඟුරු කබලකට දැමුවාය. සතුරා බල රහිත කරවීමත්, නීච බලය තීබසයෙන් බැහැර කිරීමත් එහි අරමුණ විය. අවසානයේ දී, මැවීමේ රහසිගත ගින්න ලෙස සැලකෙන ටෙෆ්නට් දේවතාවියගේ මහ පොළොවේ නියෝජිතයා ලෙස ඇය, සාධාරණත්වයේ සංකේතය වන මා ආට් ප්‍රතිමාවක් පූජා කළාය.

තීබසයේ ආවතේවකරුවෙක්, ධාන්‍යාගාර අධීක්ෂක ලේකම්වරුන් හා වැඩපොළ අධීක්ෂකවරුන්ගෙන් සමන්විත මණ්ඩලයක් ඉදිරිපිට,

පියැන්කි තම දියණිය ආමන්ගේ බිරිඳ ලෙස නම් කළේය. ඇයට, කාර්නැක් තුළ තනන ලද දෙවොලක් හිමිවන අතර, මරණින් පසු ඇය වන්දනාවට පාත්‍ර වනු ඇත.

✸

ඒ අළුයම් කාලයයි. චාරිත්‍ර ඉටුකළ දීර්ඝ රාත්‍රියකින් පසු ෂෙපෙනාට වෙහෙසක් නොදැනිණි. ඒ කෙටි කාලය තුළ ඇයට ඇගේ තාරුණ්‍යය හා උපන් බිමද අහිමිව ගියේය. දැන් ඉතින් ඇයට කිසිදා කාර්නැක් හැරයා නොහැක. ඈ ඉන් පිටවන්නේ බටහිර ඉවුරේ පිහිටි ජැමට් දෙවොලට යාමට පමණි. ඇයද, එම භූමියේ පෙර සිටි ආමන් බිරියන් හා සමග බද්ධ වනු ඇත.

ෂෙපෙනා, ශුද්ධ වූ වැව දෙස බලා සිටින අතරේ ඇගේ මව ඇය සොයා ආවාය. උදාවන හිරුගේ පළමු රැස්දහර ඔවුන් මත වැටුණි.

අබිලා මෙසේ කීවාය. ''අදයි ඔබ පාලකයෙකු ලෙස මේ උතුම් භූමියේ සිටින පළමු දවස දියණියනි. දිනපතාම අදෘශ්‍යමාන දෙවියන්ට පුදපූජා කිරීම මගින්, ඔබ ඊජිප්තුව හා සෙසු ලෝකය අතර බැම්ම ශක්තිමත් කරනවා. මට ඔබ ගැන බොහොම සතුටුයි. එසේම, ඔබ යළි කිසිදා නපාටාවට නොයන බව සිහිවන විට මට දැඩි වේදනාවක් දැනෙනවා. මගේ මේ සිතුවිලි ඔබට පැවසීම ගැන කමන්න. ඔබට ශක්තිය අවශ්‍යයි. මා ඔබව විශ්වාස කරනවා.''

ඒ දෙදෙනා එකිනෙකාගේ දෑත් මත වැටුණාහ.

''මගේ පියාණන් මට භාරදුන් වගකීම දැරීමට මා ගැලපෙන බව මා පෙන්වන්නම් මැණියනි, එය මට වඩාත් ශ්‍රේෂ්ඨ තනතුරක් වුවත්.''

''මා, ඔබ හා ඔබේ පියා තවදුරටත් එකිනෙකාට අයිති නොවෙයි, දියණියනි. ටෙෆ්නැක්ගේ ආක්‍රමණයෙන් පසු ඊජිප්තුවේ ආත්මය අපට පවසනවා අප කළ යුතු දේ. අප අපගේ හදවතින්ම එයට සේවය කළ යුතුයි. එවිටයි අප අත් විඳින මේ සතුට අපගේ අනාගත පරම්පරාවලට දැනගත හැක්කේ.''

''ඊජිප්තු රැජිනියනි, ආමන් බිරිඳගේ අළුයම් චාරිත්‍රවලට සහාය වන්නට කැමතිද?''

ඒ මව හා දියණිය. ආමන් දෙවොල වෙත පියනගන්නට වූහ.

✸

තීබසය දැඩි සේ කැළඹී තිබිණි. කළු පාරාවෝගේ පැමිණීම ළ පැරණි නගරයට නව පණක් දී තිබූ අතර, නැතිවී ගිය බලාපොරොත්තු නැවත දළුලා වැඩෙන්නට විය. එක්වරම එය, නැවත එකමුතු වන ඊජිප්තුවක් ගැන සිහින දුටුවාය. තම පූර්වජයන්ගේ අඩිපාරේ යමින්, උතුරේ පවා නැවත මා ආට් නීතිය පිහිටුවන රටක් ගැන සිහින මැවුවාය.

ඒ අනාගතය බිහිවන්නේ, ටෙෆ්නැක්ට එරෙහි දීර්ඝ, ලේ වැගිරෙන භයානක යුද්ධයකින්, දහස් ගණන් ජීවිත නැසෙන යුද්ධයකින් පසුව බව කවුරුත් දැන සිටියහ. එහෙත්, පියැන්කි සටනට සූදානම් වනතෙක්, උත්සව සංවිධානයට හා ප්‍රීතිවීමට කාලය තිබිණි. හෙටත් සතුටින් පිරි දවසක් වනු ඇත. තිබසයේ හැම ප්‍රභුවරයෙක්ම පාරාවෝට රාත්‍රී ආහාර සඳහා ආරාධනා කළහ. ඒ දවස දිවියේ අමතක නොවන දවසක් කරගන්ට පැතූ සියල්ලන්ගේම ඉල්ලීම්, පාරාවෝ ප්‍රතික්ෂේප කළේය. ඒ සමගම; පාරාවෝට, බැරැක්කවලින් පිටතට පැමිණීමට කිසිදු බලාපොරොත්තුවක් නැති බව ඔවුනට වැටහිණි. ඔහු, තම රාජවංශය පටන් ගත් දා සිට තිබසයේ රඳවන්ට යෙදුනු හමුදාවන් පරීක්ෂා කිරීමේ යෙදුනේය. නගරය ටිකෙන් ටික ශෝකී මුහුණුවරක් ගත්තේය. කළු පාරාවෝ සටනට පිටත්වීමට සංඥාව දෙන තුරු ඔවුහු බලා සිටියහ.

මෙවර, ටෙෆ්නැක් විනාශ කිරීම සඳහා යැවෙන්නේ නුබියානු හමුදාව පමණක් නොවේ. පාරාවෝගේ සියලු හමුදාවන් ඒ සඳහා මධ්‍යම ඊජිප්තුවට යනු ඇත.

තීබසයේ සියලුම වැදගත් පුද්ගලයින්ට, කාර්නැක් දෙවොලේ විශාල මිදුලට රැස්වන ලෙස පාරාවෝගෙන් අණ ලැබුණු විට, ඒ සටන් ආරම්භය නිවේදනය කිරීම සඳහා බව ඔවුහු දැන සිටියහ. දින කිහිපයක් පුරාවට නුබියානුවන් අභ්‍යන්තර පුහුණුවීම් වල යෙදී සිටි අතර, නිවාඩු අවලංගු කර තිබිණි.

මින් පෙර පාරාවෝ නො දැක සිටියවුන්, ඔහුගේ බලයෙන් වශීකෘතව ගියහ. එවැනි වීරුවකු සමග සටනට එන උතුරු හමුදාවට තෝරා ගන්නට සිදුවන්නේ පරාජය හෝ පලායාම යන දෙකෙන් එකක් පමණි. තීබසයේ ජයග්‍රහණය පිළිබඳව වූ සිහිනය අලුත් බලයකින් නැවත මතු වී තිබිණි. ඈත දකුණින් පැමිණි මේ නුබියානුවාට, සටන අවසානය දක්වාම ගෙනයාමට ධෛර්යය තිබේද?

"මා ඔබ මෙහි කැඳවූයේ වැදගත් පණිවුඩයක් දෙන්ටයි."

පියැන්කි පැවසීය.

කාගේත් හුස්ම නතරවිය. රටේ හා එහි ශුද්ධ වූ නගරයේ ඉරණම කුමක් වනු ඇතිද?

''ටෙෆ්නැක් සමග යුද්ධයට යාමට පෙර මා කැමතියි නව වසර හා ඔපෙට් උත්සවය සැමරීමට, ඔබ මින් පෙර කළා මෙන්. අපගේ ශිෂ්ටාචාරය උපන් දා සිට අපට අපගේ පූර්වජයන් සමග එකමුතු වීමට අවසර ලබා දුන් මේ චාරිත්‍රාණුකූල අවස්ථාවන් සැමරීමට වඩා වැදගත් වන වෙනත් වගකීමක් මිහිපිට නැහැ.''

ඔහුගේ වදන් සියල්ලන් තුළ විස්මය දනවිය. වහාම ටෙෆ්නැක්ට පහරදීම වෙනුවට පුරාණ උත්සවයක් පැවැත්වීමට පියැන්කි තීරණය කර ඇත. එය තීබසයේ වැසියන් විසින් පවා, මේ උද්ගත වී ඇති තත්ත්වය හේතුවෙන්, ඉතා වැදගත් යයි තීරණය කළ එකකි.

කළු පාරාවෝ උමතුවෙන්ද?

# 41

හෙතෙන් නෙසට් වැසියෝ ටෙෆ්නැක් වෙනුවෙන් උදාන ගී ගයති. ඔහුගේ සැලසුම් කිසිදු බාධාවක් නැතිව ඉදිරියට යයි. ජයග්‍රහණය පිළිබඳ සුළු සැකයක් හෝ නැත. ටෙෆ්නැක් කුමරු, වේගයෙන් වැඩෙන තම ජනප්‍රියත්වය මහත් සතුටින් මෙනෙහි කළේය.

ඩේබ්‍රේක්, කළුපාරාවෝ පරාජය කරන දවස මහත් අභිරුචියෙන් සිහි කළාය. නිතරම බැරැක්ක වෙත ගොස්, සොල්දාදුවන් දිරිගන්වන ඇය දකින්නට ඔවුන්ද මහත් ආශාවෙන් බලා සිටින බව පෙනුණි. ඒ ගැහැනිය, ඔවුන්ගේ දැඩි අධිෂ්ඨානශීලී උත්සාහය මත ඉක්මනින්ම අනාගත ඊජිප්තු රැජින බවට පත්වනවා නොවේද?

ටෙෆ්නැක් පුහුණුවන දුනුවායන් නිරීක්ෂණය කරමින් සිටින විට, යෙගෙබ් තීබසයෙන් ලැබුණු පණිවුඩයක් ගෙනාවේය.

''යෙගෙබ්, කිමද කණගාටුවෙන්?''

''උතුමාණෙනි, අදහාගත නොහැකියි. ඒත්, පණිවුඩය ඉතා විශ්වාසනීයයි. මේ සඳහන්ව ඇත්තේ අපගේ ඔත්තුකරුවන්ගේ රහස් සංකේතයමයි.''

''ඔවුන් ප්‍රතික්ෂේප කරනවා ද පියැන්කි මරාදැමීම?''

''එවැන්නක් නොවෙයි උතුමාණෙනි, එහෙත්, කළු පාරාවෝ විස්මය උපදවන ලෙස හැසිරෙනවා. තම හට කණ්ඩායම් සටනට සූදානම් කරනු වෙනුවට, මධ්‍යම ඊජිප්තුව බලා යාමට අණ කිරීම වෙනුවට, ඔහු සම්පූර්ණ අවධානය යොදවනවා ඔපෙට් උත්සවය වෙනුවෙන්. බොහෝ අය පවසන්නේ තීබසයේ දෙවිවරුන්ගේ වශීකරණයෙන් ඔහුගේ මනස විකෘති වී ඇති හෙයින් ඔහුට සත්‍යය වැටහෙන්නේ නැති බවයි.''

''පියැන්කි උන්මත්තකයෙකු නොවේ.'' ටෙෆ්නැක් කීය. ''මෙය වංචාවක්. අප අපගේ ආරක්ෂාව ඉවත් කරතැයි සිතා කරන දෙයක්. ඔහු,ආමන්ගේ බිරිඳට චාරිත්‍ර පාලනය භාරදී, උත්සවය අතරමැද හදිසි

ප්‍රහාරයක් එල්ල කරාවි. අපගේ ඔත්තු කරුවන් දෙගුණ කළ යුතුයි. සූදානම වඩාත් වැඩිකළ යුතුයි.

✸

ලැමසෙක්නි කොතරම් විස්මයට පත්විද යත්, ඔහුගේ අතින් බීර කෝප්පය අතහැරිණි. ''කුමක්ද? ඔපෙට් උත්සවය?''

''පාරාවෝගේ තීරණය මෙවර එය වඩාත් උත්කර්ෂවත් ලෙස පවත්වන්නයි.'' පෝර්මා සන්සුන්ව කිවේය.

''මා සමග සෙල්ලම් එපා දූනුවායා! ඔබත් මා තරමටම පුදුමයෙනුයි සිටින්නේ. තමන්ගේ ම රට යුද්ධයට හා අවිනීතියට හසුව තිබියදී, කෙසේද පාරාවෝ තනිවම ප්‍රීති වන්නේ?''

''මේ උත්සවය සතුට වෙනුවෙන්ම පවත්වන්නක් නොවෙයි. ඔබ හොඳින් දන්නා පරිදි එය දෙවියන් පිදීමේදී අත්‍යවශ්‍ය දෙයක්.''

''හෝ! දෙවියන්... ඔවුන්... අසිපත් හා හෙල්ල පාවිච්චි කරන්නවුන් නොවෙයි නෙව?'' ලැමසෙක්නි කීය.

''කාඩේෂ් සටනේදී මහා රැම්සීස්ට, තනිවම දහස් ගණනක් සතුරන් පරාජය කිරීමට සහාය වුණේ ආමන් දෙවියන් බවට පුරාවෘත්තයක් තිබෙනවා. පියැන්කිටත් ආමන්ගේ ආරක්ෂාව තිබෙනවා.''

''මා බොහොම මහලුයි ඔවැනි පුරාවෘත්ත විශ්වාසගන්නට, ඔබේ දූනුවායන් සූදානම් ද?''

''ඔබට නිතරම අවශ්‍ය...''

''මා මේ උත්සවය, මගේ තාලයට සමරනවා.''

✸

තිබසයේ සිටින ලිබියානු ඔත්තුකරු, කුමන සැලසුමක් ක්‍රියාත්මක කළයුතුදැයි කල්පනා කළේය. මුලදී ඔහු සිතුවේ පියැන්කිගේ වදන් සාවද්‍ය බවයි. එය, පූජකයින්ගේ හිත දිනාගැනීමට හා ටෙෆ්නැක් රැවටීමට කරන උපායක් බවයි. එහෙත්, පසුව පෙනෙන්ට තිබුණේ පාරාවෝ සත්‍ය වශයෙන්ම ඔපෙට් උත්සවය ඉහළින්ම සමරමින්, ටිකෙන් ටික ඇත් වී යන පැරණි චාරිත්‍ර රැකගන්නට උත්සාහ කරන බවයි.

රටට වාසනාවන්ත අනාගතයක් උදාකර ගැනීමට නම්, දෙවියන් සමග සන්නිවේදනය වැදගත් බවත්, චාරිත්‍ර වලට ගරුකළ යුතු බවත් පියැන්කි විශ්වාස කළේය.

රාජ සභාවේ සියලුම නිලධාරීන්, ප්‍රීතිඝෝෂා නගන මහ සෙනඟ, දූඩි ප්‍රීතියෙන් සිටින ජනතාව... මේ තත්ත්වයන් හදිසි ප්‍රහාරයක් සඳහා කදිම අවස්ථාවන්ය. එහෙත් මෙය උගුලක් නම්? පියැන්කිට ළං වීම පහසු නොවනු ඇත. ඔහුගේ පුද්ගලික ආරක්ෂකයින් නිරතුරුවම විමසිල්ලෙනි. ඊළඟට, නුබියානු පිළිමයක් බඳු රැජින, ඇය කොටිදෙනක සේ විමසිලිමත්ය. ඕනෑම ඝාතන තැතක් තනිවම පැරදවිය හැකි ගැහැනියකි ඇය. දූඩි විමසිල්ලෙන් සිටීම අත්‍යවශ්‍යය.

ඝාතකයාගේ මනසේ යම් අදහසක සේයාවක් ඇඳෙන්නට විය.

✸

ජයග්‍රහණයේ කන්ද නම් ගම්මානය යටත් කරගත් අණදෙන නිලධාරියාට උදා වූයේ සිහිනයෙන් හෝ නොසිතූ වාසනාවකි. එහි නගරාධිපතිගේ බිම්ගෙයි තිබී, වසර දහයක් පැරණි රතු කාන්තාර වයින් ජෝගු තොගයක් ඔහුට හමු වී තිබිණි. ඉතින්, දිනපතාම සන්ධ්‍යාවේ නිලධාරීන් සහ ඒ ප්‍රදේශයේ රූමතියන් කීප දෙනෙකු සමග සතුට සැමරීම ඔහුගේ සිරිත විය.

හෙනෙන් නෙසට් හි මූලස්ථානයෙන් ලැබෙන තොරතුරු වලට අනුව වර්තමානයේ සියල්ල ඇණහිට තිබේ. එය සති ගණනක් නැතහොත් මාස ගණනක් වුව මේ ලෙසින්ම පැවතිය හැකිය. දූන් ඉතින් නිලධාරියාට එක දෙයක් විශ්වාසය. පියැන්කි තීබසයේ නවතිනු ඇත. අවසන් ප්‍රතිඵලය අවිනිශ්චිත වන සටනකට ඔහු කිසිදා එළඹෙනු නැත.

ඉතින් ඔහු සැනසිල්ලේ නිදා සිටියේය.

"නිලධාරි තුමා, ඉක්මන් කරන්න, ඉක්මන් කරන්න."

"කුමක්ද ගැටලුව? අවදි වීමට තව බොහෝ වේලා තිබෙනවා."

"අපට පහර දෙනවා නිලධාරිතුමනි!"

එවිට නිලධාරියාගේ ඇස් ඇරුණි. "පියැන්කි?"

"මා දන්නේ නෑ... ඔවුන් නුබියානුවන්. එහෙත් එහි සිටින්නේ ටික දෙනෙක් පමණයි."

"එසේ නම් එය හදිසි ප්‍රහාරයක්."

විශාල ශබ්දයකින් අණදෙන නිලධාරියාගේ දෙසවන් බිහිරි විය. ලැමසෙක්නිගේ සොල්දාදුවන් විශේෂ යුධ උපකරණයක් භාවිතා කර ගමේ ප්‍රධාන දොරටුව බිඳ දමා තිබිණි. ඒ අතර, පෝර්මාගේ දුනුවායන්

ජංගම කුළුනක නැගී, ආරක්ෂක තාප්ප මත සිටි සොල්දාදුවන් එකිනෙකා බිම හෙළීය.

අණදෙන නිලධාරියා පපු සැරහුම පැළඳගන්නා අතරේ රෞද්‍ර මුහුණක් ඇති තරුණයෙක් එහි කඩා වැදුණි. ඒ ටෙෆ්නැක්ගේ පුත්‍රයාය.

''නුබියානුවන්! ඔවුන් නුබියානුවන්. ඔබ පැවසුවා ඔවුන් අපට පහර නොදෙන බව.''

''මං එය බලාගන්නම්. ඔබ පලා යන්න.''

''ඒත්... ඔවුන් පැමිණියේ මේ ගම යටත් කරගන්න නොවෙයිද?''

''ඒ ලැමසෙක්නි නම් සටන පවතින්නේ මිනිත්තු කීපයක් පමණයි. ඔහු වැනි යක්ෂයෙකු සමග අපට කළ හැක්කක් නැහැ.''

''අප සටන් කළ යුතුයි. බියගුල්ලන්ට ටෙෆ්නැක්ගෙන් සමාවක් නැහැ.''

''ඉක්මන් කරනු තරුණයා!නුඹෙ ජීවිතය අනතුරේ. ලැමසෙක්නි සිරකරුවන් ගෙනයන්නේ නැහැ.''

කවුළුවෙන් එබී බැලූ නිලධාරියාට, තත්ත්වය අවදානම් බව වැටහිණි. ප්‍රහාරය කෙතරම් බිහිසුණුද යත්, පැයකට අඩු කාලයක තුළ බලකොටුවේ සිටි භටයින්ගෙන් බාගයක්ම මරා දමා තිබිණි. ජංගම කුළුන මත සිටි දුනුවායෝ කිසිදු වෙහෙසක් නැතුව , ස්ථාවරව තම ඉලක්කය ගත් අතර ලිබියානුවන්ට සිදුවූයේ ඒ ඉලක්කවලට පපුව දෙන්නටයි.

ජයග්‍රහණයේ කන්ද වෙත කඩා පිනූ ලැමසෙක්නි හා ඔහුගේ භටයින් ලිබියානුවන් භීතියෙන් වෙව්ලා හරිමින් සටන ඉදිරියට ගෙන ගියහ. ලැමසෙක්නි තම දෙපැත්ත කැපෙන පොරවෙන් ඉදිරියට එන නිර්භීත භටයින්ද, ඊතල දෙකක් ඔබ්බවන ලද ලී අතින් අනුකම්පාව යදින බියගුල්ලන්ද මරා දැමීය. ඉතිරි දුනුවායන් පෝරාමාගේ දුනුවායන්ට බිලිවිය.

බරපතල තුවාල ලැබූවන්ගේ විලාප හඬින් කලබල වූ අශ්වයෝ අණදෙන නිලධාරියාගේ සහ ටෙෆ්නැක්ගේ පුත්‍රයාගේ ගමන නැවැත්වූහ. ඒ සැනින් ඉදිරිගාත් ඔසවාගෙන කෑගසමින් කැරකෙන්නට වූ ඔවුහු ඒ දෙදෙන බිමදැමූහ.

''මා සමග එන්න තරුණයා. අපි දුවමු.''

''නැහැ... නැහැ... මට සටන් කරන්නට අවශ්‍යයි.''

මිය ගියවුන්ගේ සිරුරු, මිය යන්නවුන්ගේ විලාප හඬ, ඊතල එහා මෙහා දිවෙන හඬ! ටෙෆ්නැක්ගේ පුත්‍රයාගේ මනස විකල් විය. ඔහු හිස් බැල්මෙන් බලා සිටියදී අණදෙන නිලධාරියා ඔහුගේ අතින් ඇදගත්තද ලැමසෙක්නිගේ පොරොව නිලධාරියාගේ උරහිසේ වැදුණි.

"ඔහු මරන්න එපා... එපා..." තම අවසන් හුස්ම පිටකරමින් නිලධාරියා මිමිණීය. "ඔහු... පුත්‍රයා... ටෙෆ්නැක්ගේ..."

එකෙනෙහිම, ලැමසෙක්නිට කරදරයකැයි සිතූ පෝර්මා ඊයක් විදා හලේය. එය නැවතුණේ නියම ඉලක්කයෙහිය. තරුණයාගේ ගෙල සිදුරු කළ ඊතලය ඒ සිරුරද නිලධාරියාගේ සිරුර මතම හෙළීය. ජයග්‍රහණයේ කන්දෙහි සුළු සටනේ අවසන් ගොදුර එය විය.

"උත්සවය හොඳින් පටන් ගත්තා" ලැමසෙක්නි හතිලමින් කීවේය.

# 42

පෝර්මා විසින් සකස් කරන ලද වාර්තාව පියැන්කි වෙත ලබා දුන් කුල්හෙඩ් බලාපොරොත්තු වූයේ එම විශේෂිත මෙහෙයුම පිළිබඳව ඔහු සතුටු වෙතැයි කියාය. ඒ නිසාම ඔහු රජුගේ ප්‍රතිචාරය දැක විස්මයට පත්විය.

''මා ඔවුනට අණ කළේ ටෙෆ්නැක්ගේ කැරලිකාර හමුදාව විනාශකොට ඒ නීවයා අල්ලාගන්නටයි. එයින් වැළකී ඔවුන් කළේ කුමක්ද? වෙනත් ගම්මානයක් අල්ලා ගැනීම. ඔවුන් සිතනවා මහා ජයක් ලැබුවා කියා.''

''උතුමාණෙනි, ටෙෆ්නැක්ගේ පුත්‍රයා ඝාතනය වුණා.'' කුල්හෙඩ් කීවේය.

''ටෙෆ්නැක්ගේ පුතුන්ගෙන් එකෙක්.'' පියැන්කි නිවැරදි කළේ ය. ''ඔහුගේ මරණය හේතුවක් වන්නේ නැහැ, ලිබියානුවන්ගේ සටන් නැවැත්වීමට. ඔහුගේ සියලුම දරුවන් ඔහුගේම ඇස් ඉදිරිපිට මරා දැමුවත් ඔහු පාරාවෝ සිහිනය අත් නොහරීවි. අප අල්ලා ගත යුත්තේ ඔහු මිස අන් කිසිවකු නොවෙයි. ඒත්... මගේ නිලධාරීන්ට එය කරගත නොහැකියි.''

''කුමක්ද ඔබේ විධානය, උතුමාණෙනි?''

''පෝර්මා සහ ලැමසෙක්නිට එම තත්ත්වය රැකගෙන සිටින්නැයි පවසන්න. දෙවියන් පිදීමට හා ශුද්ධ වූ උත්සව ආරම්භයට කාලය පැමිණ තිබෙනවා.''

✸

උත්සව කටයුතු හොඳින් කෙරීගෙන යාම පිළිබඳව වගකියන ප්‍රධාන පූජකවරයාට තම ඇස් අදහාගත නොහැකි විය. මාජොරම්ගේ සහාය ඇතිව ක්‍රියාත්මක වූ නව ආමන් බිරිඳගේ වෙහෙස මහන්සියේ ප්‍රතිඵලයක් ලෙස, නව වසරට අදාල චාරිත්‍ර, ඈත අතීතයේ පැවැත්වූ අයුරින්ම පවත්වන්නට හැකි විය. කළු පාරාවෝ තිළිණ කර තිබුණේ අශ්වයින් සහ

පැපිරස් නටුවෙන් සරසන ලද ලෝකඩ මල් බඳුන් වැනි අද්විතීය දේය. ඒ අතර මිල කළ නොහැකි, අසමසම කලාත්මක භාණ්ඩ ද විය. ඒ වූ කලී දීප්තිමත් නිල් වීදුරුවෙන් තැනූ කේතු ආකාර පාදයන් සහිත පාත්‍රා ගණනාවකි. ඒ සියල්ලම ඔසිරිස් ගේ පින්තූරයකින් සරසන ලද අතර, එහි භක්තිමත් අය සඳහා වන එහා ලොවේ භෝජන සංග්‍රහයට කරන ලද ආරාධනයක්ද ලියැවී තිබිණි. ''පානය කරන්න, ඔබ ජීවත් වනු ඇත.''

පාරාවෝ සහ ආමන් බිරිඳ යක්ෂයින් පලවා හැර තිබිණි. රෝග පීඩා සහ, පරණ අවුරුද්දේ අවසන් දින පහ තුළ සිංහ දෙවඟන වූ සෙක්මට් විසින් එවන ලද මරණයේ පණිවුඩකරුවන්ද පලවා හැරිනි. එම දවස් පහ රටේ අනාගතයට වඩාත්ම අඳුරු කාලයයි. මට් දෙවඟනට අයත් ශුද්ධ වූ සීමාව තුළ තබන ලද තුන්සිය හැට පහක් බැගින් වූ කුඩා පිළිම පේළි දෙකට පූජා පැවැත්වීමෙන්, සෙක්මට් දෙවඟනගේ කෝපය ඒකාන්ත ශක්තිය බවට පත්කිරීමට පාරාවෝට හැකිවිය.

නව වසර එළඹීමෙන් පසු සියලු රාජ්‍ය තාන්ත්‍රිකයෝ කාර්නැක් හි විවෘත මිදුලට රැස්වූහ. ඒ උණුසුම් හිරු එළියේ, ඔවුහු නව වසර සනිටුහන් කරමින් පාරාවෝ වෙත තිළිණ පිළිගැන්වූහ. ඒ අතර මාල, රෙදි තබන ලාච්චු, හාන්සි පුටු, දෝලාවක්, බැටළු හිසක හැඩගත් පියනක් සහිත බඳුන්, දුනු, ඊ හා ඊ කොපු සහ දෙවොල්හි තබන ලද දේව ප්‍රතිමාද විය.

අබිලා රැජින ආධ්‍යාත්මික සතුටකින් ඇළලී ගියාය. මේ ප්‍රීතිමත් පැය කීපය තුළ ඇය පාරාවෝගේ වඩාත්ම ප්‍රශංසාත්මක මෙහෙයුම ගැන වටහාගත්තාය. ගොඩබිම් දෙක දෙව්ලොව ජීවී ප්‍රතිරූපයක් බවට පත්කිරිම හා දෛනික ජීවිතය ආත්මීය සතුට දනවන ''උත්සවයක්'' බවට පත් කිරිමයි ඒ.

තම පෝෂිත ජලය තුළින්, නයිල් ජල ගැල්ම පියැන්කිගේ පැමිණීමට සුභ පැතුවාය. ප්‍රීති ඝෝෂා නැඟුවාය. රජුගේ ත්‍යාගශීලිත්වයට පින් සිදුවන්නට හැම ගමකම කෑම මේස දිගහැරුණි. ගංගාවක් සේ බිම ගලාගිය ඒ සංග්‍රහයේදී ඔහුගේ කීර්තිය මොනවට ගායනා කෙරිණි.

මුළු භූමියම ආලෝකමත් කරමින්; හිරුඑළිය නයිල් ගංදියේ පරාවර්තනය වූ විට, රජු හා රැජින නව වසරේ ජලය; රන්, රිදී හා තඹ බඳුන්වලට පිරවූහ. ජනතාව ඉදිරියේ සිටගත් පියැන්කි රන් හා රිදී බඳුනක අඩංගු දියර බීවේය. එහි වූයේ වයින්, බීර හා රයි වයින්වල එකතුවකි. ඊළඟට ඔහු පුරාණ ලියවිල්ලක් කියැවීය. ''සැඟවුණ දෙවියනි, අපි ඔබට අභිරහසින් පිරුණු, ගුණවත් බව උතුරා යන මේ භූමිය පූජා කරමු. එහි,

මහ පොළොවේ අපට ජීවය දෙන බාර්ලි හා තිරිඟු, රයි තණ යටපත් කරමින් වැඩෙයි."

අබිලාගේ හදවතේ ක්ෂණික බියක් ඇතිවිය. යම්කිසි ඝාතකයෙක් බීම වලට වස මිශ්‍රකළේ නම්? එහෙත් එසැනින් ඒ බිය අතුරුදහන් විය. බීම බෙදන ලද්දේ ඇගේ දියණිය, ආමන් බිරිඳ විසිනි. තීබසයේ දී පියැන්කිට අනතුරක් නැත. ඔහු ආමන් විසින් ආරක්ෂා කෙරේ.

ඉක්බිති, දෙවොල් තුළ සිදු කෙරෙන රහසිගත චාරිත්‍ර සඳහා අවස්ථාව උදාවිය. දෙවොලට ඇතුල්විය හැක්කේ ආමන් සහ ඔසිරිස් ගේ අභිරහස දන්නා අයට පමණි. ඒ සඳහා වූ පෙරහැරට පූජකවරුන් හා පූජකවරියන් හැටක් එක්වූහ. ඒ හැමකෙකු අතම දෛනික පූජාවන්ට යොදාගන්නා පූජාභාණ්ඩයක් විය. සුවඳ දුම්, පිරිසිදු කිරීමේ ද්‍රව්‍ය පිරවූ බඳුන් සහ රාජත්වය පල කරන යෂ්ටිය ඒ අතර ප්‍රධාන තැනක් ගති. මේ සංකේතවල ශක්තිය වියැකී තිබූ හෙයින්, ඒවාට යලි ශක්තිය ලබාදීම රාජකීය යුවලගේ වගකීම විය. දෙවොල් වහලය මත නැගී, ඒ සියලු පූජාභාණ්ඩ නව වසරේ බලවත් හිරු එළියට ප්‍රදානය කිරීමෙන් එය සිදුකෙරේ.

ඒ මධ්‍යහ්නයේ දිව්‍යමය ආලෝකය එහි යුතුකම ඉටු කළේය.

✸

අළුයමට මොහොතකට පෙර, දෙවොලේ ඇතුළු ගර්භයේ දී, පියැන්කි අළුත්ම සිවුරු වලින් සරසන ලද ආමන් පිළිමයක කට හා ඇස් විවෘත කළේය. එයට සුවඳ දියර ඉස, එහි 'කා' ට ආහාර හා බීම පුදකළේය. ඉක්බිති, රජු කාර්නැක් දෙවොලේ හැම ශාලාවකම, හැම පිළිමයකම කට හා ඇස් විවර කළේය. මේ සියලු පූජාවන් කරනු ලබන්නේ ඒ විශාල ජීවී සත්වයාට ශක්තිය ලබා දීමටයි. දෙවොල් පෝෂණය කෙරෙන අලුත් ශක්තිය ගලා යන්නේ ඒ අයුරිනි.

වීණා සහ බටනලා වයන්නන් ආමන් දෙවියන්ට සංගීතය පූජාවක් ලෙස පුද කරන අතරේ අබිලා තම සැමියා දෙස බැලුවාය. ඔහු, මේ මොහොතේම ඔහු විසින් නැවත ශක්තිමත් කරන ලද ශුද්ධ වූ විශ්වය විසින් ගිලගෙන ඇති බව ඇයට වැටහිනි. මහ රැජින "හෝරස් හා සෙට් දකින්නිය" යන ඉපැරණි නාමය දැරුවාය.. යථාර්ථයට කිසිදා සමකළ නොහැකි දෙපැත්තක් ඇති බව ඇය දැන සිටියාය. ඒ වූ කලී ගොඩනැගීමේ හා විනාශ කිරීමේ බලයයි. විශ්වයේ, එකිනෙකා නොනවත්වාම සටන් වදින මේ බලයන් පුදුමාකාර ලෙස එකමුතු කෙරෙන්නේ පාරාවෝ තුළයි.

රජුට තම වගකීම් අමතක වෙතැයි බිය වූ අබිලා, දැන් ඔහුගේ සිතුවිල්ලට බාධා කළයුතු අවස්ථාව බව වටහාගෙන මෙසේ ඇසුවාය.

"ඔබට යුද්ධය අමතක වීද, උතුමාණෙනි?"

"තිබසය ආරක්ෂිතයි අබිලා."

"ඒත් ඔබට බැහැ උතුමාණෙනි, ඔබේ සිතුවිලි නිදහසේ පාකර හරින්නට. හෙට කුමක් වේදැයි සිතිය යුතුයි."

"මා ඔබට මෙතරම් ආදරය කරද්දීත් ඔබ මට මෙතරම් කෲර ලෙස සලකන්නේ මන්ද, ප්‍රේමිය.?"

"එයයි මගේ වගකීම, මහරජින ලෙස. ඔබයි ඊජිප්තුවේ ස්වාමියා, ඔබගේ පූර්වජයින් මෙන්ම. ඊජිප්තුව වේදනාවට පත්ව සිටිනවා. සමහර විට මිය යාවි, ඔබ මෙහි, කාර්නැක්හි නැවතී පුරාණ චාරිත්‍ර, ශුද්ධ වූ දෙවොල ගැන පමණක් සිතමින් සිටින අතරේ. එයද ඔබේ සැලසුම?"

පියැන්කිගේ හදවත කිරිගැසිණි. අබිලා ඔහුගේ සිත කියවා ඇත. එසේය, ඔහු සිහින දුටුවේ ආමන් දෙවියන් ළඟට ආපසු පැමිණ එහි නැවතී සිටීමටයි. සෑම දවසකම පුදපූජා පවත්වමින්, පිටත ලෝකයේ ගැටලු වලින් මිදී පූජකවරයෙකු ලෙස එහි රැඳෙන්නටයි. ඔහු එහි නැවතුණි නම්, එහි සාමය ස්ථාපිත වනු ඇත. යාඥා සහ පූජාවන්හි බලයෙන් ඔහුට එය කළ හැකිය. ඔහු ඒ මග තෝරාගත්තේ නම්, යුද්ධ තත්ත්වය වසර ගණනාවකට නැවතී තිබෙනු ඇත.

එහෙත්, අබිලා මේ සිහිනය බිඳ දමන්නට තැත් කළේ පියැන්කිට ආත්මාර්ථකාමීත්වය ගැන චෝදනා කිරීමෙනි. උතුරේ සිටින ඊජිප්තුවනට මුහුණ දීමට සිදුවී ඇති කෲර ඉරණම සිහිකරදීමෙනි. ටෙෆ්නැක් නම් වූ කෲර පාලකයා ගැන සිහිකර දීමෙනි.

නැවත වරක් එක් කරන ලද භූමියක්. නීච බවින් මුදවාගත් භූමියක්. යුද්ධයෙන් මුදවාගත් ජාතියක්. එහෙත්, කළු පාරාවෝ එවන් ජයක් ලබන්නට තරම් ශක්තිමත් වනු ඇතිද? ලේ හැලීමක් සිදුවනවාට වඩා තීබසය අලංකාර කිරීමෙන් තෘප්තිමත්වීම වාසනාවක් නොවේද?

අබිලා නිහඬ වූවාය. තම සැමියාගේ හද දවන අරගලය ඇයට දැනුණි. මුළු රටක ජනතාවගේ ඉරණම රැඳී ඇත්තේ කළු පාරාවෝගේ තීරණය මතය.

# 43

ලැමසෙක්නි හුණුගලකට පිටදී ඉඳගෙන සිටියේය. ඔහුගේ ආයුධ හුණගල මත විය. රතුඑැණු කමින් සිටි ඔහු තම ලී අතේ තෙල් තවරමින් සිටියේය. එක් කලෙක, මරා දමන හැම සතුරෙකු වෙනුවෙන්ම තම ලී අතෙහි කඩතොලුවක් කිරීමට ඔහු සිතා හුන් නමුත් ඒ සංඛ්‍යාව ඉතා ඉක්මනින් ඉහළ ගියේය.

පෝර්මා තම හිතවතා අසල ඉඳගති.

''අප යළිත් ආරක්ෂක ගමකට පහර දෙනවාද?'' ලැමසෙක්නි ඇසීය.

''පියැන්කි කෝපයෙන්.'' පෝර්මා සන්සුන්ය.

''කුමක්ද? කෝපයෙන්? එය හොඳයි. බොහොම හොඳයි. අප ජයග්‍රහණයේ කන්ද ආපසු අල්ලා ගත්තා. ටෙෆ්නැක්ගේ පුත්‍රයකු මරා දමා සතුරාට තවත් අඟලක් හෝ ඉදිරියට යා නොහැකි බව පෙන්වා දුන්නා. එත් පාරාවෝ කණගාටුවෙන්.?''

''අපට ඔහු නියම කළේ සිටින තත්ත්වයේම සිටින්නයි.''

''මේ මාස කීපය තුළ අප කළේ මොනවාද? මා සිතන්නේ පියැන්කි ඉක්මනින්ම ඒවි. එවිට ඔහුට හැකියි අපට පෙන්වා දෙන්න කළ යුතු දේ''

''මා ඒ ගැන කිසිවක් දන්නේ නැහැ.''

''දන්නේ නැහැ? කුමක්ද පැවසුවේ? ඔබට දූත් ලැබී තිබෙනවා අලුත් අණ''

''ඔව්. ඒත් ඒවායෙහි මේ සම්බන්ධ තොරතුරු කිසිවක් නැහැ. පියැන්කි සූදානම් ඔපෙට් උත්සවය සංවිධානය කරන්නට. ඒත්...''

''අර ශාපලත් උත්සවය නැවතත්?'' ලැමසෙක්නි ගලක් අහුලා ඈතට විසි කරමින් කෑගැසීය.''කුමක් අප මෙහි රැඳී සිටීමේ තේරුම? රජු තීබසයේ නවතින බවත්, ඉන් එපිට අඩියක් නොතබන බවත් මට විශ්වාසයි.''

"එහි තේරුම?"

"ටෙෆ්නැක් සමග යුද්ධයකට එළඹෙන්නට පියැන්කිගේ කිසිදු අදහසක් නැහැ. එයයි සත්‍යය. අප මේ කාලකන්නි දේශසීමාව රැකගෙන, මැරෙන තෙක් මෙහි රැඳී සිටිය යුතුයි."

✸

ඒ අතිදක්ෂ දුනුවායන්ගේ හැකියාව පුදුම සහගතය. ඩේබ්‍රේක් නිතිපතාම ඔවුන්ගේ පුහුණු කඳවුරු පරීක්ෂා කළාය. තරුණ දුනුවායෙක් පියවර සියයක් ඈතින් පිහිටි ඉලක්කයේ මධ්‍ය ලක්ෂ්‍යයට ඊතල තුනක් විද්දේය. ඒ ඉලක්කය, ප්‍රවීනයෙකුට වුව පහසුවෙන් ගත නොහැකි කුඩා පළිහකි. තරුණයා ළා බාල පෙනුමෙන් යුතු වුවද, ශක්තිමත් සිරුරක් ඔහුට විය. ඔහුගේ අත් පා ක්‍රියාත්මක වූයේ මහන්සියකින් තොරව, ඉබේම මෙනි.

"අති විශිෂ්ටයි!" ඩේබ්‍රේක් තම විශාල කොළ පැහැති ඇස් බබළවමින් කීවාය.

"මා ඒ තෙවැනි ඊය එව්වේ ඔබ වෙතයි, මගේ හදවතින් උත්තමාවියනි. මගේ නොහික්මුණුකමට සමාව දෙන්නට හැකිද?"

ඇය සිනාසුණාය. "එය යුදමය ක්‍රියාවක් වුවත්, මා සිතනවා කල්පනාකාරී හැසිරීමක් කියා, හැඟීම් පළ කරන."

"තවම නැහැ කුමරිය. දැනට එය ක්‍රීඩාවක් පමණයි. එහෙත්., මා සිතනවා ඉක්මනින්ම ඒ ඉලක්කයේ සිටීවි නුබියානුවෙක්. ඊළඟට තවෙකෙක්...තවෙකෙක්..."

දුනුවායාගේ දිළිසෙන ඇස් දුටු ඩේබ්‍රේක් ගේ හදවත ගැස්සුනි. "ඔබට සත්‍ය වශයෙන්ම අවශ්‍යද පියැන්කිට එරෙහිව සටන් වදින්නට?"

"එයයි මගේ එකම පැතුම. ඒත්, මා දන්නවා මා ඉවසීමෙන් කටයුතු කළ යුතුයි කියා. කාටත් රහසක් නොවෙයි මේ යුද්ධය ඉතා දරුණු එකක් බවට."

"එය කිසිදා සිදු නොවුවහොත්?"

"එසේ විය නොහැකියි. ටෙෆ්නැක් බලා සිටින්නේ නියම මොහොත උදාවන තුරුයි. එය ජයග්‍රාහී මොහොතක් වේවි. මට විශ්වාසයි."

තරුණයාගේ මෘදු බව වශීකරනසුළුය. ඔහුගේ ඒ නොහික්මුණුකමට ඇය ආශා කළාය. ඔහු ද ඇගේම වයසේය. ඔහු, මේ මුළු ලෝකයම තමාට අයත් යැයි සිතන, තම කැපවීම හදවතින්ම කරන තරුණයෙකි.

''ඔබ නිවැරදියි ඔබ ජයගනීවි, නිසැකයෙන්ම.'' ඇය කීවාය.

ඇය ඉවතට යන විටද ඔහුගේ දෑස් ඈ වෙතින් මොහොතකට හෝ ඉවතට ගියේ නොවේ.

✸

ආත්මීය පෝෂණය ශක්තිමත් කරන ඔපෙට් උත්සවය පැවැත්වුණේ ජලගැල්ම එහි ඉහළම තත්ත්වයට නැගෙන විටදීය. එය දින විසි හතරකට වඩා අඩු කාලයක් පැවැත්වෙන අතර එය අවසන් වීමත් සමගම ජලගැල්ම පසු බසින්නේ සාරවත් රොන්මඩ තට්ටුවක් ඊජිප්තු භූමියේ තැන්පත් කරමිනි. මේ උත්සවය පැවැත්වෙන කාලය තුළ පාරාවෝගේ 'කා' ට යළි ශක්තිය ලැබේ. තම වගකීම් ඉහළින්ම ඉටුකරමින්, ඒ ශක්තිය තම භූමියට හා ජනතාවට ලබාදීමට ඔහුට අවස්ථාව ලැබේ.

✸

පියැන්කි, කාර්නැක් වෙතින් ලක්සෝර් වෙත ගෙන එන ලද ආමන් ප්‍රතිමාවට පූජෝපහාර දක්වීය. ආමන් ගේ ආරක්ෂාව යටතේ රජු හා රැජින එක්වන මොහොතේ, දෘශ්‍යමාන හා අදෘශ්‍යමාන බලයන් එකමුතු විය. දේවදාර ලීයෙන් කළ දෙවියන්ගේ බෝට්ටුව, ජයඝෝෂා නගන ජනතාව ඉදිරියේ ප්‍රදර්ශනය කෙරිනි. එය රන් ආලේප කර, මැණික් වලින් සරසන ලද්දේ විය. එම බෝට්ටුවේ කුටිය ආවරණය කළ තිරය කිසි විටෙකත් ඉවත් කරන ලද්දේ නොවේ. ඒ තිරය, දෙවියන් වැඩ සිටින ස්ථානයයි ආරක්ෂා කළේ. කිසිදු පුද්ගලයෙකුට දෙවියන්ගේ සත්‍ය ස්වරූපය දකින්නට අවස්ථාවක් නැත.

කාර්නැක් හා ලක්සෝර් දෙවොල් වලට පිවිසෙන මාවත දෙපස මෙන්, ගංගාව දිගටම කුඩා දෙවොල් පේළියක් තනා තිබිණි. ගැහැනු හා පිරිමි ගායකයින්, සංගීතඥයින්, නර්තන ශිල්පීන් පෙරටු කරගත් පෙරහැර ඒ සියලුම දෙවොල් අසලදී නවත්වන්නට යෙදිනි. සාමාන්‍ය ජනතාව පූජකයින් විසින් බෙදන ආහාර බුදිමින් සිටියහ.

පියැන්කි, නව හිරු උදාකිරීමේ බලය හිමි දෙවියන් ත්‍රිත්වයට පූජෝපහාර දක්වීය. ආමන් පියාණන්, ඔහුගේ බිරිඳ වූ මට් දෙවඟන හා ඒ දෙදෙනාගේ පුත් ''අහස හරහා යන තැනැත්තා'' නමින් හැඳින්වෙන කොන්ෂු ඒ තිදෙනා විය.

ඊජිප්තුව පාලනය කිරීමේ රහස රඳා පැවතුණේ, එහි චාරිත්‍ර පැවැත්වීමේ දින දර්ශනය නිවැරදිව කිරීමෙන් බව පියැන්කි දැන සිටියේය.

ලොව උපන්දා සිටම එය එලෙසින් තිබිණි. ආමන් දෙවියන්ගේ ප්‍රතිමාව ඇතුළු ගර්භයට ගෙනයාමේදී, පාරාවෝට ආමන්ගේ සත්‍ය ස්වරූපය දැකගත හැකිය. එය මිනිස් ඇසකට දරාගත නොහැකි තරමේ ආලෝකයකින් එළිය වී තිබිණි. ඇතුළු ගර්භයට පා තැබූ පාරාවෝ එම ප්‍රතිමාව නියමිත අසුන මත තැබීය. පාරාවෝ මැවුම්කරුට ගෞරව දක්වූ පසු, සියලු දෑ නියමිත ස්ථානවල තබන්නට යෙදිනි.

✷

තීබසය අකමැත්තෙන් මෙන්, සති ගණනක් පැවති උත්සවශ්‍රීයෙන් මිදුනාය. පියැන්කිගේ විධානයට අනුව එම උත්සවය අන් කිසි කලෙක නොවූ තරම් විශිෂ්ට ලෙස පවත්වන ලදී. දකුණු ඊජිප්තුවේ තම රාජ්‍යය දීප්තියෙන් බබළවන්නටයි පාරාවෝට අවශ්‍යව තිබුණේ. එහි ප්‍රධාන පෙළේ පුරවැසියන් විශ්වාස කළේ, යුද්ධයේ ඡායාව ටිකෙන් ටික ඈත්ව යන බවත්, කළු පාරාවෝ තීබසය වෙනුවෙන් නපාටාව අත්හැර දමන බවත්, ආමන්ගේ නගරය පුරා පිහිටි දෙවොල් රනින් සරසන බවත්ය.

පියැන්කි දිනපතාම චාරිත්‍ර ඉටුකරන තීබසය, ජයග්‍රහණය කර ඇති බව කාටත් නොරහසකි. ඔහුට පින්සිදු වන්නට, සමහර පූජකවරු භක්තිමත් බවේ නියම මග සොයාගෙන තිබුණි.

ආමන් බිරිඳ, තම පියාණන් සමග ටික කලක් හෝ ගත කිරීමට අවස්ථාව ලබාදීම ගැන දෙවියන්ට ස්තුති කළාය. ඇගේ කාර්යභාරයට අයත්, බිය දනෙන තරමට අතිවිශාල ප්‍රමාණයක් වූ භාරදූර වගකීම් සමුදාය හේතුවෙන්, ඇයට හුදකලා බවක්, සෙස්සන්ගෙන් අත්හැරෙනු ඇති බවක් දැනුණි. ඒ වනතෙක් ම සුවඳ ද්‍රව්‍ය තැනීම සඳහා දිවිකැපකර සිටි තරුණියකට, කාර්නැක්හි සියලු දෙවොල් කාර්යක්ෂමව පාලනය කිරීම කළ නොහැක්කක් සේ පෙනුණි. එහෙත් ඇගේ පූර්වජයා සහ රජු මා රජින විසින් දෙන ලද අවවාදත්, මාජොරම් හා ආවතේවකරුගේ සහායත් ඇයට ඒ වගකීම දැරීමට උදවුවක් විය. බිය අමතක කළ හැකි විය. තීබස් පූජකවරුන් බොහෝ ගණනක් මෙන්, ඇයද සිතුවේ, පාරාවෝ තීබසයේ නැවතී ප්‍රචණ්ඩත්වය සදහටම ඉවත් කරනු ඇතැයි කියාය.

✷

අළුයම අවදි වූ අබිලා, පෙර දින රාත්‍රියේ තරුණයෙකුගේ ජවයෙන්, දැඩි උනන්දුවෙන් අළුත් භූමියක් සොයා යන තරුණයෙකුගේ ජවයෙන්, ඇයට ආලය කළ පාරාවෝ දෙස බැලුවාය. එහෙත්, ඔහු පිටව ගොසිනි.

ඇය සයනාගාරයෙන් පිටවී සඳළුතලයට ගියාය. එතැනට කාර්නැක් දෙවොල පෙනිණි. ඔහු ආමන් දෙවොල දෙස බලා ගෙන එහි සිටිනු ඇතැයි ඇයට විශ්වාසය.

ඇය ඔහු වැළඳගත්තාය.

''පාරාවෝ තීරණය ගෙන අවසන්ද?'' ඇය ඇසුවාය.

''අද අප මට් දෙවොලට යනවා දෘශ්‍යමාන හා අදෘශ්‍යමාන, සතුරන්ගේ ශාපයන් ඉවත් කිරිමට, චාරිත්‍ර ඉටු කරන්නට. හෙට, මා මගේ යුද හමුදාව මෙහෙයවනවා සතුරා පරාජය කොට එකමුතුකම නැවත ඇති කරන්න.''

# 44

ඩේබ්‍රේක් කෝපයෙන් කෑගසමින්, ටෙෆ්නැක් විසින් තිළිණ කරන ලද සාළුව කෑලිවලට ඉරා දැමුවාය. මොහොතකට, නයිල් ජලගැල්ම සේ ඇගේ අතීතය ඇගේ ඇස් ඉදිරිපිට ඇඳෙන්නට විය. පියාගේ මරණය, නාට්‍රෙබ් අතින් දූෂණයට ලක්වීම, උතුරු ජෙනරල්ගේ අහංකාර කම, ඇය තුළින් යම් කෙනෙකුට පෙනෙන දේශද්‍රෝහී බව.... ඇය වහාම හෙනෙන් නෙසට් හැර යා යුතුය. එය නොවෙද හොඳම විසඳුම?

නැත, නැත. ඇය තම ඉරණමට මුහුණ දිය යුතුය. ඇයට තම මතකය පයින් පාගා දැමිය යුතුව තිබුණද, නාට්‍රෙබ්ගේ කාමුක දෑසින් බේරී සිටිමින්, යෙගෙබ්ගේ උඩඟුකම අමතක කර,ලිබියානු කුමාරවරුන්ගේ බියගුළුකම දකිමින් වුවද ඇය ටෙෆ්නැක් තනි කරන්නේ නැත. ඔහුට, ඊජිප්තුව යටත් කරගැනීමට හැකි සෑම සහායක්ම දෙන්නට ඇය සූදානම්ය.

දෙළුම්, රට ඉඳි හා මිදි දීසියක් රැගත් මිනිසෙක් ඇගේ කාමරයට ඇතුල් විය. ඈ එක්වරම ඔහු හැඳින්නාය. ඒ, දුනුවායන් කණ්ඩායමේ සිටි තරුණ නිලධාරියාය.

''සමාවෙන්න බාධා කළාට,කුමරියනි.'' ඔහු කීය. ''මා සිතුවා ඔබ මේ රසවත් පලතුරු වලට කැමති ඇති කියා.''

''කවුද ඔබට අවසර දුන්නේ, ඇතුල්වන්නට?''

'මුරකරුවන් මා හඳුනනවා. මට අවශ්‍ය වුණා කුමරියනි, ඔබ පුදුමයට පත් කරවන්නට.''

තමා අඩනිරුවතින් සිටින බව ඩේබ්‍රේක් ට එක්වරම වැටහිණි. කලවයෙන් බාගයක් පමණක් ආවරණය වන ඇගේ නාරි දේහයේ සැඟවුණ තැනක් නැති තරම්ය.

''දීසිය මෙහි තබා යන්න.'' ඇය අණ කළාය.

''අද වනතෙක් මගේ ආලය තිබුණේ දුනු හරඹයට පමණයි. ඔබ

මට අවසර දෙනවාද කුමරියනි, යුද හමුදාව හැරදා පැමිණි ඔබේ සේවකයා වෙන්නට?'' තරුණයාගේ හඬ වෙව්ලා ගියේය.

දැඩි කම්පනයෙන් ඩේබ්‍රේක් ඉවතට හැරුණාය. ''එවැනි උමතු බවක්? එවැන්නක් ගැන සිහිනෙනුදු නොසිතන්න. ඔබ අති දක්ෂ දුනුවායෙක්.''

''මට ඉන් ඇති පලක් නැහැ. ඉන් මට ඇති පලය කුමක්ද, ඔබ දකින්නට නොලැබේනම්? ඔබ හා කතා කරන්න, ඔබේ විලවුන් සුවඳ විඳින්නට නොහැකිනම්...මට...මට ඔබ ස්පර්ශ කරන්න නොහැකි නම්?''

ඔහු තම වෙව්ලායන අත ඇගේ උරහිස මත තැබීය. ඇය, ඔහුට පිටව යන්නැයි බලකළ යුතුව තිබිණි. ඔහුගෙන් ඉවතට යා යුතු ව තිබිණි. එහෙත්, ඒ සුරතලය කොතරම් මෘදු ද, කොතරම් සැපවත්ද?

''මා ඔබට ආදරෙයි.'' ඔහු ඇගේ කම්මුල සිඹිමින් කීවේය.

ඩේබ්‍රේක් ගේ හදවත වේගයෙන් ස්පන්දනය වෙයි. ඇගේ සිරුර පුරා අමුතුම උණුසුමක් පැතිර යයි. ''නැහැ, මෙතැන බැහැ, මෙතැන නෙවෙයි.''

ඒ නෑසුනා සේ තරුණයා ඇගේ වරලස පිරිමදින්නට විය. ඇය ඔහුට ඉඩ දුන්නාය. ඔහු වළක්වන්නට ඇය තුළ කිසිදු ශක්තියක් නොවීය.

''ටෙෆ්නැක් දැනගතහොත්.'' ඇය කීවාය. ''මරණය. ඔබට පමණක් නොවෙයි, මටත්.''

ඉක්බිති ඇය, ආශාවෙන් දිළිසෙන ඇස් ඇති තරුණයා දෙසට හැරුණාය.

''කවදාද, කවදාද මා ඔබ හමුවන්නේ?'' ඔහු ඇසීය.

''හෙට, සවස. මාලිගා රෙදිපිළි තබන ගබඩා කාමරයේ දී. ටෙෆ්නැක්, පාබල හමුදාවේ ආයුධ පරීක්ෂා කිරීමට බැරැක්කයට යන වේලාවේ... නැහැ,නැහැ. මෙය උමතුවක්.''

ඔහු ඇගේ දෑත් සිපගත්තේය. ''මා ඔබට ආදරෙයි ඩේබ්‍රේක්. මා ඔබට ඇති ආදරයෙන් උමතුවෙන්. මා දිවුරා සිටිනවා මෙය රහසක් ලෙස තබාගන්නා බවට. අපගේ සතුට රැඳෙන්නේ එවිටයි.''

''පිටුව යන්න, වහාම.''

ඔහු කොතරම් උමතු ලෙස ඇය සිපගත්තේ ද යත්, ඇයට ඔහු

රඳවාගන්නට අවශ්‍ය විය. ඔහු වෙත පිදෙන්නට අවශ්‍ය විය. එහෙත්, අනතුර ඉතා දැඩිය.

ඔහු පිටව ගිය පසුවද, ඇගේ හදවත ආශාවෙන් දැවෙන්නට විය. පුරුෂ ශක්තියෙන් අනූන ඒ සිරුරේ එහි, එහි දැවෙන ගින්න බෙදාගන්නා තෙක් නොඉවසිල්ලෙන් බලා සිටියාය.

✷

මාලිගයෙන් පිටවූ තරුණයා, බරක්ක වෙත දිවෙන හරස් පාරට වැටුණි. එහි ඔහු එන තෙක් බලා සිටියේ යෙගෙබ්ය.

''කෙසේද, ඔබේ ගමන සාර්ථකද?''

''කිසිදු ගැහැනියකට නොහැකියි මට බැහැයි කියන්නට. මා ඔබට එය පැවසුවා නොව. ඩේබ්‍රේක් ටත් ඒ නීතිය එසේමයි.''

''ඔබට විශ්වාසද ඇය ඔබට කැමතී කියා.''

''මා ගැහැනුන් හඳුනනවා යෙගෙබ්. ඔවුන්ට හැකියි යම් තරමකට බොරු රඟපෑම් කරන්නට. ඒත්, මේ ගැහැනිය විශ්වාසවන්තයි. ඈ ළඟ බොරුව නැහැ. එපමණක්ද, ඇය අපූරු දඟකාර කෙල්ලක්. මා තව ටික වේලාවක් ඈ හා හිටියානම්, ඒ සන්ධ්‍යාවේම ඈ හා මා එතැන නිදන්න තිබුණා.''

''එය වහාම කළ යුතුයි. ටෙෆ්නැක් තොප අල්ලාගත යුත්තේ එකට සිටින විටයි. එමගින් ඔහු හඳුනාගත යුතුයි, ඔහු ඊජිප්තු රැජින කරන්නට යන ගැහැනියගේ දූෂිත භාවය.''

''ඇය විශාල අවදානමක් ගන්නවා.''

''ඉතින්, තොපට කිම?'' යෙගෙබ් කීය.

''නුඹට මගේ ආරක්ෂාව ගැන වගකිව හැකිද?''

'''මා ටෙෆ්නැක්ට සත්‍යය පවසනවා. මා තොපට අල්ලසක් දී ඇය දූෂිත ගැහැනියක බව ඒත්තු ගන්වන්න උත්සාහ කළ බව පවසනවා. එවිට ඔහු, තොප නීතිගරුක මිනිසකු ලෙස සලකා නිසැකවම ඉහළ තනතුරකට පත් කරාවි.''

''ඒ අතරම නුඹ මට පොරොන්දු වූ ගණන ගෙවිය යුතුයි.''

යෙගෙබ්, ඒ මොහොතේම කුඩා රන් කැබලි පිරවූ හම් පසුම්බියක් ඔහු අත තැබීය. තරුණයා එය පරීක්ෂා කළේය.

''තොප දැන් ධනවතෙක්.'' යෙගෙබ් කීය.

"එය එසේ විය යුතුයි. මා ගත්තේ ඉතා විශාල ජීවිත අවදානමක්. මේ මගේ ගාස්තුවේ පළමු කොටස පමණක්ද?"

"ඉතිරි බාගය ඔබට ලැබේවි, ටෙෆ්නැක් ඒ බොරුකාර, රැවටිලිකාර ගැහැනියගෙන් මිදුනු විගසම."

"කිමද ඔබ ඔතරම්ම ඇය පිළිකුල් කරන්නේ?"

"දූනුවාය! තොප, තොපට නියම වූ දේ කරනු.! අනවශ්‍ය ප්‍රශ්න ඇසීම තහනම්!"

තරුණයා, කුඩා පසුම්බියේ බර අතින් මැන බලමින් බැරැක්ක දෙසට පිය නගන්නට විය.

සත්‍ය වශයෙන්ම යෙගෙබ් කළේ වංචාවකි. තරුණයා ගෙන ගිය රත්රන් ඔහුට ආපසු ලැබෙනු ඇත. ඒ මන්දබුද්ධිකයාගේ මිනියෙන් ඔහු එය ආපසු ගන්නවා ඇත. ජෙනරල් ට අපහාස වන අයුරින් අනාචාරයේ හැසිරීමේ වරදට ඩේබ්‍රෙක් සමගම ඔහුද මරු දකිනු ඇත. ටෙෆ්නැක්ට කිසිදා මේ සත්‍යය දැනගන්නට ලැබෙනු නැත.!

✸

රාත්‍රිය ළං වෙත්ම, කාර්නැක් දෛවඥයෝ දෙවොල් වහල මතට නැගෙන පඩි නැංගෝ ය. ඒ සියල්ලෝම 'වෙහෙසට පත් නොවන තරු' හෙවත් ග්‍රහලෝක පරීක්ෂා කළ හැකි විශේෂිත ස්ථානවල ඉඳගත්හ. මේ විශේෂඥයෝ නිරතුරුවම තම දැනුම අළුත් කර ගනිමින් දෙවියන්ගේ පණිවුඩ කියවන්නට උත්සාහ කළහ.

තම කාර්යය අරඹන්නට පෙර, ප්‍රධාන දෛවඥයා පිරිසිදු වතුර කෝප්පයක් ගෙන එය පැතලි ගලක් මත තැබීය. සාමාන්‍යයෙන් මෙම දිය මතුපිට අපූර්ව දර්පනයක් ලෙස ක්‍රියා කළේය. හාතෝර්ගේ සංකේතය වූ එය, දෛවඥයාගේ ආත්මීය බලය හා දෙවඟනගේ ආත්මීය බලය හා එක්වෙයි.

දෛවඥයා දෑස් පිසදා බැලීය. දෑස තමා රවටනවාද? නැත! මෙවැනි දසුනක්? අවට සුළඟක් නැත. ඔහු තවත් ළංවී බැලීය. ඔහුට ඒ භයානක තත්ත්වය පිළිගැනීමට සිදුවිය. දිය මතුපිට කුඩාරැළි නැගෙන්නට විය. දැඩි ලෙස බියට පත් වූ ඔහු පඩිපෙළ බැස, රජ මාලිගය වෙත දිව ගියේය. එහෙත්, නුබියානු සොල්දාදුවන් දෙදෙනෙක් ඔහුගේ මග අවුරා සිටගත්හ.

"මට රජුට කතා කරන්නට අවශ්‍යයි. වහාම!" දෛවඥයා හතිලමින් කෑගැසීය.

පියැන්කිගේ කාමරය වෙත ගිය ඔහුට, තම බිය සඟවාගත නොහැකි විය. ''උතුමාණෙනි, මා මේ දැන් භයානක තත්ත්වයක පෙර නිමිති දැනගත්තා. අප දෙවොල් වහලය මත තබන ජල දර්පනය මත රැළි නැගුණා උතුමාණෙනි.''

''ඔබ එය තේරුම් කරන්නේ කෙසේද?'' රජු ඇසීය.

''උතුමාණෙනි, මහා අවාසනාවන්ත පෙර නිමිත්තක්. එවැනි දසුනක් උතුමාණෙනි, විනාශයක් අත ළඟයි. එය රාජ්‍යයේ හදවතට පහරදේවි, උතුමාණෙනි. ඒ නිසයි මට වහාම ඔබට උපදෙස් දෙන්න සිදුවුණේ...''

''ඔබේ තීරණයට අනුව අප ගත යුතු පූර්වෝපායයන් මොනවාද?''

''ඉන්ද්‍රජාලිකයින් මුළු රාත්‍රියම යාතිකා කළ යුතුයි. මරණය වැළැක්වීම සඳහා.''

''තව මඳක් පැහැදිලි කළ හැකිද ඔබ බියවන්නේ මන්ද කියා.?''

දෛවඥයා අදිමදි කරමින් මෙසේ කීය. ''උතුමාණෙනි, ඔබේ ජීවිතය අනතුරේ.''

# 45

ඩේබ්‍රේක් විසින් කැඳවාගෙන එන්නට යෙදුනු ටෙෆ්නැක්, අමුත්තන් පිළිගන්නා ශාලාවට ආයේය. ඔහුගේ මුහුණ දෙස බැලූ බැල්මටම, තත්ත්වය බෙහෙවින් වෙනස් වී ඇති බව යුද කවුන්සිලයේ සාමාජිකයින්ට වැටහිණි. ජෙනරාල් සතුව අළුත් තොරතුරු විශාල ප්‍රමාණයක් තිබෙනු නියතය.

''පියැන්කි තීබසයෙන් පිටත් වෙනවා.'' ඔහු දැන්විය.

''ඔහු නුබියාවට ආපසු යනවාද?'' අකනොෂ් ඇසීය.

''නැහැ, ඔහුගේ සූදානම අපට පහරදෙන්නයි.''

තමා විසින් යවන ලද ඔත්තුකරුවන්ට කළු පාරාවෝ මරා දැමීමට නොහැකි වූ බවත්, ඒ ඇසීමෙන් තමා වේදනාවට පත් නොවූ බවත් පැවසීමෙන් ඔහු වැළකී සිටියේය. දකුණු යුද හමුදාව එහි නායකයාගෙන් වෙන්ව එන්නේ නම් එය පරාජය කිරීම පහසු වන්නට ඉඩ තිබිණි. එහෙත්, ඔහු මුහුණට මුහුණ සටනට කැමතිය. තම සතුරා තමාගේ අතින්ම මරා දැමිය හැකිනම් ඔහුට තම ආධිපත්‍යය පෙන්වීමට හැකි වේ.

''අප ප්‍රහාරය එල්ල කිරීමට ඔහු එනතෙක් බලා සිටිනවාද, නැතහොත් අප මුලින් පහර දෙනවාද?'' පෙෆ්ටෝ බිය වී ඇසීය.

''අවශ්‍ය නැහැ අපගේ ක්‍රමවේදය වෙනස් කරන්නට. අපි ඉඩ හරිනවා, හෙනෙන් නෙසට් ආරක්ෂක තාප්ප මතින් පියැන්කිගේ හමුදාවට, දැඩි ප්‍රහාර එල්ල කරන්නට. ඔවුන්ගෙන් ප්‍රමාණවත් හට පිරිසක් මිය ගිය පසු, අපට හැකියි සතුරා සහමුලින්ම විනාශ කරන ප්‍රහාරයන් පෙළක් දියත් කරන්නට.''

''ඔබ, දිවිබේරාගන්නවුන්ට සමාව දෙනවාද?'' පෙෆ්ටෝ ඇසීය.

''නැහැ. අප මේ නුබියානු තක්කඩියන් කිසිදු අනුකම්පාවක් නොදක්වා සමූලඝාතනය කළ යුතුයි. එයයි මේ රටේ වාසනාව.''

✸

පියැන්කි, මට් දෙවොලේ පිහිටි අඩසඳක හැඩය ගත් ශුද්ධ වූ වැවෙන් ජලය ගෙන ආයේය. එම ජලය ජෝගුවල දමා තැබීමෙන්, පිටත්වීමට සූදානම්ව සිටින යුදහමුදාවට ඉන්ද්‍රජාලීය ආරක්ෂාවක් සැලසෙනු ඇත. එම දිව්‍යමය ගංගාවෙන් ලැබුණු, ඒ එහා ලොවේ ශක්තිය, උතුරු හමුදාව පරාජය කිරීමට ඔවුන් තුළ ඇතිකරගත් අධිෂ්ඨාන ශක්තිය එලෙසින්ම පවත්වා ගැනීමට සහාය වනු ඇත.

පියයුරු නිරාවරණය වූ රතු පැහැති දිග ලෝගුවකින් සැරසුන අබිලා රජින දුටුවන් වශී කළාය. එහෙත් ඇයට තම කනස්සල්ල සැඟවිය නොහැකි විය. ''දෛවඥයා පැවසුවා නොවෙද තාරකා ඔබට අසුබයයි කියා, හිමියනි?''

''ජල දර්පනයේ රැළි නැගීමක් ඇතිවුණා.'' පියැන්කි කීය. ''එහි තේරුම මරණය සිදුවෙන බවයි. ඒ මගේ මරණය විය හැකියි. එහෙත් එය, යුගයක අවසානය විය නොහැකිද?''

අබිලා සැමියාගේ දෑස් දෙස බැලුවාය. ''මට මුලින්ම මේ යුද්ධය අවශ්‍ය වුණා. ඊලඟට මා එයට බියවුණා. නැවතත් මා වටහාගත්තා සතුට මල්ඵල ගැනීමට නියමිතව තිබේ නම් එය කිසිදා වෙනස් නොවන බව. ඉතින් මා මට ම බල කළා ඒ ගැන නොසිතා සිටින ලෙස. ඒත්... දැන් මා පරාජිතයි. මා දන්නේ, මා ඔබ ගැන බියවන බව පමණයි. ඔබ මේ දෙවොලෙහි තනිවී, සියල්ල අත්හැර දැමුවා නම් සෙස්සන් කුමක් පවසාවිදැයි මට වැටහෙනවා හිමියනි. ඔබයි මා සිහින දුටු ජීවිතය, පෙම්වත, මට අවශ්‍යයි ඔබ මගේ පසෙකින් තබා ගන්නට.''

පියැන්කි ඇය ළංකර ගත්තේය. ''සමහරවිට මේ ගමනේ අවසන මරණය මා හා එක්වේවි. ඒත්, අපට ජය ගන්නට අවස්ථාව තිබෙනවා. මා මගේ වගකීම් ඉටු නොකළහොත්,මා මේ භූමිය පුරා මා-ආට් නීතිය ගරු කරන්නට පුරුදු නොකළහොත්, මරණින් මතු මට දෙවන මරණයකට මුහුණ දීමට සිදුවේවි. මරණින් මතු අධිකරණය මා මුළුමනින් විනාශ කරාවි. අප අපේ සටන ඇරඹිය යුතුයි අබිලා.''

පියැන්කිගේ හිත වෙනස් කිරීමට තමාට කිසිදා හැකි නොවන බව වටහාගත් අබිලා, ඔහු සමග භයංකර වූ සෙක්මෙට් දෙවඟනගේ දෙවොල බලා ගියාය. සතුරාගේ විනාශකාරී බලය අඩුකරන යාඥාවන් සිදුවන්නේ එතැනයි. ඒ රාත්‍රිය පුරාම කාර්නැක් ඉන්ද්‍රජාලිකයින් රජු ආරක්ෂා කිරීම සඳහා යාඥාකර තිබිණි. පියැන්කිගේ ආත්මය සොරාගන්නට, මරණයට කිසිවිටෙකත් අවස්ථාව නොලැබෙනු ඇත.

ආමන් බිරිඳ නව හිරුගේ උදාව සමරන අතරේ; මාජොරම් හා ගෝනුසු දෙවඟන වූ සර්කෙට්ගේ පූජකවරියන්ගේ උපදෙස් අනුව, රාජකීය යුවල ටෙෆ්නැක් හා ඔහුගේ සගයින්ට එරෙහි ඉන්ද්‍රජාලීය සටනට පණ පෙවූහ. සතුරන්ගේ කුඩා අනුරූ කිරිගරුඬ හා හුණුගල් වලින් තනා තිබිණි.

''දශක කීපයකට පෙර'' පියැන්කි කීය. ''මේ අයුරින් වෛරයට භාජනය වුණේ නුබියානුවන්. ඒත්, අද ඔවුන් ඈත දකුණින් පැමිණ සිටිනවා, අපගේ සදාචාරාත්මක වටිනාකම් රකින අය ලෙස, මේ භූමිය රැක ගැනීම සඳහා සටන් වදින්නට. එහිම මියයන්නට. එය පුදුමාකාර වෙනස් වීමක්. එදා හිරිහැරයට පාත්‍ර වූ අයම, අද ඒ සියල්ල අමතක කොට නිදහස ලබාගන්නවුන් බවට පත්ව සිටිනවා.

සතුරන්ගේ රුව රැගත් කුඩා අනුරූ මත, මා ආට් විනාශ කරන්නවුන්ගේ ස්වභාවය රැගත් ලියවිල්ලක් රතු පැනෙන් ලියා තිබිණි. කුමන්ත්‍රණකරුවන් හා ඔහුගේ සගයින්ගේ රූ තනන ලද්දේ දණින් වැටී හෝ මුනින් වැටී සිටින අතර දෑත් පිටුපසට තබා බැඳ ඇති අයුරිනි.

මාජොරම් පියැන්කිට කතා කළාය ''ඉහළ හා පහළ ඊජිප්තුවේ පාරාවෝ, දෙවියෝ ඔබව නීච දේ කියන, කරන අයගෙන් වෙන්කර තබත්වා. ඔබේ බලය ඔවුන්ගේ බලයට වඩා වැඩිවේවා. ඔබේ ශක්තියෙන් ඔවුන් බියට පත්වේවා. ඔවුන් ඔබේ දෙපයට පෑගී විනාශ වේවා. හිරුගේ ගමන නවත්වන්නට තැත් කරන්නන් සඳහටම ආලෝකයෙන් ඈත් වේවා. ඔවුන්ගේ කට වැසී, දෑත් බිඳීයේවා!''

පූජකවරියෝ එම අනුරූවල මුඛය, පියැන්කිගේ මුද්‍රාව තබා වසා දැමූහ. අත්, පා කඩා දැමූහ. ඊළඟට මාජොරම් ඒවා අඟුරු කබලට විසි කළාය. එතුළින් විලාප හඬක් නැගෙන බව ඔවුන්ට දැනුණි. උත්සවයට සහභාගි වන්නන් බියට පත් කරමින් සිදු වූ ඒ සිදුවීමට,මුගටියා පවා බියවී තම ස්වාමියාගේ දෙපා පිටුපස සැඟවිනි.

අබිලා රැජිනට දැනුණේ මේ පුරාණ ඉන්ද්‍රජාලය මායාවක් නොව, පාරාවෝගේ දැඩි ප්‍රහාරයෙන් පරාජයට පත්වන සතුරාට, මාආට් නීතියට එරෙහි වීම හේතුවෙන් සත්‍ය වශයෙන්ම ඇතිවන ප්‍රහාරයක් බවයි. එසේම ඈත අතීතයේ සිටම, කිසියම් ඊජිප්තු රජෙක් යුද්ධයට පිටත් වීමට පෙර චාරිත්‍ර කිරීම අනිවාර්ය අංගයක් වූයේ මන්දැයි ඇය වටහාගත්තාය.

ගින්න ඇවිලෙන අතරේ මාජොරම්, පියැන්කිගේ නම සඳහන් කරන ලද කිරිගරුඬ බඳුනක් ඔහුට පිළිගැන්වූවාය. ''උතුමාණෙනි, ඔබේ කීර්තිය සිහිගැන්වීම සඳහා මෙම ප්‍රතිමාව දෙවොලේ තැන්පත් කිරීමට

පෙර, රා දෙවියන් විසින් මවන ලද මේ බීර ස්වල්පය බොනු මැනවි. එවිට ඔබේ බලය මේ රාජධානිය පුරා පැතිර යනු ඇති, උතුමාණෙනි.''

පාරාවෝ එම බඳුන පිළිගැනීමට අත දිගු කරත්ම ඔහුගේ උර මත සිටි මුගටියා ක්ෂණිකව නැගිට, මොහොතක් බලාසිට, ඊගසක් සේ මාජොරම්ගේ අතට පැන ලේ එනතෙක් සපා කෑවේය.

වේදනාවෙන් කෑගසමින් ඇය බඳුන අතහැරියාය. එය, ශෛලමය පොළොව මත වැටී බිඳී ගියෙන්, කහ පැහැති දියරය විසිරී ගියේය. මුගටියාගේ කෝපය දෙගුණ, තෙගුණ විය. ලොම් විහිදුවාගත් උගේ මුහුණේ රැවුල් ගස් ඉලිප්පී ගියේය. ඌ වහා හැරී සර්පයෙකුට පහර දෙන්නා සේ හිටගත්තේය.

''මේ සත්ත්වයා උමතුවෙන්. ඌ මරා දමනු.'' මාජොරම් කෑ ගැසුවාය.

එහෙත්, සත්ත්වයාගේ හැසිරීම අබිලාට යමක් වටහා දුනි. ''මාජොරම්'' ඇය කීවාය. ''ඔබ, ඔබට යමෙකු විසින් දෙන ලද සර්පවිෂ රජුට පොවන්නට තැත් කළා. ඒ වරදට හවුල් වුණේ සර්කෙට් පූජකවරියක් නොවෙද? ඔබ ටෙෆ්නැක් ගෙන් ගෙවීම් ලබනවා නොවෙද?''

රැජිනගේ බැල්ම දරාගත නොහැකි මාජොරම් ඉවතට හැරුණාය. තුවාල වූ අත අනෙක් අතින් මිරිකාගත් ඇය, සියල්ල ප්‍රතික්ෂේප කිරීමට සූදානම් වෙත්ම, වෙනත් සර්කෙට් පූජකවරියන් දෙදෙනෙක් එතැනින් පැන දුවන්නට තැත් කළහ. පියැන්කිගේ ආරක්ෂකයින් ඔවුන් අල්ලා ගති.

''කිමද නුඹ එසේ කළේ?'' රජු ඇසීය. ''මගේ මියගිය සහෝදරිය, හිටපු ආමන් බිරිඳ ගේ සේවිකාව?''

ඔහුගේ හඬ කොතරම් දැඩිද යත් මාජොරම් බියෙන් වෙව්ලා ගියාය. එහෙත් ඇය මෙසේ කීවාය. ''නව ආමන් බිරිඳ නුබියානුවෙක්, පෙර සිටි අය මෙන්ම. තීබසය ඇය ලවා පාලනය කිරීම ඔබට ප්‍රමාණවත් නොවෙද? ටෙෆ්නැක් සාධාරණයි. ඔහුගේ ජයග්‍රහණය අප එකමුතු කරනවා.''

දණින් වැටුණු ඇය ඒ විෂ ලෙවකන්නට වූවාය. ඒ මාරාන්තික විෂ! ''මා පරාජයවුණා. ඒත්,උතුර ජයගන්නවා!'' ඇගේ ඇස් කරකැවිණි. අත් පා දරදඬු විය. පිත වමනය කළ ඇය දෑතින්ම ගෙල මිරිකාගෙන බිම වැටුණාය.

ඇගේ මරණයත්, අල්ලා ගන්නට යෙදුනු ඇගේ සහායක පූජකවරියන් දෙදෙනා අත් අඩංගුවට ගැනීමත් සමග තීබසයේ හුන් ටෙෆ්නැක්ගේ ඔත්තුකරුවන් අතුගා දැමුණි.

# 46

ලිබියානු භට කණ්ඩායම් තුළ යුද්ධයට තිබූ ආශාව සමග බියක්ද වැඩෙන්නට විය. එක් අතකින් සොල්දාදුවෝ සටනට කැමැත්තෙන් සිටියහ. අනෙක් අතින් කළු පාරාවෝගේ බිහිසුණු බවට බිය වූහ. එහෙත්, ටෙෆ්නැක් එම බිය නැතිකර විශ්වාසය ඇති කරන හැටිත්, ඉදහිට දිළෙන ගිනි දූල් සදහටම දීප්තිමත්ව බබළවන හැටිත් දන සිටියේය. දවස පුරාම තම භටයින්ට පුහුණුව ලබාදීමටත්, බිය ඇතිවන මනඃකල්පිත සිතුවිලි වලින් ඈත් කිරීමටත් ඔහු පියවර ගති.

කෙසේ වෙතත්, එක දෙයක් ස්ථිරය. පියැන්කි හෙනෙන් නෙසට් යටත් කර ගන්නේ නැත. ඔහු සටන් වැදී දහස් ගණනක් මිනිසුන් මරා ගනීවිද, නැතහොත් පසුබැස යාවිද? නුබියානු යුද හමුදාවේ කොඳු නාරටිය කැඩී යන සේ, සියල්ල සුනු විසුනු කෙරෙන ප්‍රහාරයක් එල්ල කිරීමට නිවැරදිම මොහොත තෝරාගැනීම ටෙෆ්නැක්ට භාරය!

තම ගබඩා සහ ආයුධ පරීක්ෂාවෙන් ටෙෆ්නැක්ට අස්වැසිල්ලක් දුනුණි. එහි අවශ්‍ය තරම් ආයුධ තිබිණි. සියල්ල හොඳින් අළුත්වැඩියා කර ඇත. ආහාර ගබඩාවල තත්ත්වයද එසේය. විශේෂයෙන් ම,දීර්ඝ කාලයකට අවශ්‍ය තරම් ආහාර තොග එහි විය.

ආපසු මාලිගය බලා එන ටෙෆ්නැක්ට හමුවූයේ කණගාටුවෙන් හිස නමා වැටෙන යෙගෙබ්ය.

''උතුමාණෙනි...''

''කුමක්ද?''

''නරක ආරංචි දෙකක්,උතුමාණෙනි. එහෙත්, මා සිතනවා මේ මොහොතේ ඒවා පැවසීම සුදුසු නොවෙයි කියා.''

''පවසනු, වහාම!''

''මාජොරම් මියගියා උතුමාණනි, අනෙක් පූජකවරියන් දෙදෙනා සිරගත වුණා. අපට දූන් තීබසයේ සිටින පාරාවෝගේ තීරණ දූනගන්නට කිසිවෙක් නැහැ.''

''එය එතරම් බලපතල ගැටලුවක් නොවෙයි, දූන් අපට ඒ තොරතුරු අවශ්‍ය නොවන නිසා. අපි කළු පාරාවෝගේ ශක්තිය ගැන දන්නවා. ඒ නිසා අප අපේ සැලසුම් වෙනස් කරන්නෙ නැහැ. කුමක්ද අනෙක් ආරංචිය?''

යෙගෙබ් දැඩි සේ කනස්සලු වන බව පෙනිණි. ''උතුමාණෙනි, එය... එය ඉතාම සංකීර්ණයි.''

''පවසනු, වහාම!''

''එය ඩේබ්‍රෙක් ගැනයි, උතුමාණෙනි''

''කිසිවෙකු ඇයට කරදර කරන්න තැත් කළාද?''

''සත්‍යය නම් උතුමාණෙනි, ඇය ඔබේ කීර්තියට හානි කරන අයුරින් හැසිරෙන බව පෙනෙනවා. ඔබේ කීර්තියට, උතුමනි.''

''යෙගෙබ්! තා පවසන වදන් සිහි ඇතිව ප්‍රකාශ කරනු!''

''උතුමාණනි. මගේ ආයාවනය මට සවන් දෙන ලෙස. අපගේ ආරක්ෂක මුර භටයින් පවසනවා ඔවුන් දුටු බව...උතුමාණනි... ඩේබ්‍රෙක් සහ තරුණ දූනුවායෙක් අතර... සබඳකමක්...ඇති බව.''

ටෙෆ්නැක් ගේ කළු ඇස් තවත් අඳුරු විය. ඔහු ගිනිගෙන දැවෙන දෑසින් මෙසේ ඇසීය. ''තට හැකිද ඒ ඔප්පු කර පෙන්වන්ට?''

''උතුමාණෙනි...අවාසනාවකට මෙන්... හැකියි. ඔබ මා හා එන්නේ නම්...''

✷

ඩේබ්‍රෙක් තම අනාගත පෙම්වතා හමුවීමට, දැඩි ආශාවෙන් වෙව්ලා ගියාය. ලිනන් ගබඩාව පිරිසිදු, අළුත් රෙදි වල සුවඳින් හා සෞම්‍ය විලවුන් සුවඳින් පිරී ගියේය. ඔහු ඇය වෙත පැමිණියේද දළුලන ආශාව මැඩගනිමිනි.

''ඔබ පැමිණියා.'' ඔහු මෘදු බසින් කීය. ''එය සිහිනයක්. උමතු සිහිනයක්.''

ඈ සිනාසුණාය. ''නැහැ, මා සිහිනයක් නොවෙයි.''

ඔහු දෑස් පියාගති. ''මුලින් මට ඉඩ දෙන්න. ඔබේ රුව සිතේ ඇඳගන්නට. ඉන්පසු පෙන්වන්න ඔබේ නියම රූ සපුව. කුමරිය, ඔබ මගේ ලස්සනම පෙම්වතියටත් වඩා ලස්සනයි.''

''සිටියාද ඔබට බොහෝ ගණනක්?''

''ඔබ දුටු දා පටන් මගේ සිතේ අන් කිසිදු ගැහැනියක් නැහැ කුමරිය. මගේ ලොවේ අන් ගැහැනු නැහැ.''

ඔහු සෙමෙන් ඇගේ ඇඳුමේ වම් උරහිස් පටිය පහත් කළේය. යළි දකුණු උරහිස් පටියද එලෙසින්ම පහත් කළ ඔහු ඇගේ පියයුරු සිපගත්තේය. වෙව්ලා ගිය ඇය හිස හරවා ඔහුගේ දෑස දෙස බැලුවාය.

ඒ දෑස් දුටු ඇය බියෙන් ගල්ගැසී ගියාය. ඔහුගේ දෑස පිරී තිබුණේ එදා ඇය දූෂණය කළ නාට්‍රෙබ්ගේ දෑසේ වූ රාගය, කෲරත්වය සහ අවමන් සහිත බැල්මකිනි. ඔහු තුළ ඇයට ඇති ආදරයක් නැත! ඈ සිහි එළවාගත්තාය. ''පසෙකට හැරෙන්න.'' ඇය කීවාය. ''මට ඇඳුම් ඉවත් කරන්නට.''

''මා සිතුවේ නැහැ ඔබ එතරම් විනීතයි කියා.''

''අනේ... කරුණාකර.''

ඔහු අකමැත්තෙන් ඊට එකඟ විය.

සිත දැඩි කර ගත් ඩේබ්‍රෙක්, ලිනන් පොට්ටනි ගැටගසා තිබූ හම්පටියක් ඇදගෙන එයින් ඔහුගේ ගෙල සිර කළාය. හදිසියේ අතට හුසුවූ එකම ආයුධය වූ එයින්, තම සිරුර තුළ වූ සියලු ශක්තිය දෑතට දුන් ඩේබ්‍රෙක් ඔහුගේ හුස්ම හිර කළාය. තරුණයාගේ දඟලීම් ඒ ග්‍රහණයෙන් බේරෙන්නට ප්‍රමාණවත් නොවීය. එවිටම, දෑත් එල්ලා වැටෙමින් තමා දෙස බලා සිටින ටෙෆ්නැක් දුටු ඩේබ්‍රෙක් ගේ ශක්තිය තවත් වැඩි විය.

දඟලීම නැවැත්වූ දුනුවායා අප්‍රාණිකව බිම වැටුණි.

''ඔහු මට තර්ජනය කළා.''ඩේබ්‍රෙක් වැලපෙන්නට වුණාය. ''ඔහු මාමෙහි ගෙනවිත් දූෂණය කරන්න තැත් කළා. මා රවටාගෙන. ඔහුට අවශ්‍ය වුණේ ඔබේ කීර්ති නාමට කැළැල් කරන්නයි. ඔහු මට පාපොච්චාරණය කළා පියැන්කි ඔහුට ගෙවන බවට.''

මළසිරුරට කෙළ ගැසූ ඇය, වැලපෙමින් ටෙෆ්නැක්ගේ දෑත් මතට වැටුණාය.

✸

යෙගෙබ්ගේ හිස තෙත රෙද්දකින් ඔතා තිබිණි. ඔහුගේ සිරුර පුරාම රුජානාශක ආලේප තවරා තිබිණි. අජීර්ණයෙන් පෙළෙමින් සිටි ඔහු, කෑ ගසමින් මෙසේ කියන්නට විය. ''නාට්‍රෙබ්, ඔබ දන්නවද? ඒ නීච ඩේබ්‍රෙක් ? මට සිදුවුණා ඇයගෙන් සමාවගන්නට. ජෙනරල් මට තර්ජනය

කළා ඊජිප්තු රජිනගේ කීර්තියට හානි කරන්නට පෙර හොඳින් සොයා බැලිය යුතුයි කියා. මා බියවුණා මගේ රැකියාව නැතිවෙයි කියා.''

නාට්‍රේබ් නොනවත්වාම තම වේදනාදෙන පයැඟිලි අතගාන්නට විය. ''ටෙෆ්නැක්ට අප නැතුව බැහැ, ඔහු ඔහුගේ නිව වැඩ සියල්ලම භාර දෙන්නේ අපටයි. එහෙත්... කෙසේද ඒ තරුණිය දිවි බේරාගත්තේ?''

''දුනුවායා මරා දැමීමෙන්.'' යෙගෙබ් ගෙරවීය.

''ඔබ ඇයට බය නැහැ නෙව?''

''මට පරාජය පුරුදු නැහැ. මේ වෙලාවේ ඇය අපට වෛර කරනවා.''

''එය අළුත් දෙයක් නෙවෙයි.'' නාට්‍රේබ් කීය. ''ඒත් ඇය සිතනවා නම් ටෙෆ්නැක් ඇයට ආදරය කරන බව, ඇයට වැරදීමක්. ජෙනරල් විවාහ වී සිටින්නේ බලාපොරොත්තුව සමගයි. අප ඔහු ළඟ සිටින්නේ ඔහුගේ ඒ ආශාව සපුරන්නයි. ප්‍රහාරය අත ළඟ මිත්‍රයා. අප එයින් අති විශාල මුදලක් උපයනවා.''

✱

ඔටොකුගේ බර බෙහෙවින් අඩු වී තිබිණි. ඔහුට ආහාර වල රසය නොදැනෙයි. ඒ තර මිනිසා, හෘදසාක්ෂියට එකඟව, නපාටාව හොඳින් පාලනය කළේය. රාජ්‍ය තාන්ත්‍රිකයින්ට මෙන්ම පරිපාලන නිලධාරින්ටද පියැන්කිගේ අඩුව හොඳින් දැනුණි. ඔහු රෞද්‍ර පුද්ගලයෙකු වුවද ඔටොකු තරමට විධාන දෙන්නෙක් නොවීය.

තිබසයෙන් ලද පුවත ඔහුගේ ආහාර රුචිය නැත්තටම නැති කළේය. කාපා ඔහු හමුවීමට පැමිණීමද ඔහුගේ සතුටට හේතුවූයේ නොවේ.

ඔටොකු, කිරිගරුඬ දීසිය බිම තැබීය. එහි වැතිරී තම අවධානය ගන්නට තැත් කරන රෝස් කළ පාත්ත කකුල දෙස නොබැලූ ඔහු, මහල්ලා ඇතුළට එවන්නැයි පැවසීය.

''කාපා, ඔබ පැමිණියේ මා විවේචනය කරන්න නම් මේ එයට වෙලාව නෙවෙයි. මා යට වී සිටින්නේ නයිල් ජලගැල්ම තරම්ම වැඩ ගොඩකට.''

''කිමද ඔබ මෙතරම් සැකයෙන්? මාත්, ඔබේ ලේකම් වරුනුත් ඔබ ගැන ආඩම්බරයි. මා පැමිණියේ ඔබට සුබපතන්නයි ඔටොකු.''

ඔටොකුට තම දෙසවන් අදහා ගත නොහැකි විය. කාපා ඔහු

විහිළුවකට ගෙන ඇති හැඩයි. එහෙත්, මහල්ලා තම සුපුරුදු විහිළු කතාවෙන් මිදී, නපාටාවේ නව ආණ්ඩුකාරයා දිරි ගන්වයි. ඇත්තටම ඔහුද ඔටොකු තරමටම කණගාටුවෙනි.

''කුමක්ද කාපා ඔබ සිතන්නේ? පියැන්කි යළි ආපසු නොඑන බවද ඔබ සිතන්නේ?''

''කුමටද අපි අපේ සිත් රවටාගන්නේ? එක්කෝ ඔහු යුද්ධය පැරදී මියයාවි. නැතහොත් ඔහු තීබසය තම අගනුවර කරගෙන එහි රැඳේවි සදහටම. කිසිදා ආපසු නොඑවි.''

''කිසිදා...?'' ඔටොකු බිය වූයේය.

''ඔව්. කිසිදා. ඔබත් මාත් මැරෙන තුරුම නපාටාව පාලනය කරනවා, ඔබ පත් කිරීමෙන් පියැන්කි කළේ හොඳම දෙයක්.''

''මේ නගරය නැවත හඳුනා ගනීවිද සතුට යනු කුමක්ද කියා? කළු පාරාවෝ නොමැතිව එය, ඇත ක්ෂේමභූමියක වැළලී ගිය කුඩානගරයක් පමණක් වේවි.''

''මා කළා සේ ම කරන්න ඔටොකු, වයසට යන්න! එවිට ඔබට පිළිගත නොහැකි දේත් පිළිගන්නට හැකිවේවි.''

# 47

රාජකීය නෞකාවේ ඉදිරිපස, බැටළු හිසක් සහිත සර්පයකුගේ හැඩය ගත් අතර, එය රනින් ආලේප කරන ලද්දේ විය. එහි ඉඳගෙන සිටි කළු පාරාවෝ සහ මහ රැජින මධ්‍යම ඊජිප්තුව සහ හරේ පළාත දෙස නෙත් යොමාගෙන සිටියහ. ඔවුන් තව දින දහයකින් එහි ළඟා වනු ඇත.

රජු ඉහළ ඊජිප්තුවේ සංකේතය වූ සුදු ඔටුන්න පැළඳ සිටි අතර එය පහළ ඊජිප්තුව සංකේතවත් කරන රතු ඔටුන්නට ඇතුළතින් පිහිටියේය.

ඔටුන්නේ ඉහළින් ගැහැනු නාගයින් දෙදෙනකුගේ රන් රූ සවිකර තිබිණි. ඔවුන්ගේ කෝපය සතුරන් පරදවයි. කුරුළු පිහාටු සවිකරන ලද පාරාවෝගේ සැට්ටය උරහිස් පටිවලින් රඳවන ලද අතර ඔහු ලිනන් රෙද්දක් ඇඳ සිටියේය. ඔහුගේ මැණික් කටු, රන් වළලු වලින් සැරසී තිබූ අතර, ඒවායෙහි ගාංචුවල ආකාශ දෙවඟන වූ නට්ගේ රුව සඳහන්ව තිබිණි. ඉතා කුඩා නාග රූ වලින් සැදුනු ඔහුගේ රන් කරපටියට යටින් නිල් කොළ පැහැති සුරයක් විය. ඒ සියල්ල ඔහුට දිව්‍යමය රහස් හෙළිකරමින් ආලෝකය සමග සටනට ශක්තිය ලබා දුනි.

අබිලා තම සැමියා අසල ඉඳගෙන තම දකුණත මහත් ආඩම්බරයෙන් ඔහුගේ වම් අතෙහි එතුවාය. ඇගේ රතු පැහැති දිගු ගවුමේ සුදු ඉණ පටියක් විය. කන්වල රන් කරාබුද, ගෙල වටා වීදුරු,කිරි ගරුඬ හා පබළු වලින් තනන ලද අලංකාර මාලයක් ද විය. ඇගේ මාල පෙත්ත උකුසු ඇස් දෙකක් දෙපසින් පිහිටි නෙළුමක හැඩය ගත්තේය.

''මේ සුළඟේ ආමන් එහි එනවා.'' පියැන්කි කීය. ''එහෙත් එය ඇසට නොපෙනෙයි. රාත්‍රිය ඔහුගේ සුවඳින් පිරී තිබෙනවා. දිවා කාලය ඔහුට ගෞරව දක්වනවා. අහසේත් පොළොවේත් ආලෝකය පවත්වන්නේ ඔහු විසින්.''

''ඊජිප්තුවේ ශුද්ධ වූ ආත්මයාණෙනි,'' අබිලා ආයාචනා කළාය. ''ගොඩබිම් දෙක නැවත එක්කරන සටනේ යෙදෙන්නට සූදානම්ව සිටින සියලු දෙනාට ජීවන හුස්ම ලබාදෙන්න.''

පියැන්කි රිදී කොපුවක් දිගහැර කිරිච්චියක් අතට ගත්තේය. එහි මිට, නුබියානුවකු ගිල දමන සිංහයෙකුගේ හැඩයට තනන ලද්දේ විය. ඉතා ආශ්චර්යමත් රජෙක් වූ පාරාවෝ තුත්මොසිස් III සමයේ තනන ලදුව, නපාටාවේ ආමන් දෙවොලේ ආරක්ෂිතව තබන ලද්දකි එය! හිරු එළිය එහි තලය මත වැටී දිළිසුණේය. ගමනාරම්භයට වේලාව පැමිණ ඇති බවට සංඥාවයි ඒ.

✸

රන්වන් බාර්ලි ගොවිබිම්, පැපිරස් පඳුරු මතින් ඉගිලෙන කොකුන්, සුළඟ දිගේ පාවී යන උකුස්සන්, තණ නිල්ලෙන් වැසී ගිය ගං ඉවුරු... සිහිනයක ඇවිදින සෙයක් දක්වන ඒ භූමිය කෙතරම් අලංකාරද? එහෙත් කිසිදු නුබියානු සොල්දාදුවකුට ඒ අසිරි දකිමින්, අලසව ගත්කරන්නට කාලයක් නොවීය. ඔවුන්ගේ හදවත්, තව සුළු කාලයකින් මුහුණ දීමට සිදුවන භයානක යුද්ධය පිළිබඳ සිතුවිලිවලින් පිරී ගියේය. සියල්ලෝම තම බිරියන්, මාපියන්, දරුවන් ගැන කල්පනා කළහ. ඔවුනට යළි කිසි දිනක ඒ නෑසියන් දක්නට නොලැබෙනු ඇතිද?

යාත්‍රාව ආරම්භයට මත්තෙන් පියැන්කි බොහෝ වේලාවක් තම අශ්වයා සමග කතා කරමින් ගත කළේය. උගේ දිළිසෙන, බුද්ධිමත් දෑස සංකාවෙන් පිරී ගියේය. රජු සත්‍ය තත්ත්වය හෙළිදරව් නොකළ නමුත්, ඉක්මනින්ම අති භයානක අනතුරකට මුහුණ දීමට සිදුවන බවට වැලියන්ට්ට අවවාද කර තිබුණි. වැලියන්ට් සන්සුන්ව ආඩම්බරයෙන් හිස එසවීය. එසේය! ඔහුද සටනට සූදානම්ය!

හරේ පළාතේ, දකුණු දේශ සීමාවේ ගං ඉවුරේ රැඳී සිටින ලැමසෙක්නි සහ පෝර්මා දෙදෙනා ට දැඩි සතුටක් සේම තිගැස්මක් දැනුණි. ඒ දැඩි සතුට, අසු පිට එන පාරාවෝ දකින්නට ලැබීම හේතුවෙනි. තිගැස්ම, ඔහුගේ දෝෂාරෝපණයට හා විවේචනයට ලක් වීමට සිදුවන බැවිනි.

''ටෙෆ්නැක් තවමත් නිදහසේ සිටිනවා?'' ඔහු කුපිත වූ බව පෙන්වමින් ඇසීය.

''එසේය උතුමාණෙනි...'' පෝර්මා කීය.

''මා තොපට මෙහෙයුමක් භාර කළා. ඒ ද්‍රෝහියා අවසන් කරන ලෙස අණ කළා. මා තොප විශ්වාස කළා. තොප ඒ උතුරු වැසියන් පන්නා දමාවිය යන විශ්වාසය මා තුළ වූ නිසා. එහෙත් අද? කමුන් හා

හෙනෙන් නෙසට් සතුරන් අතේ. තොපගේ අදූරදර්ශී බව හේතුවෙන් පාරාවෝ නාමය කැළැල් වී තිබෙනවා.''

පෝර්මාගේ හිස නමා වැටුණද, ලැමසෙක්නි කතා කළේය. ''අප අපගේ උත්සාහයන් අතහැර නෑ උතුමාණෙනි. එහෙත් ටෙෆ්නැක් යනු, කැරලි කරුවන් ටික දෙනෙකු සමග අසංවිධානාත්මකව සටන් කරන නායකයකු නොවෙයි. අපට මුහුණ දෙන්නට සිදුවන්නේ නියම යුද්ධ හමුදාවකට.''

''තොප සිතනවාද මා එය නොදන්නවා කියා?'' පියැන්කි ඇසීය.

''හෙනෙන් නෙසට් වටලෑම දීර්ඝ, අපහසු කාරියක් වේවි.'' ලැමසෙක්නි කීය. ''අපට බොහෝ මිනිසුන් අහිමි වේවි. ඒත් මා බලාපොරොත්තු වෙනවා ඒ නගරයේ කැරලිකරුවන් අතුගා දමන මගක් සොයන්නට. අප ජයගත් පසු, ටෙෆ්නැක්ට යටත්වීමට සිදු වේවි.''

''එසේනම් අප මුහුණ දෙන්නේ විශාල ජීවිත විනාශයකට''

''අහෝ! උතුමාණෙනි. හෙනෙන් නෙසට් ආරක්ෂක බිත්ති ඉතා ශක්තිමත්. එසේම, ලිබියානුවන් අති දක්ෂයින්.''

''වහාම අපගේ වරපුරුෂයන් යවන්න.'' පියැන්කි අණ කළේය. ''ඔවුන් එහි සිටින බව මුරකරුවන්ට දැනගන්නට හරින්නැයි කියන්න.''

ලැමසෙක්නි පුදුමයට පත්විය. ''ඒත් උතුමාණනි, ඊට වඩා සුදුසු නොවෙද...''

''හෙට උදෑසන, සොල්දාදුවන් කණ්ඩායමකට නගරයේ සිට මඳ දුරකින් කඳවුරු බඳින්නැයි කියන්න. ඔවුන් හැකි තරම් ශබ්ද කළ යුතුයි. එහි සිටින බව දැනෙන්නට.''

''කණ්ඩායමක් පමණක්? උතුමාණෙනි, හෙනෙන් නෙසට් අල්ලා ගන්නට නම් අපට අපගේ සියලුම හමුදාවන් අවශ්‍ය වේවි.''

''ඔවුනට පවසන්න කූඩාරම් විශාල ප්‍රමාණයක් තනන ලෙස. අති විශාල කඳවුරක් බැඳ, මගේ මුළු යුද හමුදාවම ප්‍රහාරයට සූදානම් වන බව පෙන්විය යුතුයි.''

''ඔබ පවසන්නේ උතුමාණෙනි, අප පහර නොදෙන බවද?''

''ඇත්තෙන්ම අප පහර දෙනවා.'' පියැන්කි කීය. ''එහෙත්, සතුරා බලාපොරොත්තු නොවන තැනකින්.''

✸

නාට්‍රෙබ් කෝපයෙන්, නොඉවසිලිමත්ව හෙතෙන් නෙසටහි කෙටි තාප්පය මත එහා මෙහා යන්නට විය. හදිසියේම එක් මුරකරුවෙක්, කටු පඳුරු අතර සැඟවීමට තැත් කරන නූබියානු චරපුරුෂයින් දෙදෙනෙකු දැක තිබිණි. ඔහු වහාම උපදේශකයාට ඒ ගැන දැනුම් දී තිබිණි.

"තව දෙදෙනෙක් එහා කෙළවරේ සිටිනවා." ඔහු කීය. "තවත් දෙදෙනෙක් ගොවිපොළ අයිනේ සැඟවී සිටිනවා."

වහා තාප්පයෙන් පීනු නාට්‍රෙබ්, ටෙෆ්නැක් හා ඩේබ්‍රේක් සොල්දාදුවන් අමතන ස්ථානයට ගියේය. ඒ ප්‍රධාන බැරැක්කයයි.

"ඔවුන් එහි සිටිනවා." නාට්‍රෙබ් කීය. "චරපුරුෂයින් ගණනාවක්. එහි තේරුම පියැන්කිගේ හමුදාව හෙට මෙහි එන බව. නැතහොත් තව දින කිපයකින්.

ඩේබ්‍රේක් සිනාසුණ නමුත් ටෙෆ්නැක්ගේ සතුට නිම වූ බව පෙනිණි.

"අද සන්ධ්‍යාවේ," ඔහු කීය. "අපගේ සියලු හටයින්ට මස් හා වයින් ලැබෙනවා. පියැන්කි අපගේ උගුලට අසු වී තිබෙනවා. ඔහුගේ අහංකාරකම ඔහුව පොළඹවා තිබෙනවා මේ බිඳිය නොහැකි බලකොටුවට ප්‍රහාරයක් එල්ල කරන්නට. අපි නූබියානුවන් දහස් ගණනින් මරා දමා උතුර ජයග්‍රාහී තැනක් කරනවා. "

ටෙෆ්නැක්ගේ හටයින්, හඬනගා ඔහුට සුබ පැතූහ. ජයඝෝෂා කළහ. ඉන්පසු ඔහු ඩේබ්‍රේක් සමග තම කුටියට ගියේය. ඒ දෙදෙනාම සිටියේ දැඩි උදයෝගයෙනි. එහි වූ දැඩි උණුසුම පසෙක තිබියදී තරුණිය වෙව්ලා ගියාය.

"ඔබේ සිහිනය, දැන් මගේත් සිහිනය සැබෑ වෙන්නයි සූදානම?" ඇය කිවාය.

ඇය ජෙනරල්ගේ ඇඳුම ඉවත්කර, තම ඇඳුමේ උරහිස් පටි ලිහා දැමුවාය. ඇය පියැන්කි පරාජය කොට ගොඩබිම් දෙකේ තම කීර්තිය පතුරවන්නට සූදානම් වන තම පෙම්වතා, ආලයෙන් මුසපත් කළාය.

✸

යෙගෙබ්, ටෙෆ්නැක්ගේ ඉල්ලීමට අනුව රජයේ ඉදිරි සැලසුම සකස් කොට අවසන් කළේය. පාරාවෝ තීබසයේදීත්, මෙමපිස්හිදීත් කිරුළු පළඳිනු ඇත. සියලු නූබියානුවන්, සාමාන්‍ය වැසියන්ද සමග ඝාතනය කොට නපාටාව විනාශ කරනු ලැබේ. රන් පතල් සියල්ල පාලනය අත්පත් කරගන්නා රජය ආරක්ෂක හමුදාවන් විශාල කරනු

ඇත. ජනතාව හොඳින් අධීක්ෂණයට ලක් කෙරෙන පාලන තන්ත්‍රයක් ඇති කෙරෙන අතර, පුද්ගල නිදහස හා දේපල අයිතිවාසිකම් ඉවත් කෙරෙනු ඇත. දෙවොල් හි සියලු පූජාවන් නවත්වනු ලැබේ. ඒවායින් වැඩි කොටසක් හමුදා බැරැක්ක බවට පත් කෙරේ. ටෙෆ්නැක්ගේ විධානයකට අනුව මිස අන් කිසිදු සොල්දාදුවෙකුට ඊජිප්තුව හැර යාමට අවසර නොලැබේ. රජුට සම්පූර්ණයෙන්ම පක්ෂපාතී රජයක් ඇති කිරීමට සහය දක්වීමක් ලෙස බදු ඉහළ යැවෙනු ඇත. සියලු ආයුධ නිපදවීම වැඩි කරනු ඇත. බලකොටු සහ සිරගෙවල් වැඩියෙන් තනනු ලැබේ. මේ කිසිවකට එරෙහි වන්නන් වහාම මරා දමෙනු ඇත.

නැවත වරක් එම සැලසුම කියවා බැලූ, එම රජයේ අනාගත මුදල් ඇමති යෙගෙබ් සහ අනාගත ආරක්ෂක ඇමති නාට්‍රෙබ්, මහත් සතුටට පත්වූහ.

කෙසේ වෙතත්, යෙගෙබ්ට එක ගැටලුවක් තිබිණි. සමහර ලිබියානු ගෝත්‍ර නායකයින් තමන් නිදහස් මිනිසුන් යැයිද, ටෙෆ්නැක් ඊට ඉඩ දෙතැයිද සිතන අතර ඔවුන් සන්සුන් කළ යුතුය. මෙවැනි බොහෝ දෙනා, ඊජිප්තුවේ නව පාරාවෝගේ බලයන් සමග යටපත් වනු ඇත. එසේ නොවුවහොත්, මේ පීඩාකාරී රජයට එරෙහි නොවීම වෙනුවෙන් ඔවුන්ගේ සිත් සතුටු කිරීමට තිළිණ ලබාදිය යුතුය.

අන්තිමට ඉතිරි වූයේ අකනොෂ් කුමරු පමණි. ඔහු දූෂිතයෙකු නොවේ. දූෂණය කළ හැක්කෙක් ද නොවේ. මේ නව ප්‍රතිපත්තිවලට එරෙහිවන්නට තරම් එඩිතර වන්නේ ඔහු පමණි. ඔහුගේ හදිසි මරණය සැලසුම් කරන්නට පෙර, ඔහුගේ දුර්වල තැනක් සොයාගෙන ඔහු අපකීර්තියට පත් කළ යුතුය.

# 48

කමුන්හි නෙම්රොඩ් කුමරු කාලය ගත කළේ ඉතා සතුටිනි. පියැන්කිට ද්‍රෝහී වී ටෙෆ්නැක්ට එකතුවීම කොතරම් භාග්‍යයක්දැයි ඔහුට නිතරම සිහි විය. ටෙෆ්නැක්ගේ අනාවැකියට අනුව කළු පාරාවෝ හෙනෙන් නෙසට් මුරපොළවලට ප්‍රහාර එල්ල කරනු ඇත. එහිදී පරාජයට පත්වන ඔහු, තමා කොතරම් දුර්වලදැයි වටහාගනු නියතය.

සුවඳගන්වන ලද හිසකේ, ප්‍රවේශමෙන් රැකගත්තා නිය ඇති නෙම්රොඩ් අන් කවරදාටවත් වඩා කඩවසම්ය. ඇත්තටම ඔහුට කොතරම් ආඩම්බරයක් ඇතිවීද යත්, ඔහු තම බිරිඳ නෙසෙටා කැඳවාගෙන තිබිණි. ආදරය කිරීමට උපන් නෙම්රොඩ්, අනියම් බිරියන් වැලක පැටළීම නිසා ඇය අමතක කර තිබිණි. ඔවුන් සියලුදෙනාම ආදරය හඳුනන්නන් බවයි ඔහුගේ හැඟීම!

පනස්විය පසුකර සිටියද නෙසෙටා ඒ වන විටත් සුන්දරය. කෙසේ වෙතත්, කමුන්හි පාලකයා තම යටතට ගත හැකි යැයි සිතා හුන් විසි වියැති තරුණියන් හා තරගය, නෙසෙටාට පහසු වූයේ නොවේ. සරල ඇඳුමින් සැරසී, පරණ තාලයේ බොරු කොණ්ඩයක් පැළඳ සිටි නෙසෙටා වෙතින් පළවූයේ සන්සුන් බවකි.

''කුමටද මා කැඳවූයේ, නෙම්රොඩ්?''

''ටෙෆ්නැක් නොබෝ දිනකින් පාරාවෝ ලෙස කිරුළු පලඳිනවා. මටත් ලැබෙනවා රජයේ මා කැමති තනතුරක්. එහිදී මට අවශ්‍ය වෙනවා විනීත, යටහත් පහත් බිරිඳක්. මගේ අතින් අල්ලාගෙන ඉන්නට. ඔබ මා හා එනවාද?''

''මා එය ප්‍රතික්ෂේප කළහොත්?''

''එසේ වුවොත්... මා සුළු උපායකින් ඔබ ඉවත් කරනවා. ඇත්ත වශයෙන්ම නීත්‍යානුකූලව. ඔබේ තැනට වෙනත් ගැහැනියක් ඒවි. ඔබට ඔබේ සියලු වරප්‍රසාද, අයිතිවාසිකම් අහිමි වේවි. සිදුවේවි ඔබට බොහෝම අර පරෙස්සමින් ජීවත් වන්නට.''

"මොනවා ද මගේ වගකීම්?"

"මගේ පසෙකින් පෙනී සිටීම පමණයි. සරලව පවසනවා නම්, සතුටින් සිටින බව පෙන්වමින් කිසිදු බරපතල දෙයක් කතා නොකර සිටීමයි. ඊටත් වඩා අමාරු දේ තිබෙනවා නෙසෙටා! ඔබ මා පසෙකින් සිටින විට කිසිවෙක් මා විවේචනය නොකරාවි. මා ගැන ඕපාදූප නොකියාවි. මගේ අනාගත වගකීම් ඉටු කිරීමට මට අවශ්‍යයි නිහඬ බව. සන්සුන් බව. ඔබ කැමතිද?"

"ඔව්."

"අපූරුයි.!"

මුළු ලොවම නෙම්රොඩ් හා සිනාසෙයි. ටෙෆ්නැක් හා එක්වීම සුදුසුයයි ඇති වූ සිතුවිල්ලට පින්සිදුවන්නට, ඔහුගේ නගරය ඊජිප්තුවේ ධනවත් ම නගරය වනු ඇත. ඔහු, නව පාරාවෝගේ රාජ සභාවේ වඩාත්ම වැදගත්, කැපී පෙනෙන අයකු බවට පත්වනු ඇත.

නෙම්රොඩ්, අළුතින්ම හමු වූ අනියම් බිරිඳ සිටින කාමරයට යන්නට සූදානම් වන ඔහුට දැඩි සතුටක් දැනුණි. ඇය ඉතා සෞම්‍ය, මට සිළුටු ඇඟිලි ඇති වීනා වාදක තරුණියකි. හදිසියේම ඔහුගේ ප්‍රධාන ආරක්ෂකයා මග අවුරා සිටගති.

"නෙම්රොඩ් කුමරුනි."

"පසුව! මා හදිසියෙන්."

"කුමරුනි, අපව වටකරලා.!"

"වට කරලා?කවුරුද?"

"නුබියානුවන් දහස් ගණනක්."

"නුඹ විකාර දොඩවනවා." කුමරා කීය. "පියැන්කිගේ හමුදාව හෙනෙන් නෙසට් වෙත ගමන් කරනවා."

"නැහැ කුමරුනි. පාරාවෝ මෙහි, ඔහුගේ හමුදාව සමග."

වෙව්ලා ගිය නෙම්රොඩ්; ආරක්ෂක තාප්පයේ, බැලුම් කුළුනේ ඉහළටම නැංගේය.

ඔහු දුටු දෙයින් දැඩි භීතියට පත්විය. උතුරේ ජනතාව 'කොණ්ඩ කාරයින්' හා 'පිළිස්සුන මුහුණු' යනුවෙන් හඳුන්වන මිනිස්සු කලබලයකින් තොරව සන්සුන්ව කමුන් වෙත එමින් සිටියහ. එහි මුලින්ම සිටියේ කළු පාරාවෝය. දිළිසෙන කේශර ඇති, අත්‍යලංකාර අශ්වයකුගේ පිට නැගී

ආයේ ඔහුය! දීප්තිමත් කළු සම හා කැළැල් සහිත කම්මුල් ඇති දකුණේ සොල්දාදුවෝ, කන්වල කුඩා රන් මුදු පැළඳ සිටියහ. හිස ඉදිරිපස මුඩුකර සිටි ඔවුන්ගේ කෙස් කොටය. කැරළි සහිතය. ඔවුහු රතු පටියක් ඇල්ලූ කෙටිසාය ඇඳ සිටියහ. ඔවුන් අපරාජිත බවක් පෙනිණි. සුදු පැහැති සිවුරු, වර්ණවත් පබළු මාල සහ රතු බොරු කොණ්ඩා දමූ නිලධාරීන් හඳුනාගැනීම පහසු විය.

''කුමරුනි, අති විශාල සංඛ්‍යාවක්, අති විශාල!'' හමුදා ප්‍රධානියා කෑ ගැසීය.

භීතියෙන් මුසපත්ව සිටියද නෙම්රොඩ් සන්සුන්ව සිටින්නට තැත් කළේය. ''බිය නොවනු. අපගේ ආරක්ෂක තාප්ප ශක්තිමත්.''

''කුමරුනි. මිනිසුන් පවසනවා නුබියානුවන් තමාට හසුවන සතුරන්ගේ බඩවැල් එළියට ඇද ඔවුන් කිඹුලන්ට දෙන බව. පහර දෙන විට ඔවුන්, ලේ වැස්සක් වහින බවයි පැවසෙන්නේ... ඔවුන්...''

''නවතනු! නවතනු! සියලුම හටයින් නියමිත ස්ථාන වලට ගොස් නගරය ආරක්ෂා කරගත යුතුයි. එය තමා සතු වටිනාම වස්තුව ලෙස සලකාගෙන. අපි දකුණු හමුදාව ආපසු හරවා යවමු.''

එලෙසින්, පියැන්කි සතුරන්ට ඒත්තු ගැන්වූයේ තමා හමුදාව සමග ගොදුරු ගන්නා කුරුල්ලකු සේ හෙනෙන් නෙසට්ට ඉහළින් පියඹා යන බවයි. එහෙත්, ඔහු තම මුළු ශක්තිය යොදවා යටත් කර ගන්නට සූදානම්ව සිටියේ, තෝත් දෙවියන්ගේ නගරය වූ කමුන්ය. කළු පාරාවෝට නිසැකවම තෝත් දෙවියන්ගේ සහාය ලැබෙන බව කාගේත් පිලිගැනීම විය. චාරිත්‍රවලට මුල් තැන දුන් පියැන්කි, දැනුමට අධිපති තෝත්ගේ සහය නොමැතිව පියවරක් හෝ ඉදිරියට නොතැබීය. ටෙෆ්නැක් හෝ නෙම්රොඩ් මේ නුබියානුවාගේ පෞරුෂය වටහාගෙන නොතිබිණි. ඔහුගේ විශිෂ්ට බලය අමතක කළ ඔවුහු, ඒ උදාර පුරුෂයා සාමාන්‍ය ආක්‍රමණිකයකුගේ තත්ත්වයට පහත් කොට සැලකූහ.

එහෙත්, එය පසුතැවිල්ලට වේලාව නොවීය. නෙම්රොඩ් තම නගරය ආරක්ෂා කරගත යුතුය. ඔහු එය කරනු ඇත. ඔහුගේ නගරයේ ආරක්ෂක බැමිද හෙනෙන් නෙසට්හි තරමටම ශක්තිමත්ය.

✸

තම හටයින් තරම්වත් හොඳින් සැරසී නොසිටි ලැමසෙක්නි, රැවුල බෑමට හෝ කරදර වී නැත. ඔහු දිගු වේලාවක් ආරක්ෂක තාප්පයේ කොටසක් දෙස ඇසිපිය නොහෙළා බලා සිටියේය.

"ඔබ සිතන්නේ අප එතැනින් පහර දිය යුතු බවද?" පියැත්කි ඇසීය.

"නැහැ. උතුමාණෙනි. කිසි ලෙසකින්වත් නැහැ. එයයි නෙම්රොඩ් කඩා දැමූ කොටස, ඔබේ පළමු හමුදා කණ්ඩය උගුලක හසුකරන මුවාවෙන්. මට විශ්වාසයි ඔහු ඒ සැලසුම බිඳ වැටුණු පසුව, ඒ කොටස වඩාත් ශක්තිමත්ව ගොඩ නගා ඇති බව."

"ඉතින් කුමක්ද ඔබේ යෝජනාව?"

"මෙය මගේ සැලසුම වුණානම්, මා සියලු පැති වලින් පහර දෙනවා. ඒත් මෙය ජයග්‍රහණයේ කන්ද මෙන් කුඩා බලකොටුවක් නොවෙයි. බලන්න ඒ තාප්ප කොතරම් උසද? ශක්තිමත් ද කියා.... අපගේ සියලු හට හමුදා කමුත් වෙත කඩා වැදීම විනාශය ගෙනේවි. එය ස්ථිරයි. ආරක්ෂක තාප්පයට ළං වීමට හෝ පෙර අපගේ හටයින් විශාල ගණනකට දිවි අහිමි වේවි. උතුමාණෙනි, අවංකවම පවසන්නේ, මා සටනට සූදානම්. ඒත් කුමටද මිය යන්නේ, වීරත්වය තරමටම මෝඩකම මතුවන තැනකදී?"

"වෙනත් මඟක් නැතිද?"

ලැමසෙක්නි කණගාටුවෙන් හිස දෙපසට වැනීය. පෝර්මාට,තම සගයාගේ පසුබෑමෙන් වාසි ගෙන, තම විශිෂ්ටත්වය පෙන්වමින්, පියැත්කිගේ විශ්වාසය දිනා ඔහු සතුටු කිරීමේ හැකියාව තිබුණද, ඔහු තුළ ඉදිරිය පිළිබඳ කිසිදු අදහසක් නොවීය. හටයින් සංඛ්‍යාව ඉතා ඉහළ වුවත්, කමුත් යටත් කර ගැනීමට නුබියානුවන්ට හැකියාවක් නැත. හැකි උපරිම ශක්තිය යොදා සටන් කළද එය කෙසේ කළ හැකි වේද?

"කඳවුරු තනන්න." පියැත්කි අණ කළේය.

ලැමසෙක්නි පුද්ගලිකවම ඒ කාර්යය අධීක්ෂණය කළේය. දූලි මැකෙන සේ පොළොව තෙත් කළ ඔවුහු, විවිධ ප්‍රමාණවල කුඩාරම් තැනූහ. රාජකීය යුවල සඳහා වූ කාමර ගණනාවක් සහිත විශාලම කුඩාරමේ සිට කණිෂ්ඨ නිලධාරීන් සඳහා වන කුඩා කුඩාරම් දක්වා!

අශ්වයින්, බූරුවන් හා ගවයින්ට ආහාර සපයන ලදී. බඩු බෝට්ටු වල ගෙනෙන ලද අශ්ව රථ සවිකරන්නට යෙදිනි. වෙදැදුරෝ රෝගීන් බලාගත්හ. කවුරුත් දාදු ක්‍රීඩාවේ යෙදෙමින්, හඬ නගා කතා කරමින් හෙට උදාවන ලේ ගලන යුද්ධය අමතක කරන්නට උත්සාහ කළහ.

අබිලා රැජින කාර්යශූරය. ඇය රාජකීය කුඩාරම තුළ පිඟන් කෝප්ප

තැන්පත් කළාය. කුඩා සුවඳ වතුර කුප්පි,බැටළු හිස් හැඩැති මූඩි සහ බඳුන්, නෙළුමක හැඩගත් කුඩා අවාන්, ආලේපන කුප්පි සහිත පෙට්ටි පිළිවෙලට තැබුවාය. සේවිකාවෝ පෙරහැරකින්, රිදී රාක්ක සහ රිදී දිසි රැගෙන ආවෝය.

කාමරයට ඇතුල් වූ පියැන්කි පුදුමයට පත්විය. ''අබිලා, ඔබ නපාටාවේ අපගේ මාලිගය නැවත මෙහි ගොඩනගා තිබෙනවා.''

''කාමර කීපයක් පමණක් එතරම් හොඳ තත්වයේ නැහැ. එහෙත්, අසාධාරණයට එරෙහිව කරන මේ සටනට, අප වනචාරීන් බවට පත් කිරීමට ඉඩ නොදිය යුතුයි.'' ඇය පියැන්කිගේ හිස තම මෘදු දෑතින් ගත්තාය. ''ඔබ කණගාටුවෙන්. කුමක්ද මට කළ හැක්කේ ඔබ වෙනුවෙන්?''

''කමුන් යටත් කරගත නොහැකි හැඩයි. ලැමසෙක්නි පවා එය අත්හැර දමන්න සූදානම්.''

''ඒත් ඔබ එසේ නෙවෙයි.''

''අප පහර දෙන හැම වරකම අපගේ හටයින් විශාල වශයෙන් මියයාවි. කමුන් යටත් කර ගැනීමට නම් අපට සිදුවෙනවා වෙනත් විසඳුමක් සොයාගන්නට.''

''ඔබට ජයගත නොහැකි බාධාවක් තිබේනම් ඔබ එය සහමුලින්ම බිඳ දැමිය යුතුයි.

''ඔබ පවසන්නේ... ආරක්ෂක ප්‍රාකාර තවදුරටත් එහි නොතිබුණි නම්... ඔව්... ඔබ නිවැරදියි.''

# 49

නුබියානු වඩුවෝ දිවා රෑ නොබලා වෙහෙස වී ගල් දුනු සවිකළහ. පාබල හටයෝ රෝද මතින් එහා මෙහා ගෙන යා හැකි කුලුනු සකස් කළහ. බූරුවන් ගෙනයන්නෝ එම සතුන්ගේ පිට මත විශාල පස්කුඩා පැටවූහ.

ලැමසෙක්නි පාම් ගසකට හේත්තු වී ඉඳගෙන උන්නේය. පැපිරස් නටුවක් සපමින් ඔහු මේ කාර්යයන් දෙස විමසිල්ලෙන් බලා සිටියේය.

''ආත්ම විශ්වාසය ගොඩනගන්න.'' පෝර්මා අවවාද කළේය. ''මේ පියැන්කිගේ අණ.''

''බලකොටුවක් අල්ලාගන්න බූරුවන් යොදාගෙන? ඔබට එය විශ්වාස කළ හැකිද?''

''ඔබට ගල්දුනු අමතකයි.''

''මා දන්නේ නැහැ ඒවා යොදාගන්නේ කෙසේද කියා.''

''නපාටාවෙන් පැමිණි සොල්දාදුවන් ඒ සියලු යුද යන්ත්‍ර ක්‍රියා කරවීමේ විශිෂ්ටයින්." පෝර්මා කීය.

"ඒවා ගැලපෙන්නේ සතුරන් බියගැන්වීමට පමණයි, අන් කිසිවකට නොවෙයි."

''ඔබ නිහඬව සිටින්නේ ඔබේ හටයින් කිසි විටක ඉදිරියෙන් නොයන නිසයි.''

ලැමසෙක්නි සිරියානු වලසකු මෙන් ගෙරවිය.

✸

බලකොටුවේ අණදෙන නිලධාරියා සමග බැලුම් කුළුන මුදුනේ රැඳී සිටි නෙම්රොඩ්, නුබියානුවන්ගේ සූදානම, විමසිල්ලෙන් බලා සිටියේය. ඔහුට ඒ කිසිවක් තේරුම්ගත නොහැකි විය.

''කිමද ඔවුන් පහර නොදෙන්නේ?'' ඔහු ඇසීය.

අණදෙන නිලධාරියාට ද ඒ තේරුම්ගත නොහැකිය. ''ඇත්තටම පුදුමයක්. නුබියානු රණවිරුවන්ගේ හපන්කම් බොහොම ප්‍රසිද්ධයි. එහෙත්...''

''කුමක්ද ඒ අමුතු යන්ත්‍රය?''

''මා කිසිදා එවැන්නක් දැක නැහැ කුමරුනි. මගේ අදහසේ හැටියට... අපට පහර දීමට ක්‍රමයක් නොමැතිව, ඔවුන් අප බිය ගන්වන්න සූදානම් වෙනවා.''

මේ මොහොතේ, ගල් දුන්නකින් ගිලිහී ඉගිලී ආ අති විශාල ගලක්, පුළුස්සා නැති ගලින් බඳින ලද බිත්තිය සුනු විසුනු කොට, ලිබියානුවන් දෙදෙනකු මරා දමා, තවත් දස දෙනෙකුට තුවාල සිදු කළේය. ඒ අති දක්ෂ නුබියානුවන් තම පළමු ඉලක්කයෙන්ම තාප්පයට ඇති දුර නිවැරදිව මැන අනුමාන කර තිබිණි. වහ වහා ක්‍රියාත්මක වූ ගල් දුනු විස්සක් ආරක්ෂක ප්‍රාකාරයට දැඩිහානි පැමිණවීය.

පියැන්කි, බූරුවන් පදවන්නන්ට ඉදිරියට යන ලෙස අණ කළේය. ඒ පසුපස පස් පිරවූ කරත්ත අදින ගවයින් යවන ලදී. කුලුන මත නැගි පෝර්මාගේ දුනුවායෝ ඒ සතුන්ට හා පස් බැම්මට ආරක්ෂාව සැපයූහ. පෝර්මාගේ දුනුවායන් කෙතරම් වේගවත් වීද යත් ලිබියානුවන්ට දුනුදිය අදින්නට හෝ වේලාවක් නොලැබිණි. ගල් දුනු හා ඊතල ඔවුන් ඉලක්ක කොට තිබූ හෙයින් බොහෝ ආරක්ෂකයෝ ඊට ගොදුරු වූහ. මේ අතරේ ආරක්ෂක තාප්පයෙන් හතරෙන් තුනක් උසට පස්බැම්ම තනන්නට නුබියානුවෝ සමත් වූහ.

කමුන්හි තාප්ප තවදුරටත් නොබිඳිය හැකි වූයේ නොවේ.

✸

එකම හටයෙකුට හෝ හානියක් නොමැතිව පෝර්මාගේ හටයෝ ආරක්ෂක තාප්පයට නැග ගත්හ. පියැන්කි ඔවුන් හා එක් වූ විට, නගරයේ ආරක්ෂක වළල්ල සම්පූර්ණයෙන්ම විනාශ කර නැති බව පෙනිණි. දිවි බේරාගත්තවුන් ඒ වන විටත් මාලිගය, ආයුධ ගබඩාව, බැරැක්ක සහ ධාන්‍යාගාර අත්පත් කරගෙන සිටියහ. එහෙත් ඒ වන විටත් දරාගත නොහැකි දුගඳක් අවට පැතිරෙමින් තිබුණි. එහි පටු වීදි සහ අහුමුළුවල ගොඩගසන ලද මළමිනීවෙතින් දුගඳ හමන්නට විය. ඉක්මනින්ම කමුන්හි කිසිවෙකුට හුස්ම ගැනීමට බැරිවනු නියතය.

ලැමසෙක්නිගේ ඉවසීමේ සීමාව ඉක්ම යමින් තිබිණි. ''උතුමාණෙනි, මට මේ රාජකාරිය පවරන්න. මගේ මිනිසුන්ට මේ බියගුල්ලන් විනාශ කිරීමට වැඩි වේලාවක් ගතවන්නේ නැහැ. ''

''ඔබ වැරදියි ලැමසෙක්නි. ඔවුන් බිහිසුණු ලෙස සටන් වැදී දිවි බේරා ගනීවි. කුමටද අප අපේ මිනිසුන්ගේ ජීවිත අවදානමට ලක් කරන්නේ?''

''එසේ නම් කුමක් ද ඔබේ අණ උතුමාණෙනි?''

''අප මඳක් නැවතී බලා සිටිමු. අපට පක්ෂපාතීව සිටි නෙම්රොඩ්ගේ ප්‍රතිචාරය කෙසේදැයි බලන්නට.''

✸

''අප සියලු දෙනාම මියයාවි.'' බලකොටුවේ අණදෙන නිලධාරී පැවසීය. ''අපට මෙසේ සිටිය හැකියි මාසයක්, දෙකක්... ඉන්පසුව?''

සියලු නිලධාරීන් ඔහු හා එකඟ වූහ. නගරයේ උසස් නිලතල දරන්නන් කළු පාරාවෝගේ දඬුවම කෙසේ වේදැයි බියෙන් වැලපෙන්නට වූහ.

''අප ඔවුනට එරෙහිව නැගී සිටිය යුතුයි.'' හදිසියේම මහලු බවට පත්වූ සෙයක් පෙන්වන නෙම්රොඩ් කීය. ''වඩාත් සුදුසු වන්නේ අප පහරට පහර එල්ල කිරීමයි. පියැන්කි සිතනවා දැනටමත් ඔහු ජයගෙන ඇති බව. ඔහුගේ තීරණය වැරදි බව අප පෙන්විය යුතුයි.''

''කමුන් වටකර හමාරයි!'' අණදෙන නිලධාරී විරෝධය පෑවේය. ''අපට අහිමිවුණා අපේ භටයින්ගෙන් අඩක්ම. ඒත්, පියැන්කිගේ හමුදාවට කිසිදු හානියක් නැහැ. අප ප්‍රතිප්‍රහාර දුන්නොත්, ඒ අප සියල්ලන්ගේම අවසානයයි. ඔවුන් අප සුනු විසුනු කර දමාවි.''

''එසේනම්, ඔබේ යෝජනාව?''

''අප සාකච්ඡා කළ යුතුයි,කුමරුනි. '' නිලධාරියා හිස නමා වැටෙද්දී කීවේය.

''ඔබ පවසන්නේ, යටත්වීමද?''

''එයයි හොඳම විසඳුම.''

''තා උමතුවෙන්. පියැන්කි අප සමූල ඝාතනය කරාවි.''

එවිට නගරයේ විසූ ප්‍රභූවරයෙක් කතා කළේය. "ඔබ ඔහුට යටත් කුමරෙක් නෙම්රොඩ්. පක්ෂපාතීව සිටි ඔබ ඔහුට ද්‍රෝහි වුණා. පාරාවෝ දොස් තබන්නේ ඔබට මිස මේ නගරයට නොවෙයි. ඔහු එහි වැසියන්ට දඬුවම් දෙන්නේ නැහැ, ඔවුන් ඔහුගේ අණට හිස නවනවා නම්."

"මමයි කුමරා කමුන්හි. තායි මට කීකරු විය යුතු."

"අණදෙන නිලධාරි නිවැරදියි. " මිනිසා කීය. "අප සාකච්ඡා කළ යුතුයි."

✸

කමුන් නගරයේ ඉහළම ධනවත්තු, නෙම්රොඩ්ගේ මාලිගයට දිවෙන ප්‍රධාන දොරටුවෙන් පිටතට පැමිණියහ. මේ රාජ දූතයින් කොණ්ඩා ගොතා,යටි රැවුල් උල් හැඩයට කපා සිටි අතර මල් මෝස්තර යෙදූ සිවුරු ඇඳ සිටියහ. වහාම,නුබියානුවෝ දුනු අතට ගත්හ.

"නවතිනු!" පෝර්මා අණ කළේය. "ඔවුන් නිරායුධයි."

රත්රන්, මැණික් හා මිල අධික රෙදි පුරවන ලද පෙට්ටි ඔසවාගත් ඔවුහු,ලිබියානු මළසිරුරු ගොඩගසන ලද පවුපාර හරහා ගොස්, ලැමසෙක්නි නැවතී සිටි ස්ථානයේ රහස් දොරටුව වෙත ගමන් කළහ.

වඩාත්ම මහලු රාජ දූතයා කතා කළේය. "ඔබ අපට ඉඩ දෙනවාද මේ තිළිණ පාරාවෝගේ දෙපා මුල තබන්නට?"

"ඊට පෙර මා තොප පරීක්ෂා කළ යුතුයි."

රාජ දූතයෝ කිසිදු බාධාවකින් තොරව ඔහුට ඉඩ දුන්හ. ඉන්පසු ලැමසෙක්නි, ඔවුන් කඳවුර මධ්‍යයට යැවීය. එහි රන් ආලේපිත ලී සිහසුනේ අසුන්ගෙන සිටි රජුට, සේවිකාවන් දෙදෙනෙක් දෙපසින් හිඳ පවන් සැලූහ.

දූත පිරිසේ කථකයා, කළු පාරාවෝ ඉදිරියේ ආචාර දැක්විය. "උතුමාණෙනි, කමුන් නගරය පිළිගන්වන මේ තිළිණ භාරගනු මැනවි. මේ සියල්ල අප එක්වී එක්කළේ ඔබ පුදන්නටයි. අප නගරය දණින් වැටී ඔබට ආචාර දක්වනවා උතුමාණෙනි, ඔබේ කීර්තිය වඳිමින්, ඔබේ අනුකම්පාව යදිනවා උතුමාණෙනි."

"තොප එවන ලද්දේ නෙම්රොඩ් විසින්ද?"

"අපගේ තීරණයට කුමරු එකඟ වුණා, උතුමාණෙනි."

"කිමද ඔහු තොප සමග නොපැමිණියේ?"

"ඔබට බියෙන් උතුමාණනි... ඔහු..,"

"ඔහු නිවැරදියි." පියැන්කි ගර්ජනා කළේය. "ඔහු කවදාද මගෙන් උදුරාගත් මගේ මේ නගරයේ දොරටු විවෘත කරන්නේ.?"

"උතුමාණෙනි, නෙම්රොඩ් බියෙන් සිටින්නේ. මගේ ආයාචනය පිළිගන්නා ලෙසයි. ඔහුගේ ඉල්ලීම, උතුමාණනි."

"තොපගේ කුමරු කැරලිකරුවකු මිස අන් කිසිවකු නොවෙයි. ඊටත් වඩා ඔහු ද්‍රෝහියෙක්. ඔහුට අයිති නැති අනුකම්පාවක් ඔහු වෙත ලබා දෙන්නට තරම් කිසිම රජෙක් දුර්වල නොවේවි."

කථිකයා බියවිය. එහෙත් ඔහු තම නගරය රැක ගන්නට උත්සාහ කළේය. "නෙම්රොඩ්ගේ වරද ඉතා භයානකයි උතුමාණනි, අප එය පිළිකුල් කරනවා. එහෙත්, උතුමාණෙනි, ඔබගේ සාධාරණ කෝපය හේතුවෙන් ඇතිවන තත්ත්වය තුළ කමුන් වේදනා විඳිය යුතුද උතුමාණෙනි? නගර තාප්ප විනාශ කර තිබෙනවා. හෙට කුමක් වේදැයි කිසිවෙක් දන්නේ නැහැ."

කළු පාරාවෝ නැඟී සිටියේය. "නෙම්රොඩ් හා කමුන් මා ආට් නීතිය බිඳ දමා තිබෙනවා. එසේ ම මට දුන් ප්‍රතිඥාව බිඳ දමා තිබෙනවා. එවන් ද්‍රෝහියකු දරුණුම දඬුවම් ලැබිය යුතුයි."

# 50

නෙම්රොඩ්ගේ අනියම් බිරිඳ ඉතා දුර්ලභ තෙල් වර්ගයක් ආලේප කොට ඔහුගේ පිට සම්බාහනය කළද, සන්සුන් වූයේ ඔහු නොවේ. ඒ සුමුදු ස්පර්ශයෙන් කිසිදු සාර්ථක ප්‍රතිඵලයක් නොලැබුණි. නෙම්රොඩ් ඇය පසෙකට තල්ලු කළේය.

ඔහුගේ නීත්‍යානුකූල බිරිඳ නෙසෙටා, කාමරයේ දොරකඩ සිටින බව ඔහු දුටුවේ එවිටයි.

''කුමක්ද ඔබට අවශ්‍ය?'' ඔහු ඇසීය.

''මා ඔබේ ආදරයට බාධාවක් නම් පසුව පැමිණෙන්නම්.''

''පිටව යනු'' ඔහු තම අනියම් බිරිඳට කීවේය.

තරුණිය කෝපයෙන් ඉවතට ගියාය.

''අප සියල්ලන්ම මියයාවි.'' කුමරා කීවේය. ''පියැන්කි ළඟ අනුකම්පාව නැහැ, මා හෝ නගර වැසියන් ගැන. මට කණගාටුයි සොඳුරිය. ඔබට කිසිදිනක ටෙෆ්නැක්ගේ රාජ්‍යයේ ප්‍රධාන පෙළේ කාන්තාවක් විය නොහැකියි.''

''කළු පාරාවෝගේ කෝපයෙන් අපට කිසිදු ගැලවීමක් නැති නිසා, ඔබ මට අවසර දෙනවද අවසන් වරට සාකච්ඡා කරන්නට, එක්වරක්?''

නෙම්රොඩ් විස්මයට පත්විය. ''කුමන සාකච්ඡාද?''

''මා ඔබේ බිරිඳ නිසා, මට හැකියි ගැහැනුන් සහ ළමයින් සමග එහි යන්නට පෙරහැරකින්. මා පියැන්කිගේ අනුකම්පාව යදින්නම්.''

''ඔබට ජයගත නොහැකියි.''

''එහෙත්, අවම වශයෙන් මා ඊට උත්සාහ කර තිබේවි.''

✸

ලැමසෙක්නි; අවිශ්වාසයෙන්, තමා පසුකර යන පෙරහැර දෙස බලා සිටියේය. එහි ඉදිරියෙන්ම ගමන් කළේ ඉතා සරලව සැරසුන, පළල්

නළලක් ඇති, අහංකාර ගැහැනියකි. ලැමසෙක්නි ඇය පරීක්ෂා කරන්නට බිය විය. එහෙත් ඇය යම් ආකාරයක අනතුරක සේයාවක් පෙන්වූවහොත් වහා ඊයක් විදින ලෙස ඔහු පෝර්මාට දන්විය. නෙසෙටා පසුපසින් ගැහැනු සහ ළමයින් පනහකට වැඩි පිරිසක් ගමන් ගත්හ. සමහරු බියෙන්ද, තවත් අය සැකයෙන් ද ඒ නුබියානුවන් දෙස බලා සිටියහ. කුඩා දූරියක් පාබල හමුදා භටයෙකුගේ පළිහ අල්ලා බැලූ අතර ඔහු ඇය ඔසවාගෙන පෙරහැරට එක්විය. ඔහුගේ මුවින් ඈත නුබියාවේ කතන්දරයක් පිටවිය.

මේ අපූරු පෙරහැර පිළිගන්නා ලද්දේ අබිලා රැජින විසිනි.

නෙසෙටා ඇය ඉදිරිපිට දණ ගැසුවාය. "මා නෙම්රොඩ්ගේ බිරිඳ උත්තමාවියනි. මා පැමිණියේ අපගේ දිවි බේරාදෙන ලෙස ඔබෙන් ඉල්ලා සිටින්නයි."

"නැගී සිටින්න."

"මට පාරාවෝ සමග කතා කිරීමට අවසන දෙන තෙක් බැහැ උත්තමාවියනි."

"ඔබ සිතනවාද ඔහු ඔබට අනුකම්පාව දක්වාවි කියා...?"

"ඊජිප්තු පාරාවෝ රට පාලනය කරන්නේ තම හදවතට අනුවයි, උත්තමාවියනි."

"මා හා එන්න."

අබිලා ඇය පාරාවෝගේ කුඩාරම වෙත කැඳවාගෙන ගියාය. ගව කුර හැඩැති පාද සහිත පුටුවක වාඩි වී සිටි පාරාවෝ, පිපාසය සංසිඳුවීමට කිරි කෝප්පයක් බොමින් සිටියේය. තම අමුත්තාගේ උසස් බව ඔහුගේ පුදුමයට හේතු විය. "උතුමාණන් වහන්ස, " ඇය කීවාය. "මගේ නම නෙසෙටා. මා නෙම්රොඩ්ට ආදරය කළ නිසා ඔහු හා විවාහ වීමට සිදුවීම මගේ අවාසනාව උතුමනි. ඔහු මා කොතරම් දුකට පත් කළාද කිවහොත්, මට මගේ දිවි එපාවුණා. අද මා ආයාචනා කරන්නේ මගේ නගරය හා එහි වැසියන් වෙනුවෙන්. ඔවුන් ද්‍රෝහියෙකුගේ හස්තයට සිරවී සිටිනවා. ඔවුන්ට දඬුවම් දීම අසාධාරණයි උතුමාණනි. නෙම්රොඩ් පමණයි, ඔහු තනිවමයි ඔහු කළ දේට පිළිතුරු දිය යුතු ව න්නේ."

"එය සත්‍යයක් නම් ඔහු මා ඉදිරියට එවිය යුතුයි" පියැන්කි කීය.

✸

නෙම්රොඩ් තම බිරිඳට හොඳින් සවන්දුනි. ඇයට වදනකින් හෝ බාධා කිරීමට ඔහු තුළ ශක්තියක් නොවීය. ඇය ඔහුට මේ පුද කරන්නේ මරණ දඬුවම මිස අන් කවරක්ද?

පියැන්කි ඉදිරිපිට පෙනී සිටීම දිවි නසාගැනීම හා සමානය. මුහුණේ සිනාවක ලකුණක් හෝ නොමැතිව, නෙසෙටා කුමරාගේ සිත දිරිගන්වන්නට තැත් කළාය. දහස් ගණනකගේ දිවි බේරා ගනිමින්, තම නගරය මේ භයංකර වේදනාවෙන් මුදා ගනිමින්, තම ජනතාව වෙනුවෙන් යම්කිසි කැපවීමක් කරමින් ඔහු ඒ ගමන යා යුතුය.

නෙම්රොඩ්ට තම වගකීම් ගැන සිතන්නට ඉඩ දුන් නෙසෙටා ඉවතට ගියාය.

ඔහු තම නගරයට ආදරය කළ බව සත්‍යයකි. එහෙත් ඔහු ඊට වඩා තමාටම ආදරය කළේය. ඒ අනුව ඔහුට කළ හැකිව තිබුණේ එක දෙයකි. මෙතැනින් පැනගොස් නැවත ටෙෆ්නැක් හා එක්විය යුතුය. ආරක්ෂකයින්ගේ සේවා මුරය වෙනස් වන්නේ හිරු උදාවට මොහොතකට පෙරය. ඒ කුඩා දොරටුවක් අසල, ඔහුට පැනයාම සඳහා මිනිත්තු කීපයක ඉඩක් තිබෙනු ඇත. ගැමියෙකු ලෙස වෙස් වලා ගන්නා නෙම්රොඩ්, ධාන්‍යාගාර හා පුහුණු කඳවුරු අතරින් ගමන් කරනු ඇත. සතුරන් අතරින් ඇවිද යනු ඇත. එය අවදානම් ක්‍රියාවක් බව සත්‍යයකි. එහෙත්, දුන් ඔහුට නැතිවෙන්ට දෙයක් නැත.

ඔහු තම කාමරයේ දොර විවෘත කළේය. ඔහුගේ බිරිඳ හා ආරක්ෂකයින් කීප දෙනෙක් එතැන රැඳී සිටියහ.

''ප්‍රභුවරුන්, නිලධාරීන් හා ජනතාව යන සියලු දෙනාගේ එකඟත්වයට අනුව නෙම්රොඩ් කුමරු පාරාවෝ ඉදිරියට යා යුතුයි.'' නෙසෙටා කීවාය.

✸

බිය! සිරුර වෙව්ලා හරින බිය හේතුවෙන් සිරුරේ හැම රෝම කූපයකින්ම ගලා යන දහඩිය හේතුවෙන්, ඔහුගේ චාරිත්‍රානුකූල සිවුර ඇඟටම ඇලී තිබිණි. එවැනි බියකට එරෙහි නෙම්රොඩ්ගේ කැමැත්ත බල රහිත විය. ඔහුට සිහිසුන්විය හැකිනම්! ඒ ශූන්‍යත්වය ඔහු ගිලගන්නේ නම්? එහෙත්, ඔහු ඉදිරියට ගියේය. වෙරි වූ අසරණයෙකු මෙන් නුබියානු කඳවුර තුළට තල්ලු වී ගියේය. දහස් ගණනක් වූ නුබියානුවන්ගේ වෛරී දෑස් වලට ලක්වෙමින් ඉදිරියට ගියේය.

නෙම්රොඩ්, සියලු ශරීරාංග සහිතව තමා හමුවට එවිය යුතුය යන පාරාවෝගේ විධානය ලැමසෙක්නිට ලැබී නොතිබෙන්නට, ඔහු ඒ ද්‍රෝහියාගේ හිස තම ලී අතින් කුඩුකර දමනු ඒකාන්තය. එහෙත්,පියැන්කි තම කෝපය හදවතේ ම රඳවාගෙන ඉවසා සිටින්නේ මන්දැයි ලැමසෙක්නි ද වටහාගත යුතුය. සමහර විට රජුට අවශ්‍යව ඇත්තේ, වරදකරුවෙකු වධයට පත්කිරීම තම සොල්දාදුවන්ට පෙන්වීමට විය හැකිය. මිනිසෙකුගේ වචනය යනු ශුද්ධ වූ දෙයක් බව නෙම්රොඩ්ට සිහිකර දීමට ඔහු සිතනවා ඇත.

පෝර්මා, කමුත්හි කුමරුට ඇතුල්වීම සඳහා කුඩාරමේ තිරපට එසවීය. එහෙත් ඔහු වෙව්ලා යමින් දොරකඩ රැඳුණේය.

"ඇතුල්වනු!" ලැමසෙක්නි ඔහු තල්ලු කළේය.

නෙම්රොඩ්, මේ බියකරු සිහිනය අතුරුදහන් වේවා! යන සිතුවිල්ලෙන් දෑස වසාගති. එහෙත්,නැවත ඒ විවර වන විට කළු පාරාවෝ ඔහු ඉදිරියේ හිටගෙන සිටියේය. ඒ කළු පැහැති අයෝමය මිනිසා ඔහු ඉදිරියේය.

"වෙනදා මෙන්ම ශෝභනයි නෙම්රොඩ්! නුඹේ කීර්තිය නුඹට සාධාරණය ඉටුකරාවි!"

"උතුමාණෙනි, ඔබ පිළිගන්නවාද, යම් අවස්ථාවක හදවත යනු තම අයිතිකරු වරදට පොළඹවන සුක්කානමකැයි කියා, එය දෙවියන් අත තිබෙන නිසා? එයයි අප කවුරුද යන්නත්, අපගේ දෛවයත් තීරණය කරන්නේ උතුමාණෙනි. මගේ හදවත මං මුළා කොට මා වරදට පොළඹවූවා. ඔබට ස්තූති වේවා උතුමාණෙනි, මා මගේ වරද වටහාගෙන ඔබේ සමාව යදිමින් මෙහි පැමිණ සිටිනවා."

පියැන්කි තම සිරිය අතට ගෙන එහි මුවහත බැලීය. "නුඹ නිවැරදියි නෙම්රොඩ්. හදවත අදහස් ලබාදෙයි. එය කල්පනා කරයි. අත් පා වලට විධාන දෙයි. දිවට අණ දෙමින් දැනුම ලබා ගන්නට ඉඩ සලසයි. 'ඔබ ජීවත් වන කාලය තුළ කැමැත්තට ඉඩ දෙන්න' පිටා හොටෙප් මුනිවරයා එසේ ලියා තැබුවා. "කිසිවක් පමණ ඉක්මවා නොකරන්න. එහෙත්, ඔබේ හදවතට සවන්දෙන කාලය අඩු නොකරන්න, මන්ද යත් මැවීමේ බලය'කා' මොහොතකට හෝ විනාශ වීමට අකමැති නිසාය." හදවත ශක්තිමත් හා බලවත් අයෙක් තමාගේ බඩගින්නට වහලකු වන්නේ නැහැ. මිනිසකුට හැකියි දෙවියන් ළං කර ගන්නට. දෙවියන්ගේ හඬ අසන්නට. ඔබ ඒ මිනිසාද නෙම්රොඩ්?"

''නැහැ, උතුමාණෙනි.''

''අපගේ මුතුන් මිත්තන් ලියා තැබුවා අපේ සතුරන් සිව් දෙනා වන්නේ, කෑදරකම, බිහිරි බව, නොසැලකිල්ල හා මුරණ්ඩුකම බව. ඒවා එකක් පසුපස එකක් ඔබව ගිලගත්තා. එසේ නොවෙද?''

''අද ඔබ පමණයි ජයග්‍රාහකයා, උතුමාණෙනි මගේ පැතුම ඔබේ සේවකයා වීමයි, නැවතත්.''

''ජීවිතය දාම්ලෑල්ලක් වැනියි, සුදු හා කළු කොටු වලින් සැදුනු. එක් වර්ණයක් අපට වාසිදායකයි. අනෙක නැහැ. ඊළඟට ළඟා වනවා මරණය. වැදගත් වන්නේ මරණය නෙවෙයි. හදිසියේම මරණය වැළඳගන්නා විට අපේ මානසික තත්ත්වයයි. තා මරණයට සූදානම්ද නෙමරොඩ්.?''

කමුන් කුමරු දනින් වැටුණි. ඔහුගේ දෑස් එල්ල වී තිබුණේ සිරියෙහි තලය දෙසටයි. ''නැහැ, උතුමාණෙනි. මා මරණයට බියයි. මා කොතරම් වයසට ගියත් ජීවත් වීමට ඇති ආශාව අවසන් නොවේවි, උතුමාණෙනි.''

''ද්‍රෝහියෙකුට තුමක්ද ඇත්තේ මා වෙත පුදකරන්නට?''

''කමුන්හි සියලු දේ ඔබ සතුයි, උතුමාණෙනි, රන්, රිදී, මැණික්, නිල්කැට, ලෝකඩ යනාදී සියල්ල. අප ඔබට නොකඩවාම බදු ගෙවනවා. කිසිදු ප්‍රශ්න විමසීමකින් තොරව සියල්ලන් ඔබට අවනත වෙනවා. විශේෂයෙන් මම.''

''මා දූනටමත් තගෙන් පසු කමුන්හි පාලකයා තෝරා අවසන්.''

කුමරු සෙමින් නැගිට්ටේය. සිරිය ඔහු මත්කළ සැටියකි. ඔහුට අවශ්‍ය වූයේ කොතරම් බියෙන් සිටියද, සියල්ල අමතක කර, දෙපයින් හිටගෙන ඊට මුහුණ දීමටයි. ඒ බියෙන් වෙව්ලා යමින් ඔහු මෙසේ ඇසීය. ''ඒ කවුද උතුමාණෙනි?''

''තා... නෙම්රොඩ්. කමුන් වඩාත් හොඳින් පාලනය කරන අයුරු තට වඩා හොඳින් දන්නේ කවරෙක්ද?''

# 51

අනාගතයේදී රාජකීය ලේඛනාගාරයේ සුරක්ෂිතව තැබෙන තම වාර්තාව සකස් කරන කුල් හෙඩ්, බුම්මාගත් ගමන්ය.

''කිමද ඔබ මෙතරම් අමනාපයෙන් කුල්හෙඩ්?''

පියැන්කි ඇසීය.

''ඔබේ තීරණ විවේචනය කිරීම ගැන කෝප නොවන්න උතුමාණෙනි. මා නිතිපතාම විශ්වාසයෙන් ඔබට සේවය කළා. ඉදිරියටත් එසේමයි.''

''මඳක් හිටින්න. මා සිතන්නේ... ඔබේ බලාපොරොත්තුව මගේ මුළු යුද හමුදාව ඉදිරිපිට නෙම්රොඩ් වදයට පත්කිරීම... එසේ නොවෙද මා මිත්‍ර කුල්හෙඩ්...?''

''මා කෲරත්වයට කැමති නැහැ උතුමාණෙනි.'' ලේකම්වරයා කීය. ''එහෙත් ඔබ තේරුම්ගත යුතුයි ද්‍රෝහියෙකු එම තනතුරේම රැඳවීම බොහෝ අයගේ විරෝධයට හේතුවන බව.''

''ජනතාව තවම දන්නේ නැහැ මගේ තීරණය. රැජින සූදානම්ද?''

''ඈ ඔබ එනතුරු බලා සිටිනවා, උතුමාණෙනි.''

✸

සිහසුනේ ඉඳගත් පියැන්කි සහ අබිලා, තමන් දෙසට එන කමුත්හි කුමරු නෙම්රොඩ් සහ ඔහුගේ බිරිඳ නෙසෙටා දෙස බලා සිටියහ. නෙසෙටාගේ දකුණු අතේ රනින් කළ වළල්ලක්ද වම් අතේ නිල්කැට වලින් තනන ලද වළල්ලක්ද විය. ඒවා තනා තිබුණේ සංඥා කිරීමේදී සෙලවී හඬ නැගෙන ලෙසයි. ඒ තුළ වූ ලෝහ කැබලි මෘදු ලෙස සෙලවිනි. ඒ මොහොතේ එහි තිබූ භයංකර, විනාශකාරී හැඟීම ඒ සියුම් හඬින් පිසදා හැරෙන බවකි දනුණේ.

කමුත්හි ජනතාව, දැඩි තැති ගැන්මෙන් යුතුව, කළු පාරාවෝගේ

දෙසුමට සවන් දෙන බලාපොරොත්තුවෙන්, නුබියානු සොල්දාදුවන් ජේළියකට පිටුපසින් බලා සිටියහ.

''මේ නගරය දැඩි වේදනාවට පත්වුණා, බරපතල තුවාල එහි ඇතිවුණා, නෙම්රොඩ්ගේ හැසිරීම හේතුවෙන්.'' පියැන්කි කීය. ''එහෙයින්ම ඒ තුවාල සුවපත් කොට, කමුන් සමෘද්ධිමත් කිරීම අයිති ඔහුටයි, මා යළි ස්ථාපිත කළ සාමයට ස්තුති වෙන්ට, නැවත කිසි විටෙක මාආට් නීතිය බිඳ නොදමන බවට දිවුරා සිටිමින්, මින් ඉදිරියට අවංකව සේවය කිරීමට නුඹට පොරොන්දු විය හැකිද, නෙම්රොඩ්? නුඹට මේ නගරයේ ස්වාමියා විය හැකිද?''

''එසේය උතුමාණනි. පාරාවෝගේ නාමයෙන් හා මගේ ජීවිතයේ නාමයෙන් මා පොරොන්දු වෙනවා.''

''නුඹ කර ඇති බරපතල වැරදි සිහියේ තබාගෙන, මේ නගරය තනිව පාලනය කිරීම නුසුදුසුයි. එහෙයින්, ඔබේ බිරිඳ විශේෂ නියෝජිතයෙකු ලෙස සිටිමින් ඔබ කරන සියලු දෑ මට වාර්තා කරනු ඇති. යම්කිසි විවාදාත්මක මොහොතකදී ඇගේ අදහසට මුල් තැන දිය යුතුයි. ඇය වැඩිහිටියන්ගේ කවුන්සිලයට නායකත්වය දේවි. නගරයේ ධනය පාලනය කරන්නේත්, පුද්ගල සුභසාධනයට වගකියන්නේත් ඒ සංවිධානයයි. නුඹ මෙතැන් සිට සියල්ල කළ යුත්තේ නගර වැසියන් වෙනුවෙනුයි.''

නෙසෙටාගේ මුහුණේ කිසිදු වෙනසක් ඇති නොවීය. පාරාවෝගේ රාජත්වයේ යෂ්ටියෙන් පහර කෑ කලෙක මෙන් නෙම්රොඩ් දෙපසට වැනෙන්ට විය.

''සන්සුන් වෙන්න.'' ඔහුගේ බිරිඳ සිහින් හඬින් කීවාය. ''අමතක නොකරන්න කමුන්හි කුමරා සෙස්සන්ට ආදර්ශවත් විය යුතු බව.''

පුරවැසියෝ ඔවුන් දන්නා ගීයකට මුල පිරූහ.

''ආලෝකයේ පුත්‍රයාණෙනි. ඔබේ කාර්යය කොතරම් අලංකාරද? ඔබ අපට සාමය හා සතුට ගෙනෙයි. ඔබ හරේ පළාත හා අපගේ නගරය ආරක්ෂා කරයි. එපමණක්ද? අද දවස අපට සතුට සමරන්නට ඉඩ දෙයි.''

කුල්හෙඩ් විමසිල්ලෙන් බලා සිටියදී; පූජකයෙක්, වෙදදුරු විසින් පාරිශුද්ධ යයි තීරණය කරන ලද ගවයකු චාරිත්‍රානුකූලව බිලිපූජාවට ලක්කළේය. උගේ ඉදිරි දකුණු ගාතය කපා, තම අත් ඒ රුධිරයෙන් පොඟවා, සෙක්මට් පූජකයෙකුට ඉව කිරීමට ඉඩ සැලසීය. එම පූජකයා,

සත්ත්වයා ඉතාමත් ශක්තිමත් බවත්, එම මාංශය අනුභව කරන සියල්ලන්ගේ 'කා' ට නිරෝගී ශක්තිය ලැබෙන බවත් පැවසීය.

සැනසිල්ලේ, නිදහසේ, සතුටට පත් කමුන්, කළු පාරාවෝ වෙනුවෙන් තම දොරටු විවර කළාය. ඉන් ඇතුල් වූ පාරාවෝ මහා වෘක්ෂයන්ගෙන් සෙවන කළ මග දිගේ ආමන් දෙවොල වෙත පිය නැගීය. එහි දොරටුව අභියස වූයේ මහා රැම්සීස්ගේ අති විශාල ප්‍රතිමා දෙකකි.

සැඟවුණු දෙවියන් වන්දනා කළ පියැන්කි, තෝත් දෙවොල බලා ගියේය. රියන් දහයක් උස ශෛලමය බැබුන්ගේ දෙපා අසලදී, ප්‍රධාන පූජකයා විසින් ඔහු පිළිගන්ට යෙදිනි. වයස දහඅටේදී දෙවියන් වෙත බැඳී සිටි ඒ පූජකයා, සතුටු සිනාවෙන් මුව සරසාගෙන සිටියේය. දෙවියන්ගේ සෙවනැල්ල කළු පාරාවෝ ආරක්ෂා කරන බවත්, දිව්‍යමය 'කා' ඔහුගේ ක්‍රියාවන්ට මග පෙන්වන බවත් පූජකවරයාට පෙනිණි.

දෙවොල් උද්‍යානය දුටු පියැන්කි පුදුමයට පත්විය. පළමු හිරු උපන් ස්ථානය වූ නෙළුම් පොකුණ එහි විය. දිළිසෙන දූපත හා පිහි දෙකේ වැව, අඳුරට එරෙහිව සටන් කරන ස්ථාන, එහි විය. මැවීමේ සියලු අමුද්‍රව්‍ය අඩංගු වන දෙවොලද එහි විරාජමාන විය.

✸

නෙම්රොඩ් පසුගිය සියලු සිදුවීම් නැවත සිහි කරන්නට විය. කමුන්හි ජනතාව ඉදිරියේ අවමානයට ලක්වුවද, ඔහුගේ දිවි ගැලවී ඇත. යම් තරමක වරප්‍රසාදද ඔහුට හිමිවිය. ඔහුට, තම බිරියට අවනත වීමට සිදු වූ බව සැබැවකි. එහෙත් ඔහු තවමත් කමුන්හි කුමාරයාය. ඒ තත්ත්වය එසේමය. සමහරවිට... පෙර කළ අයුරින්ම නගරය තනිව පාලනය කිරීමට නෙම්රොඩ් වන තමාට හැකි බවත්, නෙසෙටාට ඒ ශක්තිය හෝ හැකියාව නැති බවත් පියැන්කිට පහදා දෙන්නට තවත් ඉතා සුළු ඉඩක් තිබෙන බව ඔහුට හැඟිනි.

එහෙත්, එවැන්නක් සිදුවීමට පෙර කළු පාරාවෝ තෝත් දෙවොලෙන් පිටතට ආ යුතුය. පසුගිය දින කීපය තුළ ඔහු තෝත් දෙවොල තුළ රැඳී, පුරාණ දේවකතා අධ්‍යයනය කරමින්, පූජකයින්ගේ විද්‍යාත්මක ඥානය විමසා බලමින් ඔවුන් සමග සාකච්ඡා කරමින් සිටියේය.

ඉතින්, අන්තිමේදී කළු පාරාවෝ තෝත් දෙවොලෙන් පිටතට පැමිණියේය.

''උතුමාණෙනි,'' නෙම්රොඩ් දැඩි උද්‍යෝගයෙන් කියන්නට විය. ''මා ඔබට ඉතාම විස්මයජනක දෙයක් පෙන්වන්න සූදානම්. ඔබ ඉන් සතුටට පත්වේ නම්, ඔබ මට ඉඩදෙනවාද උතුමාණෙනි මගේ ආයාචනයට, නැවතත්?''

පියැන්ක්ගේ මුහුණ කිසිදු හැඟීමක් පළ නොකළ සෙයකි.

උද්‍යෝගයෙන් වෙව්ලායමින්, නෙම්රොඩ් මාලිගයේ කාමර සියයටම පාරාවෝ කැඳවාගෙන ගියේය. හැම කාමරයක්ම මල් සහ විලවුන් සුවඳින් පිරී ගියේය. පිළිගැනීමේ ශාලාව, අමුත්තන්ගේ ශාලාව, නිදන කාමර සියල්ලම රන්, රිදී, ඇඳුම් සහ ආලේපන තබන ලද විවෘත රාක්ක වලින් පිරී ගියේය. එහෙත් ඒ කිසිවක් දෙස අගය කරන දෑසින් බැලුවේ පියැන්කි නොවේ. ඔහු ඉදිරියට ගියේ ඒ අත්‍යලංකාර බව ගැන කිසිදු කැමැත්තකින් නොවේ.

නෙම්රොඩ් දොම්නසට පත්වුවද, අධෛර්යමත් නොවීය. සමහරවිට රජු තම සිතුවිලි සඟවාගෙන සිටිනවා විය හැකිය. ඒ නැතත්, තව එක දෙයක් ඉතිරිව තිබේ. ඒ අවසන් වස්තුව, ඕනෑම කයෝර කෙනකු පුදුමයට පත් කරවන සුළුය!

කමුන්හි කුමරා තිරයක් ඇද්දේය. එයින් විවර වූයේ කුඩා අලංකාර කුටියකි. ''උතුමාණෙනි, මෙන්න මා සතු වටිනාම වස්තුව. ඒ ඔබටයි.''

කදිමට හැඩ ගැන්වූ, තිරුවත් තරුණියන් දස දෙනෙක්! ඔවුහු වර්ණවත් කොට්ටා මත වැතිර සිටියහ. ඔවුන්ගෙන් කෙනෙක් කවි කියවති. තවත් අය කුඩා වීණා වයති.

''නෙම්රොඩ්, අශ්ව ගාලට!'' පියැන්කි කීවේය.

''අශ්වාගාල? උතුමාණෙනි, ඔබට අවශ්‍යනම් මා දූන්ම අශ්වයන් ගෙන එන්නම්.''

''මා එක අණක් දෙවරක් පවසන්නේ නැහැ!''

''එසේය... එසේය... උතුමාණෙනි.''

ඒ දුගඳ හමන, අපිරිසිදු ස්ථානයට නෙම්රොඩ් කිසිම දිනක පා තබා නැත. පියැන්කි ඔහු පරීක්ෂා කරනවාට සැක නැත. ඒ නිසාම ඔහු නොනවත්වාම සිනාසෙමින්, කතා කරමින් පාරාවෝ එහි කැඳවාගෙන ගියේය.

පාරාවෝ සත්ත්ව ආහාර හා ධාන්‍ය පරීක්ෂා කිරීමට නැවතුණේය. ඔහු ධාන්‍ය මිටක් ගෙන ගලක් මත දැමීය.

''ඒවා ගල මතම රැඳී සිටිනවා.'' ඔහු කීය.

''එය හොඳ තත්ත්වයක්ද උතුමාණෙනි.?''

''ධාන්‍ය හොඳින් වියළී ඇත්නම් එය ආපසු පැනිය යුතුයි. එයයි විය යුතු. මේ ධාන්‍ය බාල තත්ත්වයේ.''

''මං ඒ ගැන නිසි පියවර ගන්නම්. උතුමාණෙනි.''

පියැන්කි, ඉදිමුනු ඇසක් ඇති, හිසේ හා පාද වල ලප මතු වූ අශ්වයකු වෙත ගියේය. මුලදී බිය වූ නමුත්, අශ්වයා පියැන්කිට ඌ අතගාන්නට ඉඩ හළේය.

''ඔහුට උණ. කිමද මේ සතාට සැලකීමක් නැත්තේ?''

''මා පොරොන්දු වෙනවා උතුමාණෙනි, ඒ ගැන බලන්නට.''

රජු තවත් අශ්ව ශාලකට ගියේය. එහි වැතිර සිටියේ උකුල් ඇටය උළුක්කු වූ, මාංශ පේශී දුර්වල සත්ත්වයෙකි.

''මට ආලේපනයක් ගෙන එනු.''

පියැන්කි අශ්වයාගේ පිටේ තෙල් ගා ඇතිල්ලුවේය. උගේ පිට කෙතරම් තුවාල වී තිබිණි ද යත්, උගේ පිටේ යාම පවා නොකළ යුතුය. ඒ රෝගී සත්ත්වයාගේ දෑසේ මතු වූ කෘතඥතා පූර්වක හැඟීම දුටු පියැන්කිට, එය දරාගත නොහැකි තරම් විය.

''තුවාල වුණු, කුසගින්නේ සිටින අත්හැර දැමූ අශ්වයින්. රා දෙවියන් මට ආදරය කරන බව සත්‍ය වූවා සේම, නුඹ මේ කර ඇති වරද ලොව ඇති බරපතලම වරද බව සත්‍යයක්. නුඹ කර තිබෙන සියලුම වැරදි වලට වඩා මේ සත්ත්වයින්ට සලකන ආකාරය වැරදි සහගතයි. මට ඒ දරාගත නොහැකියි. නෙම්රොඩ්,නුඹ සතු සියලු වස්තුව කාර්නැක් දෙවොලට භාරදිය යුතුයි. නුඹ, කිසිදු වටිනාකමක් නැති මිනිහෙක් වන නුඹ, මා නුඹට මෙතරම් අනුකම්පාවක් දැක්වීම වාසනාවකැයි සිතපන්.!''

# 52

නුබියානුවෝ, තමන් කැමතිම ආහාර බුදිමින්, බිත්තර, චීස්, මීපැණි හා එළු පැටවුන්ගේ මස් රස බලමින් ඒ රාත්‍රියේ බොහෝ වේලා යනතෙක් උත්සව පැවැත්වූහ. මඳක් මත් වී සිටියද, ලැමසෙක්නිට තම මත් වූ සොල්දාදුවන් මෙහෙයවන්නට පැහැදිලි මනසක් තිබිණි. එසේම, හෙනෙත් නෙසට් බලා ගිය පසු හොඳ සටනක් දෙන්නට ඔහු ඔවුනට පොරොන්දු විය. මෙවර ඔවුන් තම වීරත්වය විදහාපානු ඇත. අනාගත පරම්පරාවන් ඒ වීරත්වය ගැන කතා කරනු ඇත.

කමුන්හි මාලිගයේ සඳළුතලයෙහි සිටගත් පියැන්කි, නගරයේ උත්සව දෙස බැලීය.

අබිලා ඔහුගේ වම් අතින් අල්ලා ගත්තාය. ''ඔබ සමූල ඝාතනයක් වැළැක්වූවා හිමියනි.''

''එපමණක් නොවෙයි, දැන් ඔවුන් අශ්වයින් හොඳින් බලා ගන්නවා. ඒත්, අප වාසනාවන්තයි. නෙම්රොඩ් තමුන්ටම බොහොම ආදරෙයි. ඔහුට අවශ්‍ය වුණා සමථයකට පත් කර ගන්නට මේ සටන. ඔහු මේ අත්‍යලංකාර නගරය විනාශ කිරීමේ අවදානම ගත්තේ නැහැ. ඒත්, ටෙෆ්නැක් එසේ නොවෙයි. ඔහු තම අරමුණ කරා යාමට මේ රටේ සියලුම ජනතාව හෝ බිල්ලට දෙන්න සූදානම්.''

''මා නෙම්රොඩ් ගැන බොහෝ දේ කල්පනා කළා. ''

''ඔහුට දැඩි දඬුවමක් නොදීම ගැන ඔබ මට දොස් තබනවාද සොඳුරිය?''

''ඇත්තෙන් ම හිමියනි, රාජද්‍රෝහී වීම වෙනුවෙන් ඔහු ලද තිළිණය,සාමය උදාකිරීම සඳහා යොදාගත හැකියි. ''

''කුමක්ද ඔබ පවසන්නේ?'' රජු ඇසීය.

රජින තම සැලසුම ඉදිරිපත් කරන විට, එවැනි බුද්ධිමත් බිරිඳක ලබාදීම වෙනුවෙන් රජු දෙවියන්ට ස්තුති කළේය.

✸

ටෙෆ්නැක් කෝපයෙන් දැවෙන්නට විය.

"මට පින්සිදු වෙන්නට," ඔහු නාට්‍රෙබ්ට හා යෙගෙබ්ට කීය. "තොප ධනවතුන් වුණා. කාගේත් අවධානය දිනාගන්නා මිනිසුන් වුණා. දැන් තොප මා නොදන්නා ක්‍රම වලින් පවා තොපගේ පසුම්බි තරකර ගන්නවා.ඒත්, මට අවශ්‍යයි දැනගන්න පියැන්කිගේ යුද හමුදාවේ ඉදිරි ගමන් මග,"

යෙගෙබ්, වාටු බස් දොඩන්නට විය. "උතුමාණෙනි, අපි ඔබව රවටන්ට තැත්කළා නොවෙයි. ඒත්, අපට ලැබෙන තොරතුරු එකිනෙකට වෙනස්. ඒ එකක්වත් අපට විශ්වාස කළ නොහැකි වුණා. එක පණිවුඩයකට අනුව කළු පාරාවෝ දැනටමත් නුබියාව බලා ආපසු ඒමට පිටත් වී හමාරයි. අනෙක් අයට අනුව ඔහු දින කීපයකට පෙර කමුත් අල්ලාගෙන."

"මේ අවිනිශ්චිත බව දැරිය නොහැකියි! කෙසේ හෝ මා සත්‍යය දැනගත යුතුයි."

ඩේබ්‍රේක්, ජෙනරල්ගේ කාර්යාලයට ඇතුල් වුණාය. ඉතා ආකර්ෂණිය වූ ඇය උපදේශකවරුන් දෙදෙනා දෙස පිළිකුල් සහගත බැල්මක් හෙළුවාය.

"පෙම්වත," ඇය කීවාය. "මේ අනවශ්‍ය කතාබහ නවත්වා කැමතිද කමුත්ට අත් වූ ඉරණම දැනගන්නට?"

නාට්‍රෙබ්ගේ කටට පණ ආවේය. "ගෞරවණීය ආර්යාවනි, අද මෙහි කතා කරන්නේ ඉතා වැදගත් කාරණයක් ගැනයි. අප..."

"හදිසි හමුවීමකට නෙම්රොඩ් කුමරුගෙන් ලැබුණු ඉල්ලීමටත් වඩා වැදගත් කරුණක් විය හැකිද එය...?" ඩේබ්‍රේක් සන්සුන්ව ඇසුවාය.

✸

එම පුවත හෙනෙන් නෙසට් පුරා ලැව්ගින්නක් සේ පැතිර ගියේය. එහෙයින් එම හමුවීම මාලිගයේ කුලුනු ශාලාවෙහිදී පැවැත්වීමට ටෙෆ්නැක් තීරණය කළේය. නෙම්රොඩ් කොතරම් ශෝභනද,සන්සුන්ද යත් ඔහුගේ පෙනුම එහි රැස්ව සිටියවුන්ගේ විශ්වාසය යළි තහවුරු කළේය.

"ඔබ යළි දැකීම කෙතරම් සතුටක් ද ජෙනරල් ටෙෆ්නැක්..." ඔහු කීය.

"ඔබේ පැමිණීම මගේ සිත සතුටින් පුරවනවා නෙම්රොඩ් කුමරුනි. එහි තේරුම, කමුත් නිදහස් බවත්, පියැන්කි එය අතහැර ගිය බවත්ද?"

"කළු පාරාවෝ දැඩි සේ බලය පෙන්වූවා. ඔහුගේ හටයින් මගේ ආරක්ෂක තාප්පය මතට දැඩි ප්‍රහාර එල්ල කළත්, ඔවුන් දුක්ඛිත පරාජයකට ලක්වුණා. ඒ මහා පරාජය හමුවේ නුබියානුවන් පසුබැස්සා. දැන් අපට තිබෙන්නේ ඔවුන් තීබසයෙන් පලවා හැරීමයි."

කමුත් කුමරාගේ සටන්කාමී කතාවට දැඩි කැමැත්තෙන් කෙරෙන ප්‍රීතිඝෝෂා දසතින් ඇසෙන්නට විය. ටෙෆ්නැක් ඔහුට සතුට ප්‍රකාශ කොට, ඔහු වෙනුවෙන් උත්කර්ෂවත් භෝජන සංග්‍රහයක් සංවිධානයට ද කටයුතු යෙදීය.

✸

හෙනෙන් නෙසට්හි උත්සව පැවැත්විණි. මල් පොකුරු රැගත් තරුණ තරුණියන් අලංකාර ක්‍රීඩාවක යෙදෙනු බලමින්, රස්ව සිටියෝ බීර ජෝගු ගණන් හිස් කළහ.

ටෙෆ්නැක් හා ඩේබ්‍රේක්, නගර වැසියන්ගේ ආයාචනා, එකක් පසුපස එකක් අවධානයට ගනිමින්, පිළියම් කතාබහ කරන අතරේ නෙම්රොඩ්, උස පාම් ගසක් යට විවේක සුවයෙන් ගතකරනු පෙනිණි. ඔහු අසල අකනොෂ් හා හෙනෙන් නෙසට්හි කුමරා වූ පෙෆ්ටෝ ද විය. පෙෆ්ටෝ තරව සිටි අතර ඔහුගේ පිම්බුණු මුහුණේ තෘප්තිමත් බවක සලකුණු පැහැදිලිව පෙනිණි.

"කොතරම් විස්මය ජනක රාත්‍රියක්ද මිත්‍රවරුනි?" ඔහු කීය. "අප ටෙෆ්නැක්ට සහාය දැක්වීම කොතරම් නිවැරදිද? ඔහු නොවෙද අප මේ ජයකණුව වෙත ගෙන ආවේ? තවත් බොහෝ අය මේ මග එනවාට සැක නැහැ. මගේ විශ්වාසය නම්, අප වහාම තීබසයට ඇතුල් විය යුතු බවයි. එහිදී අප විමුක්ති දායකයන් ලෙස පිළිගැනේවි."

"මා මේ තත්ත්වය තුළ දැඩි වෙහෙසට පත් වී සිටිනවා." අකනොෂ් කණගාටු විය. "මට අවශ්‍ය ගෙදර යන්නයි. ඩෙල්ටාවේ මගේ ගෙදරට. යුද්ධය අමතක කර මගේම ගෙදරට"

''එසේ නොසිතන්න.'' පෙෆ්ටෝ විරෝධය පෑවේය. ''අප කිසිවකුට හැකියාවක් නැහැ ටෙෆ්නැක් අත්හරින්නට. අපගේ යුද හමුදාවන් කළු පාරාවෝගේ හමුදාව විනාශ කරන මේ අවස්ථාවේ!''

''එවැනි සුභ සිහින නොදකින්න.'' නෙම්රොඩ් අවවාද කළේය.

''මගේ අදහස් ඔබව පුදුම කරවන බව පේනවා. ඒත්, මා භීතියෙන් වෙව්ලා ගියා කමුන්හි ආරක්ෂක බැමි පියැන්කිගේ හමුදාව පලවා හරින්ට තරම් ශක්තිමත් නොවේවි කියා. ඒත්, දැන් මගේ සිත සැහැල්ලුයි. මා...''

''සැහැල්ලුයි!ඔබට එසේ වෙන්නට නොහැකියි.'' නෙම්රොඩ් කීය.

පෙෆ්ටෝ රතු පැහැයට හැරුණි. ''තේරුම්ගත නොහැකියි.''

''හොඳින් සවන් දෙන්න මට. හෙනෙන් නෙසට් කුමරා සහ ඔබ, අකනොෂ්. ඔබ සතු වටිනාම දෙය නොවෙද ජීවිතය?''

''ඇත්තෙන්ම! '' පෙෆ්ටෝ කීය. ''ඒත්, කිමද ඔබ එසේ අසන්නේ?''

''ඔබ වැරදි තීරණ ගත්තොත්, ඉක්මනින්ම ඔබට එය අහිමිවන නිසා.''

''තීරණ ගන්නේ ටෙෆ්නැක්. අප නොවෙයි.'' අකනොෂ් කීය.

''අළුත්ම තත්ත්වයට අනුව ඔබ වැරදියි.''

''පවසන්න ඔබ කුමක් ගැනද මේ සඳහන් කරන්නේ කියා?'' අකනොෂ් කීය.

''මා...පැවසුවේ අසත්‍යය!''

අකනොෂ් හා පෙෆ්ටෝ වික්ෂිප්තව මුහුණින් මුහුණ බලාගත්හ.

''අසත්‍යය? කුමක් ගැනද?'' පෙෆ්ටෝ ඇසීය.

''කළු පාරාවෝ කමුන් අල්ලා ගත්තා.''

''නෙම්රොඩ්,ඔබ අපට විහිළු කරනවා.'' පෙෆ්ටෝ කීය.

''මා උත්සාහ කළා එය වළක්වන්නට. ඒත් පියැන්කිගේ ආයුධ වලට මුහුණ දීමට නොහැකියි! අප සතු කිසිම ආයුධයක් ප්‍රයෝජනවත් නැහැ. අති විශාල ගල් විදින ගල් දුනු, නගර ප්‍රාකාර බිඳ දමා, ආරක්ෂක ප්‍රාකාර මත සිටින සොල්දාදුවන් කැබලි කරනවා. එපමණක්ද, ඔහුගේ දුනුවායන්...''

''ඔබ පවසන්නේ කිසිදු මුර පොළකට, පියැන්කිට එරෙහිව යා නොහැකි බවද?'' පෙෆ්ටෝ කලබලයන් ඇසීය.

''කමුත් වැනි තැනකට එය එසේමයි. හෙතෙත් තෙසටහි ආරක්ෂාවත්, මගේ නගරයේ ආරක්ෂාවට වඩා එලදායී නැහැ.''

''කුමක්ද? කුමක්ද සිදුවන්නේ පාරාවෝ පහර දුන් විට?'' පෙෆ්ටෝ ඇසීය.

''දහස් ගණන් ලිබියානුවන් හා ඔබේ නගරයේ ජනතාව මිය යාවි. නගරයට දැඩි හානි සිදුවේවි. එය පියැන්කි යටතට පත්වේවි.''

''අප මේ විනාශය වැළැක්විය යුතුයි.'' පෙෆ්ටෝ කෑගැසීය.

''ඒ හේතුවෙන්මයි මා මෙහි පැමිණියේ...'' නෙම්රොඩ් කීය. ''ටෙෆ්නැක්ට, හෙළිකරන්න පිළිගත නොහැකි සත්‍යය! අද රාත්‍රියේ මා කමුත් බලා ආපසු යනවා. එහිදී මා මගේ මේ ව්‍යායාම පිළිබඳ විස්තර පියැන්කිට පවසනවා, ඊජිප්තුවේ එකම ස්වාමියාට.''

සිත් තැවුලට පත් වූ පෙෆ්ටෝ, ''අප කුමක්ද කළ යුත්තේ?'' යි ඇසීය.

''ඔබම එය පැවසුවා නෙවෙද? විනාශය වැළැක්වීම.''

# 53

එය, ආදරයේ දීර්ඝතම රාත්‍රියක් විය. ඩේබ්‍රේක් ඔහුගේ ආශාවේ හැම තනුවක්ම වැයුවාය. හෙට දවසේ සිදුවන දෑ පිළිබඳව, ටෙෆ්නැක් තීරණයකට පැමිණ සිටියේය. ඔහු තම යුද හමුදාවේ ප්‍රධානතම කණ්ඩායම් සමග තීබසයට පහර දෙයි. හෙනෙත් නෙසට් හා කමුන්හි භට කණ්ඩායම්ද සමග දියත් කරන ඒ ප්‍රහාරයට, පසුබැස සිටින පියැන්කිට මුහුණ දිය නොහැක. එය දරුණු සටනක් වනු නියතය. පියැන්කි, උතුරු හමුදාවන්ට ඒ භූමිය භාර දී පලා යනු ඇත. එසේ නැතහොත්, හමුදාවන් දෙක අතර සිදුවන මහ සටනින් බොහෝ දෙනෙක් මිය යනු ඇත. ඒ කෙසේ වෙතත්, දකුණේ පරාජය ස්ථිරය.

''මා ඔබ හා එනවා.'' ඩේබ්‍රේක් කීවාය. ''එහි ගිය පසු මා කිරුළු පැළඳීමේ උත්සවයට අවශ්‍ය කටයුතු සූදානම් කරන්නම්.''

ටෙෆ්නැක් ඇගේ පියයුරු සුරතල් කළේය. ''ඇත්තටම ඔබට අවශ්‍යද ඊජිප්තු රැජින වීමට?''

''ඔබ මට කැමති දෙයක් කරන්න. ඒත්, යුද්ධය ජයගන්න.''

''ඔබ මට වඩා බොහොම ළාබාලයි, ඩේබ්‍රේක් . ඔබ තරුණයෙකු හා පෙමින් බැඳුනොත් ?''

ඇගේ කොළ පැහැති ඇස් කෝපයෙන් දිළිසුණි. ''ඔබ ඇත්තටම සිතනවාද මේ ඊජිප්තු රැජින තම සිතුවිලි වල වහලියක් වීමට තරම් මුග්ධයයි කියා? මගේ එකම සිහිනය මේ රට නැවත ගොඩනැගීමයි. ඉතා දිගු දිවියක් පවා ඊට ප්‍රමාණවත් නොවේවි.''

ටෙෆ්නැක් ඈ දෙස බලා සිටියේය. ''මා දන්නවා, මා ඔබට කරන දේ, ඩේබ්‍රේක්. එපමණක් නොවෙයි, මා දන්නවා අන් කිසිම ගැහැනියකට වඩා හොඳින් ඔබ ඒ තත්ත්වයට ගැලපෙන බව.''

✸

නාට්‍රෙබ් හා යෙගෙබ්ට සතුරෝ දෙදෙනෙක් වූහ. ඒ

දෙදෙනාගෙන්ම බේරී සිටීම අපහසුය. ගැහැනුන් සහ ග්‍රීෂ්මය. ඒ ග්‍රීෂ්මයට ඔවුන්ගේ වළලුකර හා පයැඟිලි ඉදිමෙයි. එපමණක් නොව, එය ඔවුන්ගේ සිතිමේ ශක්තිය හීන කළේය. දින කීපයකට හෝ උතුරට ආපසු යාම ඔවුන්ට දැනුණේ වටිනා තිළිණයක් ලෙසයි. මේ වනතුරුත් ඔවුනට ඩේබ්‍රේක් ගෙන් ගැලවෙන්නට නොහැකි වුවත්, ඇය ඔවුන්ගේ සැලසුම්වලට බාධාවක් වුවත්...

ඔවුන් දෙදෙනා ආලේපන බඳුන් කීපයක්, ලී පෙට්ටියක තැන්පත් කරන වෙලාවේ, මී මුහුණක් ඇති කුඩා මිනිසෙක් පැමිණ තම වාර්තාව පිළිගැන්වීය.

"අන්තිමේදී නුඹට හැකිවුණාද, අකනොෂ් කුමරුට එරෙහි කිසියම් තොරතුරක්?'' නාට්‍රෙබ් කෝපයෙන් ඇසීය.

''අවාසනාවට මෙන් නැහැ. ඒත්...''

''අප තව පැයකින් පිටත් වෙනවා. අපට දීර්ඝ සාකච්ඡා වලට ඉඩක් නැහැ. උත්සාහ ගන්න සොයන්න යම් තොරතුරක්.''

මී මුහුණා දිගටම කතා කළේය. ''අකනොෂ් කිසිදු වරදක් කරන අයෙක් නොවෙයි. ඒත්, එක දෙයක් ගැන මා තුළ උනන්දුවක් ඇති වුණා.''

''ඒ කුමක්ද?'' යෙගෙබ් ඇසීය.

''ඒ ඔහුගේ බිරිඳ ගැන. ඇය ඔහු හා විවාහ වීමට පෙර ඇගේ තොරතුරු, කිසිවෙක් දන්නේ නැහැ.''

''ඉන් පලක් නැහැ.'' නාට්‍රෙබ් කීය.

''පලක් තිබිය හැකියි.'' යෙගෙබ් කීය. ''හිතන්න ඇයට තිබෙනවා කියා සඟවන්නට යමක්... ඔබේ විමර්ශන දිගටම ගෙනයන්න.'' ඔහු මී මුහුණාට අණ කළේය. ''අප උතුරේ සිට ආපසු පැමිණි විට, උත්සාහ කරන්න යම්කිසි වැදගත් දෙයක් කරන්නට, නුඹට හොඳ ගෙවීමක් අවශ්‍ය නම්.''

අළුයම් කාලයේ; ටෙෆ්නැක් හා රාජ සභිකයන්, අකනොෂ් ඇතුළු කුමාරවරුන්ද සමග හෙනෙන් නෙසට් වෙතින් පිටත් වූයේ අශ්ව රථ හා දුනුවායන් සහිත වූ හමුදා කණ්ඩායමක් සමගයි. ඉතා කෙටි කාලයක් තුළ, ඒ බලවත් ලිබියානු හමුදාව මධ්‍යම ඊජිප්තුව හරහා ගොස් දකුණ යටත් කරගනු ඇත.

✸

පියැන්කි, නෙසෙටාගේ අණසක යටතේ කමුන් හි නැවැත්වූයේ, පාබල හටයින් සියයක පමණ කණ්ඩායමකි. ඇය තම වගකීම් භාරගත් මොහොතේ සිටම ඉහළ ආධිපත්‍යයක් හා කාර්යශූර බවක් දක්වූවාය. සියලු කරුණු සලකා බැලීමේදී තීරක වූයේ ඇගේ සැමියා වුවද, ඈ හා සසඳන කල ඔහු ඉතා දුර්වල අයෙක් විය.

හෙනෙන් නෙසට් වෙතින් ආපසු පැමිණි නෙම්රොඩ්, ගැටලුකාරී ස්වභාවයක් පෙන්වීය. ඔහු ටෙෆ්නැක්ට අසත්‍යය පවසා, අකනොෂ් හා පෙෆ්ටෝට සත්‍යය හෙළිදරව් කිරීමේ විශේෂ කර්තව්‍යය අවසන් කළ බව සැබෑවකි. එහෙත් පෙෆ්ටෝ ඊට කෙසේ ප්‍රතික්‍රියා දක්වනු ඇතිද? ඔහු ටෙෆ්නැක්ට වශී වී සිටියේ, අන්තිමේදී උතුරු හමුදාවන් ජයපැන් බොනු ඇතැයි තරයේ විශ්වාස කළ අයෙකි. නෙම්රොඩ් විශ්වාස කළේ නගරයෙන් පිටත් වන බව අඟවන ටෙෆ්නැක්, සටනට සියල්ල සූදානම් කරනු ඇතැයි කියාය.

✸

ලැමසෙක්නි, නෙම්රොඩ් පිළිකුල් කළ නමුත්, ඔහුට සවන් දුන්නේය. තවත් ද්‍රෝහියෙකු වූ පෙෆ්ටෝ ට, ටෙෆ්නැක්ට සත්‍යය පවසා අවවාද කරන ලෙස දැනුම් දීමෙන් පසුව, ටෙෆ්නැක් නෙම්රොඩ්ට ආපසු යාමට ඉඩ දුන්නේය. ඒ හේතුවෙන් තම කාර්යය සාර්ථක වූ බවයි නෙම්රොඩ්ගේ අදහස. කෙසේ වෙතත්, නුබියානුවන් ගල්දුනු සහ ජංගම කුළුනු රැගෙන හෙනෙන් නෙසට් වටකළ විට ටෙෆ්නැක්ගේ අශ්වරථ ඒ යුධ යන්ත්‍ර සියල්ල විනාශ කිරීමට පියවර ගනු නිසැකය. ලැමසෙක්නි ද ඒ අදහස පිළිගත්තේය.

අබිලා, කමුන්හි නැවතී සිටීම ප්‍රතික්ෂේප කළාය. පියැන්කි ද ඇගේ කැමැත්තට බාධා කළේ නැත. නැවතත් උතුර බලා යන ඒ අනතුරුදායක ගමන පුරාවට ඔහුගේ පසෙකින් සිටින්නට ඇය අධිෂ්ඨාන කර සිටියාය. කළු පාරාවෝ දීර්ඝ කාලයක සිට විශ්වාස කළේ, මහරැජිනගේ ඉන්ද්‍රජාලය වඩාත් ඵලදායී ආයුධය බවයි. ඉතින් කුමටද ඇයට බාධා කරන්නේ?

කුල්හෙඩ් කමුන්හි නැවතී සිටි කාලය, ඔහුගේ යුධ ජර්නලය හා වාර්තා යාවත්කාලීන කිරීමට උදවුවක් විය. නිවැරදි තොරතුරු තැන්පත් නොකළ රාජ්‍ය ලේඛනාගාරයකට පැවැත්මක් නැත. අවාසනාවක මහත! දූත් හෙනෙන් නෙසට් බලා පිටත්වීමට කාලය පැමිණ ඇත. සොල්දාදුවන් කිසිදු අවධානයක් යොමු නොකරන, දහසකුත් එකක් කළමනාකරණ තොරතුරු පරීක්ෂා කර බැලිය යුතුය. කුල් හෙඩ් බලා සිටියේ නපාටාවේ

සිටින තම පවුලේ අය බලන්ට යාමට දවසක් උදාවන තෙක්ය. බිරිඳ හා දරුවන් සෙනෙහසින් වැළඳගන්නට තව දින කීයක් බලා සිටිය යුතුද?

පියැන්කි, ඒ ගහ කොළ නොමැති හිස් බිම හරහා වාත වේගයෙන් දුවන්නට ආශාවෙන් බලා සිටින වැලියන්ට් පිට නැංගේය. ඇගේ හේෂාරවය හා දිළිසෙන ඇස් ප්‍රකාශ කළේ සමෘද්ධියයි, සතුටයි. ඒ දිප්තිමත් කහ සහ තැඹිලි පැහැති කේශර දකින සියල්ලන්ගේ හදවත් නව ශක්තියකින් පිරී ගියේ නිතැතිනි!

✸

දූතේ හෙනෙන් නෙසට් පෙනෙන තෙක් මානයේය. එහි නගර ප්‍රාකාරද කමුන්හි මෙන්ම ශක්තිමත් බව පෙනුණද පියැන්කිගේ භටයින් ඉන් බිය වූයේ නොවේ. ඔවුන්, පසුගිය සටනේදී යොදාගත් උපක්‍රම මෙහිදීද ඒ හා සමාන ප්‍රතිඵල ගෙන දෙනු නැතිද? පාරාවෝ තම භටයින්ගේ ජීවිත ගැන දැඩි අවධානයක් යොමු කළේය. එකිනෙකා පිළිබඳව, වෙන් වෙන්ව පාරාවෝගේ අවධානය ලැබීමෙන් දකුණු බල මුළු තුළ වූ විශ්වාසය ඉතා ඉහළ තත්ත්වයේ විය.

''තවත් දුර නොයාම වඩාත් හොඳයි, උතුමාණෙනි.'' ලැමසෙක්නි අවවාද මුඛයෙන් පැවසීය. ''අප පළමුවෙන්ම ඇළපාර හා මිටියාවත ආරක්ෂා කළ යුතුයි. ඊළඟට කළ යුත්තේ බටහිරින් පහර දිය හැකි ටෙෆ්නැක්ගේ අශ්වරථවල මග අහුරා දැමීම. එවිට පමණයි, උතුමාණෙනි, අපට ගල්දුනු සහ ජංගම කුළුනු ස්ථානගත කළ හැක්කේ.''

පියැන්කි හදවත පොපියන ආශාවෙන් හෙනන් නෙසට් දෙස බැලීය. ''රාජකීය දරුවාගේ නගරය!" මේ අපූරු නගරය ගොඩනගන ලද්දේ අති විශාල ගොවි බිමක් පමණක් නොව පරම්පරා ගණනාවක් පුරාවට කුඩා ඉඩම් හිමියන් අතින් පෝෂණය වන විවිධ ප්‍රමාණයේ ගෙවතු දහස් ගණනක් පිහිටි සමෘද්ධිමත් භූමියක් මධ්‍යයේය. රජු ඒ භූමියේ මෘදු බවින් සතුටට පත් විය. එය, ඔහු යුද පිටියක් බවට පත් කරන්නට සැරසෙන භූමිය නොවේද?

''මගේ භටයින් සූදානම්.'' පෝර්මා පැවසීය.

''මගේත්'' ලැමසෙක්නි කීය.

''කුඩාරම් තනා කඳවුරු බඳින්න.'' පියැන්කි කීය.

මේ කාල නාස්තිය, ලැමසෙක්නිගේ පිළිකුලට බඳුන් විය. ටෙෆ්නැක් ගේ අශ්ව රථ නවත්වන කඳු පෙදෙස වහාම පිරිසිදු කිරීම හෙනෙන්

නෙසට් යටත් කර ගැනීමට සුදුසුම පියවර නොවේද? එහෙත් රජු දැඩි සේ කලබල වන්නේ තම මිනිසුන්ගේ ආරක්ෂාව ගැනයි.

"උතුමාණෙනි," පෝර්මා පුදුමයෙන් හඬ නැගීය. "නගරයේ ප්‍රධාන දොරටුව මේ දැන් විවෘත කළා."

තම සැලසුම සාර්ථක වනු ඇතැයි දැඩි විශ්වාසයෙන් සිටි අබිලා ද ජින සිනාසුණාය. එකම ලේ බිඳුවක් හෝ නොහෙළා හෙනෙන් නෙසට් පියැන්කිට යටත්වනු ඇත.

"සුළඟ" යන තේරුම් ඇති නමක් ගත් පෙෆ්ටෝ කුමරු,වෙනසක් කිරීමට තීරණය කළ සැටියකි. නගරයෙන් පිටතට මුලින්ම පා තැබුවේ ඔහුය. ප්‍රභූවරුන් හා නිරායුධ සොල්දාදුවන් පෙරහැරක් ඔහුගේ පසුපසින් විය. ඔවුන්, රන්, රිදී, මුතු මැණික් පිරවූ බඳුන් ඔසවාගෙන ආහ. ඒ සමගම ඉතා නිරෝගී, තරුණ අත්‍යලංකාර අශ්වයින් දස දෙනෙක් ද වූහ.

"එය උපායක් විය හැකියි." ලැමසෙක්නි සැකයෙන් කීය.

වැලියන්ට්, දුර්ලභ මහේශාක්‍ය ලීලාවෙන් ඉදිරියට පා තැබීය. නගරය වෙත දිවෙන මාර්ගයේ ගමන්ගත් ඔහු පෙෆ්ටෝට යාර දෙකක් ඉදිරියෙන් නැවතුණි. ඒ නිමේෂයේම පෙෆ්ටෝ කුමරු දනින් වැටී නළල බිම තැබීය.

"උතුමාණෙනි ඔබ දිනේවා!" පෙෆ්ටෝ තම වෙව්ලන ස්වරයෙන් හැකිතරම් හඬ නගා කෑ ගැසීය. "මගේ හදවත සෙවනැලි ගහණයි උතුමාණෙනි. අඳුර මා යටපත් කර සිටිනවා. එහෙත් මා මගේ වරද වටහා ගත්තා, උතුමාණෙනි. මට ඉතා අවශ්‍ය ආලෝකය, ඔබේ මුහුණේ දීප්තියෙන් මට ලැබේවා! මම විශ්වාසවන්ත සේවකයා වෙමි. මන්ද, කිසිදා නොසිඳෙන තාරකාවන්ගෙන් සැදුම්ලත් හිසක් ඇති දෙවියන් ඔබයි, උතුමාණෙනි!"

ඒ තිළිණ කිසිවක් දෙස නොබැලූ කළු පාරාවෝ හෙනෙන් නෙසට් නගරයට ඇතුල් විය. නැවත යටත් කර ගත් නගරය! ඔහු, එහි වැසියන් අයිරිස් මල් අතුරා සකසන ලද මාවතේ ඉදිරියට ගියේය.

# 54

හෙනෙන් නෙසට් බලකොටුව නුබියානුවන් හා හාදවී හමාරය! පෙෆ්ටෝ, ඒ භෝජන සංග්‍රහය අතරතුර කිසිම මොහොතක, පියැන්කිගේ අගය වැනෙන ගී ගැයීම නැවැත්වූයේ නොවේ. එහි සිටි අමුත්තන් අතර,පුළුල් අත් සහිත කබා හැඳි ධනවතුන් හා නෙළුම් මලින් හිස සරසාගත් ඔවුන්ගේ බිරියන් කැපී පෙනිණි. පාරාවෝගේ මුගටියා ආහාර ගැනීමෙන් පසු එක් ඇසක් ඇරගෙන නින්දට වැටුණේය.

මාලිගයේ වඩාත්ම සුඛෝපභෝගී කාමරය, රාජකීය යුවල සඳහා ස්ථිරවම වෙන්කර තිබිණි. අන්තිමේදී රාජකීය යුවල තනිවූ අවස්ථාවේ, පියැන්කි සිංහ පාදවල හැඩය ගත් පාද සහිත ලී ඇඳක වැතිරුණි. ඊයේ සහ හෙට නම් වන සිංහයින් දෙදෙනා ඒ ඇගේ නිදන්නා ආරක්ෂා කරයි. ඊයේට මිය යන ඔහු, හෙටට යළි උපදින බවයි පිළිගැනීම වූයේ.

සැමියා අසල ඉඳගත් අබිලා, ඔහුගේ පපුව පිරිමැද්දාය. උදාවන හැම වසරකම ඔහු අවාසනාව පරදන, සාමකාමී බලයක මූර්තිය බව පෙන්නුම් කළේය.

"කිමද ඔබ මෙතරම් කල්පනා කරන්නේ?" ඇය ඇසුවාය. "අප කමුන් හා හෙනන් නෙසට් නැවත අල්ලාගෙන හමාරයි. ඔබේ උත්සාහයට පින්සිදුවෙන්ට, මෙතැන් පටන් මේ නගර දෙක ඔබට පක්ෂපාතී වනු ඇති. යළිත් වරක්,මධ්‍යම ඊජිප්තුව උතුරේ ආක්‍රමණයන්ට එරෙහි ආරක්ෂක ප්‍රාකාරය වනු ඇති."

"ඒත්...මුළු මධ්‍යම ඊජිප්තුවම නොවෙයි, අබිලා."

"ඔබ පවසන්නේ, ඔබ තවත් දුර උතුරු දෙසට යන බවද?"

පියැන්කි ගොළුවත රකිත්ම අබිලා කෝප වූවාය. "අපි අපට අහිමි වූ නගර යළි අල්ලා ගත්තා. ටෙෆ්නැක් තවදුරටත් තීබසයට තර්ජනයක් නොවෙයි. කුමටද ඔබ මේ යුද්ධය තවදුරට ගෙන යන්නේ, හිමියනි?"

"මා ආත්මාර්ථකාමී, බියගුල්ලෙකු නිසා... මගේ පියා ආමන්ට

අවශ්‍ය මා ඉහළ හා පහළ ඊජිප්තුවේ පාරාවෝ බවට පත් කරන්නයි. ඒත්, මගේ සාමකාමී සතුට මට අමතක කළා මගේ රටෙන් බාගයක්. ඒ නිසයි, සෙවනැලි අතරින් යක්ෂයින් හිස ඔසවන්නේ. ටෙෆ්නැක්, අපගේ වගකීම කෲර ලෙස සිහිකර දෙන්නෙක්, අබිලා.''

රජිනගේ රූමත් මුහුණ ශෝකයෙන් අඳුරු විය. ''මා හිතුවා තීබසයේ පදිංචි වෙන්නට. අප දියණිය, ආමන් බිරිඳ, සමග, ඈ ලඟින් ඉන්නට. දිවියේ ඉතිරි කාලය දෙවියන් වඳිමින් ජීවත් වෙන්නට.''

''අප ටෙෆ්නැක්ගේ බලය විනාශ කළ යුතුයි. නැතහොත්, ඇපොෆිස් සර්පයා,දෙව්ලොව හරහා යන හිරුගේ නෞකාව වැනසීමට තැත්කරන සර්පයා, මෙන් නැවත ශක්තිය ලබාගෙන ඔහු මේ භූමිය පුරා නපුර වපුරාවි. නුබියාවේ පවා. මෙය මා සිතූ පරිදි කුඩා කැරැල්ලක් නොවෙයි. නියම යුද්ධයක්. ටෙෆ්නැක්ගේ හමුදාව තිබූ පරිදිම තිබෙනවා. එය, උතුර, ඈත උතුරත් එකතු කරගෙන.''

''ඔබ පවසන්නේ, ඔබට මෙම්පීස් යටත් කරගන්ට අවශ්‍යද?''

''ඔව්. මෙම්පීස්. ඒ ස්වර්ණමය යුගයේ අගනුවර. පාරාවෝ ජෝසර් විසින් ගොඩනගන ලද ධවල තාප්ප සහිත නගරය. පිරමීඩ යුගයේ සිට පැවතෙන දීප්තිමත් නගරය. ඔවුන් පවසන ආකාරයට, ''ගොඩබිම් දෙක සමබරව තබන තැන.'' ඩෙල්ටාව හා නයිල් නදිය යා කරන තැන පිහිටි මහා නගරය.''

අබිලා දැඩි කම්පනයට පත්වූවාය. ''උතුරු හමුදාවන්ට, මෙම්පීස් හා අප අතර මුරපොළ කීපයක් තිබෙනවා තවමත්. මෙම්පීස් බලකොටුව යටත් කරගත නොහැකි බව කවුරුත් දන්නවා. අපගේ රාජකීයයන් බොහෝ කලකට පෙර එය පාලනය කිරීමේ අදහස අත්හැර දැමුවා.''

''නැවත ඒ ගැන සිතන්නට කාලයයි මේ.''

''පියැන්කි..''

''ඔබ බිය නැහැ නොවෙද ඊජිප්තු මහ රජින?''

ඈය ඔහුට ළං වුණාය. ''ඔව්. බියෙන්. මා බියෙන් හිමියනි. ඔබ අහිමි වෙතැයි බියෙන්. යුද්ධයේදී අපගේ හමුදාවන්ට හා ජනතාවට වේදනා විඳින්ට සිදුවෙතැයි බියෙන්. අප පරාජය වුවහොත් ඇතිවන භයානක තත්ත්වය ගැන බියෙන්.''

''මාත් බියෙන්. අපගේ මානුෂීය හැකියාවන් පරයන ක්‍රියාවන් ගැන බියෙන්. ඒත් මා ඒ බියට යටත්වීම ප්‍රතික්ෂේප කරනවා.''

"ඒ ඇයි, පෙම්වත?"

"ප්‍රේමිය, අප මා ආට් අපට පෙන්වූ මග ඔස්සේ එහි අවසානය දක්වාම නොයාමෙන් ඇයට ද්‍රෝහී වන නිසා. ඒ අවසානය, ටෙෆ්නැක් සහමුලින්ම විනාශ කරන්නක් විය යුතුයි. පහළ ඊජිප්තුව හා උතුරු පළාත්, සාමයෙන් එක්වන අවසානයක් විය යුතුයි."

සැමියාගේ කම්මුලට කම්මුල තබා, ඔහුගේ පපුව මත අත තැබූ ඒ රූමත් නුබියානු ගැහැනිය, තම පොරය අවසන් කළාය. "මා ඔබේ සිත වෙනස් කරන්න තැත් කරන්නේ නැහැ."

"නැහැ, එවැන්නක් නොවෙයි. ඔබ මගේ තීරණයට එකඟයි. ඔබයි අයිසිස් ඉන්ද්‍රජාලයේ භාරකරු. ඔබ දන්නවාද අබිලා, මිනිසුන්ට ශක්තිමත් විශ්වාසයක් නැති විට ඔවුන් ගමන් කරන්නේ පරාජය හා අවාසනා වෙතයි. අපි අප සතු සියලු ශක්තිය, මේ සටන වෙත විසි කරමු අබිලා. මිය යන්නේ නම් අපි එකට මිය යමු, අපට මෙතරම් සතුටින් සිටින්නට මං සැලසීම ගැන දෙවියන්ට ස්තුතිවන්ත වෙමින්."

✸

මී මුහුණාට අකනොෆ්ගේ බිරිඳ ගැන විමර්ශන අවසන් කරන්නට කාලයක් නොවීය. ඊට වඩා වැදගත් කරුණක් දූත් ඔහුගේ හිස මත පැටවී අවසන්ය. දූත් ඉතින්, හැකි ඉක්මනින් හෙනෙන් නෙසට් හැර යා යුතුය. යෙගෙබ් හමුවී ඇති වී තිබෙන සත්‍ය තත්ත්වය ඔහුට හෙළිකළ යුතුය. එත්, ඒ කාර්යය අපහසුය. අවදානම් සහිතය. කෙසේ හෝ, තම පවුල බලන්නට යන මුවාවෙන් දකුණු යුද හමුදාවේ ආරක්ෂකයින්ගෙන් බේරෙන්නට ඔහුට හැකිවිය. ඔහුගේ පවුල ජීවත් වන්නේ උතුරු දෙසින් වූ කුඩා ගමක බවත්, දූතට එය පියැන්කිගේ පාලනයට යටත්ව ඇති බවට අනුමාන කළහැකි බවත් පැවසූ ඔහුට දිවි බේරාගෙන තම ගමන යා හැකි විය.

මේ පළමු කඩුල්ල පැනගත් මී මුහුණා, ගොවිපොළ මැද්දෙන් ගොස්, එළුණු සහ දිවුල් සොරකම් කරගෙන දකුණු හමුදාවන්ගේ පාලනයට යටත් නොවූ පෙදෙසක නයිල් ගං ඉවුරට සේන්දු විය. බෝට්ටුකරු පුදුම කතන්දර කීවේය. ඔහු කියන ආකාරයට මිනිසුන් කතා කරන්නේ ගම්මාන ගිනිතබන නුබියානුවන් ගැනයි. වැසියන් සමූල ඝාතනය කරන, ගැහැනුන් දූෂණය කරන නුබියානුවන් ගැනයි. මී මුහුණා හැකිතරම් ඉක්මනින් මෙම්පිස් බලා යාමට බෝට්ටුකරු පොළඹවා ගති. වහාම එහි ගොස්, ටෙෆ්නැක්ට අනතුරු අඟවා, වහාම ක්‍රියාත්මක වීමට උපදෙස් දිය යුතුය!

බෝට්ටුව නිරතුරුවම ගංගා ජංගම ආරක්ෂකයින් විසින් නවත්වන්නට යෙදිනි. ඔවුහු මී මුහුණාගෙන් ප්‍රශ්න කළ තර ඔහු කවුද, යන්නේ කොහේද වැනි අනවශ්‍ය දේ සඳහා බොහෝ වේලා ගත කළහ. එයින් ඔහුගේ වටිනා කාලය අපතේ ගියේය. මේ කාලය තුළ පාරාවෝ නිසැකවම තව තවත් මධ්‍යම ඊජිප්තුව තුළට ගමන් කරනවා නොවේද? අහෝ! මී මුහුණාගේ ගමනට වූ බාධා මෙම්පිස් දොරටුව අසලදී පවා නොනැවතුණි.! එහිදී දීර්ඝ ලෙස ප්‍රශ්න කිරීමට බඳුන් වූ ඔහු සති දෙකක් සිරගෙට නියම විය.

වාසනාවට මෙන් මී මුහුණාට හමුවූ නිලධාරියෙක්, ඔහුගේ කතාව අසා, එය පිළිගෙන, ඒ වන විට පිටා දෙවොල අසලම ලේකම් කාර්යාලයක් පිහිටුවාගෙන සිටි යෙගෙබ් වෙත ඔහු ගෙන ගියේය.

"කිමද නුඹ මා එනතෙක් හෙනෙන් නෙසටිහි රැඳී නොසිටියේ?" යෙගෙබ් ඇසීය. "ගෙනාවේ සුබ පුවතක් නොවෙද?"

"නැහැ උතුමාණෙනි නැහැ. පෙෆ්ටෝ පියැන්කිට නගර දොරටු විවර කළා. ඊට පෙර පාරාවෝ කමුත් නගරයත් අල්ලාගෙන."

"කුමක්ද? නෙම්රොඩ් කුමරු..."

"ඔහු බොරු කළා! ඔහු පෙෆ්ටෝ මෙන්ම නැවතත් පියැන්කිට පක්ෂපාතී වීමට දිවුරා හිටියා."

තම වළලුකර ඉදිමෙන බව යෙගෙබ්ට දැනුණි. ඔහුගේ බඩ දඟලා වමනයට එන්නට විය. එහෙත්,නවතම තත්ත්වය කොතරම් බරපතලද යත්, ඔහුට ඖෂධ ගන්නට කාලයක් නැත. වහා දිවගිය ඔහු මත්පැන් හලක බොමින් සිටි නාට්‍රෙබ් සමග මී මුහුණාද කැඳවාගෙන ටෙෆ්නැක්ගේ හමුදා මූලස්ථානය වෙත ගියේය.

ටෙෆ්නැක්, මී මුහුණාට සාවධානව සවන් දුනි. අන්තිමට ඔහු මෙසේ කීය. "ඔහුට ගෙවීම් කර නගරයේ නවාතැන් පහසුකම් දෙන්න."

"අප ගත් අවදානම අධිකයි." තම විශ්වාසවන්ත සේවකයා පිටව ගිය පසු යෙගෙබ් කීය. "ඒත් අප ඔබට ඉතා නිවැරදි තොරතුරු ලබා දුන්නා. එය ජයග්‍රහණයක්."

"තොපට එය විශ්වාසද?"

"එසේයි. මට විශ්වාසයි ඔහු සත්‍යය පවසන බවට."

"මාත් එසේ සිතනවා. මොනවාද පියැන්කිගේ සැලසුම්?"

"ඔහු, ඔහුගේයි කියා සිතා සිටින නගර දෙක අල්ලාගෙන තිබෙනවා. ඔහුගේ පැරණි දේශසීමාව නැවත ගොඩ නගාගෙන තිබෙනවා. ඔබට ඒ හරහා යන්න බැරි වන සේ."

"ඔහු දන්නවා නම් මගේ අරමුණ. ඔහුට වැටහේවි මා කිසි විටක ඒ පැරණි ක්‍රමය පිළිනොගන්නා බව. මා යළිත් පහරදෙන බව."

"ඒත්, ඇත්තටම ඔහු උතුරේ ඈතට යනු ඇතිද?" යෙගෙබ් ඇසීය. "එය උමතුවක්.!"

"නුබියානුවන් ඔහු සලකන්නේ ගොඩබිම් දෙකේ නායකයා ලෙසයි. ඉහළ හා පහළ ඊජිප්තුවේ."

"ඔහු ගම්මාන කිපයක් ගිනි තබාවි. "නාට්‍රෙබ් අනාවැකියක් කීය. ඊළඟට ඔහුගේ ආදරණීය තීබසයට ගොස් දෙවියන් යදීවි. ඔහු තත්ත්වය සතුටුදායක යයි සිතන විට අපි ඔහුට කදිම පාඩමක් උගන්නමු."

ටෙෆ්නැක් කල්පනා කළේය... පියැන්කි මධ්‍යම ඊජිප්තුව අල්ලා ගනීවි. ඊළඟට ඔහු මෙම්පිස් දෙස බලාවි. ටෙෆ්නැක් ඒ තත්ත්වයේ සිටියේ නම් ඔහු කරන්නේ එයයි. එහෙත්,ටෙෆ්නැක් නියම යුද නායකයෙකි. පියැන්කි නිකම්ම නිකමෙක් පමණයි දකුණු පළාතේ! සාමයට,නීතියට, ආගමට දිවි කැපකළ නිකමෙක්.!

# 55

පියැන්කිගේ නැව් පන්තිය නයිල් නදිය දිගේ 'ඉල්ලාහුන්' තෙක් යාත්‍රා කළේය. එයයි සාරවත් ෆෙයියුම් පළාතේ දොරටුව. නැව් තට්ටුව මත සිට බලන අයෙකුට පෙනුණේ අලංකාර වටපිටාවකි. එය සැනසිලිදායකද විය. තම සොල්දාදුවන්ගේ වික්‍රමය පෙන්වන්නට ඉඩ තිබූ හෙනෙත් නෙසට් හි දුක්ඛිත යටත්වීම ගැන ශෝක වූ ලැමසෙක්නි, එඩිතර මුහුණක් පාමින්, අනිවාර්යයෙන්ම තමාට ජය ලැබෙන 'බල්ලන් සහ නරි' ක්‍රීඩාව සඳහා පෝර්මාට අභියෝග කළේය.

පියැන්කිගේ අභිමානය දිගින් දිගටම වැඩෙමින් තිබිණි. ඔහු විස්මයානුකූල ජයග්‍රහණ ලබාගත්තා පමණක් නොව, තම සොල්දාදුවන්ගේ ජීවිත ගැනද දැඩි සේ ප්‍රවේශම් විය. ලැමසෙක්නි, ඉදිරියේදී බරපතල සටනක් ලබාදෙන බව පවසමින් තම භටයින්ගේ උද්‍යෝගය අළුත් කළේය. කමුන්හි නෙම්රොඩ් හා හෙනෙත් නෙසට්හි බියගුළු දේශද්‍රෝහීන් ඉතා දුබල විරෝධයක් එල්ල කළ බව සැබෑය. එහෙත්, මධ්‍යම ඊජිප්තුවේ අනෙක් පළාත්වල තත්ත්වය ඊට වඩා වෙනස් විය හැකිය. ඔවුන් නිරතුරුවම ලිබියානුවන්ට පක්ෂපාතීව සිටි හෙයින්, දකුණු හමුදාවට එරෙහිව, අති භයානක ලෙස තම නගර ආරක්ෂා කර ගැනීමට ඉදිරිපත් වෙනවාට සැක නැත.

පියැන්කිද ඒ සමාන මගක් ගත්තේය. තම භට කණ්ඩායම් සතුන වෙනුවට ඔහු කළේ අති භයානක සටනක් ඇරඹීමට ආසන්න බව පැවසීමයි. ඔවුන් මේ පා තබන්නට සූදානම්ව සිටින්නේ, නූබියානුවන් දශක ගණනාවකින් හෝ පා තබා නැති, නොදන්නා ප්‍රදේශයකටයි. එහෙත් ඒ බියකරු උපදෙස් වලින් සිදුවුණේ දකුණු හමුදාවන්ගේ සිත ශක්තිමත් වීම පමණි. ඔවුන්, ගොඩබිම් දෙකේ සතුට හා නිදහස වෙනුවෙන් මරණය දක්වාම සටනට සූදානම්ය. කළු පාරාවෝට සේවය කිරීම අනාගත පරම්පරාවල ඊර්ෂ්‍යාවට ලක්වන තරමේ ගෞරවයකි.

කෙසේ වෙතත්, ඉල්ලාහුන් පෙනෙන මානයට ළං වූ විට, යුද

නෞකා තුළ දැඩි නිහඬතාවයක් ඇතිවිය. ඒ නගරය උතුරු පාබල හමුදාසෙබළුන්ගෙන් පිරී ඇති බවත්, ඔවුන්ද දිවි දෙවෙනි කොට සටනේ යෙදෙන්නන් බවත් කවුරුත් දැන සිටියහ. එහි ආරක්ෂක තාප්ප, කමුත් නගරයට වඩා උස් වූ හෙයින් ගල්දමන්න ඵලදායක වේද යන්න සැකයට බඳුන් විය. ඔවුන්ගේ එකම බලාපොරොත්තුව වූයේ කළු පාරාවෝ ඊට විසඳුමක් සොයනු ඇත යන්නයි.

කඳවුරු බැඳීමෙන් පසු පියැන්කි තම උපදේශකවරුන් තම කුටියට කැඳවීය.

"කුමක්ද ඔබේ අදහස, ලැමසෙක්නි?" රජු ඇසීය.

"අපට හැකියි යන්ත්‍ර යොදාගන්නට. ඒත් අපට ආශ්චර්යයක් බලාපොරොත්තු විය නොහැකියි, උතුමාණෙනි"

"මා එකඟයි. වෙනත්...?"

"පෝර්මාගේ දුනුවායන්ට තම ඉලක්ක සපුරා ගැනීම අපහසු විය හැකියි." ඔහු කුටියේ දොරෙන් අත දිගුකර ඇත පෙන්වීය. "බලන්න. අර ආරක්ෂක තාප්ප මත තිබෙන ආරක්ෂාව කොතරම්ද කියා."

"සත්‍යයක්, ලැමසෙක්නි." රජු එකඟතාවය පළ කළේය.

"එකම විසඳුම වටලෑම. එයට දිගු කාලයක් ගතවේවි. එහි තේරුම, උතුමාණෙනි, ටෙෆ්නැක්ට අවශ්‍ය තරම් කාලය තිබේවි සහාය භට කණ්ඩායම් එවන්නට."

පෝර්මා කතා කළේය. "අපට හැකියි අපගේ වැඩකරුවන් ලවා ඒ ආරක්ෂක ප්‍රාකාර වලට එරෙහිව පස් ගොඩගසන්නට." ඔහු යෝජනා කළේය. "එය අපගේ ගැටලු තරමක් දුරට විසඳාවි."

"ඒත්, කම්කරුවන් ඝාතනයට ලක්වේවි ලිබියානු දුනුවායන් අතින්." ලැමසෙක්නි විරෝධය පෑවේය.

"ඔබට අමතකයි මේ අවස්ථාවේ ඔවුන්ට ආරක්ෂාවක් නැති බව."

"මට ඉඩ දෙන්න,තනිව හිතන්න." පියැන්කි කීය.

ඉල්ලාහුන්... ඉතාම නුදුරින්, මේ මාලිගය තැනුවේ පාරාවෝ ඇම්නෙම් හැට් II විසිනි. එය කාමර දහසකට වැඩි,අති විශාල ගොඩනැගිලි සංකීර්ණයක් බවයි කියවෙන්නේ. ඔහුගේ බලපෑම මත ෆෙයියුම් අති විශාල ගෙවත්තක් බවට පත්වුණා. දඩයමට හා ධීවර කර්මාන්තයට වෙන් කරන ලද බිම් කොටසක් ඇති එය, පවතින්නේ කිඹුල් දෙවි

'සොබෙක්' ගේ ආරක්ෂාව යටතේ. නැවත ශක්තිය ලබන හිරුට, ආදි කල්පික වැවෙන් නැගෙන්ට උදවුකර දෙව්ලොව ඉහළම තැනට පත් කළේ සොබෙක් දෙවියන්ය. මේ සියලු දෑ සලකා බලන කල ඒ නගරය,'ලස්සන මුහුණ' යන ආදර නාමයට හොඳින් ගැලපුනි.

කළු පාරාවෝ වැඩිවේලා කල්පනාවේ යෙදී සිටියේ නොවේ. ඔහු කුටියෙන් පිටවීමට සැරසෙත්ම , අබිලා පැමිණියාය.

"කුමක්ද ඔබේ සූදානම?" ඇය ඇසුවාය.

"ඔබ ඊට එකඟ නොවේවි, ප්‍රේමිය."

"පියැන්කි, ඔබයි රජු. ඔබයි යුද හමුදාවේ ප්‍රධානියා. ඔබට අයිතියක් නැහැ, ඔබේ ජීවිතය අවදානමට ලක් කරන්නට."

"ඔබේ ඉන්ද්‍රජාලය මා ආරක්ෂා කරාවි, අබිලා."

පියැන්කි තම අසුපිට නැංගේය. රතු කන් ඇති තරියෙකු සේ වේගවත්, අකුණක් සේ බිහිසුණු වැලියන්ට්! රජු අසුපිට නැගී ඉල්ලාහුන් දෙසට යන හැටි සොල්දාදුවෝ විස්මයෙන් බලා සිටියහ. වේගයත් සමග ඇතිවූ හැඟීමෙන් උද්දාමයට පත් වැලියන්ට් උගේ දිග පාද විහිදුවා හරිමින්, ඉතා අලංකාරව දුවන්නට විය. එහෙත්, පියැන්කිගේ මෘදු තට්ටුවකින් ඒ වේගවත් සත්ත්වයා බලකොටු දොර ඉදිරිපිට නැවතුණි.

ඉල්ලාහුන් හි ආරක්ෂක ප්‍රාකාර මත රැඳී සිටි දුනුවායෝ, ඒ උත්තුංග දේහය, කළුවර පැහැගත් සම, රන් ආලේපිත සන්නාහය හා රාජකීය ලිනන් සිවුරේ දිස්නයෙන් ඔහු කළු පාරාවෝ බව හැඳිනගත්හ. එහෙත්, ඔවුන්ගේ අත් දුන්න වෙත ගියේ නොවේ. බිය ඊට හරස් විය.

පියැන්කි තම බලවත් හඬ අවදි කළවිට ඉල්ලාහුන්හි සියලු ආරක්ෂකයින්ට ඒ හොඳින් ඇසුණි.

"මළබැව් නොදන, මියගියවුන් සේ ජීවත්වන අනාථ දුක්ඛිත මිනිසුනි. සවන් දෙනු තොපගේ රජුට! තව මිනිත්තුවක් ඇතුළත මේ දොරටුව විවෘත කොට මට පක්ෂපාතිත්වය නොදක්වුවහොත්,තොප එකෙක් නැර ඝාතනයට ලක් වනු ඇති. මට අවනත නොවී තොපගේ අනාගතයට දොරටු වැසියාමෙන් වළකිනු. තොපගේ හිස් දංගෙඩියට නොයවනු. තොප මා ආට් නීතිය ගරු කරන්නේ නම්,තොප නගරය ඉහළ හා පහළ ඊජිප්තුවේ රජුට භාරදෙනු. එවිට, කිසිවකු ඝාතනය නොවේවි. කිසිවකු කරදරයට පත් නොවේවි. සාමය රජ කරාවි. මගේ ඉවසීමේ සීමාව දැන් ඉතා ආසන්නයි. එහෙත්, මා තොපගේ පිළිතුරක් බලා සිටිනවා. !"

ආරක්ෂක ප්‍රාකාර මත භටයින් සැම අතටම දුවන්නට වූහ. නිලධාරීන් හා ප්‍රධානීන් වහාම ගොස් ඉල්ලාහුන් කුමරු වූ ඔසොකොන්ට පියැන්කිගේ වදන් වාර්තා කළහ. ඔසොකොන් පැරණි ලිබියානුවන්ගෙන් එකෙක් විය.

"එසේ නම් ඔහු පැමිණියා. තනිවම!" කුමරා කීය.

"අපට පහසුවෙන්ම ඔහු මරා දැමිය හැකියි."බලකොටුවේ අණදෙන නිළධාරි කීය. "ඔහු මියගිය විගස නුබියානු බලමුළු පලා යාවි."

"මෝඩයා! තා කිසිදා අසා නැතිද පාරාවෝ තුළ තිබෙන ඉන්ද්‍රජාලීය බලය ගැන? සතුරන් ගණනාවකට එරෙහිව සටන් කිරීමට ඔහුට සතු බලය? ඒ බලයයි මහා රැම්සීස්ට කාඩේෂ් සටනේදී හිටයිට්වරුන් පරාජය කිරීමට සහාය වුණේ. ඒ බලය ඔහු සතු නිසයි පියැන්කි හුදකලාව පැමිණ අපට අභියෝග කරන්නේ. කිසිදු ඊයක් ඔහුට වදින්නේ නැහැ. ඔහුගේ පපු සැරහුම කිසිදු සිරියකින් තුවාල වෙන්නේ නැහැ. ඔහු කිසිදු මිනිසකුට නිවිය නොහැකි ගින්නක් වැනියි."

"එසේනම් කුමරුනි, කුමක්ද ඔබේ අණ?" නිලධාරියා ඇසීය.

ඔසොකොන් කුමරු මාලිගයෙන් පිටවී, බලකොටුවේ ප්‍රධාන දොරටුව විවෘත කරන ලෙස අණ කළේය. ඉක්බිති ඔහු, පියැන්කි ඉදිරිපිට පෙනී සිටියේය.

"දෙවියන්ගේ සෙවනැල්ල ඔබ රැකදේවා, පාරාවෝ." ඔහු කීය. "ඔබට ඔබේ බලය ලබා දෙන්නේ දෙව්ලොවයි. ඔබ හදවතේ උපදින සියල්ල සැනෙකින් ජයගනී. අපට යථාර්ථය හඳුනාගත හැකිවන්නේ ඔබේ අණ යටතේ පමණයි. මේ නගරය, මේ බලකොටුව, එහි වස්තුව හා වැසියන් ඔබට අයිතියි. උතුමාණෙනි සාමයෙන් මෙහි ඇතුල්වන්න."

වැලියන්ට්, ඉල්ලාහුන් බලකොටුව වෙත දිව ගියේය. පියැන්කි එහි මුදුනේ සිට නගරය දෙස බැලීය. එහි ප්‍රධාන මාවත් බෙදී යාම ඉතා නිවැරදිව සකස් කර තිබිණි. කාමර හැත්තෑවක් ඇති විශාල මන්දිර, පියවර සියයක් දිග සියයක් පළල සාමාන්‍ය නිවෙස් අතර පිහිටා තිබිණි. පුරවැසියෝ තම නින්දෙන් හා බියෙන් අවදිව තම විමුක්ති දායකයාට ජයඝෝෂා පැවැත්වූහ. පාම් අතුවලට තම ආයුධ හුවමාරු කරගත් බලකොටුවේ සොල්දාදුවෝ, නුබියානුවන් වැළඳගත්හ.

පැයකට අඩු කාලයක් තුළ මුළු නගරය පුරාම උත්සව පවත්වමින් තිබිණි. මාලිගා බිම්ගෙයින් ගෙනෙන ලද වයින් හා බීර ජෝගු සිය

ගණනක්, මිටි මේස මත තබන ලද මස්පෙති, කරවල හා දිඹුල්, රට ඉඳි හා මිදි සමග අමුත්තන් එනතෙක් බලා සිටිනු පෙනිණි. පියැත්කිගේ පාලනය යටතේ දැනෙන සතුට කාගේත් හදවත් පුරා රැව්දුණි.

"කුමක්ද ගැටලුව?" පෝර්මා, ලැමසෙක්නිගෙන් ඇසීය. "ඔනෑම කෙනෙක් සිතාවි ඔබ බීමතින් කියා. ඒත ඔබ තවම එක බිඳක්වත් කටේ තැබුවේ නැහැ."

"නුඹ... මෝඩයෙක් දුනුවායා. නුඹ කිසිවකින් පුදුම වෙන්නේ නැහැ. එහෙත් මට... මට... මා කිසි දිනක දැක නැහැ එවැනි මිනිහෙක්."

"නුඹයි මෝඩයා..!" පෝර්මා කෑගැසීය. "නුඹට තව වසර කීයක් ගතවේද වටහාගන්නට ඔහු පාරාවෝ බව.?"

# 56

''ඉල්ලාහුන් යටත් වී හමාරයි.'' ටෙෆ්නැක් ඩේබ්‍රේක්ට කීය.

''බොහොම නරක ආරංචියක්. ඒත් ඔබට ඒ ගැන කණගාටුවක් නැති හැඩයි.

''ඔසොකොන් කුමරු අනාගතයට බිය මහල්ලෙක්. පියැන්කිට කිසිදු අපහසුවක් නොවෙන්ට ඇති ඔහු ලවා නගර දොරටු විවෘත කරවාගන්නට....''

''ඒ නීච නුබියානුවා. දැන් ෆෙයියුම් පාලනය කරනවා?''

ඉන් කොටසක් පමණයි. ඔහු තවත් දකුණේ ඈතට යාමට උත්සාහ කළොත් මෙයිඩම් බලකොටුව ඔහුගේ මග හරස් කරාවි. මා එය පාලනයට පත්කර තිබෙන්නේ මා සතු අති දක්ෂ යුධ නිලධාරියෙක්. ඔහු දිනපතාම ඔහුගේ භටයින්ගේ පුහුණුව අධීක්ෂණය කරනවා. මේ වනවිටත්, දුර්වලයින් කීපදෙනෙකු මරා දමා තිබෙනවා. මෙයිඩම් පියැන්කිගේ ගමන නොනවත්වාවි. එහෙත් එය සති ගණනකට ඒ ගමන ප්‍රමාද කරාවි. ඔහුට සොල්දාදුවන් බොහෝ ගණනක් අහිමිවේවි.''

''කිමද ඔබ සහාය හමුදාවන් එහි නොයවන්නේ?''

''මට විශ්වාසයි ඒ නුබියානුවා උමතු සිහිනයක පැටලී සිටින බවට. ඔහුට අවශ්‍ය මෙම්පිස් යටත් කරගන්නයි.''

''පියැන්කි උන්මන්තකයෙක් නොවෙයි.'' ඇය විරෝධය පෑවාය. ''ඔහු හොඳින්ම දන්නවා එය අපහසු බව.''

''ඔහුගේ සුළු ජයග්‍රහණ ඔහු උමතු කරනවා. මට අවශ්‍යයි එවැනි සුළු සටන් වලින් ඔහුගේ ශක්තිය දියකර හැර, ඔහු අපරාජිතයකු බවට ඔහුට විශ්වාස ගන්වන්නට. ඊලඟට මෙම්පිස් හිදී ඔහු මුහුණ දෙන්නේ, කිසිදා ජයගත නොහැකි, පුදුමාකාර සහ හොඳින් විවේක ගත් ඔහුට වඩා හොඳ ආයුධ සහිත හමුදාවකට. ඔව්, මෙම්පිස් ඔහුගේ සොහොන් ගෙය වේවි.''

මෙයිඩම් බලකොටුවට වසර පහක් තිස්සේ අණ දුන්නේ 'රෙඩ්' ය. ඒ ඉපැරණි නගරය, 'ඒටම්ගේ වාසභූමිය,'' මැවුම්කරුගේ නගරය වීම ඔහුට ගැටලුවක් නොවීය. ඔහුගේ සිත දිනාගත් එකම ස්ථානය වූයේ, දෑතේ සටනින් හටයින් පුහුණු කරන බැරැක්ක පමණි. හටයින්ගෙන් පහෙන් එකක් ඉවත් කිරීම ඔහුට ගැටලුවක් නොවූයේ, ඔහු හැකිතරම් කෲර මිනිසුන්, නියම රණවිරුවන් තනන හෙයිනි. ඔහු මේ රැකියාව ඇරඹූ දා පටන් ඒ දර්ශනීය පිරමීඩ දක්නට ගොස් නැත. කුෆුගේ ගෘහ නිර්මාණ ශිල්පීය හපන්කම හෙළිවන අතිශය මෘදු මතුපිටක් ඇති ඒ පිරමීඩය බලන්නටවත් ඔහු කල්පනා කළේ නැත. රෙඩ් සිහින දුටුවේ ලේ ගලන සටන් ගැන පමණි. මෙවර නම් ඔහුට ඒ අවස්ථාව උදාවනු ඇත.

පියැන්කිගේ හමුදාව පැමිණීමට ඉතා ආසන්න බව ආරක්ෂකයෝ දැනුම් දුන්හ. ඒ මොහොතේ පටන් රෙඩ්ට හුස්ම ගැනීමට වත් ඉඩක් නොවීය. ඔහු එක් ආරක්ෂක ප්‍රාකාරයකින් තවෙකකට දුවන්නට විය. හටයින්ගේ උපකරණ පිරික්සමින්, අණ දෙමින්, සෑම කෙනෙකුටම අනෙකාට වඩා විමසිල්ලෙන් සිටින ලෙස අණ කළේය.

මුලදී ඔහු සිතුවේ ඔහු රැවටුන බවයි. එහෙත්, ඔහු රැවටී නැත. මොහොතකින් ඔහුට පෙනුණේ සියලුම නගරාරක්ෂකයින් එකම දසුනට බියවී වෙව්ලා යන බවයි. ඒ බියෙන් ඔවුන් මුදවාගනු වස්, සියලු දෙනාම එක පහරින් මරා දමන්නට රෙඩ් සූදානම්ය. එහෙත්, ඔහුට ඒ සියලුම හටයින් අවශ්‍යය. ඔහු කෑගැසීය. නුබියානුවන්ගේ ගල්දුනු හා ඊතලවලට බිය විය යුතු නැතැයි කෑගැසීය. එහෙත් කිසිවකු ඒ වදන් කනකට නොගත් බව ඔහුට පෙනුණි.

තම අසිරිමත් අසුපිට නැගි පාරාවෝ ප්‍රධාන දොරටුව දෙසට එනවිට, එක් ලිබියානු දුනුවායෙක් දණින් වැටුණි. ඔහුගේ සගයින් භීතියෙන් මුසපත්ව යද්දී රෙඩ් ඔහුගේ ගෙල සින්දේය.

''තොපට තෝරාගන්නට මාර්ග දෙකක් තිබේ!'' කළු පාරාවෝ හඬ නැගීය. ''තොප මෙයිඩම් දොරටු විවෘත කළ යුතුයි. එවිට තොප දිවි බේරෙනු ඇති. නැතහොත් ඒවා වසා තබනු! තොප මියයාවි. ඉහළ හා පහළ ඊජිප්තුවේ රජු ලෙස මා ඉඩ තබන්නේ නැහැ, මට දොරටු වසා තබන කිසිම නගරයක පැවැත්මට!''

රෙඩ්, ඔහු විසින් මරණ ලද දුනුවායාගේ දුන්න අතට ගෙන ඊතලයක් තබා පියැන්කි වෙත එල්ල කළේය. එහෙත් ඒ ඊතලය දුන්නෙන් පිටතට

ගියේ නොවේ. මන්ද යත්, ලිබියානු දුනුවායන් තිදෙනෙක් රෙඩ් මතට නැවා පැන පහරදී මරා දමා, ආරක්ෂක ප්‍රාකාරයෙන් ඉවතට පෙරළා දැමූ හෙයිනි.

ඒ සමගම පාබල හමුදා භටයෝ, බලකොටුවේ දොර විවෘත කළහ. පියැන්කි සතුටින් කෙඳිරිගාන තම අසු පිටින්ම, ඊට ඇතුල් විය.

✸

"මෙයිඩම් සටනක් නැතිවම යටත් වුණා." යෙගෙබ් කීවේය. නාට්‍රෙබ්ද, තැති ගැනුන හදින් ඔහුගේ සෙවනැල්ල සේ පසුපසින් යන්නට විය.

දැඩි කෝපයෙන් සිටි ටෙෆ්නැක් "කුමක්ද සිදුවූයේ?" යි ඇසීය.

"රෙඩ්, ඔහුගේම භටයින් විසින් පාවා දෙනු ලැබුවා." පියැන්කි ඔවුන්ව බියගන්වනවා. ඔහු ගැන භයානක කතා පැතිරී තිබෙනවා. මිනිසුන් පවසනවා පියැන්කිගේ අසිපත හසුරුවන්නේ ආමන් දෙවියන් බව. ඔහුට සතුරාගේ සිතුවිලි දැනෙන බව. ඔහු..."

"ඔය බොළඳ කතා නවතනු.! පියැන්කි මෙම්පිස් වෙත හැරෙන්නට පෙර එකම බාධකයයි තිබෙන්නේ, ලිෂ්ට්."

"අප හිත් රවටාගැනීම වරදක් ජෙනරල්." යෙගෙබ් වඩාත් නොසතුටින් කීය.

"පරාජිතයෙකුගේ වචන!" ඩේබ්‍රේක් කඩා පැන්නාය.

"නැහැ. එයයි සත්‍යය! ලිෂ්ට් මෙයිඩම්ට වඩා කුඩයි."

"සමහරවිට එහි බලකොටුව වඩාත් ශක්තිමත් විය හැකියි. "ඩේබ්‍රේක් කෝපයෙන් කීවාය.

"අපි එසේ සිතමු. ඩේබ්‍රේක්, එසේ වෙන්නැයි පතමු."

"යෙගෙබ්! මට මගේ නමින් ඇමතීම නවතනු.! තා මගේ මිතුරෙක් නෙවෙයි. මට තනතුරක් තිබෙනවා. එයින් අමතනු!"

යෙගෙබ්ට කෙළ ගිලුනි. "ඇත්තෙන්ම,උත්තමාවිය! ඒත් මා හිතනවා ලිෂ්ට් කළු පාරාවෝට එරෙහිව වැඩි කාලයක් රැඳේවි කියා."

"ධනාත්මක සිතුවිලි ගැවී නැති මෙවැනි කතා අපගේ භට කණ්ඩායම්වල මානසිකත්වය බිඳ නොදමයිද? මා සමහර විටක පුදුම වෙනවා තා සහ නාට්‍රේබ් අප සතුරන්ට පක්ෂපාතීද කියා."

"උත්තමාවිය... ඒ වදන්..."

"නවත්වනු!" ටෙෆ්නැක් හඬ නැගීය. "අප එක් ව වැඩ කළ යුතු අවස්ථාවේ එකිනෙකා මරා ගැනීම නවතනු. මගේ උපදේශකයින් රටේ සෞභාග්‍යය ගැන බලාගනීවි. මා යුද හමුදාවේ කටයුතු ගැන බලන්නම්."

නාට්‍රෙබ් හා යෙගෙබ් අතිනත ගෙන පිටව ගියහ.

ටෙෆ්නැක්, ඩේබ්‍රේක් ගේ උරහිස මිරිකුවේය. "නැවත එසේ නොකරනු. මගේ උපදේශකවරුන් විවේචනය කිරීම නුඹට අයිති වැඩක් නොවෙයි."

"ඔවුන් දෙදෙනා ඔබව පාවා දේවි."

"ඔවුන් මට ඇලී සිටිනවා, බල්ලන් තම ස්වාමියාට ඇලී සිටින්නාක් මෙන්. මා නැතිව ඔවුනට ජීවිතයක් නැහැ."

ඇය ඔහුගෙන් ඉවතට ගියාය. දිනක ඔබට සිදුවේවි තෝරාගන්නට ඔවුන් හෝ මා. මා ඔබට ආදරෙයි. ටෙෆ්නැක්. ඔවුන් කරන්නේ ඔබෙන් ප්‍රයෝජන ගැනීම පමණයි.

"ඔබ සිතනවාද මා එය නොදන්නා බව. ඒත් ඔබට බැහැ සහායකයින් නොමැතිව බලය රඳවා ගන්නට. ඒ දෙදෙනා මට ඉතා ඵලදායකයි."

✸

ලිෂ්ට්, "ගොඩබිම් දෙක යටත් කරගන්නා ඇය," නගරය මීට වසර දහසකට පෙර ඇමිනෙම්හැට් 1 ගේ අගනුවර විය. ඔහු තම පිරමීඩය නගරයට ළංව ඉදිකර තිබිණි. ඔහුගේ පුත්‍රයා මෙන්ම ඊලඟ පාරාවෝ වූ සෙනුස්රෙස් 1, ඒ සමයේ රන් අකුරින් ලියැවුණු පාරාවෝ වරු වෙති. එසමයෙහි ලියන ලද සාහිත්‍ය ලියවිලි අතර "සිනුහෙ කතාව" ඉතා ජනප්‍රිය විය. රාජකීයත්වයෙන් මිදුනු පසු ලිෂ්ට් නගරය මෙම්පීස් හා ෆෙයියුම් අතර කුඩා මුරපොළක් බවට පත්විය. අතීත මතකයන් තුළ ජීවත් වන වැසියන් වෙසෙන කුඩා නගරයකි එය.

එහෙත්, තවමත් ඒ බලකොටුව එදා මෙන්ම අලංකාරය. ලැමසෙක්නි ඒ දෙස ගිජු බැල්මක් හෙළීය.

"මට මෙය හාරදිය හැකිද උතුමාණනි?" ඔහු ඇසීය. "ගල් දුන්නෙන් ප්‍රහාර කීපයක් පමණයි. ඉතිරිය මා බලාගන්නම්."

"නැහැ ලැමසෙක්නි. අපට ඉතා හොඳින් සහාය වුණු අපගේ උපායන් මෙහිදීත් නොයොදන්නේ මන්ද?"

''ගෞරවයෙන් උතුමාණෙනි මා කියන්නේ, ඔබ ඔබේ වාසනාව ගැන එතරම් දුර නොසිතන්න. ඔබ නොමැති දවසක අප අතරමං වේවි. උතුමාණෙනි,''

''කෙසේද මේ බලකොටුවේ අණදෙන නිලධාරියා ඉල්ලාහුත් හෝ මෙයිඩම් හි නිලධාරීන්ට වඩා අඥානයෙකු වන්නේ?''

කළු පාරාවෝ තම අසුපිට නගින්නත් පෙර ලිෂ්ට්හි ප්‍රධාන දොරටුව විවර විය. එහි අණදෙන නිලධාරී, ඔහුගේ භටයින් හා ජනතාවගෙන් වැඩි කොටසක් ද පියැන්කි හමුවට පැමිණියහ.

''ගොඩබිම් දෙක ඔබෙයි උතුමාණෙනි.'' අණදෙන නිලධාරී සතුටින් පැවසීය. ''දකුණ හා උතුර ඔබෙයි. එහි තිබෙන සියලු වස්තුව ඔබෙයි. මුළු මිහිකතම ඔබ ඉදිරියේ වන්දනා කරයි. ''

දොරටුවෙන් ඇතුල් වූ වහාම, කළු පාරාවෝ තමා සුරකින දෙවියන්ට, ආමන් දෙවියන්ට බිලි පූජාවක් පවත්වා ගෞරව දක්වීය. මුළු මධ්‍යම ඊජිප්තුව ම දැන් ඔහුට යටත්ය. දැන් ඉතින් ඔහුට මෙම්පිස් වෙත යන මග විවෘතය.

# 57

ලිෂ්ට් බැරැක්ක වෙත වේගයෙන් පැමිණි චරපුරුෂයා තම අශ්වරථය ආරක්ෂක මූලස්ථානය අසල නවතා බිමට පැන්නේය.

''ලැමසෙක්නි අණදෙන නිලධාරි තුමාට පණිවුඩයක්'' ඔහු ආරක්ෂකයාට කීය.

''ඔහු විවේක ගන්නවා, එහෙත්, නිලධාරි පෝර්මා මෙහි සිටිනවා.''

''හොඳයි.''

ඇත්තටම පෝර්මා සිටියේ ලැම්සෙක්නිට ශාපකරමිනි. ඔහු ඒ අසල වූ මත්පැන් හලක විනෝද වෙයි. අඩු තරමින් පෝර්මාට, අසල්වැසි ගම්මානයේ ගම් ප්‍රධානියාගේ දියණිය හමුවෙන්ට යාමට වත් වේලාවක් නැත. ඔහු දකින හැම වරකම ඇගේ ඇස් දීප්තියෙන් බබළනු ඔහු දැක තිබිණි.''

''මේ අලුත්ම විස්තර සහිත තොරතුරක්.'' චරපුරුෂයා මුද්‍රා තබන ලද පැපිරසයක් දෙමින් කීය.

''අන්තිමේදී! අප මෙය ලැබෙන තෙක් සති ගණනක් බලා සිටියා.'' පෝර්මා ඒ වටිනා ලියවිල්ල රැගෙන වහ වහා මාලිගය දෙසට ගියේය.

අබිලා නිර්වස්ත්‍රව පිහිනමින් සිටියාය. ඒ සුවිසල් දකුණු දෙස ඉපිද, කුඩා ළදැරියක ලෙස ගංගාවේ දරුණු රළ සමග පොරබදන්නට පුරුදු වූ ඇය, එහි පිහිනා ගියේ ඉතා සැහැල්ලුවෙනි. උණුසුම ඉතා දැඩිවන විට, ඇය තම කරදර මාලිගයේ වැවට මුදා හැරියාය. පියැන්කි තම කරදර අමතක කළේ තම ආකර්ෂණීය බිරිඳ දෙස බලා සිටීමෙනි.

උතුර හා දකුණ අතර යුද්ධය ඇරඹී වසරක් ගත වී තිබිණි. මධ්‍යම ඊජිප්තුව යටත් කර ගැනීමෙන් පසු, කළු පාරාවෝ පැරණි ග්‍රාමීය පවුල්වලින් පරිපාලන නිලධාරීන් පත් කළේය. ඔවුහු කිසි විටෙක පෙෆ්ටෝ වැනි, මා ආට් නීතිය බිඳ දමන කුමාරවරුන්ට ඉඩක් නොදීමට අදිටන් කරගත්තෝ වූහ. වසර ගණනක් පැවති දූෂිත පාලනයට තිත තබා තිබිණි. ඒ පියැන්කි

වුයිනි. නිමාවක් නැති පුද්ගලික බලය හා අසරණ ගැමියන්ගේ දුක නිමාවී තිබිණි. මධ්‍යම ඊජිප්තුවේ රැඳී සිට කාලය තුළ, මෙතැන් පටන් පාරාවෝගේ බලය විහිදුවන බවත්, තම උවමනා එපාකම් ගැන පමණක් සිතන ජන කොට්ඨාසවලට කිසිදු බුරුලක් නොදෙන බවත් පියැන්කි විසින් කාටත් පෙන්වන්නට යෙදිනි.

මේ ප්‍රතිසංවිධාන කාලසීමාව තුළ නුබියානු යුද හමුදාව වඩාත් ශක්තිමත් වුවද, දිනපතාම පුහුණුවීම් කටයුතු ද සිදු කෙරිණි. රෝගී වූ හා තුවාල වූ භටයින්ට හොඳින් සුව වීමට කාලය ලැබිණි. ඒ අතර ඔවුන්ගේ සගයින් කාර්යක්ෂමව සේවයේ යෙදෙමින්ම, ඒ ප්‍රදේශයේ වූ සන්සුන් දිවියට පුරුදු වූහ.

කළු පාරාවෝ මධ්‍යම ඊජිප්තුවේ බලකොටු යටත් කරගත් වහාම මෙම්පීස්ට පහර නොදීමට හේතුවූයේ, රාජ්‍යය ස්ථාවර තත්ත්වයට පත්වන තෙක් සිටි නිසාය. දැන් එය ස්ථාවරය. ඉතින්, දැන් රජුගේ සිතුවිලි දිව යන්නේ එකම දෙයක් ගැනයි. ඒ, මෙම්පිස් සටනයි.

ඔහුට තවමත් රාජ්‍යයේ විශාලතම නගරයෙහි ආරක්ෂාව හා ප්‍රාකාර පිළිබඳ ඉතාමත් නිවැරදි තොරතුරු අවශ්‍යය. චරපුරුෂයින්ගේ තොරතුරු එකිනෙකට වෙනස්ය. වාර්තා විශ්වාස කටයුතු නොවීය. ඉතින්, පාරාවෝ එහි වූ අපහසුතා සියල්ල නිවැරදිව නොදැන මේ අනතුරුදායක කටයුත්ත පටන් ගැනීමට සූදානම් නැත.

''උතුමාණෙනි'' කුල්හෙඩ් කීය. ''පෝර්මා වහාම ඔබ හමුවීමට අවසර පතනවා.''

''කැඳවන්න.''

ලේකම්වරයා සිටියේ දැඩි සතුටකිනි. පියැන්කි ඔහුට, නපාටාවට ගොස් තම බිරිඳ හා දරුවන් සමග දින කීපයක් ගත කිරීමට අවසර දී තිබීමයි ඊට හේතුව! වීරයෙකු ලෙස ගෙදරට පිළිගැනුන කුල්හෙඩ්ට පාරාවෝගේ වික්‍රමයන් විස්තර කරන්නට වචන මදිවුවා නිසැකය. කෙසේ වෙතත්, වඩාත්ම අමාරු කොටස ඇත්තේ ඉදිරියේදී බව ඔහු පැවසුවේ නැත. එසේම, නපාටාව දැන් දුෂ්කර පළාතක අගනුවරක් පමණක් බව ඔහු පියැන්කිට පැවසුවේද නැත. ඒ අඳුර මකාගෙන සාරවත් භෝජන සංග්‍රහයක් සූදානම් කර තිබූ ඔටොකු, මහලු කාපා සතුටට පත්වන අයුරින්, වඩාත් හොඳින් නගරය පාලනය කරමින් සිටියේය.

පෝර්මා සිටියේ දැඩි සතුටින් ඉපිලෙමිනි. ''උතුමාණෙනි, මෙන්න අන්තිමේදී, අප බලා සිටි වාර්තාව.''

''අසුන් ගන්න. සිසිල් බීර රස බලන්න.''

මේ වෙලාවේ කුරුමිට්ටා නැවතත් පැමිණියේය.

''උතුමාණෙනි, ලැමසෙක්නිත් ඔබ හමුවීමට අවසර පතනවා.''

මුහුණ පුරා රැවුල වවාගත්, ලී අතක් සහිත මිනිසාගේ කෙටි සාය පොඩි වී තිබිණි. ඔහු ඇතුල් වූයේ දෙපසට වැනෙමිනි. ''මා සිහිනයක් දුටුවා පෝර්මා.'' ඔහු කීය.

''ඔබ තනිව රජු හමුවීමට ගියා. මෙම්පීස්හි බලකොටුව රජුට පෙන්නුවා. බලන්න, ඒ පිළිබඳ සියලු තොරතුරු සොයාගත්තේ මගේ චරපුරුෂයින්. මගේ අවවාදවලට අනුව ජීවිත අවදානමක් ගනිමින්.''

''වහාම අසුන්ගන්න.'' පියැන්කි පැවසීය. ''ඔබ වැටෙන්නට පෙර.''

''ඔබේ අණට උතුමාණනි.'' ලැමසෙක්නි කුඩා පුටුවකට වැටෙමින් කීය.

''ඔබ ස්නානය කරන්නේ නැතිද?'' මහරැජින පොකුණෙන් නැගී විනිවිද පෙනෙන රෙද්දකින් සිරුර මුවා කරගෙන ඇසුවාය.

''මගේ වේදනා දෙන සන්ධිවලට ස්නානය අගුණයි උත්තමාවනි. සටනක් අත ළඟ තිබියදී, රජුගේ පාබල හමුදාවේ අණ දෙන නිලධාරියාට සුළු අවදානමක් හෝ ගත නොහැකියි.''

''මා සිතනවා ඔබ දැනටමත් ඔබේ කොටස පානය කර අවසන්.''

''නැහැ නැහැ උත්තමාවියනි. ග්‍රීෂ්මය එන්ට එන්ටම වැඩිවන මේ වෙලාවේ අප ජලය අපතේ යැවීමට එරෙහිව නොනවත්වාම සටන් කළ යුතුයි.''

''මට මේ ලියවිල්ල පෙන්වන්න.'' පියැන්කි අණ කළේය.

පෝර්මා වියළි මැටි මුද්‍රාව කඩා පැපිරසය දිග හැරියේය.

''මෙම්පීස් සිතියම'' ලැමසෙක්නි සතුටින් හඬ නැගීය.

''නගරය ඉතා විශාලයි.'' රැජින පැවසුවාය. ''එයයි, ගොඩබිම් දෙකේ ආර්ථිකයේ හදවත ලෙස දිගින් දිගටම පැවතුණේ.''

දැඩි සතුටකින් පෝරමා, පැපිරසය මත සඳහන් වූ චිත්‍රලේඛන කියැවීය.

"දකුණු දෙසට, පේරු නෙෆර්හි 'සුබ ගමන්' තොටුපොළට ගොඩබිමින් ඇතිවිය හැකි බලපෑම් නවත්වන ආරක්ෂක ප්‍රාකාර පේළියකි. බටහිර දෙසට, නගරය හා කාන්තාරය අතරින් දියපාරක් ගලා යයි."

"දුර්වල තැනක්." ලැමසෙක්නි කීය.

"එය දුර්වල ලෙස පෙනෙනවා පමණයි." රජු කීය. "ඒ අසල තිබෙනවා බලකොටුවක්, නිරතුරුවම ඔත්තු බලමින්, ආරක්ෂාව සලසමින්. ඒ අතරම ඒ බලකොටුව කුඩා ඇළපාර සමග එක්වන තැන, නිරතුරුවම දුනුවායන් නතර වී සිටින බඩු නෞකාවලින් හරස් කොට තිබෙනවා. එයට පහරදීම පහසු නොවේවි."

එහිදී ලැමසෙක්නි කතා කළේය. "මට තේරෙන ආකාරයට නම්, අපට තිබෙන්නේ නැගෙනහිර දෙසට ඇති නයිල් නදිය පමණයි."

"එයින් ඇළපාරවල් තුනක් ගලා යනවා. පළමුවැන්න තොටුපොළට. දෙවැන්න මාලිගයට. තෙවැන්න උතුරේ පිහිටි ධවල බිත්ති සහිත බලකොටුව දෙසට. එහෙත්, මෙම්පීස් වැසියන් අති විශාල ආරක්ෂක ප්‍රාකාර තනා තිබෙන නිසා, ගංගාවෙන් කිසිම ප්‍රහාරයක් එල්ල කළ නොහැකියි."

"හොඳයි." ලැමසෙක්නි කීය. "අපට හැකියි නැගෙනහිර කාන්තාරය තුළින් නගරය වටලන්න. සක්වාරාහි සුසානභූමි පෙළ දිගේ ගොස් මෙම්පිස්හි උතුරු පෙදෙස අතුගා දැමිය හැකියි. එතැනදී කිසිවෙක් අප බලාපොරොත්තු වන්නේ නැහැ."

"නැහැ...නැහැ... එය කළ නොහැකියි." පියැන්කි කීය. "මුලින්ම අපට සතුරු ප්‍රහාරයන්ට ලක්වෙමින් ඇළ හරහා යාමට සිදුවෙනවා. ඇරත්, උතුරු ආරක්ෂක ප්‍රාකාර, දකුණේ ප්‍රාකාර වලට වඩා පැරණි වුවත් ඒවා ශක්තියෙන් අඩු නැහැ."

ලැමසෙක්නි නොඉවසිල්ලෙන් තම බීර කෝප්පය බීවේය. "එහෙත්... වෙනත් මගක් නැහැ..."

"මේ සැලසුම දෙස බලන විට ඒ බව හැඟෙනවා."

ලැමසෙක්නි, මෙම්පීස් බලකොටුවද අනෙක් ඕනෑම බලකොටුවක් වැනි බවට වාද කරන්නට කැමැත්තෙන් සිටි නමුත්, කරබා ගත්තේය. මෙවර වඩාත් කල්පනාකාරී විය යුතුය. දකුණු හමුදාව ඒ දේශ සීමා හරහා නොයන සැටියකි.

"අප ඔබේ අණ ලැබෙන තෙක් බලා සිටිනවා, උතුමාණෙනි."

පෝර්මා කණගාටුවෙන් පැවසීය.

ඉන්පසු නිලධාරීන් දෙදෙනා පිටව ගියහ.

පියැන්කි බොහෝ වේලා මෙම්පීස් සිතියම දෙස බලා සිටියේය.

''අපට ජයගන්නට ඉතා සුළු ඉඩක් හෝ තිබේ නම්, පෝර්මාත්, ලැමසෙක්නිත් ජීවිත පරිත්‍යාගයකට සූදානම්.'' අබිලා කීවාය.

''මෙම්පීස් ටෙෆ්නැක් අත තිබෙනතුරු ඊජිප්තුව පුරා සාමය හා සාධාරණත්වය බලපවත්වන්නේ නැහැ. මේ නගරයේ ධනවත්කමට පින්සිදු වෙන්ට, ටෙෆ්නැක්ට හැකියි තම හමුදාවට ආයුධ දෙමින් පෝෂණය කරන්නට.''

''එසේ නම් ඔබ අත් හරින්නේ නැහැ. ඒත්, ඔබ ගන්නේ කුමන මගක්ද?''

''එවැන්නක් නැතිනම්, මා එවැන්නක් තනනවා අබිලා.''

# 58

සන්ධ්‍යාව ළං ළංව ආයේය. යෙගෙබ් හා නාට්‍රෙබ්, දවසේ විශේෂ සිදුවීම් ගැන සාකච්ඡා කළහ. මෙම්පිස්හි පදිංචි වූ දා පටන් තම ධනය වැඩි වූ සැටි දකින ඔවුන්ගේ මුහුණු වල මද සිනා නැගිණි. ඔවුන් අළුත් බදු ක්‍රමයක් හඳුන්වා දී තිබිණි. ''යුද්ධය වෙනුවෙන් වූ දායක මුදල් නම් වූ එය සම්පූර්ණයෙන්ම නීත්‍යානුකූල බද්දක් වූ අතර. ඔවුන් තීරණය කරන ඕනෑම ප්‍රමාණයක් අය කිරීමට ඔවුන්ට නිදහස තිබිණි. මුදලට සීමාවක් නොවූ අතර දිළිඳු, ධනවත් භේදයකින් තොරව සියල්ලන්ගෙන්ම එය අය කරන ලදී. නුබියානු ආක්‍රමණිකයන්ට එරෙහිව යා හැකි එකම පුද්ගලයා වු ටෙෆ්නැක් කෙරෙහි වූ ගෞරවය හා විශ්වාසය, එලෙසින්ම පවත්වාගත යුතු වූ හෙයින්,මෙම්පිස්හි ප්‍රභූන් හා වෙළෙඳ ප්‍රජාවට මේ උපදේශකයින් දෙදෙනාගේ ඉල්ලීම් තෘප්තිමත් කිරීමට සිදු විය. ඔවුහු ඒ දෙදෙනාගේ හැකියාවන් හා හෘදසාක්ෂියට එකඟව වැඩ කිරීම බෙහෙවින් අගය කළහ.

''අපි තව කොතරම් කලක් ඩේබ්‍රේක්ගේ ගැහැට විඳිනවද?'' නාට්‍රෙබ්, පිටා දෙවොලෙන් ගෙනෙන ලද ආලේපනයක් තම ඉදිමුනු ඇඟිලිවල ආලේප කර පිරිමදිමින් ඇසීය.

''ඒ ගැහැනිය අප සිතුවාට වඩා ශක්තිමත්.'' යෙගෙබ් කීය. ''ඒත්, ජෙනරල් ඇයව පාලනය කරනවා.''

''හෙට ඇය මහරැජින බවට පත්වේවි.''

''ඔබේ සිත් පීඩාව සාධාරණයි. එහෙත්, වෙනත් අයකු ලවා ඇයට උගුලක් ඇටවීමට නොහැකියි. ඇය ඒ ගැන සැක කරාවි.''

''මේ තත්ත්වය තවත් ඉවසිය නොහැකියි.'' නාට්‍රෙබ් කෝපයෙන් කෑගැසීය. ඔහුගේ සඳවන් මුහුණ කෝපය නිසාම ඉදිමී තිබිණි. ''ඇය අපව පිළිකුල් කරනවා. දිනෙක ඇය අපව විනාශ කරාවි.''

''මට ඒ අනතුර නොදැනෙනවා නොවෙයි.''

කිසිවෙක් දොරට තට්ටු කළේය. ඔවුහු තම ධනය පිළිබඳව තොරතුරු සඳහන් පැපිරසය හකුලා තැබූහ.

නාට්‍රෙබ් දොර විවෘත කළේය. මී මුහුණා එතැන විය.

''හෝ! ඒ ඔබයි. කුමක්ද අවශ්‍ය?''

මී මුහුණා, කුඩා උල් දත් පෙන්නා සිනාසුණි. ''ඔබ මට හොඳින් ගෙවනවා නම්, මට හැකියි ඔබට බොහෝම වැදගත් දේ පවසන්නට.''

නාට්‍රෙබ් ඔහුගේ කර පටියෙන් අල්ලා, ඔසවා කුඩා පොදියක් මෙන් කාමරය තුළට විසි කළේය. ''නළලෙන් ලේ බිඳු වැස්සෙද්දී ඒ කුඩා මිනිහා නැගිට්ටේය.

''පවසනු!'' නාට්‍රෙබ් කීය. ''දූත් පවසනු. ඉන්පසු, යෙගෙබ් හා මා තීරණය කරන්නම් නුඹට ගෙවිය යුතු මුදල. මතක තබාගනු! අප බිය ගන්වා මුදල් ගන්නා කිසිවෙක්, ඒ ගැන පුරසාරම් දොඩන්නට ජීවත් වන්නේ නැහැ.''

දැඩි භීතියට පත් මී මුහුණා කාමරයේ මුල්ලක සැඟවුණි. ''හොඳමයි, උතුමනි හොඳමයි. මා අකනොෂ් බිරිඳ ගැන තොරතුරු සොයන බව දැනගත්, බූරුවන් කුළියට දෙන අයෙක් මට කතා කළා. මට සිදුවුණා ඔහුට ගෙවන්නට. මා...''

''පවසනු!''

''එසේය උතුමාණෙනි. මේ බූරු මිනිහා ඇගේ දෙමාපියන් ගැන දන්නවා. ඇය තරුණ කාලයේ ඔවුන් මියගියා. ඔවුන් බොහොම හොඳ පවුලක්...''

''එපමණ ද? '' නාට්‍රෙබ් අත උරුක්කර ඇසීය.

''නැහැ... නැහැ... උතුමාණෙනි, අකනොෂ්ගේ බිරිඳ, හිරු රැසින් පිළිස්සී ගිය සම ඇත්තියක්, ඔබත් මාත් මෙන්. ඒත් ඇගේ පියා නුබියානුවෙක්.'

''පියා නුබියානුවෙක්?'' යෙගෙබ් පුදුමයට පත්විය. ''තට ඒ විශ්වාසද?''

''ඒ එක සාක්ෂියක් පමණයි උතුමාණනි, තව තිබෙනවා.''

''ඔහුට ගෙවන්න.'' යෙගෙබ් නාට්‍රෙබ්ට කීය. ''මා සිතනවා දූත් අපගේ සියලු ගැටලු වලට විසඳුම අප සතුයි කියා.''

✸

ටෙෆ්නැක් හා ඩේබ්‍රේක්, තුත්මොසිස් මාලිගයේ සයනාගාරයේ යහන්ගතව සිටියහ. ඒ අසල වූ ජනෙල් තුළින් ඔවුනට නයිල් නදිය පෙනිණි. ඩේබ්‍රේක් ගේ පිට පිරිමැද, කොඳු ඇට පෙළ දිගේ ගෙන ආ අතින් ඇගේ වරලස දැඩිව ඇල්ලූ ඔහු, ඇය උඩකුරුව හැරවීය.

"ඔබ වනචාරියෙක්!" ඇය සතුටින් හඬනගමින් තම පෙම්වතා වැළඳගත්තාය.

ඩේබ්‍රේක් වෙත වූ ජෙනරල්ගේ ආශාව කිසිදා තෘප්තිමත් වූයේ නොවේ. ඇය හා ගෙවන හැම මොහොතක්ම ඔහුට ගෙන දුන්නේ දැඩි ප්‍රීතියකි.

"දැන් කුමක්ද පියැන්කි කරන්නේ?" නිහඬව වැතිර සිටින අතරේ ඇය ඇසුවාය.

"ඔහු ගිලෙනවා, මඩ වගුරේ තව තවත් ගැඹුරට. ඔහු වටහාගෙන හමාරයි, ඔහුගේ යුද හමුදාවට මෙම්පිස් ජයගත නොහැකි බව. ඒත් ඔහු කොතරම් අහංකාරද කීවොත්, පරාජය පිළිගන්න තව බොහෝ කල් ගතවේවි."

"ඔහු මධ්‍යම ඊජිප්තුවේ නැවතුනොත්?"

"එය තාවකාලික නැවතුමක් වේවි. ඔහු මෙහි නවතින්නේ නැහැ. ඔහු තීබසය බලා යාවි. එවිට මා නැවතත් පහර දෙනවා. එවිට අර ද්‍රෝහීන් මට සහාය දේවි. ඒත්, මා, ඔහු කළ වරද කරන්නේ නැහැ. ඔහු හොඳ උපායශීලී අයෙක් නොවෙයි. මා ඔවුන් සියලු දෙනා මරා දමා මගේ උපදේශකවරුන් සකස් කරන සැලසුම් හා ක්‍රම අනුව රට පාලනය කරනවා."

ඔහු, ඉදුනු ඇපල් වැනි ඇගේ පියයුරු සිපගත්තේය. "ඔබ සායිස් හඳුනන්නේ නැහැ. මා උපන් නගරය. මා එය පත් කරනවා ඊජිප්තුවේ අගනුවර බවට. හෙට මා ඔබ එහි ගෙනයනවා."

ඩේබ්‍රේක් පුදුමයට පත්වුණාය. "ඒත්, ඔබ මෙහි සිටිය යුතු නොවෙද?"

"මේ ගමන සැලසුම් කළේ බොහෝ කලකට පෙර. එය මේ මෙහෙයුමේ කොටසක්."

"පියැන්කි පහර දුන්නොත්?"

"කලබල නොවන්න. ඔහු එය අත්හැර දමලා, නැතහොත් ඔහු උමතුවෙන්. ඒ උමතු බව අවසන් වන්නේ විනාශයකින්."

''මා කිසිදා සිතුවේ නැහැ ඩෙල්ටාව හා සායිස් දකින්න ලැබෙයි කියා.''

''එය සිත් වශී කරන බිමක්, නයිල් මිටියාවත මෙන් සිය ගුණයක් ලස්සන. මේ ගමනේදී මා මගේ සගයින්ට හඳුන්වා දෙනවා ඔවුන්ගේ රැජින.''

''ඔබ පවසන්නේ...''

''ඔව් ඩේබ්‍රේක්, අප සායිස්හිදී විවාහ වෙනවා.''

✸

පියැන්කි,කාන්තාරය මැදින් අසුපිට යමින් පැය ගණන් ගත කළේය. ඔවුන් යා යුතු මග තෝරා දුන්නේ ඒ අසු, වැලියන්ට්ය. රජු නොනවත්වාම වැලියන්ට් හා කතා කළේය. අශ්වයා ආශා කළේ මෘදු වැලි කතර මගහැර විශාල වැලිකඳු මත කරනම් ගහන්නයි. හිරුට ළංවනතෙක් ඉහළ නැගී, සදාකාලිකත්වයේ හඬින් දෙවියන් කතා කරන, පළිඟු මෙන් පැහැදිලි විශ්වය ආක්‍රමණය කරන්නටයි.

පියැන්කි, දසවරක්, විසිවරක් මෙම්පිස් සිතියම හදාරා, ලැමසෙක්නි හා පෝර්මා සමග සාකච්ඡා කළේය. නගරය යටත් කර ගැනීමට තිබූ ආශාව කොතෙක් වුවද, නිලධාරීන් දෙදෙනාම ඊට ගැලපෙන සැලසුමක් ඉදිරිපත් කිරීමට අපොහොසත් වූහ.

අබිලා නිහඬව සිටියාය. ඇගේ ඉන්ද්‍රජාලය තුළ වුව, ඔවුනට ජයගත හැකි දුර්වල තැනක් සොයන්නට ඇයට නොහැකි විය. නුබියානු කඳවුරේ තත්ත්වය තව තවත් අඳුරින් අඳුරට ගමන් කළේය. මේ කූඩාරම් මාස ගණනක්, වසර ගණනක් මේ ලෙසින්ම, මෙතැනම තිබෙන්නට හැරේවිද? සියල්ලන්ම බලා සිටියේ කළු පාරාවෝගේ අණ ලැබෙන තෙක්ය. පසුබැසීම පරාජයට හේතුවන බව ඔවුහු දන සිටියහ. ඒ ප්‍රතිභා සම්පන්න මධ්‍යම ඊජිප්තු යුද මෙහෙයුම දුන් මිරිඟුවකට වඩා වැඩි දෙයක් නොවීය. ඒ අතර ටෙෆ්නැක් යටතේ වූ උතුරු හමුදාව පෙර තත්ත්වයේම පැවතුණි. කාලය ගතවෙත්ම සියල්ල රජුට අවාසි වන බව පෙනිණි. තීබසය නිදහස් බව සැබෑය. මධ්‍යම ඊජිප්තුව නැවත යටත් කරගෙන තිබිණි. එහෙත්, උතුර ආක්‍රමණය කිරීම සිදුවන්නේ කවදාද? මෙම්පිස්, ටෙෆ්නැක්ට අයිතිව තිබීමෙන් ගොඩබිම් දෙක, රාජ්‍යයේ වස්තුව, හිමිවන්නේ ඔහුටය. රාජ්‍යය පාලනය කිරීමට නම් එය පාලනය කළ යුතුය.

අද, පියැන්කි කිසිවෙකුට නොකියා තව තවත් උතුරට අසු

මෙහෙයවීය. මෙම්පිස් දෙසට! වැලියන්ට් ද ඉබේම වාගේ, වෙහෙසක් නොමැතිව දවස පුරාම ගමන් කිරීම සඳහා, සාමාන්‍ය වේගයක් තෝරාගෙන තිබුණි.

මෙම්පිස්! පුරාණ ඊජිප්තු අධිරාජ්‍යයේ රැජින! ඇ කොයිතරම් ලස්සනද? කොතරම් ශක්තිමත්ද? එහි වූ ගල්දූනු සහ දුනුවායන් රැඳී සිටින ආරක්ෂක ප්‍රාකාරවල දැඩි බව, කෲර බව වැසී යන පරිදි පාම් ගස් වලින් තැනුනු තීරයක් විය. ඒ ආශ්චර්යමත් ජෝසර් විසින් තනවන ලද ධවල බිත්තිය එහි පූජනීය දෙවොල් ආරක්ෂා කළේය. පියැන්කි එහි ගොස් පුරාණ දෙවිවරුන් වඳින්ට ඉතා ආශා කළද, ඒ බිත්තිය කිසිදා නොබිඳිය හැකි බාධකයක් සේ ඔහු ඉදිරියේ නැගී සිටියේය.

කළු පාරාවෝ, පළමු මුරපොළ තෙක් අසු පැදවීය. රජුගේ නළලට ඉහලින් දඟර ගැසී සිටින රන්වන් නාගයින් දෙදෙනා පහර දෙතැයි බියෙන් ගල්ගැසුනු මුරකරුවෝ, වහාම තම ඉහළ නිලධාරියාට පාරාවෝගේ පැමිණීම දැන්වූහ. ඔහු එසැනින්, බලකොටු අණදෙන නිලධාරියාගේ උදවු ඉල්ලුවේය. ඒ වූ කලී, යුධ හමුදා පරිපාලන කටයුතු සඳහා තෝරාගෙන තිබූ ලේකම් වරයෙකි. තම කාර්යාලයෙන් පිටතට පැමිණි ඔහු ආරක්ෂක තාප්පයට නැංගේය. වෙෆ්නැක් නොමැති අවස්ථාවල තීරණ ගැනීම භාරව තිබුණේ ඔහුටය.

කළු පාරාවෝ දුටු ලේකම්වරයා බියෙන් ගල් ගැසුණි.

"මමයි තොපගේ රජු." පියැන්කි හඬ නැගීය. "තොප මට පක්ෂපාතීත්වය දක්විය යුතුයි. මෙම්පිස්, මට සවන් දෙනු! තොපගේ දොරටු නොවසනු! සටන් නොකරනු! ලොව උපන්දා ආලෝකය උපන් භූමියයි මේ! එයට ඇතුල් වන්ට කැමති අයට, ඇතුල් වන්ට ඉඩ හරිනු! පිටව යාමට කැමති අයට පිටවීමට ඉඩ හරිනු! එන යන කිසිවෙකුට බාධා නොකරනු! මා සතුව ඇත්තේ එකම අරමුණක් පමණයි, පිටා දෙවියන්ට, මෙම්පිස්හි ආරක්ෂකයාට බුහුමන් දක්වීම පමණයි. එසේම ඔහුගේ නගරයේ සිටින අනෙක් දෙවිවරුන්ට. දකුණ් පළාත්වල, මා ආවිට එරෙහිව කැරලි ගැසූවන් හැර කිසිවෙක් මියගියේ නැහැ. දොරටු විවෘත කරනු! "

ලේකම්වරයා පිටතට ආයේය. ඔහුගේ විධානයට අනුව මුරපොළේ දොරටු විවෘත කෙරිනි. එහෙත්, පිටතට පැමිණි අශ්වාරෝහක බලඇණියක් ඉදිරියට ගියේ පාරාවෝ යටත් කර ගැනීමටයි!

# 59

එහි අවම වශයෙන් අශ්වාරෝහකයින් පනහක් විය. සියලු දෙනාම සූදානම්ව සිටියේ, ඒ බරපතල කාර්යය කිරීමටයි. නොසැලී, අභියෝගාත්මකව ඔවුන් දෙස බලා සිටින නුබියානු රණශූරයා, කළු පාරාවෝ අධිරාජයා පරාජය කිරීමටයි.

පියැන්කි තම අසිපත ඇද, පළමු සතුරාගේ ගෙල එකම පහරින් සිඳ දැමීය. දෙවැනි අසරුවාගේ හෙල්ල කළු පාරාවෝගේ සිරුරේ ගැවී, නොගැවී ඇදී ගියේය. අවසන් තත්පරයේ පසෙකට ඇලවුණු පාරාවෝ ඔහුට දරුණු පහරක් එල්ල කළ අතර තුන්වැනි ලිබියානුවාද ඔහුගේ පහරින් මැරී වැටුණි.

කළු පාරාවෝ සහ ඔහුගේ අශ්වයා, වේගවත් හා කාර්යශූර වුවද, තම පියාණන් වූ ආමන්ගේ සහාය නොමැතිව ඒ විශාල ගණනක් වූ භටයින් තමා පරදවන බව ඔහුට වැටහුණි. ආමන්! එසේය. සත්‍ය වශයෙන්ම ආමන් දෙවියන් ආකාර දෙකකින් ඔහුට සහායට ආයේය. පළමුවැන්න, තම අතිදක්ෂ පාබල හමුදාව සමග පැමිණි ලැමසෙක්නිය. දෙවැන්න, පෝර්මාගේ අශ්වාරෝහක හමුදාවයි. ලැමසෙක්නිගේ ගල්දුනු සතුරන් සුනු විසුනු කළ අතර පෝර්මාගේ දුනුවායෝ අශ්වාරෝහක කණ්ඩායමේ ඉතිරිය අතු ගා දැමූහ.

ආරක්ෂක ප්‍රාකාර මතින් ඊ වර්ෂාවක් එනවිට, නුබියානුවෝ ආරක්ෂාවෙමින් පසුපසට යාමට සමත් වූහ.

''උතුමාණෙනි, අපට විධානයක් නොලැබුණ නිසා,'' ලැමසෙක්නි කියන්නට විය. ''අප සිතුවා ඔබ පසුපස යා යුතුයි කියා. මට විශ්වාසයි අපගේ සහය නොමැතිව වුවත් ඔබ ඒ බයගුල්ලන් අතුගා දමන බව. එහෙත්, කුමටද උතුමාණනි අනවශ්‍ය ලෙස ඔබ වෙහෙසට පත්කරන්නේ?''

පියැන්කි සිනාසුණි. එහෙත් ඔහුගේ හදවත හඬා වැටුණි. මෙම්පිස් සාමය ප්‍රතික්ෂේප කරයි!

✸

මුළු ඩෙල්ටාවම පුදුමයෙන් වෙළී ගොස්ය. ටෙෆ්නැක් ඊජිප්තුවේ රජු ලෙස පිළිගෙන තිබූ අතර, ඔහු ප්‍රභූ පැළැන්තියක දියණිය වූ ඩේබ්‍රේක් සමග විවාහ වන බවද සියල්ලෝම දැන සිටියහ.

ජයග්‍රාහකයෙකු ලෙස නැගී සිටි ඔහු මෙම්පිස් යටත් කරගන්නට අපොහොසත් වූ පියැන්කිට එරෙහිව කෙරෙන මහා යුද්ධය ගැන වර්ණනා කරන්නට විය. ඔවුන් කළ යුත්තේ පියැන්කි අධෛර්යයට පත් කිරීම පමණි. සදහටම අධෛර්යයට පත් කිරීම පමණි. ඒ සඳහා කළ යුත්තේ ටෙෆ්නැක් ගේ යුද හමුදාවේ භටයින් ප්‍රමාණය වැඩි කිරීමයි. ඔහුගේ පැහැදිලි කිරීමෙන් සියලු අසුභ සිතුවිලි මග හැරුනු අතර ඒ සමගම භටයින් සංඛ්‍යාව ඉබේම වාගේ වැඩි වන්නට විය. මේ අතර කාලයේ ඩේබ්‍රේක් ඉතා සතුටින් සායිස් හි හැම තැනකම ඇවිදින්නට වූවාය. එය නෙයිත් දෙවඟන විසින් වදන් හතකින් මවන ලද නගරය බවයි කියවුණේ. අනාගත රැජිනගේ සුළු අවශ්‍යතාවක් වුව සපුරන්නට වහ වහා ක්‍රියාත්මක වන භක්තිමත් සේවක පිරිසක් ඇය වටා වූහ.

ටෙෆ්නැක් ඇය විසින් නැවත සරසන ලද අමුත්තන් පිළිගන්නා ශාලාවේදී ඈ හා එක්විය. මුලින් එහි තිබූ පැපිරස් හා සංචාරක පක්ෂීන්ගේ රූ රැගත් බිත්ති සැරසිලි වෙනුවට, තම සැමියා අශ්ව රථය පදවාගෙන යන, එයින් නුබියානු සෙබළුන් යටකරගෙන යන රූ ඇයට අවශ්‍ය විය.

''ඔබට සිතුනේ නැතිද මේවා බොහොම...යුදකාමී පින්තූර කියා?'' ඔහු උපහාසයෙන් ඇසීය.

''විශ්වාසයයි අපගේ සොල්දාදුවන්ගේ යුධ ශක්තිය වඩන්නේ. ඒ නිසා මේ මාලිගය තුළත් ඒ විශ්වාසය මුල්බැස තිබිය යුතු නොවේද?''

''ඔබේ කැමැත්තක්. හෙට මා මෙම්පිස් බලා යනවා.''

''මා මෙහි තනිකර?''

''ඔබ නොවෙද අනාගත රැජින? මා නොමැති විට ඔබයි මගේ අගනුවර පාලනය කළ යුතු''

ඩේබ්‍රේක් තම පෙම්වතාගේ දෑස දෙස බැලුවාය. ''මට ඔබේ උපදෙස් දෙන්න. මා සියල්ල නිවැරදිව කරන්නම්.''

✸

මෙම්පිස් ආරක්ෂක ප්‍රාකාරයේ අණදෙන ලේකම් වරයා, ටෙෆ්නැක් ඉදිරිපිට සතුටින් කතා කරන්නට විය.

"ජෙනරල් ටෙෆ්නැක්. අප ඉතා පහසුවෙන් කළු පාරාවෝගේ පළමු හමුදා බණ්ඩය පලවා හැරියා."

"කී දෙනෙකු සිටියාද එහි?"

ලේකම්වරයා උගුර පෑදුවේය. "ඇත්තටම උතුමාණෙනි... සංඛ්‍යාව... එතරම්.... විශාල නැහැ උතුමාණෙනි."

"නිසැකව පවසනු.!"

"මුලදී උතුමාණනි, ඔහු පැමිණියේ තනිව. ඉන්පසු..."

"පියැන්කි එඩිතර වුණා මෙම්පිස් දොරටුව අසලට හුදකලාව එන්නට?"

"උමතු ක්‍රියාවක් උතුමාණනි."

"කුමක්ද තොප කළේ?"

"ඔහුගේ අණ පරිදි මා දොරටු විවෘත කළා. එහෙත්, ඒ අශ්වාරෝහක භට කණ්ඩායම යැවීමටයි! ඒ මොහොතේම නුබියානුවන් ඔහුගේ උදවුවට නොඑන්නට අපට ඔහු යටත් කරගන්න තිබුණා. අප කොතරම් වේගවත් ප්‍රහාර එල්ල කළේදැයි දුටු ඔවුන් පලා ගියා. ඔවුන් නැවත එන්නේ නැහැ, උතුමාණනි."

"කෙසේ වෙතත්." ටෙෆ්නැක් කීය. "අප සුදුසු පූර්වෝපායයන් ගත යුතුයි. මා ඔබට එවනවා අට දහසක භට කණ්ඩායම්. මෙම්පීස්හි එතරම් භට සංඛ්‍යාවක් සිටීම, පියැන්කිගේ ප්‍රහාරය නවත්වන්නට හේතු වේවි. නිසැකවම පරාජය වන බව ඔහු දැනගනීවි."

"ඔබ පවසන්නේ... අප ඔහුට ඒ බව දැන්විය යුතුද?"

"ඇත්තෙන්ම! රාජ දූතයින් අත පණිවුඩ යැවිය යුතුයි. මහජනයාට දැනගැනීම පිණිස, අප සතු භට කණ්ඩායම් සංඛ්‍යාව. ඒ සමගම තවලම් දෙකක් දකුණ බලා යවන්න. නුබියානුවන් නිසැකවම ඒවා නවත්වා තොරතුරු , විමසනවා, වෙළෙන්දන්ගෙන්. එවිට ඔවුන්ගේ පිළිතුරු නුබියානුවන් බියෙන් වෙව්ලා හරීවි."

✸

ඒ ගොවිපොළ, පාම්ගස් ගොනු, ගිණිය නොහැකි තරම් වූ ඇළ දොළ පිහිටි සායිස් ගම්මාන, ඩේබ්‍රේක් වශී කළාය. ඈ ඒ අතරින් පැය

ගණන් ඇවිද්දාය. ඇය සමග සේවිකාවන්ද වූ අතර ඒ දැඩි හිරු රශ්මිය සඟවමින් ඔවුනට සෙවන සපයන කුඩා තුරු වදුළු හැමතැනකම තිබිණි. එසේම ඇය මාලිගයේ සියලුම කාමරවල නිතරම සක්මන් කරමින් සැරසිලි කටයුතු ඉක්මන් කළාය. බිත්ති අළුත්වැඩියා කරන්නන් හා පින්තාරු කරුවන් පැරණි මාලිගය අළුත් වැඩියා කළ අතර, පළපුරුදු විශිෂ්ට ගල් වඩුවන් හා පෙදරේරුවන් නෙයිත් දෙවොල පිළිසකර කළහ.

සන්ධ්‍යාවේ ඩේබ්‍රේක් ඇගේ සියුමැලි සිරුර මඳ උණුසුම් වතුරින් නහවා ගත්තාය. රාත්‍රී ආහාරයට සායිස්හි ප්‍රධාන පෙළේ පුරවැසියෝ ඈ හා එක්වූහ. ඔවුහු ටෙෆ්නැක්ගේ ප්‍රතිපත්ති අගය කරමින්, ඔවුන් වශී කරන ගී ගැයූහ.

එක් සන්ධ්‍යාවක, ඩේබ්‍රේක් රාත්‍රී ආහාරයට අවශ්‍ය දෑ තෝරන්නට වුණාය. එවිට, යෙගෙබ් තම පුද්ගලික කාමරයෙහි සිටිනු දුටු ඩේබ්‍රේක් කෝපයෙන් වෙව්ලා ගියාය. ඈ දුටු ඔහු අශිෂ්ට සිනාවක් පෑවේය.

''වහාම මගේ කාමරයෙන් ඉවත්වනු, වහාම!''

''උත්තමාවියනි, මට සවන් දෙන්න.''

''තගේ මිත්‍ර නාට්‍රෙබ් සොයා යනු!''

''මෙය ඔබට පුද්ගලිකව බලපාන ගැටලුවක් උත්තමාවියනි.''

''කුමක්ද?''

''මා පැවසිය යුතුයි, නාට්‍රෙබ් මෙය නොකරන්නැයි මට අවවාද කළ බව.'' යෙගෙබ් කීය. ''එහෙත් ඔබ කිසිදු කරදරයක වැටෙනු දකින්නට අකමැති නිසා මා කල්පනා කළා ඔබට පවසන්නට ඉදිරියේදී ඇති විය හැකි කරදරය ගැන. විනාශය ඇති වීමට පෙර සුබ සිහින දැකීම නැවැත්වීම සුදුසු නොවේද, උත්තමාවනි.?''

''කුමන අනතුරක් ගැනද තා පවසන්නේ?''

''ඔබ උපන්නේ රට පාලනය කිරීමට නොවෙයි, උත්තමාවියනි. ටෙෆ්නැක් අතහැර පිටව යන්න.''

''තා උමතුවෙන්.'' ඩේබ්‍රේක් කෑ ගැසුවාය.

''මගේ උපදෙස් පිළිපදින්න. නැතහොත් ඔබට ඒ ගැන පසුතැවෙන්නට වේවි.''

ඩේබ්‍රේක් විශාල රිදී බඳුනක් ඔසවා ඔහුට පහර දුන්නාය. ඔහු පැන දිවීය. ඇය ඔහුගේ බිය ගැන්වීම අමතක කරන බවත්, ඔහුගේ

සැලසුම් ක්‍රියාත්මක වීම නැවැත්වීමට ඇයට නොහැකි බවත් යෙගෙබ්ට විශ්වාසය. ඔහු ඊට සූදානම්ය. ජයග්‍රහණය භුක්ති විඳින්නට පෙරම ඇය වදයට පත් කිරීමට ඔහු සූදානම්ය! එයින් ඔහුටත් නාට්‍රෙබ්ටත් කොතරම් සතුටු විය හැකිද?

✸

දවස ගෙවී යන්නට ආසන්න වුවද, අවට උණුසුම ඉතා දැඩිය. නයිල් නදියේ ජල මට්ටම පහළම මට්ටමට වැටී තිබූ අතර ඉහළ භූමිය වියළී ඉරිතලා ගොස්ය.

වැඩියෙන් බීර බීවද, ලැම්සෙක්නි තවමත් පිපාසයෙනි. මෙම්පීස් සිට පැමිණි වෙළෙන්දාගෙන් ප්‍රශ්න කිරීම තවමත් අවසන්ව නැත.

''උතුමාණෙනි'' ඔහු පියැන්කිට කීය. ''මෙමපීස් යුද හමුදාවට සහායට, භටයින් අටදහසක් එවා තිබෙනවා. ඔවුන් ඩෙල්ටාවේ පළාත්වලින් එන ලිබියානුවන්.''

''එය සත්‍යයක්ද?''

''එසේය උතුමාණනි, එපමණක් නොවෙයි, නගරයේ ධාන්‍යාගාර තිරිඟු සහ බාර්ලිවලින් පුරවා තිබෙනවා. අශ්වගාල් හොඳින් රැක ගන්නවා. ආයුධ ගබඩා පිරී තිබෙනවා.''

''එසේනම්, මෙම්පීස්ට හැකියි දීර්ඝ කාලයක් වුවත් වටලෑමකට මුහුණ දෙන්නට.''

''අපට නගරය කුසගින්නේ තැබිය නොහැකියි. එහි ආරක්ෂාව අඩු කරන්නටද නොහැකියි.''

කළු පාරාවෝ නයිල් නදිය දෙස බලා සිටියේය. ''පාරාවෝ කෙනෙකුට තමාගේ කරදරවලට විසඳුම් සොයාගත් නොහැකි නම්,'' ඔහු කල්පනාකාරීව කීය. ''සමහර විට ඔහු දෙව්ලොව, මහපොළොව වෙත කැඳවිය යුතුයි.''

# 60

සායිස්හි දොරටුවෙන් ඇතුල්වන ටෙෆ්නැක් කල්පනා කළේ තම විවාහ මංගල්‍යය ගැනයි. එය ඉතා මනරම් අවස්ථාවක් වනු නිසැකය. දහස් ගණනක් අමුත්තන් සහභාගි වන ඒ උත්සවයේ මතක සටහන් ශත වර්ෂ ගණනාවක් කතාබහට ලක්වනු ඇත. ඩේබ්‍රේක් ගැන ඔහු තුළ දැඩි ආදරයක් තිබූ නමුත්, ඔහු කිසිවිට ආශාවට තමා පාලනය කරන්නට ඉඩ දුන්නේ නොවේ. ඇයද තමා තරමටම බලයට ආශා කරන බව ඔහු දැන සිටියේය. ඇය ඊජිප්තුවන්ගේ හදවත දිනා ගන්නවා පමණක් නොව, ඔහුට උරුමක්කාරයෙකු ද ලබා දෙනු ඇත.

උත්සව සමය අවසන් වූ වහාම, මෙම්පිස් බලා ආපසු ගොස්, බලකොටුවේ හටයින් අමතා, දැනටමත් ලබා ඇති ජයග්‍රහණය සත්‍ය වශයෙන්ම ලබා ගන්නට ටෙෆ්නැක් පොරොන්දු වනු ඇත. මෙම්පිස් බලකොටුව බිඳ හෙළිය නොහැකි නිසා පියැන්කි කිසිවක් නොකරනු ඇත. කළු පාරාවෝගේ හට කණ්ඩායම් වල චිත්ත ධෛර්යය දැනටමත් දුර්වලව ඇත. පසුබසින්නට සිදු වූ විට ඔවුන්ට නැවත සටන් කිරීමට හැකියාවක් නොලැබෙනු ඇත.

සටනට ඇති ආශාව සේ ම, ටෙෆ්නැක්ට ඉවසීමේ ශක්තිය හා ඒ කාලය තම වාසියට යොදා ගැනීමේ හැකියාවද තිබුණි. ඔහුගේ නිරවුල් චින්තනය ඉක්මනින්ම ජයගනු නියතය.

✸

මෙම්පිස් වටලෑම, පියැන්කි තමාට යම් තරමක හෝ ජයක් ලැබේයයි සිතන දවස දක්වා කල් යනු ඇත. ඒ නිසාම, අකනොෂ් තම බිරිඳ සමග සෙබෙනිටොස් පළාතේ දින කීපයක් ගත කිරීමට තීරණය කර තිබුණි. යුද්ධය නමැති අවතාරය ඔවුන් වෙතින් ඈතට, ඈතට යමින් තිබිණි. බලාපොරොත්තු කඩවන කළු පාරාවෝ දකුණ බලා ගමන ආරම්භ කළ විට, අකනොෂ් උතුරු හමුදාවට එක් නොවී ඩෙල්ටාවේම රැඳෙනු ඇත. මහලු රණවිරුවාගේ හදවතින් යුද්ධයට ඇති කැමැත්ත සදහටම

සිඳී ගොස්ය. ඔහු සටන් වලින් බොහෝ ඈත පිහිටි නිසංසල බවට ආදරය කරන්නට පටන් ගෙන තිබුණි.

කුමරාගේ සේවකයින් ඔහුගේ බඩු ඇහිරීම අවසන් කරත්ම නාට්‍රෙබ් දිව ආවේය. ඔහු සමග ආරක්ෂකයින් විසි දෙනෙක් මුගුරු රැගෙන පැමිණියහ.

''තොප උමතුවෙන්ද?'' අකනොෂ් ඇසීය. ''වහා මෙතනින් පිටවෙනු!''

''අප යුද්ධයක කුමරුනි, ටෙෆ්නැක්ට පක්ෂපාතී වීමයි නීතිය!'

''මා නීතිය බිඳ දමා තිබෙන බවටද තා සැක කරන්නේ?''

''නැහැ. ඔබ නෙවෙයි. ඔබේ බිරිඳ?''

අකනොෂ් ඔහුට දැඩි අතුල් පහරක් එල්ල කළේය. ''මෙතැනින් ඉවත්වනු, පණුවා!''

උපදේශකයාගේ තොල් කෝපයෙන් ඉදිමී ගියේය. ''මා සතුව සාක්ෂි තිබෙනවා,නුඹේ බිරිඳ නුබියානුවෙකු බවට. ඒ හේතුවෙන් ඇය පියැන්කිගේ මිත්‍ර පාක්ෂිකයෙකු බවට. ජෙනරල්ගේ අණ, වහාම ඇය ඔහු හමුවට යා යුතු බවයි.''

''පිළිගන්නේ නෑ..,''

නාට්‍රෙබ් කෝපයෙන් සිනාසුණි. ''ඔබ ප්‍රතික්ෂේප කරනවා නම්, මා බලය යොදනවා.''

''කුමන අයිතිවාසිකමකටද?''

''ටෙෆ්නැක්ගේ අණ!''

✸

ඒ වනවිටත් ඇගේ නින්ද අතරතුර නපුරු සිහින හොල්මන් කළද, ඩේබ්‍රේක් සිටියේ සතුටිනි. හෙට ඇය ටෙෆ්නැක්ගේ බිරිඳ වනු ඇත. එවිට ඇය, තම රට යළිත් වරක් එක්සත් කරන්නට සහාය වනු ඇත. යුද්ධය නිසැකවම දැඩි වේදනාවක් ගෙනෙනු ඇත. එහෙත්, කළු පාරාවෝගෙන් ගැලවෙන්නට අන් මගක් නැත. පියැන්කි පරාජය වීම ස්ථිර වුවද, ඔහු අවසානය දක්වාම සටන් වදිනු ඇත. ටෙෆ්නැක් ඒ යුද්ධය අරඹන විට, ඔහුට ඩේබ්‍රේක් ගේ සහාය අවශ්‍ය වනු ඇත. ඔහුගේ අත දුර්වල නොවූ බව පෙන්වමින් ඇය ඔහුට සහාය වනු ඇත.

ඩේබ්‍රේක්ගේ සේවිකාව ඇගේ හිස මත, අලංකාරව ගොතන ලද බොරු කොණ්ඩයක් තැබුවාය. නියම මිනිස් කෙස් යොදා තනන ලද එය මිල කළ නොහැකි වස්තුවක් වූ අතර, තරුණියගේ මුහුණට ඉන් වඩාත් සෞම්‍ය බවක් එක්කොට, උසස් කාන්තාවකගේ පෙනුම ලබා දී තිබිණි.

ඊජිප්තුවේ දක්ෂතම වියන්නිය වූ සායිස් හි පෙහෙකම්හලේ ප්‍රධානී, රාජකීය ලිනන් යොදා ඇගේ මංගල සිවුර වියා තිබිණි. ඇය,අසිරිමත් මනාලියක වනු ඇත.

"උත්තමාවියනි, ඔබ සැරසෙන්න සූදානම්ද?" සේවිකාව ඇසුවාය.

"නවතනු!" ඒ යෙගෙබ්ගේ පිළිකුල් සහගත හඬයි.!

ගෝනුස්සකුගෙන් පහර කෑ කලෙක මෙන් ඩේබ්‍රේක් හැරී බැලුවාය. "මා තට පැවසුවා මට කරදර නොකරන්නැයි කියා."

"ජෙනරල් ටෙෆ්නැක් ඔබ හමුවීමට බලා සිටිනවා, වහාම."

"මා සැරසී අවසන් නැහැ."

"ඔහු පැවසුවා වහාම කියා."

"කුමක්ද සිදුව ඇත්තේ? බරපතල යමක්.."

"මා දන්නේ නැහැ, උත්තමාවිය."

ඩේබ්‍රේක් බිය වූවාය. පියැන්කි මෙම්පිස්ට එරෙහිව සමූල ඝාතනයක් කරන්නට සූදානම්ද? යටගවුම සහ කෙටි සායෙන් පමණක් සැරසුන ඇය වහ වහා පිටත් වූ අතර යෙගෙබ් කොර ගසමින් ඈ පසුපස දුවන්නට විය.

ඇය ටෙෆ්නැක්ගේ කාමරයට ඇතුල් වූවාය. ජනෙල් තිර ඇදීමෙන් අඳුරු වූ එතුළ ඇයට දැනුණේ දැඩි පීඩනයකි. ටෙෆ්නැක් කාමරය තුළ සක්මන් කරමින් සිටි අතර, ලේකම්වරයෙකු සේ ඉඳගෙන සිටි නාට්‍රෙබ්, දෑත් බැඳගෙන හිටගෙන සිටි අකනොෂ් කුමරු දෙස බලා සිටියේය.

"අන්තිමේදී ඔබ පැමිණියාද?" ටෙෆ්නැක් ඇසීය.

"මට වැඩ අධිකයි." ඩේබ්‍රේක් කීවාය. "කුමක්ද මෙහි සිදුවන්නේ?"

ටෙෆ්නැක් අකනොෂ්ට ඇඟිල්ල දිගු කළේය. "ඔබ මේ මිනිහා දන්නවාද?"

"ඔව්,හොඳින් දන්නවා."

"ඔබට ඒ ගැන විශ්වාසද ප්‍රේමනීය ඩේබ්‍රේක් ?"

"මට...තේරුම්ගත නොහැකියි."

"මාත් සිතුවා මා ඔහු හඳුනනවා කියා. එපමණක් නෙවෙයි, මා සිතුවා ඔහු මට කිසිදා ද්‍රෝහී නොවන හිතවතෙක් කියා."

තරුණිය ගල් ගැසුණාය. "නැහැ. අකනොෂ් කුමරු! කිසිදා නැහැ."

"නැහැ. නැහැ. ඔහු නොවෙයි." ටෙෆ්නැක් කීය. "ඔහු නොවෙයි, ඔහුගේ බිරිඳ. ඔහුගේ නුබියානු බිරිඳ. නුබියානු! ඔබ දන්නවාද එහි තේරුම? පියැන්කිගේ හිතවතෙක්. මගේම මේ මාලිගයේ රැඳී සිටිමින්!"

"මමයි, මා තනිවයි!" අකනොෂ් කෝපයෙන් කෑ ගැසීය. "මා තනිවම, මගේ බිරිඳ මේ තුච්ඡ චෝදනා වලින් නිදහස් කරගන්නවා. දෙමාපියන් නුබියානුවන් වූ පමණින් ඇය ද්‍රෝහියෙකු වන්නේ නැහැ. ඇයත්, මාත් පවසන දෑ, තම පසුම්බිය තර කර ගැනීම ගැන පමණක් සිතන මේ උපදේශකවරුන්ගේ චාටු බස්වලට වඩා විශ්වසනීය නොවන්නේද?"

"අවාසනාවට මෙන්," යෙගෙබ් කීය. "අපට තිබෙනවා සාක්ෂි ඇගේ වරද ඔප්පු කිරීමට"

අකනොෂ් දෑත මිට මොළවා සෙලවීය. "බොරු, තොප පවසන සියල්ල බොරු."

"අපගේ සොල්දාදුවන්ට හමුවුණා ලිපියක්, ඔබේ බිරිඳ ප්‍රධානම සැකකාරිය වන, ලිපිය ඔප්පු කර පෙන්වනවා ඇය අතරමැදියෙකු බව. සත්‍යයක්, ඔබ එය නොදන සිටීම නම්"

"අතරමැදියෙක්? කාටද ඇගේ සේවය?" ඩේබ්‍රේක් ඇසුවාය.

ටෙෆ්නැක්ගේ දෑස, ඇගේ දෑස තුළ එබී ගියේය. "දැන් මේ රඟදැක්වීම නවතනු.!"

"රඟදැක්වීම? කුමක්ද පවසන්නේ?"

ඔහු ඇගේ දෑත කෙතරම් තදින් මිරිකා ගත්තද යත්, ඈ සිතුවේ දෑත බිඳී යතැයි කියාය. "තී, තී! ඒ ලිපිය ලියූ යක්ෂණිය. තී... මට ද්‍රෝහී වුණා, තී මා පිළිකුල් කරන නිසා. තිට එක්වරක් මා මරා මරන්නට අවශ්‍ය වුණා මතකද? තී මෙවර තිගේ පළිය ගන්න සූදානම් වුණා."

"වැරදීමක්, මා දිවුරා සිටිනවා. ඔබට වැරදීමක්."

"මා ඒ අත් අකුරු හොඳින් හඳුනා ගත්තා. ඒ ඔබගෙයි."

පියවරක් පසුපසට තැබූ ටෙෆ්නැක් තම සිරිය ඇදගත්තේය. එහි තුඩ ඇගේ ගෙල සිදුරු කරත්ම ඉත් ලේ බිඳුවක් වැස්සෙන්නට විය.

"මට නී මරා දමන්ට අවශ්‍යයි. බැල්ල! එහෙත් සෙමෙන් මිය යාමයි වඩා හොඳ දඬුවම. පැයෙන් පැය ගෙවෙන විට නිගේ තරුණ කම හා රුව නිට අහිමි වේවි."

ටෙෆ්නැක්ගේ දෙපා මුල වැටී අනුකම්පාව යදින්නට ඇයට ඕනෑ විය. එහෙත්, ඒ වෙනුවට ඇය ඔහු ඉදිරිපිට සිටගත්තාය. "ඔබ මට ආදරය කළා නම්, ඔබ සත්‍යය දැකිය යුතුයි."

"මැය ගෙනයනු!" ඇය ඉවතට ඇදගෙන යාමට පුල පුලා බලා සිටි උපදේශකවරුන්ට ඔහු කීවේය. ඔවුහු ඇය ආරක්ෂකයින්ට භාර කළහ.

අකනොෂ් කුමරු හා තනිවූ ටෙෆ්නැක්, සිදුවී ඇති දේ ගැන පැහැදිලි කරන්නට විය. "මා මෙන්ම ඔබත් රැවටීමට ලක්වුණා. බිරිඳගෙන් වෙන්වන්න. වහාම!"

"මට ඇය විශ්වාසයි." අකනොෂ් කීය. "මා දන්නවා ඇය ද්‍රෝහි කමක් නොකරන බව."

"බලන්න අකනොෂ් සාක්ෂි, එය වේදනාකාරී වුවත්. අපට හසු වූ ලිපිය. එය ඔප්පු කරනවා නුඹේ නුබියානු බිරිඳගේ සහාය ඇතිව ඩේ බ්‍රේක් ඉල්ලා සිටි බව බලකොටුවේ අණදෙන නිලධාරියාගෙන් ඔවුනට අවශ්‍ය දේ. කුමක්ද? පියැන්කිට බලකොටුවේ දොරටුව විවෘත කර දෙන ලෙස. වහාම පියවර ගන්න. එසේ නොකළොත් ඔබට ජීවිතයෙන් වන්දි ගෙවන්නට සිදුවේවි."

# 61

කුල් හෙඩ්ට නිහඬව සිටිය නොහැකිය. ඔහු දිනකට දස වරක් වත් තම සගයින්ගෙන් විමසූ කරුණක් විය. "දකුණේ පණිවුඩකරු පැමිණියාද?"

පියැන්කි ඇසිපිය නොහෙළා ගංගාව දෙස බලා සිටියේය. ඒ සිතුවිලිවල අතරමං වූ ඔහුට මෙම්පිස් අමතක විය. ඒ හිරු එළියේ දිදුළන ධවල බලකොටුව අමතක විය.

අන්තිමේදී පණිවුඩකරු පැමිණියේය. ඔහු අත තිබුණේ ස්වෙනෙට් හි විශේෂඥයන් විසින් අඳින ලද ලී පුවරුවකි.

පියැන්කි, සිතුවම් ගහණ ලී පුවරුව කියැවීය.

"කෙසේද උතුමාණෙනි?" කුල් හෙඩ් ඇසීය.

"විශිෂ්ටයි. ආමන් මගේ ආයාචනයට පිළිතුරු දී තිබෙනවා."

"කෙතරම් කලක් අප ඉවසා සිටිය යුතුද උතුමාණනි?"

"දින කිපයක් පමණයි."

මේ සුළු ප්‍රමාදය ප්‍රමාණවත්ය. පියැන්කි; ලැමසෙක්නි, පෝර්මා සහ කර්මාන්තකරුවන් කැඳවා අවශ්‍ය උපදෙස් දුන්නේය. ඔවුනට තිබූ රාජකාරිය වූයේ, ඉනිමං සෑදීම,වේදිකා තැනීම හා සෑම ප්‍රමාණයකම බෝට්ටු සූදානම් කිරීමයි. අවශ්‍ය විටෙක වන්දි ගෙවීම සඳහා අයිතිකරුවන්ගේ නාමලේඛනයක් සකස් කිරීමටද අවශ්‍ය විය.

ගංගාව ඉදිමී ගොස්,රැළි නගා ඉවුරුවලට පහර දෙන අන්දම කළු පාරාවෝට පෙනිණි. නව වසර අරඹන්නට ඇයද සැරසෙන සැටියකි. ගංගාව පරීක්ෂා කළ ස්වෙනෙට්හි විශේෂඥයින් අනාවැකි පළකර තිබූ අන්දමට ඉතා ඉක්මනින් ඉදිමී යන නයිල් නදිය, ආශ්චර්යමත් ජලගැල්මකින් ඊජිප්තුව අති විශාල වැවක් බවට පත් කරනු ඇත. සාරවත් රොන්මඩ, ඒ භූමිය පුරා තැන්පත් කරනු ඇත. එය රියන් විසි දෙකක් තරම් ඉහළ නගිනු ඇත.

මහ පොළොව කෑදර ලෙස ජලය උරා ගනී. ඇළවේළි ඒ ජලකඳ

උතුරවා හරී. ගං ඉවුරු අසල සුළි කැරකෙයි. ඒ රැල්ල පණුවන් ගිල්වා දමන අතර සර්පයින් හා ගෝනුස්සන් කාන්තාරයට පැන යති. ඉක්මනින් කුඩා ගම්මාන පමණක් ඉතිරි කර සියල්ල ජලයේ ගිලී යනු ඇත. අයිසිස් දෙවඟන ඔසිරිස්ට නැවත ජීවය දුන් බව සනිටුහන් කරමින් සොතිස් තාරකාව පායා තිබිණි. ඒ සමගම ජල ගැල්මට අධිපති දෙවියන් වූ හාපි දැඩි උද්‍යෝගයෙන් තම කාර්යයය ඇරඹීය. ජලකඳ රට යට කරගෙන ගලා ගියේය.

පියැන්කි, ගංගාවට චාරිත්‍රානුකූල පූජාවන් පවත්වන ලෙස අබිලාට දන්වීය. ගංගාව ඔහුට තම සහය පුදන්නේ එවිටයි.

''අවසන් වරටත් මගේ උත්සාහය මරණ දහස් ගණනක් වළක්වන්නටයි.'' ඔහු කීය.

''මාත් ඔබේ නිලධාරීනුත් මීට එරෙහියි, උතුමනි,'' ඇය තැවුල් සිතින් කීවාය.

පියැන්කි ඇය වැළඳ ගත්තේය. ''සමහර වෙලාවට මිනිසුන් තම උමතු ක්‍රියාවන් අත් හරිනවා. මා ඊට උත්සාහ කළ යුතුයි. ඔබ එය දන්නවා.''

✸

කළු පාරාවෝ ඒ ප්‍රභූ පෙනුමෙන් යුතු වැලියන්ට් පිට හිඳ සිටියේය. ඒ දෙදෙනාගේම ඇස් ආරක්ෂක ප්‍රාකාරය වෙත එල්ල වී තිබිණි. ඒ මොහොතේ, බලකොටුවේ අණදෙන නිලධාරි ඒ මත පෙනී සිටියේය.

''මේ නගරය මගෙයි!'' රජු ගර්ජනා කළේය. ''වහාම දොරටු විවෘත කරනු. එවිට මෙම්පිස් වැසියන් නිදහස් වනු ඇති. සොල්දාදුවන් මට පක්ෂපාතිත්වය පෙන්වූ විට, මට ඔවුන්ගේ අකීකරු කමට සමාව දිය හැකියි!''

''ආපසු යනු නුබියානුවා! මා සතු හටයින් සංඛ්‍යාව තට වඩා වැඩියි. තට මගේ ප්‍රාකාරය සූරා දමන්නට හෝ නොහැකියි.''

ඒ මොහොතේ,පියැන්කිගේ හිසේ ගැවී නොගැවී ඊයක් ඇදී ගියේය. කළු දිවියෙකු සේ ගර්ජනා කළ ඔහුගේ කෝපය මෙම්පිස් බලකොටුව සිහිසුන් කරවන තරම් විය.

''මගේ පියාණන් වන ආමන්ගේ අණට'' ඔහු ගර්ජනා කළේය. ''මා කුණාටුවක් සේ මේ නගරය බිමට සමතලා කරනවා.''

කළු පාරාවෝ තම අසු ආපසු හැරවීය. උතුරු හමුදාවේ දුනුවායන් සිහි එළවාගෙන ඊතල මුදාහරින විට, ඔහු ඔවුන්ට පෙනෙන මානයේ සිටියේ නොවේ.

✸

අළුත් දවසකට හිරු උපදින විට විවිධ ප්‍රමාණයේ බෝට්ටු එකට ඇඳා තනන ලද, අති විශාල ජංගම පාළම් නයිල් නදිය දිගේ මෙම්පිස් ප්‍රාකාරය අසලට යාත්‍රා කොට තිබිණි. ජලගැල්ම, නදී දිය කෙතරම් ඉහළට ඔසවා තිබිණිද යත්, ආරක්ෂක ප්‍රාකාරයෙහි පෙනෙන්ට තිබුණේ රියන් කීපයක් පමණි. එහි ළඟා වූ බෝට්ටු මත සිට තබන ලද ඉනිමං මත නැගී දුනුවායෝ සටන ඇරඹූහ.

පෝර්මාගේ හටයින් උතුරු හමුදාවට වඩා බෙහෙවින් වේගවත්ය. ඊයක් වැදී සතුරකු බිම වැටෙන ප්‍රමාදයට ඔවුන්ගේ අත ඊළඟ ඊයට ඇදී ගියේය. සහායකයෝ නිරතුරුවම ඊ කොපු, ඊතලවලින් පිරවූහ.

''ඉදිරියට, මෙම්පිස් වෙත!'' කළු පාරාවෝ අණ දුනි. ඔහුගේ කෝපය සියලු හමුදා හටයින් තුළද වැඩී තිබිණි. ''නයිල් නදිය මේ ප්‍රාකාරය පරාජය කළා.අපි ඒවා පසුකර යමු. කිසිදු සතුරකුට අප නැවැත්විය නොහැකියි.''

පියැන්කි පැවසූ කුණාටුව; ලැමසෙක්නි ගේ පාබල හමුදාව, නොකඩවාම ප්‍රහාර එල්ල කළේය. ඔවුහු ආරක්ෂක ප්‍රාකාර යටත් කරගත් අතර, කළු පාරාවෝගේ අණින්, නැව් පන්තිය තොටුපොළට පහර දුන්නේය.

තොටුපොළ ආරක්ෂකයෝ දකුණු හමුදාවට පහරදීමට අසාර්ථක උත්සාහයක යෙදුනහ. ඒ වන විටත් දකුණු හමුදාව, යන්තමට ජල මට්ටමට ඉළින් තිබූ දොරකඩ සහිත නිවෙස් වෙත ළං වෙමින් සිටියේය.

ලැමසෙක්නි කොතරම් ශක්තිමත්ව සටන් කළේද යත්, තම පාදය තුවාල වූ බව හෝ ඔහුට නොදැනිණි. කෙසේ වෙතත්, ඔහු හති අරින අතරේ වෙදදුරෙක් තුවාලයට මී පැණි සැරහුමක් දැමීය. වේදනාව අඩුවිය. තුවාලය ඉක්මනින් සුව වනු ඇත.

''අදයි මගේ දිවියේ වඩාත්ම සතුටු දවස.'' ලැමසෙක්නි කීය. ''කවුරුද විශ්වාස කළේ අප දිනක මෙම්පිස් ජයගන්නා බව?''

''සත්සුන්වත්ත තිලධාරිතුමනි. වෙළුම් පටිය ගැලවේවි.''

''ඉක්මන් කරනු! මට ඒ ධවල බිත්තියෙන් ඇතුල්වන පළමුවැන්නා වීමට අවශ්‍යයි. මා ඒ ගෞරවය කිසි විටෙකත් පෝර්මාට දෙන්නේ නැහැ නැහැමයි.''

වෙහෙසට පත් නොවන නුබියානු දුනුවායෝ, අවසානය දක්වාම සටන් කළහ. පෝර්මා තම භටයින් දැඩි වගකීමකින් මෙහෙයවූ බව, ලැමසෙක්නිට හදවතින්ම පිළිගන්නට සිදුවිය.

අණදෙන නිලධාරීන් දෙදෙනා, එකිනෙකාට අත් වනමින් මිනී විසිරී ගිය ආරක්ෂක ප්‍රාකාරය මත නැගී මෙම්පීස් දෙස බැලූහ. පියැන්කි අසු පිටින් බැස, නගර දොරටුවෙන් ඇතුල් වී පිටා දෙවොලට දිවෙන මග දිගේ යනු ඔවුනට පෙනිණි. භීතියට පත් නගර වැසියෝ හිස් ලූ ලූ අත දුවමින්, කාගේ අණට යටත් විය යුතුදැයි නොදත්, ඔවුන්ගේම සොල්දාදුවන් ගත් මග අනුව ගියහ.

තම භටයින් අවශ්‍ය තරම් වේලාවක් විවේක ගත් බවට තීරණය කළ ලැමසෙක්නි, කළු පාරාවෝගේ මග පිරිසිදු කිරීම් වස් ඔවුන් එහි යැවීය. ඒ අතිවිශාල දොරටු හා බැලුම් කුලුනු මත සිට පහළට බසින නුබියානු භටයින්ගේ ජයඝෝෂා දසත ඇසෙන්නට විය. ඔවුහු බැරැක්ක තුළට, ලේකම්වරුන්ගේ කාර්යාල වලට,පැපිරස් ගබඩාවල හා අණදෙන නිලධාරිගේ නිවසට කඩා වැදුණහ. ඔවුන්ගේ ගමන නවත්වන්නට තැත් කළ සියල්ලෝම, අසිපතට, පොරෝ පහරට හෝ මුගුරට තම දිවි පුද කළහ.

හදිසියේම තමා වෙත ඉලක්කය ගන්නා දුනුවායකු දුටු නමුත්, ඉවතට හැරෙන්නට තරම් වේලාවක් නොවූ ලැමසෙක්නි ඊට මුහුණ දුන්නේය. ඊය ඔහුගේ වම් කලවයේ වැදී ඔහුගේ ගමන නැවැත්විය. ඔහුගේ භටයින් වහා ඔහු වටා රැස්වූහ.

"මට සුවඳ ලාටු දෙන්න." ඔහු අණ කළේය.

ලැමසෙක්නි තම කිරිච්චියෙන් තමාගේ ම මස් ඉරා ඊතලය පිටතට ගත්තේය. තුවාලය විෂබීජ නාශකයකින් සේදුවේය. වහා ඉදිරිපත් වූ වෙදදුරු, තුවාලය මත තැබීමට විකොරි මුලක් දුන්නේය. ඊළඟට එයට සුවඳ ලාටු සැරහුමක් යොදන ලදී. ඉන් වේදනාව අඩු වූ අතර තුවාල ඉක්මනින් සුව වනු ඇත.

ලැමසෙක්නි පිටව ගියේ, පෝර්මා විසින් මරා දමන ලද දුනුවායාගේ සිරුර දෙස තෘප්තිමත් බැල්මක් හෙළමිනි.

"ඔබ මහලු වෙනවා." පෝර්මා ඔහුට කීය. "ඊලඟ වාරයේ..."

"ඊලඟ වාරයේ අප ජය ගන්නවා, අද මෙන්ම.කුමටද අප බිය විය යුතු? ගංගාව තම සගයා කරගත් රජෙකුට සේවය කරන අප?"

සමූල ඝාතනයක් සිදුවෙතැයි බිය වූ පුරවැසියෝ, ඉතිරිව සිටි උතුරු හමුදාවන්ට යටත් වන ලෙස බල කරන්නට වූහ. අවසානයේ ඉතිරිව තිබුණේ ධවල බිත්ති සහිත පුරාණ බලකොටුව පමණි. තම අණදෙන නිලධාරීන් දෙදෙන දෙපසින් සිටියදී එහි ගිය පියැන්කි ඉදිරියට, ආරක්ෂකයින්ට අණ දුන් ලේකම්වරයා රැගෙන එන්නට යෙදිනි.

''අවසානයේ දී තා යටත් වීමට එකඟද?'' රජු ඇසීය.

''එසේය උතුමාණෙනි. ඔබට ආචාර දක්වන්නට මට ඉඩ දෙනු මැනවි.'' ලේකම්වරයා රජු ඉදිරියට ගියේය. ආචාර කරන මුවාවෙන් ඉදිරියට නැමෙන ඔහු, තම කමිස අත තුළින් ඇදගන්නා දෙපැත්ත මුවහත් කිරිච්චිය පාරාවෝගේ පපුවට එල්ල කළේය. එහෙත්, එය වැදුණේ පාරාවෝ රැක ගැනීමට වහා ඉදිරියට පිනූ ලැමෙසෙක්නිගේ ලී අතටයි. ඒ සමගම බියෙන් වෙව්ලා ගිය ලේකම්වරයාගේ හිස, ඒ අතින්ම වැදුනු ප්‍රහාරයෙන් දෙපළු විය.

''මා...මහලු වෙනවා නොවෙද?'' ලැමසෙක්නි, පෝර්මාට කීය. ''දුටුවාද? මා පාරාවෝගේ දිවි බේරාගන්ට බැරි තරමට මහලු නැහැ!''

හදිසියේම කුඩා මාවත් සහ වීදි වලින් මහ හඬක් නැගෙන්නට විය. ඉක්මනින්ම එය ජයඝෝෂාවක් බවට හැරුණි. ඒ ආචාරය පියැන්කි වෙනුවෙනි. මෙම්පීස්හි නව පාලකයා වෙනුවෙනි!

# 62

අකනොෂ් කුමරුගේ අණට අනුව යෙගෙබ් ඔහු හමුවට ගියේය. ඒ, සායිස්හි පිහිටි මාලිගයටයි. ලිබියානුවා තම ආදර බිරිඳගෙන් වෙන්වීමට හේතුව,යෙගෙබ් සතුටින් සිහිකළේය. එම ගැටලුවට අදාල ලිපිය ලියන ලද්දේ යෙගෙබ්ගේම අත් අකුරිනි. ඩේබ්‍රේක් ගේ අත් අකුරු අනුකරණය කරමින් ලියන ලද ලිපියට අනුව, තවත් සතුරන් කීප දෙනකු විනාශ කිරීමට හැකිවීම ගැන යෙගෙබ්ට දැනුණේ දැඩි සතුටකි.

''ඔබට මා හමුවීමට අවශ්‍යද කුමරුනි? ''ඔහු ඇසීය.

''මට අවශ්‍යයි ඔබට ස්තුති කරන්නට, මගේ ඇස් පාදා දීම වෙනුවෙන්. මගේ බිරිඳගේ උත්පත්තිය දැන සිටියා. ඒත් මා වරදක් කළා. මා එය අමතක කිරීමෙන් මා කළේ වරදක් නොවේද යෙගෙබ්? මේ යුද්ධයයි මට සත්‍යය හෙළිකළේ, ඔබ එය හෙළිකරදීම කෙතරම් දෙයක්ද?''

යෙගෙබ්, ආචාර දක්වමින් මෙසේ කීය. ''මා මගේ යුතුකම ඉටුකළා පමණයි කුමරුනි.''

''යෙගෙබ්, මා මගේ බිරිඳට ආදරය කළා. ඉතා ආදරය කළා. දැන් මට සිතාගත නොහැකියි කුමක් කළයුතුද කියා. ඔබ මට උදවු කරනවාද, යෙගෙබ්?''

''ඒ කෙසේද කුමරුනි.?''

''මට ඇය මරා දැමිය නොහැකියි, යෙගෙබ්. ටෙෆ්නැක් මට අණ කළ ලෙස, මා එය කරන්නේ කෙසේද? ඔබට හැකිද එය කර දෙන්න... ඇත්තටම සුදුසු තිළිණයක් වෙනුවෙන්?''

''කුමක්ද සුදුසු වන්නේ කුමරුනි..?''

''රත්තරන් මල්ලක් හා නිවසක්, මගේ පළාතෙන්, සෙබෙනිටොස් පළාතෙන්.''

යෙගෙබ් මොහොතක් කල්පනා කළේය. ''රන් මළු දෙකක්, නිවසක් සමගම අස්වැන්න බද්දකින් කොටසක්.''

"ඔබ බොහෝ දේ ඉල්ලනවා."

"එය සුදුසු තිළිණයක් නොවේද?"

"හොඳයි, මා හා එන්න."

"මේ දැන්ම?"

"කාලය නාස්ති කිරීම වරදක්."

අකනොෂ්, යෙගෙබ්ගේ අතින් අල්ලාගෙන ගොස් සයනාගාරයේ දොර විවෘත කළේය. ඔහුගේ බිරිඳ එහි නිහඬව වාඩි වී සිටියාය.

යෙගෙබ් කල්පනා කළේය. "ඇගේ ගෙල මිරිකීම?" ඔව් එය වේදනාකාරී මරණයකි. ඔහු තම ගොදුර දෙසට පියවරක් තැබීය. එහෙත්, ඒ මොහොතේම ඔහුගේ ගෙල හම් පටියකින් සිරවිය. ඒ සමගම ඔහු පසුපසුට ඇදී ගියේය. ඒ තර බෙල්ලේ මාංශය ගැඹුරටම කැපී ගියේය.

"තා මරාදමන්ට ලැබීම කොතරම් සතුටක්ද?" අකනොෂ් කෙඳිරිය. "නයිල් ජලගැල්මට ස්තුතිවන්ත වෙන්න, සියලු පණුවන් අතුරුදහන් වෙනවා. මට ස්තුතිවෙන්න, ටෙෆ්නැක් එක පණුවකුගෙන් නිදහස් වුණා."

යෙගෙබ් බිම වැටුණි. ඉදිමී ගිය දිව පිටතට ඇදී ඔහු මිය ගියේය.

✸

"උතුමාණෙනි,බොහොම අසුභ පුවතක්." නාටෙබ් වෙව්ලායමින් කීය.

"කුමක්ද?"

"යෙගෙබ්"

"පවසනු! කුමක්ද සිදුව ඇත්තේ?"

"ඔහු මියගොස් උතුමාණෙනි. සිරුර සොයාගනු ලැබුවේ මාලිගය අසල හරස් පාරක තිබියදී. කිසිවකු ඔහුගේ ගෙල මිරිකා තිබෙනවා."

"ඔහු කළේ භයානක නීච වැඩ." ජෙනරල් කීය. "ඔහුට සිටියා බොහෝ සතුරන්."

"වරදකරු වහාම අල්ලාගත යුතුයි."

"කවුරුන්ද ඔබේ සැකයට බඳුන්වන්නේ."

"අකනොෂ් කුමරු උතුමාණෙනි. අද උදෑසනම ඔහු සෙබෙනිටොස් වෙත ගියා බිරිඳ සමග."

ඔහුට ලබා දෙනවා, අකනොෂ්ට. අවංක මිනිස්සු සෙවීම පහසු නැහැ..."

"ඒත් ඔහු අපරාධකරුවෙක්."

"නුඹ.. නුඹේ ඉරණම ගැන කල්පනාවෙන් සිටිනු! මගේ සේවකයින් තේරීම මට භාරකරනු... නාට්‍රෙබ්!"

✸

ටෙෆ්නැක්, මහරජිනකගේ කරදරය අත් හරින්නට තීරණය කළේය. චාරිත්‍රයට පටහැනිව, ඔහු තනිව රාජ්‍යය පාලනය කරයි. තම අවශ්‍යතාවන් සපුරා ගැනීමට ගණිකාවන් සොයා ගනී. ඩේබ්‍රෙක්ගේ ද්‍රෝහී වීම ඔහුගේ නෙත් පාදා තිබිණි. ඔහු කිසිවකු විශ්වාස නොකළ යුතුය. නිත්‍ය බලය බෙදාගත යුතු නොවේ.

ජෙනරල්, යෙගෙබ්ගේ මරණය ගැන කණගාටුවූයේ නැත. ඔහු සහ නාට්‍රෙබ් දුෂ්ටයින් යුගලකි. ඒ දෙදෙනා කවදා හෝ ද්‍රෝහී කුමන්ත්‍රණයක් ඇරඹීමට ඉඩ තිබිණි. නාට්‍රෙබ්ගේ සහය ලබා ගැනීම කරදරයක් නොවනු ඇත. සියලුම නීච වැඩ සඳහා ඔහුගේ උදවු ගත හැකිය. නියම වෙලාව පැමිණි විට, ඔහු වෙනුවට ඊටත් වඩා කැදර අයෙකු පත් කර ගත හැකි නොවේද?

"උතුමාණෙනි!"

"කුමක්ද නාට්‍රෙබ්? මා නුඹට පැවසුවා නොවෙද, අකනොෂ් ඉතා වටිනා සහායකයකු බව? ඔහුට එරෙහිව කරුණු දක්වා කාලය නාස්ති නොකරනු."

"උතුමාණෙනි,මෙම්පීස් යටත් වී හමාරයි. දූත් එහි පාලකයා පියැන්කි."

ඒ ග්‍රීෂ්ම උණුසුම මැද ටෙෆ්නැක්ගේ සිරුර සීතල විය.

"ඒ කෙසේද? පියැන්කි පහර දුන්නාද?"

"එසේය. එහෙත් එය සාමාන්‍ය ප්‍රහාරයක් නොවෙයි."

"කුමක්ද සිදුවුණේ ආරක්ෂක ප්‍රාකාරයට? බලකොටුව? මා එහි යැවූ ආරක්ෂක හමුදාවන්?"

"කළුපාරාවෝ, නගරයේ ආරක්ෂක වළලු බිඳින්නට යොදාගත්තේ ජලගැල්මයි! දහස් ගණන් උතුරු භටයන් මරා දමලා. දිවි බේරාගත්තවුන් යටත් වී ආසියානු හමුදාවට බැඳී තිබෙනවා."

"ඒත් මෙම්පිස් කිසිදා බිඳිය නොහැකියි." ඒ පුවත විශ්වාස නොකළ ටෙෆ්නැක් කිය.

"ජලගැල්මේ උස පමණක් නොවෙයි, ගංගාවත් පියැන්කිට සහාය වී තිබෙනවා."

"ඔහුගේ භටයින් විශාල සංඛ්‍යාවක් මියයන්ට ඇති."

"නැහැ උතුමාණෙනි, එය පහසුවෙන් ප්‍රහාරය දුන් ඉක්මන් ජයක්."

"ජනතාව ඔහුට එරෙහිව කැරලි ගසාවි."

"ඔවුන් ඝාතනයට ලක්වේවි. ඒත් තවමත් අප පරාජය වී නැහැ... ලිබියානු හමුදාව යුද්ධයට සූදානම්. සොල්දාදුවන් සංඛ්‍යාව අති විශාලයි. ඩෙල්ටාව පරාජය වන්නේ නැහැ."

"ඔබ නිවැරදියි නාට්‍රෙබ්. අප දිගටම සටන් කළ යුතුයි."

✸

අන්තිමේදී ආමන් විසින් පත් කරන ලද පාරාවෝ, මෙම්පිස් පාලනය කළේය. මේ ලෙසින්, ගොඩබිම් දෙක එහි එකමුතුකම රකින ස්ථානය යළි ජයගත්තේය. කෙසේ වෙතත්, බොහෝ පුරවැසියෝ කළු පාරාවෝගේ පලිගැනීම ඔවුන් වෙත එල්ල වෙතැයි යන බියෙන් පසුවූහ. දෙවරක්ම බලකොටුවේ දොරටු විවෘත කිරීම ප්‍රතික්ෂේප කළ ඔවුන් සිටියේ බරපතල ජීවිත අවදානමකය. නගරයේ උසස්ම ප්‍රභූවරුන් කීප දෙනෙක් අබිලා රැජිනගේ අනුකම්පාව යැද තිබූ නමුත් ඈ ඊට පිළිතුරක් දී නොතිබිණි.

අළුයම ළංව එන විට, පියැන්කි තම නිවහන වූ ධවල බිත්ති සහිත බලකොටුව අසල පිහිටි තුත්මොසිස් I මාලිගයේ නැවතී සිටියේය. ඔහු ඒ වන විටත් ඉදිරි ක්‍රියාමාර්ග ගැන තීරණයකට එළඹී නොසිටි හෙයින්, ඔහුගේ භට කණ්ඩායම් දැඩි අවධානයෙන් නගරයේ පාලනය භාර ගෙන තිබිණි.

ලැමසෙක්නිගේ තුවාල සුව වී තිබිණි. ඔහු,කළු පාරාවෝගේ නායකත්වය යටතේ සටන් කිරීමට තෝරාගනු ලැබූ ලිබියානුවන් එකිනෙකා ළඟට ගෙන්වා දැඩි සෝදිසියට ලක් කළේය. සැක සහිත අයකු දුටු වහාම, ඔහු හමුදාවෙන් ඉවත් කොට ගං ඉවුරු ප්‍රතිසංස්කරණය

සඳහා යොදවන ලදී. ජයග්‍රාහී පාබල හමුදා භටයෝ ඒ විශාල බැරැක්ක තුළට වී,පුරවැසියන් විසින් මිතුදම ඇතිකර ගැනීම සඳහා ප්‍රදානය කරන ලද ආහාර රස බලමින් සුවපහසුව කාලය ගත කළහ.

උදෑසන අඳුර පලවාහරිමින් ආලෝකය උපන්නේය. ඒ භූමිය බබළවමින් අළුත්ම දවසක් උදාවිය.

පියැන්කි තම තීරණය හෙළි කළේය. මෙම්පිස් පිරිසිදු කළ යුතුය!

අබිලා, කුල් හෙඩ්, ලැමසෙක්නි සහ පෝර්මා වෙව්ලා ගියහ. එතරම් කෲර කමක්? ඒ කුමටද, ඒ ජනතාව කැරැල්ලක කිසිදු සලකුණක් නොපෙන්වන කල?''

''උතුමාණෙනි, එය අත්‍යවශ්‍යද?'' පෝර්මා ඇසීය.

''අත්‍යවශ්‍යයි'' පියැන්කි කිය. ''මේ යුද්ධය පිටාගේ නගරය අපවිත්‍ර කළා. ඒ නිසා මා දූත් ගොස් ඒ දෙවොලේ ඇතුළු කුටියේදී පිරිසිදු වෙනවා. මා ගවයින්, අං රහිත ගවයින් හා කකුළන් පූජා කරනවා. මත්පැන් පූජා කරනවා. අවසානයේ මා දෙවොල පිරිසිදු කර මුළු නගරයම සුවඳ දුම් හා සුවඳ ලාටු යොදා පිරිසිදු කරනවා. එවිටයි, එවිටම පමණයි අපට ඉදිරි කටයුතු ගැන කතා කළ හැක්කේ...''

✸

පියැන්කිගේ කිරුළු පැළඳීමේ උත්සවය,පිටා දෙවොලේදී අවසන් විය. ගොඩබිම් දෙකේම වැසියන් ඉදිරියේ ඔහු ඉහළ හා පහළ ඊජිප්තුවේ රජු ලෙස පිළිගැනිණි. පාරාවෝ සහ මහරැජින, මාලිගයේ ජනතාව අමතන කවුළුවෙන් ප්‍රදර්ශනය වූහ. නව යුගයක අරුණළු නැගෙනවා ඇත යන සිතුවිල්ලෙන් මඩනා ලද වැසියෝ, මහත් සතුටින් උත්සව පැවැත්වූහ.

ටික වේලාවකට පසු කුල් හෙඩ් වෙත පණිවුඩයක් ලැබිණි. ඔහු එය වහාම පාරාවෝ වෙත ගෙන ගියේය.

''උතුමාණෙනි,මෙම්පීස්හි සියලුම බලකොටු අත්හැර දමූ බව සැලයි. මුරපොළ සියල්ල අත්හැර ගොසින්.''

පියැන්කි ඒ පුවතින් වැඩි සතුටට පත් වූ බව නොපෙණිනි.

''ඔබ කල්පනා කරන්නේ ඩෙල්ටාව යටත් කර ගැනීමට නෙවෙද?'' අබිලා ඇසුවාය.

''බාර් අබා බලකොටුව, බටහිර ඩෙල්ටාවට යන මග අවහිර කර තිබෙනවා.'' පියැන්කි කීය. ''මහ සටනක් අප ඉදිරියේ.''

# 63

ලිබියානු සොල්දාදුවන් අතර, මෙම්පීස් පරාජය ගැන කතාබහ ඇතිවිය. ඇත්තටම, ඒ පරාජය සැලකිය යුතු තරම් විය. එහෙත්,ඩෙල්ටාවෙහි තමාට පක්ෂපාතීව සිටි නායකයින් එකතු කරගත් ටෙෆ්නැක් තම බලාපොරොත්තු ජයගැනීමට සිතා සිටියේය. පියැන්කිගෙන් ඒ මිනිසුන්ට ලැබෙන්නේ, කැරලි ගැසීම වෙනුවෙන් කෙරෙන දඬුවම් පමණි. එහෙත් ටෙෆ්නැක් හා එක්වීමෙන් ඔවුනට අහිමි වූ භූමිය නැවත ලබා ගැනීම පිළිබඳ බලාපොරොත්තු තැබිය හැකිය. මෙම්පීස් පරාජය කළ නොහැකිය යන්න බොරුවක් බවට ඔප්පු වී හමාරය. ඉතින් කිමද කළු පාරාවෝ ආදර්ශයට නොගන්නේ? අවස්ථාව පැමිණි විට නැවතත් ඒ මහා නගරය ඊජිප්තුවන් අතට පත්වනු ඇත.

''මේ පරාජය කෙසේ වුවත්,'' ටෙෆ්නැක් තම සගයින්ගේ විශ්වාසය දිනාගන්නා අටියෙන් කීය. ''අපගේ හමුදාව විශාලයි. පියැන්කි ඩෙල්ටාව යටත් කර ගැනීම වැළැක්වීමට අපට හැකියි. මගේ යෝජනාව මෙයයි. අප ස්ථාන දෙකකින් හරස් කරනවා, නුබියානුවන්ගේ පැමිණීම. පළමුව තෝරාගත් ස්ථානයකදී දූනු ප්‍රහාරයක් එල්ල කිරීම හා ඒ සමගම, ප්‍රහාරයට ප්‍රහාරය එල්ල කිරීම. අපගේ දූනු ප්‍රහාරය එල්ල වන්නේ මේ භූමියේ වඩාත්ම පැරණි, වඩාත්ම ශක්තිමත් බාර්-අබා බලකොටුව අසලදී. එය ගොඩනැගිල්ලක් මත පිහිටා තිබෙන නිසා, සතුරාට ජලගැල්ම සහායක් නොවේවි.''

ටෙෆ්නැක් ගේ මේ ප්‍රකාශයට පළමුවෙන්ම පිළිතුරු දුන්නේ, ඇත්‍රිබිස් නගරයේ ප්‍රධානියා වූ පෙටිසිස් කුමරුය. ධනවත්, අධි බරැති අයකු වූ ඔහුගේ වයස අවුරුදු හැටකි.

''දැන් පියැන්කි පාරාවෝ බවට පත්වී හමාරයි.'' ඔහු කීය. ''ඔහුට ආමන්ගේ ආරක්ෂාව තිබෙන බව රහසක් නෙවෙයි. අනෙක් සියලු නගර මෙන් ඔහු බාර්-අබා ජය ගනු නැතිද?''

''අවංකවම,'' ටෙෆ්නැක් කීය. "මා සිතනවා ඔහු එසේ කරාවි.

එහෙත් ඔහුගේ ජයග්‍රහණය ඔහු වඩාත් දුර්වල කරාවි. මන්ද, වටලෑමට දීර්ඝ කාලයක් ගතවේවි.''

''එය සත්‍යයක්. ඊළඟට?'' පෙටිසිස් ඇසීය.

''තවත් බරපතල වටලෑමක්.''

''ඒ කොතැනද?''

''බාර්-අබා යටත් කරගන්නා පියැන්කි, ඒ අසලම පිහිටි ඇත්‍රිබිස් අල්ලාගන්ට තැත් කරාවි. එහිදී ඔබේ කාර්යභාරය වඩාත් තීරණාත්මක වේවි. පෙටිසිස්.''

''මා හැකිතරම් කාලයක් ඔවුන් නවත්වාගන්නම්. එහෙත්...''

''මා ඒ හමුදාවන් අතුගා දමනවා. මගේ මුළු හමුදාවම; දුනුවායන්, පාබල හමුදාව, නාවිකයින් ඒ සියල්ලම. මෙතැන් පටන් මා ඔවුන් කණ්ඩායම් කරනවා. සායිස් හි ගිණිකොන දෙසට දින තුනක ගමනකින් හමුවන මොස්ටායි දී, අපි උකුස්සකුගේ වේගයෙන් පහර දෙනවා. ඔහුගේ හමුදාව එකතැන නැවතී සිටියදී. ඔබේ බලකොටුව වටලමින් අප ඒ හමුදාව කැබලි කරනවා.''

''එය දක්ෂ, ජයගත හැකි සැලසුමක්.'' පෙටිසිස් කීය. සෙසු පළාත් නායකයෝද ඊට එකඟ වූහ.

✸

පියැන්කි, වැලියන්ට්ට ලුණු ආහාරයට දුන්නේය. දරුණු උණුසුම් කාලවලදී වැඩියෙන් දහඩිය පිටවන හෙයින්,අශ්වයාට සාමාන්‍ය තරමට වඩා ලුණු අවශ්‍යය. ජීර්ණ ගැටලු නැති කිරීමට, දිනකට වතුර පනිට්ටු කීපයක් බීම වැලියන්ට්ගේ පුරුද්ද විය. එසේම වියළි බාර්ලි, පලතුරු හා එළවළු හොඳින් ආහාරයට ගැනීමද සිදුවිය. සන්ධ්‍යාව ලංවෙත්ම, පියැන්කි උගේ සිරුරේ දහඩිය හා තෙතමනය උරාගැනීමට නැවුම් තණ මිටකින් උගේ සම පිරිමැද්දේය. ඌ සමග සාකච්ඡා කරමින් වාර්තාවක් සකස් කළේය. උදේ පටන් ම හොඳින් දීප්තිමත්ව තිබූ උගේ ඇස්, සන්ධ්‍යාවේදී දුබල විය.

''ඔහු කණගාටුවෙන්ද?'' අබිලා ඇසුවාය.

''නැහැ.'' පියැන්කි කීය. ''ඒත් ඔහු ඩෙල්ටාවට බියෙන්, අප මෙන්ම. එය අපගේ සොල්දාදුවන් නොදන්නා බිමක්. එපමණක් නොවෙයි, එය වළවල් හා අනතුරු වැඩි බිමක් ලෙසයි පිළිගැනීම.''

''ඔබට එය යටත් කරගත හැකිය යන විශ්වාසය නැතිද?''

"මා තවත් ප්‍රමාද නොවිය යුතුයි. පහළ ඊජිප්තුව, ආමන් මට භාරදුන් භූමිය. එය, කැරලිකරුවන් අත තිබිය යුතු නොවෙයි. එහෙත්, එය ඉතා භයානක කාර්යයක්. අප ටෙෆ්නැක් හා සටනට යන්නේ ඔහුගේම බිමේදී. එසේම බාර්-අබා වටලෑමේදීත් අපට බොහෝ මිනිසුන් අහිමිවේවි."

"උතුමාණනි, ඔබ ඔවුනට නායකත්වය දෙන්න. ඔවුන් ඔබ පසුපස ඒවි. ඔවුන් දන්නවා ඔබ ආලෝකයේ පුත්‍රයා බව, ගංගාවේ සහෝදරයා බව සහ මාඅාට්ගේ සේවකයා බව."

"පියැන්කි, අබිලාගේ මුහුණ මෘදු ලෙස ස්පර්ශ කළේය. "ඔබ නොමැතිව මගේ එකම කාර්යයක්වත් ජයගත නොහැකියි. ප්‍රේමිය..."

✸

යෙගෙබ්ගේ මරණය පිළිබඳව,නාට්‍රෙබ් තුළ වූ ශෝකය ඉතා ඉක්මනින් තුනී විය. ඔහු, ඝාතකයා සෙවීමද අත්හැර දැමීය. කෙසේ වෙතත්, ඔහුට ඒ මිතුරාගේ, අඩු අධ්‍යාපනයක් ලැබුවේ යැයි තමාව නිතරම පහත් කොට සැලකූ ඒ තක්කඩියාගේ මරණයෙන් ඇති වූ වාසියද අති මහත්ය. යෙගෙබ්ගේ ගණිත දැනුම ඔහුට තම වස්තුව පිළිබඳව ගිණුම් තබන්නට සහාය වූ බව සත්‍යයකි. එහෙත්, අද ඒ වාසි සියල්ල ලබන්නේ නාට්‍රෙබ්ය. තමා ධනවතකු බව හැඳිනගත්දා පටන් ඔහු කිසි විටෙකත්, තම ධනයෙන් ඉතා සුළු කැබිලිත්තක් වුව අහිමි කර ගත්තේ නැත.

ඩෙල්ටාවේ විශාලතම මෙන්ම ධනවත්ම නගරය වූ සායිස් හි දී, නාට්‍රෙබ්ට කිසිදු අවදානමක් නැත. කළු පාරාවෝ කිසිවිටක මෙතරම් දුරක් පැමිණෙන්නේ නැත. විශේෂයෙන්ම ඔහුගේ හමුදාව ඇත්‍රිබිස්හි කඳුවුරු ලන කළ, ටෙෆ්නැක්ගෙන් ලැබෙන දැඩි ප්‍රහාර හමුවේ නුබියානු හමුදාව සායිස් දෙස බැලීමෙන් පවා වළකිනු නිසැකය. ටෙෆ්නැක්ගේ සැලසුම්, සත්‍ය වශයෙන්ම විශිෂ්ටය. මොස්ටයි හි එක්ව සිටි ලිබියානු හමුදාවන්ට, පළිගන්නා තෙක් ඉවසුමක් නැත.

තව තවත් යෙගෙබ් ගැන කල්පනා කරන නාට්‍රෙබ්ට දැනුණේ ඔහු කිසිම බලාපොරොත්තුවක් නැති මහල්ලකු බවය. ඔහු, තමා සතු වස්තුවෙන් සෑහීමකට පත්ව සිටියේය. එහෙත්, නාට්‍රෙබ්ගේ පැතුම දේශපාලනික විසඳුමකි. යුද්ධය බොහෝ කල් පවතී. මන්ද, ඇත්‍රිබිස් ජයගන්නා ටෙෆ්නැක් නිසැකවම තමාට අහිමි වූ භූමිය යලි අත්පත් කර ගැනීමට තැත්කරන නිසාය. ඔහුට අවශ්‍ය වන්නේ යුදබිමේදී නිර්භයව සටන් වදින, පරිපාලනය වෙනුවෙන් කැපවී සිටින ඇමතිවරයෙකු විසින් පාලනය කෙරෙන භූමියකි. ඒ පාලනය සඳහා සැලසුම් දැනටමත් සකස් කර ඇත්තේ නාට්‍රෙබ්

ඉයිනි. ඉතින්, ඒ තනතුර හිමි නාටේ‍රබ්ටමය!

සායිස්හි සිරගෙදර භාර නිලධාරියා නාටේ‍රබ් හමුවට ආයේය.

"උතුමාණනි, සිරකාරිය ඔබ හමුවීමට අවසර පතනවා."

"ඩේබ්‍රේක්? ඒත් සිරගේ අපිරිසිදුයි, දුගඳයි."

"ඒ නිසාම උතුමාණනි, ඔබ ඇය හමුවීමට කැමති නම්. මට හැකියි ඇය ඔබට ගැලපෙන තැනකට මාරුකර යවන්නට."

"හොඳයි. ඇය නහවා සුවඳ ගල්වන්න"

"ඔබේ අණපරිදි, උතුමනි." නිලධාරියා කීය.

එය නම්, අනපේක්ෂිත සතුටු උල්පතකි. ඔහු ඇය දූෂණය කිරීමට සූදානම් වූ විට, ඒ බැල්ල සටන් වැදුණාය. මෙවර ඇයට සමාවක් නැත. ඒත්, කුමටද ඈ ඔහු හමුවන්නේ? කුමන් තොරතුරක් දෙන්නද?

✸

ඒ මුහුණේ විඩාපත් බවක සලකුණු තිබුණද, ඩේබ්‍රේක් තවමත් රූමත්ය. නග්න දෙපයින්, ලා කහපාට කොට ඇඳුමකින් සැරසී සිටි ඇගේ උරහිස් වැසී නොතිබිණ. ඒ ඇඳුමට ඇය ළාමක තරුණියක ලෙස පෙනිණි.

නාටේ‍රබ් තුළ ඇවිළෙන ගින්න පිටතට දනෙන තරම් විය. ඔහුගේ තර දෙතොල් ඉදිමුනි. ගෙල තද වී, මහත අතැඟිලි සර්පයින් සේ දඟලන්නට විය.

"කුමක්ද මට පවසන්නට ඇත්තේ, සුරතලිය?"

ඩේබ්‍රේක්, නාටේ‍රබ්ගේ කෑදර දෑස් මගහැරියාය. "ඔබ සහ යෙගෙබ් නිවැරදියි. මට මගේ පියාණන් වෙනුවෙන් පළිගන්ට අවශ්‍යයි. මා පොරොන්දු වූ පරිදි එය කරනවා."

"හොඳයි, හොඳයි. ඒත් ඔබ ප්‍රමාද නැතිද?"

"මට දුන් දඬුවම ඉා දරුණුයි. මට එහි විසිය නොහැකියි. දුර්ගන්ධය! තෙත්බිම! මා බේරාගන්න නාටේ‍රබ්."

"එය අපහසුයි සුරතලිය. දඬුවම ප්‍රකාශ කළේ ටෙෆ්නැක්. දැන් මට එය වෙනස් කළ නොහැකියි."

"මා අයාචනා කරනවා. මා වෙනත් සිරගෙයකට දමන්න. පිරිසිදු තැනකට. මීයන් නැති තැනකට."

''එවන් වරප්‍රසාදයක් දෙන්නට මට ඔබ දෙන්නේ කුමක්ද?''

ඩේබ්‍රේක්, තම ඇඳුම ඒ තරුණ සිරුර දිගේ පහළට ලිස්සා හැරියාය.

නාට්‍රෙබ්ගේ කටට කෙළ ඉනුවේය. ''ඔබ මට කිසිදු බාධාවක් නොකළ යුතුයි.''

''හොඳයි.''

''ඔබ නිකම්ම වැතිරී නොසිටිය යුතුයි. මා පිළිකුල් කරනවා උදාසීන ගැහැනුන්.''

''මා සූදානම්.''

ඩේබ්‍රේක් වෙනත් සිරගෙයකට මාරුකරන්නට, නාට්‍රෙබ් තුළ කිසිදු සිතුවිල්ලක් හෝ නැත. ටෙෆ්නැක් මෙය දැනගතහොත් කෝපයෙන් වියරු වැටෙනු ඇත. ආදරය කිරීම ඔහු සතු හැකියාවක් බැවින්, නාට්‍රෙබ්ට තව මොහොතකින් කදිම, සතුටුදායක පැය කීපයක් ලැබීමට නියමිතය.

''එන්න, මා සිපගන්න සුරතලී.'' ඔහු කීය.

ඇය නාගයෙකු සේ වේගයෙන් ඇදී ගියාය. නාට්‍රෙබ්ගේ ගෙල දැඩිව සපාගත්තාය. ඒ මොහොතේ එතැනින් ලේ විදින්නට විය. වේදනාවෙන් උමතු වූ නාට්‍රෙබ්, ඇයට අතින්, පයින් පහරදී බිම දමා පාගන්නට විය. සිහිසුන්ව ගිය ඇය, ඔහුගේ දෙපයින් බිමටම ඇලී පොඩි වී යන මොහොතේ. මරණය තමා වෙත එන බව නොදුටුවාය.

✸

''නාට්‍රෙබ්ට කෙසේද?'' ටෙෆ්නැක් ඇසීය.

''තුවාලය පැසවා තිබෙනවා. එය සුවකිරීම පහසු නොවේවි.'' වෙදැදුරු කීය. ''මට අවශ්‍යයි අධික මිල ගණනින් යුතු දුර්ලභ ආලේපන විශාල ප්‍රමාණයක්.''

''ඒවා අපතේ නොයවන්න. මගේ හමුදාවට එය අවශ්‍යයි.''

''ඔබ පවසන්නේ...''

''ඔහු මියයන්ට හරින්න. වේදනාව අඩු නොකරන්න. මිනිසකු එවැනි වනචාරී තත්ත්වයකට පත්වන විට එහි තේරුම, ඔහුගේ ආත්මය මියගොස් බොහෝ කල්. ''

ටෙෆ්නැක්, ඩේබ්‍රේක් ගේ සිරුර දුටුවේය. ඇයට මේ වේදනාව හිමිවූයේ, එදා ඔහුට පිදූ ආදරයේ නාමයෙන් නොවේද?

# 64

බාර්-අබා දෙසට අසු මෙහෙයවන අතරේ, උගේ ගෙල පිරිමදින් පාරාවෝ, තම සිතුවිලි, බලකොටුවකින් ආරක්ෂාව ලබන නගරයක් වූ ඉයුනු දෙසට යොමු කළේය.

දිව්‍යමය ආලෝකය වූ 'රා' ගේ නගරය, ඉයුනු, ඊජිප්තුවේ ආත්මීය ජීවය උපත ලද ස්ථානය විය. පිරමීඩ තුළ සඳහන් සටහන් ලියන ලද්දේ එහිය. පළමුවරට මුළු ඊජිප්තුව පුරාම දෙවියන්ගේ හඬ ඇසුණේද, මෙතැනින්ය.

තම දිවිය උසස් තත්ත්වයට ළං වන බව කළ පාරාවෝට දැනුණි. ඔහු තුළ ඇති වූ සංවේගය ඉමහත්ය. ඇත නුබියානු පුත්‍රයෙකු වන පියැන්කි නම් වූ ඔහු, ජීවිතයේ කිසියම් දවසක,ශිෂ්ටාචාරය උපත ලද්දා වූ මෙම ස්ථානයට මෙතරම් ළංව සිටින්නට භාග්‍යය ලැබෙතැයි සිතුවේ නැත. එහෙත්, ඒ සතුටුදායක හැඟීම අතරින් ම හද දවන ශෝකයක් ඔහු සිත හටගති. ඔහු ඉයුනු වෙත ළංවීම වෙනුවෙන් සොල්දාදුවන් කී දෙනෙක් ජීවිත පූජාකළ යුතුද?

අබිලා, පියැන්කිගේ අත අල්ලා ගත්තාය. ''ඔබේ හදවතේ රැඳී ඇති විශ්වාසය එසේම රැකගන්න හිමියනි.'' ඇය කොඳුළාය.

✸

''අන්න, ඔවුන්!'' කුලුන මත සිටි ඔත්තු බලන්නා නිලධරයෙකුට පැවසීය. ඒ බාර්-අබාහි බැලුම් කුලුනයි.!

වහාම ආරක්ෂක ප්‍රාකාරයෙන් බිමට බට නිලධාරියා බලකොටුවේ අණදෙන නිලධාරියා වෙත දුවන්නට විය. රදල පෙනුමකින් යුතු එම නිලධාරියාගේ වයස හතළිස් ගණනක් වූ අතර රාජකාරිය කළේ ඉතා සැහැල්ලුවෙනි.

''කී දෙනෙක් සිටිත්ද?'' අණදෙන නිලධාරී ඇසීය.

''මා සිතනවා, මුළු නුබියානු හමුදාවේම සොල්දාදුවන් එතැන නිලධාරිතුමනි.''

''කළු පාරාවෝ.?''

''ඉදිරියෙන්ම!''

''අපගේ හමුදාව සූදානම්ද?''

''ඔවුන් අවසන් හටයා දක්වාම සටන් කරාවි නිලධාරිතුමනි. නුබියානුවන් වනසා දමමින්,අපගේ සහාය හට කණ්ඩායම් පැමිණෙන තෙක් සටන් කරාවි.''

'''සායිස් වෙතින් සහාය හට කණ්ඩායම් නොපැමිණේවි.''

''සහාය කණ්ඩායම් නැහැ? ඒත්...''

''අපට අණ ලැබී තිබෙන්නේ, සහාය කණ්ඩායම් නැති බවත්, හැකි තරම් කාලයක් සතුරා රඳවා තබාගෙන පහර දෙන ලෙසටත් පමණයි. අපට සිටින්නේ අප පමණයි!''

''තේරුණා නිලධාරිතුමනි. අපට මාස ගණනාවකට සෑහෙන තරම් ආහාර සහ ජලය තිබෙනවා.''

''නුබියානු ගල් දුනු ගැන ඔබේ අදහස කුමක්ද? ඒවා ඵලදායිද?''

'ඒවා ඉතාම භයානකයි. නිලධාරිතුමනි.''

''ඔවුන්ගේ අශ්වයින්?''

''හොඳම තත්ත්වයේ.''

''කෙසේද අප බලකොටුවේ හටයින්ගේ චිත්ත ස්වභාවය?''

නිලධාරියා අදිමදි කළේය.

''මට අවශ්‍ය සත්‍යයයි.!''

''එතරම් විශිෂ්ට තත්ත්වයක නැහැ නිලධාරි තුමනි. අපගේ සොල්දාදුවන් දන්නවා, නුබියානුවන් පසු නොබසින් බවත්, කළු පාරාවෝ හිතුවක්කාරයෙකු බවත්. ඔවුන් පවසනවා ඔහුට ආමන් දෙවියන්ගේ ආරක්ෂාව ඇති බවත්, ඔහගේ බිරිඳගේ ඉන්ද්‍රජාලීය බලය ඔහු ජයග්‍රහණය කරා ගෙන යන බවත්.''

''හැම හටයෙක්ම නිවැරදිව ස්ථානගත කරන්න. දෙවියෝ අප දෙස බලත්වා.!''

✸

''හෝ! කොතරම් අපූරු තැනක්ද? ලැමසෙක්නි බාර් අබා දුටු විගස කෑගැසීය. ''මෙම්පීස්! දැන් එය ඉතා පහසුයි! මෙවර සටන අපේම දැතින්!''

පෝර්මාගේ සිතුවිලි ඊට වෙනස් බව පෙනිණි. ''අපට එක ඉණිමඟක් ඔසවන්නට හටයින් පනහකගේ ජීවිත පූජා කරන්න සිදුවේවි. බාර් අබා දුනුවායන් නියමිත් ස්ථානවල රැඳී සිටිනවා. මගේ හටයින්ට දැඩි අවදානමක්! අනතුරක්!''

''කවදාද ඔබේ හදවත පුරවාගෙන සිටින අසුභවාදී සිතුවිලි නැති වෙන්නේ? ඔබට අමතකයි අපට අණ දෙන්නේ පියැන්කි කියා!''

බාර් අබා හි ආරක්ෂක ප්‍රාකාර දකින පෝර්මාගේ සිතේ බිය අඩු වූයේ නොවේ. ''අපට ගැටලු ඇතිවේවි ප්‍රාකාර අසලට පස් එකතු කරනවිට. සමහර විට මැඬලිය නොහැකි බාධාවන් ඇතිවේවි. අපට අපගේ හටයින් විශාල ලෙස අහිමි වේවි. එය ස්ථිරයි. අප මෙතැන යටත් කරගත්තත්, අප ඩෙල්ටාවට යන්නේ කා සමගද? කොහිද හටයින්?''

''පියැන්කි ඊට පිළිතුරු සොයාවි.''

පෝර්මා කෝප විය. ''කුමක්ද සිදුවූයේ ඔබේ සිතීමේ හැකියාවට ලැමසෙක්නි?''

''ඔබ මගේ අණදෙන නිලධාරියා වූවා නම් මගේ බලාපොරොත්තු සුන් වෙන්න තිබුණා. ඒත් මට අණ ලැබෙන්නේ පාරාවෝගෙන්. හෙට... ඉර පායාවි.''

✸

එය ලස්සන උදෑසනක් විය. ඒ දරුණු හිරු රැස් මැඬලමින් ආලෝකයේ සුළඟ හමා ගියේය. ඩෙල්ටාවට යන මග විවෘත කිරීම වෙනුවෙන් තම දිවි පුදන්නට දහස් ගණන් නුබියානුවන් සූදානම්ය.

පෝර්මාගේ දුනුවායන්, පාබල හමුදාවන්ට හා කම්කරුවන්ට ආරක්ෂාව සපයනු ඇත. එහෙත්, බාර්-අබා හි ප්‍රාකාරවලට පෙර තම හමුදාවේ සොල්දාදුවන් වැඩි ගණනක් ඇද වැටෙන බව පියැන්කි දැන සිටියේය.

පාරාවෝගෙන් පහරදීමේ සංඥාව ලැබෙන තෙක් බලා සිටින නුබියානු හමුදාව තුළ වූයේ දැඩි නිහඬතාවයකි.

වැලියන්ට් කෙඳිරි ගා, ඉදිරිගාත් එසවීය. ඉක්බිති, සත්සුන් වූ ඔහු බලකොටුවේ දොරටුව දෙසට තම දීප්තිමත් දෑස් යොමුකළේය.

බලකොටු දොරටුව... එය සිහිනයකින් මෙන් විවර විය. ලිබියානු අණදෙන නිලධාරියා පිටතට පැමිණියේය. තම අසිපත හා දුන්න බිම තබා පියැන්කි වෙත ගොස්, ඔහු ඉදිරිපිට සිටගත්තේය.

"පාරාවෝ මෙම්පීස්හිදී කිරුළු පැළඳුවා." ලිබියානුවා සතුට ප්‍රකාශ කළේය. "දෙවියන් අණකර තිබෙනවා ඔහුට ඊජිප්තුවේ පාලනය භාරගෙන ජාතියට සතුට ලබා දෙන ලෙස. කුමටද මා මරණය හා ශෝකය වපුරන්නේ, ඒ විනාශය වැළැක්වීමට කළ යුත්තේ ඔබට අවනත වීම පමණක් නම්, උතුමාණනි, පිළිගන්න බාර් අබා නගරය. එය ඔබෙයි."

තවත් තත්පර කීපයක් නිහඬ බව රජ කළේය. නුබියානු හමුදාවේ හුස්ම නතර වීද? ඊළඟට, බිය වාෂ්ප වී ගොස් සියලු හදවත් සතුටින් පිරී ගියේය. විස්තර කළ නොහැකි තරමේ සතුටකින් ඉදිරියට දිව ආ පියැන්කිගේ හමුදාව සහ බාර්-අබාහි ආරක්ෂකයින් එකිනෙකා වැළඳගත්හ.

✸

කළු පාරාවෝ බාර් අබා කන්ද හරහා ගොස් කෙබේ වැවෙන් පවිත්‍ර වූයේය. එයින් නැවත ශක්තිය ලබාගත් පියැන්කි ඉයුනු වැලිකන්ද වෙත ගමන් කළේය. ජීවය උපත ලද්දේ එහිදිය! නැගෙනහිරු ඉදිරිපිට සිටගත් පියැන්කි මැවුම්කරුවාට සුදු ගොනුන්, කිරි, සුවඳ ලාටු, සුවඳ දුම් හා සුවඳ දිය පූජා කළේය. ඉක්බිති ඔහු පූජකවරුන්ගේ ජයඝෝෂා මධ්‍යයේ ඒටම් දෙවොලට ඇතුල්විය. ඔවුහු, ඔහු පාරාවෝ ලෙස, ලොව යළි නිර්මාණය කළ දෙවිවරු නවදෙනාගේ සහෝදරයා ලෙස පිළිගත්හ.

පාරාවෝ,දෘශ්‍යමාන හා අදෘශ්‍යමාන සතුරන් පළවා හැරීමට චාරිත්‍රානුකූල වදන් ප්‍රකාශ කළේය. දෙවොලෙහි ඇතුළු කුටියේදී පිරිසිදු කරන ලද ලෝගුව පොරවාගෙන,දෙවිවරුන්ගේ ලෝකය දකීමට සහය වන පටිය හිස වටා බැඳගති. ඊළඟට ඔහු,දෙවොලේ ඉහළ මාලයට දිවෙන පඩිපෙළ නැංගේය. ඔහු, පළමුවරට කළු ගලෙන් තනන ලද හතරැස් කුලුන දුක තිබුණේ එහිදීය.

තවත් ඉතිරිව තිබුණේ එක් කාර්යයකි. ඒටම් හි රහසිගත, ඇතුළත වූ, කුටියට ඇතුල්වීමයි ඒ. ඒටම් යන නාමය 'පවතින' හා 'නොපවතින' දෙකෙහි සංකලනයකි. පියැන්කි ඒ රන් දොරටුව මත තබන ලද මුද්‍රාව කඩා එය විවෘත කළේය. නිමැවුමේ රහස දුටුවේය. උදෑසන හා රාත්‍රිය සදාකාලිකවම සම්බන්ධ කරන දිව්‍යමය ගමන අත් දුටුවේය.

මේ මොහොතේ,තමා මේ දිගු ගමන ආයේ මන්දැයි ඔහුට වැටහිනි. තමාගේ මෙන්ම තම ආදරය දිනූ අයගේ ජීවිත අවදානමකට ලක් කරමින් එසේ කළේ මන්දැයි ඔහුට වැටහිනි. ගොඩබිම් දෙක එකතු කර එය ආදරයෙන් රැකගත යුතු වන්නේ මන්දැයි වැටහිනි.

# 65

ඇකේෂියා සහ දිඹුල් ගස්වලින් සෙවන වූ ඉයුනු නගරයේ ඉන්ද්‍රජාලයට මැදි වී, රාජකීය යුවල රැම්සීස් II හා රැම්සීස් III දෙවොල් තුළ උතුම් පූජාවන් පැවැත්වූහ. ඒ සදාකාලික නිවස්නයක් මල් වලින් සරසා, ආලෝක ශක්තිය මහ පොළොව මත රඳවන මූර්තිය වූ මිනෙවිස් ගවයාට පූජා පැවැත්වූහ.

පියැන්කි, සිකමෝර්හි ඒටම් දෙවොලට ආදරය කළේය. තෝත් දෙවියන්ගේ වෙස් මුහුණු පැළඳගත් පූජකයෝ, කළු පාරාවෝගේ කිරුළු පැළඳීමේ නාමය සටහන් කළෝය. කුඩා වනපෙත්, පලතුරු උයන්, ඔලිව් වගාවන් හා කෘත්‍රිම වැව විසින්, ඉයුනු ජීවී භූමියක් බවට පත්කර තිබිණි. එහි තබන හැම පියවරක් පාසාම ඔබට, දෙවියන් එහි රැඳී සිටින බව හැඟේ.

✸

ලැමසෙක්ති පමණක් බුම්මාගෙන සිටියේය.

"අපි කාලය නාස්ති කරනවා." ඔහු පෝර්මාට කීවේය. "බලන්න අපගේ සොල්දාදුවන්. පළල් අත් ඇති සැට්ට, වර්ණවත් මොස්තර දමූ කෙටි සාය, ඒ මදිවාට ඔවුන් රූමත් ගැහැනුන් පසුපස යන හැටි! මේ සියලු දෙනා, ලේකම්වරයාගේ සිට ඉහළම තනතුරු දරන්නා දක්වා පියැන්කිගේ ගුණ වර්ණනා කරනවා. අප අතීත ජයග්‍රහණ සමරනවා, නැති කරගනිමින් යුද්ධයට තිබෙන ආශාව! මේ ලෙසින් ඇත්‍රිබිස් යටත් කරගත නොහැකියි."

පෝර්මා සිනාසුනි. "මඳක් විශ්වාසයෙන් හිටින්න මිත්‍රයා. පාරාවෝ ඊට පිළිතුරු සොයාගනීවි."

✸

ඇත්‍රිබිස් නගරයේ සංකේතය කළු ගවයෙකි. ධනවත්, බලවත් නගරයක් වූ එය පාලනය කෙරුනේ 'අයිසිස්ගේ තිළිණය' යන නම ලද

පෙටිසිස් කුමරා විසිනි. ලිබියානුවන් විසින් ඇති කරන ලද ආර්ථික අපහසුතා අතරම, ඔහුට තම අගනුවර වැසියන්ට ආහාර සැපයීමටත් හැකි වූ අතර සියල්ලෝම ඔහුට පක්ෂපාතී වූහ.

දිනපතාම මඳ උණුසුම් වතුරෙන් ස්නානය කළ පෙටිසිස් කුමරා, අපූර්ව උදේ ආහාරයක් ගත්තේය. එළු චීස් හා කරවලවලට ඔහු තුළ වූයේ දැඩි ආශාවකි.

එහෙත්, ප්‍රධාන ලේකම්වරයා ගෙන ආ පුවත ඔහුගේ කුසගින්න නැති කළේය.

"බාර්-අබා සටන් නොකරම යටත් වුණා? විය නොහැකියි."

"අණදෙන නිලධාරියා කළු පාරාවෝගේ රාජකීයත්වය වටහාගත්තා. ඒ අනුව ඔහුට තම බලකොටුව පාරාවෝ යටතට පත් කිරීමට වෙනත් හේතු අවශ්‍ය වුණේ නැහැ."

"ටෙෆ්නැක් ඔහුට අණ දී තිබුණේ සටන් වදින්නට. ඒත්, නිලධාරියා දැන සිටියා යටත් වීමේ වටිනාකම. දැන් පියැන්කි කොහිද?"

"ඔහු ඉයුනුහි නතරවී සිටිනවා." ලේකම් කීය.

"ඔහු අපට පහර දී කාලය නාස්ති කරන්නේ නැහැ. සියලු නිලධාරීන් බලකොටුවට කැඳවන්න."

"අකනොෂ් කුමරු මේ දැන් සෙබෙනිටොස් සිට පැමිණියා. ඔහුට අවශ්‍යයි ඔබ හා කතා කරන්නට."

"කැඳවන්න."

ඒ දෙදෙනා උණුසුම්ව ආචාර සමාචාර කළහ. ඔවුහු බොහෝ කලක සිට හොඳ මිතුරන් වූහ.

"ඔබ මුළු රැයම ගමනේද මිතුර?" පෙටිසිස් ඇසීය.

"මා ගමන් ඇරඹුවා බාර් අබා යටත් වූ බව දැනගත් විගසම. ඒ තොරතුරු ස්ථිර කර අවසන්ද?"

"බලකොටු අණදෙන නිලධාරි කළු පාරාවෝට දොරටු විවෘත කළා. පියැන්කිට සටන් කිරීමට සිදුවුණේ නැහැ. ඔහුගේ එකම භටයෙකු හෝ මියගියෙත් නැහැ."

"ටෙෆ්නැක්ගේ සැලසුමේ පළමු කොටස පරාජිතයි."

"ඔව්. පියැන්කිගේ හමුදාව ඇත්‍රිබිස් දොරටුවට ළඟාවීමට ආසන්නයි." පෙටිසිස් ශෝකී හඬින් කීය.

"අප මේ යුද්ධයට තිත තැබිය යුතුයි."

"ඔබ පවසන්නේ මා..."

"ඔව්. ඔබත්... ඔබත් ඔබ නගරයේ දොරටු විවෘත කර නියම පාරාවෝ පිළිගත යුතුයි."

"ඔබ ඒ අවවාදයේ ප්‍රතිඵලය ගැන හොඳින් වටහාගෙනද සිටින්නේ?"

"එය දේශද්‍රෝහී වීමක් නොවෙයි, පෙටිසිස්. ටෙෆ්නැක් ගේ අණ යටතේ අප උත්සාහ කළා පියැන්කි පරදවන්න. ඒත් අප පරාජය වුණා. ඔහුයි පාරාවෝ. අප ඔහුට අවනත විය යුතුයි. කුමටද අපගේ පළාත් නිරපරාදේ දුකට හෙලන්නේ?"

අකනොෂ් දැඩි අවදානමක් ගන්නවා නොවේද? ඔහු අත් අඩංගුවට ගන්නා ලෙස අණ කර,සායිස් බලා ආපසු යවා, මරා දමන්නට පෙටිසිස්ට හැකිය.

"මට රහසක් තිබෙනවා ඔබට පවසන්නට." පෙටිසිස් කීය. "මා ලිබියානුවෙකු නොවෙයි අකනොෂ්. ඊජිප්තුවෙක්. ඇත්‍රිබිස් නියම පාරාවෝගේ දෑතට පුද කෙරෙනු දැකීම තරම් සතුටක් මගේ මේ මහලු වියේදී මට ලැබිය හැකිද?"

✸

"ඔබ හරි හැඩයි!" පෝර්මා ලැමසෙක්නිට කීවේය. "ඒ කෙටි,පළල් අත් දැමූ කමිසය ඔබට කදිමට ගැලපෙනවා."

"නවත්වනු දුනුවායා! මා පිළිකුල් කරනවා මේ උදාසීන හමුවීම."

"මෙය එතරම්ම උදාසීන නොවේවි. ඇත්‍රිබිස්හි කුමරු තම නගරය පාරාවෝට ආපසු භාරදීම, ඔබ නිතර දකින දෙයක් නොවෙයි."

"අප සොල්දාදුවන් මිස රාජසභිකයින් නොවෙයි. මට හැකියි මේ බලකොටුව මගේ අසිපත් තුඩෙන් යටත් කරගන්නට."

"ඔබේ ශක්තිය සායිස් වෙනුවෙන් රැක ගන්න." පෝර්මා කීය. "ටෙෆ්නැක් යටත් නොවේවි. ඔබට එය ජයගත හැකියි ස්ථිරවම."

ඒ දෙදෙනා උත්සවය බැලීම සඳහා ගංගාව දෙසට ගියහ.

පියැන්කි සහ අබිලා රාජකීය නෞකාවෙන් ඇත්‍රිබිස් තොටුපොළට ගොඩබැස්සෝය. හිරු එළියෙන් ආවරණය වීමට ඔවුන් වෙනුවෙන් රන් ආලේපිත ලී මත සවිකරන ලද වියනක් තනා තිබිණි.

"ඔබේ නිවහනට ඇතුල්වන්න,උතුමාණෙනි," කුමරා ඔවුන් ඉදිරිපිට දණින් වැටී කීවේය. "එහි සියලු වස්තුව ඔබෙයි. මගේ රන් පොලු, නිල් කැට, මාල,කුඩා පිළිරූ, රන් දිසි, රාජකීය ලිනන් වලින් තනන ලද සිවුරු, හොඳම රෙදි අතුරන ලද ඇඳන්, තෙල්, ස්නේහක, මගේ අශ්වගාලේ සිටින සියලුම අශ්වයින් ඔබෙයි,උතුමාණෙනි."

"ඔබ මට ඔවුන්ගෙන් හොඳම කොටස දෙනවාද?"

"කිසිවෙකු හොඳම අශ්වයා ඔබෙන් සැඟවුවහොත්, ඔහු එතැනම මරා දමනවා උතුමාණනි."

"නැගිටින්න පෙටිසිස්."

"මා ඊජිප්තු පුත්‍රයෙක් උතුමාණෙනි, මා ඔබට කෘතඥ වෙනවා ඇත්‍රිබිස්ට යළිත් නිදහස දීම පිළිබඳව. ලිබියානුවන්ගේ පුත්‍රයින් වන මේ ලිබියානුවන් අද ඔබේ පාලනයට නතු වෙනවා, උතුමාණෙනි."

මුලින්ම ඉදිරියට පැමිණියේ තම බිරිඳ හා පැමිණි අකනොෂ් කුමරුය. ඔවුන් කෙරෙන් විද්‍යාමාන වූ ප්‍රභූත්වය පාරාවෝගේ අගය කිරීමට ලක්විය.

"අප පරාජිතයි." අකනොෂ් කීය. "උතුමාණනි, සෙබෙනිටොස් පළාතත් ඊජිප්තු පාරාවෝට අයත්. මගේ නිලධාරීන්ට හා බිරිඳට අනුකම්පා කරන ලෙස මා ඔබෙන් අයදිනවා. උතුමාණනි, මගේ බිරිඳ උපතින් නුබියානුවෙක්."

"ඔබගේ නුවණ ප්‍රශංසා කටයුතුයි." පියැන්කි කීය. "මේ රටට හා එහි රජුට විශ්වාසයෙන් සේවය කරන්න. සෙබෙනිටොස් පාලනය බාර ගන්න."

"ඔබ මා වෙත විශ්වාසය තබනවාද? ලිබියානුවෙකු වෙත?"

"මා විශ්වාසය තබනවා මේ වනතුරු තමාගේ පළාත හා එහි වැසියන් හොඳින් රැකගත් අයකු වෙත. ඔබ ඔවුන්ගේ ජීවිත, ඔබේ ජීවිතයට වඩා ඉහළින් තබන නිසා ඔබ දන්නවා ඔවුන් සතුටින් තබන ආකාරය."

නගරාධිපතීන්, කළමනාකරුවන්, පරිපාලන නිලධාරීන්, උපදේශකවරුන්, විනිසුරුවන් හා බලධාරීන්, ඊජිප්තුවන් කීප දෙනෙක් හා ලිබියානුවන්, කළු පාරාවෝ වෙත පැමිණ ප්‍රතිඥා දුන්හ. ධනවත් නගරයක් වූ බෙම් හි කුමරාද ඒ අතර විය. මා ආට් නීතියට ගරු කළ යුතු බවත් ගොඩබිම් දෙකේ එකමුතුකම රැකිය යුතු බවත් ඔවුනට ලැබුණු උපදේශය විය.

ඩෙල්ටාවේ රජය ස්ථාපිත කිරීමෙන් පසුව, බොහෝ රෑ වන තෙක් උත්සවය ආරම්භ නොවීය.

රෝස් කළ තාරා කකුලක් සපන ලැමසෙක්නිට, කට පියාගෙන සිටිය නොහැකිය. ''සායිස් තවමත් අප ඉදිරියේ, අවසන් සහ හොඳම සටන.''

පියැන්කිගේ මුගටියා ලැමසෙක්නිගේ ලී අත මත ඇවිදින්ට විය. ''හා! නුඹද? නුඹ අපව අවසානය දක්වාම රැකගන්නවා නොවෙද?''

කුඩා මුගටියා සොල්දාදුවාගේ උරහිස මත ඉඳගෙන ඔහුගේ කම්මුල ලෙවකෑවේය.

''පාරාවෝ නිවැරදියි.'' ලැමසෙක්නි කීය. ''අප හැම දෙයක්ම අවසානය දක්වාම කරගෙන යා යුතුයි. අවසන් කඩුල්ලේදී මිය යාම අපරාධයක්.''

# 66

ටෙෆ්නැක්ට පක්ෂපාතී නායකයින් කීප දෙනා, සායිස්හි මාලිගයේදී ඔහු හමුවූහ. නුබියානුවන්ට එරෙහි යුද්ධය ගැන සාකච්ඡා කළහ.

''ඇත්‍රිබිස් අපට ද්‍රෝහි වී තිබෙනවා.'' ටෙෆ්නැක් හෙළි කළේය. ''ලිබයානු නායකයින් වැඩිම ගණනක් පියැන්කිට පක්ෂපාතීයි.''

''ඉතින් කිම?'' මහලු නිලධාරියෙක් කෑ ගැසීය. ''අප එවැනි බියගුල්ලන් අත්හරින්නේ නැහැ. අඩු තරමේ අප දැන් දන්නවා, අපට විශ්වාසය තැබිය හැක්කේ කවුරුන් ගැන ද කියා. අපගේ භට කණ්ඩායම් එකතුවන මොස්ටයි වෙත එන්න ජෙනරල්. ඔබට පේනේවි අප සටනට සූදානම් බව.''

''ඔබ දැනගත යුතුයි මා කිසි විටක යටත් නොවන බව. අපගේ හමුදාව තවමත් සූදානමින් සිටින්නේ, පියැන්කිගෙන් සායිස් රැකගන්නට. ඔහු කපා, කොටා, ගිනි ලා වනසන්නට යන භූමිය රැකගන්නට!''

තරුණ නිලධාරියෙක් කෝපයෙන් කතා කළේය. ''ඔබ වැරදියි ජෙනරල්. පියැන්කි එකම සතුරකු හෝ මරා නැහැ. එසේම, ඔහුගේ රාජකීයත්වය දකින කිසිවෙක්, කිසිදු චෝදනාවක්, දොසක් තබන්නේ නැහැ. ඔහුට!''

''නුඹයි වැරදි. ඒ නුබියානුවාට ඇත්තේ එකම අරමුණක් පමණයි. මා ඝාතනය කිරීම හා මා හා සිටින ලිබියානුවන් විනාශ කිරීම. දැනට ඔහු පෙන්වනවා අනුකම්පා සහගත බව. හෙට, ඔහු ඔහුගේ සත්‍ය ස්වභාවය පෙන්වාවි. අනුකම්පාව නොහඳුනන කෲරත්වය.!''

''පිළිගත නොහැකියි ජෙනරල්. සත්‍යය යනු සත්‍යයයි ඔබ වැරදියි.''

''තා සූදානම් වන්නේ මගේ හමුදාවෙන් ඉවත් වෙන්නද?''

''අප පරාජය පිළිගනිමු ජෙනරල්. පියැන්කි අපට සමාව දේවි.''

මහලු නිලධාරියාගේ කිරිච්චිය තරුණයාගේ පපුව සිදුරු කළේය. ඔහු දෑස් අයාගත්වනම මැරී වැටුණේය.

"අප සටන් කරනවා. අප ජය ගන්නවා!"

✷

ඩෙල්ටාවේ සිතියමෙහි යටත් නොවූ රාජ්‍ය තිබුණේ එකකි. ඒ,ටෙෆ්නැක් පාලනය කළ සායිස්ය.

"අවසන් කඩුල්ල." ලැමසෙක්ති කීය.

"ටෙෆ්නැක් ඔහු වටා දක්ෂතම මිනිසුන් තබාගෙනයි සිටින්නේ" පෝර්මා කීය. "මේ වන විට උතුමාණෙනි, ඔබ දහස් ගණනක් ජීවිත බේරාගෙන තිබෙනවා. ඒත්, මේ සටන ඉතා බිහිසුණු එකක් වේවි."

මුගටියා තම උරමත තබාගත්වනම පියැන්කි බර කල්පනාවක වැටී සිටියේය. "ඔබ ටෙෆ්නැක් වුණානම්, ඔබ කරන්නේ කුමක්ද?"

ලැමසෙක්ති තම ලී අත දිගු කළේය. "එකම බලකොටුවක් හෝ අපට එරෙහිව නැගී සිටියේ නැහැ. සායිස් ඒ තීරණයට වඩා වෙනස් වන එකක් නැහැ උතුමාණෙනි. එහි රැඳී සිටියහොත් ඔවුනට ගැලවුමක් නැහැ."

"එසේනම්" පෝර්මා කීය. "ඔහු තම හට හමුදාව වෙනත් පෙදෙසක නවත්වනු ඇති. බොහෝ විට සායිස් වෙත යන මාර්ගයේ තැනක.."

"මට නිසැකවම කිව හැකියි ඔහු අප එනතුරු සිටින ස්ථානය, මොස්ටායි." පියැන්කි කීය.

"උතුමාණෙනි, එහෙත් කෙසේද?"

"මට ඒ තොරතුරු ලැබුණා ලිබියානු කුමරකුගෙන්. ඒත්, මට අවශ්‍ය වුණා ඔබේ සිතීමේ බලය පරීක්ෂා කරන්නට."

ලැමසෙක්ති විරෝධය පෑවේය. "ටෙෆ්නැක්ට වැටහුණි නම්, ඔහුගේ සගයින් ඔහු අතහැර ඇති බව, ඔහු සිතාවි ඔබට මොස්ටයි පිළිබඳ තොරතුරු ලැබී ඇතැයි කියා. ඒ නිසාම ඔහු එම ස්ථානය වෙනස් කර ඇති."

"අපට එය විශ්වාස කළ නොහැකියි" රජු කීය. "ඔහුට අවශ්‍යයි විශ්වාසවන්ත හටයින්. ඔහුගේ අශ්ව රථ ගෙන යන පාබල හමුදා හසුරුවමින් බෝට්ටුද ඉදිරියට ගෙන යාම පහසු නොවේවි."

"මා ඒ ගැන සොයා බලන්නම්." ලැමසෙක්ති කීය.

✷

කුල්හෙඩ් සතුට හා දුක දෙක අතර මැදි වී සිටියේය. කළු පාරාවෝගේ ජයග්‍රහණය දකිමෙන් සතුටට පත් ඔහු නපාටාවෙන් හා නුබියාවෙන් සදහටම වෙන්වීම ගැන දුක් විය. පියැන්කි ඔහුට වැදගත් අමාත්‍යාංශයක් භාරදෙන පවසා තිබූ හෙයින් ඔහු තම පවුල ඊජිප්තුවට ගෙන එන්නට සිතුවේය. එහෙත්, රජ පවුල ජීවත්වන්නේ කොහේද? තිබසයේද? මෙම්පීස්හිද? පාරාවෝ ඉහළ පහළ දෙකේම ජීවත් වන බව පෙන්වීමට, ඔහු ග්‍රීෂ්ම කාලයේ උතුරේද, ශීත කාලයේ දකුණේද ජීවත් වනවාට සැක නැත.

දැන්, දෙවියන්ගේ ආදරණීය භූමියේ කරදරයට පත්වීමට ඉතිරිව ඇත්තේ සායිස් පමණි. ඇත්‍රිබිස්හි පවතින නිහඬ, සාමකාමී පරිසරය මැද වුව පියැන්කි කණගාටුවෙන් බව කුල්හෙඩ්ට පෙනිණි. ටෙෆ්නැක් ඉතා දුර්වල තත්ත්වයකට පත්වී සිටි නමුත්, ඒ ද්‍රෝහියා යම්කිසි බලාපොරොත්තු නොවූ ප්‍රචණ්ඩ යමක් කරනු ඇතැයි පාරාවෝ සැක කළේය. උතුර රුධිරයෙන් නැහැවෙන උමතු ක්‍රියාවක්! එසේම, තම කාර්යයට බලාපොරොත්තු වූවාට වඩා වැඩි කාලයක් ගන්නා ලැමසෙක්නි ගැනද ඔහුගේ සිත කරදරයෙනි.

පෝර්මා තෝන්තුවාවෙනි.! ඔහු විනීත සොල්දාදුවෙකු නොවන්නට, පාරාවෝගේ අණ නොතකා, නිසැකවම කරදරයක වැටී සිටින තම මිතුරා සොයා යන්නට ඉඩ තිබුණි. අවාසනාව මතු වී ලැම්සෙක්නිට තම කාර්යය මඟහැරුණාද? ඔහු සතුරා අතට පත්වීද?

✸

ලැමසෙක්නි ජීවතුන් අතරය!

දූවිල්ලෙන් වැසී,වෙහෙසට පත්ව, පිපාසයෙන් දැවෙමින් කිපෙන සුළු මිනිසකුව ඔහු ආපසු පැමිණ ඇත. සිසිල් බීර ජෝගුවක් බී, කටු පඳුරින් සීරී ගිය තම ලී අත සෝදා ගන්නා තෙක් ඔහු කතා කිරීම ප්‍රතික්ෂේප කළේය.

"යන්ට සිදුවුණේ මට කැළෑ මැදින්." ඔහු විස්තර කළේය. "සටන් කළා සර්පයින් හා ගෝනුස්සන් සමග, ඊළඟට මොස්ටයි අසල මඩ වගුරක එරුනත් මම ඔවුන් දුටුවා. ඇලක බෝට්ටු ගොඩක්... පාබල හමුදා කඳවුරක්..."

"භටයින් විශාල ප්‍රමාණයක්? " පියැන්කි ඇසීය.

"අපට සිටින තරම් ප්‍රමාණයක් නැහැ. මගේ තීරණය, උතුමාණනි

අපි ඇළට හා කඳවුරට එකවිට පහර දිය යුතුයි. අපගේ බෝට්ටු පසුපසුවෙන්ම ප්‍රහාර එල්ල කරාවි. දුනුවායන් මුරපොළ දෙක ඉවත් කරාවි. උතුරු මාර්ගය දිගේ ගොස් පාබල හමුදා විනාශ කිරීම අශ්වරථ හමුදාවට භාරයි.''

පෝර්මා නිහඬව සවන්දුනි.

''මට දිනක්, දෙකක් විවේකය අවශ්‍යයි.'' ලැමසෙක්නි කීය. ''ඒත් අප ඉතා ඉක්මනින් ක්‍රියාත්මක විය යුතුයි.''

පියැන්කිට ලිබියානු කුමාරවරුන්ගේ සහාය ලබාගත හැකිව තිබුණද, අවසන් යුද්ධය තමාගේම හමුදාවන් යොදාගෙන කළ යුතුයැයි ඔහු කල්පනා කළේය. නපාටාවෙන් පිටත්ව පැමිණිදා පටන් තමාට ඉතා කීකරුව, අවනතව සේවය කළ ඒ සොල්දාදුවන්!

මේ අවස්ථාවේ පෝර්මා තම සිත් කරදරය ඉදිරිපත් කළේය.

''උතුමාණෙනි, මේ යුද්ධය පරාජය වුවහොත්, ඔබේ සියලු කාර්යයන් පලක් නොවේවි. සියල්ල කණපිට පෙරළී රට පුරා කලබල රජකරාවි.''

ලැමසෙක්නි කෑ ගැසීය. ''මමයි සතුරන්ගේ සංඛ්‍යාව හා ශක්තිය පරීක්ෂා කළේ. නුඹේ දුනුවායකු නොවෙයි. අප විනාශ කිරීමට උගුල් අටවා නැහැ.''

''ඒත්, ලිබියානු අශ්වරථ හමුදාවක්...''

''එවැන්නක් නැහැ පෝර්මා. මේවා ටෙෆ්නැක්ගේ අවසන් බලඇණි. අපි ඒවා විනාශ කරමු.''

✸

පියැන්කි සහ අබිලා, ඇත්‍රිබිස් මාලිගයේ පිටත වැවේ බෝට්ටු ගමනක යෙදුනු අතර එහි හබල තිබුණේ පියැන්කි අතේය. දූල් ගවුමකින් සැරසී සිටි රැජිනගේ සිරුර, ආවරණය වූ ප්‍රමාණයට වඩා අනාවරණය වී තිබිණි. ඇයට හිරු රැසින් ආරක්ෂා වීමට සෙවනක්ද එහි විය.

''මෙයයි අවසන් කඩුල්ල. එසේ නොවෙද?'' අබිලා ඇසුවාය.

''ඔව්. මා සිතනවා ලැමසෙක්නි නිවැරදියි.''

''ඔබේ නිලධාරීන් සිත් තැවුලෙන්.''

''සත්‍යයක්!'' ඔහු කීය. ''සමහර විට පරාජයක් පිළිබඳ සිතුවිලි ඔවුන්ගේ ආත්මයන්ට කරදර කරනවා විය හැකියි.''

"නිව බලයා එය අපගේ හට කණ්ඩායම තුළට රිංගන්න උත්සාහ කරනවා. අප සටන් ඇරඹීමට පෙර එය ඉවත් කළ යුතුයි."

"ඔබේ යෝජනාව?"

"අපි අපගේ ඉතාම පැරණි චාරිත්‍ර ඉටු කරමු. රතු බඳුන් බිඳ දැමීම."

✸

නුබියානු හමුදාව මොස්ටයි බලා යාමට පෙර දින රාත්‍රියේ, අබිලා රජින ඒ චාරිත්‍ර ඉටු කළාය. සෙක්මෙට් නාමයෙන් පෙනී සිටි ඇය, ටෙෆ්නැක්ගේ නාමය සඳහන් කරන ලද රතු බඳුනක් දෙවොල් බිමේ පොළොවේ ගසා බිඳ දැමුවාය. මේ අයුරින් ඇය රතු පැහැයෙන් සංකේතවත් වන සෙට් දෙවියන්ගේ ශක්තිය යොදාගෙන ලිබියානු හමුදාවන්ට හානිවන චාරිත්‍ර ඉටු කළාය.

ඒ චාරිත්‍රය අවසන් වූ වහාම, දින කීපයක පටන් හුස්ම ගැනීමේ අපහසුතාවයකින් පෙළුන පෝර්මාට සහනයක් දැනුණි. තවත් සොල්දාදුවන් ගණනාවකට ඒ සුවය ලැබුණු බවද දැනගන්නට ලැබිණි.

අබිලා රජිනගේ ඉන්ද්‍රජාලය, ටෙෆ්නැක්ගේ ඉන්ද්‍රජාලයට වඩා ඵලදායීය. ඉතින්, නුබියානු හමුදාව පිටත් විය. ගී ගයමින්, අවසන් උතුරු කඩුල්ල පනින්නට ඉදිරියට ගියහ.

# 67

ටෙෆ්නැක්ට තවදුරටත් ඒ සන්සුන් බව දරාගත නොහැකිය. ඔහු ඇත්‍රිබිස්හි නැවතී සිටි පියැන්කිගේ හමුදාවන්ට පහර දීමට තීරණය කළේය. හදිසියේම සිදුවන එම ප්‍රහාරයෙන් පියැන්කිගේ හමුදාවට බරපතල හානි සිදුවන අතර ආපසු පැමිණ නැවතත් එවැනි ප්‍රහාර සඳහා සූදානම් විය හැකිය.

ලිබියානු සොල්දාදුවන් සූදානම්ය. පපුව හරහා කතිරය වැටෙන පටි, ගෙතූ කොණ්ඩා, උල් හැඩයට කැපූ යටි රැවුල්...... ඔවුන්ගේ පපුව හා බඩ යුදකාමී පච්චා වලින් වැසී තිබිණි. තව ඉතිරිව තිබුණේ හිසේ පිහාටු දෙකක් සවිකිරීම පමණි. රෝගීන් හෝ මහල්ලන් පවා සටනට එක්වීමට කැමති වූ අතර, පිසැප් නම් වූ හැත්තෑවියැති අශ්වරථ නිලධාරියා පවා, හමුදා බණ්ඩවල විශ්වාසය තර කිරීමට සටනට එක්ව සිටියේය.

ටෙෆ්නැක්ට නින්දක් නැත. ඒ අවිවේකී රාත්‍රියේ ඇස් පියවෙන විට ඔහුට පෙනුණේ, අති විශාල නයිල් රළ පහරක් සේ නුබියානුවන් ගංගාවක් තමා වෙතට කඩා පතින හැටිය! ඔහු ඒ රිදී පැහැගත් සඳ එළියෙන් නැහැවී ගිය කඳවුරු මැදින් ඇවිද්දේය. ජීවිතයේ පළමු වරට ඔහුගේ සිතේ සැකයක් උපනි.

ඔහුට, ඔහු ගැනම සැකය. ඔහු කළ දේ, එහි වටිනාකම, ඉන් ඇති ඵලය, සටන් කිරීමේ ඇති ඵලය,.... දෙව්ලොව හා දෙවියන් ඔහුගේ ඇස් අරින්නට කොතරම් සංඥා මහපොළොවට එවා තිබිණිද? ආමන් විසින් එවන ලදුව, පාරාවෝ ලෙස හඳුනාගන්නා පියැන්කි, සාධාරණත්වය වපුරා සතුට හා සාමය ඇති කළේය. ඒ අතර ටෙෆ්නැක් නම් වූ ඔහු? එසේය! ඔහු කැරලි ගසන, විනාශය ඇති කරන, රට වැසියන් අඳුරු අගාධයකට ඇද දමන අයකු ලෙස ඔහුටම දැනුණි.

අළුයම ළං ළංව ආයේය. ඒත්, කුරුල්ලන් ගී ගැයුවේ නැත. දුරින් ඇසෙන හඬක් ඔවුන් බියගන්වා ඇත. ගෙවෙන හැම තත්පරයක් පාසාම උස්ව නැගෙන ඒ හඬ! පියැන්කිගේ අශ්ව රථ!

ටෙෆ්නැක්, අනතුරු හඟවන නලාව හඬවන්නැයි ආරක්ෂක ප්‍රාකාර භාර නිලධාරීන්ට නියෝග කළේය. වහා අවදි වූ පාබල හමුදාව ආයුධ සන්නද්ධ වූහ. අශ්වරථ නිලධාරීන් අසුන් රථවල ගැටගසන්නට සූදානම් වනවිටත්, පෝර්මාගේ දුනුවායෝ මුර සෙබළුන් මරා දමා අවසන්ය! ටෙෆ්නැක්ගේ බෝට්ටු, පියැන්කිගේ බෝට්ටු පන්තියේ ප්‍රහාරයට ලක්වෙයි! භීතියට පත් ලිබියානුවන්ට හැකිවුණේ ඉතා දුර්වල ප්‍රහාරයක් එල්ල කිරීමට පමණි.

නුබියානුවන් විනාශ කිරීමට නම්, කළ යුතු එකම දේ ඔවුන්ගේ අශ්වරථ විනාශ කීම බව ටෙෆ්නැක්ට එක්වරම සිහිවිය.

''ඉදිරියට!'' අණදුන් ඔහුද තම රථයට නැංගේය.

''රථයේ තට්ටුවට, හම් පටි වලින් තදින් බැඳ සිටි හැත්තෑ වියැති පිසැප්, තෝන අතින් ගත්තේය.

''කොහිද මගේ රථාචාර්යයා?''

''ඔහුට වමනය!'' මහල්ලා කීය. ''මරණ බිය. කරදර නොවන්න ජෙනරල්. මා දන්නවා ඔබේ අසුන් හසුරුවන ආකාරය. මරාදමන්නට හැකිතරම් නුබියානුවන්!''

ලිබියානුවන්ට ධෛර්යය හා හැකියාව නොඅඩුව තිබුණද, ඒ භූමිභාගය ඔවුනට අවාසිදායක විය. රථ කීපයක රෝද කැඩී ගියේය. එහෙත්, නපාටාවේ වඩුවාගේ පොරොන්දුව ඉටු කරමින්, පියැන්කිගේ රථ හමුදාව ඒ බාධාවන් මැඩගෙන වාත වේගයෙන් ඉදිරියට ගියේය.

සමබරතාවය ගිලිහී ගියෙන්, බොහෝ ලිබියානු දුනුවායන් හා හෙල්ලකරුවන්ගේ ඉලක්ක මග හැරුනි. ඒ අතරම නුබියානුවෝ එකද ඉලක්කයක් හෝ මග නොහැර ලිබියානුවන් විනාශ කළහ. ඒ සමගම, මහත් ආශ්චර්යයක්! ටෙෆ්නැක්ට පියවර පනහකට අඩු දුරකින් පියැන්කි ඔහුගේ අසු පිට!

පියැන්කි, අනතුර ගැන අනවධානයෙන් එතැනටම පැමිණ ඇත! ටෙෆ්නැක් ඉලක්කය ගෙන තම දුන්නෙන් ඊයක් මුදා හළේය.!

වැලියන්ට්, ඒ මොහොතේම පෙරළුන අශ්වරථයක් මගහරින්නට දිගු පිම්මක් පැන්නේය. ඊතලය කළු පාරාවෝගේ ගෙල සූරාගෙන ඇදී ගියේය.

''ජෙනරල්තුමනි,'' බලාපොරොත්තු කඩ වූ පිසැප් කෑ ගැසීය. ''අප පසුබැසිය යුතුයි.''

ටෙෆ්නැක් හැරී බැලීය. ඔහුගේ සියලුම අශ්වරථ කැඩී ගොස්ය.

''වහාම ඇළ දෙසට!'' ඔහු අණ කළේය.

එහි බෝට්ටුවල ප්‍රහාරයන්ට ප්‍රහාර එල්ල කිරීමට යැයි සිතූ පිසැප් එසේ කළේය.

ඇළ අසලදී බිමට පැනගත් ටෙෆ්නැක්, ළඟම තිබූ බෝට්ටුවට පැන්නේය. එහි රුවලට ගිනි තැබුවේය. උදෑසන මඳ සුළඟ ගින්නට පවන් සැලීය. ඒ, ඉක්මනින්ම ඊළඟ බෝට්ටුවේ රුවල අල්ලා ගති.

පිසැප් බිය විය. ''කිමද ජෙනරල් තුමනි?''

''පියැන්කිට මගේ නැව් පන්තියට අත තැබිය නොහැකියි. දූන් අප සැමට මරණය! අපි ආපසු සටනට යමු!''

''නැහැ. අප දිවි බේරාගත යුතුයි.''

''නොහැකියි!''

''ඇළ පාර අයිනෙන් දිවෙන මග ගත හැකියි. ජෙනරල්! එහි උතුරට ගොස් තිරිඟු යාය හරහා ගමන! ඩෙල්ටාවේ ගොහොරු බිම අපට ආරක්ෂිතයි. මා දන්නවා පියැන්කිගේ සොල්දාදුවන්ට කිසිදා සොයාගත නොහැකි ස්ථාන,සැඟවෙන්ට.''

''අශ්වරථ පළලින් වැඩියි!''

''ඉදිරියට මගේ දරුවනි, ඉදිරියට!'' පිසැප් කෑගැසීය.

අශ්වයෝ ඉදිරියට දුවන්නට වූහ.

✸

මුළු ලිබියානු හමුදාවෙන්ම ඉතිරිව සිටියේ ටික දෙනෙකි. ඒ අතරින්ද බොහෝ දෙනෙක් දරුණු ලෙස තුවාල ලබා සිටියහ. ටෙෆ්නැක්ගේ හමුදාවලට දැඩි හානි සිදුවී තිබිණි.

පියැන්කි, තුවාලකරුවන් බලාගන්නා ලෙස වෙදදුරුට අණ කළේය. ඉක්බිති ඔහු අසු පිටින් ගියේ, තමාට සුභ පතන, ආචාර දක්වන සොල්දාදුවන් දෙසටයි. ඔහු ඔවුනට කතා කළේය.

''ඔබ සටන් කළේ මිනිසකුගේ කීර්තිය වෙනුවෙන් නොවේ. ඔබේ සටන ඊජිප්තුව හා එහි පාරාවෝ වෙනුවෙන්. දිව්‍යමය මාආට් නීතියේ ලෞකික නියෝජිතයා වෙනුවෙන්. මේ යුද්ධය අවසානයි. අද ඔබ සාමය ගොඩනැගූ උතුම් මිනිසුන්. කිසිවකුට හිංසා නොකරන්න, දුර්වලයා

රැකගන්න. ජනතාවගේ ආරක්ෂාව සහතික කරන්න. එලෙස කිරීමෙන් ඔබ හැමදෙනාම ජයග්‍රහණය ලබනු ඇති.''

ලැමසෙක්නි හා පෝර්මා සමග යුදපිටිය සිසාරා ගිය පියැන්කි, ටෙෆ්නැක්ගේ සිරුර සොයන්නට විය. නුබියානුවෝ මළසිරුරුවල දකුණත කපාගත්හ. එමගින් මියගියවුන් ගණන් බලන අතර,ලේකම්වරු ඒවා සටහන් තැබූහ.

උරහිස තුවාල වූ ලිබියානු රථාචාර්යයකු දෙන ලද සලකුණු අනුව, පෝර්මා දෙවරක්ම ටෙෆ්නැක්ගේ සිරුර යයි අනෙකක් තෝරාගත්තේය. ඒ දෙවරම, රථාචාර්යයාට පෙන්වූ කළ ඒ ජෙනරල් නොවන බවට හඳුනා ගැනිණි.

ටෙෆ්නැක් අශ්වරථයක නැගී උතුරට පලාගිය බවට සාක්ෂි කීපයක්ම ලැබුණෙන්, ඒ සත්‍යයැයි ලැමසෙක්නි තීරණය කළේය. වරපුරුෂයින් කීප දෙනෙකුගේ සහයෙන්, රථරෝදවල සලකුණු පිහිටි මාවත සොයාගන්නට ඔවුනට හැකි විය.

පියැන්කි තම කෝපය නොසඟවාම කෑ ගැසීය.

''එසේනම්, ටෙෆ්නැක් තවමත් ජීවතුන් අතර.''

''මා ඔහු සොයන්නට භට පිරිස් කීපයක් යවන්නම්, උතුමාණෙනි,'' පෝර්මා පොරොන්දු විය.

✸

බෝලයක් සේ ගුලිවුණු මුගටියා,පියැන්කිගේ ඇකයෙහි නිදන්නට විය. ඌට ඒ සැප නින්ද ලැබුණේ, එදා ටෙෆ්නැක්ගේ නීතියට යටත්ව තිබූ අඳුරු ශාලාවේ, රන් ආලේපිත සිහසුනක් මතය.

නෙයිත් දෙවඟනගේ නගරය, කළු පාරාවෝට අයිති වී තිබිණි. පියැන්කි තම වැසියන් නිදහස් කරනු ඇතැයි සිතූ ඒ නගරය, දැඩි නිහඬ බවකින් වෙළී ගියාය. කළු පාරාවෝට නින්ද ආවේ නැත. සතුරාගේ ඊළඟ සැලසුම කුමක් විය හැකිද?

ඒ අත්හැර දමන ලද මාලිගයේ නිහඬ බව මැද, පියැන්කි කල්පනා කළේ කිසිදු සහායක් නැතිව තනි වූ ටෙෆ්නැක් ගැනයි, තම සතුරා ගැනයි. ටෙෆ්නැක්! තම සිහිනය වෙනුවෙන් සියලු ශක්තිය යෙදවූ ඒ මිනිසා! ඔහු ඊජිප්තුවේත්, තමාගේත් ඉරණම වටහාගෙන තිබුණේ වැරදියටයි!

අබිලා නග්න දෙපයින් ඒ අඳුර තුළින් පැමිණ, සිහපුන අසල බිම වාඩි වී තම හිස සැමියාගේ දෙදණ මත තැබුවාය.

"කුමක්ද වරපුරුෂයින් සොයාගත් සාක්ෂි?"

"කිසිවක් නැහැ." පියැන්කි පිළිතුරු දුනි. "ටෙෆ්නැක් ඩෙල්ටාවේ දූපත් හා ගොහොරු බිම් හොඳින් දන්නවා. ඔහු එකකින් තවෙකකට පනිමින් සැඟවී සිටීවි."

"කිමද ඔබ, ඔහු ඒ හුදකලාවට නිදහස් නොකරන්නේ?"

"ඔහු එයින් සෑහීමකට පත් නොවන නිසා. ඔහු බෝට්ටු කරුවන් හා ධීවරයින් එක්කරගෙන ගම්මාන කොල්ලකාවි. රටේ කෙලවර අසමගිය, අනාරක්ෂිත බව රජකරාවි. මට ඉඩදිය නොහැකියි."

# 68

එහෙත්, ටෙෆ්නැක් පියැන්කි සිතූ පරිදි හුදකලා වූයේ නොවේ. ඔහු ඒ ඩෙල්ටාවේ අනතුරුදායක, භයංකර ගොහොරු බිම් වෙත යන අතර කල්පනා කළේ, නූබියානුවන්ට එරෙහිව සටන් වැදීම සඳහා ධීවරයින් එකතු කරගන්නා හැටිය. සායිස් හි උතුරු දෙස පිසැප් හඳුනන මිනිසුන් සිටි අතර, ඔවුන් ඔහුගේ සහයට එනු නිසැකය.

ඔවුහු බිඳී ගිය රථය අත්හැර දැමූහ. ඉන්පසු පැපිරස් බෝට්ටුවක ආධාරයෙන් ඒ ගොහොරු බිමේ යාත්‍රා කළ ඔවුන් අල්ලා ගැනීමට කිසිදු නූබියානුවෙකුට හැකියාවක් නැත. ඒ දුෂ්කර මග ඔස්සේ ධීවරයින් ජීවත්වන දූපත්වලට යෑම, ඉතා හොඳ හැකියාවක් ඇත්තකුට මිස, කළ නොහැක්කකි.

ටෙෆ්නැක් හා පිසැප් එක දූපතකට ළංවූහ. එහි පැපිරස් පඳුරු අතර සැඟවී තිබුණේ කුඩා ශෛලමය දෙවොලකි. එය, සර්ප දෙවඟන වූ වැජිට් වෙනුවෙන් ඉදිකරවන ලද අතර, ලිබියානු හමුදාවේ භාණ්ඩාගාරික තැන රන් හා වටිනා ගල් සඟවා තිබුණේ එහිය. ඒ සුළු වස්තුවට පින්සිදු වන්නට, පියැන්කිට එරෙහි කැරලි ඇතිකිරීමට ටෙෆ්නැක්ට හැකිවනු ඇත.

ඒ දූපතේ කුඩා පැලක් විය. පිසින ලද මාළු ආහාරයට ගැනීමෙන් පසු ඔවුහු නිදාගන්නට පැලට ගියහ. මැදියම් රැයේ ඔහුට යම් හඬක් ඇසුණි. පක්ෂියකු පියාසලන හඬක්! අසිපත රැගත් ඔහු පිටතට ගියේය.

සඳ වලාකුළක සැඟවී තිබුණද, ඒ රාත්‍රිය දහවල සේ පැහැදිලිය. ඒ ආලෝකය තුළ ඔහුට පෙනුණේ කුමක්ද? රියන් දොළහක් උස පැපිරස් නටුවක් මත වසා සිටි, මිනිස් හිසක් සහිත කුරුල්ලෙක්. ඌ බලා සිටියේ ටෙෆ්නැක් දෙසයි.

එසේනම් ඒ මිත්‍යාව බොරුවක් නොවේ. මුතුන් මිත්තන් එහා ලෝකයෙන් ආපසු පැමිණෙන විට, ආලෝකය ඔවුනට මිනිස් හිසක් ඇති කුරුල්ලන් සේ විද්‍යාමාන වීමට ඉඩ සලසයි. කුරුල්ලාගේ ස්වරූපය වෙනස් විය. ඒ මුහුණ තුත්මොසිස්, ආමෙන්හොටෙප් හා මහා රැම්සීස්...

ලෙසයි ටෙෆ්නැක්ට පෙනුණේ. ඒ සියලු පාරාවෝ වරු ඔහුට දොස් පවරන්නට වූහ.

තද සුළඟක් හමා ආයේය. අඳුර, ආලෝකය ගිලගන්නා හාම කුරුල්ලා ඉගිල ගියේ, නීලමාණික්‍ය පැහැති සලකුණක් ඉතිරි කරමිනි.

✸

"පිසැප්, මට ඔබේ සහාය අවශ්‍යයි. ඉතා වැදගත් මෙහෙයක් සඳහා," ටෙෆ්නැක් කීය. "මේ පණිවුඩය පියැන්කි වෙත ගෙන යන්න."

මහල්ලා කත කැසීය. "මට... කුමක්ද ඇසුණේ ජෙනරල්? ඔබ...? කුමක්ද පැවසුවේ...?"

"ඔබට මා පවසූ දේ හොඳින් ඇසුනා පිසැප්."

"ටෙෆ්නැක්... ඔබට අවශ්‍ය යටත් වෙන්නද?"

"නැහැ. අවශ්‍යයි මට සාකච්ඡා කරන්නට. සායිස් පළාතේ නියෝජිතයන් ලෙස ඔබට බියවීමට හේතුවක් නැහැ."

"ඔබ පවසන්නේ, ඔබ සටන අත්හරින බවද?"

"ඔව්. අත්හරිනවා සටන! මගේ මුතුන් මිත්තන් මා ඉදිරියේ පෙනී සිටිමින්, මට පහදා දුන්නා මා ගත් මග වැරදි බව. අද සත්‍ය පාරාවෝ සිටිනවා. ඉයුනු,මෙම්පීස් හා තීබසයේ කිරුළු පැළඳි. අප ඔහුටයි අවනත විය යුතු. ඔහු, මා සිහින දුටු එකමුතුකම ඇතිකර හමාරයි, පිසැප්. වැසී තිබූ මගේ දෑස විවර වුණේ මේ දූන්. අන්තිමේදී... ඊජිප්තුව සාමය හඳුනාගත්තාට පසුව මා තවදුරටත් විනාශකාරයෙකු නොවිය යුතුයි."

"ඔබේ ඉරණම ඔබ දන්නවා, සාකච්ඡා කළත්, නැතත්."

"කැරලිකරුවකු වූ මට මරණ දඬුවම හිමිවේවි. පාරාවෝට ඒ තීරණය ගැනීමට සිදුවේවි. මා ඔහුගේ තැන සිටියා නම් මා කරන්නේත් එයමයි. එහෙත් මට දෙපයින් සිටගෙන මිය යන්නට අවශ්‍යයි. මගේ විනිශ්චයකරුවන්ගේ මුහුණට මුහුණලා! පිටේ ඊයක් අමුණාගත් බියගුල්ලකු වීමට නොහැකියි! එසේම මගේ පැතුම, මගේ යටත් වීමෙන් ඔවුන්ගේ හදවත්වලින් යුද්ධය යන වදන ඉවත් කිරීමයි. මට පාරාවෝගේ සමාව අවශ්‍යයි. එවිට මට හැකියි මරණින් මතු ලොවේ අධිකරණය ඉදිරියේදී නිදහස් වෙන්නට."

✸

"ඉක්මන් කරන්න ලැමසෙක්නි." පෝර්මා බලකරන්නට විය. "අප ප්‍රමාදයි. රැවුල බා මුහුණ සෝදාගන්න. වහාම."

"මට නිදිමතයි. ඔබ යන්න."

ලැමසෙක්නිගේ වෙහෙසට හේතු වූ රූමත් තරුණිය, දැඩි සැලකිල්ලෙන් ඔසවාගත් පෝර්මා, ඇය හෙමිහිට බිමින් තැබීය. එවිට ඈ ඔහු වෙත පෑ සිනාවෙන් වශී වෙන්නට තරම් විවේකයක් ඔහුට නොවීය.

යළිත් වරක් ඒ තරුණිය ගැන සිහින දකින්නට සූදානම් වූ ලැමසෙක්නි, අනෙක් පසට හැරුනද, පෝර්මා ඇඳේ පැත්තකින් අල්ලා එය උඩු යටිකුරු කළේය.

ගල් අතුරන ලද බිමට පතිත වූ ලැමසෙක්නිගේ නිදිමත අතුරුදහන් විය.

"මේ හමුදා උත්සව මට පිළිකුල්, මිත්‍රයා." පිට අතගාමින් ලැමසෙක්නි ගොරවන්නට විය.

"අවශ්‍යද ඔබට සීතල වතුර ජෝගුවක් නාන්නට?"

"හෝ... එපා... එපා..."

"අප තවමත් අර නීච ටෙෆ්නැක් අල්ලා නොගත් නිසා අපට තිබෙන තර්ජනය ඔබට නොවැටහේද?"

"ඒ කෙසේ වෙතත්, අප පාරාවෝගේ අණට කීකරුවිය යුතුයි. අප මේ උත්සවයට යා යුතුයි. මාදුන් ඔබ වෙත විසිකරනවා පිරිසිදු කෙටි සැට්ටයක්. වහාම සූදානම් වන්න."

ලැමසෙක්නි බුම්මාගත් වනම සූදානම් වූයේය.

සටනේදී පෙළහැර පෑ දක්ෂ සොල්දාදුවන්ට රන් තිළිණ බෙදා දෙන විටද, ඒ මහ සෙනග මැද ලැමසෙක්නි හිටගෙන නිදා වැටුණි.

ඊළඟ මොහොතේ පාරාවෝ මෙසේ කීය. "මේ උදාවන්නේ අපගේ විශිෂ්ටතම නිලධාරීන්ට ගෞරව දැක්වීමේ අවස්ථාවයි. ඒ සඳහා සුදුසු පළමුවැන්නා, සතුරාට එරෙහිව නැවත නැවතත් දිවි පරදුවට තැබූ, පසුබැස්මක සිතුවිල්ලකින්ද තොරව ඉදිරියට පා තැබූ, තම දුනුවායන්ටද ඒ වීරත්වය උගන්වන නිලධාරි පෝර්මා, ජෙනරල් තනතුරට උසස් කෙරෙනවා."

ලැමසෙක්නිගේ ඇස් පුදුමයෙන් විවර විය. මිනිසුන් පීරාගෙන ඉදිරියට ගිය ඔහු, පාරාවෝ ඉදිරිපිට සිටගති. පෝර්මා ජෙනරල් වරයෙක්!

නිසිදු යුද උපක්‍රමයක් නොදන්නා දුනුවායෙක්! නිසි ප්‍රහාර නිවැරදිව එල්ල කිරීමට කිසි අවබෝධයක් නැති දුනුවායෙක්! නැත, නැත,එසේ නොවෙයි. දුනුවායා තරුණයි, ධෛර්යයෙන්ද අඩුවක් නැත. ඔහු අනෙක් හැම කෙනෙකුටම වඩා හොඳ නිලධාරියෙකු වනු නිසැකය.

"දැන් ඒ තනතුරම, ඒ ප්‍රශංසාවම ලැබෙන්නේ ලැමසෙක්නිට." පාරාවෝ පැවසීය.

ඇකේෂියා ලී අතක් සහිත මිනිසාගේ සිරුර සීතල විය. දෙසවන් අදහාගත නොහැකි වූ ඔහු දෑස් පිසදා අවට බැලීය. ඉදිරියට යාගත නොහැකිව එතැනම ගල්ගැසී සිටින ඔහුගේ අතින් අල්ලාගත් පෝර්මා, ඔහු රජු වෙත කැඳවාගෙන ගියේය. රජු ඔහුට රන් සලකුණ පැළඳවීය.

"මගේ ජෙනරල්වරුනි, මට ඔබ ගැන බොහොම ආඩම්බරයි. ඔබ ඉදිරියටත් අණ දෙනවා ඊජිප්තු හමුදාවන්ට, ලිබියානුවන්, නුබියානුවන් හා ඊජිප්තුවන්ගෙන් සැදී ඊජිප්තු හමුදාවට! අපගේ හමුදාවන්ගේ එකමුතුකම රැකගැනීම ඔබට භාරයි."

✸

"ජෙනරල් ලැමසෙක්නි." කුල්හෙඩ් කියන්නට විය. ඔහු කැළඹී සිටි බව පැහැදිලිව පෙනිණි. "ටෙෆ්නැක්ගේ පණිවුඩකරුවෙක් උතුමාණන් හමුවට අවසර පතනවා."

"මා සිටින්නේ නිල සාකච්ඡාවක" ලැමසෙක්නි කීවේය.

"ජෙනරල් තුමනි, මෙය ඉතා වැදගත් කරුණක්."

තම උසස්වීම සැමරීමට හිතවතුන්ට ආරාධනා කර තිබූ ලැමසෙක්නි ඔවුන් සමග සතුටු වෙමිනි සිටියේ! ජලය සමග මිශ්‍ර නොකරන ලද විශිෂ්ට කාන්තාර වයින් තොලගාමින්, ඔහු තම මිතුරන්ට නොමසුරුව සංග්‍රහ කරමින් සිටියේය.

"ඔහුගේ නම පිසැජ්." කුල් හෙඩ් කීය. "ඔහු සතුව තිබෙනවා ටෙෆ්නැක්ගේ මුද්‍රාව සහිත ලිපියක්."

එකම දවස තුළ සිදුවන දෙවැනි ආශ්චර්යය!

ලැමසෙක්නි සිසිල් ජල බඳුනක් හිස මත වත්කරගති. එහෙත්, ඒ අද්භූත දසුන පහව ගියේ නොවේ. කුල්හෙඩ්, ඇත්තටම ඔහු ඉදිරියේය.!

ජෙනරල්වරයෙකුට හිමි අභිමානයෙන් පිසැජ්ට සවන් දුන් ලැමසෙක්නි, තම අශ්වයා අතගාමින් සිටි කළුපාරාවෝ වෙත ඔහු කැඳවාගෙන ගියේය.

කළු පාරාවෝගේ උස සිරුර දුටු පමණින් ම බය වූ ලිබියානුවාගේ මුව ගොළු විය.

"මේ රාජදූතයා මා වෙත පණිවුඩයක් ගෙනා බව සත්‍යයක්ද?" පියැන්කි ඇසීය.

ලැමසෙක්නි, පිසැප්ගේ අතින් පැපිරසය ගෙන, එහි මැටි මුද්‍රාව කඩා, දිගහැර කියවන්නට විය.

*ජෙනරල් ටෙෆ්නැක් ගෙන් ඉහළ සහ පහළ ඊජිප්තුවේ පාරාවෝ වෙත. ඔබ දිගුකල් ජීවත් වේවා! නිරෝගී වේවා! කිසිවකු ඔබේ දෑස් දෙස සෘජුව නොබලන හෙයින්ද, ඔබේ දෑසින් පිටවන ගින්න කිසිවකුට දරිය නොහැකි හෙයින්ද උතුමාණනි, සාමය ඔබ සමග පවතීවා! බලවත්, ජයග්‍රාහී හස්තයක් හිමි ගවයා ඔබයි. ඔබ මා පරාජය කිරීමෙන් පසුව ඔබේ හදවත සන්සුන්ව ඇතැයි සිතමි. ටෙෆ්නැක් නම් වන මම, විනාශ වූ,අතරමං වූ මිනිසෙක් වෙමි. මට අනුකම්පා කරනු මැනවි! ගසේ මැරුණු අතු කපා දමන්න. එහෙත් එහි මුල් නොකපන්න. මම ඔබට බියෙන් සිටිමි. එය සත්‍යයකි. ඒ බිය මගේ සිරුරට රිංගා එය කීතු කීතු කර දමයි. මගේ ඇට කටු පුපුරුවා හරී. ඔබ මා පරාජය කළ දා පටන් මා අනුභව කළේ සාගින්න නැමති ආහාරය පමණි. මා පානය කළේ පිපාසය නමැති ජලය පමණි. මගේ වස්ත්‍ර ඉරී ගොසිනි. මගේ ශරීරය වේදනාවෙන් කකියයි. මගේ නගරයට අධිපති නෙයිත් දෙව්දුව,මගේ වැරදි වලට සමාව දෙනු ඇතිද? ඔබ දිගින් දිගටම මා දඬයම් කරයි. මගේ ශක්තිය සිඳී ඇත. මගේ වැරදි වලින් මා බේරාගන්නා ලෙස, මා ඔබෙන් ඉල්ලන්නේ එහෙයිනි. මගේ සියලු වස්තුව, මගේ අශ්වයින් ඔබේ භාණ්ඩාගාරයට එක්කරගන්න. උතුමාණෙනි, මගේ මේ ආයාචනයට සහනදායී පිළිතුරක් දෙන්න. එවිට, මගේ හද දවන මේ වේදනාව පහව යනු ඇත."*

පියැන්කි, බොහෝ වේලාවක් පිසැප් ගේ සිරුර ඉවකර, සන්සුන්ව තද නින්දට වැටුනු මුගටියා දෙස බලා සිටියේය. පිසැප්ගෙන් අනතුරක් නැත!

"තවත් පණිවුඩ තිබේද?" පියැන්කි ඒ වන විටත් වෙව්ලමින් සිටි මහල්ලාගෙන් ඇසීය.

"එසේය උතුමාණෙනි, ටෙෆ්නැක්ට ඔබ හමුවීමට අවශ්‍යයි. තනිවම, නෙයිත් දොවොලේදී."

# 69

තර ඔටොකු සහ කෙට්ටු කාපා, කඩා වැටුණු පාම් ගසක කඳක් මත ඉඳගෙන සිටියහ. කාපාගේ සිහින් අත්, බස්තමේ මුදුනෙහි රැඳී තිබිණි. ඒ දෙදෙනාගේම දෑස් එල්ල වී තිබුණේ කාන්තාරය දෙසටයි.

''කොතරම් සුභ ආරංචියක්ද?'' ඔටොකු කීය. ''මෙතැන් පටන් උතුර, දකුණ,බටහිර හා නැගෙනහිර සියලු පළාත් පාරාවෝට අවනතයි. කිසිදු පළාතක් ඔහුට එරෙහි නොවේවි. හැම පුරවැසියෙකුගේම ගෞරවය ගොඩබිම් දෙකේ නායකයාටයි.''

''බොහොම හොඳයි, බොහොම හොඳයි'' කාපා කීය. ''ඒත් මා බොහොම කැමැත්තෙන් ගෙල සිඳිනවා අර පෙෆ්ටෝ සහ නෙම්රොඩ්ගේ. එතරම් ඉක්මනින් දේශද්‍රෝහී වී ටෙෆ්නැක්ගේ දෙපතුල වැටුණු ඔවුනට හිමි තිළිණය එයයි.''

''පෙෆ්ටෝ රෝගියෙක්. ඉක්මනින් ම ඔහු රාජ්‍ය කටයුතු වලින් ඉවත් වේවි. නෙම්රොඩ් දැන් පියැන්කිගේ ඉතා සුවච සහායකයෙක්. ඔහු ඉතා කාර්ය බහුලයි. නැහැ කිසිම නිදහසක්.''

''පාරාවෝ කොහේද පදිංචි වෙන්නේ?''

''මෙම්පීස්හි. නිරතුරුවම ඩෙල්ටාවේ ආරක්ෂාව ගැන සහතික විය යුතු නිසා.''

''හොඳ තීරණයක්!'' කාපා කීය.

''ඒත්... මෙම්පීස් බොහෝ ඈතයි.''

''ඔබ ඊට හුරුවිය යුතුයි ඔටොකු. අප එකට වයසට යාවි, නපාටාවේදී. පියැන්කි අපට හිමිකර දුන් ඒ සුන්දර මතකයන් සමග අපට අනාගතය ගෙවා දැමිය හැකියි. දැන් ඔහු සතු වගකීම් සමුදාය, ඊජිප්තුව තරමටම විශාලයි.''

''එය, ජයග්‍රහණයක්. ඔබ සත්‍යයි. ඒත් එය අපව රජු හා රැජිනගෙන්

සඳහටම වෙන් කරනවා. අපට ඔවුන් අහිමිවේවි.'' ඔටොකු ශෝකයෙන් කීය.

''ඔවුන්ගේ දෛවය, අපගේ දෛවයට වඩා වෙනස් මිත්‍රයා. ඔවුන්ගේ ජීවිත ඔවුන්ට අයත් නැහැ. රටේ හා ජනතාවගේ සතුට හා සෞභාග්‍යය වෙනුවෙනුයි ඔවුන් ජීවත් වන්නේ. පුද්ගලික ජීවිතයක් ඔවුන්ට නැහැ.''

ඔටොකු, දූඩි සිත් තැවුලෙන්. කේක් කැබැල්ල හපන්නට විය. හැමදාම කතාව අවසන් කරන්නේ මේ මහල්ලාම නොවැ?

✸

තෙයිත් දෙවොල පිටත රැඳී සිටි ලැමසෙක්නි, තම මිතුරා වූ ජෙනරල් පෝර්මාගේ කතාවට එකඟ වෙමින් රජුට විරෝධය දැක්විය. ''උතුමාණෙනි,අනතුරුදායකයි. එය ඉතාම අනතුරුදායකයි. මා කිසි විටක පිළිගන්නේ නැහැ ටෙෆ්නැක් යටත් වේවි කියා. ඔහු ඔබට බොහෝ බොරු කියා තිබෙනවා. මේ ඔහුගේ අවසන් උගුලයි. තනිවම ඔබ හමුවීමට උත්සාහ කරන්නේ, උතුමාණෙනි ඔබව මරාදැමීමට පමණයි.!''

''මට හැකියි පහසුවෙන්ම මගේ ආරක්ෂාව සලසාගන්නට.''

''එය සත්‍යයක් වුවත්, උතුමාණෙනි, කුමටද අවදානමක් ගන්නේ? රටට ඔබව අවශ්‍යම වෙලාවක?''

''අවම වශයෙන් මට ඔහු පරීක්ෂා කිරීමට ඉඩදෙන්න, උතුමාණෙනි.'' පෝර්මා කීය.

''උතුමාණෙනි, ඔහු පැමිණෙනවා.'' ආරක්ෂකයා කීවේය.

පියැන්කි හැරී දෙවොල තුළට ගියේය.

පිසැප් විසින් කැඳවාගෙන එන්නට යෙදුනු පරාජිත ජෙනරල්ගේ අශ්ව රථයට ඉතා බරපතල ලෙස හානි වී තිබිණි. එහි තට්ටුව පුපුරා ගොසිනි. රෝද කැඩී යන්නට ආසන්නය. පියැන්කිට පෙනුණේ දුර්වලව, වෙහෙසට පත්ව සිටි අශ්වයින් දෙදෙනා පමණි.! රජුගේ සිතුවිලි හඳුනන අශ්වගාලේ සේවකයා, අවශ්‍ය ප්‍රතිකාර ලබාදීම සඳහා ඔවුන් දෙදෙන වහාම අශ්වගාලට රැගෙන ගියේය.

ලැමසෙක්නි පිසැප්ගේ උරහිස් වලින් ඇල්ලුවේය.

''කළු පාරාවෝ ටෙෆ්නැක් මරා දමාවිද?'' මහල්ලා ඇසීය.

''ඔබ මහලු සොල්දාදුවෙක්! ඔබ දන්නවා යුද්ධ නීතිය. එන්න,

එයින් උගුරක් බොන්න. දැන් සිදුවීමට යන දේ ඔබට අමතක වේවි, එයින්.''

✸

ටෙෆ්නැක්ගේ කෙසේ හා රැවුල වැවී තිබිණි. ඇඳුම වැරහැල්ලකි. වගුරු බිමක ගත කළ කාලය විසින් ඔහු යාචකයෙකු බවට පත් කර තිබිණි. නමුත්, ඔහුගේ දෑසේ අහංකාරකම නම් නොඅඩුව තිබිණි. සොල්දාදුවන් දෙපෙළක් අතරින් ගමන් කළ ඔහු, දෙවොල් දොරටුව අසලට පැමිණියේය. ඔහු එනතෙක් එහි බලා සිටි පෝර්මා, ඔහු පරීක්ෂා කොට සැඟවුනු ආයුධ කිසිවක් නැති බව සැක හැර දැන ගත්තේය. ඒ අතරම, අවිශ්වාස කටයුතු අමුත්තන් පලවා හැරීමේ රාජකාරිය භාරව සිටි මුගටියා, සිංහ පිළිරුවක් මත නැගී සිටිමින් කිසිදු විරෝධයකින් තොරව බලා සිටියේය. අනතුරක සේයාවකුදු නැත!

ටෙෆ්නැක් ඒ අතිවිශාල දොරටුව අතරින් ගමන් කළේය. සුවිසල් මිදුල හරහා ගොස් කුලුනු ශාලාවට ඇතුල් විය.

දෙබිඩි කිරුළ පැළඳ සිටි කළු පාරාවෝගේ ගෙල වටා රන් කරපටියක් විය. සුදු පැහැති පාවහන් හා සුදු කෙටි සායද ඔහුගේ ඇඳුම විය. ඔහු ආලෝක ධාරාවක් තුළ ගලක් සේ නිසලව හිටගෙන උන්නේය.

කළු පාරාවෝට ළං වෙත්ම, ඒ විසල් මිනිසා අපරාජිත වූයේ මන්දැයි ටෙෆ්නැක්ට වැටහුණි. ඒ උත්තුංග දේහයට සරිලන ආත්මීය බලයක් හිමි ඔහුට, නොදන්නා මං ඔස්සේ යමින්, කිසි දිනක දුර්වල නොවී සටන් කිරීමේ හැකියාවක් ඇත. ඔහු ජයග්‍රහණ ගැන සිහින නොදකින අතර සතුරා කවරකු වුවද එක්වරම පහරදෙයි. ඒ හැමවරකම ජයග්‍රහණය ඔහු හඹා එයි.

''මා ඔබට අවනතයි, උතුමාණෙනි'' ටෙෆ්නැක් පැවසීය.

පියැන්කි, බැටළු හිසක හැඩය ගත් රිදී කොප්පුවකින්, කිරිච්චියක් ඇද ගත්තේය.

ටෙෆ්නැක් වෙව්ලා ගියේය. එහෙත්, ඔහු වෙතින් බියක් හෝ තැති ගැන්මක් විද්‍යාමාන වූයේ නොවේ. ඔහු පැතූ ලෙසම, නොබියව මරණයට මුහුණ දෙනු ඇත.

''මට අවශ්‍යයි, මට සහාය දක්වන බවට ප්‍රතිඥාවක්.'' රජු කීය.

තමාගෙ තරම පරයන ශක්තියක් මවාගත් ටෙෆ්නැක්, ජීවිතයේ පළමුවරට බිම වැතිර ආචාර දැක්වීය.

''මා, මාඇට් නීතිය බිඳින්නේ නැහැ, උතුමාණෙනි.'' ඔහු පොරොන්දු විය. ''මම පාරාවෝගේ අණට කීකරු වෙමි. මම ඔහුගේ ආඥාවන් ක්‍රියාත්මක කරමි. මම ඔහුගේ සහායකයින්ට පහර නොදෙමි. පාරාවෝගේ කැමැත්තට අනුව ක්‍රියා කරමි.''

ඔහු නැගී සිටින විට, කිරිච්චිය එහි කොපුව තුළ විය.

''ටෙෆ්නැක් කුමරුනි,'' පියැන්කි කීය. ''මා නුඹට සායිස් නගරය භාර දෙනවා. ඒ නගරය ගැන අන් කිසිවකුට වඩා දන්නේ නුඹයි. නුඹ මෙ පළාතේ ජනතාව සතුටින් තබන්නට මහන්සි ගන්න. මා නුඹට දෙන නීති රීති අනුව කටයුතු කරන්න. නුඹ දිනපතාම දෙවොලට ගොස් පවිත්‍ර විය යුතුයි. හැම මසක ම දින තුනක් එහි රැඳී සිටිය යුතුයි, මෙලොව සියලු භෞතික කටයුතුවලින් මිදී දෙවියන්ගේ හඬට සවන් දීමට හා මා-ආට්ට එරෙහිව නුඹ තුළ ඇති සියලු ආශාවන් සිඳ දැමීමට නුඹ පොරොන්දු වෙනවාද? නුඹේ හා පාරාවෝගේ නාමයෙන්, එම වගකීම ඉටු කිරීමට?

''එසේය, උතුමාණෙනි. මා පොරොන්දු වෙනවා.''

✸

නුබියානු නැව් පන්තිය නපාටාවට ළංව එයි. ඔටොකු ඒ දෙස බලාගෙන කල්පනා කළේ, එය සමගම තමා පිට පැටවෙන වගකීම් සමුදාය ගැනයි. පියැන්කි තම පොරොන්දුව ඉටු කරමින් රන්, රිදී, තඹ, අගනා රෙදිපිළි හා ආමන් දෙවොල තුළ දැල්වීමට දුර්ලභ සුවඳ ද්‍රව්‍ය එවා තිබිණි. ඒ සියල්ල එකතු කොට නිවැරදිව සඳහන් කර භාණ්ඩ වට්ටෝරුවක් සකස් කළ යුතුය. එය කළ යුත්තේ කාපාගේ පරීක්ෂාකාරී බැල්මට යටත්වය. ඒ මහල්ලා ඉතා සුළු වරදකට හෝ ඉඩක් නොතබයි. අහෝ! කුල් හෙඩ් ඔහුගේ තැන සිටියා නම්! ඔටොකුට වෙනත් කිසිම ලේකම්වරයෙකු විශ්වාස නැත. ඒ නිසා ම ඒ බරපතල කටයුතු සියල්ල තනිවම කරගන්නට ඔහු තීරණය කළේය.

සටන් නිමකර, නුබියාව බලා ආපසු එන්නට තරම් වාසනාවන්ත වූ සොල්දාදුවන් පිළිගැනීමට, නාපාටා වැසියෝ තොටුපොළට රැස්ව සිටියහ. සොල්දාදුවන්ගෙන් කොටසක් ආපසු නොපැමිණ,ලැමසෙක්නි හා පෝර්මාගේ අණසක යටතේ, ඊජිප්තුව, මෙම්පීස් හෝ තීබසයේ නැවතී සිටියහ.

ඔවුහු එක්ව ගී ගැයූහ. එකිනෙකා වැළඳගෙන සිපගත්හ. පියැන්කිගේ නම කියා කෑ ගැසූහ. ගොඩබැසීමට පෙර ඒ සෞම්‍ය උතුරු සුළඟට පූජාවන් පැවැත්වූ නාවිකයින්ගේ ගුණ ගැයූහ.

කාපා.

"කුමක්ද ඔටොකු? " මහල්ලා දත්මිටි කමින් ඇසීය. ඔහු මේ සෝෂාකාරී අවස්ථාවන් පිළිකුල් කළේය.

"ක්..කු...ල් හෙඩ්?"

"මගේ පෙනුම දැන් දුර්වලයි. ඔබට විශ්වාසද?"

"ඔහු නැව් තට්ටුව දිගේ දුවගෙන එනවා."

මහ සෙනග කුරුමිට්ටාට ඉඩ දී පසෙකට වූහ. රාජදූතයෙකු ලෙස ඔහුගේ කීර්තිය රට පුරා ප්‍රචලිතය.

ඔටොකුට සතුට ඉවසාගත නොහැකි තරම්ය. තවත් මොහොතකින් ඔහු දුටු දෙයින්, ඔහුගේ හදවත නැවතුණා මෙනි. "බලන්න කාපා, බලන්න, හොඳින්."

"මා පැවසුවා නොව මගේ ඇස් දුර්වලයි කියා?"

"අන්න. රාජකීය නෞකාවේ ඉදිරියෙන්ම සිටින්නේ පියැන්කි. පියැන්කි සමග අබිලා රැජින."

"ඔබට ඔල්මාදය ඔටොකු!"

"පාරාවෝ ආපසු පැමිණිලා."

තර මිනිසා සිරුර දෙපසට පද්දමින් දුවන්නට විය. පාරාවෝ යුවල අසල ආචාර දක්වන පළමුවැන්නා වීමේ ආශාවෙන්,අලියෙකු සේ ඔහු ඉදිරියට ඇදුණි.

"උතුමාණෙනි, ඒ ඔබද, ඒ ඔබද?" ඔහු කෑ ගැසීය. සතුටු කඳුළු දෙකොපුල් තෙමා වැටෙද්දී ඔහු පියැන්කි ඉදිරිපිට නතර විය

"මා ඒ තරමටම වෙනස් වීද, ඔටොකු?" පාරාවෝ සිනාසී ඇසීය.

"මා සිතුවා ඔබ මෙම්පිස්හි නතර වෙතැයි කියා, උතුමාණෙනි."

"මගේ මෙහෙයුම අවසානයි ඔටොකු. දැන් ඊජිප්තුව තනි රාජ්‍යයක්. ගොඩබිම් දෙක සාමයෙන්. හැම පළාතක් ම තම පාරාවෝට අවනතයි. මගේ තැන නපාටාවයි. මගේ පියාණන් වන ආමන් අසල සිටීමටයි මට අවශ්‍ය. ඔහුයි මට මග පෙන්වූයේ, මා ආරක්ෂා කළේ, ඉතින්, මා ආපසු ආවා ඔහු නිසාවෙන්. දැන් ඩෙල්ටාව පුරා රජයන්නේ මා ආට් නීතියයි. නයිල් මිටියාවතේ මෙන්ම. ඒ සතුට මැනගත හැකියි චාරිත්‍රානුකූලව පූජාවන් පවත්වා උත්සව කරන ආකාරය අනුව. හෙට දවසේත් ඊජිප්තුවේ

කොතැනක හෝ සිටින ජනයාට, අසාධාරණය හා අවනීතිය වෙනුවෙන් මගේ සහාය අවශ්‍ය වුවහොත් මා යළිත් පිටත් වෙනවා.''

උත්සව සංවිධානය කෙරෙන අතරතුර කළු පාරාවෝ සහ අබිලා රැජින ගුද්ධ වූ කන්ද වෙත ගියෝය. හිරු, කාන්තාර වැල්ල රන් බවට පතකර තිබූ අතර මහ දෙවොලේ දොරටු දීප්තියෙන් බැබළුණි.

''ඔබ පමණයි දන්නේ මගේ රහස්. ප්‍රේමිය'' රජු අබිලාට කීය. ''ඔබ පමණයි දන්නේ මගේ ඉලක්කය බලය නොවන බව. මා යන මාවත, දෙවියන් හා පැරැන්නන් විසින් මේ දෙවොල තුළ සාදන ලද මාවතයි. අවි ගැටුම් හෝ රාජ සභිකයින්ගේ වර්ණනාත්මක ගායනා මගේ දිවියේ තාලය වුණේ නැහැ කිසිදාක.''

''ඔබ ජනතාවගේ හදවත් අවදි කළා. ඒ නිසා ඔවුන් තම යුතුකම් වටහා ගනීවි, සියල්ලන්ටම නිවැරදි ස්ථානය ලබා දීමෙන්. ඔබ අපගේ ලෝකය වෙනස් කළේ නැහැ. ඒත් ඔබ ඊට තේරුමක් දී තිබෙනවා. දිනපතාම අපි දෙවියන්ට චාරිත්‍ර ඉටුකරමු. එය අපට උදවු කරාවි, මහලු දිවියට යන මේ මාවතේ අපට බාධා කරන සතුරන් ජයගන්නට.''

''අප ඒ සටනත් ජයගන්නවා, ප්‍රේමිය.'' රජු පොරොන්දු විය.

''ඔව් පියැන්කි, ආදරයට අධිපති දෙවඟන. සියල්ල සතුටින් තබනවා. අහසේ දිලෙන තාරකාවන් සේ ඒ දෙව්ලොව අන් කිසිවක් නොවෙයි හිමියනි, අපගේ රාජ්‍යයයි.''

පාරාවෝ සහ රැජින; අඳුර ආලෝකය බවට පත් කළ, ''මහපොළොව මත දෙව්ලොව'' නම් ලද ඒ මහා දෙවොලේ සුවිසල් දොරටුවෙන් ඇතුල් වූහ.

-----